# කාර්ය සාධන වාර්තාව

# 2017

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණිය

ශ්‍රී ලංකා

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින්

ප්‍රකාශයට පත් කරන ලදී

2018

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය විසින් සම්පාදනය කොට කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය මගින් මුද්‍රණය කරන ලදී.

සියලුම හිමිකම් ඇවිරිණි. විවේචනය හා පුනරීක්ෂණය සඳහා කෙටි වාක්‍ය ඛණ්ඩවල උපුටා ගැනීම් හැරුණුවිට, මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතියෙන් තොරව, නැවත ඉදිරිපත් කිරීම, පුනරුත්පාපනය කළ හැකි වන සේ ගබඩා කර තැබීම, විද්‍යුත්, යාන්ත්‍රික, ඡායාස්පිත, පටිගත කිරීම හෝ වෙනත් ක්‍රම උපයෝගී කරගනිමින් සම්ප්‍රේෂණය කිරීම සපුරා තහනම් වේ. අසාධාරණයක් නොවන පරිදි වාණිජ නොවන ස්වරූපයේ කටයුතු සඳහා මෙම අවසරය ලබාදීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී  ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලබන ප්‍රකාශන වල, වාණිජ නොවන, කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමේදී ගාස්තු ගෙවීම අනවශ්‍යවේ. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලදී  කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණාත්මක සොයාගැනීම් සඳහා අව්‍යාජව යොදා ගැනීමට මෙම හිමිකම් ඇවිරීමේ ප්‍රකාශය බාධාවක් නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# ඉදිරි දැක්ම

ජාතික සෞභාග්‍යය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම.

# මෙහෙවර

නව දියුණු කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කර ව්‍යාප්ත කිරීම සහ අදාල සේවාවන් ගොවීන් වෙත වැඩි අවධාරණයක් සහිතව සියළුම පාර්ශවකරුවන් වෙත ලබාදීමෙන් ජාතියේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යෝග්‍ය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්කර ගැනීම.

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2018

ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන් මයා - කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

ඩබ්.ඒ.ජී. සිසිර කුමාර මයා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)

ආචාර්ය ආර්.එස්.කේ. කීර්තිසේන මයා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ)

එච්.පී.ඩී.එම්. සරච්චන්ද්‍ර මිය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)

ඩබ්.ඒ.කේ. කරුණාතිලක මයා - අධ්‍යක්ෂ (ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන)

ආචාර්ය ප්‍රියන්ත වීරසිංහ මයා - අධ්‍යක්ෂ (උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන)

ආචාර්ය පී.ඩබ්. අලහකෝන් මිය - අධ්‍යක්ෂ (පලතුරු පර්යේෂණ හා සංවර්ධන)

ජී.ඩී.එස්.එන්. චන්ද්‍රසේන මිය - අධ්‍යක්ෂ (වී පර්යේෂණ හා සංවර්ධන)

ආචාර්ය එස්.එච්.එස්.ඒ. ද සිල්වා මයා - අධ්‍යක්ෂ (ස්වාභාවික සම්පත් කළමනාකරණ)

ඩී.එස්.එන්. ඒකනායක මයා - අධ්‍යක්ෂ (බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ)

කේ.ඩී. පුෂ්පානන්ද මයා - අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන)

ආචාර්ය ආර්.එම්. හේරත් මයා - අධ්‍යක්ෂ (සමාජ ආර්ථික හා සැලසුම්)

අමල් අරුණප්‍රිය මයා - අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු)

එස්. පෙරියසාමි මයා - අධ්‍යක්ෂ (ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන)

පී.එම්.ඩී.ඩබ්.ඩී. පල්ලාවල මයා - අධ්‍යක්ෂ (පාලන)

කේ.ජී.එස්.පී. කළුආරච්චි මයා - අධ්‍යක්ෂ (ආයතන)

පී. රාජපක්ෂ මිය - ප්‍රධාන ඉංජිනේරු

පරාක්‍රම ප්‍රේමරත්න මයා - ප්‍රධාන ගණකාධිකාරි

## ප්‍රධාන උපදේශකත්වය

ඩබ්.ඒ.ජී. සිසිර කුමාර

## සංස්කරණය

ආචාර්ය ප්‍රියන්ත වීරසිංහ
ආචාර්ය ආර්.එස්.කේ. කීර්තිසේන
එම්.ඒ.කේ. මුණසිංහ
පී.සී. පීරිස්
කේ.එන්.එස්. රණතුංග
ආචාර්ය ජේ.ඒ. සුමිත්
ආචාර්ය එස්.කේ. වාසල

## සම්බන්ධීකරණය

පී.සී. පීරිස්
ඊ.එම්.අයි.සී.කේ. වේරපිටිය

## පරිවර්තනය

ජේ. උඩුදෙණිය
එස්.ඒ.එන්.ඩී. විජේකෝන්
ඒ.ඩබ්.එම්.ආර්.වයි.කේ. රත්වත්ත

## සෝදුපත් කියවීම

ජේ. උඩුදෙණිය
එස්.ඒ.එන්.ඩී. විජේකෝන්
ඒ.ඩබ්.එම්.ආර්.වයි.කේ. රත්වත්ත
ඩබ්.එම්.ටී.වී.පී. විජේකෝන්
ටී.එම්.ඒ.කේ. බණ්ඩාර
පී.එස්.පී. නිල්මල්ගොඩ
ආර්.එම්.එස්.එම්. අබේරත්න

## යතුරු ලියනය සහ පිටු සැකසුම

කේ.ජේ.එම්. ජයසිංහ

## පිට කවරය නිර්මාණය

ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය

## මුද්‍රණය

කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය

## සම්බන්ධීකරණ නිලධාරින්

- ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - ආර්.ඒ.සී.ජේ. පෙරේරා මයා/ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
- තෙල් හා මාෂ බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - ඩී.පී.පී. ලියනගේ මිය/ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
- ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අරලගංවිල - ආචාර්ය එම්.එස්. නිජමුදීන් මයා නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
- ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - කිලිනොච්චි - ආචාර්ය එස්. ජේ. අරසකේසරී මයා/ අතිරේක අධ්‍යක්ෂ
- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - පී මාලතී මිය / නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
- ආහාර පර්යේෂණ ඒකකය - එස්.එම්.ඒ.සී.යූ. සේනාරත්න මිය/ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
- ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල - ඊ.ඒ.එස්.එස්. ජයසේකර මිය/ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
- ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර - එස්.ඒ.එස්.එම්. කුමාරි මිය/ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
- කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - සීතාඑළිය - එම්.ඒ.පී. මායාකඩුව මිය/ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
- කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල - එච්.ඒ.පී.ඒ. ශ්‍යාමලී මිය/ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
- කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - ගිරාඳුරුකෝට්ටේ - පී.ජී.එස්. ශාන්ත මයා/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
- පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය - ආචාර්ය ඊ.ආර්.එස්.පී. එදිරිමාන්න මිය / අතිරේක අධ්‍යක්ෂ
- පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය - ජේ.ජී.කේ.එල්. ගම්ලත් මයා/ වැඩසටහන් සහකාර (කෘෂිකර්ම)
- පැළෑටි වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානය - ජේ. බමුණුආරච්චි මිය / වැඩසටහන් සහකාර (කෘෂිකර්ම)
- වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය - ජී.ඩී.එස්.එන්. චන්ද්‍රසේන මිය/ අධ්‍යක්ෂ
- ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - බෝඹුවල - එම්.ජී.එන්. රූපසිංහ මිය/ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
- ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය - පේරාදෙණිය - ආචාර්ය එච්.කේ. කඩුපිටිය මයා/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
- බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - එස්.එස්.කේ. හේමචන්ද්‍ර මිය/ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන)
- බීජ සහතික කිරීමේ සේවය - ආර්.ඒ.අයි.එස්. ආරියරත්න මිය/ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන)
- පැළෑටි සංරක්ෂණ සේවය - ටී.එන්. ඉහළගමගේ මිය/ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන)
- පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය - ආචාර්ය ජේ.ඒ. සුමිත් මයා/ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්
- පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය - එස්.එම්.එස්.ඩබ්. වනිගදේව මයා / සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
- ජාතික ශාක නිරෝධායන සේවය - ජී.ජී. ලාලනි මිය / සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන)
- බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය - එච්.එම්.එස්.පී. හේරත් මයා/ අතිරේක අධ්‍යක්ෂ (වී හා අතිරේක ආහාර බෝග)
- සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය - කේ.පී.සී.ඩී.බී. විජේසිංහ මයා / සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා)
- ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය - කේ.එන්.එස්. රණතුංග මිය/ අතිරේක අධ්‍යක්ෂ
- ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය - අයි.එස්.එම්. හලීම්දීන් මිය/ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන)
- පරිපාලන අංශය - ඩබ්.එස්.පී. වික්‍රමාරච්චි මිය/ සහකාර අධ්‍යක්ෂ (පාලන)
- ඉංජිනේරු අංශය - ඒ.කේ.එස්.පී.එස්. විජයසෝම මිය/ ඉංජිනේරු (විදුලි)
- ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය - එච්.එම්.ඒ.පී. හේරත් මිය/ ඉංජිනේරු (යාන්ත්‍රික)
- මුදල් අංශය - ඩබ්.එම්.එස්.බී. විජේකෝන් මයා/ අයවැය සහකාර
- ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය - පී.සී. පීරිස් මයා/ අතිරේක අධ්‍යක්ෂ

# පටුන


පෙරවදන....................................................viii
2017 වර්ෂය තුල ඉටු කරන ලද පුමුඛ කාර්යයන් ....................ix
1.1 ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහඉලුප්පල්ලම ..........1
1.1.1 තෙල් හා මාෂ බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අඟුණකොළපැලැස්ස .....19
1.1.2 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අරලගංවිල ..........28
1.1.3 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - කිලිනොච්චිය..........35
1.2 උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - ගන්නොරුව ..........40
1.2.1 ආහාර පර්යේෂණ ඒකකය - ගන්නොරුව..........60
1.2.2 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල ..........69
1.2.3 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර..........77
1.2.4 කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - සීතා එළිය ..........88
1.2.5 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල ..........95
1.2.6 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - ගිරාඳුරුකෝට්ටේ ..........102
1.3 පලතුරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය - හොරණ ..........106
1.3.1 පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය - ගන්නොරුව..........122
1.4 වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය - බතලගොඩ..........139
1.4.1 ප්‍රාදේශීය වී පර්යේෂණ සහ සංවර්ධනමධ්‍යස්ථානය - බෝඹුවල..........172
1.5 ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය - පේරාදෙණිය ..........180
2.1 බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නොරුව..........195
2.1.1 බීජ සහතික කිරීමේ සේවය - ගන්නොරුව ..........200
2.1.2 පැළෑටි සංරක්ෂණ සේවය - ගන්නොරුව ..........214
2.1.3 පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය - පේරාදෙණිය ..........220
2.1.4 පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය - ගන්නොරුව ..........247
2.1.5 ජාතික ශාක නිරෝධායන සේවය - කටුනායක..........258
2.2 බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය - පේරාදෙණිය ..........279
2.4 සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය - පේරාදෙණිය..........302
3.1 ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය - පේරාදෙණිය..........311
3.2 ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය - ගන්නොරුව..........363
4.1 පරිපාලන අංශය - පේරාදෙණිය ..........379
4.2 ඉංජිනේරු අංශය - පේරාදෙණිය ..........388
4.2.1 ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය - මහඉලුප්පල්ලම ..........394
4.3 මුදල් අංශය - පේරාදෙණිය ..........400
4.4 ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය - පේරාදෙණිය..........405
5. කාලගුණ වාර්තාව..........438
6. ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම් ..........452
7. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය (2017.12.31 දිනට) ..........477
8. තාක්ෂණික කාර්ය මණ්ඩල සුදුසුකම් (2017.12.31 දිනට) ..........504
9. කාර්ය මණ්ඩල ස්ථාපිතය (2017.12.31 දිනට) ..........505

# පෙරවදන

ආහාර බෝගවල ඵලදායිතාව හා නිෂ්පාදනය ඉහළ නංවනු පිණිස සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව සළකා බැලීමේදී, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට 2017 වර්ෂය තවත් ඵලදායී වර්ෂයක් විය. 2017 වර්ෂය තුළදී, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික ක්‍රියාකාරකම් වල නිරන්තර අවධානය, දිවයිනේ ආර්ථිකයේ ඉහළ වැදගත්කමක් දරන වී, වෙනත් ක්ෂේත්‍ර බෝග, අර්තාපල්, එළවළු හා පලතුරු බෝග වල ඵලදායිතා ප්‍රවර්ධනය හා නිෂ්පාදනය පිළිබඳව යොමු විය. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් දියත් කරන ලද ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන මගින් අපේක්ෂා කරන ලද පරිදි ස්වයංපෝෂිතභාවය අත්පත් කර ගැනීම හා මෙකී බෝග ආනයන අඩු කිරීම උදෙසා ඉලක්ක කණ්ඩායම් වෙතට බීජ, රෝපණ ද්‍රව්‍ය හා තාක්ෂණික දැනුම යනාදී අවශ්‍ය යෙදවුම් සපයමින්, සියළු පාර්ශ්වකරුවන්ගේ සාමූහික සහයෝගය ඇතිව අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවමින්, හඳුනාගත් එක් එක් බෝගයට අදාළව ක්‍රියාත්මක කළ යුතු සුවිශේෂී ක්‍රියාකාරකම් සැළසුම් කිරීම මගින්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මෙම කර්තව්‍යයට ක්‍රියාකාරීව සම්බන්ධ වී සිටී.

ස්වකීය පර්යේෂණ වැඩසටහන තුළින් වඩා වැඩි අස්වනු ලබා දෙන හා වඩා හොඳ ගුණත්ව ලක්ෂණ සහිත නව බෝග ප්‍රභේද නිෂ්පාදනයට මෙන්ම වගාවේ නව තාක්ෂණවේද බොහොමයක් සංවර්ධනය කිරීමට ද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හැකි විය. බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා සහතික කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ඉදිරියට ගෙන යනු ලබන අතර, දිවයිනේ කෘෂිකර්මාන්තයේ තිරසාර බව සුරකිනු වස් පාංශු පනත, පැළෑටි ආරක්ෂණ පනත, පලිබෝධනාශක පාලන පනත හා පාංශු සංරක්ෂණ පනත යන පනත් ක්‍රියාවට නැංවීමේ නියාමන ආයතනය ලෙසට ද මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරයි. පොහොර හා ජලය භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රමවේද ජනතාව අතර ප්‍රචලිත කිරීමට, යාන්ත්‍රීකරණය ප්‍රවර්ධනයට, වැඩිදියුණු කළ තාක්ෂණවේද ප්‍රචාරණයට කටයුතු කරන අතරම, ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාල තුළින් NVQ ප්‍රමිතීන් ට අනුව පිළියෙල කරන ලද නව විෂයමාලා යටතේ කෘෂිකර්ම අධ්‍යාපනය ලබා දීමද අරමුණු කරගෙන කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මෙලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා යෙදවුම් හා ශක්තීන් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ගන්නා ලද ක්‍රියාමාර්ග ඇගයීමට ලක් වූ අතර, කිලිනොච්චි හි ප්‍රාදේශීය කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට, එහි මහා පරිමාණ හරිත ගොවිපල වෙනුවෙන් ජනාධිපති පරිසර සම්මානය හිමි විය. එමෙන්ම මහ ඉලුප්පල්ලම, ක්ෂේත්‍ර බෝග සංවර්ධන හා පර්යේෂණ ආයතනයට වැවිලි නොවන අංශයේ CARP ජාතික සම්මානයේ දෙවන ස්ථානය හිමි විය.

මෙම ප්‍රකාශනයෙහි අන්තර්ගත ජයග්‍රහණ අත්පත් කර ගැනීම උදෙසා ස්වකීය ශ්‍රමය කැප කළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ කාර්යභාරය මගේ ඇගයීමට ලක් වේ. එමෙන්ම, නියමිත කාලසීමාව තුළදී මෙම ප්‍රකාශනය ඉදිරිපත් කිරීමෙහි ලා ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකයේ සංස්කාරකවරුන්ගේ අනලස් ව්‍යායාමයටද මාගේ ස්තූතිය හිමිවේ.



ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන්
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

# 2017 වර්ෂය තුළ දී ඉටු කරන ලද පුමුඛ කාර්යයන්

## නිකුත් කරන ලද නව බෝග ප්‍රභේද

### කව්පි - ANKCP 2





- සිටුවා දින 64-68කින් අස්වැන්න නෙලා ගත හැක.
- සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1500 - 1600ක් වේ.
- පියකරු වර්ණයෙන් (ලා දුඹුරු - සුදු) යුතු විශාල ප්‍රමාණයේ ඇට සහිතය.
- නැවුම් කරල් වලින් වෙන් කරගත් ඇට පිසීමට හැකි අතර වියළි ඇට තම්බා ආහාරයට ගත හැක.
- වාර 3 - 4ක් අස්වැන්න ලබා ගත හැක.

### බෝංචි - කැකුළු බෝංචි (PB 161)





- විභව අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 23 - 25ක් පමණ වේ.
- සිටුවා දින 60-63කින් අස්වැන්න නෙලා ගත හැක.
- පිටතින් බැලූ විට ඇට පැහැදිලිව නො පෙනෙන මධ්‍යම ප්‍රමාණයේ දිගකින් යුතු කොළ පැහැති සිනිඳු රවුම් කරල් ලබා දෙයි.
- වාර 8 -9ක් අස්වැන්න ලබා ගත හැකි අතර වැලේ සෑම තැනකම ඒකාකාරී ලෙස කරල් හට ගනී.
- අස්වනු නෙලා ගැනීම ප්‍රමාද වුවද කරලේ මොළොක් බව නොවෙනස්ව පවතී.

## මිරිස් - MICH HY 2





- හෙක්ටයාරයකට ටොන් 35ක විභව අස්වැන්නකින් යුතු දෙමුහුම් ප්‍රභේදයකි. (කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත වෙනත් විවෘතව පරාගිත ප්‍රභේද වලට වඩා 30% - 40% දක්වා වූ වැඩි අස්වැන්නකි.)
- කරලේ දිග සෙ.මී. 13ක් පමණ වේ.
- අමු මිරිස් හෝ වියළි මිරිස් ලෙස භාවිතා කළ හැක.
- කොළ කොඩවීමේ රෝගයට මධ්‍යස්ථව ප්‍රතිරෝධී බවක් දක්වන බැවින් පළිබෝධනාශක භාවිතා කිරීම ද අඩු කළ හැක.

## අඹ - හොරණ හිරු





- පහතරට තෙත් කලාපය සඳහා නිර්දේශ කර ඇත.
- ඒකාකාර වාර්ෂික මල් හට ගැනීමක් ද සහිත ව වේගවත් වර්ධනයක් පෙන්වන ප්‍රභේදයකි.
- ඇන්ත්‍රක්නෝස් රෝගයට මධ්‍යස්ථව ප්‍රතිරෝධී බවක් දක්වයි.
- වැඩි කාලයක් තබා ගැනීමේ හැකියාවෙන් යුතුය.
- පැසුණු ගෙඩි ඉටි සහිත කහ පැහැයෙන් යුතුය.
- පොත්තේ කහ පැහැය ලබා ගැනීමටත් පළිබෝධ හා රෝග අවස්ථා මඟ හැර සිටීමටත් ගෙඩි හට ගෙන දින 20කට පසු ගෙඩිය බෑගයකින් ආවරණය කිරීම අත්‍යවශ්‍ය වේ.

## පැෂන් ෆෘට් - හොරණ ගෝල්ඩ්

 

- බීජ වලින් ප්‍රචාරණය වන ඉහළ අස්වනු ලබා දෙන ප්‍රභේදයකි.
- ගෙඩියක සාමාන්‍ය බර - ග්‍රෑම් 155කි.
- මදයේ වර්ණය කහ තැඹිලි පාට වේ.
- පැසෙන අවස්ථාවේ දී පොත්තේ පැහැය කහ තැඹිලි පාට වේ.
- ගෙඩිය දිගැටි/රවුම් හැඩයෙන් යුතුය.
- පහතරට හා මැද රට තෙත්, අතර මැදි හා වියළි කලාප සඳහා නිර්දේශ කර ඇත.

## පැෂන් ෆෘට් - බණ්ඩාරවෙල දම්



- ගෙඩියක සාමාන්‍ය බර - ග්‍රෑම් 100 - 120ක් වන අතර පොත්ත රතට හුරු දම් පැහැයෙන් යුතුය.
- ළපටි කොළ හා වැලේ පහුරු දම් පැහැයෙන් යුතුය.
- ගෙඩියේ යුෂ කහ පැහැයෙන් යුතුය.
- සිටුවා මාස 10කින් අස්වැන්න නෙලා ගත හැක. (පළමු අවුරුද්ද - වැලකට කිලෝග්‍රෑම් 16, දෙවන අවුරුද්ද - වැලකට කිලෝග්‍රෑම් 24)
- වෛරස් වලට හා මුල් කුණුවීමේ රෝගයට මධ්‍යස්ථව ප්‍රතිරෝධී බවක් දක්වයි.
- උඩරට, අතර මැදි හා තෙත් කලාප සඳහා නිර්දේශ කර ඇත.

## ජමනාරන් – ජුසි




- යුෂ නිෂ්පාදනය සඳහා විශේෂයෙන්ම සුදුසු ද්වි කාර්ය ප්‍රභේදයකි.
- ප්‍රධාන වාර දෙකකින් සමන්විත වන අතර අවුරුද්ද පුරා ඵලදාව ලබා දේ.
- ඉහළ අස්වැන්නක් ලබා දෙන ප්‍රභේදයකි. (එක් අවුරුද්දකට එක් පැළෑටියකින් කිලෝග්‍රෑම් 60ක්)
- විශාල ප්‍රමාණයේ ගෙඩි (කිලෝග්‍රෑම් 100 - 130)
- තැඹිලි පැහැ මදයකින් යුතුය.
- පහතරට තෙත් කලාපය සඳහා නිර්දේශ කර ඇත.

## නෙල්ලි - ගන්නොරුව නෙල්ලි




- පැසෙන අවස්ථාවේ දී කහ පැහැයට හුරු කොළ පාටින් යුතු පියකරු විශාල ප්‍රමාණයේ (ග්‍රෑම් 40 - 70) ගෙඩි වලින් යුතුය.
- සිටුවා අවුරුදු 2 1/2 - 3ක් වැනි කෙටි කාලයකින් මල් හට ගෙන ගෙඩි හට ගනී.
- පළමු වරට ගෙඩි හට ගැනීමෙන් පසු සාමාන්‍යයෙන් අවුරුදු 3කින් පමණ එක් පැළෑටියකට ගෙඩි අස්වැන්න කිලෝග්‍රෑම් 150ක් පමණ ලබා දෙන වැඩි ඵලදාවකින් යුතු ප්‍රභේදයකි.
- බඳුන් වල සාර්ථකව වගා කළ හැකි අතර නාගරික කෘෂිකර්මාන්තයේ දී ප්‍රයෝජනවත් වේ.

## මාදං - ගන්නොරුව මාදං




- දේශීය වගා ප්‍රභේද (ග්‍රෑම් 1.5) සමඟ සැසඳීමේ දී වඩා විශාල ප්‍රමාණයේ ගෙඩි (ග්‍රෑම් 13) වලින් යුතුය.
- පියකරු දම් පැහැයෙන් යුතු මාංසල ගෙඩි වලින් හටගනී.
- දේශීය වගා ප්‍රභේද (බ්‍රික්ස් 9) සමඟ සැසඳීමේ දී ප්‍රණීත රසයෙන් (ඉහළ බ්‍රික්ස් අගය - 18) යුතුය.
- බඳුන් වල සාර්ථකව වගා කළ හැකි අතර තෙත් කලාපය සඳහා නිර්දේශ කර ඇත.

## මාදං - ගන්නොරුව එළ දං





- පියකරු ළා කොළ පැහැයෙන් යුතු ඉතා දුර්ලභ මා දං විශේෂයකි.
- මාංසල හා ප්‍රණීත ගෙඩි වලින් යුතුය.
- බ්‍රික්ස් අගය 15ක් පමණ වන ප්‍රණීත මිහිරි රසයෙන් යුතු ඵලයකි.
- බඳුන් වල සාර්ථකව වගා කළ හැක.

## දෙළුම් - කල්පිටිය දෙමුහුම




- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිපදවන ලද පළමු දෙමුහුම් දෙළුම් විශේෂය වේ.
- ගෙඩියේ ලෙල්ල තුනී එකක් වන අතර තැඹිලි රෝස පැහැයෙන් යුතුය.
- රතු පැහැති මධුර මාංශයකින් යුතු (බ්‍රික්ස් අගය 15 - 16) මෘදු ඇට වලින් යුතු පලතුරකි.

- මධ්‍යම ප්‍රමාණයේ රවුම් හැඩයෙන් යුතු ගෙඩියක බර ග්‍රෑම් 230 - 260 අතර වේ. (කිලෝග්‍රෑම් එකකට ගෙඩි 4 - 5)
- ගෙඩියේ බාහිර පෙනුම ආනයනය කරනු ලබන ගෙඩි වල පෙනුම සමඟ තරඟකාරී තත්වයේ වේ.
- ආනයනය කරනු ලබන ප්‍රභේද වලට වඩා වැඩි ප්‍රතිඔක්සිකාරක ගුණයෙන් යුතුය.
- ප්‍රචාරණය කිරීම සිදු කරනු ලබන්නේ පැල බද්ධ කිරීම මගිනි.

## පර්යේෂණ වල ප්‍රතිඵල

- කළුතර දිස්ත්‍රික්කයේ ගංවතුර අවදානම සහිත ක්ෂේත්‍ර වල ගංවතුරට ඔරොත්තු දීම සඳහා වරණය කළ වී ආර පරීක්ෂාවට ලක් කරන ලදී.

- වී වගාව සඳහා යන්ත්‍රයෙන් පැල සිටුවීම ප්‍රවර්ධනය කරන ලද අතර වඩා හොඳ නිෂ්පාදනයක් සඳහා මෙම ක්‍රමෝපාය යොදා ගැනීමට ගොවීහු උනන්දුවක් දක්වති.
- CORIGAP ව්‍යාපෘතිය (විදේශීය ආධාර ලත් කුඩා පරිමාණ ව්‍යාපෘතිය) යටතේ පොලොන්නරුවේ කුඩා කුඹුරු එක් කොට කුඹුරු ඉඩම් ව්‍යාප්ත කිරීම සිදු කරන ලදී. අක්කර එකක පිහිටි කුඩා ඉඩම් කොටස් දහයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අනවශ්‍ය වේලි ඉවත් කොට විශාල කොටස් 3 - 4ක් ලෙස යළි සකස් කරන ලද්දේ කාර්යක්ෂම වගාවක් සඳහා ගොවිපල් යන්ත්‍රෝපකරණ පහසුවෙන් භාවිතා කිරීමට ඉඩකඩ ලැබෙන පරිදිය.
- අයහපත් කාලගුණ තත්ව හේතුවෙන් ආහාර නිෂ්පාදනය අඩුවීමට පිළියමක් ලෙස හිස් පොලිසැක් බෑග වල බතල වගා කිරීමේ තාක්ෂණය ප්‍රවර්ධනය කරන ලදී. මෙම වැඩසටහන යටතේ බතල හා මඤ්ඤොක්කා රෝපණ ද්‍රව්‍ය ගම්මාන 23ක ගොවින් අතර බෙදා හරින ලදී.




පොලිසැක් බෑගවල බතල වගා කිරීම

- ශ්‍රී ලංකාවේ උද්‍යාන විද්‍යා බෝග වල ප්‍රධාන පලිබෝධ හා රෝග සඳහා ජෛව - සූක්ෂම ඒකාබද්ධ පලිබෝධ හා රෝග කළමනාකරණ (BIPM) වැඩසටහන් සංවර්ධනය කිරීම පිළිබඳ ව්‍යාපෘතිය යටතේ කාර්යක්ෂම සහ දිගු කාලයක් පවතින පෙරමෝනයක්, එනම් කෘමිනාශක සංයෝජනයක් ලෙස මෙතිල් ඉයුජිනෝල් මිලි ලීටර 1: ඇබෙමෙක්ටින් මිලි ලීටර 0.15 හඳුනා ගන්නා ලදී. පෙරමෝන උගුල තුළ එහි කාර්යක්ෂමතාව මාස 02ක කාලයක් දක්වා පවත්වා ගන්නා හොඳම අවශෝෂක ද්‍රව්‍ය ලෙස කපු පුළුන් හඳුනා ගන්නා ලදී.

- මිරිස් සඳහා බිංදු ජල සම්පාදනය හා මුං සඳහා විසිරුම් ජල සම්පාදනය සහිත නව ශෂ්‍ය විද්‍යාත්මක කට්ටල 2ක් සංවර්ධනය කරන ලදී. මෙමගින් ක්ෂුද්‍ර ජල සම්පාදනය යටතේ මිරිස් හා මුං අස්වනු පිළිවෙලින් හෙක්ටයාරයකට ටොන් 45ක් හා හෙක්ටයාරයකට ටොන් 2.5 - 3ක් දක්වා වැඩි කළ හැකි වූ අතර මතුපිට ජල සම්පාදනය 30-50% දක්වා ප්‍රමාණයකින් අඩු කළ හැකි විය.






නව වාරි ජල සම්පාදන කට්ටල සමග මිරිස් හා මුං ඇට වගාව

- එළවළු බීජ වල ගබඩා සමය තුළ ජීව්‍යතාව ඉහළ නැංවීමට ඒවා පටලයකින් ආවරණය කිරීමේ සුදුසු තාක්ෂණයක් සංවර්ධනය කිරීම පිළිබඳ ව්‍යාපෘතිය යටතේ මිරිස්, මාළු මිරිස් හා බණ්ඩක්කා ඇට සඳහා සුදුසු පටලමය බීජ ආවරණයක් යොදන ලදී.







තුනී පටලයකින් ආවරණය කරන ලද කව්පි හා බණ්ඩක්කා ඇට    බීජ වලට පටලමය ආවරණය යෙදීමේ යන්ත්‍රය

- අවාරයේ වගාව සඳහා හැකියාව පවතින ස්ථාන ලෙස, එළවළු සඳහා නව ස්ථාන 12ක්, පලතුරු බෝග සඳහා ස්ථාන 5ක් සහ වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා ස්ථාන 19ක් හඳුනා ගන්නා ලදී.

- පසුගිය අවුරුදු 16 ට අදාළ MODIS චන්ද්‍රිකා දත්ත යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ නියඟයට නතුවන ප්‍රදේශ දැක්වෙන සිතියම ගොඩනගන ලද අතර එහි අවසන් කටයුතු සිදු කෙරෙමින් පවතී.

- පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල සහයෝගය ඇතිව පාංශු සංරක්ෂණය පනත යටතේ වූ ක්‍රියාකාරකම් සිදු කරන ලදී. ක්ෂුද්‍ර ජලාධාර පාදක ගොවි ක්ෂේත්‍ර වල උචිත පාංශු සංරක්ෂණ පිළියම්/ව්‍යුහ ස්ථාපනය කරන ලදී. මෙම වැඩසටහන දිස්ත්‍රික්ක හතක ගොවි ක්ෂේත්‍ර අක්කර 130ක් ආවරණය කලේය.





මුල්ගම හා බදුල්ල දිස්ත්‍රික්කයේ පාංශු සංරක්ෂණ ආදර්ශන

## සංවර්ධන කාර්යයන්

- කෘෂිකර්ම විද්‍යාල සංවර්ධන වැඩසටහන යටතේ කුණ්ඩසාලේ, කරපිංච කෘෂිකර්ම විද්‍යාල සඳහා දේශන ශාලා, පුස්තකාල හා ගුරු විවේකාගාර සහිත නව ගොඩනැගිලි ඉදිකිරීම හා අගුණකොළපැලැස්ස දෙමහල් ගොඩනැගිල්ලේ දෙවන අදියර සම්පූර්ණ කිරීම සිදු කරන ලදී. මීට අමතරව, පැල්වැහැර සඳහා විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම, වවුනියාවේ භෝජන ශාලාව ඇතුළු ගොඩනැගිලි නවීකරණය හා අධි ධාරිතා ජල පිරිසිදුකරනයක් පරන්තන් හි සවි කිරීම සම්පූර්ණ කරන ලදී.





කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ නව ගොඩනැගිල්ල හා තොරතුරු තාක්ෂණ ඒකකය

- වාරිමාර්ග ඇල, වැටවල්, පාරවල් ඉදිකිරීම, සම්මන්ත්‍රණ ශාලාව වැඩි දියුණු කිරීම, පර්යේෂණාගාර උපකරණ මිලදී ගැනීම හා සූර්ය පැනල සවි කිරීම මගින් මහඉලුප්පල්ලම ගොවිපල් යන්ත්‍රෝපකරණ පර්යේෂණ මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් වැඩි දියුණු කරන ලදී.





පරීක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍ර වටා වාරිමාර්ග ඇල හා වැටවල් ඉදිකිරීම



සූර්ය පැනල සවි කිරීම



සම්මන්ත්‍රණ ශාලාව වැඩි දියුණු කිරීම





ගොවිපල් යන්ත්‍රෝපකරණ පරීක්ෂා කිරීමේ පර්යේෂණාගාරය

- දිස්ත්‍රික්ක 20ක දිස්ත්‍රික් මට්ටමේ පස් පරීක්ෂා කිරීමේ පර්යේෂණාගාර (20ක්) පිහිටුවන ලදී. පාංශු නියැදි 11,400ක විශ්ලේෂණ අවසන් කරන ලද අතර පහතරට වී වගාව සඳහා ග්‍රාම සේවා කොට්ඨාශ මට්ටමින් පොහොර නිර්දේශ ලබා දෙනු ඇත.





පස් පරීක්ෂා කිරීමේ විද්‍යාගාර

- දේශීය අර්තාපල් වල නිෂ්පාදනය හා ඵලදායිතාව ප්‍රවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය යටතේ පිළිවෙලින් $G_0$ හා $G_1$ බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා මහා පරිමාණ පොලි ගෘහ (වර්ග මීටර 800) තුනක් හා වර්ග මීටර් 400 පොලි ගෘහ විස්සක් ඉදිකරන ලදී. සීතා එළිය රජයේ බීජ ගොවිපලේ බීජ අර්තාපල් ගබඩා සඳහා, නව ශීතාගාරයක් ඉදිකිරීම හා පවතින ශීතාගාරය තවදුරටත් විශාල කිරීම මගින් පහසුකම් සපයන ලදී.





$G_0$ බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා සීතා එළිය ගොවිපලේ පොලි ගෘහ





$G_1$ බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා සීතා එළිය ගොවිපලේ පොලි ගෘහ





සීතා එළිය ගොවිපලේ නවීකරණය කරන ලද හා අළුතින් ඉදිකරන ලද ශීතාගාර

## වෙනත් ක්‍රියාකාරකම්

- ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ගොවීන් අතර බෙදාහැරීම සඳහා රුපියල් මිලියන 8.2ක් වටිනා ගොවිපල් යන්ත්‍ර හා උපකරණ අසූවක් මිලදී ගන්නා ලදී.



ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ බෙදා හරින ලද වේලි සැකසීමේ යන්ත්‍රය

- වාණිජ වගා සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය යටතේ අවශ්‍ය යන්ත්‍ර, ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති, සෙවන දැල්, කෘමි වාරක දැල් මිලදී ගැනීමට හා ආරක්ෂිත ගෘහ ඉදිකිරීමට ව්‍යවසායකයන්ට මූල්‍ය ආධාර සපයන ලදී.





වී කෙටීමේ යන්ත්‍රය බෙල් පෙපර් සඳහා බිංදු ජල සම්පාදනය සහිත ආරක්ෂිත ගෘහය

- වී නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ආදර්ශන සඳහා පැරෂුට් තැටි 101,640ක් සපයන ලද අතර පොහොර භාවිතාවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන පත්‍ර වර්ණ දර්ශක 1,585ක් කුඩා ගොවි කණ්ඩායම් අතර බෙදා හරින ලදී.





පැරෂුට් තැටි හා පත්‍ර දර්ශක සටහන් ගොවීන් අතර බෙදා හැරීම



පැල සිටුවීම යාන්ත්‍රීකරණය ජනප්‍රිය කිරීම සඳහා ආදර්ශන පැවැත්වීම

- බඩ ඉරිඟු වල නිෂ්පාදනය හා ඵලදායිතා ප්‍රවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය යටතේ දෙමුහුම් ප්‍රභේද ජනප්‍රිය කිරීම පිණිස 50%ක ගොවි සහභාගිත්වය යටතේ හෙක්ටෙයාර 5,609කට දේශීය හා ආනයනික දෙමුහුම් බීජ සපයන ලදී.





ක්ෂේත්‍ර ආදර්ශන සඳහා දෙමුහුම් බඩඉරිඟු බීජ බෙදා හැරීම

දේශීය දෙමුහුම් බීජ නිෂ්පාදන ප්‍රවර්ධනයට කොන්ත්‍රාත් බීජ නිෂ්පාදකයින් යොදා ගැනීම

- සෝයා බෝංචි වගාව ප්‍රවර්ධනයට, හෙක්ටයාර 6,477කට නොමිලේ බීජ සපයන ලද අතර, රයිසෝබියම් ආමුකුලන (Rizobium inoculum) හෙක්ටයාරයට 1,61කටද, හෙක්ටයාර 3,174ක් සඳහා භූමිය සකස් කිරීමට දීමනාවක් ද සපයන ලදී. මීට අමතරව වප්කර 4ක්, අතුරයත් ගෑමේ යන්ත්‍ර 8ක් හා නෙලන යන්ත්‍ර 2ක් සපයන ලදී.

- 2017 වර්ෂය තුළදී, පොත් 37ක පිටපත් 94,197ක්, පත්‍රිකා 10ක පිටපත් 44,790ක්, බෝග දින දර්ශන පොතේ පිටපත් 19,000ක් මුද්‍රණය කරන ලද අතර එක් අන්තර් ක්‍රියාකාරී බහුමාධ්‍ය සංයුක්ත තැටිය (IMMCD) කින් පිටපත් 1,000ක් මුද්‍රණය කරන ලදී.










බෝග දින දර්ශනය

මී මැසි පාලනය පිළිබඳ ප්‍රකාශන

- වාණිජමය මී පැණි නිෂ්පාදනය සඳහා මෙන්ම බෝග පරාගණය සඳහා මී මැසි පාලනය ජනප්‍රිය කිරීමේ අභිමතාර්ථය ඇතිව දිස්ත්‍රික්ක 25 පුරා මී මැසි පාලන ගම්මාන 106ක් ස්ථාපනය කරන ලද අතර මී මැසි සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 2,120ක් අතර මී මැසි පෙට්ටියක්, දුම් විසිරණයක් හා ජනාවාසයක් බැගින් බෙදා හරින ලදී.

- පදියතලාව, වාකරේ හා කන්තලේ "හෙළ බොජුන්" අලෙවි සැල් ඉදිකිරීම සම්පූර්ණ කරන ලද අතර, නිට්ටඹුවේ, යාපනයේ හා මාතර නව "හෙළ බොජුන්" අලෙවි සැල් විවෘත කරන ලදී. වර්ෂය තුළදී, "හෙළ බොජුන්" අලෙවි සැල් ආශ්‍රිතව ව්‍යවසායකයන් ලෙස ගෙවිලියන් 68ක් සේවයේ නියුක්ත කරවන ලදුව ව්‍යවසායකත්ව පුහුණු 56ක්ද පවත්වන ලදී.





"හෙළ බොජුන්" අලෙවි සැල, මාතර

නිට්ටඹුවේ "හෙළ බොජුන්" අලෙවි සැල විවෘත කිරීම



තින්නවෙලි "හෙළ බොජුන්" අලෙවි සැල

- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) තුළින් දේශීය හා විදේශීය වෙළඳපොල සඳහා උසස් තත්ත්වයේ ආරක්ෂිත කෘෂිකාර්මික නිෂ්පාදන සැපයීමට යාන්ත්‍රණයක් පිහිටුවීම පිළිබඳ ව්‍යාපෘතිය යටතේ, ගොවිපල 149ක් සහතික කරන ලද අතර ආදර්ශ ගොවිපල 22ක් ස්ථාපනය කරන ලදී. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහිත බවට සහතික කරන ලද ගොවිපල පිළිබඳ දත්ත සමුදාය ප්‍රවේශ 1900කින් යාවත්කාලීන කරන ලදී. විදේශ වෙළඳපොල සඳහා පලතුරු හා එළවළු ගබඩා 2,308ක ප්‍රමාණයක් GAP ප්‍රමිතීන් සඳහා පරීක්ෂා කරන ලදී.





නුවරඑළිය හා මාතර GAP සහතික ලත් ගොවිපල

- 2017 වර්ෂය තුළදී කෘෂිකර්ම විද්‍යාල වල NVQ 6 වන මට්ටමේ සිසුන් 617ක් සඳහා සහ NVQ 5 වන මට්ටමේ සිසුන් 340ක් සඳහා කෘෂිකර්ම ඩිප්ලෝමා පිරිනැමීමේ උත්සව (NVQ 5 හා 6) දෙකක් පවත්වන ලදී.









කෘෂිකර්ම ඩිප්ලෝමා ප්‍රදාන උත්සව

## තිළිණ

- බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද පරිසර තිළිණ ප්‍රදාන උත්සවයේදී මහා පරිමාණ හරිත ගොවිපල සඳහා වූ ජනාධිපති පරිසර තිළිණය, කිලිනොච්චි ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට හිමි විය.









- කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (CARP) විසින් සංවිධානය කරන ලද ජාතික තිළිණ ප්‍රදාන උත්සවයේදී වැව්ලි නොවන අංශයේ දෙවන ස්ථානය මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ගොවිපලට හිමිවිය.






# 1.1 ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහඉලුප්පල්ලම

මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (FCRDI) සහ ඊට අයත් අනෙකුත් සහායක ආයතන බෝග ප්‍රභේද හා අතිරේක ආහාර බෝග සංවර්ධනයට හා සමගාමී තාක්ෂණය වැඩිදියුණු කිරීම මෙන්ම උනන්දුවක් දක්වන පාර්ශ්වවලට එම තාක්ෂණය මූලික වශයෙන් බෙදා දීමත් බෝග ප්‍රභේද සැපයීමත් වැනි කාර්යයන් පිළිබඳ වගකීම දරයි. ශ්‍රී ලංකාවේ වෙනත් ක්ෂේත්‍ර බෝග (OFC) වශයෙන් කුළුබඩු (මිරිස් සහ ළූණු), රනිල ධාන්‍ය (මුං ඇට, කව්පි, උඳු), තෙල් බීජ බෝග (රටකජු, සෝයා බෝංචි, තල සහ සූරියකාන්ත සහ රළු ධාන්‍ය (බඩඉරිඟු, කුරක්කන්, ඉදල් ඉරිඟු සහ වෙනත් මෙනේරි ආදිය) හඳුනාගනු ලැබ තිබේ. වැඩිමනත් වශයෙන්, මෙම ආයතනයේ අධීක්ෂණය යටතට පැවරු සියළුම බෝගවල න්‍යෂ්ටික බීජ ප්‍රමාණවත් අන්දමින් නිපදවීමේ වගකීම ද මෙය සතුය. කලාපීය වශයෙන් වැදගත් වන වී, පලතුරු සහ එළවළු යනාදියෙහි ඵලදායිතාව ඉහළ නැංවීම ද වගකීම් අතරට එක්වෙයි. වියළි කලාපීය ආහාර බෝගවල ආවේණික ජනකප්ලාස්මවල නලස්ථ සංරක්ෂණය සහ බෝග ප්‍රවර්ධන වැඩසටහනේ දී ඒවායෙහි කාර්යක්ෂම භාවිතය මෙන්ම ජනකප්ලාස්මවල සුදුසු හඳුන්වාදීම ද FCRDI හි දී සිදු කෙරේ. මෙකී සියළු අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා FCRDI, ජාතික සහ අන්තර්ජාතික පර්යේෂණ සහ සංවර්ධන ආයතන, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශයේ සංවිධාන සමග සහයෝගිතාවයෙන් කටයුතු කරයි.

FCRDI පද්ධතිය, මහඉලුප්පල්ලම ප්‍රධාන පර්යේෂණ ආයතනය, අඟුණකොළපැලැස්ස මාෂ හා තෙල් බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (GLORDC), අරලගංවිල සහ කිලිනොච්චියෙහි පිහිටි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන (RARDC), තිරුනෙල්වේලි හා වවුනියාවේ පිහිටි කෘෂිකර්ම පර්යේෂණ ස්ථාන (ARS) යනාදී ආයතන/ මධ්‍යස්ථානවලින් සමන්විතය.

## අයවැය

**වගු අංක 1.1.1: 2017 වාර්ෂික අයවැය**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 17,751,866 | 12,757,786 | 72 |
| මූලධන | 16,867,941 | 12,796,026 | 76 |
| ව්‍යාපෘති | | | |
| • මිරිස්, බඩඉරිඟු සහ ළූණු වල දෙමුහුම් හා විවෘත පරාගිත ප්‍රභේද හඳුන්වාදීම | 43,000,000 | 22,960,000 | 53 |
| • NARP ව්‍යාපෘති | | | |
| ○ මුං | 1,370,000 | 1,344,794 | 98 |
| ○ වී | 773,300 | 490,990 | 63 |
| ○ ළූණු වල ව්‍යාධිවේදය | 532,000 | 531,467 | 100 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| • KOPIA ව්‍යාපෘති | | | |
| ○ මුං | 3,610,000 | 2,862,991 | 79 |
| ○ එළු | 10,884,000 | 4,244,650 | 39 |
| • NFPP ව්‍යාපෘති (MOA) | | | |
| ○ මිරිස් | 1,000,000 | 914,787 | 91 |
| ○ උඳු | 250,000 | 237,635 | 95 |
| **එකතුව** | **96,039,107** | **59,141,126** | **62** |

# ප්‍රගතිය

## බෝග ප්‍රවර්ධනය

### කුළු බඩු

#### මිරිස්

මිරිස් යනු ශ්‍රී ලංකාවේ ප්‍රධාන කුළුබඩු බෝගයකි. මිරිස් හා සම්බන්ධ වත්මන් බෝග ප්‍රවර්ධන වැඩසටහන මගින් ඉහළ අස්වැන්නක් (අමු මිරිස් හෙක්ටයාරයකට ටොන් 35 ට වැඩි) ලබා දෙන දෙමුහුම් සහ ජෛව ආතතියට (දිලීර රෝග, වෛරස් රෝග හා පළිබෝධ) සහ අජෛව ආතතියට (ආර්ද්‍රව ආතතියට) ප්‍රතිරෝධී/ ඔරොත්තු දෙන විවෘත පරාගිත මිරිස් ප්‍රභේද (අමු මිරිස් අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 20 ට වැඩි) කෙරෙහි අවධානය යොමු කෙරී ඇත.

හෙක්ටයාරයකට ටොන් 35 විභව අස්වැන්නක් ලබා දෙන බලාපොරොත්තු තැබිය හැකි මිරිස් දෙමුහුම් ප්‍රභේදයක් වගාව සඳහා නිදහස් කරනු ලැබිණ. එකී ප්‍රභේදය මිරිස් පත්‍ර හැකිලීමේ සංකීර්ණය. මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධීතාවක් දක්වයි.

- හෙක්ටයාරයකට ටොන් 28 ට වැඩි විභව අස්වැන්නක් සහිත බලාපොරොත්තු තැබිය හැකි මිරිස් දෙමුහුම් තුනක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂාව (NCVT) යටතේ අගයන ලදී.
- බලාපොරොත්තු තැබිය හැකි විවෘත පරාගිත ප්‍රභේද හඳුනා ගැනීම සඳහා දෙමුහුම් අභිජනන වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද බලාපොරොත්තු තැබිය හැකි අන්තර් අභිජනන ආර 3ක් NCVT යටතේ අගයන ලදී.
- හෙක්ටයාරයකට ටොන් 28 ට වැඩි විභව අස්වැන්නක් සහිත අමු මිරිස්වල බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් සයක් NCVT සඳහා තෝරා ගන්නා ලදී.
- මූලික අස්වනු පරීක්ෂාව (PYT) යටතේ දෙමුහුම් 36ක් අගයන ලද අතර එයින් දෙමුහුම් අටක් MYT සඳහා හඳුනා ගන්නා ලදී.
- උසස් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ සහිත ජනක ආර හයක් හඳුන්වා දෙන ලදී.
- මුහුම්කරණ 15ක් සිදු කරන ලද අතර අඩු පාංශු ජල තත්වයනට ඔරොත්තු දිය හැකි මිරිස් දෙමුහුම් හඳුනා ගැනීම සඳහා එක් එක් මුහුම්කරණයෙන් බීජ ග්‍රෑම් 25ක් බැගින් නිෂ්පාදනය කරන ලදී.
- අන්ත: අභිජනන මිරිස් දෙමුහුම් 51ක් ($F_7$ සිට $F_8$ දක්වා ප්‍රජනිත 11ක්, $F_5$ සිට ප්‍රජනිත 20ක්, $F_4$ සිට $F_5$ දක්වා ප්‍රජනිත 14ක් සහ $F_3$ සිට $F_4$ දක්වා ප්‍රජනිත 6ක්) ඉදිරියට ගෙන යන ලදී.

- අන්තර් විශේෂ මිරිස් දෙමුහුම් ප්‍රජනිත 41ක් ඉදිරියට ගෙන යන ලදී. $F_7$ සිට $F_8$ දක්වා ප්‍රජනිත 11ක් සහ $F_5$ සිට $F_6$ දක්වා ප්‍රජනිත 30ක්)

- ජානමය පුං වඳ (GMS) ලක්ෂණය සඳහා හේතුවන ජාන, බලාපොරොත්තු තැබිය හැකි ජනක ආර / අන්තර් අභිජනන ආර 3කට පිළි මුහුම්කරණය මගින් සම්ප්‍රේෂණය කරන ලදී. සිවුවන පිළි මුහුම්කරණයෙන් පසුව නිස්සාරණය කරන ලද බීජ ස්වයං පරාගණයට යටත් කරන ලද අතර GMS සම්ප්‍රේශිත ප්‍රජනිත හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍රයේ සිටුවන ලදී.

- $F_1$ දෙමුහුම් පරම්පරාවේ බීජ අස්වැන්න වැඩි කර ගැනීමේ අරමුණ සහිතව කලංක ග්‍රාහකත්වය මත පරාගනය සිදුවන කාලයේ බලපෑම හඳුනා ගැනීම සඳහා අධ්‍යයනයක් මෙහෙයවන ලදී. එකම දිනක උදෑසන 6.00 සිට 12.00 දක්වා පුමංගිහරණය කිරීමෙන් උපරිම ඵල හට ගැනීමේ ප්‍රතිශතය සහ උපරිම බීජ අස්වැන්න/ පැළ ප්‍රමාණයක් ලබා ගත හැකි බව අනාවරණ විය.

- සුදුසු පරාග රැස්කිරීමේ හා පුමංගීහරණ ක්‍රමයක් හඳුනාගත හැකි විය. ශ්‍රම පිරිවැය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන $F_1$ බීජ නිෂ්පාදන පිරිවැය 50%කින් කපා හැරීමට එමගින් හැකියාව ලැබිණ.

- ප්‍රභේද ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ දේශීය මිරිස් දෙමුහුම්, MICH HY 1 කිලෝග්‍රෑම් 18 ගොවීන් අතර බෙදා දෙන ලදී.

- අස්වැන්න සහ පලිබෝධ/ රෝග වලට ඔරොත්තු දීම/ ප්‍රතිරෝධිතාව සඳහා විදේශීය මිරිස් දෙමුහුම් හතලිස් තුනක් අගයන ලදී. වාණිජ වගාව සඳහා ඉහළ අස්වනු දෙන (අමු මිරිස් හෙක්ටයාරයකට ටොන් 18-25) 'හොට් පෙපර්' වර්ගයේ දෙමුහුම් හයක් අඩු පලිබෝධ සහ රෝග පැතිරීම සම්බන්ධයෙන් හඳුනාගන්නා ලදී.

## මිරිස් විවෘත පරාගිත ප්‍රභේද (OPVs) සංවර්ධනය

- දෙමාපිය ද්‍රව්‍ය පහළොවක් පවත්වාගෙන යන ලද අතර ස්වපරාගණය මගින් එක් වර්ගයකින් බීජ ග්‍රෑම් 50ක් නිෂ්පාදනය කෙරිණි.

- මිරිස්වල විවෘත පරාගිත ප්‍රභේදවල අන්තර් විශේෂ දෙමුහුම්කරණය සඳහා *Capsicum chinense* වල මව් ආර 14ක් සහ *C. frutescens* භාවිතා කෙරිණ. ස්වපරාගණය මගින් එක් එක් ප්‍රභේදයකින් ග්‍රෑම් 25ක් නිෂ්පාදනය කරන ලදී.

- නව අන්ත: විශේෂ මුහුම්කරණ විස්සක් සහ අන්තර් විශේෂ මුහුම්කරණ පහක් කෘත්‍රිම පුමංගිහරණය සහ පරාගනය මගින් බිහිකර ගන්නා ලදී. බීජ නිස්සාරණය කොට වියළා ගබඩා කරන ලදී.

- 2017 වර්ෂයේ දී පරම්පරා ඉදිරියට ගෙන යාමේ වැඩසටහන මගින් පහත ප්‍රජනිත ඉදිරියට ගෙන යන ලදී.

**වගු අංක 1.1.2: 2017 වසරේ දී මිරිස්වල පරම්පරා ඉදිරියට ගෙන යාම**

| පරම්පරාව | අන්ත: විශේෂ දෙමුහුම් කරණය | අන්තර් විශේෂ දෙමුහුම් කරණය |
|---|---|---|
| $F_1$ | ප්‍රජනිත 30ක් සමගින් මුහුම්කරණ 6ක් | ප්‍රජනිත 12ක් සමගින් මුහුම්කරණ 2ක් |

| පරම්පරාව | අන්ත: විශේෂ දෙමුහුම් කරණය | අන්තර් විශේෂ දෙමුහුම් කරණය |
|---|---|---|
| $F_2$ | ප්‍රජනිත 35ක් සමඟින් මුහුම්කරණ 7ක් | ප්‍රජනිත 6ක් සමඟින් මුහුම්කරණ 3ක් |
| $F_3$ | ප්‍රජනිත 50ක් සමඟින් මුහුම්කරණ 10ක් | ප්‍රජනිත 10ක් සමඟින් මුහුම්කරණ 2ක් |
| $F_4$ | ප්‍රජනිත 60ක් සමඟින් මුහුම්කරණ 12ක් | ප්‍රජනිත 4ක් සමඟින් මුහුම්කරණ 2ක් |
| $F_5$ | ප්‍රජනිත 45ක් සමඟින් මුහුම්කරණ 9ක් | |
| $F_6$ | ප්‍රජනිත 35ක් සමඟින් මුහුම්කරණ 7ක් | |
| $F_7$ | ප්‍රජනිත 65ක් සමඟින් මුහුම්කරණ 13ක් | |
| $F_8$ | ප්‍රජනිත 50ක් සමඟින් මුහුම්කරණ 10ක් | |

- වෛරසවලට ඔරොත්තු දීමේ ලක්ෂණය සම්ප්‍රේෂණය කිරීම සඳහා නිර්දේශිත ප්‍රභේද වැරණියා 1 (මුහුම්කරණ 7) සහ වැරණියා දම් (වැරණියා පර්පල්) (මුහුම්කරණ 4ක්) සමග පිළිමුහුම්කරණයට ලක් කරන ලදී. ක්ෂේත්‍ර ඇගයීම සඳහා ආර 4ක් හඳුනාගන්නා ලදී.
- වරණය, ඇගයීම සහ වැඩිදියුණු කිරීම යටතේ වැරණියා කොළ ප්‍රභේදයේ පැළ 10,000 - 15,000කින් සමන්විත ශාක ගහණයක් පවත්වාගෙන යන ලදී. ග්‍රෑම් 500 බීජ තොගයක් නිස්සාරණය කර ගන්නා ලදී.
- යාපනය වරණයෙහි වැඩිදියුණු කළ ගහණයක් වන "හේන් මිරිස්" නමැති භූමි දර්ශය සහ බලාපොරොත්තු තැබිය හැකි විවෘත පරාගිත ආර තුනක් NCVT යටතේ පරීක්ෂා කරන ලදී. හේන් මිරිස් සහ යාපනය වරණයෙහි බීජ ග්‍රෑම් 500ක් නිෂ්පාදනය කෙරිණ .
- තෝරා ගනු ලැබූ ආර 9ක් PYT සහ ප්‍රධාන අස්වනු පරීක්ෂාව යටතේ (MYT) අගයන ලදී. බලාපොරොත්තු තැබිය හැකි ආර තුනක් NCVT සඳහා තෝරා ගන්නා ලදී.
- ප්‍රවේණි විවිධත්වය තක්සේරු කිරීම සඳහා *Capsicum chinense* සහ *C. frutescens* එකතුන් 13ක් රූපීය ලක්ෂණ සහ අණුකමය ක්‍රමවේද අනුව ලාක්ෂණිකරණය කරන ලදී. රූපීය ලක්ෂණ 12ක් විශ්ලේෂණය කරන ලදී. විචලතා විශ්ලේෂණය (ANOVA) මගින් පරීක්ෂා කරන ලද බොහොමයක් ලක්ෂණ සඳහා ප්‍රවේණි දර්ශ අතර සැලකිය යුතු වෙනසක් පවතින බව හඳුනා ගන්නා ලදී. පියර්සන් සහසම්බන්ධතා සංගුණකය මගින් පෙන්නුම් කරන ලද්දේ සංසන්දනය කරන ලද වැඩිමනත් රූපවිද්‍යාත්මක ලක්ෂණ අතර සැලකිය යුතු ධනාත්මක සහසම්බන්ධතාවක් පෙන්නුම් කළ බවයි. ප්‍රධාන සංරචක (PC) ඇගයීම මගින් අගයන ලද ලක්ෂණ අතුරින් මුල් සංරචක 3 සඳහා සමස්ථ විචලතාවයෙන් 71%ක් විස්තර කරන

ලදී. පැළයේ උස, වියනේ පළල, 50%ක් පුෂ්පීයකරණය සඳහා ගතවන දින ගණන, පැළයකට ඇති කරල් ගණන සහ අස්වැන්න අතර ධනාත්මක සහසම්බන්ධතාවක් පෙන්නුම් කෙරින. මාළු මිරිස් (*Capsicum*) එකතුන් 13ක් සඳහා මයික්‍රො සැටලයිට් සලකුණු (මාර්කර්ස්) 15කින් සමස්ථ ඇළීල 15ක සංඛ්‍යාවක් හඳුනාගන්නා ලදී. ප්‍රවේණි විවිධත්වය 0.51ක සමාන්‍යයකින් යුතුව 0.00 සිට 0.75 දක්වා පරාසයක විහිදිණි. එකතුන් 13 හි එක් එක් ප්‍රභේදයෙන් බීජ ග්‍රෑම් 10ක් නිෂ්පාදනය කරන ලද අතර වැඩිදුර සංරක්ෂණය සඳහා ඒවා PGRC වෙත ලබා දෙන ලදී.

### ළූණු

ළූණු බෝගය වැඩි දියුණු කිරීමේ වැඩසටහන පවත්වාගෙන යනු ලබන්නේ දීර්ඝ කාලයක් (මාස 4ක ගබඩාකරණයකදී හානිය < 25%) ගබඩා කර තබා ගත හැකි සහ ප්‍රධාන පලිබෝධ සහ රෝග ආසාදනවලට ඔරොත්තු දෙන / ප්‍රතිරෝධී ඉහළ අස්වනු දෙන (හෙක්ටයාරයකට ටොන් 40) කෙටිකාලීන ලොකු ළූණු ප්‍රභේද බිහිකර ගැනීමේ අරමුණෙනි. පොකුරු ළූණු අභිජනන වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වන්නේ අවාරයේ දී ලොකු ළූණු වෙනුවට විශාල බල්බ සමූහවලින් සමන්විත, ඉහළ අස්වනු (හෙක්ටයාරයකට ටොන් 25) ලබා දෙන බීජ දරන්නා වූ පොකුරු ළූණු සංවර්ධනය කිරීමයි.

- 2017 වසරේ යල කන්නයේ දී තෝරා ගනු ලැබූ ලොකු ළූණු ආර FCRDI - මහඉලුප්පල්ලම, ARS - තිරුනෙල්වේලි සහ වීරවිල හි දී අගයන ලදී. හඳුනාගනු ලැබූ බලාපොරොත්තු තැබිය හැකි ආරවලට වඩා පසුගිය වසර 3 තුළ යහපත් කාලගුණික තත්ත්වයන් යටතේ සිදුකළ ක්ෂේත්‍ර අත්හදා බැලීම් වලින් තෝරා ගත් MIBO 1 වඩා හොඳ කාර්යක්ෂමතාවක් පෙන්නුම් කළේය.
- MIClO 09-01 (රෝස) නමැති, බීජ නිෂ්පාදනය කරන්නාවූ පොකුරු ළූණු ප්‍රභේදය වගාව සඳහා කොන්දේසි සහිතව නිදහස් කරන ලදී. එය විශාල පොකුරු නිෂ්පාදනය කරන අතර බීජ නිෂ්පාදනය සඳහා උචිතය. මෙම ප්‍රභේදයේ වාර්තාගත ඉහළම පොකුරු අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 29.6කි.
- ලොකු ළූණුවලට ආදේශකයක් වශයෙන් විශාල බල්බ සමූහ සහිතව පොකුරු ළූණු නිෂ්පාදනය කිරීමේ අරමුණින් ලොකු ළූණු සහ පොකුරු ළූණු මුහුම්කරණය සිදු කරන ලදී. ආර විසිහතරක් තෝරා ගන්නා ලද අතර තුන්වන දරු පරම්පරාව ($F_3$) දක්වා ඉදිරියට ගෙන යන ලදී.
- ළූණුවල ප්‍රවේණි විවිධත්වය අරමුණු කර ගනිමින් ජනකප්ලාස්මා ගවේෂණය සහ දේශීය හා විදේශීය ආර මුහුම්කරණය සිදු කෙරිණ. දෙවන දරු පරම්පරා දෙකක් ඉදිරියට ගෙන යන ලදී.

## රළු ධාන්‍ය

### බඩ ඉරිඟු

- හිතකර පරිසර පද්ධතිවල වගා කිරීමෙන් හෙක්ටයාරයකට ටොන් 8ක අස්වැන්නක් ලබා දෙන බඩඉරිඟු දෙමුහුම් ප්‍රභේද සංවර්ධනය සඳහා මෙන්ම තෙතමන ආතතිය පවතින පරිසර පද්ධති සඳහා බඩ ඉරිඟු දෙමුහුම් මෙන්ම අන්තර් අභිජනන ජනක ආර සංවර්ධනය පිණිස බඩඉරිඟු අභිජනන වැඩසටහනක් සැලසුම් සිදු කරන ලදී.
- 'CLYQ220/ CL02450Q' සහ 'CLYQ203/ CLYQ221' යනාදී දෙමුහුම් දෙවර්ගය VAT තුළ ඇගයීමෙන් පසු හෙක්ටයාරයකට

ටොන් 5-6 පමණ සාමාන්‍ය අස්වැන්නක් පෙන්නුම් කළේය.

- CIMMYT - ඉන්දියා ප්‍රභේදයෙන් ලබා ගත් තෝරා ගනු ලැබූ නියඟයට ඔරොත්තු දෙන බඩඉරිඟු ප්‍රභේද 12ක් පර්යේෂණ CVAT තුළදී මෙන්ම ගොවි ක්ෂේත්‍රවලදී ද අත්හදා බලන ලදී. ඉහළ අස්වනු දෙන (හෙක්ටයාරයකට ටොන් 6-7) දෙමුහුම් පහක් වැඩිදුරටත් වැටි තුළ ඇගයීම පිණිස තෝරා ගන්නා ලදී.
- CIMMYT සහ අන්තර් අභිජනන ආර මගින් නව බඩඉරිඟු තනි මුහුම්කරණ විස්සක් අස්වැන්න සඳහා අගයන ලදී. දෙමුහුම් හතරක් පරීක්ෂා දෙමුහුම් ප්‍රභේදය සමඟ සංසන්දනාත්මක අස්වැන්නක් (හෙක්ටයාරයකට ටොන් 5-6) පෙන්නුම් කළේ ය.
- බලාපොරොත්තු තැබිය හැකි බඩඉරිඟු ප්‍රභේද දහයක් ස්ථාන තුනකදී NCVT තුළ අගයන ලද අතර එක් මුහුම්කරණයක් පරීක්ෂා මුහුම සමඟ සැසඳිණි.
- තනි මුහුම්කරණයට ලක් කොට දේශීය වශයෙන් සංවර්ධිත බඩඉරිඟු අගයන ලදී. බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම්කරණ සහ ඒවායෙහි ජනක ආර වැඩිදුර ඇගයීම සහ මුහුම්කරණ වැඩසටහන් සඳහා තෝරා ගන්නා ලදී.
- විවිධ පෞද්ගලික ආයතනවලින් ලබා ගත් විදේශීය බඩඉරිඟු දහයක් පරීක්ෂා කරන ලදී. Champ 5555, Var 153, Tech 153 සහ Tech 188 Tabimdang නමැති බඩඉරිඟු සමාන්‍ය වගාව සඳහා ආනයනය කිරීමට නිර්දේශ කරන ලදී.
- MI බඩඉරිඟු දෙමුහුම් 01 (CML -161, CML-194) හි ජනක ආර ගැමා ප්‍රවිකිරණයට ලක් කරන ලද අතර වැඩිදුර වරණය සඳහා M2 ක්ෂේත්‍රයේ ස්ථාපනය කරන ලදී.

## කුරක්කන්

- කුරක්කන් අභිජනන වැඩසටහනේ අරමුණ වන්නේ හෙක්ටයාරයකට ටොන් 3.5ක විභව අස්වැන්නක් දෙන කෙටි කාලීන (දින 75 - 85) සහ මධ්‍යස්ථ වයසැති (දින 100 - 110) ප්‍රභේද සංවර්ධනයයි.
- VAT සඳහා හෙක්ටයාරයකට ටොන් 3.0 - 3.75ක සාමාන්‍ය අස්වැන්නක් ලබා දෙන බලාපොරොත්තු තැබිය හැකි කුරක්කන් ආර තුනක් තෝරා ගන්නා ලදී.
- ICRISAT- ඉන්දියා වලින් ලබා ගත් කුරක්කන් එකතුන් අටක්, නිර්දේශිත ප්‍රභේද දෙකක් සමඟ අගයන ලදී. එම එකතුන් හෙක්ටයාරයකට ටොන් 2.5 - 3ක පමණ සාමාන්‍ය ධාන්‍ය අස්වැන්නක් පෙන්නුම් කළේ ය.
- මිශ්‍ර ගහණයෙන් තෝරා ගනු ලැබූ බලාපොරොත්තු තැබිය හැකි කුරක්කන් ආර හයක් අගයන ලදී. එම ආර යල සහ මහ යන කන්න දෙකෙහි දීම හෙක්ටයාරයකට ටොන් 3.5 - 3.75ක පමණ අස්වැන්නක් පෙන්වීය. බලාපොරොත්තු තැබිය හැකි එක් ආරක් NCVT සඳහා තෝරා ගන්නා ලදී.
- පූර්ව කන්නයේ මුහුම්කරණයෙන් සංවර්ධනය කරගන්නා ලද එක් තොග ගහණයක් වරණය සඳහා සංස්ථාපනය කරන ලදී. සිවුවන තොග ගහනයෙන් පෙළපත් ආර 15ක් වැඩිදුර වරණය සහ ඇගයීම සඳහා තෝරා ගන්නා ලදී.
- නිර්දේශිත කුරක්කන් ප්‍රභේද දෙකක බීජ ගැමා කිරණ මාත්‍රා සතරකින් ප්‍රතිකාර කරන ලදී. මෙම විකෘති ප්‍රභේද දෙකෙහි M1 පරම්පරාවේ බීජ ක්ෂේත්‍රයේ සංස්ථාපනය සඳහා තෝරා ගන්නා ලදී.

### ඉදල් ඉරිඟු

- බලාපොරොත්තු තැබිය හැකි ඉදල් ඉරිඟු එකතුන් දෙකක් VAT තුළ අගයන ලදි. මෙම එකතුන් හෙක්ටයාරයකට ටොන් 3.5 - 4.0ක පමණ දළ අස්වැන්නක් පෙන්නුම් කළේය.

### ස්වීට් සෝගම්

- ඉහළ ජෛව ස්කන්ධයක් සහ බ්‍රික්ස් අගයක් සහිත ප්‍රභේද සංවර්ධනය කිරීම සඳහා ගැමා ප්‍රවිකිරණයෙන් ලබා ගත් ගහණ M5 පරම්පරා මට්ටම දක්වා ඉදිරියට ගෙන යන ලදී.

### තණ හාල්

- බලාපොරොත්තු තැබිය හැකි තණ හාල් එකතුන් පරීක්ෂා කෙරිණ. මෙම එකතුන් හෙක්ටයාරයකට ටොන් 2.5 - 3.0ක පමණ සාමාන්‍ය ධාන්‍ය අස්වැන්නක් පෙන්නුම් කළේය.

### විළඳ ඉරිඟු

- ඉහළ අස්වැන්නක් සඳහා ලබාගත් 3 වන පිළිමුහුම්කරණ ගහණය ඉදිරියට ගෙන යන ලදී. සිවුවන පිළිමුහුම් පරම්පරාව ක්ෂේත්‍රයේ ස්ථාපනය කෙරෙනු ඇත.
- දේශිය වශයෙන් සංවර්ධිතව පවත්නා අන්තර් අභිජනන ආර සහ ඇගයීම් ක්‍රියාවලිය භාවිතයෙන් විළඳ ඉරිඟු මුහුම්කරණ 16ක් සංවර්ධනය කරන ලදි. ඇගයීම් ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කෙරේ.
- පවතින හුදෙකලා ගහන භාවිතයෙන් අන්තර් අභිජනන ආර 15ක් සංවර්ධනය කරන ලද අතර එම ආර S5 පරම්පරාවේ පවතියි.

## ධාන්‍ය රනිල

### මුං

- බෝග කාලය දින 60-80 වන ජෛව හා අජෛව ආතතිවලට ඔරොත්තු දෙන/ප්‍රතිරෝධි ඉහළ අස්වනු දෙන (හෙක්ටයාරයකට ටොන් 2.5 ට වැඩි) ප්‍රභේද සංවර්ධනය, මුං අභිජනන වැඩසටහනේ අරමුණයි. වත්මන් බෝග ප්‍රවර්ධන වැඩසටහනේ විශේෂත්වයක් ගන්නා සමමුහුර්තක පරිණතිය ද තවත් එක් අරමුණකි.
- අවශ්‍ය ලක්ෂණවලින් යුත් ඉහළ අස්වනු දෙන ප්‍රභේද සංවර්ධනය පිණිස පූර්ව කන්නයේ දී අගයන ලද තෝරා ගනු ලැබූ ජනක ශාක භාවිතයෙන් නව මුහුම්කරණ සිදු කරන ලදී. පළමු වන දුහිතෘ පරම්පරාව ($F_1$) ක්ෂේත්‍රයේ සංස්ථාපනය කරන ලද අතර දෙවන දුහිතෘ පරම්පරාව ($F_2$) දක්වා ඉදිරියට ගෙනයන ලදී. දෙවන, තුන්වන සහ හතරවන ($F_2$, $F_3$, සහ $F_4$) දරු පරම්පරා තොග ගහණයක් වශයෙන් පවත්වාගෙන යන ලදී. සිවුවන දරු පරම්පරාවෙන් ශාක තනි තනිව තෝරා ගෙන ඒවා පස්වන දරු පරම්පරාව දක්වා ඉදිරියට ගෙන යන ලද අතර ප්‍රජනිත වශයෙන් සිටුවන ලදී. PYT සඳහා පස්වන දරු පරම්පරාවෙන් අවශ්‍ය ලක්ෂණ සහිත ප්‍රජනිත 79ක් තෝරා ගැණින.
- අස්වැන්න හා වෙනත් පරාමිතීන් සඳහා බලාපොරොත්තු තැබිය හැකි මුං ආර 19ක් අගයන ලදී. වැඩිදුර අත්හදා බැලීම් සඳහා බලාපොරොත්තු තැබිය හැකි ආර හයක් වරණය කර ගන්නා ලදී.
- NCRVT යටතේ ස්ථාන 7ක දී බලාපොරොත්තු තැබිය හැකි ආර දෙකක අනුවර්ත්‍යතාව සහ ස්ථායිතාව පරීක්ෂා කරන ලදී. ප්‍රභේද අනුවර්තිතා පරීක්ෂාව (VAT) යටතේ අත්හදා බැලිම පිණිස ඒවා තෝරා ගැණින.

### කව්පි

- කව්පි අභිජනන වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ පලිබෝධ සහ රෝගවලට ඔරොත්තු

දීම/ප්‍රතිරෝධීතාව දැක්වීම යනා දි අවශ්‍ය ලක්ෂණ ද සමඟ ජල සම්පාදිත තත්ත්ව යටතේ සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 3.0 වන සහ වැසි පෝෂිත තත්ත්ව යටතේ හෙක්ටයාරයකට ටොන් 2.0 ට වැඩි අස්වැන්නක් ලබා දෙන ප්‍රභේද සංවර්ධනය කිරීමයි

- අවශ්‍ය ලක්ෂණයන්ගෙන් යුත් ඉහළ අස්වනු දෙන ප්‍රභේද සංවර්ධනය කිරිම සඳහා නියඟයට ඔරොත්තු දෙන ලක්ෂණ සහිත ඉහළ අස්වැන්නක් ලබා දෙන තෝරාගත් ජනක ශාක යොදා ගනිමින් නව මුහුම්කරණ සිදුකරන ලදී. පළමුවන සහ දෙවන දරු පරම්පරාවලින් පිළිවෙලින් දෙවන දරු පරම්පරා පහකින් ද තුන්වන දරු පරම්පරා හතරකින් ද සමන්විත ගහණ තෝරා ගෙන පරම්පරා ඉදිරියට ගෙන යාම සඳහා තොග ගහණ වශයෙන් ක්ෂේත්‍රයේ ස්ථාපනය කරන ලදී. සිවු වන දරු පරම්පරාවෙන් තෝරාගනු ලැබූ මුහුම්කරණ දෙකක් සහ පස්වන දරු පරම්පරාවෙන් තෝරා ගනු ලැබූ මුහුම්කරණ තුනක් මීළඟ පරම්පරාව දක්වා ඉදිරියට ගෙන යන ලදී.
- බලාපොරොත්තු තැබිය හැකි ආර 20ක අස්වැන්න සහ වෙනත් පරාමිතීන් පරීක්ෂා කිරීම සඳහා PYT සිදු කරන ලදී. ඉදිරි කන්නයේ දී AYT තුළ පරීක්ෂා කිරීම සඳහා ආර 12ක් තෝරාගන්නා ලදී.
- විවිධ කෘෂි-පාරිසරික කලාපවලට දක්වන අනුවර්තාතාව සහ ස්ථායිතාව සඳහා බලාපොරොත්තු තැබිය හැකි ආර සතරක් NCVT අත්හදා බැලීම් තුළ අගයන ලදී. එසේ වුව ද මෙම ආර අතුරින් කිසිවක් නිර්දේශිත ප්‍රභේද වලට වඩා යහපත් කාර්යසාධනයක් නොපෙන්වීය.

### උඳු

- උඳු අභිජනන වැඩසටහන මගින් කෙටි/ මධ්‍යස්ථ /දිගු යනාදි කාල පරාසයක් සහිත පලිබෝධ/රෝග ආසාදනවලට ඔරොත්තු දෙන / ප්‍රතිරෝධී ඉහළ අස්වැන්නක් ලබා දෙන (හෙක්ටයාරයකට ටොන් 2.5 ට වැඩි සාමාන්‍ය අස්වැන්නක්) ප්‍රභේද සංවර්ධනය අරමුණු කෙරේ.
- අවශ්‍ය ලක්ෂණවලින් සමන්විත ඉහළ අස්වනු දෙන ප්‍රභේද ගොඩනැගීම සඳහා තෝරා ගනු ලැබූ ජනක ශාක භාවිතයෙන් නව දෙමුහුම් සිදු කරන ලදී. පෙර මුහුම්කරණ මගින් ලබා ගත් පරම්පරා ඉදිරියට ගෙන යන ලදී. PYT හි අත්හදා බැලීම සඳහා අවශ්‍ය ලක්ෂණයන්ගෙන් යුත් ආර පනස් අටක් තෝරා ගැණින.
- බලාපොරොත්තු තැබිය හැකි ආරවල අස්වැන්න සහ වෙනත් පරාමිතීන් පරීක්ෂා කරන ලදී. (2015 වසරේ යල කන්නයේ දී ආර 18ක් තෝරා ගන්නා ලදී.)

## තෙල් බෝග

### සෝයා බෝංචි

- සෝයා බෝංචි අභිජනන වැඩසටහනේ අරමුණ වන්නේ ජල සම්පාදිත තත්ත්ව යටතේ සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 5 ද වර්ෂාපෝෂිත තත්ත්ව යටතේ සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 3 ද වන සේ වර්ධන චර්යාව, විශාල බීජ සහ පලිබෝධ හා රෝග ආසාදනවලට ඔරොත්තු දෙන/ ප්‍රතිරෝධී යනා දී අවශ්‍ය ලාක්ෂණිකයන්ගෙන් යුත් ප්‍රභේද සංවර්ධනයයි.
- පරම්පරා ඉදිරියට ගෙන යාම සඳහා සිවුවන දරු පරම්පරාවේ ගහණ 6ක් ද තුන්වන දරු පරම්පරාවේ ගහණ 3ක් ද දෙවන පරම්පරාවේ ගහන 8ක් ද තොග ගහන වශයෙන් ක්ෂේත්‍රයේ ස්ථාපනය

කරන ලදී. පස්වන දරු පරම්පරාවේ මුහුම්කරණ 3කින් තෝරා ගනු ලැබූ ප්‍රජනිත සයවන දරු පරම්පරාව දක්වා ඉදිරියට ගෙන යන ලදී.

- ආසියානු එළවළු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (AVRDC) වෙතින් ලබා ගත් සෝයා බෝංචි ආර සතරක් සහ උඳු බීජ ආර දෙකක් විවිධ කෘෂි පාරිසරික කලාපවල අනුවර්තතාව සහ ස්ථායිතාව නිශ්චිත කරලීම සඳහා අගයන ලදී.
- මිචිගන් රාජ්‍ය විශ්ව විද්‍යාලයෙන් ලැබුණු ආරවල ජනකප්ලාස්ම ඇගයීම මගින් බලාපොරොත්තු තැබිය හැකි ආර අටක් තෝරා ගැණින.
- Pb 01 ප්‍රභේදයේ බීජ 50 kr, 100 kr, 150 kr, 200 kr සහ 250 kr ප්‍රබලතාවෙන් ප්‍රකිරණයට ලක්කොට ලබා ගත් M5 පරම්පරාවේ Pb 01 හි වඩා හොඳ ලක්ෂණවලින් යුත් ශාක M6 පරම්පරාව බිහිකිරීම සඳහා තෝරා ගන්නා ලදී.

## එළවළු

- වට්ටක්කාවල බලාපොරොත්තු තැබිය හැකි ආර සඳහා NCVT අත්හදා බැලීම් මාකඳුර RARDC මගින් සම්බන්ධීකරණය කරන ලද අතර වම්බටුවල බලාපොරොත්තු තැබිය හැකි ආර සඳහා අත්හදා බැලීම් ගන්නෝරුව HORDI මගින් සම්බන්ධීකරණය කෙරිණ. ප්‍රතිඵල අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී.

## පලතුරු

- අඹ, පේර, මිටි මුරුංගා, ඩ්‍රැගන් ෆෘට් සහ මිදි සඳහා ජනකප්ලාස්මා ස්ථාපනය හා නඩත්තුව අඛණ්ඩව සිදු කරන ලදී.
- වියළි කලාපයේ වැදගත් බහුවාර්ෂික බෝග විශේෂවල ජාන සම්පත් සංරක්ෂණය සඳහා වියළි කලාපීය ක්ෂේත්‍ර ජාන බැංකු පවත්වාගෙන යන ලදී. විශේෂ හැටක පැළැටි දෙසිය හතලිහක් සංස්ථාපනය කොට පවත්වාගෙන යන ලදී.

## ශෂ්‍ය විද්‍යාව

- වියළි කාලයේ දී පසේ අඩු තෙතමන තත්ත්ව යටතේ මුං, මිරිස් සහ බඩඉරිඟු යනාදියට පැවතිමේ හැකියාව සහ ක්‍රියාකාරි හැකියාව සොයා බැලීම පිණිස ඒවායෙහි ප්‍රවේණි දර්ශ පරීක්ෂා කරන ලදී. විවෘත පාරිසරික තත්ත්ව යටතේ පරීක්ෂා කරන ලද මුං සහ බඩඉරිඟු ආර පිළිවෙලින් 30ක් හා 40ක් වූ අතුරින් අඩු පාංශු තෙතමන තත්ත්වයක් යටතේ පරීක්ෂා කරන ලද වෙනත් ආරවලට සාපේක්ෂව මුං ආර තුනක් ද බඩඉරිඟු ආර දෙකක්ද සාපේක්ෂව වඩා හොඳ කාර්ය සාධනයක් පෙන්වීය. පරීක්ෂා කරන ලද ආර පනස් හතකින් අනෙකුත් ආරවලට සාපේක්ෂව මිරිස් ආර තුනක් අඩු පාංශු තෙතමන තත්ත්වයක් සඳහා මනා කාර්යසාධනයක් පෙන්නුම් කළේය.
- වියත් උෂ්ණත්වය මත සපුෂ්පික අවධියේ දී පාංශු තෙතමනයේ බලපෑම හා වී වල පරාග හා ශුකිකාවේ සරු බවට වන බලපෑම පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරන ලදී. පසේ පරිමාමිතික තෙතමන ප්‍රමාණය 16% දක්වා පහත වැටුණ විට වියත් උෂ්ණත්වය ඉහළ ගිය අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් පරාග ශුකිකාවේ සරුබව හා ධාන්‍ය අස්වැන්න කෙරෙහි බලපෑම් ඇති විය.
- නිර්දේශිත වී ප්‍රභේද දහසයක් සහ සාම්ප්‍රදායික වී ප්‍රභේද පහක් ජල ආතති තත්ත්ව යටතේ (අඩු පාංශු තෙතමන තත්ත්ව යටතේ) වියත් සිසිලන හැකියාව සඳහා පරීක්ෂා කරන ලද අතර එහි අරමුණ වූයේ වී වල වියත් සිසිලන හැකියාව සම්බන්ධයෙන් ජානමය හා පාරිසරිකමය වෙනස් වීම

හඳුනා ගැනීමය. Bg 300 සහ Bg 358 පරීක්ෂා ප්‍රභේද ඇතුළත්වන ලෙස අවම වශයෙන් ප්‍රභේද තුනක හෝ "O" හැඩයට පත්‍රය හැකිලෙන අවස්ථාව දක්වා ප්‍රජනක සමයේ දී ජල ආතතිය ක්‍රියාත්මක කරන ලදී. පත්‍රයේ වියළි බර, ඡත්‍රමය පත්‍රය සහ කඳ අතර කෝණය, වියනේ උස සහ පඳුරු සංඛ්‍යාව ඉහළ උෂ්ණත්වයේ දී සහ නියං ආතති තත්ත්ව යටතේ දි වී වල වියන් සිසිලන හැකියාව මත සුවිශේෂී බලපෑමක් ඇති කළේ ය.

- ලොකු ළූණු බල්බ අස්වැන්න කෙරෙහි කාබනික වසුන් යෙදීමෙහි බලපෑම සොයා බැලීම සඳහා පරීක්ෂණයක් සිදු කරන ලද අතර පිදුරු වසුන් බල්බ අස්වැන්න කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ බව අනාවරණය විය. පිදුරු වසුන් යෙදූ විට සාමාන්‍ය බල්බ අස්වැන්න යල කන්නයේ දී හෙක්ටයාරයකට ටොන් 38 වුවත් මහ කන්නයේ දී එය හෙක්ටයාරයකට ටොන් 27 පමණ විය. වසුන් නොයෙදූ තත්ත්ව යටතේ දී යල සහ මහ කන්න සඳහා අස්වනු වැඩි වීම පිළිවෙලින් 32% පමණ සහ 15% පමණ විය.
- මිරිස්වල වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ක්ෂුද්‍ර සහ මහා පෝෂකවල බලපෑම අගයන ලදී. කාබනික ද්‍රව්‍ය සමඟ යෙදූ විට ක්ෂුද්‍ර පෝෂකවල බලපෑමක් නොමැති බව සොයා ගැණින. එසේ වුවත් වර්ධනය වර්ධක හෝර්මෝන භාවිතයෙන් දිරිගැන්වුව ද අස්වැන්න කෙරෙහි සුවිශේෂී බලපෑමක් නිරීක්ෂණය නොවී ය.
- විදේශීය සහ දේශීය බඩ ඉරිඟු දෙමුහුම් යොදා ගෙන සිදු කරන ලද අධ්‍යයනයෙන් සනාථ වූයේ සමානුපාතික නයිට්‍රජන් වැඩි කිරීමකින් 45 cm x 30 cm පරතරයක ශාක ඝනත්වය හෙක්ටයාරයකට පැළ 74,074 දක්වා වැඩි කළ හැකි බවයි. වත්මන් භාවිතාවනට සාපේක්ෂව අස්වනු ලාභය 20% - 25% ක් විය.
- මිරිස් ප්‍රභේද හතක් සඳහා පත්‍ර වර්ණ සටහන් ක්‍රමාංකනය කිරීම සඳහා (Leaf Colour Chart (LCC)) පරීක්ෂණයක් මෙහෙයවන ලදී. කේට් සහ නෙල්සන් චිත්‍රණ ක්‍රමය අනුව වඩා හොඳ අස්වැන්නක් සැපයීමට නම් පරීක්ෂා කරන ලද මිරිස් ප්‍රභේද වලට (MI 2, KA 2, ගල්කිරියාගම වරණය, MI ග්‍රීන්, MICH 3, වැරණියා සහ MICH HY1) බෝග කාලය පුරාම LCC අගය 4ක් හෝ ඊට ඉහළ අගයක තිබිය යුතුය.
- පත්‍රවලට ඉසින දියරයක් වශයෙන් ඇල්බර්ට් මිශ්‍රණය හරහා අතිරේක පෝෂක සපයන අතරම මිරිස්වල වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ශාක වර්ධක හෝර්මෝනවල බලපෑම පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. ශාකවල වියළි බර සඳහා වර්ධක හෝර්මෝන හෝ ඇල්බර්ට් මිශ්‍රණය තනිව ගත් කළ බලපෑමක් නොපෙන්විය. ඇල්බර්ට් මිශ්‍රණය තනිව ගත් කළ අමු මිරිස් අස්වැන්න කෙරෙහි බලපෑමක් නොපෙන්වීය. එසේ වුව ද ශාකවලට අතිරේක පෝෂක යෙදූ විට ශාක වර්ධක හෝර්මෝනවල බලපෑම කැපී පෙනිණි.

## බෝග ආරක්ෂණය

### ව්‍යාධිවේදය

- ළූණුවල කළු දිලීර සංකීර්ණය හඳුනාගැනීම සඳහා පරීක්ෂණයක් මෙහෙයවන ලදී. ගොවි ක්ෂේත්‍ර 21කින් දිලීර සම්පාත සහිත ළූණු මල් නියැදි එක් රැස් කර ගන්නා ලදී. ළූණු මල් සහ බල්බවලට බලපාන කළු දිලීරයේ ව්‍යාධිජනකයා ඇස්පර්ජිලස් විශේෂයක් බව (*Aspergillus* spp.) තහවුරු විය. කළු දිලීර ආසාදිත ළූණු මල්වලින් සහ බල්බවලින් වෙන්කර ගන්නා ලද

*Aspergillus* ආධාරයෙන් බල්බ ආමුකුලනය කළ විට සමාන කළු දිලීර සම්පාත නිරීක්ෂණය විය. ළූණු ක්ෂේත්‍රයෙන් ලබා ගන්නා ලද පාංශු නියැදි වලින් *Trichoderma* වෙන් කර ගන්නා ලදී. ප්‍රතිවිරුද්ධතා අධ්‍යයනය මගින් පෙන්නුම් කළේ *Trichoderma* මගින් කාර්යක්ෂම ලෙස *Aspergillus* spp. පාලනය කෙරුණු බවයි.

- දඹුල්ල වරණය සහ වේදාලන් (Vethalan) පරීක්ෂා ප්‍රභේද සමඟ විදේශීය ළූණු ආර එකොළහක් ඇන්ත්‍රැක්නෝස් සඳහා අගයන ලදී. සියලුම ආර රෝගයට දැඩිව ගොදුරුවන/ ගොදුරු වීමේ ප්‍රතික්‍රියතාවක් දක්වන බව පෙන්නුම් කළේය.
- බලාපොරොත්තු තැබිය හැකි දේශීය මිරිස් දෙමුහුම් ආර දහයක් විජය සහ MICH HY1 යන පරීක්ෂා ප්‍රභේද සමග 2016/17 මහ කන්නයේ සහ 2017 යල කන්නයේ දී CLCV සඳහා පරීක්ෂා කරන ලදි. මිරිස් ආර දහයම CLCV සඳහා මධ්‍යස්ථ ප්‍රතිරෝධීතාවක් පෙන්නුම් කළේය.
- 2016/17 මහ සහ 2017 යල කන්නවලදි මිරිස් ආර නවයක් MICH 03 පරීක්ෂා ප්‍රභේද සමඟ CLCV සඳහා පරීක්ෂා කරන ලදී. මිරිස් ආර නවය අතුරින් ආර අටක් මධ්‍යස්ථ ප්‍රතිරෝධි ප්‍රතික්‍රියා පෙන්නුම් කළ අතර අනෙක් ප්‍රභේද CLCVවලට මධ්‍යස්ථ ගොදුරුවීමේ ස්වාභාවයක් පෙන්නුම් කළේය.
- කුරක්කන් කොළ පාළු රෝගය සඳහා 2016/3017 මහ කන්නයේ දී කුරක්කන් ආර දහයක් නිර්දේශිත පරීක්ෂා ප්‍රභේද දෙකක් වන ඕෂධ සහ රාවණා සමඟ පරීක්ෂා කරන ලදී. පරීක්ෂා කරන ලද ආර දහයකින් ආර දෙකක් මධ්‍යස්ථ ප්‍රතිරෝධි ආරක් වන ඕෂද සමග සංසන්දනාත්මක ප්‍රතිඵල පෙන්නුම් කළේය.
- ළූණුවල ඇන්ත්‍රැක්නෝස් සහ පර්පල් බ්ලොච් (Purple Blotch) පාලනය කිරීම සඳහා ලීටරයට ග්‍රෑම් 250 SC ඇසොක්සිස්ට්‍රොබින් (Azoxystrobin) හි සාඵල්‍යතාව පරීක්ෂා කිරීම පිණිස 2016/17 මහ කන්නයේ දඹුල්ල ගොවි ක්ෂේත්‍ර ආශ්‍රිතව මෙහෙය වූ නියමු පරිමාණයේ අත්හදා බැලීම මගින් සනාථ වූයේ ලීටරයට ග්‍රෑම් 250 SC ඇසොක්සිස්ට්‍රොබින් මගින් අන්ත්‍රැක්නෝස් සහ පර්පල් බ්ලොච් කාර්යක්ෂම ලෙස පාලනය කෙරුණු බවයි.
- නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය වෙනුවෙන් ළූණුවල ඇන්ත්‍රැක්නෝස් සහ පර්පල් බ්ලොච්වලට එරෙහිව දිලීරනාශකවල සාඵල්‍යතාව යළි පරීක්ෂා කිරීම සඳහා අත්හදා බැලීමක් සිදු කරන ලදී. ට්‍රයිෆ්ලොක්සිස්ට්‍රොබින් (Tryfloxystrobin) 250 + ටෙබියුකොනසෝල් (Tebuconazole) කිලෝග්‍රෑමයට ග්‍රෑම් 500 WG සහ ෆ්ලුඅසිනම් (Fluazinam) ලීටරයට ග්‍රෑම් 500 SC කාර්යක්ෂම බව හඳුනාගන්නා ලද නමුත් ක්ලෝරොතැලොනිල් (Chlorothaloni) 75% WP ඇන්ත්‍රැක්නෝස් සහ පර්පල් බ්ලොච්වලට එරෙහිව කාර්යක්ෂම නොවීය.

## කීට විද්‍යාව

- දේශීය මිරිස් දෙමුහුම් අටක් විදේශීය දෙමුහුමක් වන විජය හා දේශීය දෙමුහුමක් වන MICH HY1 සමඟ කෘමිනාශක නොඉසින තත්ත්ව යටතේ අගයන ලදී. පරීක්ෂා කරන ලද සියලුම නව දෙමුහුම් සහ MICH HY1 (15% - 24%) විශේෂයේ පැළ මැක්කාගේ හානියේ බරපතල ස්වභාවය විජය ප්‍රභේදය (39%) හා සැසඳීමේ දී අඩු බව පෙනී ගියේය. වෛරස් ආසාදන දේශීය මිරිස් දෙමුහුම්වලට (7% - 16%) වඩා විජය ප්‍රභේදයේ (68%) වැඩි බව පෙන්නුම් කෙරිණ.

- විවෘත පරාගිත මිරිස් ආර නවයක් පලිබෝධ හානි සඳහා නිර්දේශිත MICH 03 ප්‍රභේදය සමඟ ඇගයීමට ලක් කරන ලදී. MICH 03 (severity index - 69) ප්‍රභේදය හා සැසඳීමේ දී ආර 2ක පැළ මැක්කන්ගේ හානියේ බරපතල ස්වභාවය අඩු බවක් පෙන්නුම් කළ අතර (severity index - 22 සහ 38) පරීක්ෂා කරන ලද සියලුම ප්‍රභේදවල වෛරස් හානි (0 - 28%) MICH 03 (56%) ප්‍රභේදය හා සැසඳිමේ දි පහළ තත්ත්වයක තිබුණි.

- කෘමිනාශක භාවිතා කරන ලද තත්ත්වයක් යටතේ 2016/2017 මහ කන්නය තුළ පලිබෝධ හානිය සඳහා දේශීය මිරිස් දෙමුහුමක් වන MICH HY1 හා ගල්කිරියාගම වරණය සමඟ විදේශීය ආර 26ක් අගයන ලදී. පරීක්ෂා කරන ලද සියලුම මිරිස් දෙමුහුම්වල පැළ මැක්කන්ගේ හානියේ තීව්‍රතා දර්ශකයේ අගය 17-42 දක්වා පරාසයක් ගත්තේය. තවද, පරීක්ෂා කරන ලද මිරිස් දෙමුහුම් සියල්ලේ ම මයිටාවන් හානි කළ පැළ ප්‍රතිශතය 0 - 17 % පරාසයක විය.

- කෘමිනාශක භාවිතා කරන ලද තත්ත්ව යටතේ දී 2017 යල කන්නයේ පලිබෝධ හානි සඳහා දේශීය මිරිස් දෙමුහුම් (MICH HY1) සමඟ විදේශීය මිරිස් දෙමුහුම් දහනවයක් අගයන ලදී. පරීක්ෂා කරන ලද සියලුම මිරිස් දෙමුහුම්වල පැළ මැක්කාගේ හානිය සම්බන්ධයෙන් තීව්‍රතා දර්ශකය 13 - 34 පරාසයක විය. පරීක්ෂා කරන ලද මිරිස් දෙමුහුම් සියල්ලෙහි ම පැළ මැක්කන් හානි කළ ප්‍රතිශතය 0 - 44% පරාසයක පැවතුණි.

- මිරිස්වල කොළ කොඩවීමේ සංකීර්ණය සඳහා නයිලෝන් දැල්වල විවිධ ප්‍රමාණවල (දැල් ප්‍රමාණය 40 සහ 50) බලපෑම අධ්‍යයනය කරන ලදී. පාලක ප්‍රතිකර්මය හා සැසඳිමේ දී නයිලෝන් දැල්වලින් ආවරණය කරන ලද ක්ෂේත්‍රවල කුඩිත්තන් ගේ හා වයිරස් ආසාදන ඉහළ මට්ටමක පැවතුණි.

- කොළ කොඩවීමේ සංකීර්ණය පාලනය කිරීම සඳහා ශාක නිස්සාරණවල (Synkromax Synkoviron) බලපෑම අධ්‍යයනය කළ අතර පත්‍ර හැකිලීමේ සංකීර්ණය පාලනය කිරීම සඳහා ශාක නිස්සාරණ පමණක් කාර්යක්ෂම නොවන බව හඳුනා ගන්නා ලදී.

- බඩඉරිඟු කඳ විදින්නා පාලනය සඳහා විවිධ රනිල බෝග සමඟ බඩඉරිඟු මිශ්‍ර බෝග වගාවේ බලපෑම අධ්‍යයනය කරන ලදී. පාලක ක්ෂේත්‍රය (බඩඉරිඟු පමණක්) හා සැසඳීමේ දි කව්පි සහ මුං සමඟ බඩඉරිඟු වගා කළ විට කඳ විදින්නා ගේ හානිය අඩු බව නිරීක්ෂණය විය.

- 2016/17 මහ කන්නයේ දී, කෘෂි රසායන නොඉසින තත්ත්ව යටතේ දී පරීක්ෂාවට ලක් කළ සියලුම බඩඉරිඟු දෙමුහුම් වල කඳ විදින්නා ගෙන් හානි වූ ශාක ප්‍රතිශතය 13% - 37% පරාසයක විහිදුණි. කඳ විදින්නා හානි කළ ශාක ප්‍රතිශතය MI Maize HY 01 සඳහා 28% ද MI Maize HY 02 සඳහා 19% ද විය. කෙසේ වෙතත් 2017 යල කන්නයේ දී, නොවිසිරුම් තත්ත්ව යටතේ පරීක්ෂා කරන ලද බඩඉරිඟු දෙමුහුම්වල කඳ විදින්නාගේ හානිය ඉතා ඉහළ මට්ටමක. (60%-76%) පැවතිණි.

- පලිබෝධ හානි සඳහා නිර්දේශිත ප්‍රභේද දෙකක් (MI 6 සහ MI 5) සමඟ මුං ආර විස්සක් අගයන ලදී. ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන ලද්දේ එක් ආරක් හැරුණු කොට පරීක්ෂා කරන ලද සියලුම ආර කරල් විදින්නාගේ හානියට ගොදුරු වන බවයි. (හානිය > 38%).

- උඳු ආර දොළසක් කරල් විදින්නාගේ හානිය සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලද අතර පිරික්සූ සියලුම ආර කරල්

විදින්නාගේ හානියට ගොදුරු වූ බව හඳුනා ගැණින.

- ගාල්ල, මාතර, හම්බන්තොට, කළුතර, අනුරාධපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල වී වල BPH හි ජෛවදර්ශ හඳුනා ගැනීම සඳහා ආරම්භ කළ අධ්‍යයනයට අදාළ නියැදි කරණයන් සම්පූර්ණ කරන ලදී. රූපමිතික සහ අණුකමය විශ්ලේෂණය ඉදිරියේ දී සිදු කෙරෙනු ඇත.

## වල් පැළෑටි පාලනය

- වල් පැළෑටි පාලන හැකියාව සහ නොතේරූ පූර්ව-ශාක වල්පැළෑටි නාශක වශයෙන් පත්‍රමය ධූලකතාව විශ්ලේෂණය කිරීම සඳහා වල් නාශක පහක් පරීක්ෂා කරන ලදී. 1, 8 සිනියෝල් (Q ස්ටාර්) SC, ඇවෙන්ජර් එජී බර්න් ඩවුන් සහ බෙලෞබා වීවීඑච් 86086 යනාදිය වල් පැළෑටි මර්දනයේ දී කාර්යක්ෂම නොවීය. ඉමැසපයිරිසොප්‍රොපිල් ඇමෝනියම් ලවණ 27.6% W/W (පෝලාරිස්) සහ ඉමැසපිර් 25% SL පශ්චාත් නිර්ගමන වල්නාශක (post emergence herbicides) වශයෙන් වල් පැළෑටි මර්දනය කළ ද බෝගවල දැඩි ධූලකතාවක් සමගින් ඉතා ඉහළ මට්ටමේ අවශේෂ බලපෑමක් පෙන්වීය. පරීක්ෂා කෙරුණු රසායනික ද්‍රව්‍ය වල ඉහළ අවශේෂ බලපෑම හේතුවෙන් මාස තුනක් අවසන්වන විට පවා වල්පැළෑටි මතු වීමක් නොවීය.

## පාංශු සාරවත්භාවය

- බඩඉරිඟු යනු අකාබනික නයිට්‍රජන් (N) පොහොර අධික ලෙස භාවිතයට ගන්නා අතිරේක ආහාර බෝගයකි. බහුලව භාවිතා කෙරෙන N පොහොර ප්‍රභවය වන්නේ යූරියා යි. කෙසේ වෙතත් N පොහොරක් වශයෙන් යූරියාවල කාර්යක්ෂමතාව ඉතා අඩුය. එබැවින් යෙදිය යුතු නයිට්‍රජන් ප්‍රමාණය සහ කාලය තීරණය කිරීම සඳහා පත්‍ර වර්ණ දර්ශක (LCC) භාවිතා කළ හැකි ආකාරයේ බෝගයේ අවශ්‍යතාවයට සරිලන නයිට්‍රජන් පොහොර යෙදවුම් උපාය මාර්ගයක් හඳුනාගැනීමේ අවශ්‍යතාවක් මතු වී ඇත. තීරණාත්මක පත්‍ර වර්ණ දර්ශක අගය වශයෙන් 4.5 හඳුනාගනු ලැබ තිබේ.
- ලොකු ළූණු සඳහා පොහොර නිර්දේශ සංශෝධනය කිරීම පිණිස අධ්‍යයනයක් ආරම්භ කර අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙමින් පවතී.
- මුං කෙරෙහි ක්ෂුද්‍ර පෝෂකවල බලපෑම සොයා බැලීම සඳහා අධ්‍යයනයන් සිදු කරන ලද අතර නිර්දේශ ලබා දීමට පෙර කන්න කිහිපයක් තුළ පර්යේෂණ නැවත නැවතත් සිදු කෙරෙනු ඇත.

## ජල කළමනාකරණය

- බහු වාර්ෂික බෝග වැටි මගින් වගා කළ හැකි බිම් ප්‍රමාණය අත්පත් කර ගැනීම අඩු කිරීම සඳහා විශාල පරතරයකින් යුත් සාම්ප්‍රදායික විදී බෝග වගා ක්‍රමය නවීකරණය කිරීමේ අරමුණින් සහ බෝග නිෂ්පාදිතතාව ඉහළ නැංවීමටත් නියඟයෙන් වන බලපෑම අවම කිරීමටත් වාරි ජලය සැපයීම සඳහා ජල සැපයුම් පද්ධතියක් සංස්ථාපනය කිරීමේ අරමුණින් 2017 වසරේ දී ද පරීක්ෂණ ක්‍රියාත්මක කරන ලදී. ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ විසිරි ජල සැපයුම සහ අතු කප්පාදු කර යෙදීමේ ක්‍රමය සමඟ විදි බෝග වගා පද්ධතිය මගින් ලද මුං අස්වැන්න විසිරි ජල සැපයුම සමඟ විදි බෝග නොවන ක්‍රමය හා සැසඳීමේ දී 38 - 45%ක් වන බවයි. අතු කප්පාදු කර යෙදීමේ ක්‍රමය නොමැතිව විදි බෝග සහ විසිරි ජල සම්පාදන ක්‍රමය ඒකාබද්ධ කළ විට යල සහ මහ කන්නවලදී සාමාන්‍ය උෂ්ණත්වය පිළිවෙලින් 1.5 සහ 1°C කින් අඩු වූ බව හඳුනා ගන්නා ලදී. නවීකරණය කළ විදි බෝග ක්‍රමය

මගින් මෙතෙක් සනාථ කර ඇත්තේ එය උෂ්ණත්වය අඩු කිරීම සඳහා උපයෝජනය කළ හැකි බවත් නිෂ්පාදිතතාව ඉහළ නැංවීමට යොදාගත හැකි බවත් ය.

- ක්ෂුද්‍ර ජල සම්පාදනය උපයෝගි කර ගනිමින් මිරිස් සහ මුං වල බෝග නිෂ්පාදිතතාව ඉහළ නැංවීම සඳහා සුදුසු ශෂ්‍ය විද්‍යාත්මක කළමනාකරණ පැකේජයක් හඳුන්වාදීම සඳහා 2016 වසරේ දී ආරම්භ කළ පරීක්ෂණ මාලාව 2017 වර්ෂයේදී ද නැවත සිදු කරන ලදී. බිංදු ජල සම්පාදනය පදනම් කරගත් ක්‍රමයක් මිරිස් බෝගය සඳහාද, විසිරි ජල සම්පාදනය පාදක කරගත් ක්‍රමයක් මුං වගාව සඳහාද අත්හදා බලන ලදී. පිදුරු වසුන් යෙදීම, කාබනික පොහොර භාවිතය සහ පොහොර කඩින් කඩ යෙදීමද බිංදු සහ විසිරුම් ජල සම්පාදන පද්ධති යටතේ පැකේජ වශයෙන් ආදේශ කරන ලදී. පොහොර මිශ්‍රිත ජල සම්පාදනය ද බිංදු ජල සම්පාදන ක්‍රමය යටතේ භාවිතා කෙරිණ. අධ්‍යයනය මගින් පෙන්නුම් කරන ලද්දේ මතුපිට ජල සම්පාදනයට සාපේක්ෂව වාරි ජල පරිභෝජනය 30 - 50% ප්‍රමාණයකින් අඩු කරන අතරම ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති යටතේ අමු මිරිස් සහ මුං අස්වැන්න පිළිවෙලින් හෙක්ටයාරයකට ටොන් 45 සහ හෙක්ටයාරයකට ටොන් 2.5 - 3 දක්වා ඉහළ නැංවිය හැකි බවයි.

## ජෛව තාක්ෂණය

- ඇන්ත්‍රැක්නෝස් ප්‍රතිරෝධීතාව සඳහා මිරිස් එකතුන් ඇගයීම පිණිස ආරම්භ කරන ලද අධ්‍යයනය මගින් *C. capsicsi* සහ *C. gloeosporioides.* යන විශේෂ දෙකම ධාරක ශාකයට හානිකරන්නා වූ හේතුකාරක විශේෂ දෙකක් බව සනාථ විය. ගොදුරු වීමේ පරාසය තුළ අරුණළු සහ MI හොට් ප්‍රභේද දෙක අවම ගොදුරු වීමේ ප්‍රතික්‍රියාවක් පෙන්නුම් කළේය. තව ද, *Capsicum annum* හි ප්‍රතිරෝධී ජාන හඳුනාගැනීමට ප්‍රතිරෝධී ජාන ප්‍රතිසම පූර්වකයක් භාවිතයෙන් පොලිමරේස දාම ප්‍රතික්‍රියාව සම්පූර්ණ කරන ලදී.

- මිරිස් අස්වැන්න 100% ම විනාශයට පත් කරන වඩාත්ම හානිකර රෝගය වශයෙන් මිරිස් කොළ කොඩවීමේ (CLC) රෝගය හඳුන්වා දිය හැකි ය. කෙසේ වෙතත් ප්‍රතිරෝධී ප්‍රබව හඳුනාගනු ලැබ ඇත. එබැවින් CLC වෛරස්වලට ප්‍රතිරෝධී/ ඔරොත්තු දෙන සුදුසු මිරිස් ආරක් හඳුන්වාදීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කරන ලදී.

- දුම්කොළ පුනර්ජනනය සඳහා පටක රෝපණ ප්‍රොටොකෝලයක් ගොඩනගන ලදී. කැලිෆෝනියා වොන්ඩර් නමැති මිරිස් විශේෂය සඳහා පටක රෝපණ ශාක පුනර්ජනන ප්‍රොටොකෝලය ප්‍රශස්ථකරණය කෙරිණ. PCR භාවිතයෙන් වෛරසය පවතින බව තහවුරු කර ගන්නා ලදී. AC1 ප්‍රතිකාරකයෙන් siRNA ගොඩනැගීමේ දාමය විස්තීර්ණය කිරීම පිණිස පූර්වකය සැලසුම් කොට අවසන් කරන ලදී.

- ගුණාත්මක ප්‍රෝටීන බඩඉරිඟු (QPM) යනු ද්‍රෘඪ භ්‍රෑණපෝෂය අනවශ්‍ය තරම් මෘදු හා පිටිමය තත්ත්වයකට පරිවර්තනය වැළැක්වීමට මොඩිෆයර් ජාන යොදා වර්ධනය කළ ප්‍රවේණි දර්ශ දෙකක නිමැවුමයි. QPM චක්‍රයේ අභිජනනය තීව්‍ර කිරීම සඳහා “මාකර් ඇසිසිටඩ් සිලෙක්ෂන්” ක්‍රමවේදය යොදා ගන්නා ලදී. QPM ආර/ QPM ප්‍රභේද සංවර්ධනය සඳහා QPM නොවන ආර තුළට ඔපේක්-2 ජානය සංස්ථාපනය කිරීම අවශ්‍යය. නිසි ප්‍රභේද/ආර හඳුනාගැනීම සඳහා අණුකමය සලකුණු භාවිතා කළ හැකිය. ගහණයෙන් තෝරාගනු ලැබූ ආර දෙකක් (CML 20/193, 164/CML 20) ස්වපරාගණයෙන් $BC_2F_2$ ගහණය

දක්වා ඉදිරියට ගෙන යන ලදී. CML 20/193 මුහුම් සංයෝජනයෙහි පැළ 210ක් සඳහා අණුකමය පරීක්ෂාව සිදුකරන ලදී. QPM සංස්ථාපනය කරන ලද ආර 30 ක් හඳුනා ගැණින. QPM සංස්ථාපිත ආර ස්වපරාගණයෙන් $BC_2F_6$ ගහණය දක්වා ඉදිරියට ගෙන යන ලදී. රූපවිද්‍යාත්මක වශයෙන් සම යුක්තාණුක අන්තර් අභිජනනන ආර PYT සඳහා තෝරා ගැණින. තෝරා ගන්නා ලද ආර 30 ක් $BC_4F_1$ සෑදීම සඳහා CML20 සමඟ පිළි මුහුම්කරණයට ලක්කරන ලදී.

- වර්ධක ප්‍රචාරණයට ප්‍රමාණවත් රෝපණ ද්‍රව්‍ය නොමැති වීම හේතුවෙන් බීජ/ ප්‍රරෝහ රෝපිත භාවිතයෙන් ශ්‍රී ලංකාව තුළ සොයා ගත හැකි වැදගත් මිදි ප්‍රභේදවලින් ක්ෂුද්‍ර ප්‍රචාරක ප්‍රොටොකෝලයක් ගොඩනැගීම පිණිස පරීක්ෂණයක් ආරම්භ කරන ලදී. ලීටරයට මිලි ග්‍රෑම් 0.5 BAP සමඟ C2D මාධ්‍යය ආරම්භක රෝපණ මාධ්‍යයක් වශයෙන් හඳුනාගෙන ඇති අතර 5μM BAP සමඟ GA3 ලීටරයට මිලි ග්‍රෑම් 0.2 C2D මාධ්‍යය කඳ බහුගුණනය සඳහා සුදුසු මාධ්‍යයක් වශයෙන් හඳුනාගැණින. තව ද, ලීටරයට මිලි ග්‍රෑම් 0.5 GA3, ලීටරයට මිලි ග්‍රෑම් 0.4 BAP සහ ලීටරයට මිලි ග්‍රෑම් 0.01 NAA සමඟ C2D දියර මාධ්‍යය භාවිතයෙන් සොනාකා නමැති බීජ රහිත මිදි ප්‍රභේදය සඳහා කඳ බහුගුණන ප්‍රොටෝකෝලයක් ගොඩනඟන ලදී. කඳ බහුගුණනයන් සති 2-3 අතර කාලයකදී ලබා ගැණින.
- ගුල්ලන්ට ප්‍රතිරෝධී නව ආර/ප්‍රභේද සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමේ අරමුණින් ගුල්ලන්ට ප්‍රතිරෝධී ජාන (Br1) සඳහා මුං ආර/ප්‍රභේද පරීක්ෂා කිරීම පිණිස අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. ගුල්ලන් ප්‍රතිරෝධී මුං ආර සහ කහ විචිත්‍ර වෛරස් ප්‍රතිරෝධී ආර හඳුනාගැනීම සඳහා DNA නිස්සාරණ ප්‍රොටොකෝලය ප්‍රශස්ථකරණය කරන ලද අතර PCR විස්තීර්ණය ක්‍රියාත්මක කෙරෙමින් පවතියි.

## බීජ නිෂ්පාදනය

අභිජනන සහ ලියාපදිංචි/ සහතික කරන ලද/ වාණිජ බීජ පහත ප්‍රමාණවලින් නිෂ්පාදනය කොට SPMDC සහ වෙනත් අදාළ ආයතනවලට සපයන ලදී. (1.1.3 වගුව)

**1.1.3 වගුව: 2017 වර්ෂය තුළ දී නිෂ්පාදනය කරන ලද අභිජනන සහ ලියාපදිංචි/ සහතික කරන ලද/ වාණිජ බීජ**

| බෝගය | ප්‍රභේදය | ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | |
|---|---|---|---|
| | | අභිජනන බීජ | ලියාපදිංචි/ සහතික කරන ලද/ වාණිජ බීජ |
| බඩඉරිඟු | රුවන් | 39.0 | - |
| | භද්‍රා | 55.0 | - |
| | CML 161 | 755.0 | - |
| | CML 194 | 164.0 | - |
| | CML 451 | 70.0 | - |
| | CLO 2450 | 55.0 | - |
| | MI Maize HY 1 | - | 350.0 |

| බෝගය | ප්‍රභේදය | ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | |
|---|---|---|---|
| | | අභිජනන බීජ | ලියාපදිංචි/ සහතික කරන ලද/ වාණිජ බීජ |
| කුරක්කන් | රාවණා | 37.0 | - |
| | ඕෂධ | 38.0 | - |
| විළඳ ඉරිඟු | MI විළඳ ඉරිඟු | - | 64.0 |
| ස්වීට් සෝගම් | | - | 100.00 |
| මිරිස් | ගල්කිරියාගම අන්තර් අභිජනන ආර | 1.44 | - |
| | MI වැරණියා 1 අන්තර් අභිජනන ආර | 1.85 | - |
| | MICH 3 | 3.59 | - |
| | MI 2 | 2.0 | - |
| | MI වැරණියා 1 | 2.14 | - |
| මුං ඇට | ආරි | 11.0 | - |
| | MI 6 | 72.5 | - |
| ලොකු ළූණු | MIBO 1 | 7.0 (සත්‍ය බීජ) | - |
| උඳු | MI 1 | 29.0 | - |
| | අනුරාධ | 44.0 | - |
| සෝයා බෝංචි | Pb 1 | 185.0 | - |
| කව්පි | ධවල | 16.0 | - |
| | MICP 1 | 37.0 | - |
| | වරුණි | 77.0 | - |
| | බොම්බේ | 22.0 | - |
| පතෝල | MI මිටි | 2.0 | - |

## තාක්ෂණික ව්‍යාප්තිය

- 5000 කට අධික සහභාගිත්වයක් පැවති නිලධාරීන්, ගොවීන් සහ පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සහ තාක්ෂණික විද්‍යාල සිසුන් සඳහා වෙනත් අතිරේක ආහාර බෝග (OFC) පිළිබඳව පුහුණු වැඩසටහන් 175කට අධික සංඛ්‍යාවක සම්පත් දායක පුද්ගලයෝ වශයෙන් FCRDI නිලධාරීහු සහභාගී වූහ.
- ක්ෂේත්‍ර චාරිකා 100කට සහ පැළැටි සායන 5කට කෘෂිකර්ම ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සමඟ FCRDI නිලධාරීහු සහභාගි වූහ.
- ආයතනයට පැමිණි සහ දුරකථන ඇමතුම් ඔස්සේ සම්බන්ධ වූ සේවාදායකයෝ 2,500කට අධික සංඛ්‍යාවකට තාක්ෂණික උපදෙස් සපයන ලදහ.

- තාක්ෂණික තොරතුරු සම්බන්ධ පත්‍රිකා 250ක් පමණ බෙදා හරින ලදී.

- වී සඳහා ග්‍රාම නිලධාරි කොට්ඨාශ පදනමින් පොහොර නිර්දේශය ලබා දීමේ ක්‍රියාත්මක වැඩසටහන යටතේ පාංශු නියැදි 1400ක් පරීක්ෂා කරන ලදී. අමතරව පාංශු නියැදි 100ක් ගොවීන්ගේ සහ ව්‍යාප්ති නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි විවිධ බෝග සඳහා ස්ථාන විශේෂිත පොහොර නිර්දේශ ලබාදීමේ අරමුණින් පරීක්ෂා කෙරිණ.

- අතිරේක ආහාර බෝග බීජ කිලෝ ග්‍රෑම් 48ක් පමණ ගොවීන් හා වෙනත් ආයතන වෙත නොමිලයේ නිකුත් කරන ලදී.

- අතිරේක ආහාර බෝග හා ආශ්‍රිත මාතෘකා සම්බන්ධ ගුවන්විදුලි වැඩසටහන් පහළොවකට FCRDI නිලධාරීහු සම්පත්දායකයෝ ලෙස සහභාගි වූහ.

## වෙනත්

- උපාධි අපේක්ෂකයෝ තිදෙනෙක් මෙම ආයතනයේ දි සිය අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘතිය නිම කළහ.

- තාක්ෂණික විද්‍යාල සිසුහු දහහතර දෙනෙක් ඔවුන් ගේ සය මාසික ප්‍රායෝගික පුහුණුව අවසන් කරන ලදි. තවදුරටත්, ජාතික තරුණ සේවා සභාවේ සිසුහු 9ක් සහ කෘෂිකර්ම විද්‍යාලවල සිසුහු 8 දෙනෙක් ඔවුන්ගේ සය මාසික ප්‍රායෝගික පුහුණුව ආයතනයේ දී සම්පූර්ණ කරන ලදී.

- පවතින විද්‍යාගාර උසස් තත්ත්වයට ගෙන එන ලද අතර දෙමුහුම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ විද්‍යාගාර උපකරණ සහ ක්ෂේත්‍ර කෘෂි යන්ත්‍රෝපකරණ මිලදී ගන්නා ලදී.

- 'ශ්‍රී ලංකාවේ ඇණු ප්‍රභේද සඳහා බීජ බහුගුණන සහ වගා තාක්ෂණ සංවර්ධනය' යන KOPIA TCP ව්‍යාපෘතිය යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.
    - අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිදුණුවැව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලියන්ගස්තොට සහ මන්නාරම දිස්ත්‍රික්කයේ තරවන්කෝට්ටේ සහ සින්නක්කරාසි යන බීජ නිෂ්පාදන ආදර්ශ ගම්මානවල ලොකු ඇණු බීජ නිෂ්පාදනය. - 2016/2017 මහ කන්නයේ දී ගලෙන්බිදුණු වැව බීජ නිෂ්පාදන ආදර්ශ ගම්මානයේ හෙක්ටයාර 1 (වැසි ආවරණ යටතේ) ක භූමි ප්‍රමාණයක ලොකු ඇණු බීජ කිලෝ ග්‍රෑම් 1,414ක ප්‍රමාණයක් නිපදවන ලදී.
    - භූමි හෙක්ටයාර 3ක වැසි ආවරණ පහසුකම් ද ඇණු මව් බල්බ ටොන් 90ක ධාරිතාවක් ගබඩා කළ හැකි ගබඩාවක් ද ඉදි කරන ලදී.
    - මව් බල්බ ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් ඇසුරුම්, බිංදු ජල සම්පාදන පද්ධති, කෘෂි රසායන ද්‍රව්‍ය, බලවේග ඉසින සහ වෙනත් කුඩා මෙවලම් බෙදා දෙන ලදී.
    - ගලෙන්බිදුණු වැව ආදර්ශ ගම්මානය හෙක්ටයාර 2ක් දක්වා පුළුල් කරන ලදී.
    - ඇණු නිෂ්පාදන නව ආදර්ශ ගම්මානයක් මහවැලි H කලාපයේ බුල්නෑව ග්‍රාමයේ ස්ථාපනය කරන ලදී.

## 2018 වසර සඳහා සැලැස්ම

### පර්යේෂණ

- අතිරේක ආහාර බෝගවලට අදාළ බෝග ප්‍රවර්ධනය හා ප්‍රභේදමය සංවර්ධනය

- අතිරේක ආහාර බෝගවලට හානිකරන පලිබෝධ හා ආසාදන පාලනයට තාක්ෂණය සංවර්ධනය කිරීම
- බෝග වැඩි දියුණු කිරීම සඳහා ජෛවතාක්ෂණ මෙවලම් ඵලදායී ලෙස යොදා ගැනීම
- අතිරේක ආහාර බෝග වගාවන් සඳහා පාංශු කළමනාකරණ තාක්ෂණයන් සංවර්ධනය.
- වියළි කලාපයේ කෘෂිකර්මාන්තයේදී ජල ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික ක්‍රම නිර්මාණය කිරීම
- අතිරේක ආහාර බෝගවල නිෂ්පාදිතතාව කෙරෙහි දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම පිළිබඳ අධ්‍යයනය
- වියළි කලාපය සඳහා යෝග්‍ය එළවළු සහ පලතුරු බෝග / වර්ග සංවර්ධනය හා හඳුනා ගැනීම

## සංවර්ධනය

- නිර්දේශිත වෙනත් ක්ෂේත්‍ර බෝග වර්ග වල අභිජනන බීජ නිෂ්පාදනය කිරීම.
- පාර්ශ්වකරුවන්ට කෘෂි තාක්ෂණය බෙදා හැරීම.

## කාර්ය මණ්ඩලය

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| ප්‍රධාන කෘෂිකර්ම විද්‍යාඥ (කීට විද්‍යා) | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 15 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) | 01 |
| පරිපාලන නිලධාරි | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 02 |
| සංවර්ධන නිලධාරී | 01 |
| කෘෂිකර්ම උපදේශක | 04 |
| පර්යේෂණ සහකාර | 20 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 11 |
| තාක්ෂණික සහායක | 03 |
| ගොවිපළ ලිපිකරු | 01 |
| රියදුරු | 07 |
| ගබඩාකරු | 01 |
| යන්ත්‍ර ශිල්පී | 03 |
| කාර්මික ශිල්පි | 01 |
| පර්යේෂණ උප සහකාර | 09 |
| සංචාරක බංගලාව භාරකරු | 01 |
| ලොරි පවිත්‍රකරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| මුරකරු | 24 |
| කම්කරු (ස්ථිර) | 289 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 25 |
| **එකතුව** | **425** |

## 1.1.1 තෙල් හා මාෂ බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අඟුණකොළපැලැස්ස

තෙල් හා මාෂ බෝග පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය (GLORDC) ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ විෂය සීමාවට යටත්ව ක්‍රියාත්මක වන අතර එය දකුණු වියළි කලාපයේ පිහිටි ප්‍රධාන කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථානයයි. මාෂ බෝග, තෙල් බෝග, කලාපීය වශයෙන් වැදගත්වන එළවළු සහ පලතුරු පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් කෙරෙහි මෙම ආයතනයේ ක්‍රියාකාරිත්වය කේන්ද්‍රය වී ඇත. $DL_5$ කෘෂි දේශගුණික කලාපයේ පිහිටි වීරවිල සහායක පර්යේෂණ ස්ථානය (ARS) හා එක්ව තාක්ෂණය හුවමාරුව සඳහා ද එය කටයුතු කරයි. බෝග ප්‍රවර්ධනය, ශෂ්‍ය විද්‍යාව, පැළෑටි සංරක්ෂණය, ජල කළමනාකරණය සහ පාංශු විද්‍යාව යනාදී ක්ෂේත්‍ර තේමා කොට ගත් ජාතික මෙන්ම කලාපිය අවශ්‍යතා මත පදනම්ව සියලුම පර්යේෂණ වැඩසටහන් සැලසුම් කෙරේ.

මීට අමතරව, නිර්දේශ කරන ලද ප්‍රභේදවල අභිජනන බීජ සහ මූලික රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, ස්ථානීය විශේෂත්වයක් දරන පොහොර යෙදීම නිර්දේශ කිරීම සහ ක්ෂේත්‍ර නිලධාරීන්, ගොවීන් සහ උනන්දුවක් දක්වන වෙනත් පුද්ගලයන් වෙත තොරතුරු බෙදා හැරීම වැනි ක්‍රියා සම්බන්ධයෙන්ද මෙම මධ්‍යස්ථානය මැදිහත් වෙයි.

### අයවැය

**වගු අංක 1.1.1: වාර්ෂික අයවැය- 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 14,409,907 | 12,203,335 | 85 |
| මූලධන | 8,100,000 | 7,900,439 | 98 |
| ව්‍යාපෘති | | | |
| • NARP | | | |
| ○ දකුණු දිග වියළි කලාපයේ පිපිඤ්ඤා, රනිල බෝග සහ මිරිස්වලට වැළදෙන වෛරස් වැනි රෝග හඳුනාගැනිම හා පාලනය | 205,000 | 205,000 | 100 |
| ○ වර්ෂාපෝෂිත කුරක්කන් වගාවේ තිරසාරත්වය සඳහා තාක්ෂණිකමය පැකේජයක් ගොඩනැංවීම | 246,500 | 224,546 | 91 |
| ○ වියළි සහ අන්තර් මධ්‍ය කලාපයෙන් ලබාගත් දිවුල් ජනකප්ලාස්මා එක්රැස් කිරීම, ස්ථාපනය සහ ඇගයීම | 2,694,500 | 2,578,432 | 96 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| • පලතුරු නිෂ්පාදන ගම්මාන වැඩසටහන | | | |
| ○ සිට්‍රස් විවිධත්ව එක්රැස් කිරීම සහ ඇගයීම | 2,600,000 | 2,554,336 | 98 |
| ○ අඹ උයනක් ස්ථාපනය | 1,492,500 | 1,492,500 | 100 |
| ○ පළතුරු ගම්මාන වැඩසටහනේ දිවුල් බද්ධ පැළ 10,000ක් නිෂ්පාදනය | 500,000 | 471,973 | 94 |
| • මිලියන 55 ව්‍යාපෘතිය | 2,770,000 | 2,741,462 | 99 |
| **එකතුව** | **33,018,407** | **30,372,023** | **92** |

## ප්‍රගතිය

### ශෂ්‍ය විද්‍යාව

- රටකජු අස්වැන්න කෙරෙහි (*Arachis hypogea* L.) ඇබ්සිසික් අම්ලය සහ නියං ආතතියෙහි බලපෑම අත්හදා බැලීම සම්පූර්ණ කරන ලදී. පාලකය හා සැසඳීමේ දී ඇබ්සිසික් අම්ලය තුළ බීජ ගිල්වා තැබීමේ ප්‍රතිකාරකයෙන් සහ පත්‍රවලට ඇබ්සිසික් අම්ලය යෙදීමෙන් රටකජු පැළයක බීජවල බර, සහ පිරවුම් ප්‍රතිශතය නියං බලපෑම සමඟ විශේෂ වෙනසක් නොපෙන්වන ලදී.
- තල සඳහා තත්ත්ව පරාමිතීන් වැඩි දියුණු කිරීමට විවිධ තාක්ෂණික ක්‍රම අත්හදා බැලීම් සිදු කරන ලදී. තල පැළවල පත්‍ර පතනය සහ වියළීම සඳහා යෝග්‍යතම තාක්ෂණය වශයෙන් වර්ග මීටරයට මවුල 0.5ක ලුණු සාන්ද්‍රණය සමඟ ලුණු, එතුල්, යූරියා යනාදියෙහි සාන්ද්‍රණ අනුක්‍රමිකයක් සන්සන්දනය කරන ලදී. වර්ග මීටරයට මවුල 0.5ක සාන්ද්‍රණයේ ලුණු භාවිතය පරිණතියේ දී තල ශාකවල පත්‍ර පතනය සහ වියළීම සඳහා කාර්යක්ෂම ප්‍රතිකාරය බව හඳුනා ගැණින.
- රනිල සමඟ බඩඉරිඟු සමඟ බෝග මාරු පද්ධති ඇගයීම පිළිබඳ අත්හදා බැලීම සිදු කරන ලදී. බඩඉරිඟු තනිව වගා කළ විට සහ සෝයා බෝංචි, කොල්ලු සහ රටකජු සමඟ වගා කළ විට බඩඉරිඟු අස්වැන්නෙහි සුවිශේෂී වෙනසක් නොවිය.
- දේශීය තල ප්‍රභේදවල වැඩෙන දින ගණන් (Growing Degree Days (GDD)) අවශ්‍යතා විවිධ වගා කාලයන් හා ගණනය කරන ලදී.
- රටකජු බීජ හා බැඳුණු ආයු කාලය වැඩිකිරීමට තාක්ෂණික ක්‍රම සංවර්ධනය කළ අතර ස්වශක්තිතා ගැටළු සහ සුවකිරීමේ බලපෑම (curing effect) අගයන ලදී.
- බඩඉරිඟුවල CYMMIT ආරෙහි නියං පරීක්ෂාව අත්හදා බැලීම් සිදු කෙරිණ. රැස් කරන ලද දත්ත වැඩිදුර විශ්ලේෂණය සඳහා අත්හදා බැලීම් සම්බන්ධීකාරක වෙත යොමු කරන ලදී.
- වර්ෂාපෝෂිත ගොවිතැන් පද්ධති යටතේ කුරක්කන් වගාවේ තිරසාර භාවිතයේ තාක්ෂණික පැකේජයක් ගොඩනැගීමේ අරමුණ සමඟ ගොවි ක්ෂේත්‍ර අත්හදා බැලීම් සිදු කරන ලදී. පේළියට වැපිරීම, කොම්පෝස්ට් යෙදීම සහ නිර්දේශිත මාත්‍රාවලින් අකාබනික පොහොර යෙදීම

අස්වැන්න කෙරෙහි බලපාන්නේ කෙසේද යන්න පරීක්ෂා කෙරිණ. කොම්පෝස්ට් අඛණ්ඩ භාවිතය මගින් අස්වැන්න වැඩිකර ගත හැකි බව සොයා ගන්නා ලදී. පේලියට වැපිරීම සහ රසායනික වල් පැළෑටි මර්දනය මගින් අස්වැන්න 23% ප්‍රමාණයකින් ඉහළ නැංවිය හැකිය. පර්යේෂණය තවදුරටත් සිදුකෙරෙමින් තිබේ.

- රටකජු, තල, මුං, කව්පි, දෙමුහුම් මිරිස්, දෙමුහුම් බඩ ඉරිඟු, සෝයා බෝංචි සහ කුරක්කන් සඳහා ජාතික ඒකාබද්ධතා ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහන (NCVT) යටතේ අත්හදා බැලීම් ක්‍රියාත්මක කෙරිණ. එක් රැස් කළ දත්ත වැඩිදුර විශ්ලේෂණය සඳහා අදාළ සම්බන්ධීකාරකවරුන් වෙත යවා ඇත.

## පැළෑටි අභිජනනය

## (බෝග ප්‍රවර්ධනය)

### තෙල් බීජ බෝග

#### රටකජු

- රටකජු ප්‍රභේද වැඩිදියුණු කිරීම: $F_2$- විවිධ ආර 7 , $F_4$- විවිධ ආර 6, $F_5$- එක් ආරක්, $F_7$-ආර 6ක් වැඩිදුර විශ්ලේෂණය සඳහා තෝරා ගැණින.
- කෙටි කාලීන රටකජු ආර සඳහා මූලික අස්වනු අත්හදා බැලීම් සම්පූර්ණ කරන ලද අතර ප්‍රධාන කන්න අත්හදා බැලීම් දක්වා ක්‍රියාත්මක කෙරිණ.
- මෙම කන්නය සඳහා ඉහළ අස්වනු, මධ්‍යස්ථ කාලීන සහ විශාල බීජ රටකජු ආර සඳහා NCVT සම්පූර්ණ කරන ලද අතර මීළඟ කන්නය සඳහා ද එය ක්‍රියාත්මක කෙරේ.
- මෙම කන්නය සඳහා ඉහළ අස්වනු, කෙටි කාලීන සහ විශාල බීජ රටකජු ආර සඳහා NCVT සම්පූර්ණ කරන ලද අතර මීළඟ කන්නය සඳහා ද එය ක්‍රියාත්මක කෙරේ.

#### තල

- ඉහළ අස්වනු දෙන, ඉහළ තෙල් සංචිතයක් ඇති රෝගවලට ඔරොත්තු දෙන නිර්ණය කෙරෙන ආකාරයේ සුදු/ කළු බීජ සහිත තල ප්‍රභේද සංවර්ධනය සඳහා පර්යේෂණ අත්හදාබැලීම් මෙහෙයවන ලදී. මෙම වැඩසටහන යටතේ 5 වන ජනක පරම්පරාවේ දෙමුහුම් උසස් කරන ලදී.
- ඉහළ අස්වනු දෙන, ඉහළ තෙල් සංචිතයක් ඇති රෝගවලට ඔරොත්තු දෙන නිර්ණය කෙරෙන ආකාරයේ සුදු/ කළු බීජ සහිත තල ප්‍රභේද සංවර්ධනය සඳහා පරීක්ෂා ප්‍රභේද තුනක් සමඟ තෝරා ගනු ලැබූ ආර පහක් සඳහා මූලික අස්වනු ඇගයීම් සිදු කරන ලදී.
- VAT වැඩසටහන යටතේ තෝරාගනු ලැබූ තල ආර තුනක් අගයන ලදී.
- MI3 සහ MI1 ප්‍රභේද පවිත්‍රකරණය තවදුරටත් සිදු කෙරේ.

#### සෝයා බෝංචි

- NCVT හි පරීක්ෂා කරන ලද, තෝරාගත් බලාපොරොත්තු තැබිය හැකි ආර දෙක (AC 2133, AC 2514) මගින් සාපේක්ෂව වඩා හොඳ ප්‍රතිඵල පෙන්නුම් නොකෙරිණ.
- මූලික අස්වනු අත්හදා බැලීම් සඳහා තවත් බලාපොරොත්තු තැබිය හැකි ආර 4ක් නම් කරන ලදී.

### ධාන්‍ය රනිල

#### මුං

- කන්නමය වගා සඳහා ඉහළ අස්වනු (හෙක්ටයාරයකට ටොන් 3 ට වැඩි) දෙන පළිබෝධ හා රෝගවලට ඔරොත්තු දෙන මුං ප්‍රභේද සංවර්ධනය සඳහා $F_4$, $F_5$ හා $F_7$ පරම්පරා උසස් කිරීම කරන ලදී.

- NCVT යටතේ ඉහළ අස්වනු දෙන (හෙක්ටයාරයට ටොන් 2 ට වැඩි), පලිබෝධ හා රෝගවලට ඔරොත්තු දෙන ආර සතරක් (ANKMB 41, ANKMB 117, ANKMB 118, ANKMB 121) සංවර්ධනය කෙරිණ.

- VAT යටතේ එක් මුං ආරක් (ANKMB 48) අගයන ලදී.

- නියඟයට ඔරොත්තු දෙන මුං ජනකප්ලාස්මා ඇගයීම ක්‍රියාත්මක තත්ත්වයේ ඇත.

### කව්පි

- 2017 ප්‍රභේද නිදහස් කිරීමේ කමිටු රැස්වීමේ (VRC) දී ANKCH1 නමැති පරීක්ෂා කරන ලද කව්පි ආර නිදහස් කරන ලදී.

- එක් කන්නයක දී NCVTහි දී පරීක්ෂා කරන ලද ඉහළ අස්වනු දෙන මධ්‍ය කාලීන කව්පි ආර සතරක් පරීක්ෂා කරන ලදී.

- CP220 සහ CP128 කව්පි ආර සාපේක්ෂව ඉහළ නියං තත්වයකට ඔරොත්තු දෙන එකතුන් ලෙස හඳුනාගන්නා ලද අතර NCVTහි දී පරීක්ෂා කරන ලදී.

- ප්‍රධාන අස්වනු අත්හදා බැලීමේ දී මධ්‍ය කාලීන කව්පි 4ක් සහ කෙටි කාලින කව්පි 5ක් පරීක්ෂා කෙරිණ.

## එළවළු

### තුඹ කරවිල

- ක්ෂේත්‍ර ජාන බැංකු වශයෙන් ජනකප්ලාස්ම 48ක් පවත්වාගෙන යන ලදී.

### එළබටු

- ක්ෂේත්‍ර කාර්ය සාධනය අත්හදා බැලීම සඳහා ආර අටක් සමඟ මූලික අස්වනු ඇගයීම් මෙහෙයවන ලදී.

### වැටකොළු

- තෝරා ගත් ආර දෙකක් සඳහා සහ පරීක්ෂා ප්‍රභේද දෙකක් සඳහා NCVT ක්‍රියාත්මක කරන ලදී.

### රතු ළූණු

- සාම්ප්‍රදායික අභිජනනයෙන් ප්‍රමාණයෙන් විශාල බල්බ, කලින් පරිණතවන (දින<75), පොකුරු ළූණු ආර සංවර්ධනය සඳහා මූලික අස්වනු අත්හදා බැලීම්වලදී තෝරා ගනු ලැබූ ආර 2ක් පරීක්ෂා ප්‍රභේද 4ක් සමඟ අගයන ලදී.

## පලතුරු බෝග

### දිවුල්

- අක්කර 25ක වපසරියක් පුරා එකතුන් 156කින් සමන්විත දිවුල් ජාන බැංකුවක් පවත්වාගෙන යන ලදී.

- උතුරු දිග කලාපයෙන් නව එකතුන් එක් රැස්කර බද්ධ කර ගන්නා ලද අතර සංස්ථාපනය සඳහා භූමිය සකස් කෙරිණ.

- පුෂ්පීය ලක්ෂණ, අස්වැන්න සහ පළතුරුවල තත්ත්වය යනාදී දත්ත වාර්තා කොට විශ්ලේෂණය කරන ලදී.

### බෙලි

- අක්කර 1.5ක වපසරියකින් යුත් භූමියක එකතුන් 23 කගෙන් සමන්විත බෙලි ජාන බැංකුවක් පවත්වාගෙන යනු ලැබිණ.

### අඹ

- වයස්ගත අඹ ශාක පුනරුත්ථාපනය කිරීමේ අධ්‍යයනය අවසන් කොට රැස්කළ දත්ත විශ්ලේෂණය කෙරිණ.

- බාහිර වියන් ගෝලය කප්පාදු කිරීම සහ අඹ වැඩි ඝනත්වයකින් යුතුව වගා කිරීම අධ්‍යයනය කරන ලදී. ගෝලීය කප්පාදු චක්‍ර තුනක් සම්පූර්ණ කරන ලද අතර අවශ්‍ය වියන් ව්‍යුහයකින්

සමන්විත ශාක ගොඩනගා ගැනීමට හැකි විය.

- ප්‍රභේදමය වැඩිදියුණු කිරීම සඳහා දේශීය මෙන්ම විදේශීය සම්භවයක් සහිත අඹ එකතුන් 156ක් එක්රැස් කොට ස්ථාපනය කරන ලදී.
- අක්කර 12ක පැතිරී පවතින අඹ පර්යේෂණ උයන සඳහා අවශ්‍ය සියලු යටිතල පහසුකම් සම්පූර්ණ කරන ලදී.

## කෙසෙල්

- කන්න සතරක් සඳහා අස්වනු ලක්ෂණ ඇගයීම නිම කරන ලදී. ඇඹුල් කෙසෙල් එකතුවක් සහ සීනි කෙසෙල් එකතුවක් බලාපොරොත්තු තැබිය හැකි එකතුන් ලෙස තෝරා ගන්නා ලද අතර ප්‍රධාන අස්වනු අත්හදා බැලීම සඳහා සංස්ථාපනය කරන ලදී.

## සිට්‍රස් (දෙහි කුලය)

- දොඩම්, ඇඹුල් දොඩම්, හීන් නාරන්, ජම්බෝල, ගඩා දෙහි, නස්නාරං, මැන්ඩරින් සහ සිදරන් ඇතුළුව එකතුන් 356ක් රැස් කරන ලද අතර ස්ථාපනය කරන ලදී.
- වර්ධන පරාමිතීන් වාර්තා කොට උයන පවත්වාගෙන යන ලදී.

## පැපොල්

- NCVT තුළ දේශීය පැපොල් ස්ථාපනය කොට අගයන ලදී.
- අස්වනු ඇගයීම් පරීක්ෂාවේ දී පැපොල් මුදු ලප වෛරසයට (PRSV) ඔරොත්තු දෙන ලක්ෂණ සහිත සහ හොඳ තත්ත්වයේ හා ප්‍රමාණාත්මක අස්වනු ලක්ෂණ සහිත පැපොල් ආර 6ක් තෝරා ගනු ලැබිණ.

## පාංශු විද්‍යාව

- RBE පස්වල ජල සම්පාදිත තත්ත්ව යටතේ විශාල බීජ සහිත රටකජුවල අස්වැන්න සහ බීජ පිරවුම් කෙරෙහි ජිප්සම් යෙදීමේ බලපෑම අගයන ලදී. අනුයාත කන්න දෙකක දී RBE පසෙහි රටකජු අස්වැන්න කෙරෙහි මූලික යෙදීමේ දී ජිප්සම් හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 100 දක්වා යෙදීම මගින් කිසිදු සුවිශේෂී බලපෑමක් නොවීය.
- ජල සම්පාදිත තත්ත්ව යටතේ විශාල බීජ සහිත රටකජුවල අස්වැන්න සහ බීජ පිරීම වැඩිදියුණු කිරීම සඳහා පොහොර යෙදීමේ පිළිවෙල මනා සේ සකස් කිරීම.

## පෝෂණවේදය

- ශ්‍රී ලංකාවේ වගා කෙරෙන ප්‍රචලිත ධාන්‍ය වර්ගවල පෝෂණමය සැසඳීම සහ සෞඛ්‍ය ප්‍රතිලාභ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලදී. කඩල යනු යකඩ, සින්ක් සහ කැල්සියම් වැනි බොහෝ ඛණිජ ලවණ බහුල මනා ප්‍රභවයකි. ශ්‍රී ලංකාවේ සියලුම ධාන්‍ය ප්‍රභේද අතුරින් "MI6" නමැති මුං ප්‍රභේදය ඉහළම පොස්ෆරස් සංචිතයකින් සමන්විත වෙයි. සියලුම ධාන්‍ය ප්‍රභේදවල පුරෝකථනය කළ ග්ලයිසීමික් දර්ශකයේ අගය 50ට අඩුය.

- සෝයා බෝංචි, මුං සහ රටකජු භාවිතයෙන් 'වෙජී-ෆින්ගර්ස්' (Vege-fingers) ගොඩ නගන ලදී. විවිධ ධාන්‍ය (formulations) සහ තෙල් බීජ පල්ප වට්ටෝරු භාවිතයෙන් 'වෙජී-ෆින්ගර්ස්' (Vege-fingers) ඇගයීම හා සංවර්ධනය සිදු කරන ලදී. පෝෂණමය සංයුතිය සහ සංවේදක ඇගයීම් ප්‍රතිඵල මගින් පෙන්නුම්කරන ලද්දේ vege finger සඳහා යෝග්‍යතම වට්ටෝරුවට සෝයා බෝංචි 40%, මුං ඇට 20%, රටකජු 20% සහ වෙනත් සංයෝග 20% ඇතුළත් වූවකි. එහි පෝෂණමය සංයුතිය කාබෝහයිඩ්‍රේට් 13.69%, ලිපිඩ 27.05%, ප්‍රෝටීන 9.25% සහ ඛණිජ ලවණ 2.49% වශයෙන් වේ.

### ව්‍යාධිවේදය

- නලස්ථ විකෘතිකරණය යටතේ කෙසෙල් සඳහා ෆියුසාරියුම් මැලවීමේ (*Fusarium oxysporum* f.sp. cubense (Foc)) රෝගයට ප්‍රතිරෝධී/ ඔරොත්තු දෙන වැඩසටහන් යටතේ පටක රෝපණයෙන් ජනනය කරන ලද කුඩා පැළ 3366ක් ද්විත්ව තැටි ක්‍රමය යටතේ පරීක්ෂා කරන ලද අතර පැළැටි 1198ක් රෝගී නියැදි ක්‍රමය යටතේ පරීක්ෂා කරන ලදි. (sick plot) ද්විත්ව තැටි සහ රෝගී නියැදිවල පැළැටි 2125ක් මිය ගොස් තිබිණ.
- දකුණු දිග වියළි කලාපයේ වැවෙන පිපිඤ්ඤා, රනිල සහ මිරිස්වල වෛරස් සහ වෛරස් වැනි රෝග හඳුනාගැනීම සිදු කරන ලදී. සෝයා බෝංචි, කව්පි, තුඹ සහ පිපිඤ්ඤා නියැදි 200ක් පරීක්ෂා කරන ලදී. පිපිඤ්ඤාවල නව වෛරස් දෙකක් හඳුනා ගැණින. ගැණින. (Water melon cholorotic stunt virus and Cucurbit aphid borne yellow virus)

## ARS, වීරවිල ($DL_5$)

- $DL_5$ කෘෂි පාරිසරික කලාපය තුළ ලොකු ළූණු අස්වැන්න සහ නිෂ්පාදනය කෙරෙහි විවිධ වසුන්වල බලපෑම නිශ්චිත කරලීම සඳහා අත්හදා බැලීම් සිදු කරන ලදී. පොලිතීන් වසුන් අතුරින් කළු පැහැති වසුන් වඩා හොඳ බලපෑමක් පෙන්වූ අතර කාබනික වසුන් අතුරින් පිදුරු උපරිම උචිතතාවක් පෙන්වීය. මීට අදාළව කන්න දෙකක් සම්පූර්ණ කරන ලද අතර ප්‍රතිඵල තහවුරු කරලීම සඳහා තවත් කන්නයක් තුළ අත්හදා බැලීම් සිදු කළ යුතු ය.

### තාක්ෂණික හුවමාරුව සහ පුහුණුව

#### රූපවාහිනී වැඩසටහන්

- අඟුණකොළපැලැස්ස GLORDC මඟින් නිකුත් කරන ලද රනිල ප්‍රභේද පිළිබඳ රූපවාහිනි වැඩසටහනක් සඳහා බී.එන්. සමරනායක මහතා සහභාගි වූයේය.
- තුඹ කරවිල බෝගය පිළිබඳ ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහන් 03කට ඩී. වීරසේකර මහතා සහභාගි වූයේය.

#### ගුවන් විදුලි වැඩසටහන්

- එළවළු වගාව සම්බන්ධයෙන් රුහුණු සේවය සමඟ පැවති ගුවන්විදුලි වැඩසටහන් දෙකකට (රුහුණු ගෙවත්ත) ඩී. වීරසේකර මහතා සහභාගි වූයේ ය.
- ධාන්‍ය රනිල සහ තෙල් බෝගවලට වැළඳෙන රෝග සම්බන්ධයෙන් වැඩසටහන රුහුණු සේවාව ඔස්සේ ගුවන්ගත කෙරිණ.

#### පුහුණු වැඩසටහන්

- දකුණු පළාතේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවාවට අයත් තාක්ෂණික නිලධාරීන් සඳහා පූර්ව කන්නමය වැඩසටහන් 18ක් පවත්වන ලදී.
- තොරතුරු ලබා ගැනීමේ අරමුණින් මධ්‍යස්ථානය වෙත පැමිණි ගොවීන් 87 දෙනෙකුට පමණ අවශ්‍ය උපදෙස් සහ නිර්දේශ සපයන ලදී.
- තාක්ෂණික කාර්ය මණ්ඩලය වෙනුවෙන් වගාව පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්විණ.

### සපයන ලද සේවාවන්

#### පස, කොම්පෝස්ට් සහ ජලය පරීක්ෂා කිරීමේ වැඩසටහන

- ගොවි ක්ෂේත්‍රවලින් ලබා ගන්නා ලද පස් සාම්පල 890ක් විශ්ලේෂණය

කොට පොහොර නිර්දේශ සපයන ලදී.

- ජල සාම්පල 20ක් සහ කොම්පෝස්ට් සාම්පල 20ක් තත්ත්ව විශ්ලේෂණය සඳහා භාවිතා කෙරිණ.
- ස්ථාන විශේෂිත කලාපීය ගැටළු නිරාකරණය සඳහා නිලධාරීන් විසින් ක්ෂේත්‍ර චාරිකා 27ක් සිදු කරන ලදී.

### විශේෂ ජයග්‍රහණ/ සම්මාන

- ඩී.ජී.සී. ජීවනි මිය චීනයේ වයඹ දිග කෘෂිකර්ම සහ වනාන්තර විශ්ව විද්‍යාලයෙන් (Northwest Agriculture and Forest University) සිය දර්ශනපති උපාධිය ලබා ගත්තාය.
- කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්, කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය, කෘෂිකර්ම අතිරේක ලේකම්, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂවරු සහ අනෙකුත් ආයතනික ප්‍රධානීන් සමඟ සියලුම නිලධාරීන් 2017 දෙසැම්බර් 15 වැනි දින අඟුණකොළපැලැස්ස GLORDC හිදී පර්යේෂණ ක්ෂේත්‍ර දිනය පවත්වන ලදී.

## රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

### එළවළු

- නිර්දේශිත තුඹ ප්‍රභේදවල මූලික රෝපණ ද්‍රව්‍ය වශයෙන් කුඩා පැළෑටි 2476ක් නිෂ්පාදනය කරන ලදී.

### පළතුරු

- බද්ධ දිවුල් පැළ 5,000ක් නිපදවන ලදී.

## බීජ නිෂ්පාදනය

**වගු අංක 1.1.1.2: 2017 වර්ෂයේදි නිෂ්පාදිත බීජ ප්‍රමාණය**

| බෝගය | ප්‍රභේදය | වර්ගය | ප්‍රමාණය (kg) |
|---|---|---|---|
| රටකජු | තිස්ස | අභිජනන බීජ | 288 |
| | ANKG 1 | අභිජනන බීජ | 62 |
| | ANKG 2 | අභිජනන බීජ | 391 |
| | මිශ්‍ර රටකජු | පාරිභෝගික | 1549 |
| තල | උමා | අභිජනන බීජ | 6.26 |
| | මලී | අභිජනන බීජ | 2 |
| | මිශ්‍ර තල | පාරිභෝගික | 12 |
| කව්පි | ANKCP 1 | අභිජනන බීජ | 20 |
| | මිශ්‍ර කව්පි | පාරිභෝගික | 352.5 |
| කොල්ලු | ANKK කළු | අභිජනන බීජ | 03 |
| | ANKK දුඹුරු | අභිජනන බීජ | 03 |
| | මිශ්‍ර කොල්ලු | පාරිභෝගික | 61 |
| මුං ඇට | මිශ්‍ර මුං | පාරිභෝගික | 56.5 |
| | මිශ්‍ර මුං | පාරිභෝගික | 56.5 |
| සෝයා බෝංචි | මිශ්‍ර සෝයා බෝංචි | පාරිභෝගික | 45 |
| බඩ ඉරිඟු | මිශ්‍ර බඩඉරිඟු | පාරිභෝගික | 659.5 |
| රුහුණු මිරිස් | බීජ | බහුගුණන | 5 |

## සංවර්ධන ක්‍රියාකාරකම්

- පළතුරු උයනක් ස්ථාපනය කිරීම සඳහා අක්කර 12ක ඉඩමක් සංවර්ධනය කරන ලදී.
- අඹ ව්‍යාපෘතියේ සහ අභ්‍යන්තර සම්පත්වල ආධාරයෙන් ගබඩා සහ දැල් ගෘහ සහිත ක්ෂේත්‍ර පැළ තවාන් ගොඩනැගිල්ලක් ඉදි කරන ලදී.
- අක්කර 10ක් පුරා පැතිර පවතින පළතුරු බෝග වර්ග 90ක ප්‍රවේණි විවිධත්වය සංරක්ෂණය කිරීම පිණිස ජෛව විවිධත්ව උයනක් සංවර්ධනය කරන ලදී.

## 2018 වසර සඳහා සැලැස්ම

- වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා බෝග කළමනාකරණ භාවිතාවන් සංවර්ධනය කිරීම
- වාණිජමය සහ පරිභෝජන කාර්යයන් සඳහා ඉහළ අස්වනු, මධ්‍යස්ථ කාලීන විශාල බීජ සහිත රටකජු ප්‍රභේද සංවර්ධනය
- ඉහළ අස්වනු, ගුණත්වය සහ පලිබෝධ හා රෝගවලට ප්‍රතිරෝධී මුං, කව්පි සහ කොල්ලු වලට විශේෂ අවධානය යොමු කරමින් රනිල ධාන්‍ය බෝග සංවර්ධනය හා ප්‍රවර්ධනය.
- වාණිජමය සහ පරිභෝජන කාර්යයන් තල ප්‍රභේද සංවර්ධනය හා ප්‍රවර්ධනය
- තෙල් බිජ බෝග සහ ධාන්‍ය කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් පාංශු සාරවත්භාවය කළමනාකරණ අධ්‍යයනය.
- තෙල් බීජ බෝග සහ ධාන්‍ය සඳහා පරිසර හිතකාමී සහ අඩු පිරිවැය සහිත පලිබෝධ සහ රෝග කළමනාකරණ ක්‍රම සංවර්ධනය.
- තෙල් බීජ බෝග, ධාන්‍ය, කලාපීය වශයෙන් වැදගත් පළතුරු සහ බඩඉරිඟු සඳහා ආර්ථිකමය වශයෙන් වැදගත් හා පාරිභෝගික රුචිකත්වය ඇති ආහාර සැකසුම් තාක්ෂණය සංවර්ධනය කිරීම.
- කලාපීය වශයෙන් වැදගත්වන එළවළු බෝග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම.

## කාර්ය මණ්ඩලය

### GLORDC, අඟුණකොළපැලැස්ස

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ ) | 14 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යාඥ) | 01 |
| පරිපාලන නිලධාරි | 01 |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 01 |
| සංවර්ධන නිලධාරි | 03 |
| ගොවිපළ කළමනාකරු | 01 |
| පර්යේෂණ සහකාර | 10 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 06 |
| තාක්ෂණික සහායක | 03 |
| රියදුරු | 07 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 02 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| මුරකරු | 15 |
| කම්කරු (ස්ථිර) | 156 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 35 |
| **එකතුව** | **258** |

## ARS, වීරවිල

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂිකර්ම පර්යේෂණ) - ස්ථාන භාර | 01 |
| සංවර්ධන නිලධාරි | 01 |
| පර්යේෂණ සහකාර | 02 |
| තාක්ෂණික සහායක | 01 |
| රියදුරු | 01 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| මුරකරු | 04 |
| කම්කරු (ස්ථිර) | 13 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 04 |
| **එකතුව** | **28** |

## 1.1.2. ප්‍රාදේශිය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අරලගංවිල

අරලගංවිල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය යටතේ ක්‍රියාත්මක වේ. මෙය සතු වගකීම වනුයේ, වෙනත් ක්ෂේත්‍ර බෝග, වී, පලතුරු, එළවළු වැනි කලාපීය ඉල්ලුමක් සහිත බෝග වර්ග සම්බන්ධයෙන්, අවශ්‍යතාවය අනුව පර්යේෂණ සිදු කිරීමයි. ඉහළ අස්වනු ලබා දෙන ප්‍රභේද බිහි කිරීම, බෝග ආරක්ෂණ තාක්ෂණ ක්‍රම බිහිකිරීම, ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් සහ පැළෑටි පෝෂක කළමනාකරණ ක්‍රමෝපායන් බිහි කිරීම මෙහි පර්යේෂණ වැඩසටහන් වලදී ඉලක්ක කෙරේ.

චූර්ණමය නොවන දුඹුරු පසකින් යුත් DL2b කෘෂි පාරිසරික කලාපයේ පිහිටුවා ඇති එකම කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, අරලගංවිල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයයි. මහවැලි B, C, G කලාප වලට අමතරව ශ්‍රී ලංකාවේ නැගෙනහිර කලාපය ආවරණය කරමින් තාක්ෂණික මාර්ගෝපදේශ ලබා දෙන එකම ආයතනය වනුයේ ද මෙම මධ්‍යස්ථානයයි.

### අයවැය

**වගු අංක 1.1.2.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 7,430,466 | 6,589,767 | 89 |
| මූලධන | 5,105,000 | 4,877,512 | 96 |
| ව්‍යාපෘති | | | |
| • පැපොල් අභිජනන බීජ නිෂ්පාදනය | 500,000 | 491,740 | 98 |
| • මිරිස්, බඩඉරිඟු සහ ඵෑණු බෝග දෙමුහුම් සහ විවෘතව පරාගණය වන ප්‍රභේද බිහි කිරීම | 1,620,000 | 1,388,055 | 86 |
| • ග්‍රාම නිලධාරි වසම් සඳහා පාංශු පරීක්ෂණ මත පදනම් වූ පොහොර නිර්දේශ කිරීමේ වැඩසටහන | 200,000 | 199,722 | 100 |
| **එකතුව** | **14,855,466** | **13,546,796** | **91** |

### ප්‍රගතිය

#### ප්‍රභේදීය වැඩිදියුණු කිරීම

##### පොකුරු ඵෑණු

- එකතුන් 60ක රූපීය සහ ගුණාත්මක ලක්ෂණ පිළිබඳ ඇගයීම් අඛණ්ඩව සිදු කෙරිණි. පරීක්ෂාව සඳහා නිර්දේශිත ප්‍රභේද දෙකක් (තින්නවේලි රෙඩ් සහ ජැෆ්නා ලෝකල්) සමඟින් ACA 56 සහ ACA 13 යන කෙටි කාලීන වර්ග (දින 60-75) ප්‍රභේදීය අනුවර්තීතාවය යටතේ අගයනු ලැබිය; එම ප්‍රභේද නම් ‘තින්නවේලි රෙඩ්’ සහ ‘ජැෆ්නා ලෝකල්’ ය. 2016/17 මහ කන්නයේදී සහ 2017 යල කන්නයේදී තෙළුල්ල

සහ කල්පිටියේදී ACA 56 අනෙකුත් ප්‍රභේද වලට වඩා ඉහළ අස්වනු ගෙන දුන් අතර ත්‍රිකුණාමලයේදී ACA 13 සාර්ථක අස්වනු ලබාදුනි.

- 2016/17 මහ කන්නයේදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා ලැබීම (NCVT) යටතේ සපුෂ්පික ආර හතරක් එනම් ACA 67, ACA 68, ACA 81 (ආර අංක 15) සහ ACA 82 (ආර අංක 17) "වේදාලන්" (පරීක්ෂණ ආර) සමග අගයනු ලැබිය. 2016/17 මහ කන්නයේදී අරලගංවිල ආශ්‍රිතව ACA 81 ඉහළ සාර්ථකත්වයක් පෙන්නුම් කළ නමුත් කන්නය අවසානයේ හටගත් වර්ෂා තත්ත්වය හේතුවෙන් වගාව හානියට පත්විය. තිරුනෙල්වෙලියේදී පරීක්ෂණ ආරට වඩා අනෙකුත් ආර හතර ඉහළ සාර්ථකත්වයක් පෙන්විය.
- 2016/17 මහ කන්නයේදී සහ 2017 යල කන්නයේදී ප්‍රධාන අස්වනු අත්හදා බැලීම (MYT) යටතේ ඉහළ අස්වනු සහිත සහ මනා පෙනුමෙන් යුත් ආර දොළහක් අගයන ලදී. මහ කන්නයේදී හටගත් වර්ෂාව හේතුවෙන් ප්‍රධාන අස්වනු අත්හදා බැලීමට බාධා ඇතිවිය. ACA 83 (15.9 ටො/හෙ.) යල කන්නයේදී ඉහළම අස්වැන්නක් පෙන්නුම් කලේය. අන්තර් විශේෂ අතර දෙමුහුම්කරණය යටතේ $F_1$ බීජ අස්වනු ලබාගත් අතර ඒවා ගුණනය කිරීම හා ඇගයීම් සඳහා වගා කරන ලදී.

## උද්‍යාන බෝග

### පැපොල්

'රත්න' පැපොල් ප්‍රභේදයේ බීජ හටගැනීම සඳහා බලපාන කන්නමය වෙනස්වීම් සහ විවිධ ක්‍රම පිළිබඳ අධ්‍යයනය කරනු ලැබිය. පැපොල් පලතුරෙහි බර සඳහා පරාගන ක්‍රමය, පවත්නා කාළගුණ තත්ත්වය, විශේෂයෙන් ඉහළම සහ පහළම ආර්ද්‍රතාවය හෝ නිරපේක්ෂ ආර්ද්‍රතාවය විශේෂ බලපෑමක් ඇති නොකරන අතර, එය එම පලතුරෙහි තිබෙන පූර්ණ වූ බීජ ප්‍රමාණයට හෝ බීජ ප්‍රමාණය අඩු වීම සඳහා බලනොපායි.

නව 'රත්න' පැපොල් බීජ අභිජනන වගාවක් ස්ථාපිත කරන ලද අතර අභිජනන බීජ කි.ග්‍රෑ. 5ක් නිෂ්පාදනය කෙරිණි.

### ඩ්‍රැගන් ෆෘට්

ඩ්‍රැගන් ෆෘට් ශාකය සම්බන්ධයෙන් ශාක පුහුණුව සහ කප්පාදු කිරීම ඇගයීම පිළිබඳ වූ අත්හදා බැලීමක් ආරම්භ කරන ලදී. මෙම වර්ෂයේදී පලතුරු ඉතා අඩු ප්‍රමාණයක් අස්වැන්න ලෙස නෙලාගන්නා ලදී. මෙම ශාකයේ මූලික සහ ද්විතියික රිකිලි මතු විම සහ මල් හට ගැනීම සඳහා, පවත්නා තොරතුරු අනුව, පැළ සංඛ්‍යාවේ හෝ අතු සංඛ්‍යාවේ බලපෑමක් නොමැති බව පැහැදිලි වී ඇත.

### අඹ

මධ්‍යස්ථානයේ වගා කර ඇති අඹ එකතුන් 46ක් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අස්වනු දත්ත ලබා ගනිමින් අගයන ලදී. එම එකතුන් අතර ACC 51, 28, 8, 14 සහ 15 යන එකතුන් සඳහා රස සහ සුවද ඇගයීමේදී වැඩි වරණයක් හිමි විය. දත්ත රැස් කිරීම අඛණ්ඩව සිදු වේ.

### පොකුරු ඇණු

- ඇණු බීජ සම්බන්ධයෙන් වසන්තීකරණ ක්‍රියාවලිය මිල අධික මෙන්ම කාලය ද වැයවන ක්‍රියාවලියකි. එබැවින් වසන්තීකරණය නොකරන ලද පොකුරු ඇණු වල මල් හට ගැනීම සඳහා විවිධ මට්ටමේ නයිට්‍රජන් පොහොර සහ GA3 භාවිතයන් අගයන ලදී. එහෙත් වසන්තීකරණය නොකරන ලද රතු ඇණු වල මල් හට ගැනීම සඳහා පරීක්ෂණයට භාජනය කල නයිට්‍රජන් සහ GA3 මට්ටම් වල කිසිදු විශේෂිත බලපෑමක් නොමැති බව පෙනී ගොස් ඇත.

- සාරවත් බව හීන වූ පසෙහි තත්ත්වය ඉහළ නැංවීම සඳහා ජෛව අඟුරු සහ කාබනික ද්‍රව්‍ය භාවිතය පොකුරු ඇණු යොදාගනිමින් අගයන ලදී. පරීක්ෂණයට භාජනය වූ කිසිදු පරාසයකදී වුව පොකුරු ඇණු සම්බන්ධයෙන් සුවිශේෂී ප්‍රතිඵල ලබා නොදුනි.

## වී

බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය (RRDI) සම්බන්ධීකරණය කරන ලදුව, අරලගංවිලදී මාස 3 ½ක් පරිණත වන ආර 4ක්, සහ මාස 3ක් පරිණත වන ආර 5ක් පරීක්ෂාවට ලක් කෙරිණි. මාස 3 ½ න් පරිණත වන At 362 පරීක්ෂණ ප්‍රභේදය, අනෙකුත් තෝරාගත් පරීක්ෂණ ප්‍රභේද වලට වඩා (BG 352, At 373, BG 366) ඉතා ඉහළ අස්වැන්නක් (7.5 ටො./හෙ.) ලබා දුන්නේය. මහ කන්නයේදී, මාස 3න් පරිණත වන At 13-1543 (7.3 ටො./හෙ.) අභිජනන ආරය පරීක්ෂණ ආර (BG 300, At 309, At 311) වලට වඩා ඉහළ අස්වැන්නක් ලබා දුන් අතර At 13 - 3048) (13.7 ටො./හෙ.) ලබා දුන්නේය. මාස 3 ½න් පරිණත වන ආරයේ කිසිදු සුවිශේෂී වෙනසක් පෙන්නුම් නොකලේය.

## කව්පි

මහ කන්නයේ කරදියනාරු ප්‍රදේශයේ වර්ෂා පෝෂක තත්ත්වය යටතේ කව්පි ආර 10ක් අතුරින් (නියඟයට ඔරොත්තු දෙන) ANKCP 1 සහ MICP 2009 - 4 (2.7 ටො./හෙ.) යන ආර පරීක්ෂණ ආර වන වරුණි (2.5 ටො./හෙ.), ධවල (2.4 ටො./හෙ.) සහ MICP 1 (2.6 ටො./හෙ.) ට වඩා වැඩි අස්වැන්නක් ලබා දුන් අතර, ධවල පරීක්ෂණ ආරය (2.8 ටො./හෙ.) වාරිජල සැපයුම් තත්ත්වය යටතේ අරලගංවිලදී ඉහළ අස්වැන්නක් ලබා දුණි. යල කන්නයේ සීමිත ජල සැපයුම යටතේ MICP 2009 - 1 (1.9 ටො./හෙ.) ඉහළම අස්වැන්නක් ලබා දුන් අතර පරීක්ෂණ ආර 'ධවල' සහ MICP 2009 - 4 ද (2.7 ටො./හෙ.) ඉහළ අස්වැන්නක් ලබාදුණි. අඟුණකොළපැලැස්ස GLORDC වෙතින් සම්බන්ධීකරණය කරන ලද ආර 8ක් අගයන ලද අතර යල කන්නයේදී අස්වැන්නේ සුවිශේෂී වෙනසක් පෙන්නුම් නොකලේය.

## මුං

මහඉලුප්පල්ලම FCRDI සහ අඟුණකොළපැලැස්ස GLORDC වෙතින් සම්බන්ධීකරණය කරන ලදුව NCVT යටතේ මුං ආර 8ක් පරීක්ෂාවට ලක් කරන ලදී. MIMB 14254 සහ MI5 පරීක්ෂණ ආරය (0.6 ටො./හෙ.) 2016/17 මහ කන්නයේ ඉහළම අස්වැන්නක් ලබා දුන්නේය. යල කන්නයේ ආර 10ක් පරීක්ෂාවට භාජනය කරන ලද අතර අස්වැන්නේ සුවිශේෂී වෙනසක් පෙන්නුම් නොකලේය.

## රටකජු

අඟුණකොළපැලැස්ස තෙල් හා මාෂ බෝග පර්යේෂණ හා සවංර්ධන මධ්‍යස්ථානය (GLORDC) වෙතින් සම්බන්ධීකරණය කරන ලදුව විශාල බීජ සහිත රටකජු ආර 5ක් කෙටි කාලීන අස්වනු ලබා දෙන ආර 4ක් NCVT යටතේ පරීක්ෂාවට ලක් කෙරිණි. විශාල බීජ සහිත ANKG 2 (2.3 ටො./හෙ.) ANKG 7 (2.2 ටො./හෙ.) ඉහළම අස්වනු ලබාදුන් අතර, කෙටි කාලීන අස්වනු ලබා දෙන ICGV 2742 (2.2 ටො./හෙ.) මහ කන්නයේදී ඉහළම අස්වැන්නක් ලබා දුන්නේය. යල කන්නයේදී ANKGL 2742 (1.8 ටො./හෙ.) සහ ANKGL 6 (1.7 ටො./හෙ.), පරීක්ෂණ ආරයට වඩා වැඩි අස්වැන්නක් ලබා දුන්නේය.

## සෝයා

මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (FCRDI) සහ අඟුණකොළපැලැස්ස GLORDC වෙතින් සම්බන්ධීකරණය කරනු ලදුව NCVT

යටතේ සෝයා ආර 10ක් පරීක්ෂාවට ලක් කරන ලදී. MISB 2 ආර අංක 2542 සහ පරීක්ෂණ ආර PB 1 (1.5 ටො./හෙ) මහ කන්නයේදී ඉහළම අස්වනු ලබා දුන් අතර, MISB 1 (1.3 ටො./හෙ.) පරීක්ෂණ ආරය යල කන්නයේදී ඉහළම අස්වනු ලබාදුණි.

## ඌණ භාවිත බෝග

### තිබ්බටු

තිබ්බටු අභිජනන බීජ ක්ෂේත්‍රය අසල වෙනත් තිබ්බටු වගාවක් ස්ථාපනය කිරීම හේතුවෙන් අභිජනන බීජ නිෂ්පාදනය සිදු නොකරන ලදී. තිබ්බටු ප්‍රචාරණ ක්‍රම පිළිබඳ ක්ෂේත්‍ර ඇගයීම් සිදුවෙමින් පවතී.

### තුඹ කරවිල

වියළි කලාපීය තත්ත්වයන් යටතේ තුඹ කරවිල සම්බන්ධ ක්‍රියාකාරීත්වයන් සඳහා විවිධ සෙවන මට්ටම්වල ආවරණ දැල් භාවිත කිරීමෙන් සිදුවන ප්‍රතිඵල පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයනයන් ආරම්භ කරන ලදී. මල් පිපීම සම්බන්ධයෙන් වූ දත්ත සහ උෂ්ණත්ව, ආලෝක තත්ත්වයන්ගේ විවිධ මට්ටම් ප්‍රමාණනය කරන ලදී. පරීක්ෂණ අඛණ්ඩව සිදු වේ.

ද්විකේෂර පුෂ්ප හටගැනීම සම්බන්ධ අධ්‍යයන ද අඛණ්ඩව සිදු වේ.

## පැළෑටි සංරක්ෂණය

- පොකුරු ඇණු වගාව සඳහා බලපාන ප්‍රධානතම ගැටලුව වනුයේ දිලීර රෝගයන්ය. ප්‍රධානතම දිලීර රෝග සම්බන්ධයෙන් (දම් පැල්ලම් රෝගය, ඇන්ත්‍රැක්නෝස්, දිලීර බල්බ කුණුවීමේ රෝගය) පොකුරු ඇණු ආර 46ක් පරීක්ෂණයට භාජනය කරන ලද අතර, තෝරාගත් ආර ගුණනය සඳහා යොදා ගන්නා ලදී. අණුක හඳුනා ගැනීම්ද අඛණ්ඩව සිදු වේ.

- ශ්‍රී ලංකාවේ ඇණු වගාවේදී පත්‍ර කන දළඹුවන්, පැළ මැක්කන්, බල්බ මයිටාවන් ප්‍රධානතම කෘමි වර්ග වන අතර, දම් පැල්ලම් රෝගය, ඇන්ත්‍රැක්නෝස්, දිලීර බල්බ කුණුවීම, බැක්ටීරියානු බල්බ කුණුවීම සහ යටිපුස් රෝගය ප්‍රධානතම රෝග වර්ග වේ. ඉහත කෘමීන්ගෙන් සහ රෝග වලින් වන අස්වනු හානිය, විවිධ දේශගුණික තත්ත්වයන් යටතේ වෙනස් වේ. කෘමි හා රෝග සහ කාලගුණික පරාමිතීන් සම්බන්ධ එක්රැස් කරගත් දත්ත ආශ්‍රයෙන් මහවැලි B කලාපය සඳහා බෝග දින දර්ශනයක් සැකසීමට නියමිතය.

- විවිධ කාලගුණික තත්ත්ව යටතේ කෘමීන් සහ රෝග වලින් බෝග වලට වන හානිය විවිධ වේ. රටකජු වගාවේ අස්වනු හානිය සඳහා කෘමීන්ගෙන් සහ රෝග වලින් වන බලපෑම සළකා බලමින්, කෘමි හා රෝග දත්ත සහ කාලගුණික දත්ත භාවිත කොට මහවැලි B කලාපය සඳහා බෝග දින දර්ශනයක් සකසනු ඇත. දත්ත රැස් කිරීම අඛණ්ඩව සිදු වේ.

- දිවයින පුරා ප්‍රදේශවලින් රටකජු ආර 21ක් එක්රැස් කරගන්නා ලද අතර, ප්‍රධාන රෝග, රූපීය හා ගුණාත්මක ලක්ෂණ පිළිබඳ පරීක්ෂාවට භාජනය කිරීම අඛණ්ඩව සිදුවුනි.

## පාංශු විද්‍යාව සහ ජල කළමනාකරණය

- වී අස්වනු සඳහා කාබනික සහ කාබනික නොවන පොහොර දිර්ඝ කාලීනව මිශ්‍රව යොදා ගැනීමෙන් ඇතිවන බලපෑම සම්බන්ධයෙන් අවුරුදු 25ට වඩා වැඩි කාලයක සිට අධ්‍යයන සිදු කෙරෙමින් පවතී. ස්ථානීය වශයෙන් (වී - රනිල බෝග මාරුව) රසායනික පොහොර සමග කාබනික ද්‍රව්‍ය යොදා ගැනීම සහ ගොම සමඟ රසායනික පොහොර යොදා ගැනීම යන කටයුතු වලදී වැඩි අස්වනු ලබා දුන්නේය. (3.7 ටො./හෙ.) (වී - වී බෝග මාරුවේදී) රසායනික පොහොර සහ කාබනික ද්‍රව්‍ය යොදා ගැනීම

පිළිබඳ පරිබාහිර පරීක්ෂණකදී හෙළිවූයේ ගොම පොහොර සමග කොළ පොහොර යොදා ගැනීමෙන් රසායනික පොහොර යොදා ගැනීම හා සංසන්දනාත්මකව ඉහල අස්වැන්නක් (අස්වැන්න > 6 ටො./හෙ.) ලබා දුන් බවයි.

- ශ්‍රී ලංකාවේ බඩඉරිඟු වගාව සඳහා දේශගුණික විපර්යාසයන්ගෙන් එල්ලවන බලපෑම තක්සේරු කිරීම සඳහා අධ්‍යයනයක් අඛණ්ඩව සිදු කෙරේ. විවිධ ප්‍රභේද සඳහා පූර්ව අත්හදා බැලීම් වලට අනුව දත්ත ආදර්ශ ක්‍රමාංකනය කිරීම සම්පූර්ණ කරන ලදී.

- අඩු පෝෂක ප්‍රමාණයක් යටතේ කැල්සියම් රහිත දුඹුරු පසේ වී ප්‍රභේද වගා කිරීම පිළිබඳ වූ පිරීක්සීමේදී පොහොර නොයොදා BG 357 සහ BW 361 යන වී ප්‍රභේද ඉහළ අස්වැන්නක් (67 ටො./හෙ.) ලබාදුන් බව පෙනී ගියේය.

- රතු ළූණු වගාවේ ජලය භාවිතය කාර්යක්ෂම කිරීම සඳහා ජලය උරාගැනීමේ සුපිරි කාරක වල බලපෑම පරීක්ෂා කිරීමට අධ්‍යයනක් ආරම්භ කරන ලදී. එහිදී හෙක්ටෙයාරයකට කි.ග්‍රෑ. 0 සිට 50 දක්වා යොදා කරන ලද ප්‍රතිකර්ම වලදී කිසිදු වෙනසක් ඇති නොවුනි. එබැවින් ඉහළ ප්‍රමාණ යටතේ අධ්‍යයනය අඛණ්ඩව සිදු වේ.

- බඩඉරිඟු වගාව සඳහා දුර්වල ජල වහනයේදී ඇතිවන තත්ත්වයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක් සිදුකරන ලදී. ප්‍රතිකාර ක්‍රම අතරින් වගාවේ මුල් භාගයේදී (පත්‍ර 3ක් සහිත කාලය) ඇතිවන දුර්වල ජල වහනයේ බලපෑම වැඩිවන බව එම අධ්‍යයනයෙන් අනාවරණය විය.

## බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

**වගු අංක 1.1.2.2. : 2017 වර්ෂයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

| බෝගය | ප්‍රභේදය | බීජ / රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය |
|---|---|---|
| තුඹ කරවිල | | බඳුන් පැළ 1758ක් බෙදා දෙන ලදී |
| තිබ්බටු | බින්දු | බඳුන් පැළ 470ක් ගොවීන්ට බෙදා දෙන ලදී |
| පැපොල් | රත්න | අභිජනන බීජ කි.ග්‍රෑ. 5ක් නිපදවන ලදී. |

## තාක්ෂණ ව්‍යාප්තිය

### ක්ෂේත්‍ර දින සහ පුහුණු

- බෝග සායන : නිලධාරීන් සම්පත් දායකයන් ලෙස සහභාගි වූ අතර ගොවි ක්ෂේත්‍ර ගැටළු සඳහා විසඳුම් ලබා දෙන ලදී.

- පළාත් සහ මහවැලි තාක්ෂණික කණ්ඩායම් රැස්වීම: මහවැලි සහ නැගෙනහිර පළාත් ප්‍රාරම්භක රැස්වීම් සඳහා කන්න දෙක වෙනුවෙන් අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දෙන ලදී.

- ව්‍යාප්ති නිලධාරීන් සඳහා තුඹ කරවිල වගාව පිළිබඳ තාක්ෂණික උපදෙස් ලබා දෙන ලදී.

- පාසැල් ළමුන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

### සේවා

- පස් පරීක්ෂාව : ගොවි ක්ෂේත්‍ර සහ පර්යේෂණ ක්ෂේත්‍ර වලින් ලබාගත් පස් සාම්පල 856ක් විශ්ලේෂණය කර නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

- ගොවීන් 50කට වඩා වැඩි සංඛ්‍යාවකට ගොවි උපදෙස් ලබා දුන් අතර, ක්ෂේත්‍ර

ගැටළු විසඳීම සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණ 23ක් සිදු කරන ලදී.

## 2018 වසර සඳහා සැලැස්ම

- ඉහළ අස්වනු, කෙටි කාලීන අස්වනු සළකා බලමින් පොකුරු ඵෑණු සම්බන්ධයෙන් ප්‍රභේදමය වැඩිදියුණු කිරීම් සිදු කිරීම සහ කෘමි හා රෝග අවම කිරීම.
- එළවළු සඳහා මල් හටගන්නා ප්‍රශස්තම ආර තෝරා ගැනීම සහ පොකුරු ඵෑණු සම්බන්ධයෙන් සත්‍ය බීජ නිෂ්පාදනය.
- තුඹ කරවිල සම්බන්ධයෙන් ප්‍රභේදමය වැඩිදියුණු කිරීම්.
- පොකුරු ඵෑණු, අවභාවිත බෝග සහ වී වගාවේ අස්වනු වැඩි කිරීම සඳහා ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් නිර්මාණය කිරීම.
- අඹ, ඩ්‍රැගන් ෆෘට් පලතුරු බෝග සඳහා යෝග්‍ය වූ බෝග පාලන පිළිවෙත් නිර්මාණය කිරීම.
- වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා ජල භාවිත කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට තාක්ෂණික ක්‍රම නිර්මාණය කිරීම.
- වී සහ වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා පාංශු පෝෂක වැඩි දියුණු කිරීමේ තාක්ෂණික ක්‍රම නිර්මාණය කිරීම.

## කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 12 | 03 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 01 | - |
| පරිපාලන නිලධාරි (වැඩ බලන) | 01 | 01 |
| කෘෂිකර්ම උපදේශක (විශේෂ) | 01 | - |
| පර්යේෂණ සහකාර (විශේෂ) | 02 | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 01 | - |
| සංවර්ධන නිලධාරි | 02 | - |
| කෘෂිකර්ම උපදේශක | 04 | 02 |
| පර්යේෂණ සහකාර | 09 | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 05 | 04 |
| තාක්ෂණ සහායක (ව්‍යාප්ති) | 06 | 05 |
| තාක්ෂණ සහායක (පර්යේෂණ) | 06 | 05 |
| රියදුරු | 05 | 04 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 02 | 01 |
| ගබඩා භාරකරු | 01 | 01 |
| වඩුකරු | 01 | 01 |
| පෙදෙරේරු | 01 | - |

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| විදුලි ශිල්පි | 01 | - |
| කාර්මික ශිල්පි | 01 | 01 |
| පර්යේෂණ උප සහකාර | 04 | 01 |
| බද්ධකරු | 01 | 01 |
| සංචාරක බංගලා භාරකරු | 01 | - |
| කාර්යාල කාර්ය සහායක | 01 | 01 |
| මුරකරු | 13 | 11 |
| කම්කරු (ස්ථිර) | 96 | 78 |
| කම්කරු (කොන්ත්‍රාත්) | - | 25 |
| **එකතුව** | **177** | **147** |

# 1.1.3 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - කිලිනොච්චිය

වවුනියාව, තිරුනෙල්වෙලි සහ මුලතිවු යන ප්‍රදේශවල පිහිටා ඇති උප මධ්‍යස්ථාන (ARS) ද ඇතුළුව කිලිනොච්චියෙහි පිහිටි ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ (RARDC) කාර්යභාරය වන්නේ උතුරු කලාපීය ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලීම පිණිස විශේෂයෙන්ම වෙනත් ක්ෂේත්‍ර බෝග හා බැදුණු කෘෂිකාර්මික පර්යේෂණ සහ සංවර්ධන කටයුතු පවත්වාගෙන යාමයි.

## අයවැය

**වගුව අංක 1.1.3.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 11,645,829 | 11,263,278 | 97 |
| මූලධන | 11,120,000 | 10,176,751 | 92 |
| ව්‍යාපෘති | | | |
| • දෙමුහුම් | | | |
| ○ පුනරාවර්තන | 2,190,000 | 1,625,102 | 74 |
| ○ මූලධන | 1,100,000 | 743,359 | 68 |
| • NARP | 3,206,000 | 2,936,943 | 92 |
| • FAO | 462,000 | 165,721 | 36 |
| **එකතුව** | **19,723,829** | **26,911,154** | **91** |

## ප්‍රගතිය

### පර්යේෂණ

#### බෝග ප්‍රවර්ධනය

##### මෑ

- ද්වීකාර්ය මෑ සංවර්ධනය දෙවන අනුයාත වර්ෂය සඳහා ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. දැනටමත් හඳුනාගනු ලැබ ඇති ජනකප්ලාස්මා 30ක් අතර මුහුම්කරණ සිදු කරන ලද අතර සාර්ථක වූ මුහුම්කරණ 60ක් අගයන ලදී. මනා කාර්යසාධනයක් පෙන්නුම් කළ ආර එකොළහක් මූලික අස්වනු පරීක්ෂාව (PYT) සඳහා තෝරා ගැණින. මුහුම් සංයෝජන 6කින් සිවුවන දරු පරම්පරාවේ ඉදිරියට ගෙන යන ලද අභිජනන ආර මනා කාර්යසාධනයක් පෙන්වූ අතර ඒවා PYT සඳහා තෝරා ගැණින.

##### තක්කාලි

- තාපයට ඔරොත්තු දීම හා ඉහළ බීජ සංඛ්‍යාවක් අඩංගු KC-1-1 වලින් තෝරාගත් ආර ඉදිරියට ගෙන යන ලදී. KC1 වලින් තෝරා ගනු ලැබූ තාපයට ඔරොත්තු දෙන බලාපොරොත්තු තැබිය හැකි ආර ඉදිරියට ගෙන යන ලදී.

##### වට්ටක්කා

- බලාපොරොත්තු තැබිය හැකි ආර 6ක් නිපදවන ලදී.

### කුරක්කන්/ රටකජු/ තණ හාල්

- රටකජු, කුරක්කන් සහ තණ හාල් සඳහා VAT සිදු කරන ලදී.

### වම්බටු

- වැඩිදුර ඇගයීම සඳහා ආර එකොළහක් තෝරා ගන්නා ලදී. බලාපොරොත්තු තැබිය හැකි වම්බටු ආර පවිත්‍රකරණය කොට පවිත්‍රකරණයේ අවසන් අදියර දක්වා ඉදිරියට ගෙන යන ලදී.

### මිරිස්

- විවිධ මුහුම්කරණ 3ක ප්‍රජනිත 17ක් තුන්වන දරු පරම්පරාව දක්වා ඉදිරියට ගෙන යන ලදී.
- විවිධ මුහුම්කරණ 6ක ප්‍රජනිත 70ක් දෙවන දරු පරම්පරා මට්ටම දක්වා ඉදිරියට ගෙන යන ලද අතර වැඩිදියුණු කළ ආර 8ක් PYT සඳහා තෝරා ගැණින.
- ආර 38ක් සඳහා තුන්වන ස්වපරාගන චක්‍රය සම්පූර්ණ කරන ලද අතර අන්තර් අභිජනන ආර සංවර්ධනය සඳහා ආර 30කට පස්වන පරාගන චක්‍රය සම්පූර්ණ කරන ලදී.

### වෙනත් බෝග

- අතිරේක ආහාර බෝග සහ කලාපීය බෝග සඳහා NCVT සිදු කරන ලදී.
- අඹ, පේර, කොස්, මුරුංගා, දෙළුම්, මිදි සහ කෙසෙල් ප්‍රභේදවල ජනක ප්ලාස්ම නඩත්තු කරන ලදී

### පැළෑටි කීට විද්‍යාව

- රටකජුවල සුදු පැහැති කම්බිලි පණුවන් පාලනය කිරීම සඳහා නව රසායනික අණු පරීක්ෂා කරන ලදී. සුදු කම්බිලි පණුවන් පාලනය සඳහා කැසියුඩොෆෝස් (Caseudophos) වඩා හොඳ ක්‍රියාකාරිත්වයක් පෙන්වීය.
- මීටර් 10 x 10ක උපරිම වර්ග ප්‍රමාණයෙන් යුතුව තල්කොළ අතු වට කොට වැට බැඳීමෙන් වැඩි මිරිස් අස්වැන්නක් ලබාගත හැකි විය.
- මිරිස්වල නෙමටෝඩා පාලනයේ දී ඇබමෙක්ටින් (Abamectin) 2500 ml/ha ප්‍රමාණයන් දෙසතියකට වරක් සිවු වතාවක් හෝ ෆ්ලුඔපිරැම් (Fluopyram) හෙක්ටයාරයකට මිලි ලීටර් 1250ක් තෙමසකට වරක් යෙදීමෙන් සාර්ථක ප්‍රතිඵල පෙන්නුම් කොට තිබේ.

### පැළෑටි ව්‍යාධිවේදය

- බීජ බල්බ පැළ කිරීමට ප්‍රථම කාබනීකෘත දහයියා හෙක්ටයාරයකට ටොන් 15ක් යෙදීමෙන් රතුළූණුවල *Fusarium oxysporum* ආශ්‍රිත බල්බ කුණු වීමේ රෝගය පාලනය සඳහා කාර්යක්ෂම බව සොයා ගැණින.
- බීජ බල්බ පැළ කිරීමට ප්‍රථම බයෝචර් (Biocher) හෙක්ටයාරයකට ටොන් 15ක් යෙදීමෙන් රතුළූණුවල *Fusarium oxysporum* ආශ්‍රිත බල්බ කුණු වීමේ රෝගය පාලනය සඳහා කාර්යක්ෂම බව සොයා ගැණින.
- *Sclerotium rolfsii* ව්‍යාධිජනක ආකාරයේ විවිධ විශේෂ 16ක් සහ *Fusarium oxysporum* ව්‍යාධිජනක ආකාරයේ විශේෂ 6ක් වෙන්කර ගන්නා ලදී.
- උතුරු කලාපයේ මිදි වගාව හා බැඳී පවතින නව මුල් හා කඳරෝග හා සම්බන්ධ ගැටළුවලට හේතුවන ව්‍යාධිජනක දිලීරය වශයෙන් *Xylaria feejeensis* හඳුනාගනු ලැබ ඇත. එම රෝගය පාලනය කිරීම සඳහා පස මැන්කොසෙබ්) Mancozeb(64% + මෙටැලෙක්සිල් වලින් ) Metalaxyl ( 8% WP ලීටර් 10 කටගෑම් 20 පෙඟවීම කාර්යක්ෂම බව සොයා ගෙන තිබේ .

**වෙනත්**

- අතිරේක ආහාර බෝග සම්බන්ධයෙන් පහත පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර දින සහ ආදර්ශන පවත්වන ලදී.
- බඩඉරිඟු, උඳු, කව්පි, මුං ඇට සහ රටකජු පිළිබඳ ක්ෂේත්‍ර ආදර්ශන 4ක්
- ක්ෂේත්‍ර දින 5ක්
- කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් 2ක්
- පාසල් සිසුන් සඳහා සම්මන්ත්‍රණ 24ක්

- විශ්වවිද්‍යාල සිසුන් 3ක් සහ ඩිප්ලෝමා මට්ටමේ සිසුන් දෙදෙනෙක් ඔවුන්ගේ සේවාස්ථ පුහුණුව නිම කළහ.
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ස්වාධීන සේවාව, රජරට සේවාව සහ රංගිරි එෆ්.එම්. සේවාව ඔස්සේ විකාශය වූ කෘෂිකාර්මික ගුවන්විදුලි වැඩසටහන් 12ක් සඳහා තාක්ෂණික යෙදවුම් සපයන ලදී.
- පුවත්පත් ලිපි 4ක් පළ කෙරිණ.
- පැළෑටි නියැදි 248ක් පරීක්ෂා කරන ලද අතර ගොවීන්ට තාක්ෂණික උපදෙස් සපයන ලදි. සායනික ගොවි ක්ෂේත්‍ර චාරිකා 53 ක් පවත්වන ලදී.
- පාංශු නියැදි 1,694ක් පරීක්ෂා කරන ලද අතර අදාළ වැඩසටහන්/ ව්‍යාපෘතිවලට වාර්තා ලබා දෙන ලදී.
- පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.
  - තෝරාගත් බෝගයන්හි අභිජනන බීජ නිෂ්පාදනය.
  - ගස්ලබුවල පිටි මකුණා පාලනය සඳහා පරපෝෂිතයන් නිෂ්පාදනය කොට නිදහස් කරන ලදී.
  - ජනකප්ලාස්මා රැස් කිරීම සහ ස්ථාපනය කිරීම
  - මිදි සහ බිම්මල් උපයෝජ්‍යතාව අත්හදා බැලීම්
  - ශ්‍රී ලංකාවේ රෝපණ ද්‍රව්‍ය සහ වාණිජ බල්බ අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීම සඳහා ද්වි කාර්ය පොකුරු බල්බ ප්‍රභේද සංවර්ධනය.
  - විවෘතව පරාගිත (OPV) සහ දෙමුහුම් බඩ ඉරිඟු, ළූණු සහ මිරිස් සංවර්ධනය

## කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, තිරුනෙල්වෙලි

ARS, තිරුනෙල්වෙලි යනු කිලිනොච්චිය කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයෙහි උප මධ්‍යස්ථානයකි.

### ප්‍රගතිය

**පර්යේෂණ**

- කලින් එක්රැස් කර ගන්නා ලද සිනි කැකිරි ජනකප්ලාස්මා අගයන ලදී.
- මිරිස් කොළ කොඩ වීමේ රෝගයට එරෙහිව මිරිස් වලට ඇන්ටිගොනොන් (Antigonon) ද්‍රව පොහොර යොදා පරීක්ෂා කරන ලදී. නිරීක්ෂණ අධ්‍යයන යන බලාපොරොත්තු තැබිය හැකි මට්ටමේ පැවතිණි.
- දේශීය වර්ග භාවිතයෙන් Dioscorea යාපනය ප්‍රදේශයෙහි වසර පුරාම වගා කළ හැකි බව සොයා ගැණින.
- වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු හා පළතුරු මෙන්ම වී වැනි කලාපීය බෝග සඳහා NCVT සිදු කරන ලදී.
- ටිව් රෙඩ් රතු ළූණු ප්‍රභේදය සඳහා අභිජනන බීජ බල්බ බහුගුණනය සිදු කරන ලද අතර ස්වාරක්ෂක සංචිතයක් නඩත්තු කරන ලදී.

- සන්හෙම්ප් සහ මඤ්ඤොක්කා වගා කිරීම මගින් *Cyperus rotandus* සාර්ථකව පාලනය කළ හැකි බව අධ්‍යයන මගින් සනාථ වී තිබේ.

- නව වැටකොළු ආරක් සඳහා වගා ක්‍රම හඳුනාගන්නා ලදී.

- වම්බටු කුඩා පත්‍ර අසාමාන්‍යතාව පාලනය කිරීමේ පැකේජයක් හඳුනාගැණින.

- මැ සහ බඩඉරිඟු ඇතුළත්ව නව වගා පද්ධතියක් පරීක්ෂා කරන ලදී.

**වෙනත්**

- කාබනික තත්ත්ව යටතේ රතු ළූණු වගාව සම්පූර්ණ කරන ලදී.

- ප්‍රශ්නගත භූමිවලින් පාංශු නියැදි රැස් කරන ලද අතර විසඳුම් ලබා දෙන ලදී.

- නිත්‍ය පාංශු පරීක්ෂාව. ග්‍රාම නිලධාරී කොට්ඨාස පදනම් කර ගත් පාංශු නිර්දේශ කිරීම් සහ උතුරු පළාතේ PSDG වැඩසටහන් යටතේ පාංශු නියැදි 707ක් පරීක්ෂා කරන ලදී.

- බිංදු ජල සම්පාදිත මිරිස් MI CH HY 1 ප්‍රභේදය වගා කරන ලදී. පාර්ශ්වික බිංදු ජලවහනයෙන් සෙන්ටිමීටර් 5-10ක් ඉවතට වගා කිරීම මගින් යාපනයෙහි රතු කහ ලැටසෝල් පසෙහි අමුමිරිස් වගාව ඉහළම අස්වැන්නක් ලබා දුන්නේය. දේශීය තත්ත්වයනට සරිලන විසිරි ජල සම්පාදන ක්‍රම හඳුනාගනු ලැබ ඇති අතර පරීක්ෂණ තවදුරටත් සිදු කෙරෙමින් පවතියි.

- තිරසාර බෝග නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ස්ථාන විශේෂිත පොහොර කළමනාකරණ පද්ධතියෙහි සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පොහොර උප කමිටුවෙහි FAO ආධාරිත සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්වලට නිලධාරීහු සහභාගි වූහ.

- JKWSSP ව්‍යාපෘතිය යටතේ යාපනය නවාලි යෝජිත කෘෂිකාර්මික ප්‍රදේශයේ පාංශු සමීක්ෂණ සාර්ථකව නිම කරන ලදී.

- අපගේ උපදේශන සේවාව යටතේ බෝග, පස සහ ගොවි ක්‍රියාකාරකම්වලට අදාළව ගොවීන්ගේ සහ ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ ගැටළු විසඳන ලදී.

- ගොවීන්, විශ්වවිද්‍යාල සහ පාසල් සිසුන් වෙනුවෙන් වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු පිළිබඳ පුහුණු වැඩසටහන්, ප්‍රදර්ශන, ක්ෂේත්‍ර දින සහ ආදර්ශන රැසක් පවත්වන ලදී.

## කාර්ය මණ්ඩලය

### RARDC, කිලිනොච්චිය

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 03 |
| සංවර්ධන නිලධාරි | 02 |
| පර්යේෂණ සහායක | 02 |
| තාක්ෂණික නිලධාරි | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| තාක්ෂණික සහායක | 04 |
| රියදුරු | 02 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| යාන්ත්‍රික ශිල්පි | 02 |
| පෙදරේරු | 01 |
| කාර්මික ශිල්පි | 01 |
| මුරකරු | 06 |
| කම්කරු (ස්ථිර) | 52 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 32 |
| **එකතුව** | 111 |

## ARS, තිරුනෙල්වෙලි

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) ස්ථාන භාර | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 02 |
| සංවර්ධන නිලධාරි | 03 |
| කෘෂිකර්ම උපදේශක | 02 |
| පර්යේෂණ සහකාර | 04 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| තාක්ෂණික සහායක | 01 |
| රියදුරු | 01 |
| ගබඩාකරු | 01 |
| පර්යේෂණ උප සහායක | 01 |
| මුරකරු | 03 |
| කම්කරු (ස්ථිර) | 19 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 19 |
| **එකතුව** | 58 |

# 1.2 උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - ගන්නොරුව

උද්‍යාන බෝග වගාවට අදාළ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වගකිව යුතු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආයතනය වශයෙන් ගන්නොරුව පිහිටි උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය හැඳින්විය හැකිය. එයට වගකීම පැවරී ඇති බෝග කාණ්ඩ වන්නේ එළවළු, අර්තාපල් ඇතුලු මුල් හා ආකන්ද බෝග සහ මල් යනාදියයි. බණ්ඩාරවෙල සහ මාකඳුර පිහිටි කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානද, සීතා එළිය, ගිරාඳුරුකෝට්ටෙ, තෙලිජ්ජවිල සහ රහංගල පිහිටි අනෙකුත් පර්යේෂණ මධ්‍යස්ථාන හතරද උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය යටතේ ක්‍රියාත්මක වෙයි. පර්යේෂණ වැඩසටහන් තුළදී ආයතනය මෙහිදී සුදුසු එළවළු බෝග නිෂ්පාදන ඉලක්ක ලඟා කල හැකි ලෙස බෝග කළමනාකරණ ක්‍රමවේද පරිසර හිතකාමී ලෙස භාවිතයටද ප්‍රධාන අවධානය යොමු වී ඇත. පර්යේෂණ කටයුතු වලට අමතරව මෙම ආයතනය ස්වකීය පර්යේෂණ යටතට සෘජුවම සම්බන්ධ වන කෘෂිකර්ම සංවර්ධන ක්‍රියාකාරකම්වලද නිරත වෙයි.

## අයවැය

**වගු අංක 1.2.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 35,443,931 | 23,487,183 | 66 |
| මූලධන | 28,056,919 | 28,733,079 | 102 |
| ව්‍යාපාති | | | |
| • KOPIA - බිම්මල් (285-2-2-4-2502 (13 Mush-28) | 3,067,000 | 3,840,000 | 125 |
| • පැළෑටි ජාන සම්පත් සඳහා සමෝධානිත කළමනාකරණ පද්ධතිය | 3,500,000 | 2,970,000 | 85 |
| • පසු අස්වනු තාක්ෂණ සංග්‍රහයක් / අත්පොතක් නිර්මාණය හා ක්‍රියාත්මක කිරීම (285-2-2-42502 (13) AFACI-10 | 2,232,000 | 2,050,000 | 92 |
| • NARP (285-2-2-5-2502-11) | 9,167,400 | 9,073,113 | 99 |
| • තිරසාර කාබනික ගොවිතැන් තාක්ෂණය සඳහා ආසියාතික ජාලය (285-2-2-4-2507(13) 33 | 1,762,000 | 1,663,000 | 94 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| • හයිඩ්‍රොපොනික් නිෂ්පාදන පද්ධති භාවිතයෙන් වෛරස් රහිත අර්තාපල් බීජ නිෂ්පාදන තාක්ෂණය හඳුන්වා දීම (285-2-2-4-2507-(13)IMPGR 13) | 2,212,000 | 2,700,000 | 122 |
| • නව දෙමුහුම් සහ විවෘත පරාගිත ප්‍රභේද සංවර්ධනය සහ මූලික බීජ නිෂ්පාදනය (285-2-2-8-2507) | 27,000,000 | 27,137,900 | 101 |
| • පසු අස්වනු කළමනාකරණය සහ අලෙවි ප්‍රවර්ධනය (285-2-2-12-2502-13) | 63,000,000 | 57,000,000 | 90 |
| • තෝරා ගනු ලැබූ එළවළු වල නිෂ්පාදනය, නිෂ්පාදිතතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණිකමය සොයාගැනීම් යෙදවීම (118-2-3-2502-R2) | 1,000,000 | 650,000 | 65 |
| • ජෛව සංවේදී සමෝධානිත පලිබෝධ සහ රෝග කළමනාකරණය තාක්ෂණය වැඩිදියුණු කිරීම (BIPM) (118-2-3-20-2509-R3) | 3,000,000 | 2,906,000 | 97 |
| • ග්‍රාම නිලධාරී කොට්ඨාශ සඳහා පාංශු පරීක්ෂණ මත පදනම් වූ පොහොර නිර්දේශ කිරීම් සහ කාර්යක්ෂම පොහොර කළමනාකරණය (118-2-3-20-2509-F8) | 100,000,000 | 98,571,000 | 99 |
| • නියං තත්ත්ව වලදී රටෙහි පවතින ආහාර හිඟය ජය ගැනීමට බතල සහ මඤ්ඤොක්කා වගා කිරීම (118-2-3-20-2509-S2) | 2,580,000 | 2,183,000 | 85 |
| **එකතුව** | **282,021,250** | **262,964,275** | **93** |

## ප්‍රගතිය

### බෝග ප්‍රවර්ධනය

#### වම්බටු

පූර්ව අත්හදා බැලීම්වලදී තෝරා ගනු ලැබූ වම්බටු දෙමුහුම් තුනක් විවිධ කෘෂි පාරිසරික ප්‍රදේශවලට දක්වන අනුවර්තතාව පර්යේෂණ සහ ගොවීන්ගේ වගා ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ අත්හදා බලන ලදී. ඉහළ අස්වැන්නක් ලබා දෙන තවත් "ලේන ඉරි" වර්ගයේ දෙමුහුම් තුනක් තවදුරටත් උසස් මහා පරිමාණ අස්වනු අත්හදා බැලීම්වලදි

පරීක්ෂා කරන ලදී. පූර්ව අධ්‍යයනවලින් තෝරා ගනු ලැබූ ජනක ආරවලින් බිහිකර ගත් නව සංයෝජන දම් පැහැති වර්ග 19කින් ද “ලේන ඉරි” වර්ග 5කින් ද සමන්විත විය. ඉහළ අස්වනු දෙන විවෘත පරාගිත ආර දෙකක් වන SBN (EG 11) සහ EGFR (EG 12) ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම (NCVT) දක්වා ඉදිරියට ගෙන යන ලදී.

ආනයනිත ප්‍රභේද තුනක් අගයන ලද නමුත් බැක්ටීරියා මැලවීමේ රෝගයට ඔරොත්තු දීමේ හැකියාවක් නොමැති වීම හේතුකොට ගෙන දෙවන කන්නයේ ඇගයීම සඳහා ඉන් එකදු ප්‍රභේදයක් හෝ නිර්දේශ නොකරන ලදී.

### තක්කාලි

AMYT හි අගයන ලද තක්කාලි දෙමුහුම් 5ම NCVT සඳහා තෝරාගන්නා ලදී. විවෘත පරාගිත ප්‍රභේද 6ක් ප්‍රධාන අස්වනු පරීක්ෂාව (MYT) දක්වා ඉදිරියට ගෙන යන ලදී. ප්‍රවේණි විවිධත්වයක් සහිත මව් ආර බිහි කිරීම සඳහා තෝරා ගනු ලැබූ අන්තර් අභිජනන ආර, සමීප වල් දර්ශ සමඟ මුහුම්කරණයෙන් නව අන්තර්විශේෂ සංයෝජන 15ක් බිහිකර ගැණින.

විදේශීය තක්කාලි දෙමුහුම් 20ක් ක්ෂේත්‍ර ඇගයීම් කරන ලද අතර ගොවි ක්ෂේත්‍රවල මහා පරිමාණ ආදර්ශනය සඳහා එක් දෙමුහුම් ප්‍රභේදයක් නිර්දේශ කරන ලදී.

### මාළු මිරිස්

විවිධ ජාන සංයුති සහිත වර්ග 20ක රූප විද්‍යාත්මක ලක්ෂණීකරණය අවසන් කර ඇත. ඉහළ අස්වැන්න (පැළයකට කිලෝ ග්‍රෑම් 1ක්), කලින් මල් හට ගැනීම, ලා කොළ පැහැති දිලිසෙන කරල් සහ බැක්ටීරියා මැලවීමට ක්ෂේත්‍ර ප්‍රතිරෝධිතාව යනාදිය මත පදනම වූ වැඩිදුර අධ්‍යයනය සඳහා එක් වර්ගයක් තෝරා ගන්නා ලදී. අන්තර් අභිජනන ආර සංවර්ධනය සඳහා වර්ග 10ක් හඳුනා ගැණින. ඒ අතුරින් එකතූන් 05ක් ජලය හිඟ තත්ත්වයට ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කළ අතර, අනෙක් එකතූන් උෂ්ණත්වය දරා සිටීමේ ලක්ෂණ පෙන්නුම් කළේය. ප්‍රජනක අවධියේදී පරාගවල ජීව්‍යතාව සහ පරාග ප්‍රරෝහණය භාවිතයෙන් නව එකතූන් 4ක උෂ්ණත්වය දරාගැනීම තක්සේරු කිරිම පිණිස අධ්‍යයනයක් සිදු කරන ලදී. සමුච්චිත ප්‍රතිචාර දර්ශකය (Cumulative Response Index (CRI)) අනුව එකතූන් සතරක් උෂ්ණත්ව සංවේදී ලෙස වර්ගීකරණය කරන ලද අතර, CA8 නිර්දේශිත ප්‍රභේදය උෂ්ණත්වය දරා සිටීමේ අතරමැදි තත්ත්වයක පවතින බව හඳුනාගන්නා ලදී.

ප්‍රවේණි විවිධත්වයක් ජනනය සඳහා අන්ත: සහ අන්තර් විශේෂ මුහුම්කරණ සිදු කරන ලදී. දුරස්ථ දෙමුහුම්කරණයේ දෙමුහුම් 30ක් අතුරින් *C. annuum* x *C. chinense* දෙමුහුම් 5ක් සහ *C. annuum* x *C. frutescens* එක් දෙමුහුමක් සාර්ථක විය.

අස්වැන්න සහ පලිබෝධ හා රෝග ප්‍රතිරෝධිතාව සඳහා අගයන ලද විදේශීය ප්‍රභේද 3ක් අතුරින් එක් ප්‍රභේදයක් මහා පරිමාණ ආදර්ශන සඳහා නිර්දේශ කෙරිණි.

### බෝංචි

පූර්ව අධ්‍යයනයන්ගෙන් ලබාගත් අස්වැන්න සහ ගුණාත්මක ලක්ෂණ පදනම් කරගනිමින් තෝරාගනු ලැබූ දේශීයව සංවර්ධනය කරන ලද ආකාර දෙකක් මහා පරිමාණ අස්වනු අත්හදා බැලීම සඳහා ඉදිරියට ගෙන යන ලදී. පළමුවන දූහිතෘ පරම්පරාවේ ($F_1$) 13ක් දෙවන දූහිතෘ පරම්පරාව දක්වා ඉදිරියට ගෙන යන ලදී. ජනක ආර වශයෙන් ජනකප්ලාස්ම 5ක් තෝරා ගැණින.

වෛරස්වලට ඔරොත්තු දෙන ඉහළ අස්වනු දෙන බෝංචි ප්‍රභේද සංවර්ධනය සඳහා විකෘති අභිජනනය ආරම්භ කරන ලදී. ප්‍රභේද දෙකක ප්‍රවිකිරණය කරන ලද

බීජ පරීක්ෂා කොට $M_2$ පරම්පරාව දක්වා උසස් කරන ලදී.

### මෑ

දේශීයව අභිජනනය කරන ලද ආර දෙකක් විවිධ පරිසරවලට අනුවර්තනතාව සොයා බැලීමේ අධ්‍යයනයන් අඛණ්ඩව සිදු කෙරිණ. NCVT හි පරීක්ෂා කරන ලද ඉහළ අස්වනු දෙන පාදම කුණුවීමේ රෝගයට ඔරොත්තු දෙන ආර දෙකක් අනුවර්තනතා අධ්‍යයනය සඳහා යෝජනා කෙරිණ. MYT පරීක්ෂාවට ලක් කළ ආර 12කින් 4ක් ප්‍රධාන අස්වනු පරීක්ෂාව යටතේ වැඩිදුර අත්හදා බැලීම (AMYT) සඳහා තෝරාගත් අතර නව මුහුම්කරණ 15ක් තෝරාගනු ලැබූ ජනක ආරවලින් සකස් කර ගන්නා ලදී.

### වැටකොළු

අස්වැන්න සහ ඵලයේ ලක්ෂණ අනුව ආර 5ක් MYT දක්වා උසස් කරන ලදී. අස්වනු නිරීක්ෂණය සඳහා පර්යේෂණ (OYT) වලින් අවශ්‍ය ලක්ෂණ සහිත ආර 6ක් මූලික අස්වනු පරීක්ෂාව (PYT) සඳහා තෝරා ගැණින.

දෙමුහුම් නිපදවීම සඳහා අන්තර් අභිජනන ආර 14ක් වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. අන්තර් අභිජනන ආර සංවර්ධනය සඳහා $F_3$ ගහන 5ක් සහ $F_2$ ගහණය 2ක පරම්පරා උසස් කිරීම ද සිදු කෙරිණ. නව සංයෝජන 54ක් බිහි කරන ලදී.

### බණ්ඩක්කා

වෙළඳපොල ඉල්ලුමට සරිලන පරිදි ඉහළ අස්වනු දෙන ගුණාත්මක බණ්ඩක්කා ප්‍රභේද ($F_1$ දෙමුහුම් සහ විවෘතව පරාගිත ප්‍රභේද) සංවර්ධනය පිණිස වැඩසටහනක් ආරම්භ කරන ලදී. පරීක්ෂා කරන ලද ජනකප්ලාස්මා 54කින් 8ක්, අස්වැන්න සහ කරලේ ලක්ෂණ පදනම් කර ගනිමින් හඳුනා ගැණින. නව සංයෝජන 16ක් බිහි කරන ලදී. ($F_1$) පළමු වන දුහිතෘ පරම්පරා වේ ශාක 54ක් දෙවන දුහිතෘ පරම්පරාව ($F_2$) දක්වා උසස් කෙරිණ.

### පිපිඤ්ඤා

සුදු සහ කොළ පැහැති ඵල හටගන්නා ගහණ සතරක් තුන්වන දුහිතෘ පරම්පරාව ($F_3$) දක්වා උසස් කරන ලදී. පරීක්ෂා කරන ලද සියලුම විදේශීය පිපිඤ්ඤා ප්‍රභේද දෙවන කන්නමය ඇගයීම සඳහා තෝරා ගැණින.

### කරවිල

OYT සඳහා ආර දෙකක් තෝරා ගන්නා ලදී. ගහණ සයක් $F_6$ පරම්පරාව දක්වා උසස් කරන ලද අතර සුදු සහ කොළ පැහැති කරල් සහිත ගහණ අටක් තුන්වන දුහිතෘ පරම්පරාව දක්වා උසස් කරන ලදී. අස්වැන්න, ඵලයේ ලක්ෂණ, පළිබෝධ හා රෝගවලට ගොදුරුවීමේ ප්‍රවණතාව සඳහා පරීක්ෂා කරන ලද විදේශීය ප්‍රභේද දහයක් අතුරින් ප්‍රභේද තුනක් මහා පරිමාණ ආදර්ශන සඳහා තෝරා ගන්නා ලදී.

### වට්ටක්කා

'පද්මා' නමින් නව වට්ටක්කා ප්‍රභේදයක් (*Cucurbita moschata)* නිල වශයෙන් නිදහස් කරන ලදී.

### මඤ්ඤොක්කා

වෛරස්වලට ඔරොත්තු දෙන, ඉහළ අස්වනු සහිත කෙටි කාලීන මඤ්ඤොක්කා ප්‍රභේද තෝරා ගැනීම සඳහා ආකාර 4ක එකතුවක් NCVT සඳහා යෝජනා කරන ලදී.

### ඩයස්කොරියා

අගයන ලද ඩයස්කොරියා එකතුන් 45ක් අතුරින්, එකතුන් 7ක් අස්වැන්න සහ අනෙකුත් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ පදනම් කර ගනිමින් තෝරා ගන්නා ලද අතර වගාවන් සඳහා ගොවීන් අතර බෙදා හරින ලදී.

## පටක රෝපණය

### මාළු මිරිස් ප්‍රභේදමය සංවර්ධනය සඳහා පරාගධානි රෝපණ තාක්ෂණය

වගා කරන ලද මාළු මිරිස් ප්‍රභේද 3ක් (CA8, LYW, HYW) සහ බෙල් පෙපර් දෙමුහුම් දෙකක් (ඉන්ද්‍රා $F_1$, කිංග් ආතර් $F_1$) යොදා ගනිමින් පරාගධානි රෝපණ තාක්ෂණය වැඩිදියුණු කරන ලදී. මාළු මිරිස් සහ බෙල් පෙපර් යන දෙකම සඳහා කිණක ජනනයට උචිතම මාධ්‍යය වශයෙන් NAA ලීටරයට මිලි ග්‍රෑම් 1ක් සහ 2 BAP යෙදූ MS මාධ්‍යය හඳුනාගෙන තිබේ. කිණක පුනර්ජනන මාධ්‍යයක් සංවර්ධනය සඳහා පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කෙරෙමින් පවතියි.

### ඩයස්කොරියා සඳහා නලස්ථ ආකන්ද නිෂ්පාදන තාක්ෂණය

රාජ අල, කිරි කොඩොල් සහ කැකුළු ඩයස්කොරියා ප්‍රභේද සඳහා ක්ෂුද්‍ර ආකන්ද නිෂ්පාදන තාක්ෂණය සංවර්ධනය කරන ලදී. BAP ලීටරයට මිලි ග්‍රෑම් 2ක් සහ GA3 ලීටරයට මිලි ග්‍රෑම් 0.5ක් යෙදූ MS මාධ්‍යය ක්ෂුද්‍ර ආකන්ද නිපදවීම සඳහා උචිතම මාධ්‍යයයි. ක්ෂුද්‍ර ආකන්ද, ක්ෂේත්‍රයේ ස්ථාපනය කිරීම සඳහා යෝග්‍යතාව අධ්‍යයනය කෙරෙනු ඇත.

### බෝංචි මලකඩ රෝගයට ප්‍රතිරෝධී ජානමය සලකුණක් හඳුනාගැනීම සහ සංවර්ධනය

අවුරෝරා (Aurora) සහ ඒ ආශ්‍රිත මුහුම්වල UR 3 ජානය හඳුනා ගැනීමට SCAR සලකුණු දෙකක් තෝරා ගන්නා ලදී.

## ශෂ්‍ය විද්‍යාව

### ප්‍රාර්ථනා නමැති නව මාළු මිරිස් ප්‍රභේදය සඳහා ප්‍රශස්ථ පරතරය

මෙම පරීක්ෂණයේ අරමුණ වන්නේ මෑතකදී නිදහස් කරන ලද ප්‍රාර්ථනා නමැති මිරිස් විශේෂය සඳහා ප්‍රශස්ථ පරතරය හඳුනාගැනිමයි. පෙර අධ්‍යයනවල ප්‍රතිඵල තහවුරු කර ගැනීම සඳහා පරතර හයක් අධ්‍යයනය කරන ලද අතර මෙම ප්‍රභේදය සඳහා වර්ග සෙන්ටිමීටර් 40 x 30ක පරතරය ප්‍රශස්ථ බව හඳුනා ගැණින.

### ආරක්ෂිත ගෘහවල වගා කෙරෙන සලාද පිපිඤ්ඤා සඳහා ශාක කප්පාදුව

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ආරක්ෂිත ගෘහවල වගා කෙරෙන සලාද පිපිඤ්ඤාවල අස්වැන්න කෙරෙහි ශාක කප්පාදුවේ බලපෑම අධ්‍යයනය කිරීමයි. තනි අතුවල ඒකාන්තර කප්පාදුව මගින් සලාද පිපිඤ්ඤාවල අස්වැන්න 25%කින් වැඩි වී ඇති බව ප්‍රතිඵල මගින් අනාවරණ විය.

### ආරක්ෂිත ගෘහවල වගා කෙරෙන තක්කාලිවල ශාක කප්පාදුව

ආරක්ෂිත ගෘහවල වගා කෙරෙන තක්කාලිවල තනි අතුවල ඒකාන්තර කප්පාදුව මගින් බෝග අස්වැන්න 15%කින් ඉහළ ගොස් බීජවල තත්ත්වය ද උසස් වී ඇති බව පරීක්ෂණ මගින් තහවුරු විය.

### වම්බටුවල වියන් කළමනාකරණය, ඵල ප්‍රමාණය, පැළ ඝනත්වය සහ පෝෂක කළමනාකරණය බීජ අස්වැන්න සහ ගුණාත්මය කෙරෙහි බලපෑම

බෝග අස්වැන්න වැඩි කිරීම සඳහා තත්ත්වයෙන් උසස් බීජ පහසුවෙන් ලබා ගත හැකි වීම අත්‍යවශ්‍ය වේ. වම්බටුවල බීජ අස්වැන්න සහ තත්ත්වය උසස් කිරීමට යෝග්‍යතම ප්‍රතිකාර සංයෝජනය හඳුනාගැනීමට මෙම පරීක්ෂණය සිදු කරන ලදී. ප්‍රරෝහ 3ක් සහ ඵල 7ක් වර්ග සෙන්ටිමීටර් 60 x 60ක පරතරයෙන් යුතුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශිත පොහොර 1½ පරතරයෙන් යෙදීම SM164 වම්බටු ප්‍රභේදයේ අස්වැන්න 20%කින් ඉහළ නැංවීමටත් බීජ ප්‍රරෝහණය වර්ධනය කිරීමටත් උචිතම සංයෝජනය බව හඳුනාගන්නා ලදී.

## පිපිඤ්ඤා සඳහා පැළෑටි පුහුණු කිරීම සහ පරතරය සැකසීම - කල්පිටිය

'HORDI ග්‍රීන්' නමැති පිපිඤ්ඤා දෙමුහුම් ප්‍රභේදයෙහි ජායා මව් ශාකය 'කල්පිටිය වයිට්' යනුවෙන් හැඳින්වේ. මෙම අධ්‍යයනයේ අරමුණ නම් 'කල්පිටිය වයිට්' නැමති ප්‍රභේදයේ බීජ අස්වැන්න වැඩි කිරීම සඳහා ප්‍රශස්ථ පරතරය සහ පුහුණු තාක්ෂණය අධ්‍යයනය කිරීමයි. දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කළ පරතරය සමග පහතින් ම පිහිටි පාර්ශ්වික අතු කප්පාදු කිරීමෙන් බීජ අස්වැන්න 18%කින් වර්ධනය කොට තිබුණි.

## බතල

බතල ප්‍රභේද 6ක් සහ පොහොර සංයෝජන 3ක් ගෙවතු වගා ක්‍රමයේ දි පොලි සැක් වගාවන් සඳහා අගයන ලදී. 'ගන්නෝරුව වයිට්' සහ ගොවි ක්ෂේත්‍ර වරණ 1 සැලකිය යුතු අස්වනු ඉහළ යාමක් පෙන්නුම් කළ අතර එම ප්‍රමාණ පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 1.45 සහ 1.375 විය.

## ලැබ්ලැබ් බෝංචි

විවිධ *Lablab purpureus* වගාවන් වල වර්ධනය සහ රූප විද්‍යාව අධ්‍යයනය කරන ලදී. 12141, 12142 සහ 12146 යන ආකාර ප්‍රභා කාලයට ඉහළ සංවේදීතාවක් පෙන්නුම් කළ අතර එමනිසා පුෂ්ප හටගැනීමත් කරල් නිෂ්පාදනයත් 2017 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට පමණක් නිරීක්ෂණය කරන ලදි. පරික්ෂණය තවදුරටත් සිදු කෙරේ.

## වසර පුරාම මඤ්ඤොක්කාවල උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමට ඇති හැකියාව

මඤ්ඤොක්කාවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ වැඩිදියුණු කළ ශෂ්‍ය විද්‍යාත්මක පැකේජයක (හෝර්මෝන ප්‍රතිකාර කරන ලද මීටර් 1ක් දිග කඳ කැබලි විශාල වළවල පැළ කිරීම) බලපෑම අධ්‍යයනය කිරීම සඳහා පරීක්ෂණය තව දුරටත් සිදු කරන ලදී. ප්‍රතිඵල මගින් අනාවරණ වූයේ පැළයකින් වැඩි අතු සංඛ්‍යාවක් බැගින් මුළු කඳ කොටස් සංඛ්‍යාව ඉහළ නැංවීමට මෙම තාක්ෂණය මගින් හැකි වූ බවයි. 2016 වර්ෂයේ දී හෙක්ටයාරයකට කැපුම් 130,000 ක් ලබා ගත් නමුත් 2017 වර්ෂයේ දී එය 67,000 දක්වා පහත වැටුණු අතර (52%) මෙය දැඩි නියං තත්ත්වය හේතු කොටගෙන විය හැකි බව උපකල්පනය කෙරේ.

## මඤ්ඤොක්කාවල නිෂ්පාදිතතාව ඉහළ නැංවීම

මඤ්ඤොක්කාවල ආකන්ද නිෂ්පාදනය කෙරෙහි ඉන්ඩෝල් 3 බියුටාරික් ඇසිඞ් (වර්ධක හෝර්මෝන) වල බලපෑම පරීක්ෂා කිරීමට අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. සිටුවන අවස්ථාවේදී කඳ කොටස් වලට විවිධ ප්‍රමාණවලින් ඉන්ඩෝල් 3 බියුටාරික් ඇසිඞ් යොදන ලදී. අධ්‍යයනය තව දුරටත් සිදු කෙරේ.

## ඩයස්කොරියා (වැල් අල)

ඩයස්කොරියා බෝගයෙහි වේගවත් බහුගුණනයක් සඳහා ගොවි හිතකාමී තාක්ෂණයක් සංවර්ධනය කිරීම දැනට පර්යේෂණ සිදු කෙරෙමින් පවතියි.

## මල් වගාව

$^{60}Co$ විවිධ ගැමා ප්‍රවිකිරණ මාත්‍රාවන් භාවිතා කරමින් තෝරා ගනු ලැබූ විසිතුරු පැළ හයක් සඳහා LD50 අගය හඳුනාගැනීමට පසුගිය වසරේ දී අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. LD50 මාත්‍රාව *Zamiocucus zamifolia* සඳහා 125 rads වශයෙන් ද, *Anthurium andreanum* බීජ සඳහා 365 rads වශයෙන් ද, *Munronia pinnata* සඳහා 400 rads වශයෙන් ද හඳුනාගන්නා ලදී. ප්‍රවිකිරණය කරන ලද සියලුම රෝපණ ද්‍රව්‍ය 50%ට වැඩි ප්‍රමාණයක් මිය ගිය අතර වර්ධන වේගයෙහි කැපීපෙනෙන අඩුවීමක් පෙන්නුම් කළේය.

ෆිලොඩෙන්ඩොන් (Philodendron) (ලෙමන් දෙහි වර්ගයේ) විකෘති ඇගයීමේ දී වර්ධක ප්‍රචාරණයෙන් බහුගුණනය කරන ලද පැළ අතර වෙනස්කම් නිරීක්ෂණය කරන ලදී. පරීක්ෂණ තවදුරටත් සිදු කෙරේ.

*Munronia pinnata* යනු ඒකීය කඳක් සහිත ශාකයකි. 200 ppm ගිබරලික් අම්ලය මසකට වරක් බැගින් අනුයාත මාස 2 ක් යෙදීමෙන් පසු සියුම් කප්පාදුවෙන් (thumbnail) *M. pinnata* වල පඳුරුමය ආකර්ෂණීය මල් බඳුනක් ලබා ගත හැකි විය.

## පාංශු සාරවත්භාවය සහ ශාක පෝෂණය

### දෙමුහුම් මාළු මිරිස් සඳහා නව පොහොර නිර්දේශ

දෙමුහුම් මාළු මිරිස් සඳහා නව පොහොර නිර්දේශ සංවර්ධනය කිරීමට අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. පෝෂක ඉවත් වීමේ දත්ත පදනම් කරගනිමින් නයිට්‍රජන් සහ පොටෑසියම් පොහොර විවිධ අනුපාතවලින් යොදන ලදී. රම්‍යා නමැති දෙමුහුම් ප්‍රභේදය සඳහා හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 120 ඉක්මවා නයිට්‍රජන් පොහොර යෙදූ විට කිසිදු ප්‍රතිචාරයක් නොවීය. එසේ වුව ද ප්‍රාර්ථනා ප්‍රභේදය නයිට්‍රජන් පොහොර හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 160 යෙදූ විට හෙක්ටයාරයට ටොන් 21.5ක ඉහළම අස්වැන්නක් ලබා දුන්නේය. පාංශු පරීක්ෂණ අගයන් මිලියනයට කොටස් 247 වූ විටදී ප්‍රභේද දෙකෙන් ම පොටෑසියම් පොහොර යෙදීමට අදාළව කිසිදු ප්‍රතිචාරයක් නොවීය. මෙම අධ්‍යයනය තවදුරටත් සිදු කෙරේ.

### වැටකොළු දෙමුහුම් සඳහා නව පොහොර නිර්දේශය තහවුරුකරණය

වැටකොළු දෙමුහුම් ප්‍රභේද සඳහා නයිට්‍රජන් හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 150 හා පොටෑසියම් හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 75 යන මැතකදී හඳුන්වාදෙන ලද පොහොර නිර්දේශ HORDI සහ මාරස්සන, මාතලේ, පලුගස්වැව සහ තෙලිජ්ජවිල ගොවි ක්ෂේත්‍රවලදි පරීක්ෂාවට ලක් කරන ලදී. පර්යේෂණ ක්ෂේත්‍රවල දි ගොවිතැන් ක්‍රම ද භාවිතයට ගන්නා ලදී. පර්යේෂණ සහ ගොවි ක්ෂේත්‍ර යන දෙකෙහි දී ම පොහොර නිර්දේශ මගින් ඉහළම අස්වැන්නක් ලබා ගන්නා ලදී.

### තක්කාලිවල ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා පෝෂක කළමනාකරණ පැකේජයක්

තක්කාලිවල ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා යෝග්‍ය පෝෂණ කළමනාකරණ පැකේජයක් සංවර්ධනය කිරීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. ද්විතියිකයක් හා ක්ෂුද්‍ර පෝෂක ඇතිව සහ නොමැතිව නයිට්‍රජන් සහ පොටෑසියම් පොහොර විවිධ අනුපාත සහ කොටස්වලින් (කොටස් 3 සහ 6) පරීක්ෂා කරන ලදී. ප්‍රතිඵල මගින් අනාවරණ වූයේ වැඩිපුර නයිට්‍රජන් හා පොස්පරස් පොහොර යෙදීමෙන්, ද්විතියික සහ ක්ෂුද්‍ර පෝෂක මගින් බීජවල අස්වැන්න හා තත්ත්වය කෙරෙහි සුවිශේෂී බලපෑමක් සිදු කර නොමැති බවයි.

### තිරසාර එළවළු නිෂ්පාදනයක් සඳහා ස්ථාන විශේෂ පොහොර කළමනාකරණය

එළවළු නිෂ්පාදනය සඳහා ස්ථාන විශේෂිත පොහොර කළමනාකරණ පද්ධතියක් ගොඩනැගීමට අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. නයිට්‍රජන්, පොස්පරස් හා පොටෑසියම් (NPK), පාංශු පරීක්ෂණ පදනම් කර ගත් පොහොර නිර්දේශ සහ NPK ආවරණ නිර්දේශ ඇතුලත් ප්‍රතිකාර 5ක් බෝංචි, තක්කාලි සහ කරවිල සඳහා පරීක්ෂා කරන ලදී. බෝගය කවරක් වුව ද පොස්පරස් සහ පොටෑසියම් රහිත ප්‍රතිකාරය, පාංශු පරීක්ෂණ මත පදනම් වූ පොහොර නිර්දේශ සහ ආවරණ NPK පොහොර නිර්දේශවලින් අස්වැන්නෙහි විශේෂ වෙනසක් නොවූ බව ප්‍රතිඵල මගින්

පෙන්නුම් කෙරිණ. එසේ වුව ද, නයිට්‍රජන් රහිත ප්‍රතිකාරය අවම අස්වැන්නක් ලබාදුණි. පාංශු පරීක්ෂණවලින් පෙන්නුම් කරන ලද්දේ පරීක්ෂණ භූමියෙහි, ඉහළ පොස්පරස් සහ මධ්‍යස්ථ පොටෑසියම් සංචිතයක් දරන බවයි.

### ට්‍රිපල් සුපර් පොස්ෆේට් (TSP) පොහොරවලින් යුත් පසෙහි කැඩ්මියම්වල ජෛව සුලභතාව

ට්‍රිපල් සුපර් පොස්ෆේට් යෙදීම නිසා පසෙහි සහ ශාකවල කැඩ්මියම් ජෛව සුලභතාව නිශ්චය කිරීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. ක්ෂේත්‍ර තත්ත්ව යටතේ දී නෝකෝල් සහ ගෝවා සඳහා පරීක්ෂණ මෙහෙයවන ලදී. අධික ලෙස TSP පොහොර යෙදීමෙන් බෝග අස්වැන්න ඉහළ නොගිය ද TSP වල අධික භාවිතයත් සමග ශාක පටකවල ද සහ පසෙහි ද කැඩ්මියම් සංචිතය ඉහළ ගොස් තිබිණ.

## කාබනික ගොවිතැන

### පෝෂක කළමනාකරණය

බණ්ඩක්කා, රාබු සහ බෝංචිවල වර්ධනය සහ අස්වැන්න කෙරෙහි කොම්පෝස්ට් තේ සමග විවිධ කාබනික පෝෂක ප්‍රභව සමග කුකුළු පොහොර කොටස් වශයෙන් යෙදීමේ බලපෑම අධ්‍යයනය කරන ලදි. කුකුළු පොහොර කොටස් වශයෙන් යෙදිම සමඟ සංයෝජනය කොට මූලික පොහොර ලෙස කොම්පෝස්ට් පොහොර යෙදීම මගින් බණ්ඩක්කා, රාබු සහ බෝංචිවල අස්වැන්න පවත්වාගත හැකිය බණ්ඩක්කා සහ රාබු හැරුණු කොට කොම්පෝස්ට් තේ වල කොටස් වශයෙන් යෙදිම බෝංචි අස්වැන්න කෙරෙහි කිසිදු බලපෑමක් නොදක්වයි. එබැවින්, මෙම අධ්‍යයනය මගින් සනාථ කර ඇත්තේ කාබනික පොහොර මූලික සහ කොටස් වශයෙන් භාවිතය මගින් කාබනික ගොවිතැනෙහි දී බෝග නිෂ්පාදනය තිරසර අන්දමින් පවත්වාගෙන යනු ලබන බවයි.

### අර්ධ දහනයට ලක් කළ දහයියා යෙදීම

ගෝවා, බණ්ඩක්කා සහ මාළු මිරිස් මිශ්‍ර බෝග වගාව සඳහා අර්ධ වශයෙන් දහනය කළ දහයියා සමඟ කොම්පෝස්ට් සහ කුකුළු පොහොර යෙදීමෙන් සිදු වන බලපෑම පරීක්ෂා කරන ලදි. උපරිම මිශ්‍ර අස්වැන්නක් (හෙක්ටයාරයකට ටොන් 36.6) ලැබුයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත පොහොර යෙදීමෙන් අනතුරුවය. කුකුළු පොහොර අර්ධ වශයෙන් දහනය කළ දහයියා ග්‍රෑම් 250ක් සමඟ යෙදීමෙන් හෙක්ටයාරයකට ටොන් 31.3ක අස්වැන්නක් ලබා දුනි.

### කොම්පෝස්ට්වල දිගුකාලීන භාවිතය

එළවළු වගාවේ දිගු කාලින අධ්‍යයනයේ 34වන කන්නය අවසාන වන විට NPK පමණක් යෙදිමෙන් (හෙක්ටයාරයකට ටොන් 24.1) වම්බටුවල ඉහළම අස්වැන්නක් ද කොම්පෝස්ට් හෙක්ටයාරයට ටොන් 40ක් යෙදීමෙන් දෙවනුවට ඉහළ අස්වැන්නක් ද (හෙක්ටයාරයකට ටොන් 21.2) ලබා ගන්නා ලදී, පතෝල සඳහා හෙක්ටයාරයකට ටොන් 40 කොම්පොස්ට් සහ නිර්දේශිත NPK පොහොර උපරිම අස්වැන්න දුන් අතර (හෙක්ටයාරයකට ටොන් 23.3) නිර්දේශිත NPK පොහොර සමඟ කොම්පෝස්ට් හෙක්ටයාරයකට ටොන් 10ක් යෙදිමෙන් 32වන කන්නයේදී හෙක්ටයාරයකට ටොන් 17.3ක අස්වැන්නක් නෙළා ගන්නා ලදී.

### එළවළුවල විවිධ ප්‍රභේද පරීක්ෂා කිරීම

කාබනික ගොවිතැන සඳහා යෝග්‍ය එළවළු බෝග/ප්‍රභේද හඳුනා ගැනීමට අධ්‍යයනයක් සිදු කරන ලදි. කව්පි එළවළු ප්‍රභේද 5ක් සහ තක්කාලි ප්‍රභේද 2ක් අවම යෙදවුම් තත්ත්ව යටතේ පරීක්ෂා කරන ලදී. BS 1 හා ‘ගන්නොරුව හවරි’ කව්පි සහ T245 තක්කාලි එළවළු ප්‍රභේද කාබනික ගොවිතැන යටතේ හොඳ ප්‍රතිචාරයක් පෙන්වීය.

### පසේ භෞතික ස්වභාවය කෙරෙහි බිම් සැකසීමේ බලපෑම

රතු දුඹුරු ලැටසොලික් පසෙහි භෞතික ගුණාංග කෙරෙහි අවම බිම් සැකසීමේ බලපෑම තක්සේරු කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. බිම් සැකසීමේදී ට්‍රැක්ටරයක් භාවිතය සහ බිම් සැකසීමෙන් තොරව වගා කිරීම යන ක්‍රම දෙකෙන් පතෝලවල අස්වැන්න කෙරෙහි සැලකිය යුතු බලපෑමක් නිරීක්ෂණය නොවීය. පස සකස් කිරීමේ ආකාර දෙකෙන් අස්වනු වල විශේෂ වෙනස්වීමක් නොපෙන්විණි. එසේ වුවද ඉහළම වැලෙහි උසක් සහ මුලෙහි වැඩිම දිග ප්‍රමාණයක් පස පෙරලීමේ ප්‍රතිකාරය තුළ පෙන්නුම් කෙරිණි. පරීක්ෂණය තවදුරටත් සිදු කෙරේ.

### බ්‍රොයිලර් අපද්‍රව්‍යමය ජෛව අඟුරු භාවිතයෙන් පාංශු සාරවත්භාවය හා බෝග අස්වැන්න වර්ධනය

බ්‍රොයිලර් අපද්‍රව්‍යමය ජෛව අඟුරු යෙදීමෙන් සිදුවන බලපෑම අධ්‍යයනය සඳහා පසේ විවිධ ගැඹුරින් ඒවා යෙදීමෙන් පරීක්ෂණයක් ආරම්භ කරන ලදී. හෙක්ටයාරයට ටොන් 5ක් වන සේ පස සමග මිශ්‍ර කළ බ්‍රොයිලර් අපද්‍රව්‍යමය ජෛව අඟුරු සෙන්ටිමීටර් 15ක ගැඹුරින් යෙදූ විට ලැබුනු කැරට් අස්වැන්න (හෙක්ටයාරයට ටොන් 19) සෙන්ටිමීටර් 5 (හෙක්ටයාරයට ටොන් 14.9), සෙන්ටිමීටර් 30 (හෙක්ටයාරයට ටොන් 11.7) සහ පාලකය (හෙක්ටයාරයට ටොන් 11.3) මගින් ලැබූ අස්වැන්න හා සැසඳීමේ දී ඉහළ අගයක් ගත්තේය.

### මාළු මිරිස් සමඟ තෝරා ගනු ලැබූ නයිට්‍රජන් තිර කිරීමේ ආමුකුලනවල නයිට්‍රජන් සැපයීමේ හැකියාව

මේ සඳහා CA 8 නමැති මාළු මිරිස් ප්‍රභේදය යොදා ගන්නා ලදී. යූරියා පමණක් භාවිත කිරීමට අමතරව නිර්දේශිත යූරියා 25%, 50%, 75% හා 100% අනුපාතය සමඟ නයිට්‍රජන් තිර කිරීමේ ජෛව ආමකූලන යොදන ලදී. නිරීක්ෂණාත්මක අධ්‍යයනයේදී, 50% රසායනික නයිට්‍රජන් සමඟ ජෛව ආමුකූලන ප්‍රතිකාරය ඉහළම අස්වැන්නක් වාර්තා කළේය.

### නයිට්‍රජන්වල යෝග්‍ය ආකාර වල තක්සේරුකරණය

ද්‍රව පොහොර මාධ්‍යයන් තුළ ඇමෝනියම්වලට නයිට්‍රේට් ($NH_4^+:NO_3^-$) අනුපාත 0:100, 25:75, 50:50, 75:25 වන සේ එළවළු බෝග 5කට නයිට්‍රජන් (N) ප්‍රතිකාර 5ක් සිදු කරන ලදී. සලාද කොළ වල N, P, K පෝෂක හා වියළි බර වැඩිවීම සඳහා $NH_4^+:NO_3^-$ 25:75 අනුපාතය සුදුසු විය. 75:25ක $NH_4^+:NO_3^-$ අනුපාතය මාළු මිරිස් බෝගයේ වියළි බර වැඩිවීම හා නයිට්‍රජන් පෝෂණය කෙරෙහි යහපත් ප්‍රතිචාර දැක්වීය. $NH_4^+:NO_3^-$ සමප්‍රමාණවලින් යුත් අනුපාතය ගෝවාවල වියළි බර වැඩිවීම සඳහා යෝග්‍ය විය. ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන ලද්දේ විවිධ එළවළු බෝග ඒවායෙහි වගා මාධ්‍ය තුළ විවිධ නයිට්‍රජන් ආකාර අපේක්ෂා කරන බවයි.

## කීට විද්‍යාව

### පත්‍රමය එළවළු සඳහා කෘමිනාශක

කෙටි කාලීන අස්වනු සහ අමුවෙන් ආහාරයට ගැනීමේ පුරුදු හේතුවෙන් පත්‍රමය එළවළු සඳහා කෘමිනාශක නිර්දේශ කර නොමැත. එහෙත්, අපනයන භාණ්ඩවල පළිබෝධකයන් සිටින බවද, අක්‍රමවත් කෘමිනාශක භාවිතය හේතුකොටගෙන බෝගය තුල අවශේෂ රැඳී තිබෙන බවද හඳුනා ගැනීම නිසා එසේ නිර්දේශ කිරීමේ කඩිනම් අවශ්‍යතාවක් මතු වී තිබේ. එබැවින් බලාපොරොත්තු තැබිය හැකි කෘමිනාශක තුනක් සමඟින් ප්‍රධාන පළිබෝධකයන්ට එරෙහිව ඇතැම් කෘමිනාශක පරීක්ෂා කිරීමේ අධ්‍යයනයක් සිදු කරන ලදී. පත්‍ර කීඩැවන් සහ සුදු

මැස්සන් සඳහා සල්ෆොක්සාල්ලෝර් 50%WG පත්‍රමය එළවළු සඳහා නිර්දේශ කරන ලදී. අවම විෂ සහිත විකල්පමය කෘමිනාශක හඳුනා ගැනීම සඳහා මෙම පරීක්ෂණය තවදුරටත් සිදු කෙරේ.

### වෛරස් වාහකයන් පාලනය සඳහා කෘමිනාශක

වෛරස් රෝග පුළුල් ලෙස ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා වෛරස් වාහක කෘමි විශේෂ පාලනය අත්‍යවශ්‍ය වේ. අනෙකුත් සමෝධානිත ක්‍රමවේදයන් සමඟ කෘමිනාශක භාවිතය බහුලව භාවිතා කෙරෙන ක්‍රමවේදයයි. පළිබෝධනාශකවලට එරෙහිව ප්‍රතිරෝධයක් ගොඩනගා ගන්නා ගුප්ත විශේෂයන් ලෙසට වෛරස් හඳුන්වා දිය හැකිය. එබැවින්, විවිධ ක්‍රියාකාරි මාදිලි සමඟ මාරුවෙන් මාරුවට කෘමිනාශක යෙදීම කෘමින් තුළ ප්‍රතිරෝධිතාව ගොඩනැංවීම ප්‍රමාද කරවයි. නව ක්‍රියාකාරී මාදිවලින් සමන්විත ඇතැම් කෘමිනාශක පිපිඤ්ඤා හා තක්කාලි වල සුදු මැස්සන්, කුඩිත්තන්, පත්‍ර කීඩෑවන් සහ පැළ මැක්කන්ට එරෙහිව පරීක්ෂා කරන ලදී. අධ්‍යයනය තවදුරටත් සිදු කෙරේ.

## විවිධ පරිසර පද්ධති වල පරාගන සේවා

### මූලික අදියරේ තක්සේරුකරණය

කළුතර, මහනුවර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල බණ්ඩාරගම, උඩුදුම්බර හා ගල්ගමුව යන ප්‍රදේශවල බෝග හා සම්බන්ධ පරාගනකාරකයින් අධ්‍යයනය කරන ලදී. මී මැස්සන් විශේෂ තුනක් (*Apis cerana*, *A. dosata*, *Trigona iridipennis*) සහ විශේෂ නවයක පරාගකාරකයෙන් (*Xylocopa tenuiscapa*, *Amegillascinti*, *Ceratinabinghami*, *Lithurgus atratus*, *Haplonomia westwoodi*, *Megachile umbripennis*, *Haplonomia westwoodi*, *Braunsapsis sp.*, *Amegilla puttalama*, *Ceratina hieroglyphica*) හඳුනා ගන්නා ලදී. විශේෂ තුනක් හඳුනා ගැනීමට ඉතිරි වී තිබේ. බඹරුන් තිදෙනෙක් හඳුනා ගෙන තිබේ. (*Scolia* sp., *Megacampsomeris seylonica*, *Colcacampsomeris* sp.) ඇතැම් හඳුනාගනු ලැබූ විශේෂ එක් එක් ස්ථානයට ආවේණික වෙයි. එබැවින් බෝගවල පරාගණය වැඩිදියුණු කිරීම පිණිස ඔවුන්ගේ ගහණය සුරක්ෂිත කිරීමට උපාය මාර්ග සංවර්ධනය අත්‍යවශ්‍ය වේ.

### නව නෙමටෝඩානාශක හඳුන්වාදීම

ගොටුකොළ, මුකුණුවැන්න වැනි පලා එළවළු සහ තක්කාලි වල මූල ගැටිති නෙමටෝඩා පාලනය සඳහා 20 g/l SC ඇබමෙක්ටින් සුදුසු යැයි හඳුනාගෙන නිර්දේශ කරන ලදී. මෙම නෙමටෝඩානාශක ගොටුකොළ සඳහා GAP ආදර්ශනය සඳහා සමෝධානිත නෙමටෝඩා පාලන පැකේජයෙහි සංරචකයක් ලෙස අන්තර්ගත විය.

### ගස්ලබුවල පිටිමකුණා පරපෝෂිතයන්ගේ කාර්යක්ෂම ක්ෂේත්‍ර මුදා හැරීමේ තාක්ෂණය

ගස්ලබුවල පිටිමකුණා පාලනය සඳහා පරපෝෂිතයන් භාවිතා කිරීම ජෛව විද්‍යාත්මක ක්‍රමවේදයක් වශයෙන් හඳුනාගනු ලැබ ඇත. ගස්ලබු පිටි මකුණා (*Paracoccus marginatus*) පාලනය (PMB) සඳහා කාර්යක්ෂමව පරපෝෂිතයන් මුදාහැරීම් ක්‍රමවේදයක් සංවර්ධනය කරන ලදී. මෙම ක්‍රමය භාවිතයෙන් සති දෙකක කාලයකදී හෙක්ටයාරයකට පරපෝෂිතයන් 5,000ක් නිදහස් කළ හැකිය.

### ඉටිමය ශල්ක සහිත පළිබෝධකයෙන් වන *Ceroplastes* sp. සහ ඔවුන්ගේ පරපෝෂිකයන් මහා පරිමාණ වශයෙන් බෝ කිරීම

ශල්කමය කෘමීන්ගේ පරපෝෂිතයන් හඳුනා ගැනීම සහ බෝ කිරීම සඳහා

අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. ඉටිමය ශල්කධාරීන් සඳහා යෝග්‍යතම ධාරක පැළෑටිය *Aglaonema* බව සොයා ගන්නා ලදී.

**පිපිඤ්ඤාවල පලතුරු මැස්සාගේ විවිධත්වය සහ සුලභතාව**

අනුරාධපුර, කුරුණෑගල හා මහනුවර යන දිස්ත්‍රික්ක වලින් පිපිඤ්ඤා කුලයට (වට්ටක්කා, පිපිඤ්ඤා, පතෝල, වැටකොළු, කරවිල) හානිකර පලතුරු මැස්සන් *B. cucurbitae* (කොමඩු පළතුරු මැස්සා), *B.tau* සහ *Dacus ciliatus*, *B. diversa* සහ හඳුනා නොගත් විශේෂයක් වශයෙන් විශේෂ 5ක් වාර්තා වී ඇත. *B. cucurbitae* පුමුඛතම විශේෂය (>86%) වෙයි. විවිධ විශේෂ 5ක් පිපිඤ්ඤාවලට හානි කරන නමුදු (Methyl Euginol) මෙතිල් ඉයුජිනෝල් හෝ කියු - ලුරේ (Cue - lure) ෆෙරමෝන උගුල් වලට ආකර්ශණය නොවන *D. ciliatus* හැරුණු කොට ඉහත කී පලිබෝධ ගහණයන් පාලනය කිරීම සඳහා දැනට නිර්දේශිත IPM පැකේජය යොදා ගත හැක.

අනුරාධපුර, කුරුණෑගල සහ මහනුවර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද සමීක්ෂණයෙන් අනාවරණ වුයේ බොහෝ ගොවීන් Cue-Lure උගුල්වලට වඩා මෙතිල් ඉයුජිනෝල් උගුල් පිළිබඳ උනන්දු බවයි. Cue-Lure උගුල්වලට හසුවූ කොමඩු පලතුරු මැස්සන් (*B. cucurbitae*) සංඛ්‍යාව මෙතිල් ඉයුජිනෝල් උගුල්වලට හසුවූ සංඛ්‍යාවට වඩා අධිකය. එබැවින් ෆෙරමෝන උගුල් පිළිබඳ ගොවීන්ගේ දැනුම්වත්භාවය පිපිඤ්ඤාවලට හානිකර පලතුරු මැස්සන් පාලන වැඩසටහන සඳහා වැදගත් සාධකයක් ලෙස සැලකේ.

**පලතුරු මැස්සා පාලනය පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය**

පලතුරු මැස්සා පාලනය සඳහා ගොවීන් විසින් විවිධ ක්‍රම 3ක් අනුගමනය කරන බව සිදු කරන ලද ගොවි සමීක්ෂණයක් මගින් අනාවරණය විය. ප්‍රදේශයක් ආවරණය වන IPM වැඩසටහන (AWIPM), නොකඩවා කෘමිනාශක භාවිතය සහ වෙනත් මිශ්‍ර ප්‍රවේශයන් එම ක්‍රමවේදයන් වේ. කෘමිනාශක භාවිත කළ ගොවීන් 75% SC ඇසිෆේට්, ලීටරයට ග්‍රෑම් 500 EC ප්‍රොෆෙනොෆොස්, ලීටරයට ග්‍රෑම් 18 EC ඇබමෙක්ටින් සහ 20% SP ඇසිටැම්ප්‍රිඩ් දින 5-7 අන්තරයකින් යුතුව යොදා ඇති අතර මේවා පලතුරු මැස්සා පාලනය සඳහා නිර්දේශිත නොවූ කෘමිනාශක වේ.

AWIPM වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් හේතු 6ක් හඳුනාගත් අතර, ඒවා නම් නොදැනුවත්භාවය, ප්‍රෝටීන ඇම රසායන ද්‍රව්‍ය අඛණ්ඩව සැපයීම් කර නොමැති වීම, AWIPM පැකේජය පිළිබඳ අවිශ්වාසය, කෘමිනාශකවල කඩිනම් ක්‍රියාකාරිත්වය/ කෘමිනාශක භාවිතා කිරීමට ඇති කැමැත්ත, යාය තුළ පිපිඤ්ඤා වගා කරනු ලබන කාලය විවිධ වීම/ ගොවීන් අතර සහයෝගිතාවක් නොමැති වීම සහ පලතුරු මැස්සාන්ගේ අධික හානිකර තත්ත්වය යනාදියයි. එබැවින් AWIPM වැඩසටහන පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

**පලතුරු මැස්සන් පිළිබඳ AWIPM වැඩසටහන සඳහා නව පාලන ක්‍රමවේද**

පිරිමි සතුන් ආකර්ශණය කිරීමේ ලිංගික හෝර්මෝන උගුල් මෙම අධ්‍යයනයේදී පාලන කාර්යය සඳහා යොදා ගන්නා ලදී. HORDI සිට කිලෝ මීටර් 1 ක අරයකින් යුත් වර්ග ප්‍රමාණයක් පුරා උගුල් 15ක්ද, HORDI සිට කිලෝ මීටර් 7ක අරයකින් එහි මායිමෙහි වෙනත් පාලන උගුල් 5ක්ද මාස 4ක් පුරා ස්ථාපිත කර තැබීමෙන් මහා පරිමාණ වශයෙන් පලතුරු මැස්සන් හසුකරගැනීමට ප්‍රයත්න කරන ලදී. පලතුරු මැස්සන් 150,000කට වැඩි සංඛ්‍යාවක් හසුකර ගන්නා ලදුව

හඳුනාගැනීම සිදු කරන ලදී. අධ්‍යයන කාල සීමාව තුල ගහණයෙන් 71%ක් වූ *Bactrocera correcta* පුමුඛ විශේෂ වූ අතර ප්‍රමුඛතාවක් දැක්වූ අනෙකුත් විශේෂ වශයෙන් *B. kandiensis* (19%) සහ *B. dorsalis* (10%) පෙනී ගියේය. අධ්‍යයන අවසන් වන විට *B. correcta* (2718/දින සිට 333/දින දක්වා) *B. kandiensis* (478/දින සිට 261/දින) ද, *B. dorsalis* (324/දින සිට 111/දින ද, ගහණයේ සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කළේය.

### පිපිඤ්ඤා වල කොමඩු පලතුරු මැස්සාට එරෙහිව ඇසැඩිරැක්ටින් (Azadiractin) සංයෝගය

ඇසැඩිරැක්ටින් සංයෝගය (ලීටරයට ග්‍රෑම් 50 ඇසැඩිරැක්ටින්, ලීටරයට ග්‍රෑම් 10 ඇසැඩිරැක්ටින්, 80% ඇසැඩිරැක්ටින් (ක්ෂුද්‍ර), 0.03%+ ඇසැඩිරැක්ටින් කරන්ජීන් 4%) මගින් බිත්තර දැමීම වළක්වනු ලබන අතර *Bactrocera cucurbitae* විකර්ෂණය කරනු ලබන බවද විද්‍යාගාර ජෛව ක්‍රියාකාරිත්ව පරීක්ෂණ මගින් වාර්තා වී ඇති අතර ඒ සඳහා දින 7ක අන්තරයකින් 2016 වර්ෂයේ දී පත්‍රවලට ඉසින්නක් වශයෙන් ක්ෂේත්‍රයේ දී භාවිතා කරන ලදී. නමුත් ප්‍රතිඵල වලට අනුව, එකදු සංයෝගයක් හෝ පලතුරු මැස්සා මැඩපැවැත්වීමේ සාර්ථකත්වයක් නොපෙන්විය. 2017 වර්ෂය යල කන්නයේ දී දින 5ක අන්තරයකින් යුතුව ක්ෂේත්‍රයේදී පරීක්ෂා කරන ලදී. පාලකය හා සැසඳීමේ දී 80% ඇසැඩිරැක්ටින් (ක්ෂුද්‍ර) ලීටරයට මිලි ලීටර් 17ක් මගින් හානි වූ පලතුරු වල සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කළ අතර, අලෙවි කළ නොහැකි වූ අස්වනු ප්‍රතිශතය 40%කි. එබැවින් වෙළඳපලෙන් ලබාගත හැකි ඉහත කී කොහොඹවලින් සකස් කළ සංයෝග දින 5ක අන්තරයකින් යෙදීම පිපිඤ්ඤා කුලයේ කොමඩු පලතුරු මැස්සා පාලනය කිරිමෙහිලා කාර්යක්ෂම මෙවලමක් නොවන්නේය.

### බෝංචි දුඹුරු පැහැ වීම පාලනය කිරීම සඳහා IPM පැකේජය වැඩිදියුණු කිරීම

බෝංචි කහ පැහැ වීම පාලනය කිරීම සඳහා ජීවී (බඩඉරිඟු වැට) හෝ භෞතික බාධක, කෘෂරී බීජ ප්‍රතිකාරය; කිලෝ ග්‍රෑම් 1ක් බීජ සඳහා ග්‍රෑම් 3.5 + ඇලෙන සුළු උගුල් සහ මාරුවෙන් මාරුවට 50 WG ෆයිමෙට්‍රොසින් සහ අප්ලවුඩ් (10% WP බියුප්‍රොෆෙසින්) පුෂ්ප හටගන්නා තෙක් දින 7-10ක අන්තරයකින් යෙදීම බලාපොරොත්තු තැබිය හැකි ප්‍රතිඵල පෙන්නුම් කළේය.

## ශාක ව්‍යාධිවේදය

### අන්තශ් ශාකමය බැක්ටීරියා මගින් සොලනේසියේ කුලයේ බෝගවල ෆියුසාරියුම් (Fusarium) මැලවීමේ රෝගය පාලනය

2017 වර්ෂයේ ජනවාරි - ජූනි දක්වා කාලය තුළ මහනුවර, මාතලේ, නුවරඑළිය හා බණ්ඩාරවෙල ප්‍රදේශවලින් එක්රැස් කළ *Fusarium* මැලවීමේ නියැදි 100කින් වෙන්කර ගන්නා ලද නියැදි 80ක එකතුවක් පාංශු අසාදනය කිරීමේ තාක්ෂණය (soil infestation) ඔස්සේ ඒවායෙහි ව්‍යාධිජනකභාවය සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලදී. එහිදි 80න් 25ක් ව්‍යාධිජනක බව හඳුනා ගන්නා ලදී. *Fusarium* මැලවීමේ රෝගයෙන් යැයි ආසාදිත ක්ෂේත්‍රවලින් ලබාගත් නිරෝගී තක්කාලි සහ වම්බටු පැළ 40ක් සහ අන්තශ් ශාකමය බැක්ටීරියා නියැදි 30ක් වෙන්කරගෙන *Fusarium* වලට එරෙහිව ඒවායෙහි ක්‍රියාකාරිත්වය පරීක්ෂණාගාර තත්ත්ව යටතේ පරීක්ෂා කරන ලදී. අන්තශ් ශාක වර්ග 30න් 6ක් *Fusarium oxysporum* සහ *Fusarium solani* විශේෂ මත තලස්ථ තත්ත්ව යටතේ අතිශය ප්‍රතිරෝධිතාවක් පෙන්වූයේය. අන්තශ් ශාකමය බැක්ටීරියා 6ක් හඳුනාගන්නා ලද අතර ඒවායින් හතරක් *Streptromonas* spp විශේෂ හා

දෙකක් *Bacillus* spp විශේෂ වේ. යෝග්‍ය ජෛව ස්වරූපය හඳුනා ගැනීම සඳහා අධ්‍යයනයක් තවදුරටත් සිදු කෙරේ.

### *Ralstonia solanacearum* විශේෂ සංකීර්ණයේ විවිධත්වය

සොලනේසියේ කුලයේ බෝග ප්‍රධාන වශයෙන් වැඩෙන ප්‍රදේශවලින් බැක්ටීරියා මැලවීමේ රෝග ලක්ෂණ දර්ශිය වශයෙන් පෙන්නුම් කළ නියැදි 114ක් එක්රැස් කර ගන්නා ලදී. වෙන්කරගත් බැක්ටීරියා තහවුරු කරන ගන්නා ලදී. *Ralstonias solanacearum* හඳුනා ගැනීමට කඩිනම් හා ආර්ථිකමය වශයෙන් වාසිදායක සෘජු PCR ක්‍රමයක් වැඩිදියුණු කරන ලදී.

ජෛව රසායනික පරීක්ෂණයක් මගින් බයෝවාර් තහවුරු කරන ලද අතර ප්‍රතිඵලවලට අනුව තෝරාගත් සියලුම බැක්ටීරියා නියැදි බයෝවාර් (Biovar) III ගණයට අයත් වේ. තක්කාලි, වම්බටු, මාළු මිරිස් සහ අර්තාපල් යන බෝග සමඟ ව්‍යාධිජනකතාවය හා වර්ගය (Race) හඳුනාගැනීම සිදු කළ අතර මාතලේ සහ මහනුවර බැක්ටීරියා නියැදි Race 1 හා 3 ට අයත් බව අනාවරණ විය.

### සලාද වල *Botrytis* අංගමාරය පාලනය

සලාද වල *Botrytis* අංගමාරය පාලනය කිරිම සඳහා කාර්යක්ෂම ඒකාබද්ධ පළිබෝධ පාලනය පැකේජයක් හඳුනා ගැනීමට අධ්‍යයනයක් සිදු කරන ලදී. *Botrytis* විශේෂ වෙන්කර ගන්නා ලද අතර පිරිසිදු රෝපණ සකස් කොට කෝච්ස් ප්‍රතිග්‍රාහකය මගින් ඒවායෙහි ව්‍යාධිජනකභාවය තහවුරු කරගන්නා ලදී. *Trichoderma asperellum, fluorescens, Pseudomonas spp* භාවිතයෙන් ජෛව සාඵල්‍යතාව පරීක්ෂා කරන ලද අතර ඊඩින් නමැති අයිස් බර්ග් ප්‍රභේදය සමඟ ආරක්ෂිත ගෘහ තුළ හා නලස්ථ තත්ත්ව යටතේ *Botrytis* විශේෂයන්හි කෘත්‍රිම ආමුකූලනයට එරෙහිව දිලීරනාශක (75WP ඩික්ලොරන්) පරීක්ෂා කරන ලදී. ප්‍රතිඵලවලට අනුව දින 7ක අන්තරයකින් යුතුව *Trichoderma asperellum* (ලීටරයට මිලි ලීටර් 10ක්) හි ද්‍රවීය සංයෝගය ඉසීමෙන් සලාද වල *Botrytis* අංගමාරය කාර්යක්ෂම ලෙස පාලනය කළ හැකි බව අනාවරණ විය.

### *Trichoderma asperellum* සමඟ අනුකූලවන කෘමිනාශක හඳුනාගැනීම

විවිධ කෘත්‍රිම කෘමිනාශක (70% WG ඉමිඩැක්ලොප්‍රිඩ්, 4% GR තයෝසිලියම් හයිඩ්‍රජන්, 20% ක්ලොරන්ට්‍රනිලිප්‍රෝල් + 20% WG තයමෙතොක්සැන් 10% WP බප්‍රොෆෙසින්, ලීටරයට ග්‍රෑම් 50 SC පිප්‍රොනිල්, ග්‍රෑම් 500 EC ප්‍රොෆෙනොෆොස්, 240 SC සල්ෆොක්සැෆ්ලෝර් සහ 120 SC ස්පයිනෙටොරම්) සමඟ *T. asperellum* හි අනුකූලතාව හඳුනාගැනීමට විද්‍යාගාර තත්ත්ව යටතේ අධ්‍යයනයක් සිදු කරන ලදී. 70% WG ඉමිඩැක්ලොප්‍රිඩ්, ක්ලොරන්ට්‍රනිලිප්‍රෝල් + 20% තයෝමෙතොක්සැම්, 25% WG තයමෙතොක්සැම්, 10% WP බප්‍රොෆෙසින්, 240 SC සල්ෆොක්සැෆ්ලෝර් සහ 120 SC ස්පයිනෙටොරම් *T. asperellum.* සමග අනුකූලතාවක් දක්වන බවයි.

### පාංශු කාරක මගින් ව්‍යාප්තවන ව්‍යාධිජනකයන් පාලනය සඳහා කාර්යක්ෂම ජෛව පාලන කාරකයන්

*Fusarium, Sclerotium,,* සහ *Phythium* දිලීරමය ව්‍යාධිජනකයන් පාලනය කිරීම සඳහා වෙන්කරගත් දේශීය මාදිලියක් වන *P. fluorescens* වලට ජෛව පාලන කාරකයන් ලෙස ක්‍රියා කිරීමේ හැකියාව පවතියි. නලස්ථ තත්ත්ව යටතේ දී *Fusarium, Sclerotium* සහ *Phythium* හි වර්ධනය නිශේධනය කිරීමට *P. fluorescens* ට හැකි විය. නොනැසී පවතින ආමුකූලනයක් වශයෙන් *P.*

*fluorescens* පවත්වාගෙන යාම සඳහා මොලේසස් උචිත මාධ්‍යයක් විය. සකස් කිරීමෙන් මාස 3කට පසුව එයින් මිලි ලීටරයට ගණාවාස ඇති කිරීමේ ඒකක (cfu ) $2.5\times10^{9}$ක් ලබා දෙන ලදී.

### ආනයනික බීජ අර්තාපල්හි ස්වස්ථතාව පරීක්ෂා කිරීම

විවිධ රටවල් වලින් ආනයනය කරන ලද තොග 80ක් බීජ අර්තාපල් නියැදි නිරෝධායන රෝග සඳහා පරීක්ෂා කරන ලදී. *Erwinia carrotovora, Geotrichum candidum, Fusarium* spp., *Rhizoctonia solani, Helminthosporium* spp. සහ *Streptomyces* spp. මෙම තොගවල බහුලව හමු වූ නමුත් ඒවා ඩව් පරිමාණයට වඩා පහළ අගයක පැවතුණි. ගෙතුණු කබොළු (*Streptomyces reticulisscabies*) ඉහළ සංඛ්‍යාවකින් ආසාදනය නිසා එක් නියැදියක් ද පිටිමය කබොළු (*Spongospora subterranea*) හේතුවෙන් තවත් නියැදි දෙකක් ද ප්‍රතික්ෂේප කරන ලදී.

### බීජ මඟින් පැතිරෙන වෛරස් සඳහා විදේශීය දෙමුහුම් පරීක්ෂා කිරීම

කරවිල ප්‍රභේද 22ක්ද, පිපිඤ්ඤා ප්‍රභේද 7ක්ද ගර්කින් ප්‍රභේද 2ක්ද බටර්නට් ප්‍රභේද 1ක්ද වශයෙන් විවිධ රටවලින් ආනයනය කරන ලද දෙමුහුම් බීජ නියැදි බීජ මඟින් පැතිරෙන වෛරස් සඳහා පරීක්ෂාව කරන ලදී. ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ කරවිල නියැදි 2ක් සහ පිපිඤ්ඤා නියැදියක් CGMMV පවතින බවට ලක්ෂණ පෙන්නුම් කළ බවයි. අනෙකුත් සියලුම බීජ නියැදි බීජ මගින් ව්‍යාප්ත වන වෛරස් වලින් තොර විය.

### බැක්ටීරියා අංගමාරය සඳහා ප්‍රතිරෝධී විදේශීය දෙමුහුම් පරීක්ෂා කිරීම

*Ralstonia solanacearum* හේතුවෙන් හටගන්නා බැක්ටීරියා අංගමාර රෝගයට ප්‍රතිරෝධී ආනයනික දෙමුහුම් එළවළු ප්‍රභේද හරිතාගාර තත්ත්ව යටතේ පරීක්ෂා කරන ලදී. බැක්ටීරියා අංගමාර රෝගයට මධ්‍යස්ථ ප්‍රතිරෝධිතාවක් දැක්වූ ප්‍රභේද අනුවර්තනතා පරීක්ෂණ සඳහා නම් කරන ලදී.

**වගු අංක 1.2.2.2: බැක්ටීරියා අංගමාරය සඳහා ඇගයූ ප්‍රභේද වල නොනැසී පැවැත්මේ හැකියාව**

| බෝගය | අගයන ලද ප්‍රභේද සංඛ්‍යාව | ප්‍රතිරෝධීතාව (<10%) | මධ්‍යස්ථ ප්‍රතිරෝධීතාව (10-20%) | මධ්‍යස්ථ ග්‍රාහීතාව (21-40%) | ග්‍රාහීතාව |
|---|---|---|---|---|---|
| තක්කාලි | 18 | - | 07 | 03 | 08 |
| වම්බටු | 06 | - | 02 | 01 | - |
| මිරිස් | 01 | - | 01 | - | 03 |
| බෙල් පෙපර් | 03 | - | 02 | - | 01 |

### ආනයනික කරවිල බීජවල ෆයිටොප්ලාස්මා අනාවරණ කරගැනීම

PCR තාක්ෂණය (nested PCR technique) භාවිතයෙන් ෆයිටොප්ලාස්මාවලට විශේෂිත පූර්වක යොදාගනිමින් බීජ තොග පරීක්ෂා කරන ලද අතර එය 1250pb බණ්ඩයක් විස්තාරණය කිරීම මඟින් 'මායා' නමැති කරවිල දෙමුහුමෙහි බීජ තොග දෙකක ෆයිටොප්ලාස්මා පවතින බව තහවුරු කර ගන්නා ලදී.

### නව දිලීරනාශකවල ජෛව සාඵලායතාව

පිපිඤ්ඤා වල යටිපුස් රෝගය පාලනය කිරීම සඳහා 75%WGD මැන්කොසෙබ් හි නව සංයෝගයක් ලීටර් 10ට ග්‍රෑම් 20ක සාන්ද්‍රණයෙන් ද නව දිලීරනාශකයක් වන 5% මැන්ඩිප්‍රොපමිඩ් + 60% මැන්කොසෙබ් ලීටර් 10ට ග්‍රෑම් 25ක සාන්ද්‍රණයන් සාර්ථකව භාවිතා කළ හැකිය.

## සංවර්ධනය

### දැනුම්වත් කිරීම හා තාක්ෂණය බෙදාහැරීම් වැඩසටහන්

පාසල්, රජයේ ලේකම් කාර්යාල, මහවැලි අධිකාරිය, එළිමහන් රැඳවුම් කඳවුරු, පාබල හමුදා වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා විදේශිය රැකියා කාර්යාංශය සහ විවිධ සමාජ නියෝජනය කරමින් සහභාගි වූ 5000ක පිරිසකට කෘෂිකර්මාන්තයට අදාළ විවිධ විෂයයන් ඔස්සේ මූලික පුහුණුව හා මූලික දැනුම්වත්වීමේ වැඩසටහන් පවත්වන ලදී.

### කර්මාන්තමය පුහුණු වැඩසටහන

**වගු අංක 1.2.3: පවත්වන ලද කර්මාන්තමය පුහුණු වැඩසටහන්වල විස්තර**

| අපේක්ෂිත උපාධිය | ශිෂ්‍ය සංඛ්‍යාව | විශ්ව විද්‍යාල | පුහුණු කාලය |
|---|---|---|---|
| විද්‍යාවේදී කෘෂිකර්ම NVQ මට්ටම - 7 | 23 | විවෘත විශ්ව විද්‍යාලය<br>සබරගමුව විශ්ව විද්‍යාලය<br>වයඹ විශ්ව විද්‍යාලය<br>රජරට විශ්ව විද්‍යාලය | සති 15 |
| NVQ මට්ටම - 6 | 28 | කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලය<br>අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලය<br>අම්පාර උසස් තාක්ෂණ ආයතනය<br>නයිවල උසස් තාක්ෂණ ආයතනය<br>ලබුදූව උසස් තාක්ෂණ ආයතනය | මාස 6 |
| NVQ මට්ටම - 5 | 7 | බිබිල ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය | මාස 6 |
| NVQ මට්ටම - 4 | 13 | ඇඹිලිපිටිය තාක්ෂණික විද්‍යාලය<br>ජාතික තරුණ සේවා සභාව | මාස 6 |
| **එකතුව** | **71** | | |

## ප්‍රදර්ශන

**වගු අංක 1.2.4: පැවැත්වූ ප්‍රදර්ශන පිළිබඳ විස්තර**

| වැඩසටහනේ / මධ්‍යස්ථානයේ විස්තර | දිනය | ඉලක්කගත කණ්ඩායම |
|---|---|---|
| කෑ/ව - නියන්දුරුපොල මහා විද්‍යාලය | 25 ජනවාරි 2017 | සියලුම අංශ |
| කෑගල්ල විද්‍යාලය | 13,14,15 ජනවාරි 2017 | සියලුම අංශ |
| දියතිලක මධ්‍ය මහා විද්‍යාලය හඟුරන්කෙත | 21,22,23 පෙබරවාරි 2017 | සියලුම අංශ |
| ශාන්ත අන්තෝනි විද්‍යාලය, මහනුවර | 25,26,27 මැයි 2017 | සියලුම අංශ |
| පුෂ්පදාන බාලිකා විද්‍යාලය, මහනුවර | 1,2,3 ජූනි 2017 | සියලුම අංශ |
| කිංස්වුඩ් විද්‍යාලය, විද්‍යා සංගමය | 25, 26 | සියලුම අංශ |
| පළාත් කෘෂිකර්ම ප්‍රදර්ශනය - 2017, යාපනය | 19,20,21,22,23 සැප්තැම්බර් 2017 | සියලුම අංශ |
| කාබනික කෘෂිකර්මාන්තය සඳහා විශිෂ්ඨතා කේන්ද්‍රය, මාකඳුර | 14,15,16 දෙසැම්බර් 2017 | සියලුම අංශ |
| **එකතුව** | **8** | |

**සේවා**

**වගු අංක 1.2.5: සපයන ලද සේවා පිළිබඳ විස්තර**

| සේවාව | සංඛ්‍යාව | විශේෂ සටහන් |
|---|---|---|
| බෙදා හරින අත්පත්‍රිකා | 6,560 | ප්‍රභේද 172ක අත් පත්‍රිකා ඇත |
| උපදේශක සේවා | 42 | ලිඛිත පිළිතුරු |
| | 312 | දුරකථනය මඟින් තාක්ෂණික උපදෙස් |
| | 357 | පැමිණි පිරිසට වාචික උපදෙස් |
| රෝග නිර්ණ | 357 | එළවළු, ආකන්ද, විසිතුරු, පලතුරු බෝග, වෙනත් ක්ෂේත්‍ර බෝගද ඇතුළු බෝග සඳහා කෘමි හානි, රෝග නියැදි සහ බිම්මල් කොම්පෝස්ට් බෑග් වල දිලීරමය හානි |

| සේවාව | සංඛ්‍යාව | විශේෂ සටහන් |
|---|---|---|
| එළවළු අභිජනනය පිළිබඳ පුහුණුව/ නිදහස් කරන ලද නව ප්‍රභේද | වැඩසටහන් 11 | කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරින් |
| දෙමුහුම් බීජ නිෂ්පාදනය පිළිබඳ පුහුණුව | වැඩසටහන් 05 | බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය හා අඟුණකොළපැළැස්ස, කරපිංච, කුණ්ඩසාලේ, පැල්වෙහෙර කෘෂිකර්ම විද්‍යාල |
| පාංශු පරීක්ෂණ පිළිබඳ | | |
| ගෙවතු වගාකරණය පිළිබඳ පුහුණුව | 566 | ගොවීන් |
| ගෙවතුවල බතල වගාව | 55 පුහුණු | ගොවීන් සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරිහු |
| ආරක්ෂිත කෘෂිකර්මාන්තය පිළිබඳ පුහුණුව | 85 | ගොවීන් |
| බීජාණු නිෂ්පාදනය | 3,487 බෑග් | ඔයිස්ටර් බිම්මල් |
| | 225 මවු බීජාණු | පිදුරු බිම්මල් |
| බිම්මල් වගා පුහුණුව සඳහා සහතික නිකුත් කිරීම | 340 | ඔවුන්ගේ ව්‍යාපාර ලියාපදිංචිය සඳහා |
| ඔයිස්ටර් බිම්මල්, පිදුරු බිම්මල් සහ බීජාණු නිෂ්පාදනය පිළිබඳ පුහුණුව | තනි පුද්ගලයන් 1507 සහ වැඩසටහන් 30 | ගොවීන්, ව්‍යාප්ති නිලධාරින්, ශිෂ්‍යයන් |
| කාබනික කෘෂිකර්මාන්තය සඳහා සහභාගිත්ව සහතිකකරණ පද්ධතිය පිළිබඳ පුහුණු | පුද්ගලයන් 1600 සහ වැඩසටහන් 28 | කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරින් |
| කෘෂිකර්මාන්තය පිළිබඳ විවිධ විෂයන් සම්බන්ධ පුහුණුව | පුද්ගලයන් 3200 සහ වැඩසටහන් 28 | විවිධ සංවිධාන පාසල්, ගොවි සංවිධාන, විශ්ව විද්‍යාල, විවධ සංගම් වලින් සහභාගිවන්නෝ |

| සේවාව | සංඛ්‍යාව | විශේෂ සටහන් |
|---|---|---|
| දිස්ත්‍රික් තාක්ෂණික කෘෂිකර්ම කමිටු රැස්වීම් | 04 | කෑගල්ල |
| පළාත් තාක්ෂණික කෘෂිකර්ම ක්‍රියාකාරි කමිටු | 10 | |
| යන්ත්‍ර සූත්‍ර හඳුන්වාදීම | 02 | බිම්මල් වගාව සඳහා මළු පිරවීමේ යන්ත්‍ර දෙකක් හඳුන්වා ගන්නා ලද අතර බිම්මල් වගාව සඳහා නිර්දේශ කරන ලදී. |
| රූපවාහිනී වැඩසටහන් | 03 | විවිධ මාතෘකා |
| ගුවන් විදුලි වැඩසටහන් | 27 | විවිධ මාතෘකා |

## අභිජනන බීජ නිෂ්පාදනය

**වගු අංක 1.2.6: අභිජනන බීජ නිෂ්පාදන ප්‍රමාණය**

| බෝගය | ප්‍රභේදය | ප්‍රමාණය |
|---|---|---|
| මෑ | ගන්නොරුව A9 | 26.85 |
| | ගන්නොරුව හවරි | 7.0 |
| බෝංචි | ගන්නොරුව ග්‍රීන් | 6.5 |
| කරවිල | මාතලේ ග්‍රීන් | කිලෝ ග්‍රෑම් 1 |
| පිපිඤ්ඤා | කල්පිටිය වයිට් | කිලෝ ග්‍රෑම් 0.75 |
| තක්කාලි | ලංකා සවර් | කිලෝ ග්‍රෑම් 0.45 |
| වම්බටු | HS2 - ජනක ආර | කිලෝ ග්‍රෑම් 1.83 |
| | 5124 - ජනක ආර | කිලෝ ග්‍රෑම් 1.5 |
| | පාදාගොඩ | කිලෝ ග්‍රෑම් 1.3 |
| සාම්ප්‍රදායික ප්‍රභේද | බණ්ඩක්කා (ඇත්දළ) | කිලෝ ග්‍රෑම් 3.1 |
| | බණ්ඩක්කා (රතු) | ග්‍රෑම් 300 |
| | තක්කාලි (ගොරකා) | ග්‍රෑම් 300 |
| | කැකිරි | ග්‍රෑම් 350 |
| | නිවිති | ග්‍රෑම් 300 |

## රෝපණ ද්‍රව්‍ය බෙදාහැරීම

**වගු අංක 1.2.7: බෙදාහරින ලද රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණය**

| බෝගය | කැපුම් සංඛ්‍යාව |
|---|---|
| බතල | 342,000 |
| මඤ්ඤොක්කා | 54343 |
| වෙනත් අල බෝග | 854 |

### විද්‍යාගාර විශ්ලේෂණාත්මක සේවා

2017 වර්ෂයේදී පස් නියැදි 880, කොම්පෝස්ට් නියැදි 155ක්, ජලය නියැදි 152ක් හා පැළැටි නියැදි 40ක් විශ්ලේෂණය කොට වාර්තා ඉදිරිපත් කරන ලදී. ගොවීන් වෙතින් ලද විවිධ ගැටළු සහිත ශාක සහ පාංශු නියැදි ද්විතියික හා ක්ෂුද්‍ර පෝෂක සඳහා

විශ්ලේෂණය කෙරිණ. ඊට අමතරව, වී සඳහා පාංශු පරීක්ෂණ පදනම් කරගත් පොහොර නිර්දේශ කිරීම් සඳහා ග්‍රාම නිලධාරි කොට්ඨාශවලින් එක්රැස් කරගත් පාංශු නියැදි 2115ක් විශ්ලේෂණය කෙරිණ. පාංශු සහ කොම්පෝස්ට් විශ්ලේෂණය මගින් 2017 වර්ෂයේ දී ලද ආදායම රු. 344,325.00කි.

**විශේෂ පොහොර පරීක්ෂා කිරීමේ වැඩසටහන**

හරිතාගාර සහ ක්ෂේත්‍ර තත්ත්ව යටතේ පොහොර නිෂ්පාදන 13ක් පරීක්ෂා කරන ලද අතර ආනයනය සඳහා නිෂ්පාදන 4ක් නිර්දේශ කරන ලදී. පොහොර පරීක්ෂා කිරීමේ වැඩසටහන් මගින් ලද ආදායම රු. 6,320,000.00කි.

**ග්‍රාම නිලධාරි කොට්ඨාසවල පාංශු පරීක්ෂණ**

මෙම වැඩසටහන යටතේ සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි කෘෂිකර්ම ව්‍යාප්ති අංශය මගින් පාංශු නියැදි රැස් කරන ලදී. නියැදි විශ්ලේෂණය කරන ලද අතර නිර්දේශ සැකසෙමින් පවතියි. මෙම ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් පාංශු පරීක්ෂණ විද්‍යාගාර විස්සක් පාංශු පරීක්ෂණ සේවාව පුළුල් කිරීමට දිවයිනේ දිස්ත්‍රික්ක 20ක ස්ථාපනය කරනු ලැබිය.

## 2018 වසර සඳහා සැලැස්ම

- දේශීය වගා තත්ත්වයන්ට අනුවර්තනය විය හැකි දෙමුහුම් හා විවෘත පරාගිත එළවළු බෝග ප්‍රභේද සංවර්ධනය
- කාලගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන දෙමුහුම් හා විවෘත පරාගිත එළවළු බෝග ප්‍රභේද සංවර්ධනය.
- විවිධ පාරිසරික තත්ත්වයන්ට සරිලන උචිත තාක්ෂණික පැකේජයක් සංවර්ධනය
- එළවළු වගාකරුවන් සඳහා පරිසර හිතකාමී, ආරක්ෂිත යෙදවුම් කළමනාකරණ ක්‍රමවේද හඳුනාගැනීම සහ සංවර්ධනය
- සාම්ප්‍රදායික සහ පුළුල් එළවළු බෝග විශේෂ ගෙවතුකරණය සහ ප්‍රචලිතකරණය
- න්‍යෂ්ටික බීජ ද්‍රව්‍ය නිෂ්පාදනය

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුරු | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | - |
| ප්‍රධාන කෘෂි විද්‍යාඥ | 05 | 03 |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ | 02 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 08 | 05 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂිකර්ම පර්යේෂණ) | 87 | 40 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (ආර්ථික විද්‍යා) | 03 | - |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | - | 03 |
| පරිපාලන නිලධාරි | 04 | 03 |
| කෘෂිකර්ම උපදේශක (විශේෂ) | 11 | - |
| පර්යේෂණ සහකාර (විශේෂ) | 07 | 04 |

| තනතුරු | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| ආර්ථික විද්‍යාඥ සහකාර | 03 | 02 |
| තොරතුරු හා තාක්ෂණ නිලධාරි | 01 | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 | 02 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 31 | 20 |
| සංවර්ධන නිලධාරි | 24 | 14 |
| කෘෂිකර්ම උපදේශක | 50 | 49 |
| පර්යේෂණ සහකාර | 84 | 57 |
| ඉංජිනේරු සහකාර | 02 | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 43 | 41 |
| තාක්ෂණික සහායක (ඉංජිනේරු) | 03 | - |
| තාක්ෂණික සහායක (ව්‍යාප්ති) | 28 | 30 |
| තාක්ෂණික සහායක (පර්යේෂණ) | 03 | 02 |
| ගොවිපල ලිපිකරු | 08 | 10 |
| රියදුරු | 28 | 25 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 12 | 10 |
| ගබඩාකරු | 07 | 07 |
| යාන්ත්‍රික ශිල්පි | 05 | 03 |
| යන්ත්‍ර ශිල්පි | 03 | 02 |
| කාර්මික ශිල්පි | 10 | 08 |
| වඩුකරු | 05 | 02 |
| පෙදරේරු | 04 | 01 |
| විදුලි කාර්මික | 05 | 02 |
| පර්යේෂණ උප සහකාර | 24 | 18 |
| ජල පොම්ප ක්‍රියාකරු | - | 01 |
| මී මැසි පාලක | - | 01 |
| බද්ධකරු | 07 | 07 |
| සංචාරක බංගලා භාරකරු | 05 | 04 |
| ලොරි පවිත්‍රකරු | 01 | 01 |
| කාර්යාල කාර්ය සහායක | 06 | 06 |
| මුරකරු | 69 | 61 |
| කම්කරු | 476 | 398 |
| සනීපාරක්ෂක කම්කරු | 02 | 02 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 109 | 77 |
| **එකතුව** | **1188** | **923** |

## 1.2.1. ආහාර පර්යේෂණ ඒකකය - ගන්නොරුව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ පරිපාලනය යටතේ මෙම ඒකකය ක්‍රියාත්මක වේ. ආහාර පර්යේෂණ ඒකකය, ආහාර බෝග වල පසු අස්වනු තාක්ෂණය සහ නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ පැවැත්වීම සම්බන්ධයෙන් මූලික වශයෙන් වගකීම දරයි. බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහනින් ලබා ගත් නියැදි වල ගුණාත්මක තත්වය ඇගයීමද එහි තවත් වගකීමකි. තවද, මෙම ආයතනය, තාක්ෂණය වැඩිදියුණු කිරීම, එම තාක්ෂණය බෙදාහැරීම සහ යන්ත්‍ර සූත්‍ර භාවිතය සම්බන්ධයෙන්, රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික අංශයේ සංවිධාන සමග එක්ව සහයෝගීතා වැඩසටහන් පවත්වනු ලබයි. එම කාර්යයන්ට අමතරව, පසු අස්වනු සහ සැකසුම් කිරීමේ තාක්ෂණික ක්‍රම වල විවිධ අංශ සම්බන්ධයෙන් උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධිය හදාරණ සිසුන් සිදු කරන පර්යේෂණ කටයුතු වලට අවශ්‍ය පහසුකම් සහ උපදේශ ලබා දීමද සිදු කරනු ලබයි.

### අයවැය

**වගු අංක 1.2.1.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 1,830,624 | 1,830,624 | 100 |
| මූලධන | 2,393,800 | 2,009,814 | 84 |
| ව්‍යාපෘති | | | |
| • එළවළු / පලතුරු පසු අස්වනු අත්පොත - FRU - AFACI වැය ශීර්ෂය : 285-2-2-4-2507 (13) AFACI - 10 | 2,232,000 | 2,232,000 | 100 |
| • පලතුරුවල පසු අස්වනු හානිය අවම කිරීම - SDF වැය ශීර්ෂය : 285-2-2-12-2507 (SDF) | 57,028,500 | 56,613,749 | 99 |
| **එකතුව** | **63,684,924** | **62,686,187** | **99** |

### ප්‍රගතිය

#### පර්යේෂණ සොයාගැනීම්

#### විසිරි වියලනයෙන් වියලාගත් අනෝදා නිෂ්පාදනයේ අන්තර්ගත භෞත රසායනික සහ පෝෂණමය ගුණ

අනෝනා මුරිකාටා (*Annona muricata*) සහ අනෝනා රෙටිකුලේටා (*Annona reticulata*) යනු ශ්‍රී ලංකාවේ ඌණ භාවිත පලතුරු ලෙස සාමාන්‍යයෙන් සැලකේ. එම පලතුරු තුල විටමින්, ඛණිජ ලවණ සහ ශාක රසායන විශාල ප්‍රමාණයක් අන්තර්ගතය. මෙම පලතුරු ඉක්මනින් නරක්වන පලතුරු වන අතර විශාල පසු අස්වනු හානියක් සිදුවේ. එහිදී, ජල ප්‍රමාණය, ජලයේ ක්‍රියාකාරීත්වය සහ ක්ෂුද්‍ර ජීවීන් ඇතිවීම අවම කරමින් එම පලතුර සඳහා විසිරි වියලන තාක්ෂණය යොදා ගැනීම, මනා ලෙස මෙම පලතුරු කල්තබා

ගැනීමේ උපක්‍රමයක් වේ. ආසක්ත ද්‍රාව්‍යතාව, ජල ක්‍රියාකාරීත්වය, සජල කාලය, ඝනවීමේ හැකියාව, අවසන් අස්වනු සහ ද්‍රාව්‍යතාව වැනි ක්‍රියාකාරීත්වයන් තුලින් මෝල්ටි ඩෙක්ස්ට්‍රින් මට්ටම වැඩි කරමින් භෞතරසායන ලක්ෂණ වඩා යහපත් බවට පත්කිරිමෙහිලා විසිරි වියලන ක්‍රමෝපාය භාවිතයෙන් නිෂ්පාදිත අනෝනා මුරිකාටා (*Annona muricata*) අනෝනා රෙටිකියුලාටා (*Annona reticulata*) නමැති කටු අනෝදා දෙවර්ගයටම හැකියාව ඇති බව පෙන්නුම් කර ඇත.

## විසිරි වියලනයෙන් වියලාගත් දූරියන් තුල අන්තර්ගත භෞතික ගුණ විමර්ෂණය කිරීම

දූරියන් (*Durio zebathinas*) යනු ශ්‍රී ලංකාවේ ජනප්‍රිය පලතුරකි. විටමින්, ඛණිජලවණ, ප්‍රතිඔක්සිකාරක වැඩි ප්‍රමාණයක් සමග රසායනික සංයුතියෙන් සමබල වූ පලතුරකි. එහෙත්, එහි එයටම ආවේනික වූ සැර ගන්ධය, අතිශය පැණි රස සහ ඝණ කටු සහිත පොත්ත හේතුවෙන් මෙම පලතුරු විකිණීමේදී බාධා මතු වේ. මෙම ගැටළු විසදීම සඳහා පවත්නා ඉතා වැදගත් ක්‍රමයක් වනුයේ එයට වටිනාකම එක් කිරිමය. දූරියන් පවුඩර්, විසිරි වියලනය භාවිතායෙන් නිෂ්පාදනය කරනු ලබන අතර එම නිෂ්පාදනය, යෝගට්, යෝගට් බීම, රසකල අයිස් ක්‍රීම්, කේක් සහ ක්ෂණික බීම වශයෙන් වැඩිදියුණු කරන ලදී.

## අඩු මිලකට අලිපේර තෙල් නිෂ්පාදනය

නරක්වීමේ ප්‍රවණතාවය ඉහළ මට්ටමක පවතින බැවින් සහ අවාරමය කාලපරිච්ඡේදයක් පවතින බැවින් අලිපේර පසු අස්වනු හානිය ඉතා ඉහළ අගයක් පෙන්නුම් කරයි. කොලෙස්ට්‍රෝල් ඇති නොවන අසන්තෘප්ත මේදය ලබාගැනීමේ ඉතා හොඳ මුලාශ්‍රයක් වනුයේ අලිපේර තෙල් නිෂ්පාදනයයි. අලිපේර පලතුරෙන් මෙසේ තෙල් ලබා ගැනීම ද පසු අස්වනු හානිය අවම කරවීමට ඉවහල් වේ. ආහාර පර්යේෂණ ඒකකය වෙතින් අඩු වියදම් සරල උපකරණයක් මගින් තාපය උකහාගැනීමේ ක්‍රමයක් අත්හදා බලන ලදී. එම ක්‍රමය සහ ක්‍රියාවලිය සාර්ථක වූ අතර ගුණාත්මක තත්ත්වයේ අලිපේර තෙල් නිපදවීමට හැකි විය.

## ස්වභාවික ක්‍රියාකාරි කාබන් යොදා ගනිමින් තක්කාලිවල ජීවකාලය දීර්ඝ කිරීම

ඉක්මන් නරක්වීමේ ස්වභාවය හේතු කොට ගෙන තක්කාලි අස්වැන්න විශාල ලෙස හානියට පත් වේ. වර්තමානයේ තක්කාලිවල ජීව්‍යතාවය දීර්ඝ කාලයක් ආරක්ෂා කිරීම සඳහා, ශිත බහාලුමක ගබඩා කිරීම, නවීකරණය කරන ලද අවකාශ ක්‍රම, රසායනික ප්‍රතිවිකිරණ වැනි විවිධ ක්‍රම භාවිතයට ගනු ලැබේ. එහිදී, ස්වභාවික ක්‍රියාකාරි කාබන් භාවිත කරමින් තක්කාලිවල ජීව්‍යතාව පවත්වා ගැනීමේ හැකියාව පිළිබඳ ආහාර පර්යේෂණ ඒකකය විමර්ශණයට භාජනය කරන ලදී. අඩක් පුළුස්සන ලද දහයියා, පොල්කටු අඟුරු සහ සිනිඳු දැව අඟුරු, කාබන් මුලාශ්‍ර ලෙස යොදා ගන්නා ලදී. තක්කාලිවල ජීව්‍යතාවය ගුණාත්මක තත්ත්වයෙන් පවත්වා ගැනීම සහ වැඩිකිරීම සඳහා අනෙකුත් මුලාශ්‍ර දෙකට වඩා අඩක් පුළුස්සන ලද දහයියා සාර්ථක ලෙස උපකාරි වන බව පෙනී ගියේය.

## අපනයන වෙළඳපල ඉලක්කරගත් TJC අඹ වල ජීව්‍යතාව ඉහළ නැංවීම සඳහා විවිධ වූ 1 - MCP ප්‍රතිකර්ම

නැව් මගින් TJC අඹ අපනයන කිරිමේදී මතුවන ප්‍රධාන ගැටළුවක් වනුයේ අඹවල අඩු ජීව්‍යතාවයයි. අහස් යානා මගින් ප්‍රවාහනය කිරීම ඉතා මිල අධික ක්‍රමයක් වන අතර ලාභය අවම කරයි. TJC අඹවල ඌෂ්ණත්වය සෙල්සියස් 15 මට්ටමේ රඳවමින් 1 - MCP ජලජමය සහ ධුමකරණ

ප්‍රතිකාර තුලින් අඹවල ජීව්‍යතාවය වැඩි කල හැකි බව ආහාර පර්යේෂණ ඒකකය මගින් සොයාගෙන තිබේ. ඉහත කී ප්‍රතිකර්ම ලෙස 100, 500 සහ ලීටරයට මයික්‍රො ග්‍රෑම් 1000 1-MCP ප්‍රතිකර්ම අත්හදා බලන ලදී. ලීටරයට මයික්‍රො ග්‍රෑම් 1000 1-MCP ජලජමය ප්‍රතිකර්මය TJC අඹවල ජීව්‍යතාවය දින 21ක් දක්වා ඉහල නැංවීමට හේතුවිය. මෙම අත්හදා බැලීම ශීත කාමර තත්ත්වයක් යටතේ අඹ තොග වශයෙන් ගෙන සිදු කළ යුතුය.

## පූර්ව ප්‍රතිකර්ම සහ වියලීමේ ක්‍රම සංයෝගයෙන් විජලනය කරන ලද තෝරාගත් පලතුරු වල භෞතික රසායන, ප්‍රතිඔක්සිකාරක සහ සංවේදක ලක්ෂණ අධ්‍යයනය කිරීම

පූර්ව ප්‍රතිකර්ම හා සම්බන්ධ තෝරාගත් වියළීමේ ක්‍රම අතර අන්නාසි (*Ananas cosmosus*), පැපොල් (*Carica papaya*), සහ කෙසෙල් (*Musa saba*) යන පලතුරුවල, රික්ත වියළීම හා සම්මිශ්‍රිත වූ ආස්‍රැති ප්‍රතිකර්ම ක්‍රමය මඟින් වැඩි ඇස්කෝබික් අම්ල ප්‍රමාණයක් රඳවන ලදී. තෝරාගත් පලතුරුවල සිදුකරන ලද රික්ත වියළීමේ හා සම්මිශ්‍රිත වූ සිට්‍රික් අම්ල ප්‍රතිකර්මයේ දී ෆිනොලික් ප්‍රමාණය සහ ප්‍රතිඔක්සිකාරක ධාරිතාවය ඉහල මට්ටමක පැවතුනි. ආස්‍රැතිමය වශයෙන් පූර්ව ප්‍රතිකර්ම සිදුකරන ලද රික්තමය වශයෙන් වියළා ගත් අන්නාසි, කෙසෙල් සහ පැපොල් සඳහා වැඩි පරිභෝගික රුචිකත්වයක් පෙන්නුම් කලේය.

## වරකා (කොස්; *Artocarpus heterophylus*) පලතුරු අවම සැකසුම් මට්ටමෙන් භාවිත කිරීම සහ ජීව්‍යතාවය හඳුනාගැනීම

සංවේදන ලක්ෂණ සහ ගබඩා කාලය පිළිබඳ සළකා බැලීමේදී, 30% (w/v) සීනි ද්‍රාවනය + 0.5% (w/v) සිට්‍රික් අම්ලය මිශ්‍ර කොට වරකා බල්බ හැකිලෙන දවටනයක ($T_3$) එතීමෙන් සිදුකරන ප්‍රතිකර්මයේ දී දවස 7ක් දක්වා ජීව්‍යතාවය රඳවාගත හැක. එබැවින් වරකා බල්බවල ජීව්‍යතාවය වැඩිකිරීමට මෙම ක්‍රමය යොදා ගත හැක.

## වගා ක්‍රම සහ පොහොර භාවිතයෙන් මුකුණුවැන්න ශාකයේ (*Alternanthera sessilis*) ප්‍රතිඔක්සිකාරක කෙරෙහි ඇතිවන බලපෑම

පිළියන්දල ප්‍රභේදය හා සංසන්දනාත්මකව කොළඹ ප්‍රභේදයේ ජෛව ක්‍රියාකාරි සංයෝග ප්‍රශස්තව පවත්නා අතර, පොහොර භාවිතයේ සමෝධානික ක්‍රමය භාවිතයෙන් වැඩීමට සැලැස්වීමේදී මෙම මුකුණුවැන්න ප්‍රභේද දෙවර්ගයම ඉහළ ප්‍රතිඔක්සිකාරක මට්ටමක් පෙන්නුම් කලේය.

## පසු අස්වනු හානිය අවම කිරීම සඳහා තක්කාලි සෝස් නිෂ්පාදනය කිරීම

රික්ත විජලනය මගින් ලබාගත් තක්කාලි පවුඩර් යොදා ගනිමින් තක්කාලි සෝස් නිෂ්පාදනය කිරීම සඳහා තාක්ෂණයක් සකස් කරන ලදී. මෙමගින් තක්කාලි නිෂ්පාදනයේ විශාල පසු අස්වනු හානිය අවම කිරීමටත් අවාරයේදී සෝස් කර්මාන්තයට අවශ්‍ය තක්කාලි සුලබ කිරිමටත් හැකිවනු ඇත.

## කෙසෙල් ප්‍රභේද පහක් භාවිත කරමින් කෙසෙල් තීරු (chips) නිෂ්පාදනය

රික්ත විජලන තාක්ෂණය උපයෝගි කොට ගනිමින් ඇඹුල් කෙසෙල්, ඇම්බන්, කෝලිකුට්ටු, සීනි සහ කැවෙන්ඩිෂ් කෙසෙල් ප්‍රභේද සඳහා කෙසෙල් තීරු නිෂ්පාදනය කිරීමේ තාක්ෂණයක් සකස් කරන ලදී. මෙම තාක්ෂණය මගින් කෙසෙල් සඳහා අගය එකතු කිරීමක් සිදුකරන අතර මෙමගින් පසු අස්වනු හානිය අවම කරයි. පාරිභෝගිකයන්හට පෝෂදායි සහ ආරක්ෂා සහිත කෙටි ආහාරයක් ලෙස කෙසෙල් රසවිඳිය හැක.

### රික්ත වියලනය තුලින් අඹ පවුඩර් නිෂ්පාදනය සහ අනෙකුත් ආහාර සකස් කිරීම සඳහා එම නිෂ්පාදනය යොදා ගැනීම

රික්ත වියලනය තුලින් අඹ පවුඩර් (කර්තකොලොම්බන්, විලාඩ් සහ ටොම් EJC) නිෂ්පාදනය කිරීම සඳහා තාක්ෂණයක් සැකසීම පිළිබඳ වූ පර්යේෂණයක් සාර්ථක අන්දමින් සිදුකරන ලද අතර, එය, ජෑම්, ක්ෂණික කෝ(ර්)ඩියල්, කේක්, යෝගට්, යෝගට් බීම සඳහා භාවිත කරනු ලැබේ.

### එළවළු සඳහා රික්ත විජලන තාක්ෂණය යොදා ගැනීම

එළවළු, කරවිල, තක්කාලි, කොහිල, දෙහි, ගොටුකොළ, මුකුණුවැන්න, කරපිංචා, කොස්, වැල ආදිය වෙනුවෙන් රික්ත විජලන තාක්ෂණය වැඩිදියුණු කරන ලදී.

### අගය එකතුකල නිෂ්පාදන වැඩිදියුණු කිරීම

ජමනාරං, ක්ෂණික මැංගුස් බීම, ක්ෂණික කැරට් බීම, ක්ෂණික බිට්රූට් බීම සහ ජම්බු වට්නි බෝතල් කිරීම සඳහා ආහාර සැකසීමේ තාක්ෂණයක් සකසන ලදී.

## විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය

### සාක් රටවල නිෂ්පාදන ධාරාව තුල පලතුරු සඳහා අගය එකතු කිරීම සහ පසු අස්වනු කළමනාකරණය (SDF ව්‍යාපෘතිය)

ශ්‍රී ලංකාව තුල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා සාක් මූල්‍ය ප්‍රතිපාදන යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ආහාර පර්යේෂණ ඒකකයේ කළමණාකාරීත්වය සහ මඟපෙන්වීම යටතේ, අනුරාධපුර, දඹුල්ල, ගම්පහ, මාතලේ, මුලතිව්, නුවරඑළිය සහ මහනුවර යන පලතුරු වගා කරන විවිධ වූ ප්‍රදේශ තුල පලතුරු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපිත කරන ලදී. මෙම මධ්‍යස්ථාන යටතේ ගොවි/ ප්‍රතිලාභී කණ්ඩායම් හතක් නිර්මාණය කරන ලදී. මේ වන විට රුපියල් මිලියන 83ක් වැය කරමින් මූලික සමීක්ෂණ, යටිතල පහසුකම් සංවර්ධනය, යන්ත්‍ර සහ උපකරණ සැපයීම, පුහුණුව, වෙළඳපල සංවර්ධනය සහ උපකරණ සැපයීම, පුහුණුව යන කටයුතු සම්පූර්ණ කොට ඇත. මුලතිව්, මහනුවර සහ නුවරඑළිය වැනි ඇසුරුම් සහ සැකසුම් මධ්‍යස්ථාන තුල පලතුරු ඇසුරුම් කිරීම සහ සැකසුම් කිරීම ආරම්භ කොට ඇත.

### අත්පොත් සැකසීම සහ ක්ෂේත්‍රය තුල වැඩිදියුණු කළ තාක්ෂණය භාවිතය තුලීන් ආසියාවේ පලතුරු සහ එළවළු පසු අස්වනු හානිය අවම කිරීම (AFACI පසු අස්වනු ව්‍යාපෘතිය)

පසු අස්වනු සම්බන්ධ අත්පොත් 3ක් නිර්මාණය කරන ලදී. ගොවි පුහුණු වැඩසටහන් හරහා හඳුනාගත් ප්‍රදේශවල වැඩිදියුණු කරන ලද තාක්ෂණය ක්ෂේත්‍ර සඳහා යොදා ගැනීමේ කටයුතු (පසු අස්වනු තාක්ෂණය සහ අගය එකතු කළ ආහාර නිෂ්පාදනය) සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ පොත්, අත් පත්‍රිකා, අත්පොත් සහ පෝස්ටර නිර්මාණය කරන ලදී. පසු අස්වනු හානිය වැළැක්වීමේ කටයුතු සඳහා ප්ලාස්ටික් ඇසුරුම් පෙට්ටි සහ උපකරණ මිලදී ගන්නා ලදී. 2017 පසු අස්වනු ආසියානු සම්මේලනයේදී එක් පර්යේෂණ සොයා ගැනීමක් ප්‍රකාශයට පත් කරන ලදී. තෝරා ගත් පලතුරු සහ එළවළු සම්බන්ධයෙන් පසු අස්වනු හානිය පිළිබඳ ඇගයීමේ කටයුතු අඛණ්ඩව සිදුවේ.

## සංවර්ධනය

### තාක්ෂණ ප්‍රචාරණය

#### ගුවන් විදුලි වැඩසටහන්

- ප්‍රනාන්දු, එච්.ආර්.පී. - සුභාරති (පලතුරු හා එළවළුවල පසු අස්වනු හානිය අවම කිරීම), ශ්‍රී ලංකා ස්වදේශිය සේවය

(ශ්‍රී.ලං.ගු.සං.) සහ 'සිංහල අවුරුද්දට පලතුරු ගෙන නැගම් යමු', කඳුරට සේවය (ශ්‍රී.ලං.ගු.සං.)

- සේනාරත්න, එස්.එම්.ඒ.සී.යු. - 'සරුසාර උදැසන' කෘෂි FM ජාල ගුවන් විදුලිය, කඳුරට සේවය (ශ්‍රී.ලං.ගු.සං.), 'අස්වැන්න' (සජීවි වැඩසටහන - අගය එකතු කල ආහාර නිෂ්පාදනය), කඳුරට සේවය (ශ්‍රී .ලං.ගු.සං.) 'කෘෂි චාරිකා' (අගය එකතු කල ආහාර නිෂ්පාදනය) කඳුරට සේවය (ශ්‍රී.ලං.ගු.සං.), 'අස්වැන්න' (සජීවි වැඩසටහන - ගෙවතු වගාව තුලින් ආහාර සහ පෝෂණය), කඳුරට සේවය (ශ්‍රී .ලං.ගු.සං.), 'සරුසාර උදැසන' (සජීවි වැඩසටහන - කොස් පිළිබඳ තොරතුරු), කෘෂි FM ජාල ගුවන් විදුලිය, කඳුරට සේවය (ශ්‍රී.ලං.ගු.සං.), බිම්මල් නිෂ්පාදන, ගුවන් විදුලි ගොවි සේවය, කෘ.දෙ., උදැසන ආහාරය සඳහා මාෂ සුප් මිශ්‍රණය, ගුවන් විදුලි ගොවි සේවය, කෘ.දෙ, ප්‍රතිඔක්සිකාරක සහ කොළ එළවළු, ගුවන් විදුලි ගොවි සේවය, කෘ.දෙ., 'රන්දියවර' (සජීවි වැඩසටහන - අපගේ ආහාර පුරුදු සහ ආහාර සැකසුම), රන්ගිර ශ්‍රී ලංකා, 'ගෙවත්ත' - ගෙවතු වගාව තුලින් පෝෂණය, වයඹ සේවය (වැඩසටහන් දෙකක්)
- හෙට්ටිආරච්චි, ඩී.එන්. - 'ගොවිතැනට පැයක්', ශ්‍රී ලං.ගු.සං
- වික්‍රමසිංහ, ඩබ්.ආර්.ඩී.එම්.ඒ.කේ. - අගය එකතු කල ආහාර වැඩසටහන්, ශ්‍රී. ලං.ගු.සං.

### රූපවාහිනී වැඩසටහන්

- පලතුරු, එළවළු සහ කොස් විජලනය, ජාතික රූපවාහිනිය, සේනාරත්න එස්.එම්.ඒ.සී.යු., ඩී.කේ. විජේරත්න, කේ.ඩබ්.පී.ඩී. කරදවල සහ වයලට් රාජපක්ෂ
- ආහාර පර්යේෂණ ඒකකය - ආහාර සැකසුම සහ කල්තබා ගැනීම, ශ්‍රද්ධා රූපවාහිනිය, සේනාරත්න එස්.එම්.ඒ.සී.යු., ඩී.කේ. විජේරත්න, කේ.ඩබ්.පී.ඩී. කරදවල සහ වයලට් රාජපක්ෂ.

### පුහුණු වැඩසටහන්

ආහාර පර්යේෂණ ඒකකයේදී, පසු අස්වනු තාක්ෂණය, ආහාර සැකසීම සහ ඇසුරුම් කිරීම පිළිබඳ සම්පත් දායකයන් සඳහා වන පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- ශීත කාමර කළමනාකරණය (වැඩසටහන් 3ක්)
- පලතුරු, එළවළු සහ ගොටුකොළ පසු අස්වනු හානිය අවම කිරීම (04),
- පලතුරු සහ එළවළු පසු අස්වනු හානිය අවම කිරීම පිළිබඳ පාසැල් ළමුන් සහ ගුරුභවතුන් පුහුණු කිරීමේ වැඩසටහන් (10)
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ආහාර සංරක්ෂණය සහ ආහාර නාස්තිය අවම කිරීම පිළිබඳ වැඩමුළුව.
- පලතුරු හා එළවළු ඇසුරුම් කිරීම සහ විජලනය, SDF මුලතිව් ව්‍යවසායකයන් සහ ඇඹිලිපිටිය පල්ලව ගොවි කණ්ඩායම් සඳහා මඤ්ඤොක්කා හා කෙසෙල් නිෂ්පාදනය පිළිබඳ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ වැඩසටහන්.

සමාලෝචිත කාලය තුල, පසු අස්වනු තාක්ෂණය සහ නිෂ්පාදන වැඩිදියුණු කිරීම පිළිබඳ අනෙකුත් පුහුණු වැඩසටහන් ආහාර පර්යේෂණ ඒකකය මගින් පහත සඳහන් ආයතන සඳහා පවත්වන ලදී.

විශ්ව විද්‍යාල - සබරගමුව, පේරාදෙණිය, ඌව වෙල්ලස්ස, වයඹ, තාක්ෂණික විද්‍යාල සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

මෙම පුහුණු වැඩසටහන් තුලින් ආවරණය කරන ලද මාතෘකා වුයේ පසු අස්වනු තාක්ෂණය සහ සෝයා, සහල්, අනෙකුත් මාෂ බෝග සහ ධාන්‍ය වර්ග අඩංගු නිෂ්පාදන සැකසීම, කිරි අඩංගු ආහාර නිෂ්පාදන, ආහාර වල ගුණාත්මක තත්ත්වය විශ්ලේෂණය සහ ආහාර සැකසුම්, පැණි රස ආහාර නිෂ්පාදනය, බයිට්, ජෙස්ට් සහ බේකරි නිෂ්පාදන ආදියයි. මෙම පුහුණුවීම්වලදී, නැවුම් සහ සැකසු ආහාර ඇසුරුම් කිරීම, ආහාර සහ පෝෂණය, ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ගැටළු, ගෙවතු වගාව තුලින් ආහාර සුරක්ෂිතතාවය, ආරක්ෂිත ගෘහ තුල වගාව සහ වෙළඳපල යන මාතෘකාද ආවරණය කරනු ලැබිය.

සම්පත් ලාභීන් ලෙස පහත සඳහන් ආයතනවල නිලධාරීන් සහභාගි වූහ.

- පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු - පලතුරු පරිභෝජනය වැඩි කිරීම (සිද්ධාන්ත සහ ප්‍රායෝගික - වැඩසටහන් 2ක්) සහ ගොවි පුහුණු - නුවරඑළිය සහ වාරියපොල, දඹුල්ල, මොණරාගල, වැල්ලවාය
- ගොවීන් සඳහා ජයිකා පුහුණුව - පලතුරු, විශේෂයෙන් අඹ සහ එළවළු සම්බන්ධයෙන් පසු අස්වනු තාක්ෂණය
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ගන්නොරුව සහ බෝඹුවල ISTI පුහුණුව - මාෂ සහ ධාන්‍ය නිෂ්පාදන ඇසුරුම් කිරීම, පසු අස්වනු තාක්ෂණය සහ ආරක්ෂිත ගෘහ තුල වගාව (වැඩසටහන් 4ක්), අපනයන වෙළඳපල සඳහා පලතුරු සහ එළවළු (වැඩසටහන් 2ක්), අපනයන වෙළඳපල සඳහා පලතුරු සහ එළවළු කල්තබා ගැනීම, (වැඩසටහන් 7ක්), ගෙවතු වගාව තුලින් ආහාර සහ පෝෂණය, කෘත්‍රිම ඉදවීම සහ මේරීමේ දර්ශක, ආහාර ඇසුරුම් කිරීම (වැඩසටහන් 3ක්) සහ කණ්ඩායම් වැඩ, අපනයන මුලික කොට ගත් නිෂ්පාදන, පලතුරු වල පසු අස්වනු තාක්ෂණය, පලතුරු සහ එළවළු විජලනය (වැඩසටහන් 2ක්), ඉරිඟු නිෂ්පාදන, සෝයා, සහල් සහ මාෂ බෝග නිෂ්පාදන (වැඩසටහන් 10), SDF ව්‍යවසායකයන් (වැඩසටහන් 02)
- ශ්‍රී.ලං.පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා ගන්නොරුව ISTI හි පුහුණු - ගෙවතු වගාව තුලින් ආහාර සුරක්ෂිතාවය (වැඩසටහන් 2ක්)
- අනෙකුත් වැඩසටහන් - කෘෂිකර්ම සහ ගෘහ විද්‍යා ගුරුභවතුන් සඳහා; කටුගස්තොට කලාපය (ආහාර කල්තබා ගැනීම, ඇසුරුම් කිරීම සහ ලේබල් කිරීම) ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩල - ගොවීන් / මුරුතලාව (කොස් හා පලතුරු සැකසීම) කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, කටුබැද්ද (බිම්මල් නිෂ්පාදන), මහවැලි අධිකාරිය (ආහාර සැකැස්ම), විදාතා - පන්නල (ආහාර සැකැස්ම), ශ්‍රි ලංකා ගොවි සංවිධානය - දෙහිඅත්තකන්ඩිය හා මොණරාගල (ආහාර සැකසිම), කෘෂිකර්ම පීඨය - මහඉලුප්පල්ලම (ආහාර සැකසීම) රාහුල විද්‍යාලය - කටුගස්තොට (ආහාර සැකසීම), ශ්‍රී ලංකා ගුවන් හමුදාව - කටුනායක (බිම්මල්, තක්කාලි සහ කොළ එළවළු ආශ්‍රිත නිෂ්පාදන)
- අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය සඳහා බාහිර කථිකාචාර්යවරුන් සැපයීම.

## ශිෂ්‍ය පුහුණුව / පර්යේෂණ වැඩසටහන්

පසු අස්වනු තාක්ෂණය සහ ආහාර සැකසීම පිළිබඳ අවසන් වසර පර්යේෂණ / පුහුණු වැඩසටහන් සඳහා පහත දැක්වෙන ආයතනවල ශිෂ්‍යයන් වෙනුවෙන් ආහාර නිෂ්පාදන ඒකකය තම සහයෝගය දක්වන ලදී. රුහුණු විශ්ව විද්‍යාලය - ශිෂ්‍යයන් 02, පේරාදෙණිය විශ්ව විද්‍යාලය - 03, සබරගමුව විශ්ව විද්‍යාලය - 01, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය - 01, රජරට

විශ්ව විද්‍යාලය - 01, වයඹ විශ්ව විද්‍යාලය - 06, විවෘත විශ්ව විද්‍යාලය - 06, හාඩි (HARDI) - 11, කෘෂිකර්ම විද්‍යාලය - 02, DTC - 02, තාක්ෂණ විද්‍යාල - 04, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ විද්‍යාලය - 01.

## විදේශ පුහුණු

- එච්.ආර්.පී. ප්‍රනාන්දු, SDF ව්‍යාපෘතිය, පසු අස්වනු තාක්ෂණය, ඔක්තෝබර් 3 - 6 , භූතානය
- එස්.එම්.ඒ.සී.යූ. සේනාරත්න, AFACI ව්‍යාපෘතිය, වාර්ෂික ප්‍රගති රැස්වීම, ජුලි 18 -22 , බංගලාදේශය
- එස්.එම්.ඒ.සී.යූ. සේනාරත්න, 2017 ආසියාව, පසු අස්වනු සම්මේලනය, සැප්තැම්බර් 12 -15, දකුණු කොරියාව

## වැඩමුළු

- ව්‍යාපාර උපදේශන වැඩසටහන - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කරන ලදී.
- අපනයන වෙළඳපල සඳහා ආහාර සුරක්ෂිතතා මාර්ගෝපදේශනය - අපනයන සංවර්ධන මණ්ඩලය වෙතින් මෙහෙයවන ලද (වැඩසටහන් 2ක්)
- කොළඹ, වෝටර්ස් එජ්හිදී, ජාතික ආහාර සුරක්ෂිතතා රාමුව වැඩිදියුණු කිරීමේ වැඩසටහන
- කෘෂි ජෛව විවිධත්වය තිරසාර ලෙස භාවිත කිරීමෙන් වැඩිදියුණු කල නිෂ්පාදනය සහ වෙළඳපල නොවන ප්‍රතිලාභ - ඕක් රේ රිජන්සි හෝටලය, මහනුවර

## ප්‍රදර්ශන

- PGRC හි පැවැත්වුනු ලෝක ආහාර දින ප්‍රදර්ශන සඳහා ආහාර පර්යේෂණ ඒකකය සහභාගි විය. ම.ප/ ගිනිගත්හේන මධ්‍ය විද්‍යාලය, ම.ප/ම/ පේරාදෙණිය මධ්‍ය විද්‍යාලය, ම.ප/මැ/ මැණික්හින්න මධ්‍ය විද්‍යාලය., ම.ප./ම/ පුෂ්පදාන බාලිකා විද්‍යාලය, ම.ප./ම. බෙරවටස්/ අම්පිටිය, ආහාර ප්‍රදර්ශන වැඩසටහන් - බෝඹුවල, යාපනය, ‘තිරසාර යුගයක්’ ප්‍රදර්ශනය - NAICC.

## රසායනාගාර විශ්ලේෂණ සේවා

සමාලෝචිත වසර තුල පහත සඳහන් නිෂ්පාදන සම්බන්ධයෙන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුල පර්යේෂණ, ආහාර සැකසුම්කරුවන් සහ ගොවීන් සඳහා තත්ත්ව විශ්ලේෂණ සිදුකරන ලදී. එළවළු 128ක්, පලතුරු 46ක්, අල 30ක්, අගය එකතු කල නිෂ්පාදන 223ක් සඳහා වාර්තා නිකුත් කරන ලද අතර, ක්ෂුද්‍රජීවි විශ්ලේෂණ වාර්තාද 72ක් නිකුත් කරන ලදී.

## යටිතල පහසුකම් සංවර්ධනය

- ප්‍රධාන ගේට්ටුව සහ වැට ඉදිකිරීම
- රසායනාගාර 1හි වහලය අළුත් වැඩියා කිරීම
- වැසිකිළි 2 / නාන කාමර ඉදිකිරීම

## තාක්ෂණ ජනනය

- පිපිඤ්ඤාවල ගුණාත්මක තත්ත්වය සහ ගබඩා කාලය වැඩි කිරීම සඳහා කාබනික පොහොර භාවිතය.
- විසිරි වියලන තාක්ෂණය භාවිතයෙන් දූරියන් පවුඩර් නිෂ්පාදනය
- දූරියන් පවුඩර් භාවිතයෙන් වටිනාකම එකතුකල නිෂ්පාදන කිහිපයක් නිෂ්පාදනය කිරීම
- පලතුරු සහ එළවළු සඳහා රික්ත වියලන තාක්ෂණික පැකේජ
- කෙසෙල් ප්‍රේරිත ඉදවීම සඳහා ඒත්‍රල් පරිමාව අඩුකරන ලද මාත්‍රාව

## 2018 වසර සඳහා සැලැස්ම

### පර්යේෂණ වැඩසටහන් - 2017 - 2018

- පසු අස්වනු හානිය අවම කිරීම - අපනයන වෙළඳපල සඳහා TJC අඹවල ජීව්‍ය කාලය වැඩි කරනු වස් විවිධ වු 1 - MCP ප්‍රතිකර්ම
- භූ විද්‍යාත්මක සහ පාරිසරික තත්ත්වයනට අනුව මී පැණි සඳහා දර්ශකයක් හඳුනා ගැනීම.
- එළවළු හම් නිෂ්පාදනය සඳහා යෝග්‍ය වූ විජලන ක්‍රමයක් හඳුනා ගැනීම.
- සැපයුම් දාමය ඔස්සේ තෝරාගත් පලතුරු සහ එළවළු සම්බන්ධයෙන් පසු අස්වනු හානිය පිළිබඳ හඳුනාගැනීම සහ ඇගයීම
- කෑමට සුදුසු ලෙස පැපොල් වල ආලේපන ගැල්වීමෙන් එහි ගබඩා කාලය වැඩිදියුණු කිරීම
- එළවළු සඳහා රික්ත විජලන තාක්ෂණය වැඩිදියුණු කිරීම

### නිෂ්පාදන වර්ධනය

- විසිරි වියලන තාක්ෂණය මගින් නිෂ්පාදිත කටු අනෝදා පවුඩර් වල (*Annona muricata* සහ *Annona reticulata*) භෞතික ගුණාංග.
- අඩු වියදමෙන් අලිපේර තෙල් ලබා ගැනීම පිළිබඳ විමර්ශණය.
- ක්ෂුද්‍ර හරිත වල සුවිශේෂී පෝෂණ අංග විමර්ශනය කිරිම
- බේකරි නිෂ්පාදන සඳහා කෙසෙල් බඩය සහ ඉරිඟු පිටි යොදා ගැනීමේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම
- රික්ත වියලන තාක්ෂණය යොදා ගනිමින් පලතුරු ආශ්‍රිත සැකසූ ආහාර නිෂ්පාදනය කිරීම වැඩිදියුණු කිරීම (අඹ, කෙසෙල්, පැපොල්, අන්නාසි, කටු අනෝදා, කාමරංගා)
- ඌණ උපයෝජිත පලතුරු සඳහා සැකසූ ආහාර නිෂ්පාදනය වැඩිදියුණු කිරීම.

## කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 | 01 |
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) | 05 | 02 |
| කෘෂිකර්ම උපදේශක (විශේෂ) | 01 | - |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 04 | - |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 03 | - |
| සංවර්ධන නිලධාරි | 02 | 01 |
| කෘෂිකර්ම උපදේශක | 02 | 01 |
| පර්යේෂණ සහකාර | 04 | 03 |
| කළමනාකරණ සහකාර | 02 | 02 |
| රියදුරු | 02 | 01 |
| විදුලි ශිල්පී | 01 | 01 |

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| යන්ත්‍ර ක්‍රියාකාරු | 01 | 01 |
| පර්යේෂණ උප සහකාර | 02 | 02 |
| මුරකරු | 02 | 02 |
| කම්කරු (ස්ථිර) | 11 | 07 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 03 | 03 |
| **එකතුව** | **36** | **27** |

## 1.2.2. ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල

මුහුදු මට්ටමේ සිට මීටර් 1400ක් ඉහළින්, උඩරට අතරමැදි කලාපයේ පිහිටා ඇති බණ්ඩාරවෙල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය ඌව පළාතේ සහ සබරගමුව පළාතේ බලංගොඩ කලාපයේ වගා කරන කෘෂිකාර්මික බෝගවල අස්වැන්න සහ ගුණාත්මය ඉහළ නැංවීම අරමුණු කරගත් කෘෂිකාර්මික තාක්ෂණ ක්‍රම බිහි කිරීමේ වගකීම දරන ප්‍රධාන ආයතනයයි. $IU_2$, $IM_2$, $IM_3$, $WM_3$, සහ $IL_2$ $WM_3$ යන කෘෂි පාරිසරික කලාප මෙම ආයතනය මගින් ආවරණය කෙරේ. මෙය උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය යටතේ ක්‍රියාත්මක වන අතර එහි උප පර්යේෂණ ස්ථානයක් රහංගල පිහිටුවා ඇත. පර්යේෂණ කටයුතු වලට අමතරව අර්තාපල්, පලතුරු සහ මල් වගාව සඳහා අවශ්‍ය ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම ඇතුළු තාක්ෂණය ප්‍රචාරණය කිරීමේ කටයුතු සහ කෘෂිකාර්මික සංවර්ධන කටයුතු මෙම මධ්‍යස්ථානය මගින් සිදු කරනු ලබයි.

### අයවැය

**වගු අංක 1.2.2.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| **ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල** | | | |
| පුනරාවර්තන | 3,839,615 | 3,491,122 | 91 |
| මූලධන | 2,985,000 | 2,625,077 | 88 |
| ව්‍යාපෘති | | | |
| • NARP බෝංචි | 274,000 | 272,398 | 99 |
| • NARP ජර්බෙරා | 311,500 | 292,422 | 94 |
| • NARP බෙල් පෙපර් | 230,200 | 219,056 | 95 |
| • තෝරාගත් පලතුරු (ස්ට්‍රෝබෙරි) සම්බන්ධයෙන් නිෂ්පාදනය හා වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික මැදිහත්වීම | 200,000 | 199,538 | 100 |
| • $F_1$ දෙමුහුම් වම්බටු | 80,000 | 79,885 | 100 |
| • $F_1$ දෙමුහුම් තක්කාලි | 80,000 | 79,935 | 100 |
| • NARP තක්කාලි | 292,600 | 266,690 | 91 |
| • NARP පැඟිරි | 200,000 | 199,923 | 100 |
| • තෝරාගත් එළවළු සම්බන්ධයෙන් නිෂ්පාදන හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික මැදිහත්වීම | 220,000 | 215,978 | 98 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| • ANSOFT | 150,000 | 141,890 | 95 |
| • පාංශු පරීක්ෂණ | 200,000 | 174,424 | 87 |
| **එකතුව** | **9,062,915** | **8,258,338** | **91** |
| **කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - රහංගල** | | | |
| පුනරාවර්තන | 842,965 | 720,098 | 85 |
| මූලධන | 1,318,270 | 714,543 | 54 |
| ව්‍යාපෘති | | | |
| • තෝරාගත් පලතුරු බෝගවල (පැඟිරි) නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික මැදිහත් වීම | 200,000 | 198,427 | 99 |
| • ඉහල අස්වනු සහිත පැඟිරි ප්‍රභේද වැඩිදියුණු කිරීම (NARP) | 200,000 | 195,157 | 98 |
| • $F_1$ දෙමුහුම් ව්‍යාපෘතිය | 200,000 | 199,156 | 100 |
| **එකතුව** | **2,761,235** | **2,027,381** | **73** |
| **මුළු එකතුව** | **11,824,150** | **10,285,719** | **87** |

## ප්‍රගතිය

### බෝග වැඩි දියුණු කිරීම

- තක්කාලි ප්‍රභේද සහ දර්ශ 150ක් අතුරින්, නියඟයට ඔරොත්තු දෙන වර්ග පිළිබඳ නලස්ථ තත්ත්ව යටතේ, තක්කාලි දර්ශ හැට පහක් ඇගයීම් කරන ලදී.

- තක්කාලි දර්ශ සහ ප්‍රභේද 150ක් අතුරින් තක්කාලි වර්ග 30ක් වැඩි උෂ්ණත්වයට ඔරොත්තු දීම සම්බන්ධයෙන් ඇගයීම සිදු කරන ලද අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තක්කාලි ප්‍රභේද වන 'ලංකා චෙරි' එහි සෑම වර්ධක අවධිවලදීද, 'රවි' එහි මූලික වර්ධන අවධියේදීද, 'භාතිය' මල් පිපෙන අවධියේද ඉහල උෂ්ණත්වයට ($40^0$) ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කරන ලදී.

- ප්‍රේරිත විකෘතිකරණය කරන ලද 'කටුගස්තොට බැක්ටීරියානු හිටු මැරීමට' ප්‍රතිරෝධී තක්කාලි ප්‍රභේදය සඳහා ප්‍රශස්ත ගැමා කිරණ මාත්‍රාව 398 Gy විය.

- බෝංචි මලකඩ රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේද නිපදවීම සඳහා බෝංචි පෙළවල් 159ක් පරීක්ෂණයට ලක්කරන ලදී. තවද දෙමුහුම් කිරීම මගින් නව පෙළවල් 14ක් නිපදවන ලද අතර, එම පෙළවල් නැවත මව් දර්ශ සමග මුහුම් කරන ලදී.

- කෙටි කාලීන ප්‍රභේද වැඩිදියුණු කිරීම සඳහා $F_2$ පරම්පරාවේ බෝංචි පෙළවල් 15ක් අගයන ලද අතර, $F_3$ පරම්පරාව දක්වා උසස් කරන ලදී.

- බෝංචි මූලික අස්වනු අත්හදාබැලීම්, බෝංචි පෙළවල් 12ක් යොදාගනිමින් ආරම්භ කරන ලදී.

- බෝංචි පෙළවල් 3ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂණ සඳහාද 2ක් ප්‍රභේද අනුවර්තිතා

පරීක්ෂණ සඳහාද නම්කරන ලද අතර එක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂණයක් අවසන් කරන ලදී.

- *Fusarium* මුල් කුණුවීමට ප්‍රතිරෝධිතාව දැක්වීමේ ප්‍රභේදයක් වැඩිදියුණු කිරීම සඳහා බෝංචි පෙළවල් 10ක් ($F_2$ පරම්පරාව) තෝරා ගන්නා ලද අතර, එම පෙළවල් $F_3$ පරම්පරාව දක්වා උසස් කරන ලදී.

- දෙමුහුම් වම්බටු ප්‍රභේද නිෂ්පාදනය කිරීම සඳහා වම්බටු දර්ශ 7ක් ස්වයං පරාගනය කරන ලද අතර සහජාත පෙළවල් නිෂ්පාදනය කිරීම ආරම්භ ලදී.

## ශෂ්‍ය විද්‍යාව

- මැටි බෝල (Hydrocorns), කොහුබත්, අඩක් පිළිස්සුනු දහයියා මාධ්‍යයේ (1:2:2) අර්තාපල් බීජ වැඩීම පස්ගුණයකින් සිදුවන බව නිරීක්ෂණය කරන ලදී.

- $G_1$ අර්තාපල් බීජ නිෂ්පාදනය කිරීම සඳහා, කොම්පෝස්ට් සහ පාංශු (1:1) පුරවන ලද අර්තාපල් කණුවක් (tower) හඳුන්වාදෙන ලදී.

- රෙඩ් ලා සෝඩා, කැලි වයිට්, ෆලුකා සහ ආනෝවා වැනි වාණිජ ප්‍රභේද මන්නාරම ප්‍රදේශය සඳහා නිර්දේශ කල හැකි අතර, යාපනය සඳහා ෆලුකා, ලැපලා, ආනෝවා නිර්දේශ කල හැක. කැල්වයිට්, ෆලුකා සහ ආනෝවා ඉතා පහසුවෙන් වෙනස් වන දේශගුණික තත්ත්ව අනුව අනුවර්තනය වන බැවින්, කාලගුණික විපර්යාසවලින් සිදුවන බලපෑම අවම කිරීම සඳහා, අර්තාපල් වගාකරන ප්‍රදේශ සඳහා නිර්දේශ කල හැක.

- සලාද පැළ ක්ෂේත්‍රයේ සිටුවා සති 2ක්, 4කට පසු පත්‍ර මත වියලි යීස්ට් (5 ග්‍රෑ/ලී) ඉසීම මගින් එහි අස්වැන්න 30%ක් වර්ධනය කල හැක.

- බදුල්ල දිස්ත්‍රික්කයේ ආරක්ෂිත කෘෂිකර්මාන්තයේ තත්ත්වය පිළිබඳ සිදුකරන ලද විමර්ශනයකදී අනාවරණය වුයේ ගොවීන් 61.24% දෙනෙකු ආරක්ෂිත ගෘහ වර්ග අඩි 750ක පමණ අවකාශයකට හිමිකම් කියන බවයි. හඳුනාගත් පුමුඛ බාධාවන් වුයේ අලෙවි කිරීමේ ගැටළු සහ ආරක්ෂිත කෘෂිකර්මාන්තය පිළිබඳ පවතින අඩු දැනුමයි.

- ලංකා කැරට් ප්‍රභේදයේ වර්ණය තීව්‍ර කිරීම සඳහා, කුකුල් පොහොර සහ කහ පැහැති පොලිතීන් භාවිතා කල හැක.

## පාංශු විද්‍යාව

- බීජ පැළවන අවධියේදී බීජ දමන වලක් සඳහා පොස්පරස් කැට 3ක් යෙදීම මඟින්, තක්කාලි සහ ගෝවා අස්වැන්නට බලපෑමක් නොවන අයුරින් පොස්පරස් පොහොර යෙදීම අවම කළ හැකි බව මූලික පරීක්ෂණවලදී අනාවරණය විය.

## උද්‍යාන බෝග වගාව

- සාර්ථක ස්ට්‍රෝබෙරි දර්ශ 12ක් ආරක්ෂිත ගෘහ තුල අගයන ලදී.

- pH අගය 5.8ක් වන, පූර්ණ ප්‍රබලත්වයෙන් යුත් MS මාධ්‍ය සහ අර්ධ ප්‍රබලත්වයෙන් යුත් MS මාධ්‍ය යොදා ගනිමින් පටක රෝපණයෙන් නිපදවා ගත් පැළ ඇගයීමට ලක් කරන ලදී.

- කිවි පලතුරු දර්ශ 6ක් තෝරා ගන්නා ලද අතර, ආරක්ෂිත ගෘහ තුල අගයන ලදී.

## ශාක ව්‍යාධිවේදය

- කහගොල්ල හා දෙහිවින්න ප්‍රදේශවල අර්තාපල් පශ්චිම අංගමාරයේ රෝග ලක්ෂණ වගාවේ මුලින්ම පෙන්වූයේ පසුගිය දින 10යේ වර්ෂාපතනයේ එකතුව මි.මී. ≥ 30 හා එම කාලයේ පසුගිය දින 5 ක උෂ්ණත්වයේ සාමාන්‍ය අගය සෙ. 25.5ට අඩු විට දී වන අතර කෝමාරිකාගොඩ ප්‍රදේශයේ අර්තාපල් පශ්චිම අංගමාරයේ රෝග ලක්ෂණ වගාවේ මුලින්ම පෙන්වූයේ පසුගිය දින 5ක ආර්ද්‍රතාවයේ සාමාන්‍ය 79%ට වැඩි විට හා පසුගිය දින 5ක උෂ්ණත්වයේ සාමාන්‍ය අගය සෙ. 12ට වැඩි විට දීය. මෙම කාලගුණ දත්ත භාවිතයෙන් එම ප්‍රදේශවල අර්තාපල් පශ්චිම අංගමාරයේ රෝගය ඇතිවීම පුරෝකථනය කල හැක.

- බෝංචි මලකඩ රෝගය සහ කෝණාකාර පත්‍ර ලප රෝග අඩු කිරීම සඳහා මායිම් බෝගයක් ලෙස හෝ සෑම බෝංචි තීරු 8ක් සඳහාම අභ්‍යන්තර පෙළක් ලෙස බඩ ඉරිඟු අක්වක් ආකාරයෙන් සිටුවීම සිදුකල හැක.

- අඩක් පිළිස්සූ දහයියා බීජ සිටුවන වලට මිශ්‍ර කර බීජ සිටුවා, සති 2කින් පසුව සෑම දින 7කට වරක්ම මල් පිපීම හා කරල් ඇතිවන මුල් අවස්ථාව වන තෙක් Thiophante Methyl 70% WP බෝංචි වැලේ මුලට යෙදීමෙන් බෝංචි මුල් කුණුවීම පාලනය විය.

- ජර්බෙරා වගා ප්‍රභේද 8ක් ස්වභාවික ආසාදන තත්ත්ව යටතේ පිටිපුස් රෝගය කෙරෙහි ප්‍රතිශක්තිකරණයක් දැක්විය.

- බෝංචි දර්ශ 100ක් බෝංචි මලකඩ රෝගයට දක්වන ප්‍රතිචාර සම්බන්ධයෙන් පරීක්ෂාවට භාජනය කල අතර (*Uromyces appendiculatus* Pers.) කිසිදු ප්‍රතිරෝධී දර්ශයක් හඳුනාගනු ලැබුවේ නැත.

- බෝංචි වල මලකඩ රෝගය, කෝණාකාර පත්‍ර ලප රෝගය සහ ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය කිරීම සඳහා Tebuconazole 25% WG (3.5 ග්‍රෑ /10 ලී) Triforine 190 ග්‍රෑ/ලී DC (15 මි/ලි / 10 ලි) නිර්දේශ කරන ලදී.

- තක්කාලි බෝගයේ පූර්ව අංගමාරය පාලනය කිරීම සඳහා Chlorothalonil 720 SC (20 මි.ලි / 10 ලි) Mancozeb 75% WG (20 ග්‍රෑ/ 10 ලී) නිර්දේශ කරන ලදී.

## කීට විද්‍යාව

- තක්කාලි බෝගයේ පත්‍ර කනින්නාගේ (*Tuta absoluta*) සුහුඹුල් සළඹයා (දිනකට සාමාන්‍ය වශයෙන් එක් උගුලකට සුහුඹුල් සතුන් 250ක් පමණ) හසුකර ගැනීම සඳහා CFL බල්බ (වො.8) යෙදූ විශේෂිත ආලෝක උගුල ඵලදායී විය.

- Abamectin 18 ග්‍රෑ/ ලි EC (මි.ලි 6 / ලි. 10) Emamectin benzoate 5% SG (ග්‍රෑ 4 /ලි. 10) Spinetoram 25% WG (ග්‍රෑ. 2.5/ ලි.10) Indoxacarb 150 ග්‍රෑ/ලි EC (මි.ලි. 4/ ලි.10) අනුපාත *Tuta absoluta* කීට අවධියේදී හරිතාගාර තුල ඵලදායි ලෙස පාලනය කරන ලදී.

- ජලරෝපිත ලෙස වගාකල අර්තාපල් වල සුදුමැස්සා (*Bemisia tabaci*) සඳහා, රසායනාගාර තුල කොහොඹ මුලික කොටගත් කෘමිනාශක අගයන ලද අතර Azadirachtin F 5.0% සඳහා වඩාත් ඵලදායි මාත්‍රාව ලෙස මි.ලි 8 /ලි 10 හඳුනා ගනු ලැබීය.

- ජලරෝපිත පද්ධතියේදී, Azadirachtin F 5.0% (මි.ලි. 8/ ලි.10)

සුදු මැස්සා ඉතා හොඳින් පාලනය කරන ලදී.

- ගෝවා පත්‍ර කනින දළඹුවන්ගෙන් සිදුවන හානිය අවම කිරිම සඳහා සෝඩියම් සිලිකේට් පත්‍ර වලට ඉසීම හෝ බීජ පැළ ප්‍රතිකාර කිරීම හෝ පාංශු ප්‍රතිකාර කිරීම මගින් සිදු කල හැක.

## මල් වගාව

- දේශීය ජර්බෙරා ප්‍රභේද නිපදවීම සඳහා, $F_1$ ගහනයේ ජර්බෙරා දර්ශ 20ක් අගයන ලදී.
- කපුරු වගාව සඳහා මතුපිට පස්, වැලි, මදක් පුළුස්සන ලද දහයියා, ගොම (4:2:2:1) අනුපාතයට සකස් කල මාධ්‍ය වඩාත් යෝග්‍ය විය.
- බේබි රෝස වර්ධක ප්‍රචාරණය සඳහා මතුපිට පස්, මදක් පුළුස්සන ලද දහයියා සහ කොම්පෝස්ට් (8:2:1) අනුපාතයෙන් යොදා ගත් මාධ්‍ය වඩාත් යෝග්‍යතම මාධ්‍ය බව හඳුනා ගනු ලැබිය.

## පටක රෝපණය

- ‘ලිලි’ බල්බ හටගැනීම උත්තේජනය සඳහා අඩු වියදම් ජෛව ක්‍රියාකාරි පද්ධතියක් හඳුනා ගනු ලැබිය.

## බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

- ක්ෂුද්‍ර ප්‍රචාරණයෙන් ග්‍රැනෝලා බීජ අර්තාපල් (2940), ස්ට්‍රෝබෙරි (30), ජර්බෙරා (90) සහ බේබිස් බ්‍රෙත් (25), සහතික කල නාරං බද්ධ පැළ (6377), පැණි දොඩම් (892), පෙයාස් බද්ධ පැළ (212) ක් නිපදවනු ලැබිය.
- රහංගල ARS හිදි ලංකා බටර් ප්‍රභේදයේ DOA - SCS සහතික කල අභිජනන බීජ කි.ග්‍රෑ. 50ක් නිෂ්පාදනය කරනු ලැබිය.
- රහංගල ARS හිදි ආරෝග්‍යා (508), බිබිලේ ස්වීට් (194), සිසිල (236), රහංගල මැන්ඩරින් (682), එහිමි - 1 (446), එහිමි - 11 (208), එහිමි - 111 (210), පෙයාර්ස් (3100), පීච් (35), ජෙර (572), පැෂන් ෆෲට් (80), මැකඩමියා (80), ස්ට්‍රෝබෙරි (420), දෙළුම් (42), මිදි (76) යන බෝගවල සහතික කල පැළ නිෂ්පාදනය කරන ලදී.

## විශ්ලේෂණ සේවා

- පාංශු පරීක්ෂා කර පොහොර නිර්දේශයන් ගොවීන් 1200ක් සඳහා ලබා දෙන ලදී.

# 2018 වසර සඳහා සැලැස්ම

## පැළෑටි අභිජනනය

- ඉහළ අස්වනු සහිත ගුණාත්මක තත්ත්වයේ උසස් ප්‍රභේද සංවර්ධනය කිරීම.
- කාලගුණ තත්ත්වයනට ඔරොත්තු දෙන එළවළු ප්‍රභේද වැඩිදියුණු කිරීම.

## ශෂ්‍ය විද්‍යාව

- අර්තාපල් බල්බ අස්වැන්න වැඩි කිරීම සඳහා ජල රෝපණය සම්බන්ධයෙන් විවිධාකාර වූ වාතන ක්‍රම ඇගයීම.
- ගොවි ක්ෂේත්‍ර වල $G_1$ බීජ නිෂ්පාදනය සම්බන්ධයෙන් අර්තාපල් කුළුණු ක්‍රමවේදය ඇගයීම.
- බෝංචි, තක්කාලි, කැරට් සහ සලාද පිපිඤ්ඤා සඳහා යෝග්‍ය වූ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම වැඩිදියුණු කිරීම.
- තක්කාලි සඳහා සුදුසු ජල සංරක්ෂණ ක්‍රම හඳුනාගැනීම

## පාංශු විද්‍යාව

- එළවළුවල පොස්පරස් භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීම.

- දීර්ඝ කාලීනව ගෝවා සඳහා ක්ෂුද්‍ර පෝෂක භාවිත කිරීම මඟින් වගාවට හා පසේ ඇතිවන වෙනස්කම් පිළිබඳ ඇගයීම.

- බෝංචි, ගෝවා සහ අර්තාපල් සඳහා භූමියට සුවිශේෂී වූ පොහොර නිර්දේශ වැඩිදියුණු කිරීම සඳහා පාංශු වල N,P,K මට්ටම් ක්‍රමාංකනය කිරීම.

## උද්‍යාන බෝග වගාව

- අවම ශීත අවශ්‍යතාව නොමැතිව ඉහල අස්වනු ලබා දෙන ස්ට්‍රෝබෙරි සහ ඇපල් ප්‍රභේද වැඩිදියුණු කිරීම.

## ව්‍යාධිවේදය

- බණ්ඩාරවෙල ප්‍රදේශයේ *Fusarium* දිලීරය හේතුවෙන් ඇතිවන බෝංචි කහවීමේ රෝගය පැතිරීම පිළිබඳ සමීක්ෂණය.

- බෝංචි මුල් කුණුවීමේ රෝගයේ පැතිරීම සමග පාංශු භෞතික සහ රසායනික ලක්ෂණ අතර සහ සම්බන්ධය ඇගයීම.

- ගෝවා කළු කුණුවීම වැළැක්වීම සඳහා සැලිසිලික් ඇසිඩ් ප්‍රේරිත ප්‍රතිරෝධය ඇතිකිරීම පිළිබඳ ඇගයීම.

## කීට විද්‍යාව

- එළවළු සඳහා පරිසර හිතකාමී, පිරිමැසුම්දායක කෘමි කළමනාකරණ විකල්පයන් වැඩිදියුණු කිරීම. බෝංචි සහ ගෝවාවල කෘමි පළිබෝධයන් වෙත ප්‍රතිරෝධක ප්‍රේරණය කිරීමේදී සෝඩියම් සිලිකේට්වල බලපෑම (පසුගිය වසරේ සිට අඛණ්ඩව සිදුවූ අත්හදා බැලීම්)

- උඩරට අන්තර් කලාපය තුල වවනු ලබන එළවළු වල කෘමින් සහ මයිටාවන්ට එරෙහිව නව කෘමිනාශකවල සාඵල්‍යතාව ඇගයීම.

## වෙනත් තොරතුරු

### නිකුත් කරන ලද ප්‍රභේද

- බෝංචි PB 161 ප්‍රභේදය 2017 වසරේ VRCහි කොන්දේසි සහිතව නිකුත් කරන ලදී.

- පැෂන් ෆෲට් BWPF 1401, උඩරට අන්තර් කලාපයේ සහ තෙත් කලාපය සඳහා 'බණ්ඩාරවෙල දම්' ලෙස නිකුත් කරන ලදී.

- එළවළු, පලතුරු, මල් සහ අර්තාපල් වගාවේ යෙදෙන ගොවීන් 107ක් සඳහා පළිබෝධ සහ රෝග කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබාදෙන ලදී.

### තාක්ෂණ ව්‍යාප්තිය

- විවිධ කාණ්ඩ වල පුද්ගලයන් 976ක් සඳහා (ගොවීන්, විශ්ව විද්‍යාල සිසුන්, පාසැල් ළමුන් වෙනත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්) විවධ කෘෂි ක්‍රියාකාරකම් පිළිබඳ වූ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

### ප්‍රදර්ශන/ ක්ෂේත්‍ර වැඩසටහන්

- පර්යේෂකයන්, ව්‍යාප්ති නිලධාරීන් සහ ගොවීන්ගේ සහභාගීත්වයෙන් වූ "අර්තාපල් බීජ නිෂ්පාදනය කිරීමේ ක්‍රමවේද" පිළිබඳ ක්ෂේත්‍ර දිනයක් බණ්ඩාරවෙල RARDC හිදී පැවැත්විණ.

### පුහුණු

- චීනයේ පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කෘෂි ජෛවතාක්ෂණය භාවිතා කිරීම

සම්බන්ධයෙන් වූ සම්මන්ත්‍රණය සඳහා ඒ.ජේ. සමන්ති මිය සහභාගී විය.

- චීනයේ පැවති, සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වූ බෝග පළිබෝධක සහ රෝග ජෛව පාලනය මැයෙන් වූ පුහුණු පාඨමාලාව සඳහා ජී.ඒ.ආර්. සෝමසිරි සහභාගී විය.
- ඩබ්.එම්.එස්. ගුණසේකර - දකුණු ආසියානු සහ අග්නිදිග ආසියානු රටවල ප්‍රධාන බෝගයන්ගේ රෝග සහ කෘමි පළිබෝධකයන් වැලැක්වීම සහ පාලනය කිරීම සඳහා සාමෝධානික තාක්ෂණය පිළිබඳ වූ වැඩමුළුව - චීනය
- එස්.එම්.යූ.අයි. සමරවීර - සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වූ අර්තාපල් වගාව සහ ව්‍යාප්ති තාක්ෂණය පිළිබඳ පුහුණුව - චීනය
- එම්.ඩී.ඩී. කොස්තා - සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා JANCAO කර්මාන්තය පිළිබඳ වූ වැඩමුළුව - චීනය

## කාර්ය මණ්ඩලය

**ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල**

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 12 | 10 |
| පරිපාලන නිලධාරි | 01 | 01 |
| කෘෂිකර්ම උපදේශක (අධි ශ්‍රේණිය) | 01 | - |
| පර්යේෂණ සහකාර (අධි ශ්‍රේණිය) | 01 | 01 |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 01 | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 | - |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 09 | 07 |
| සංවර්ධන නිලධාරි | 02 | 02 |
| කෘෂිකර්ම උපදේශක | 05 | 06 |
| පර්යේෂණ සහකාර | 10 | 10 |
| ඉංජිනේරු සහකාර | 01 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 08 | 11 |
| තාක්ෂණ සහායක (ඉංජිනේරු) | 01 | - |
| තාක්ෂණික සහායක (ව්‍යාප්ති) | 01 | 01 |
| ගොවිපළ ලිපිකරු | 01 | 01 |
| රියදුරු | 05 | 04 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 01 |
| ගබඩා භාරකරු | 01 | 01 |
| තාක්ෂණ ශිල්පී | 01 | 01 |
| වඩුකරු | 01 | 01 |

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| පෙදරේරු | 01 | 01 |
| විදුලි ශිල්පි | 01 | - |
| කාර්මික ශිල්පි | 02 | 01 |
| පර්යේෂණ උප සහකාර | 03 | 02 |
| බද්ධකරු | 02 | 01 |
| සංචාරක බංගලා භාරකරු | 01 | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 | 02 |
| මුරකරු | 10 | 07 |
| කම්කරු (ස්ථිර) | 75 | 63 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 08 | - |
| **එකතුව** | **170** | **138** |

**කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, රහංගල**

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 03 | 01 |
| කෘෂිකර්ම උපදේශක | 03 | 02 |
| පර්යේෂණ සහකාර | 03 | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | 02 |
| තාක්ෂණ සහායක (පර්යේෂණ) | 02 | 01 |
| ගොවිපළ ලිපිකරු | 01 | 01 |
| රියදුරු | 01 | 01 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 01 |
| පර්යේෂණ උප සහකාර | 01 | 01 |
| බද්ධකරු | 02 | 02 |
| මුරකරු | 05 | 05 |
| කම්කරු (ස්ථිර) | 40 | 21 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 03 | 03 |
| **එකතුව** | **67** | **42** |

# 1.2.3. ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර

මාකඳුර ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය යටතේ පාලනය වෙමින්, ප්‍රධාන වශයෙන් ගම්පහ, කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වල කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතා ඉටු කරණු ලබයි. තබ්බෝව සහ වාරියපොළ පිහිටා තිබෙන උපයෝගිතා පර්යේෂණ ඒකක හා කල්පිටියේ පිහිටි කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය සම්බන්ධ කරගනිමින් විවිධ පාරිසරික සාධක සඳහා නිශ්චිත වූ පර්යේෂණ සිදුකරනු ලබයි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික ප්‍රමුඛතා ඉෂ්ඨ කරමින්, ප්‍රාදේශීය වශයෙන් සුවිශේෂී වූ අවශ්‍යතා සම්බන්ධයෙන්ද කටයුතු කරයි. මෙම මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙනත් ආයතන හා මධ්‍යස්ථාන මෙන්ම පරිබාහිර ආයතන සමඟද සබඳතා පවත්වා ගනිමින් කටයුතු කරනු ලබයි.

මෙහි පර්යේෂණ සහ සංවර්ධන කටයුතු තුළින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනුයේ පොල් ඉඩම්වල බෝග ඵලදායිතාව රැක ගැනීම පිණිස පොල් වගාව යටතේ අතුරු බෝග වගා සඳහා තාක්ෂණයන් බිහිකර ඒකාබද්ධ කිරීම කෙරෙහිය. එළවළු, ආකන්ද බෝග, බිම්මල්, මල් වගාව මෙන්ම පලතුරු සඳහා පර්යේෂණ සිදුකරමින් තාක්ෂණයන් බිහි කිරීම සිදු කරයි.

## අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 1.2.3.1 හි දැක්වේ.

**වගු අංක 1.2.3.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| **ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, මාකඳුර** | | | |
| පුනරාවර්තන | 5,532,097 | 4,294,809 | 78 |
| මූලධන | 3,373,000 | 2,956,709 | 88 |
| ව්‍යාපෘති | | | |
| • නිවැරදි පොහොර කළමනාකරණ පැකේජයක් බිහිකිරීම | 2,676,000 | 2,455,618 | 92 |
| • වම්බටුවල රිකිලි සහ ගෙඩි විදින්නා පාලනය කිරීම සඳහා කීට ව්‍යාධිජනක දිලීර භාවිතය | 272,900 | 268,793 | 98 |
| • දෙමුහුම් ප්‍රභේද සහ විවෘත පරාගන ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන | 1,730,000 | 1,726,199 | 100 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| • කහ විචිත්‍ර වෛරස් රෝගයට ප්‍රතිරෝධි / ඔරොත්තු දෙන බණ්ඩක්කා අභිජනන පෙළවල් වැඩිදියුණු කිරීම | 606,800 | 576,220 | 95 |
| • බතල සහ මඤ්ඤොක්කා සඳහා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය | 400,000 | 367,062 | 92 |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ තෝරාගත් එළවළු බෝගවල නිෂ්පාදනය සහ ඵලදායිතාවය වැඩිකිරීම සඳහා තාක්ෂණික මැදිගත්වීම | 100,000 | 59,976 | 60 |
| **එකතුව** | **14,590,797** | **12,645,408** | **87** |
| **උපයෝගීතා පර්යේෂණ ස්ථානය, කල්පිටිය** | | | |
| පුනරාවර්තන | 589,575 | 555,284 | 94 |
| මූලධන | 1,342,000 | 109,592 | 8 |
| ව්‍යාපෘති | | | |
| • පලතුරු ගම්මාන සංවර්ධනය වැඩසටහන | 500,000 | 312,972 | 62 |
| **එකතුව** | **27,431,575** | **977,848** | **40** |

## ප්‍රගතිය

### පර්යේෂණ

### එළවළු අභිජනනය

- සුපිරිසිදු කරන ලද විලච්චි පෙළ (MK ස්පන්චි) ස්ථාන 9ක් තුළ NCVT හි සිදුකරන ලදී.
- 90%ක සුපිරිසිදු මට්ටමක් පවත්වා ගනිමින් MK ස්පන්චි වට්ටක්කා බීජ ග්‍රෑ. 500ක් ගුණනය කිරීම සිදුකරන ලදී.
- වට්ටක්කා වගාව සඳහා සුදුසු වගා පරතරය හඳුනා ගැනීමේ අරමුණින් පර්යේෂණ සිදුකරන ලදී.

### පුහුල්

- ප්‍රමුඛ පෙළ පුහුල් ප්‍රජනිතය (*Benincasa hispida*) අපේක්ෂිත ලක්ෂණ සහිතව 90%ක මට්ටම දක්වා පාරිශුද්ධ කරන ලදී. 6වන පරම්පරාව දක්වා වැඩිදියුණු කළ ප්‍රජනිතය ගොවි ක්ෂේත්‍ර වලදී පරීක්ෂණයට භාජනය කරන ලදී. දිග සහ මහත අනුපාතය අඩු, බැරල් හැඩයෙන් යුක්ත වූ කි.ග්‍රෑ. 10යට වඩා වැඩි බරකින් යුත් පුහුල් අස්වැන්න මුළු අස්වැන්නෙන් 60%කට වඩා අගයක් ගත්තේය. 2017/18 මහ කන්නයේදී, ඉහත කී විශාලත්වයකින් යුත් පුහුල් සහ ගොවි බිම් වගා දර්ශයක බීජ, වයඹ පළාතේ එම වගාව සිදු කරන සියළු පළාත් ආවරණය කරමින් ගොවින් 20 දෙනෙකු අතර බෙදා හරින ලදී.

## මාළු මිරිස්

- බුල්නෝස් මාළු මිරිස් ප්‍රභේදයේ ජානමය වැඩිදියුණු කිරීමේදී එම ගහනය 6වන පරම්පරාව දක්වා උසස් කරන ලදී. තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී කරලේ වර්ණය, හැඩය, අග්‍රස්ථයේ ලක්ෂණ සැලකිල්ලට ගනු ලැබීය.

## නයි මිරිස්

- නයි මිරිස් ගහනය 6 සහ 7 වන පරම්පරාව දක්වා උසස් කරන ලදී.

- මෙම ගහනයේ වෛරස් ප්‍රතිරෝධතාවය පරීක්ෂා කිරීමේදී ඇඩි උෂ්ණත්වයකින් යුතු වූ දේශගුණය හා කෘෂිරසායන නොයෙදීම මනා පිටුවහලක් විය. සාර්ථක ලක්ෂණ වලින් යුතු ප්‍රජනිත 5ක් තෝරා ගනු ලැබූ අතර එය තවදුරටත් සුපිරිසිදු කරන ලදී.

## සීනි කැකිරි

- ගොවි ක්ෂේත්‍ර වලින් ජානප්ලාස්ම එක්රැස් කරගන්නා ලදී.

## වැටකොළු

- ඉහල උෂ්ණත්ව තත්ත්වයන්ට ඔරොත්තු දෙමින් ඉහළ ඵලදාවක් ලබා දෙන පෙළවල් 10ක් තෝරා ගන්නා ලද අතර, ඒවා $F_2$ පරම්පරාව දක්වා උසස් කරන ලදී. $F_3$ ගහණයෙන් පෙළවල් 30ක් තෝරා ගන්නා ලද අතර වරණය මගින් පෙළවල් 6ක් $F_4$ පරම්පරාව දක්වා උසස් කරන ලදී. පෙළවල් 2ක් $F_2$ පරම්පරාව දක්වා උසස් කරන ලද අතර, එහි සහාභිජනන පාතනය හේතුවෙන් වර්ධන ශක්තිය සහ අස්වැන්න සුවිශේෂී ලෙස පහළ මට්ටමක පවතින බව අනාවරණය විය. පෙළවල් 8ක් $F_2$ පරම්පරාව දක්වා ද, පෙළවල් 6ක් $F_3$ පරම්පරාව දක්වා ද උසස් කරන ලදී. වරණය සහ ස්වපරාගනය සිදුකරමින්, නුමුහුම් පෙළවල් බිහිකිරීම සඳහා බීජ නිෂ්පාදනය කරන ලදී.

- විදේශීය වැටකොළු 4ක් අගයන ලදී. (නො. 114, LF 3501, LF 3521, LF 3522)

## බණ්ඩක්කා

- පෙළවල් 15ක් $F_2$ පරම්පරාව දක්වා වැඩිදියුණු කරන ලද අතර $F_2$ දක්වා පරම්පරාව උසස් කිරීම සඳහා පෙළවල් 3ක් වගා කරන ලදී. අභිජනන පෙළවල් 37ක් $F_4$ පරම්පරාව දක්වා වැඩිදියුණු ලදී. $F_3$ පරම්පරාව දක්වා වැඩිදියුණු කිරීම සඳහා පෙළවල් 25ක් ක්ෂේත්‍රයේ සිටුවන ලද අතර පූර්ව මුහුන් 12ක් සිදු කරන ලදී.

- කල්පිටිය ARS හිදී බණ්ඩක්කා පෙළවල් 133ක් පරීක්ෂාවට භාජනය කරන ලදී. කහ නාරටි විචිත්‍ර වෛරස් රෝගයට ක්ෂේත්‍ර ප්‍රතිරෝධී වූ (YVMV) විදේශීය ආර 2ක් සහ YVMV රෝගයට මැදහත් මට්ටමෙන් ප්‍රතිරෝධී වූ දේශීය වගා දර්ශ 4ක් ද හඳුනාගනු ලැබිණ.

- විදේශීය දෙමුහුම් බණ්ඩක්කා ප්‍රභේද අගයන ලදී.

## බෝංචි

- උෂ්ණත්වයට ඔරොත්තු දීම සම්බන්ධයෙන් බෝංචි පෙළවල් 37ක් යල කන්නයේ අවසාන භාගය තුලදී පරීක්ෂණයට භාජනය කරන ලදී.

## පලතුරු අභිජනනය

- දෙළුම් "නයන" ප්‍රභේද සමග සිදුකළ මුහුන් සියල්ල දෘඩ බීජ වලින් යුතුවිය. ශාක වියන, මල් පිපීමට යන දින ගණන යන ලක්ෂණයන්හි වැඩි

දෙමුහුන් දිරියක් CxD මුහුම් සංකලනයේදී පෙන්වන අතර AxD සහ CxD මුහුම් මගින් වැඩි බරක් සහිත මදුළුද වැඩි යුෂ ප්‍රතිශතයක් AxD මුහුම් මගින්ද ලැබී ඇත. අභිජනන අරමුණු (පොත්තේ සහ මදුළුවල පැහැය, මදුළුවල බර, යුෂ, බ්‍රික්ස් අගය, මෘදු බීජ) සැලකීමේදී AxD සහ CxD මුහුන් වඩාත් සාර්ථක සංකලන ලෙස හඳුනාගත හැක.

- වාණිජමය වගාවන් සඳහා බද්ධ පැළ නිෂ්පාදනය කිරිම හා මව් ශාක ගුණනය කිරීම සඳහාද CxD මුහුම් තෝරාගන්නා ලද අතර එය 2017 VRC සඳහා නම් කරන ලදී.
- VRC වෙත දෙළුම් ප්‍රභේදයක් යොමු කරන ලද අතර එය, “කල්පිටිය දෙමුහුම්” (Kalpitya hybrid) නමින් නිදහස් කරන ලදී.

## අල සහ ආකන්ද බෝග

- ජානප්ලාස්ම එක්රැස්කර අගයන ලදී. ප්‍රතිඔක්සිකාරක සහ කැරොටීන (Carotenoids) ලක්ෂණ පැහැදිලිව දැකගත හැකි වූ එකතුන් 2ක් තෝරා ගන්නා ලදී. මූලික අස්වනු අත්හදා බැලීම් සම්පූර්ණ කරන ලදී.

## මල් වගාව සහ පටක රෝපණය

- තවදුරටත් ඇගයීම සඳහා ලංකා කුමාරි x එටර්නිටි (Eternity cross) ප්‍රජනිත වලින් ශ්වේත වර්ණ කොලපුවකින් හා විවිධ වර්ණ සංයෝගයෙන් යුත් ජද ශුකි සහිත කැපූ මල් සඳහා සුදුසු ඇන්තූරියම් ශාක 6ක් තෝරා ගන්නා ලදී.
- විකෘත අභිජනනයෙන් ලබා ගත් හරිත වර්ණ ඇන්තූරියම් ආරයක් ඉදිරි ඇගයීම් සඳහා තෝරා ගන්නා ලදී.
- විකෘත අභිජනනයෙන් ලබාගත් හරිත වර්ණ ඇන්තූරියම් ආර සඳහා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට ක්‍රමෝපායක් සකස් කිරීම ආරම්භ කරන ලදී.
- ඇන්තූරියම් දෙමුහුම්කරණයෙන් ලබාගත් විවිධ වර්ණ සංකලනයෙන් යුතු (රතු, රෝස, තැඹිලි, පබළු වර්ණ සහ ද්වි වර්ණ) ඇන්තූරියම් පැළ 5ක් ඉදිරි ඇගයීම් සඳහා තෝරා ගන්නා ලදී.
- විවිධ ඩෙන්ඩ්‍රෝබියම් විශේෂ (Dendrobinm Spp.) අතර දෙමුහුම්කරණයෙන් ලබා ගත් පැළෑටි පටක රෝපණ විද්‍යාගාරය සහ දැල් ගෘහ තුල වර්ධනය වීමට සලස්වන ලදී.
- මෙරිගෝල්ඩ් වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලද අතර ක්ෂේත්‍රයේ $F_3$ පරම්පරාව ස්ථාපිත කරන ලදී.
- ජැස්මින් ජානප්ලාස්ම 10ක් ඇගයීම සඳහා ක්ෂේත්‍රයේ සිටුවන ලදී.

## කීට විද්‍යාව

- *Metarhizium anisopliae* දිලීරය PDA මාධ්‍යයේ විශාල ලෙස රෝපණය කරන ලදී. කඳ සහ ගෙඩි විදින්නා පරීක්ෂණාගාර අත්හදාබැලීම් සඳහා බෝ කරන ලදී.
- අදාළ ෆෙරමෝනය ආනයනය කරන ලද අතර, බතල ගුල්ලා පාලනය කිරීම සඳහා සුදු පැහැති ඇලෙන උගුල වඩාත් ඵලදායි විය. ජල උගුලක්ද නිර්මාණය කරන ලද අතර පර්යේෂණ අඛණ්ඩව සිදුවේ.
- බණ්ඩක්කාවල බිබිලි කුරුමිණියා (*Mylabris Spp.*) පාලනය කිරීමට විවිධ වූ පැළෑටි නාශක නිරන්තරයෙන් යෙදීම තුලින් පළිබෝධක ගහනය අවම කල හැක. සෙ.මී. 25ක විෂ්කම්භයකින් යුත් නිල් පැහැති බඳුන බිබිලි කුරුමිණියා අල්වා ගැනීමට

සුවිශේෂී වශයෙන් ඵලදායි වන පරිසර හිතකාමී ක්‍රමයකි.

## පැළෑටි ව්‍යාධිවේදය සහ බිම්මල්

- සෘෂි බිම්මල් (*Ganoderma lucidum*) ලී කොට වල සහ මලු වල වගා කිරීම සාර්ථක ලෙස අත්හදා බලන ලදී. *Ganoderma* බිම්මල් විශේෂයේ වැදගත් ලක්ෂණ විශ්ලේෂණය කිරීම සඳහා එහි නියැදි FRU වෙත භාරදෙන ලදී.
- බිම්මල් එක්රැස් කිරීම, මව් රෝපිත සහ බිම්මල් බීජ නිෂ්පාදනය කිරීම සම්පූර්ණ කරන ලදී. යෝග්‍ය වූ වර්ධක මාධ්‍ය තෝරා ගැනීම සඳහා අත්හදා බැලීම් ආරම්භ කරන ලදී.
- අත්හදා බැලීම් සිදුකර සාර්ථක ලෙස බිම්මල් ප්‍රභේද වගා කරන ලදී. (ශිතකේ සහ එරින්ගි)
- කල්පිටිය අර්ධද්වීපයේ රතු ළූණු කොළ ඇඹරීමේ රෝගය (Disco) සඳහා හේතුකාරක හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීමේ කටයුතු පූර්ණ කරන ලදී.
- මුණමල්දෙණිය ආදර්ශ බිම්මල් ගොවිපල ගොඩනැගීම කටයුතු අවසන් කරන ලදී.
- වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගය සමග බිම්මල් ගම්මානයක් ස්ථාපිත කිරීම සඳහා ගොවීන් 10 දෙනෙකු තෝරා ගන්නා ලදී. කෘමීන් වැලැක්වීමේ දැල් සහ විසිරුම් ඒකක ගොවීන් අතර බෙදා දෙන ලදී.

## වෙනත් කාර්යන්

### බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

පහත දැක්වෙන ප්‍රමාණයන්ගෙන් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමත් අලෙවි කිරීම / නිකුත් කිරීමත් සිදුකරන ලදී.

**වගු අංක 1.2.3.2: රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

| බෝගය | ද්‍රව්‍යයේ ස්වභාවය | නිෂ්පාදිත ප්‍රමාණය | අලෙවි කළ / නිකුත් කළ ප්‍රමාණය |
|---|---|---|---|
| ඇන්තූරියම් | පැළ | 600 | 244 |
| කෙසෙල් | මොරෙයියන් | 7,602 | 6,602 |
| මඤ්ඤොක්කා | දඬු | මීටර් 15,000 | මීටර් 1,000 |
| බතල | කැබලි | 25,000 | - |
| ඩ්‍රැගන් ෆෲට් | අතු පැළ | 1,500 | 1,296 |
| අන්නාසි | මොරෙයියන් | 55,000 | 43,750 |
| වට්ටක්කා (වැඩිදියුණු කරන ලද ආර) | බීජ | ග්‍රෑම් 500 | - |
| මෑ (A9) | අභිජනන බීජ | කිලෝ ග්‍රෑම් 5 | - |
| කරවිල (තින්නවෙලි වයිට්) | අභිජනන බීජ | ග්‍රෑම් 500 | - |

## උපදේශක සේවා

**වගු අංක 1.2.3.3: සපයන ලද සංඛ්‍යාව**

| ක්ෂේත්‍රය | සපයන ලද උපදේශක සේවා සංඛ්‍යාව |
|---|---|
| බිම්මල් | 240 |
| අන්නාසි | 320 |
| මල් වගාව | 132 |
| ගෙවතු වගා | 50 |
| අල හා ආකන්ද | 60 |
| ඩ්‍රැගන් ෆෲට් | 45 |
| කෙසෙල් | 85 |
| ව්‍යාධිවේදය | 135 |
| කීට විද්‍යාව | 70 |
| එළවළු | 165 |

## තාක්ෂණික ප්‍රචාරණය

පහත දැක්වෙන ගොවි පුහුණු සිදුකරන ලදී.

**වගු අංක 1.2.3.4: සිදු කරන ලද ගොවි පුහුණු**

| වැඩසටහනේ තේමාව | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| එළවළු වගාව | 16 | 600 |
| තවාන් කළමනාකරණය | 08 | 350 |
| මල් වගාව | 09 | 502 |
| බිම්මල් | 12 | 520 |
| පළතුරු | 03 | 240 |

- බිම්මල්, ඩ්‍රැගන් ෆෲට්, එළවළු වගාව සහ පළිබෝධ පාලනය සම්බන්ධයෙන් වූ අත්පත්‍රිකා බෙදාහරින ලදී.
- බිම්මල් වගාව පිළිබඳ වැඩමුළු 3ක් ගොවීන් සඳහා පවත්වන ලදී.
- පස් සාම්පල (500ක්), කොම්පෝස්ට් සාම්පල (270ක්) සහ ජල සාම්පල (76ක්) විශ්ලේෂණය කරන ලදී.

## සහභාගි වූ පුහුණු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

- සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා එළවළු වගාව සහ සැකසුම් තාක්ෂණ පිළිබඳ පුහුණු 2017, චීනය
- පස් සහ පොහොර පෘථුල ලෙස කළමනාකරණය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය සහ එය සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා යොදා

ගැනීම. 2017.03.29 සිට 2017.04.27 දක්වා, චීනයේදී.

- ප්‍රධාන බෝග වල සමෝධානික කෘමි සහ රෝග පාලන ක්‍රම පිළිබඳ පුහුණු. 2017.06.02 සිට 2017.06.21 දක්වා, චීනයේදී
- දකුණු ආසියානු රටවල් සඳහා ජාත්‍යන්තර බිම්මල් පුහුණුව පිළිබඳ පුහුණු වැඩමුළුව. 2016.12.07 සිට 2016.12.29 දක්වා, චීනයේදී.
- අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණය පිළිබඳ මූලධර්ම සම්බන්ධ වූ සහතික පත්‍ර පාඨමාලාව. කෘෂි ජෛවතාක්ෂණ මධ්‍යස්ථානය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

### ගුවන් විදුලි සහ රූපවාහිනී වැඩසටහන්

- ‘වයඹ හඬ’ ගුවන් විදුලියේ සහ ‘රන්ගිරි දඹුළු’ ගුවන් විදුලියේ බිම්මල් පිළිබඳ සජීවී වැඩසටහනට සහභාගීත්වය ලබා දෙන ලදී.
- කොරියානු තානාපති කාර්යාලයේ 40වන සංවත්සරය නිමිති කොට රූපවාහිනී වැඩසටහනට සහභාගීත්වය ලබා දෙන ලදී.

### සම්මාන

- 2017 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික සම්මේලනයේදී පාලිත රාජපක්ෂ මයා විසින් හොඳම පෝස්ටරයට හිමි සම්මානය දිනා ගන්නා ලදී.
- 2017 කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සම්මේලනයේ “පැළෑටි ජීව විද්‍යාව සහ ඵලදායිතා වර්ධනය” සැසියේදී හොඳම ඉදිරිපත් කිරීම වෙනුවෙන් එස්.ඒ.එස්.එම්. කුමාරි මිය සම්මාන දිනා ගන්නා ලදී.

## 2018 වසර සඳහා සැලැස්ම

### එළවළු අභිජනනය

- VAT පරීක්ෂණ පැවැත්වීම, MK ස්පන්ච්වට්ටක්කා සඳහා DUST පරීක්ෂණ සම්පූර්ණ කිරීම, සහ එය 2018 වර්ෂයේ දී VRC සඳහා නම් කිරීම.
- උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා වට්ටක්කා වගාවේ සුදුසු පරතර නිර්දේශ කිරීම.
- පැතලි හැඩයකින් යුත් වට්ටක්කා ආර (MK 1 සහ MK 2) සුපිරිසිදු කිරීම අඛණ්ඩව සිදු කිරීම.
- දේශීය වශයෙන් සුලභ වගා ප්‍රභේදවල ගහණ වැඩිදියුණු කිරීම තුලින් අළු පුහුල් වල (*Beninicasa hispida*) ප්‍රභේදීය වැඩිදියුණු කිරීම.
- ‘බුල්නෝස්’ (Bullnose) මාළු මිරිස් බෝගයේ ජාන වැඩිදියුණු කිරීම සහ ගහන වර්ධනය.
- *Capsicum chinense* Jacq. විශේෂයේ ජාන වැඩිදියුණු කිරීම සහ ගහණ වර්ධනය.
- “නයි මිරිස්” වගා ප්‍රභේද එක් රැස් කිරීම.

### අල සහ ආකන්ද බෝග

- ප්‍රතිඔක්සිකාරක සහ කැරොටිනොයිඩ් අන්තර්ගත නව බතල ප්‍රභේද හඳුනා ගැනීම.

### උද්‍යාන බෝග

- අධික උෂ්ණත්වය සහ තෙතමන තත්ත්වයන්ට ඔරොත්තු දිය හැකි වැටකොළු ප්‍රභේද වැඩිදියුණු කිරීම.
- $F_1$ දෙමුහුම් සහ විවෘත පරාගන ප්‍රභේද වැඩිදියුණු කිරීම සඳහා වැටකොළු දෙමුහුම් කිරීම සහ පරම්පරාව උසස් කිරීම

- *Luffa acutangula* සහ *Luffa cylindrica* වැටකොළු ප්‍රභේද වල විවිධතා අධ්‍යයනය කිරීම.
- කහ නාරටි විචිත්‍ර වෛරසය (YVMV) සඳහා ප්‍රතිරෝධීතාවය / ඔරොත්තු දීම පිළිබඳ බණ්ඩක්කා පෙළවල් හඳුනා ගැනීම.
- තෝරාගත් දෙළුම් දෙමුහුම් සඳහා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ බද්ධ දෙළුම් පැළ ක්ෂේත්‍ර ඇගයීම
- වැඩි උෂ්ණත්ව තත්ත්ව යටතේ වැල් බෝංචි ආර ඇගයීම.
- බණ්ඩක්කා සහ වැටකොළු විදේශීය ප්‍රභේද ඇගයීම.
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම් - බණ්ඩක්කා

## මල් වගාව

- සාම්ප්‍රදායික අභිජනන සහ විකෘති ප්‍රේරණය තුලින් ඇන්තූරියම්, ඕකිඩ්, මෙරිගෝල්ඩ් සහ ජැස්මින් මල් බෝග වැඩිදියුණු කිරීම.

## කීට විද්‍යාව

- බතල ගුල්ලා පාලනය කිරීම සඳහා ස්ථානීය සහ නියමු මට්ටමින් ෆෙරමෝන පරීක්ෂාව.
- *Mylabris Spp.* පාලනය කිරිමට සහ අස්වැන්න ඉහල දැමීම සඳහා IPM පැකේජයක් සකස් කිරීම.
- කුකුර්බිට් වල *Aulacophora Spp.* පාලනය සඳහා IPM පැකේජයක් සකස් කිරීම.

## ව්‍යාධිවේදය සහ බිම්මල්

- බිම්මල්වල අගය එකතු කල නිෂ්පාදන සහ වෙනත් සැකසුම් ක්‍රම වැඩිදියුණු කිරීම.
- වන බිම්මල් (ස්වභාවිකව වැවුණු) එක්රැස් කිරීම සහ තෝරාගත් ප්‍රභේද 3ක් සඳහා කෘත්‍රිම වගා තාක්ෂණයක් සකස් කිරීම.
- 'මාකඳුර වයිට්' නව බිම්මල් ප්‍රභේදය සඳහා ව්‍යාප්ති වැඩසටහන් සිදු කිරීම.
- කඳුකර ප්‍රදේශ සඳහා (අඩු උෂ්ණත්වයක් සහිත) සුදුසු විදේශීය බිම්මල් ප්‍රභේද වගා කිරීම පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා ව්‍යාප්ති වැඩසටහන් සිදුකිරීම.

# කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - කල්පිටිය

## ප්‍රගතිය

### පර්යේෂණ

- මිරිස් (FCRDI), මෑ (HORDI) හා බතල (මාකඳුර) ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම් සිදුකරන ලදී.
- විදේශීය ප්‍රභේද ඇගයීමේ වැඩසටහන් පවත්වන ලද අතර බීට් ප්‍රභේද 3ක්, ගෝවා ප්‍රභේද 3ක් සහ කෝලිෆ්ලවර් ප්‍රභේද 3ක් පරීක්ෂණයට භාජනය කරන ලදී.
- දෙළුම් අභිජනන වැඩසටහන් පවත්වන ලද අතර,VRC නාමකරණය කරන ලද මව් ශාක සහ බද්ධ පැළ නිෂ්පාදනයද සිදුවිය.
- බණ්ඩක්කා ජනකප්ලාස්ම ඇගයීම සහ YVMV වෛරසය සම්බන්ධයෙන් ප්‍රභේදීය පරීක්ෂා කටයුතු අඛණ්ඩව සිදු වේ.
- දෙළුම්, පේර සහ එළවළු අභිජනන බීජ නිෂ්පාදන කටයුතු සිදුවෙමින් පවතී.

### සහභාගී වූ පුහුණු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

- පස් සහ පොහොර පෘථුල කළමණාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය සහ එය සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා යොදා ගැනීම. 2017.03.29 සිට 2017.04.27 දක්වා, චීනයේදී

### බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

**වගු අංක 1.2.3.5: නිෂ්පාදනය කරන ලද බීජ සහ රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණය**

| බෝගය | ද්‍රව්‍යයේ ස්වභාවය | නිෂ්පාදිත ප්‍රමාණය | අලෙවි කළ නිකුත් කළ ප්‍රමාණය |
|---|---|---|---|
| දෙළුම් | පැළ | 13,400 | 2,400 |
| මෑ (A9) | බීජ | 500 g | |
| කරවිල - තින්නවේලි | බීජ | 500 g | |
| බණ්ඩක්කා (ඇත්දල බණ්ඩක්කා) | බීජ | 3 kg | - |
| බටු | අභිජනන බීජ | 1,000 g | - |
| මඤ්ඤොක්කා | දඬු | 10,000 m | 10,000 |
| බතල | දඬු | 25,500 | 10,000 |

### තාක්ෂණ ප්‍රචාරණය

පුද්ගලයන් 2,050ක් සඳහා එළවළු සහ පලතුරු පිළිබඳ පුහුණුවක් පවත්වන ලදී.

## 2018 වසර සඳහා සැලැස්ම

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම් (NCVT) සිදු කිරීම, විදේශීය ඇගයීමේ වැඩසටහන්
- දෙළුම්, පේර සහ එළවළු අභිජනන බීජ සඳහා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- YVMV වෛරසය සම්බන්ධයෙන් බණ්ඩක්කා පරීක්ෂණයට භාජනය කිරීම

## කාර්ය මණ්ඩලය

**ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, මාකඳුර**

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 12 | 04 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (ආර්ථික විද්‍යා) | 01 | - |
| පරිපාලන නිලධාරි | 01 | 01 |
| කෘෂිකර්ම උපදේශක (විශේෂ) | 01 | - |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 01 | 01 |

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 05 | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 06 | 01 |
| සංවර්ධන නිලධාරි | 03 | 03 |
| ගොවිපළ කළමණාකරු | - | 01 |
| කෘෂිකර්ම උපදේශක | 06 | 07 |
| පර්යේෂණ සහකාර | 10 | 08 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 08 | 08 |
| තාක්ෂණික සහායක | 04 | 04 |
| ගොවිපළ ලිපිකරු | 01 | 02 |
| ගබඩාකරු | 01 | 01 |
| පර්යේෂණ උප සහකාර | 03 | - |
| රියදුරු | 04 | 03 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 02 | 01 |
| පෙදරේරු | 01 | - |
| වඩුකරු | 01 | 01 |
| කාර්මික ශිල්පි | - | - |
| තවාන්කරු | 01 | - |
| විදුලි ශිල්පි | 02 | - |
| කාර්මික ශිල්පි | 02 | - |
| තණකොළ කපන්නා | - | 01 |
| සංචාරක බංගලා භාරකරු | 01 | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 | - |
| මුරකරු | 05 | 05 |
| සනීපාරක්ෂක කම්කරු | 01 | 01 |
| නුපුහුණු කම්කරු (I ශ්‍රේණිය) | 63 | 11 |
| නුපුහුණු කම්කරු (III ශ්‍රේණිය) | - | 27 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 01 | 07 |
| **එකතුව** | **148** | **102** |

**කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, කල්පිටිය**

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| ගොවිපළ කළමනාකරු | 01 |
| කෘෂිකර්ම උපදේශක | 01 |
| පර්යේෂණ සහකාර | 02 |

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| තාක්ෂණ සහායක | 04 |
| රියදුරු | 01 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| මුරකරු | 02 |
| යාන්ත්‍රික ශිල්පි | 01 |
| නුපුහුණු කම්කරු (Iශ්‍රේණිය) | 05 |
| නුපුහුණු කම්කරු(III ශ්‍රේණිය) | 07 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 01 |
| **එකතුව** | **28** |

**අනුවර්තන කෘෂිකර්ම පර්යේෂණ ඒකකය, තඹබෝව**

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| ගොවිපල කළමනාකරු | 01 |
| තාක්ෂණ සහායක | 01 |
| මුරකරු | 02 |
| නුපුහුණු කම්කරු (I ශ්‍රේණිය) | 03 |
| නුපුහුණු කම්කරු (III ශ්‍රේණිය) | 05 |
| **එකතුව** | **12** |

**අනුවර්තන කෘෂිකර්ම පර්යේෂණ ඒකකය, වාරියපොල**

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| සංවර්ධන නිලධාරි | 01 |
| ගොවිපළ කළමණාකරු | 01 |
| කෘෂිකර්ම උපදේශක | 02 |
| පර්යේෂණ සහකාර | 01 |
| මුරකරු | 02 |
| නුපුහුණු කම්කරු (I ශ්‍රේණිය) | 04 |
| නුපුහුණු කම්කරු (II ශ්‍රේණිය) | 05 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 05 |
| **එකතුව** | **21** |

## 1.2.4. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - සීතා එළිය

සීතා එළියේ කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ගන්නොරුවේ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ විෂය පථයට අයත් ආයතනයකි. අර්තාපල්, සම ශීතෝෂ්ණ එළවළු, පලතුරු සහ සමහර මල් වගා බෝග යන අංශ මුල් කරගත් පර්යේෂණ සිදුකිරීම මෙම මධ්‍යස්ථානය මගින් ඉටුකෙරෙන අතර ක්‍රියාත්මක කෙරෙන බෝග සංවර්ධන වැඩසටහන් වලට ප්‍රභේදීය සංවර්ධනය, ඉහළ අස්වනු ලබාදෙන ප්‍රභේද තෝරා ගැනීම හා හඳුන්වා දීම ඇතුළත් වේ. බෝග ඵලදායිතා වැඩසටහන ඉහළ නැංවීමට වැඩිදියුණු කළ ශෂ්‍ය විද්‍යාත්මක කට්ටල සංවර්ධනය කිරීම හා පළිබෝධ, රෝග හා පෝෂක කළමනාකරණයට යහපත් කෘෂිකාර්මික භාවිතාවන් යොදාගැනීම සිදු කෙරෙයි. බීජ අර්තාපල්, ස්ට්‍රෝබෙරි රෝපණ ද්‍රව්‍ය හා සමහර විසිතුරු පැළෑටි වල ගුණාත්මක බව හා ප්‍රමාණය නඟාලීමට ජාතික වැඩසටහන් පැවැත්වීමේ වගකීම ද මධ්‍යස්ථානය සතුය.

### අයවැය

**වගු අංක 1.2.4.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 3,758,767 | 3,640,357 | 97 |
| මූලධන | 2,420,750 | 2,245,985 | 93 |
| ව්‍යාපෘති | | | |
| • අර්තාපල් නිෂ්පාදන වැඩසටහන 2016 -2018 | 2,800,000 | 2,793,222 | 100 |
| • බීජ අර්තාපල් නිෂ්පාදනය | 7,100,000 | 5,881,066 | 83 |
| • තිරසාර බෝග නිෂ්පාදනයක් සඳහා ස්ථානීය සුවිශේෂී පොහොර කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම. | 180,000 | 144,520 | 80 |
| • $F_1$ දෙමුහුම් හා විවෘතව පරාගණය වන ප්‍රභේද සංවර්ධනය කිරීම සහ මූලික බීජ නිෂ්පාදනය | 700,000 | 703,738 | 101 |
| • බිම්මල් නිෂ්පාදන වැඩසටහන (KOPIA) | 100,000 | 100,000 | 100 |
| • ග්‍රාම නිලධාරි කොට්ඨාශ සඳහා පාංශු පරීක්ෂණ පාදක පොහොර නිර්දේශ කිරීම සහ කාර්යක්ෂම පොහොර කළමනාකරණය | 200,000 | 199,376 | 100 |
| • AFACI | 2,703,038 | 2,703,038 | 100 |
| • කළු කියත් පණුවා, *Agrotis* spp. පාලනය සඳහා ජෛව තීව්‍ර ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ වැඩසටහන. | 300,000 | 298,850 | 100 |
| **එකතුව** | **20,262,555** | **18,710,152** | **92** |

## ප්‍රගතිය

### පර්යේෂණ

#### ශෂ්‍ය විද්‍යාව

- වායුරෝපිත ක්‍රමය සඳහා Granola අර්තාපල් ප්‍රභේදයට සුදුසු ප්‍රචාරකයක් තෝරා ගැනීමට අධ්‍යයනයක් පවත්වන ලදී. ප්‍රතිඵල අනුව මුල් ඇඳුනු දඬු කැබලි වලින් ලබාගත් බීජ, කුඩා ආකන්ද පැළ ක්ෂුද්‍ර ආකන්ද පැළ සහ නලස්ථ පැළ වලට වඩා ඉහළ අස්වැන්නක් ලබාදුනි.

- ගෝවා, චීන ගෝවා, බ්‍රොකොලි හා මල් ගෝවා සඳහා වඩාත්ම උචිත පැළ කිරිමේ ඝනත්වය සොයා ගැනීමට පරීක්ෂණයක් පවත්වන ලදී.

#### පැළෑටි අභිජනනය

- තනි ආකන්ද වරණ ක්‍රමය යොදා ගනිමින් $F_1$ බීජ අර්තාපල් ආකන්ද ලබා ගැනීමට පාලිත පරිසර තත්ව යටතේ අර්තාපල් සත්‍ය බීජ තවාන් ස්ථාපනය කරන ලදී.

- දේශීයව සංවර්ධනය කරන ලද අර්තාපල් ආර හයක් ප්‍රධාන අස්වනු පරීක්ෂාව (MYT) යටතේ ඇගයීමට ලක් කෙරිණි. ආර 4ක් පාලිත ප්‍රභේදයට වඩා කැපී පෙනෙන ලෙස වැඩි ඵලදා ලබා දුනි.

- රිවෝලා ලෙස නම් කරන ලද බලාපොරොත්තු තැබිය හැකි උණුසුමට ඔරොත්තු දෙන YP-07-611 අර්තාපල් ආර පුත්තලම හා යාපනය දිස්ත්‍රික්ක වල වාණිජ වගාව සඳහා නිර්දේශ කරන ලදී.

- කල්පිටිය හා තිරුනෙල්වේලි පර්යේෂණ ස්ථාන වල දී අර්තාපල් ප්‍රභේද තිහක් ඇගයීමට ලක් කරන ලදී. පරීක්ෂාවට ලක් කළ සියලු ආර පරීක්ෂක ප්‍රභේදය වන රෙඩ් ල සෝඩා හා සැසඳීමේ දි වඩා අඩු අස්වනු ලබා දුනි.

- මූලික අස්වනු පරීක්ෂාව සඳහා සුදුසු උණුසුමට ඔරොත්තු දෙන සුදුසු අර්තාපල් ප්‍රභේද තේරීමට කල්පිටිය හා තිරුනෙල්වේලි පර්යේෂණ ස්ථාන වල දී අර්තාපල් ප්‍රභේද විසි අටක් ස්ථාපනය කරන ලදී.

- මූලික අස්වනු පරීක්ෂාව (PYT) යටතේ CIP ආර එකොලහක් ඇගයීමට ලක් කරන ලදී. ආර නවයක් පාලිත ප්‍රභේදයට වඩා කැපී පෙනෙන ලෙස වැඩි ඵලදා ලබා දුනි.

- අස්වැන්න සහ පසු අංගමාර රෝගයට ප්‍රතිරෝධී බව / දරා ගැනීමේ හැකියාව සඳහා විදේශීය අර්තාපල් ප්‍රභේද තිස් අටක් ඇගයීමට ලක් කරන ලදී. රෝග වැළඳීම අඩු, වැඩි ඵලදා ලබා දෙන අර්තාපල් ප්‍රභේද දහයක් (Ranomi, Oxania, Aloutte, Sinora, Montreal, Mondio, Noha, Medeleine, Iryana, Y-05-130P) හඳුනා ගන්නා ලදී.

- ඵලදාව හා අනුවර්තතාව සඳහා විදේශිය අර්තාපල් ප්‍රභේද දහ අටක් ඇගයීමට ලක් කරන ලදී. වාණිජ වගාව සඳහා ප්‍රභේද හඳුනා ගැනීමට අධ්‍යයනය නැවත සිදු කරනු ලැබේ.

- බීට් රූට් ප්‍රභේද 3ක්, ගෝවා ප්‍රභේද 7ක්, කැරට් ප්‍රභේද 6ක්, මල් ගෝවා ප්‍රභේද එකක්, චීන ගෝවා එක් ප්‍රභේදයක්, නෝකෝල් ප්‍රභේද 2ක් Pac Choi එක් ප්‍රභේදයක් හා සුකිනි ප්‍රභේද 3ක් ඇගයීමට ලක් කරන ලදී. ඵලදාව, පරිණතිය, පළිබෝධ හා රෝග වලට අඩුවෙන් භාජනය වීම හා පාරිභෝගික පිළිගැනීම පදනම් කරගෙන බ්‍රොකොලි ප්‍රභේදයක් (Early You) ගෝවා ප්‍රභේද 4ක් (ISZ-78, Tiger, Magnum හා HLS-15), චීන ගෝවා ප්‍රභේදයක් (PAM), නෝකෝල් ප්‍රභේදයක් (NEX), Pac Choi ප්‍රභේදයක් (N- 54) හා එක් සුකිනි ප්‍රභේදයක් (Star OL) පහතරට තෙත් කලාප තත්ව යටතේ

මහා පරිමාණ ආදර්ශනය සඳහා හඳුනා ගන්නා ලදී.

- පහතරට තෙත් කලාපයේ වාණිජ වගාව සඳහා කැරට් ප්‍රභේදයක් (Rex) හා රාබු ප්‍රභේදයක් (Green Hope) නිර්දේශ කරන ලදී.

## පටක රෝපණ

- ස්ට්‍රෝබෙරි පරාගධානි රෝපණය සඳහා නලස්ථ පැළෑටි පුනර්ජනන ක්‍රමය සංවර්ධනය කරන ලදී. නලස්ථව ලබාගත් ස්ට්‍රෝබෙරි පරාගධානි වල කැල්ලි (Calli) වලින් පැළෑටි පුනර්ජනනය කළ හැකි පැළෑටි පුනර්ජනන මාධ්‍ය හතර අතරින් IAA ලීටරයට මිලි ග්‍රෑම් 2+ BAP ලීටරයට මිලි ග්‍රෑම් 1 සමඟ එක් කළ MS මාධ්‍යය තෝරා ගන්නා ලදී.
- පෙයාර්ස් නලස්ථ ප්‍රරෝහ වල මුල් ඇතිවීම ප්‍රේරණය කිරීමට ද්වි මූල ප්‍රේරණ මාධ්‍ය පරීක්ෂාවට ලක් කරන ලදී. පරීක්ෂාවට ලක් කළ කිසිදු මාධ්‍යයක් මුල් ඇති කිරීමට ඵලදායී නොවීය.

## කීට විද්‍යාව

- අර්තාපල් වල පැළ මැක්කන් හා කුඩිත්තන් පාලනය සඳහා හෙක්ටෙයාරයට මිලි ලීටර් 200 අනුපාතයට සල්ෆොක්සෆ්ලෝර් 240 SC නිර්දේශ කරන ලදී.
- යළි ලියාපදිංචිය සඳහා මෙටැල්ඩිහයිඩ් 5% G පරීක්ෂා කරන ලදී. හම්බෙල්ලන් පාලනයට හෙක්ටෙයාරයට කිලෝග්‍රෑම් 10-30 අනුපාතයට යෙදීම ප්‍රතිඵලදායක බව අනාවරණය විය.
- යුෂ උරාබොන පළිබෝධ වල ගහණ ගති විද්‍යාව කෙරෙහි දේශගුණික සාධක වල බලපෑම හඳුනා ගැනීමට අධ්‍යයනයක් සිදු කරන ලදී. කුඩිත්තන් ගහණය හා සාමාන්‍ය උෂ්ණත්වය අතර කැපී පෙනෙන ධනාත්මක අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් නිරීක්ෂණය කරන ලද අතර සාපේක්ෂ ආර්ද්‍රතාවය හා සුදු මැස්සන් අතර කැපී පෙනෙන ඍණාත්මක අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් නිරීක්ෂණය කරන ලදී.
- යුෂ උරාබොන පළිබෝධ (පැළ මැක්කන්, කුඩිත්තන් හා සුදු මැස්සන්) නිසා සිදුවන අර්තාපල් ඵලදා හානිය තක්සේරු කිරීමට පරීක්ෂණයක් පවත්වන ලදී. සතිපතා රසායනික ද්‍රව්‍ය යොදන ලද තත්වය හා සැසඳීමේ දී එලෙස පිළියම් නොකරන ලද තත්වයේ දී කැපී පෙනෙන අස්වනු හානියක් ඇති වූ බව ප්‍රතිඵල වලින් අනාවරණය විය.
- අර්තාපල් ආකන්ද සලබයා පාලනයට *Lantana camara, Eucalyptus globulus* සහ *Tithonia diversifolia* යන උද්භිද වල පලිබෝධනාශක ගුණ ඇගයීමට පරීක්ෂණයක් සිදු කරන ලදී. *Lantana camara* ඉහළම සාධනීයත්වයක් පෙන්වූ උද්භිදය බව ප්‍රතිඵල වලින් අනාවරණය විය. කුඩා පරිමාණ ගබඩා වල ආකන්ද සලබයා පාලනයට බීජ අර්තාපල් කිලෝග්‍රෑම් 1ක් සඳහා *Lantana camara* උද්භිදයේ වියළි පත්‍ර ග්‍රෑම් 15ක් භාවිතා කළ හැක.
- උඩරට තෙත් කලාපයේ සුදු කම්බිලි පණුවන්ට එරෙහිව *Metarhizium anisopliae* දිලීරයෙහි (CRI මගින් වෙන් කරන ලද) කාර්යක්ෂමතාව හා සඵලත්වය තීරණය කිරීමට අධ්‍යයනයක් පවත්වන ලදී. දිලීරය, පරීක්ෂණාගාර තත්ව හා වීදුරු ගෘහ තත්ව යටතේ සුදු කම්බිලි පණුවාට එරෙහිව ජෛව පාලන හැකියාවක් නොපෙන්වීය.

## ව්‍යාධිවේදය

- අර්තාපල් වල පසු අංගමාරය පාලනයට මැන්කොසෙබ් 68% + මෙටලැක්සිල්

4% (ලීටරයට ග්‍රෑම් 2.50) ට වඩා ෆ්ලොපිකොලයිඩ් ලීටරයට මිලි ලීටර 3.75 ලීටරයට ග්‍රෑම් 62.5 + ප්‍රොපමොකාබ් HCl ලීටරයට ග්‍රෑම් 625 SC හොඳ කාර්යසාධනයක් පෙන්වීය.

- අර්තාපල් වල පසු අංගමාරය සඳහා මැන්කොසෙබ් 75% WDG ලීටරයට ග්‍රෑම් 2 අනුපාතයට යෙදීමේ කාර්යක්ෂමතාව පරීක්ෂා කරන ලද අතර එහි කාර්යසාධනය මැන්කොසෙබ් 80% WP හි කාර්ය සාධනයට සමාන විය.
- ක්ෂේත්‍ර තත්ව යටතේ පසු අංගමාරයට එරෙහිව නව විදේශීය අර්තාපල් ආර 17ක් පරීක්ෂා කරන ලදී. 'Sapro - mira' ආර පසු අංගමාරයට ප්‍රතිරෝධී බව පෙන්වීය.
- විවිධ පැළෑටි සාර 6ක් අතරින් සුදුලූණු සාරය, කුරුඳු තෙල් සමඟ සැසඳීමේ දී නලස්ථ තත්ව යටතේ *Collectroticam* (ස්ට්‍රෝබෙරි ව්‍යාධිජනකයා) නිෂේධනය කිරීමට හැකියාව පෙන්වීය.
- නුවරඑළියේ දී ප්‍රභේද 5ක් යොදා ගනිමින් අර්තාපල් වල පිටි කබොළු රෝගය පිළිබඳව වසංගත විද්‍යා අධ්‍යයන පවත්වන ලදී. සියළුම ප්‍රභේද පිටි කබොළු රෝගයේ බලපෑමට ලක් විය.

## පාංශු විද්‍යාව

- අර්තාපල් සඳහා පොස්පරස් අවශ්‍යතාව තීරණය කිරීමට අධ්‍යයනයක් පවත්වන ලද අතර බෝගය සඳහා $P_2O_5$ අවශ්‍යතාව හෙක්ටෙයාරයට කිලෝ ග්‍රෑම් 62.5ක් බව අනාවරණය විය.
- උඩරට තෙත් කලාපයේ N,P,K පොහොර වලට වගා අනුක්‍රමයක එළවළු බෝග වල ප්‍රතිචාරය අධ්‍යයනයට පරීක්ෂණයක් පවත්වන ලදී. අර්තාපල් සඳහා N හෙක්ටෙයාරයට කිලෝ ග්‍රෑම් 100, $P_2O_5$ හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 50, $K_2O$ හෙක්ටෙයාරයට කිලෝ ග්‍රෑම් 100 ක්ද, කැරට් සඳහා N හෙක්ටෙයාරයට කිලෝ ග්‍රෑම් 100, $P_2O_5$ හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 100, $K_2O$ හෙක්ටෙයාරයට කිලෝ ග්‍රෑම් 100 ක්ද ගෝවා සඳහා N - හෙක්ටෙයාරයට කිලෝ ග්‍රෑම් 100, $P_2O_5$ හෙක්ටෙයාරයට කිලෝ ග්‍රෑම් 100, $K_2O$ හෙක්ටෙයාරයට කිලෝ ග්‍රෑම් 150 ක්ද අවශ්‍ය වන බව හඳුනා ගන්නා ලදී.
- කන්න තුනක දී ඉහළ පොස්පරස් ($P_2O_5$) අගයක් ඇති පස් වල පොස්පරස් අවශ්‍යතාව විමසීමට අධ්‍යයනයක් කරන ලද අතර අර්තාපල් හා කැරට් බෝග පොස්පරස් යෙදීමෙන් තොරව හොඳ අස්වනු ලබාදුන් බව දක්නට ලැබුණි.

## බිම්මල්

- කින්ග් ඔයිස්ටර් බිම්මල් (*Pleurorus eryngi*) වගාව සඳහා සුදුසු තාක්ෂණයක් ගොඩනැංවීමට පරීක්ෂණයක් පවත්වන ලදී. ලී ඉරුම් කුඩු 75% ක් සමඟ සහල් නිවුඩු 25% කින් සමන්විත උපස්තරය මත වඩා වැඩි අස්වැන්නක් ලැබුණි.
- ෂීටෙක් බිම්මල් (*Lentinula edodus*) වගාව සඳහා සුදුසු තාක්ෂණයක් ගොඩනැංවීමට පරීක්ෂණයක් පවත්වන ලදී. *Albizzia lebbek* ඉරුම් කුඩු වලින් සමන්විත මාධ්‍යයෙන් වඩා වැඩි අස්වැන්නක් ලැබුණි.
- කොම්පෝස්ට් කරන ලද දහයියා සමඟ ඉරුම් කුඩු විවිධ සම්මිශ්‍රණ යොදා ගනිමින් ඇමෙරිකන් ඔයිස්ටර් බිම්මල් (*Pleurotus ostreatus*) සඳහා අඩු පිරිවැයකින් යුතු උපස්තරයක් සංවර්ධනය කිරීමට අධ්‍යයනයක් සිදු කරන ලදී. ඇමෙරිකන් ඔයිස්ටර් බිම්මල් අස්වැන්නට බලපෑමක් නොවන පරිදි ඉරුම් කුඩු වලට 40% දක්වා කොම්පෝස්ට් කරන ලද දහයියා එකතු කිරීම සිදු කළ හැක.

## පලතුරු

- පෙයාස් ප්‍රභේද 8ක් ඇගයීමට ලක් කරන ලද අතර 'නුවරඑළිය වරණය' උඩරට තෙත් කලාප තත්ව යටතේ හොඳ කාර්ය සාධනයක් පෙන්වීය.

### බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

පහත සඳහන් ප්‍රමාණ වල බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ලදී.

**වගු අංක 1.2.4.2: 2017 වර්ෂය තුළදී බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පදානය**

| බෝගය | ප්‍රභේදය | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|---|
| අර්තාපල් | | පූර්ව මූලික බීජ (Go) | 171,395 |
| | ග්‍රැනෝලා | නලස්ථ පැළ | 17,931 |
| | ආනෝවා | නලස්ථ පැළ | 231 |
| | රෙඩ් ල සෝඩා | නලස්ථ පැළ | 253 |
| | YP-07-611 | නලස්ථ පැළ | 165 |
| | | නලස්ථ කුඩා ආකන්ද | 610 |
| ස්ට්‍රෝබෙරි | | නලස්ථ පැළ | 1,302 |
| බෙබිස් බ්‍රෙත් | | නලස්ථ පැළ | 15,455 |
| මැඩෝනා ලිලී | | නලස්ථ පැළ | 11 |
| ජර්බෙරා | | නලස්ථ පැළ | 73 |
| ක්‍රිසන්තිමම් | | නලස්ථ පැළ | 2,442 |
| ස්ටැටිස් | | නලස්ථ පැළ | 358 |
| ලිමෝනියම් | | නලස්ථ පැළ | 252 |

### සේවා

පාංශු ලක්ෂණ තීරණය කිරීම සඳහා පස් සාම්පල ලැබුණු අතර ඒවායේ රෝග සඳහා අපවිත්‍රනය වීම් විශ්ලේෂණය කරන ලද අතර පහත දක්වා ඇති පරිදි වාර්තා ලබා දෙන ලදී.

**වගු අංක 1.2.4.3: 2017 වර්ෂය තුළදී සපයන ලද විශ්ලේෂණාත්මක සේවා**

| අරමුණු | ප්‍රමාණය |
|---|---|
| අර්තාපල් කෝෂ්ය වටපණුවා | 850 |
| බැක්ටීරියානු හිටු මැරීම | 870 |
| pH | 1,273 |
| EC | 1,273 |
| පොස්පරස් | 1,273 |
| පොටෑසියම් | 1,273 |
| කාබනික ද්‍රව්‍ය | 1,172 |

- ගොවීන් විසින් ලබා දෙන ලද පැළෑටි සාම්පල 17 ක රෝග හඳුනා ගන්නා ලද අතර පාලනය කිරීමේ නිර්දේශ ලබා දෙන ලදී.

## සහභාගි වූ පුහුණු, සම්මන්ත්‍රණ හා වැඩමුළු

- සංවර්ධනය වන රටවල් සඳහා පස් හා පොහොර කළමනාකරණය හා උපයෝගිතාව, චීනය.
- බීජ අර්තාපල් ගුණනය හා ඒකාබද්ධ රෝග පාලන ක්‍රමෝපාය, චීනය.
- සංවර්ධනය වන රටවල් සඳහා අර්තාපල් නිෂ්පාදනය හා ව්‍යාප්ති තාක්ෂණ, චීනය.
- කලාප හා මංපෙත් රටවල් සඳහා JUNCAO තාක්ෂණය, චීනය.
- එළවළු නිෂ්පාදනය, ඊජිප්තුව.
- AFACI ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචන රැස්වීම, ඉන්දුනීසියාව.

## වෙනත්

- වලපනේ, කොත්මලේ හා නුවරඑළිය පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු මගින් සංවිධානය කරන ලද පර්යේෂණ හා ව්‍යාප්ති සංවාද වලට සහභාගි වන ලදී.
- එක් බී.එස්සී උපාධි අපේක්ෂක ශිෂ්‍යයෙක් කීට විද්‍යාවට අදාළ තම අවසන් වසර විශේෂීය ව්‍යාපෘතිය සම්පූර්ණ කළේය.
- ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරියේ සිසුහු 21 දෙනෙක් තම කර්මාන්ත පුහුණු සඳහා පුහුණු කරන ලදී.
- විශ්වවිද්‍යාල සිසුන් 327ක්, කෘෂිකර්ම විද්‍යාල සිසුන් 587ක්, පාසල් සිසුන් 2,960ක්, කෘෂිකර්මය හා ආශ්‍රිත නිලධාරීන් 128ක් හා ගොවීන් 435ක් සඳහා අර්තාපල් වගාව, බීජ අර්තාපල් නිෂ්පාදනය, පටක රෝපණය, මල් වගාව, ස්ට්‍රෝබෙරි වගාව, ආරක්ෂිත රෝපණය, පළිබෝධ හා රෝග කළමනාකරණය, උඩරට එළවළු වගාව, ගෙවතු වගාව හා පාංශු සංරක්ෂණය පිළිබඳව පුහුණුව ලබා දෙන ලදී.
- එක් ක්ෂේත්‍ර දිනයක් පවත්වන ලදී.
- තරඟ ඉසව් වලින් ජයග්‍රහණ ලබා ගනිමින් නුවරඑළිය මහ නගර සභාව මගින් පවත්වන ලද ‘April Blooms’ 2017 ට මෙම මධ්‍යස්ථානය සහභාගි විය.
- කීට විද්‍යා පර්යේෂණාගාරය නවීකරණය කරන ලදී.

## 2018 වසර සඳහා සැලැස්ම

- ගුණත්වයෙන් යුතු බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා වූ තාක්ෂණවේද වැඩිදියුණු කිරීම හා ගොඩනැගීම.
- දේශීයව වගා කිරීම සඳහා සුදුසු අර්තාපල් ප්‍රභේද සංවර්ධනය, හඳුනාගැනීම, වැඩි දියුණු කිරීම හා වරණය.
- බීජ හා ආහාර ආරක්ෂාව තහවුරු කිරීමට, උඩරට තෙත් කලාපයේ බෝග සඳහා පරිසර හිතකාමී පළිබෝධ හා රෝග පාලන ක්‍රම සඳහා තාක්ෂණවේද ගොඩනැගීම.
- උඩරට තෙත් කලාපයේ වගාව සඳහා සුදුසු සම ශීතෝෂ්ණ එළවළු ප්‍රභේද වරණය.
- බීජ අර්තාපල් හා සම ශීතෝෂ්ණ පලතුරු බෝග නිෂ්පාදන වල අනුවර්ත්‍ය නාලස්ථ ප්‍රචාරණ ක්‍රමෝපාය සංවර්ධනය හා වැඩි දියුණු කිරීම.
- උඩරට තෙත් කලාපයේ බෝග වගා ක්‍රම සඳහා පරිසර හිතකාමී පොහොර කළමනාකරණ භාවිතා හඳුනා ගැනීම හා සංවර්ධනය කිරීම.
- උඩරට තෙත් කලාපය සඳහා සුදුසු නව බිම්මල් වර්ග සඳහා තාක්ෂණවේද වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම.

## කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 09 | 04 |
| පරිපාලන නිලධාරි | 01 | - |
| කෘෂිකර්ම උපදේශක (විශේෂ ශ්‍රේණිය) | 01 | - |
| පර්යේෂණ සහකාර (විශේෂ ශ්‍රේණිය) | 01 | - |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | - | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 03 | - |
| සංවර්ධන නිලධාරි | 02 | - |
| කෘෂිකර්ම උපදේශක | 03 | 03 |
| පර්යේෂණ සහකාර | 07 | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 | 03 |
| තාක්ෂණ සහායක | 06 | 06 |
| ගොවිපළ ලිපිකරු | 01 | - |
| රියදුරු | 03 | 03 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 01 |
| ගබඩාකරු | 01 | - |
| විදුලි ශිල්පී | 01 | - |
| පර්යේෂණ උප සහකාර | 03 | - |
| කර්යාල කාර්ය සහායක | 01 | 01 |
| මුරකරු | 06 | 06 |
| කම්කරු | 44 | 36 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 27 | 25 |
| **එකතුව** | **114** | **68** |

# 1.2.5 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල

තෙලිජ්ජවිල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, ගන්නෝරුව, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය යටතේ ක්‍රියාත්මක ආයතනයකි. තෙලිජ්ජවිල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයෙහි, පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රධාන වශයෙන් එළවළු, මුල් හා අල වර්ග, පලතුරු හා හතු නිෂ්පාදන ඵලදායිතාවය වැඩිදියුණු කිරීමේ තාක්ෂණයන් සංවර්ධනය හා ව්‍යාප්තිය කෙරෙහි යොමු වී තිබේ. ඊට අමතරව රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම, ව්‍යාප්ති කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ ඔවුනට අධ්‍යාපනය ලබා දීම සහ ගොවීන්ට ශ්‍රී ලංකාවේ දකුණු පළාත තුළ බෝග නිෂ්පාදනයේ තිරසාර පැවැත්ම තහවුරු කිරීම සිදු කෙරේ.

## අයවැය

**වගුව 1 .2.5.1: වාර්ෂික අයවැය -2017**

| **වැය ශීර්ෂය** | **ප්‍රතිපාදන (රු.)** | **වියදම (රු.)** | **වියදම (%)** |
|---|---|---|---|
| පුනරාවර්තන | 1,873,179 | 1,481,453 | 79 |
| මූලධන | 2,304,000 | 2,033,773 | 88 |
| ව්‍යාපෘති | | | |
| • NARP - *FUSARIUM* මැළවීමේ රෝගයට (*Fusarium oxysporium* f.sp. cubense (Foc) ප්‍රතිරෝධීතාව දැක්වීම/ ඔරොත්තු දීම සඳහා කෙසෙල්වල නලස්ථ (*In vitro)* විකෘතිකරණය | 180,000 | 179 , 996 | 100 |
| • මාතර දිස්ත්‍රික්කයේ මල් වගාව පිළිබඳ NARPහි වර්තමාන තත්ත්වය හා අනාගත සම්බන්ධතා | 445,500 | 444,926 | 100 |
| • තෝරාගත් එළවළු වර්ගවල නිෂ්පාදන හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික මැදිහත්වීම | 130,000 | 130,000 | 100 |
| • පවතින නියඟය හේතුවෙන් රට තුල ආහාර හිඟය මැඩපැවැත්වීමට බතල හා මඤ්ඤොක්කා වගාව | 200,000 | 197,605 | 99 |
| • ශ්‍රී ලංකාව සඳහා ඉහළ අස්වනු දෙන උසස් තත්ත්වයේ “ඉන්නල” ප්‍රභේද සංවර්ධනය කිරීමේ NARP වැඩසටහන | 718,000 | 680,887 | 95 |
| • බටුවල පළමු දුහිතෘ පරම්පරාවේ දෙමුහුම් සහ විවෘත පරාගිත ප්‍රභේද සංවර්ධනය | 550,000 | 508,367 | 92 |
| • KOPIA ව්‍යාපෘතිය | 100,000 | 96,128 | 96 |
| **එකතුව** | **6,500,679** | **5,753,135** | **89** |

## ප්‍රගතිය

### පර්යේෂණ

#### ශාක අභිජනනය

#### මිරිස්

සාම්ප්‍රදායික මිරිස්වල *(Capsicum chinense)* ජනකප්ලාස්ම 40ක් අගයන ලද අතර විශිෂ්ට ආර 8ක් සියයට 70ක් දක්වා පවිත්‍ර කරන ලදී. සංරක්ෂණය සඳහා ආර 12ක් ගන්නොරුව පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරන ලදී.

#### මෑ/ එළවළු කව්පි

- PGRC මගින් එළවළු කව්පි ජනකප්ලාස්ම 30ක් ලබා ගෙන අගයන ලදී. පිවිසුම් අංක 012124 සහ 08766 පිළිවෙලින් පාදස්ථ කුණුවීමට ඔරොත්තු දෙන සහ මධ්‍යස්ථ වශයෙන් ඔරොත්තු දෙන ජනකප්ලාස්ම වශයෙන් හඳුනා ගන්නා ලදී.
- දෙමුහුම්කරණය මගින් ඉහළ අස්වනු, පාදස්ථ කුණු වීමට ඔරොත්තු දෙන උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු ‘පොළොන් මෑ’ ප්‍රභේද වරණය සිදු කෙරෙමින් පවතියි.

#### වම්බටු

- NCVT වම්බටු (දෙමුහුම්) සහයෝගීතා වැඩසටහන පවත්වා ගෙන යන ලද අතර පහතරට තෙත් කලාපීය තත්ත්ව යටතේ EGH 10 සහ EGH 11 වඩා හොඳ කාර්යසාධනයක් පෙන්වීය.
- ගුණාත්මකව ඉහළ වැඩි අස්වනු ලබා දෙන වම්බටුවල ‘ලේනඉරි’ වර්ගයේ පළමුවන දුහිතෘ පරම්පරාවේ (කෙළවර වටකුරු) දෙමුහුම් සඳහා අන්තර් අභිජනන ආර සංවර්ධනය සිදු කෙරෙමින් පවතියි.

#### මුල් හා අල බෝග

- විවිධ ‘ඉන්නල’ ආර විසි හතරක් ඇගයීමට ලක් වූ අතර කෘත්‍රිම තත්ත්ව යටතේ සංරක්ෂණය සඳහා ආර 20ක් PGRC වෙත ඉදිරිපත් කරන ලදී.
- අස්වැන්න ඇගයුම් සඳහා ඉස්තරම් ආර 6ක් තෝරා ගැණින.
- මාතර දිස්ත්‍රික්කයේ ගොවි ක්ෂේත්‍ර ආදර්ශන දෙකක් පිහිටුවන ලදී. සාමාන්‍ය අස්වැන්න පිළිබඳ එකඟතාවකට නොඑළඹ උද්භිද විද්‍යාත්මක බීජ මගින් ‘කටු අල’ ස්ථාපනය කළ හැක.
- ඩයස්කොරියා විශේෂ වගා කිරීම සඳහා ජාලාකාර ජලවහන ක්‍රමයක් හඳුනා ගන්නා ලදී.

#### පටක රෝපණය සහ ජෛව තාක්ෂණය

**කෙසෙල් හියුසාරියුම් මැලවීමේ රෝගයට (*Fusarium oxysporium f.sp. cubense* (Foc)) ප්‍රතිරෝධී / ඔරොත්තු දීමේ නලස්ථ විකෘතිජනනය (NARP අරමුදල් ව්‍යාපෘතිය)**

‘අග්‍රා’ නමැති කෙසෙල් ප්‍රභේදයේ කඳ අග්‍රස්ථ 600ක් වසර තුළදී බියගම ගැමා කිරණ මධ්‍යස්ථානයේදී $^{60}$C0 ප්‍රභවය ඇසුරින් ප්‍රවිකිරණයට කොට නොනැසි පවතින පැළෑටි නලස්ථ පරීක්ෂාවට ලක් කරන ලදී.

*Fusarium oxysporium* f.sp. *cubense* අදාළව සිදු කරන ලද පරීක්ෂාව විවිධ FOC ආමුකූලන ක්‍රම 3ක් උපයෝගී කර ගනිමින් සිදු කළ අතර පෙර පරීක්ෂාවන් සඳහා පරීක්ෂා කරනු ලැබූ විට, බඳුන්වලට එන්නත් ක්‍රමය සමඟ (දළ වශයෙන් මිලි ලීටරයට බීජාණු 1.0 x $10^6$) මිලි ලීටර 3ක් එකතු කිරීමෙන් ද්වි බඳුන් පද්ධතිය

ඉක්මන් හා ඉහළ ආසාදනයක් ප්‍රතිඵල ලෙස ලබාදුන් බව හඳුනා ගන්නා ලදී. දිලීරමය සහ රෝපණ ක්‍රමය සමඟ නලස්ථ පරීක්ෂාව සිදු කරන ලද අතර එක් පැළෑටියක් සාදා ගන්නා ලදුව තවදුරටත් ඇගයීම සිදු කෙරෙමින් පවතියි. පැළ කළ 2,375ක සංඛ්‍යාවක් ද්වී බඳුන් පද්ධතියෙහි පරීක්ෂාවට ලක් කෙරුණු අතර පැළ 210ක් රෝගී නියැදිවල අලුතෙන්ම ස්ථාපනය කෙරිණි. රෝගී නියැදියෙහි මාස 18 ජීව්‍යතාව රැඳුණු එක් පැළයක් කෙසෙල් කැනක් නිපදවූ අතර එය අණුකමය තහවුරු කිරීම සඳහා තෝරා ගන්නා ලදී.

### පටක රෝපණය

- කොහුබත් : වැලි (2:1) සහ වැලි පමණක් වූ මාධ්‍ය වල පටක රෝපිත භාවිතයෙන් ඉන්නල නිපදවා ගත හැකිය. පැළ කිරීමෙන් ඉක්මනින් එනම් මාස 3ට පසු අස්වැන්න ලබාගත හැකි අතර එසේ අස්වැන්න ලෙස ලබා ගත් අල ශීතකරණයක් තුළ ගබඩා කොට තබා මිලියනයකට කොටස් 50ක් වූ $GA_3$ සමඟ පැළ කරවා ගත හැකිය. පැළ කිරීමෙන් මාස 5කට පසු අස්වැන්න ලෙස ලබාගත් අල $GA_3$ නොමැතිව ප්‍රරෝහණය කර ගත හැකිය. ප්‍රතිඵල තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණ නැවත නැවතත් සිදු කෙරේ.
- *Dioscrea alata* (රාජ අල) වල නලස්ථ ක්‍රමයෙන් (මකෘත්‍රි) අල නිෂ්පාදනය කිරීමේ පරීක්ෂණයේදී අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබූ මාධ්‍ය සංයෝජන 6කින් (MS + ලීටරයට මිලි ග්‍රෑම් 2ක BAP සමඟ ලීටරයට ග්‍රෑම් 30, 60 සහ 80ක සුක්‍රෝස් ද්‍රව හා ඝන ආකාර) කිසිවක් ප්‍රමාණවත් අල සංඛ්‍යාවක් ලබා නොදුන් බව පෙනී ගියේය.

## මල් වගාව

### නව ඕකිඩ් ප්‍රභේද සංවර්ධනය

- ගැමා ප්‍රවිකිරණයෙන් නිෂ්පාදනය කරන ලද එක් මිටි ශාකයක් හඳුනා ගන්නා ලදී. නව්‍ය ආකාර හඳුනා ගැනීම සඳහා වරණීය ක්‍රියාවලිය තවදුරටත් සිදු කෙරේ.
- සෙවණ ගෘහවල ඇන්තූරියම් සහ ඕකිඩ් වගා තාක්ෂණික ක්‍රම ආදර්ශනය කරන ලදී.

### පැළෑටි ව්‍යාධිවේදය සහ බිම්මල්

- ‘ඌරුපහ’ ආදර්ශනය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය සාර්ථකව නිම කරන ලදී.
- ‘ඌරුපහ’ සහ බිම්මල්වල වෙනත් වල් දර්ශ සාර්ථක ලෙස ගෘහස්ථකරණය කරන ලද අතර මේවා මෘදු දැව කුඩු උපස්ථරයක හෝ මිශ්‍ර උපස්ථරයක් භාවිතයෙන් රෝපණය කළ හැකිය.
- විදේශීය බිම්මල්වල බීජාණු නිෂ්පාදනය ආරම්භ කරනු ලැබ ඇති අතර එහි කටයුතු තවදුරටත් සිදු කෙරෙමින් පවතියි.

### පාංශු විද්‍යාව සහ ශෂ්‍ය විද්‍යාව

- භූමිය ගංවතුරින් මනාසේ ආරක්ෂා වී තිබේ නම් සෝර්ජාන් ක්‍රමයට ඉන්නල, ඇතැම් බතල ප්‍රභේද ඩයස්කොරියා සහ මඤ්ඤොක්කා සාර්ථක ලෙස වගා කළ හැකිය. මුල් තත්ත්වය හා සැසඳීමේ දී ගත වූ වසර තුන තුළ සෝර්ජාන් ක්‍රමය මඟින් පසේ පාංශු රසායනික ගුණාංග (EC සහ pH) වැඩිදියුණු වී තිබේ.
- ටිකියා (*Eleocharis acuta*) ලෙස බහුලව හැඳින්වෙන ආක්‍රමණික වල් පැළෑටිවල රසායනික විශ්ලේෂණය කොම්පෝස්ට් සඳහා භාවිතා කළ හැකිය.

## සංවර්ධන ක්‍රියාකාරකම්

- ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන - තෝරාගත් එළවළු ප්‍රභේදවල නිෂ්පාදනතාව හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික මැදිහත්වීම : සාම්ප්‍රදායික බීජ ප්‍රභේද (බෝග 7ක්) ප්‍රචලිත කිරීම - මාතර දිස්ත්‍රික්කයේ (ගොවීන් 475) සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ (ගොවීන් 202ක්) තෝරාගත් ගෙවතු සඳහා බීජ බෙදා දෙනු ලැබිණ.

- මාතර දිස්ත්‍රික්කයේ මල් වගාව පිළිබඳ වර්තමාන තත්ත්වය හා අනාගත ප්‍රතිමානයන් හඳුනගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකරන ලදී. වගාකරුවන් 300ක සිට දත්ත එකතු කරන ලදී. අලෙවි පහසුකම් නොමැතිවීම, ප්‍රසාරණය සඳහා ප්‍රාග්ධන හිඟය හා ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නොමැතිවීම මාතර දිස්ත්‍රික්කයේ මල් වගාව දියුණු කිරීම සම්බන්ධයෙන් පවතින ප්‍රධාන බාධක ලෙස හඳුනාගන්නා ලදී.

- පවතින නියඟය නිසා රටේ ආහාර හිඟය ජයගැනීමට බතල සහ මඤ්ඤොක්කා වගාව : මෙම වැඩසටහන HORDI හි සහයෝගයෙන් ක්‍රියාත්මක වූ අතර ප්‍රධාන කාර්යය වූයේ ගොවීන් සඳහා බතල හා මඤ්ඤොක්කා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමයි. (අක්කර 0.5ට අඩු වපසරියක් ඇති ගොවීන් සඳහා රෝපණ ද්‍රව්‍ය නොමිලයේ නිකුත් කෙරිණි)

- අකුරැස්ස ගොවිජන සේවා බල ප්‍රදේශය තුළ පුරන් කුඹුරු ඉඩම් සඳහා ගංවතුර ප්‍රධාන ප්‍රශ්නයන් බව ගොවි සමීක්ෂණයේ දී පාර්ශ්වකරුවන් සමඟ පැවති සාකච්ඡා මඟින් අනාවරණ විය.

- අකුරැස්ස ගොවිජන සේවා කොට්ඨාසය තුළ වී වගා කිරීමට නියමු ව්‍යාපෘතියක් සඳහා අක්කර 200 ඉඩමක් හඳුනාගෙන ඇත. ගොවි සමීක්ෂණයක් සිදු කළ අතර යළි වගා කිරීම සඳහා ඉඩම් සැකසීමට ගොවීන්ගේ මූල්‍ය සහාය අපේක්ෂා කරන බව හඳුනා ගන්නා ලදී.

- නිල්වලා ගංගා ද්‍රෝණි පෙදෙස්හි භූමි ඵලදායිතාව වැඩි කිරීම සඳහා මුල් හා අල වර්ග හඳුන්වා දෙන ලදී.

## තාක්ෂණය ව්‍යාප්තිය

**වගු අංක 1.2.5.2: 2017 දී පවත්වනු ලබන පුහුණු වැඩසටහන්**

| පුහුණු වැඩසටහන | පංති සංඛ්‍යාව | සහභාගීවන්නන් සංඛ්‍යාව |
|---|---|---|
| ඕකිඩ් සහ ඇන්තූරියම් වගාව | 25 | 486 |
| ගෙවතු වගාව | 16 | 475 |
| IPM පුහුණු | 16 | 475 |
| උසස් පෙළ සිසුන් සහ විවෘත විශ්වවිද්‍යාල සිසුන්ගේ පුහුණුව | 01 | 91 |
| ශිෂ්‍යයින් සඳහා NVQ 4 සහ 5 පාඨමාලා | - | 03 |
| විසිතුරු පත්‍ර බෝග වගාව සහ අපනයන ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන | 01 | 268 |
| පටක රෝපණ (අඩු පිරිවැය තාක්ෂණික ක්‍රම සමඟ) | | 03 |

## බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

**වගු අංක 1.2.5.3: 2017 දී බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

| රෝපණ ද්‍රව්‍ය | බෝග | ප්‍රභේදය | නිෂ්පාදනය |
|---|---|---|---|
| කැපුම් | බතල | ගන්නොරුව වයිට් | 15,130 |
| | | වෙනත් | 200,000 |
| | මඤ්ඤොක්කා | කිරි කවඩි | 1,000 |
| | | වෙනත් | |
| | රාජ අල විශේෂ | ආකන්ද | ගොවීන් 60ක් සඳහා කිලෝ ග්‍රෑම් 5ක් ගොවීන් 30ක් සඳහා 200ක් |
| | ඉන්නල | තෝරාගත් ආර | කිලෝ ග්‍රෑම් 500 |
| බීජ (සාම්ප්‍රදායික) | ආලංගා | | ග්‍රෑම් 500 |
| | හාල්මැස්සන් දඹල | | ග්‍රෑම් 300 |
| | සාම්ප්‍රදායික මෑ | | කිලෝ ග්‍රෑම් 40 |
| | දඹල | | ග්‍රෑම් 100 |
| | රතු මෑ | | කිලෝ ග්‍රෑම් 2 |
| | මෑ | A9 | ගොවීන් සඳහා අභිජනන බීජ කිලෝ ග්‍රෑම් 3.9 |
| පටක රෝපණය | කෙසෙල් (විවිධ ප්‍රභේද) | පැළ 744ක සංඛ්‍යාවක් | |
| | | ප්‍රජා බඳුන් 65ක් (පැළ 3250) | |
| | | නලස්ථ රෝපණ 13ක සංඛ්‍යාවක් | |
| | | අහල් 2 දැල් බඳුන් 1193 සංඛ්‍යාවක් | |
| බීජාණු | ඇමරිකානු ඔයිස්ටර් | ග්‍රෑම් 200 ඇසුරුම් | 2326 |

**සහභාගි වූ සමුළු සහ සම්මන්ත්‍රණය**

- මල් වගා පර්යේෂණ පිළිබඳ වැඩමුළුව - 2017, පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය.
- සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කෘෂිකාර්මික ජෛවතාක්ෂණ යෙදවුම් පිළිබඳ සම්මන්ත්‍රණය - 07.06.2017 සිට 06.07.2017 දක්වා චීනයේ බීජිං හිදී.
- මාර්ග සහ තීරු රටවල් සඳහා ජුන්කාවෝ තාක්ෂණය පිළිබඳ පුහුණුව (සති 7)
- සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා බෝග පලිබෝධ සහ රෝග

පාලනය සඳහා හරිත පාලනය පිළිබඳ පුහුණුව - 03.05.2017 සිට 01.06.2017 දක්වා චීනයේදී

- නිලධාරීන් සහ කම්කරුවන් සඳහා දෙමළ භාෂා පුහුණුව (පැය 100)

## 2018 වසර සඳහා සැලැස්ම

- උසස් අස්වැන්නක් සහිත, ගුණත්වයෙන් ඉහළ රවුම් හැඩයෙන් යුත් ලේනඉරි වර්ගයේ පළමු වන දුහිතෘ පරම්පරාවේ වම්බටු දෙමුහුම් ප්‍රභේද හඳුන්වා දීම
- ප්‍රේරිත විකෘති මගින් වම්බටු වැඩිදියුණු කිරීම
- දෙමුහුම්කරණය සහ වරණය මඟින් ඉහළ අස්වැන්නක් දෙන පාදස්ථ කුණු වීමට ඔරොත්තු දෙන උසස් තත්ත්වයේ 'පොළොන් මෑ' හඳුන්වාදීමේ කටයුතු සිදු වෙමින් පවතී
- විශිෂ්ට ඉන්නල ආර 6ක (MYT/ NCVT) අස්වැන්න ඇගයීම
- කෝලිකුට්ටුවල තෝරා ගත් විකෘතිවල ක්ෂුද්‍ර ප්‍රචාරණය සහ ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ වැඩිදුර පරීක්ෂා කිරීම
- ඉන්නලවල (*Solenastemon rotundifolius*) අල හටගැනීම පිළිබඳ අධ්‍යයනය
- ඩෙන්ඩ්‍රෝබියම් ඕකිඩ්වල නව ප්‍රභේද ප්‍රවර්ධනය : තෝරාගත් විකෘති පරික්ෂා කිරීම සහ ක්ෂුද්‍ර ප්‍රචාරණය
- මාතර දිස්ත්‍රික්කයෙහි කොළ එළවළු හා අල බෝග (ඉන්නල)වල ශාක පරපෝෂී නෙමටෝඩාවන් හඳුනාගැනීම GIS හා භාවිතා කරමින් නෙමටෝඩා ව්‍යාප්ති රටාව සිතියම්කරණය
- ඉන්නලවල මුල ගැටිති නෙමටෝඩා පාලනයට ස්පෙන්ට් ඔයිස්ටර් බිම්මල් උපස්ථරය (SMS) සහ අඩ වශයෙන් පුළුස්සන ලද පිදුරු (PBPH) උපස්ථරයේ බලපෑම
- දේශගුණික සාධකවල වෙනස්වීමේ රටාව හමුවේ පිපිඤ්ඤා වෛරස් වාහක ගහණ ගතිකය
- උරුපහ සහ ක්ෂීර බිම්මල් සඳහා රෝපණ ප්‍රොටෝකෝල ප්‍රශස්ථකරණය
- ක්ෂේත්‍රයේ දී සහ ගබඩා කර තැබීමේ දී රාජඅල සහ මඤ්ඤොක්කා සම්බන්ධ රෝග හඳුනා ගැනීම
- නිල්වලා ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රමයේ ඉඩම්වල නිෂ්පාදනතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණික ක්‍රම හඳුනා ගැනීම
- එළවළු මත පත්‍ර පොහොර වල යෝග්‍යතාව පිළිබඳ පරීක්ෂා කිරීම
- පටක රෝපිත පැළෑටි යොදා ගනිමින් වසර පුරා ඉන්නල නිෂ්පාදනය පිළිබඳ පර්යේෂණ

### සංවර්ධන වැඩසටහන්

- නිල්වලා ගංගා ද්‍රෝණි ප්‍රදේශයේ ගොවි පවුල් සඳහා මුල් හා අල බෝග හඳුන්වාදීම සහ ප්‍රචලිත කිරීම

### රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

- දේශීය වගාකරුවන් සඳහා ක්ෂුද්‍ර ප්‍රචාරණය මඟින් ඕකිඩ් (ඩෙන්ඩ්‍රෝබියම්) නිපදවන ලදී.
- බිම්මල් බීජාණු නිපදවීම

**පුහුණු වැඩසටහන්**

ගෙවතු වගාව, ඔකිඩ් සහ ඇන්තූරියම් වගාව, ඒකාබද්ධ පලිබෝධ කළමනාකරණය භාවිතාවන්, විචිත්‍ර පත්‍රික ශාක වගාව, බිම්මල් වගාව, පොලි සැක් මළුවල 'ගන්නෝරුව වයිට්' බතල වගාව, ක්ෂුද්‍ර ප්‍රචාරණය පිළිබඳ පුහුණුව (අඩු වියදම් විකල්ප සමඟ)

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 03 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 02 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 03 |
| සංවර්ධන නිලධාරි | 03 |
| කෘෂිකර්ම උපදේශක | 04 |
| පර්යේෂණ සහකාර | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| තාක්ෂණික සහායක | 02 |
| ගොවිපළ ලිපිකරු | 02 |
| රියදුරු | 02 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| ගබඩාකරු | 01 |
| පර්යේෂණ උප සහකාර | 02 |
| කාර්යාල සේවක | 01 |
| මුරකරු | 06 |
| කම්කරු | 24 |
| සනීපාරක්ෂක කම්කරු | 00 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 06 |
| **එකතුව** | **68** |

## 1.2.6. කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - ගිරාඳුරුකෝට්ටේ

ගිරාඳුරුකෝට්ටේ පිහිටි කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථානය, මහවැලි C කලාපයෙහි කෘෂිකාර්මික පරිසරය සහ පරිසර පද්ධතිවල තිරසර පැවැත්ම තහවුරු කරමින් ගොවිපල නිෂ්පාදනතාව ඉහළ නැංවීම සඳහා කෘෂි පර්යේෂණ තාක්ෂණය සංවර්ධනය ප්‍රධාන වගකීම කොට ගත් ආයතනයකි. එසේම ජාතික වශයෙන් වැදගත් යැයි සලකනු ලබන විශේෂ කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාකාරකම්වලද එය නිරත වෙයි.

වර්තමානයේදී මෙම ආයතනය ක්‍රියාත්මක වන්නේ ගන්නෝරුව පිහිටි HORDI ආයතනයේ පරිපාලනය යටතේය.

පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්වලට අමතරව පර්යේෂණායතනය, නිලධාරීන්ට, ගොවීන්ට, පාසල් ළමයින්ට සහ වෙනත් ආයතනවල අදාළ පුද්ගලයන් හට කෘෂිකර්මාන්තතය හා සම්බන්ධයෙන් ප්‍රධාන සේවා සැපයුම්කරුවෙක් ලෙස ක්‍රියාකරයි.

### අයවැය

**වගු අංක 1.2.6.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 3,843,081 | 2,878,395 | 75 |
| මූලධන | 2,516,000 | 457,698 | 18 |
| **ව්‍යාපෘති** | | | |
| • පළමු දරු පරම්පරාවේ දෙමුහුම් සහ විවෘතව පරාගිත ප්‍රභේද සංවර්ධනය සහ මූලික බීජ නිෂ්පාදනය | 800,000 | 745,564 | 93 |
| • සර්ම කලාපිය පලතුරු බෝගවල ජෛව විවිධත්ව උද්‍යානයක් ගිරාඳුරුකෝට්ටේහි ස්ථාපනය සඳහා අණුකමය ක්‍රමවේද භාවිතයෙන් තෝරාගනු ලැබූ පලතුරු ජනකප්ලාස්මා සංරක්ෂණය සහ ලාක්ෂණීකරණය | 1,271,000 | 1,118,212 | 88 |
| • අල බෝගවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය | 100,000 | 79,600 | 80 |
| **එකතුව** | **8,530,081** | **5,279,469** | 62 |

## ප්‍රගතිය

### පර්යේෂණ

### දේශිය වශයෙන් එක්රැස් කරගත් එළබටු ආර ඇගයීම

$S_6$ ආර තුනක්, $S_5$ ආර 18ක්, $S_2$ ආර 9ක්, $S_1$ ආර 2ක් සහ ආර 8ක් මූලික අස්වනු අත්හදා බැලීම් සඳහා තෝරාගනු ලැබූ අතර එයින් ආර 4ක් ඉහළ අස්වනු ලබා දෙන ආර වශයෙන් වරණය කර ගනු ලැබිණ. ව්‍යාධිවේදමය සහ කීට විද්‍යාත්මක පරීක්ෂාවන් සඳහා සියලුම ආර HORDI වෙත යවන ලදී. ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂාව (NCVT) තෝරාගනු ලැබූ ආර සඳහා බීජ නිෂ්පාදන වැඩසටහන සම්පූර්ණ කරන ලදී. NCVT වැඩසටහන සඳහා ආර 4ක් තෝරා ගැණින.

### බණ්ඩක්කා බෝග වැඩිදියුණු කිරීම

තුන්වැනි දුහිතෘ පරම්පරා මට්ටමේ විවිධ ආර 28ක් ද දෙවන දුහිතෘ පරම්පරාවේ අසංයෝගිත ගහණයෙන් නව ආර 17ක් ද තෝරා ගන්නා ලද අතර සියලුම ආර රූපවිද්‍යාත්මක ලෙස වර්ගීකරණය කරන ලදී. නව ආගන්තුක ජනකප්ලාස්මා 5ක් වැඩසටහනට එකතු කෙරිණ. හැකි සියලුම මුහුම්කරණයක් සිදු කෙරිණ.

### තක්කාලි උෂ්ණත්ව පරීක්ෂාව යටතේ අත්හදා බැලීම

සැසඳුම් ප්‍රභේද තුනක් සමඟ විවිධ ආර 12ක් පරීක්ෂා කරන ලදී. පුෂ්පීය ලක්ෂණ සහ අස්වනු පරාමිතීන් වාර්තා කර ගත් අතර විවිධ ආර 4ක් තෝරා ගැණින.

### අන්තර් අභිජනන ආර සංවර්ධනය

බලාපොරොත්තු තැබිය හැකි ආර තුනක් හඳුනාගන්නා ලද අතර මූලික අස්වනු පරීක්ෂාව අවසන් කරන ලදී.

### ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂාව (NCVT)

පහත සඳහන් එළවළු බෝග සඳහා ජාතික සමෝධානිත ප්‍රභේදමය අත්හදා බැලීම් සිදු කරන ලදී.

**වගු අංක 1.2.6.2: NCVT පැවැත්වූ එළවළු වර්ග**

| බෝගය | 2016/17 මහ | 2017 යල |
|---|---|---|
| වම්බටු | දෙමුහුම් 05, විවෘත පරාගිත 02 | විවෘත පරාගිත 02, දෙමුහුම් 01 |
| මෑ | දෙමුහුම් 06 | |
| වට්ටක්කා | දෙමුහුම් 05 | |

### සාම්ප්‍රදායික එළවළු පාරිශුද්ධකරණ සහ බීජ නිෂ්පාදන වැඩසටහන

රතු බණ්ඩක්කා ආර දෙකක සහ මහවැලි මෑ ආරක බීජ නිෂ්පාදනය සම්පූර්ණ කරන ලදී.

### ශාක වර්ධක නියාමන පරීක්ෂා කිරීම

ශාක වර්ධක නියාමන (PGR) පරීක්ෂණ අත්හදා බැලීම් 6ක් නිම කරන ලදී. එක් ශාක වර්ධක නියාමන පරීක්ෂණ අත්හදා බැලීමක් තවදුරටත් සිදුකෙරෙමින් ඇත.

### කඳ සහ කරල් විදින්නන්ට ප්‍රතිරෝධී වම්බටු එකතුවක් සඳහ පරීක්ෂා කිරීම

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ ජනකප්ලාස්මා, නව අභිජනන ආර සහ ඇතැම් වල් දර්ශයන් සමීප ආර පරීක්ෂා කරන ලද අතර ක්ෂේත්‍රයට ඔරොත්තු දුන් ආර 17ක් තෝරා ගන්නා ලදී. එසේ තෝරා ගන්නා ලද ආර වැඩිදුර තහවුරු කිරීම් සඳහා ක්ෂේත්‍රයේ ස්ථාපනය කරන ලද අතර අත්හදාබැලීම් තවදුරටත් සිදු කෙරේ.

## පලතුරු

### *Anona muricata* ඇගයීම සහ බහුගුණනය

අනෝදා එකතුන් 180ක සහ අඹ එකතුන් 104ක රූපවිද්‍යාත්මක වර්ගීකරණය දැන් ක්‍රියාත්මක තත්ත්වයේ ඇත. ඉහළ බ්‍රික්ස් අගයක් ගන්නා තෝරා ගනු ලැබූ එකතුන් ද ඇතුළත් ව එකතුන් 28කින් නියැදි එක් රැස් කර ගන්නා ලදී. මෙකී එකතුන්වල DNA නිස්සාරණය අවසන් කර ඇත. තෝරා ගනු ලැබූ පැළවල ප්‍රචාරණය ආරම්භ කරනු ලැබ තිබේ.

### විදේශීය අඹවල ජනකප්ලාස්මා ඇගයීම, ලාක්ෂණීකරණය සහ බහුගුණනය

රූපවිද්‍යාත්මක වර්ගීකරණය අවසන් කොට ඇත. බ්‍රික්ස් අගය අනුව රසවත් එකතුවක් වශයෙන් විදේශීය එකතුන් පහක් තෝරා ගන්නා ලදී. නව පැළ 100 නිපදවිණ.

### වී (NCRVT)

මාස 3 සහ මාස 3½ වයස් කාණ්ඩ 2016/17 මහ සහ 2017 යල කන්න සඳහා ජාතික සමෝධානිත වී ප්‍රභේදමය අත්හදා බැලීම් සිදු කරන ලදි.

## සංවර්ධන වැඩසටහන්

### පලතුරු

හෙක්ටයාර 1.5ක වර්ග ප්‍රමාණයෙන් යුත් ඌන උපයෝජිත පළතුරු උද්‍යානයක් ස්ථාපනය කරන ලදී. පලතුරු බෝග විශේෂ 37ක් එහි සිටුවන ලදී.

### යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාරකම්

සමාලෝචනයට අයත් කාල සීමාව තුළදී ගබඩා කාර්යාල ගොඩනැගිල්ල නවීකරණය ආරම්භ කරන ලදී. එහි වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතියි. බීජ නිස්සාරකයක්, පසු අස්වනු ක්‍රියාදාම ගොඩනැගිල්ලක් පිහිටුවන ලද අතර කාර්යාල පරිශ්‍රයෙහි අපවහන පද්ධතියක් ද වසර තුළ දී සංවර්ධනය කෙරිණ.

### තාක්ෂණ ව්‍යාප්තිය

දැනුම්වත් කිරීමේ වැඩසටහන් තුනක් පවත්වන ලද අතර තම ක්ෂේත්‍ර ගැටළු විසඳා ගැනීම පිණිස පාසල් සිසුහු 105කට වැඩි පිරිසක් සහ වගා ක්ෂේත්‍ර 15ක් නැරඹූහ. මහවැලි අධිකාරිය මඟින් සංවිධාන කරන ලද බෝග සායන සඳහා නිලධාරීහු සහභාගී වූහ.

### බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ රෝපණ ද්‍රව්‍ය පහත ප්‍රමාණවලින් නිෂ්පාදනය කොට ගොවීන් අතර සහ මහවැලි අධිකාරිය අතර බෙදා දෙන ලදී.

## 2018 වසර සඳහා සැලැස්ම

- මෑ, වම්බටු සහ වට්ටක්කා සඳහා ජාතික සමෝධානිත ප්‍රභේදමය අත්හදා බැලීම
- ජාතික සමෝධානිත ප්‍රභේදමය අත්හදා බැලීම (NCRVT)
- පැෂන් පළතුරු ජනකප්ලාස්මා ඇගයීම
- පවතින පළතුරු බෝග ජනක ප්ලාස්මා ඇගයීම
- එළබටු ප්‍රභේද සංවර්ධනය
- බණ්ඩක්කා අන්තර් අභිජනන ආර සංවර්ධනය
- NCVT සහ VAT අත්හදා බැලීම් (එළවළු /වෙනත් ක්ෂේත්‍ර බෝග)
- අභිජනන බීජ නිෂ්පාදන වැඩසටහන

## කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 06 | 01 |
| පර්යේෂණ සහකාර (අධිශ්‍රේණි) | 01 | - |
| කෘෂිකර්ම උපදේශක | 05 | 01 |
| පර්යේෂණ සහකාර | 04 | 05 |
| තාක්ෂණික සහායක | 03 | 03 |
| ගොවිපළ ලිපිකරු | 01 | 01 |
| රියදුරු | 01 | 01 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 02 | 02 |
| ගබඩාකරු | 01 | 01 |
| පැස්සුම්කරු | 01 | 01 |
| බද්ධකරු | - | 01 |
| පර්යේෂණ උප සහකාර | 02 | 02 |
| මුරකරු | 07 | 05 |
| නුපුහුණු කම්කරු (III ශ්‍රේණිය) | 47 | 46 |
| කම්කරු (කොන්ත්‍රාත්) | | 12 |
| **එකතුව** | **82** | **83** |

# 1.3 පලතුරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය - හොරණ

පලතුරු බෝගවල නිෂ්පාදනතාව සහ ගුණත්වය මෙන්ම පාර්ශ්වකරුවන් කරා ඒවායෙහි මූලික ව්‍යාප්තිකරණය ඉහළ නැංවීම සම්බන්ධයෙන් වගකිවයුතු ආයතනය වශයෙන් හොරණ පිහිටි පලතුරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනයත් (FRDI) එහි පරිවාර ස්ථානත් හඳුන්වා දිය හැකිය. වත්මන් පර්යේෂණ වැඩසටහන් පහත සඳහන් ප්‍රධාන අංශ වටා කේන්ද්‍රගත වී ඇති අතර ඒවා නම්, ඉහළ අස්වනු සහ උසස් ගුණත්වයෙන් යුතු ප්‍රභේද සංවර්ධනය, වැඩිදියුණු කළ බෝග කළමනාකරණ භාවිතාවන්, බෝග ආරක්ෂණය, පෝෂණ කළමනාකරණය, පසු අස්වනු, පිරිසැකසුම් සහ අගය එකතු කිරීම හා ශාක ප්‍රචාරණ තාක්ෂණ යනාදියයි. ඊට අමතරව නිර්දේශිත පලතුරු බෝගවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය එනම් විශේෂයෙන්ම මවු ශාක වශයෙන් නිෂ්පාදනය සම්බන්ධයෙන් ආයතනය විසින් වගකීම දරනු ලබයි. පලතුරු ගම්මාන ස්ථාපනය සහ ජෛව විවිධත්ව ගම්මාන සංවර්ධනය මෙම ආයතනය යටතේ ක්‍රියාත්මක ප්‍රධාන සංවර්ධන වැඩසටහන්ය.

FRDI පද්ධතිය හොරණ පිහිටි ප්‍රධාන පර්යේෂණ ආයතනයෙන් ද, ගන්නෝරුව පිහිටි පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයෙන් ද, (FCRDS), හෝමාගම පැළෑටි වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානයෙන් (PVIC) ද, මදුරුකැටිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයෙන් (ARS) ද, මුතුකණ්ඩිය පර්යේෂණ ස්ථානයෙන් ද, බිබිලේ පිහිටි පැහිරි පර්යේෂණ ස්ථානයෙන් ද, එරමිණිගොල්ල රඹුටන් පර්යේෂණ ඒකකයෙන් ද, කුණ්ඩසාලේ ජාතික පලතුරු ප්‍රභේද සංරක්ෂණ මධ්‍යස්ථානයෙන් ද, අඹතැන්න උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපළෙන් ද සමන්විත වෙයි.

## අයවැය

**වගු අංක: 1.3.1 වාර්ෂික අයවැය - 2017** (එරමිණිගොල්ල සහ අඹතැන්න උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපළවල් හැර)

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 15,819,743 | 14,552,557 | 92 |
| මූලධන | 7,526,360 | 7,105,177 | 94 |
| ව්‍යාපෘති | | | |
| • NARP (FR-FRI-285-2-2-5-2502) | | | |
| ○ දෙමුහුම්කරණය මගින් පැෂන් ෆෲට් ප්‍රභේද සංවර්ධනය සහ සංයුක්ත බීජ නිෂ්පාදනය | 892,800 | 828,946 | 93 |
| ○ ඇතැම් කළමනාකරණ භාවිතාවන් මගින් මිල්ලෑව සුවඳැල් කෙසෙල්වල (*Musa* Spp.) අස්වැන්න සහ තත්ත්වය වැඩිදියුණු කිරීම | 1,291,600 | 1,235,352 | 96 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| ○ උසස් තත්ත්වයේ පැඟිරි ප්‍රභේද සංවර්ධනය (පැණි දොඩම් සහ නාරං ප්‍රභේද ) | 1,656,000 | 1,584,852 | 96 |
| ○ නිෂ්පාදනතාව සහ ගුණත්වය වැඩිදියුණු කිරීම සඳහා බෙලි (*Aegle marmelos*), ජම්බු (*Syzygium samarangense*), ලංකා වෙරළු (*Elaeocarpus serratus*), අනෝදා (*Annona muricata*), සැපදිල්ලා (*Manilkara zapota*) වල පුෂ්පීකරණ රටාවෙහි සහ පුෂ්ප ජෛව විද්‍යාවෙහි ලාක්ෂණීකරණය | 1,368,500 | 1,397,264 | 102 |
| ○ එල හට ගැනීම සහ පසු අස්වනු ආයු කාලය නියාමනය හා ශ්‍රී ලංකාවේ හමුවන *Annona muricata* L. එකතුන්ගෙන් තෝරා ගනු ලැබූ එකතුන්හි ජෛව සක්‍රිය සංයෝගවල විවිධත්වය විමර්ශනය | 1,170,000 | 1,000,507 | 86 |
| ○ සමෝධානිත ප්‍රවේශයක් ඔස්සේ සුදු මුල් රෝගය කළමනාකරණය කිරීම | 100,000 | 99,417 | 99 |
| • විවෘත පරාගිත සහ දෙමුහුම් ප්‍රභේද සංවර්ධනය සහ බීජ නිෂ්පාදනය (පලතුරු බෝග) (FR-FRI-285-2-2-8-2502) | 5,700,000 | 4,956,746 | 87 |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන - පර්යේෂණ ව්‍යාපෘති (118-2-3-20-2502 (II)) | | | |
| ○ තෝරා ගනු ලැබූ පලතුරු බෝගවල පසු අස්වනු හානිය අවම කරලීම සඳහා භාවිත පැකේජ සංවර්ධනය | 800,000 | 807,052 | 101 |
| ○ නිරෝගී නාරං රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා නලස්ථ තාක්ෂණය හඳුන්වාදීම. | 700,000 | 671,983 | 96 |
| ○ ප්‍රධාන පලිබෝධ ගැටළු කළමනාකරණය මගින් පලතුරු බෝගවල නිෂ්පාදිතතාව ඉහළ නැංවීම | 375,000 | 283,056 | 75 |
| • අලිපේර හා අනෝදාවල සුලභව දැකිය හැකි පසු අස්වනු එල කුණුවීමේ රෝගය පාලනය කිරීම සඳහා පාලන ක්‍රම සංවර්ධනය කිරීම | 500,000 | 385,751 | 77 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| • පළතුරු ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය (වැය ශීර්ෂය: 285-2-2-9-2502) | 15,000,000 | 14,991,630 | 100 |
| • ජෛව විවිධත්ව ව්‍යාපෘතිය (වැය ශීර්ෂ: 285-2-2-10-2502) | 25,000,000 | 20,905,692 | 84 |
| **එකතුව** | **77,900,003** | **70,805,982** | **91** |

## ප්‍රගතිය

### බෝග ප්‍රවර්ධනය

#### අඹ

අළුතෙන්ම සංවර්ධනය කරන ලද දෙමුහුම් 21 ද පෙර අවස්ථාවලදී සංවර්ධිත දෙමුහුම් 07ක් ද තවදුරටත් අගයන ලදී. ඊට අමතරව FRDI ක්ෂේත්‍රයෙහි ස්ථාපනය කරන ලද අඹ එකතුන් 141කින් එකතුන් 91ක අස්වැන්න සහ පලතුරුවල ගුණාත්මක තත්ත්වය පිළිබඳ දත්ත එක් රැස් කරන ලදී. බලාපොරොත්තු තැබිය හැකි එකතුන් 11කින් අඛණ්ඩව ඵල දැරීම සහ ඉහළ ගුණත්වයෙන් යුත් ඵල ලබාදෙන්නා වූ එක් එකතුවක් “හොරණ හිරු” වශයෙන් පහතරට තෙත් කලාපයේ වගා කිරීම සඳහා නිර්දේශ කරන ලදී.

#### දූරියන්

නව එකතුන් දෙකක් එක්රැස් කොට ජාන බැංකුවෙහි ස්ථාපනය කරන ලද අතර පූර්වයෙන් එක්රැස් කර ගන්නා ලද එකතුන් 36ක ලාක්ෂණිකරණය සහ ඇගයීම අඛණ්ඩව සිදු කරගෙන යන ලදී.

කුඩා බීජ, ඉහළ අස්වනු සහ මාංසල වැඩි යනාදී විශේෂ ලක්ෂණවලින් සමන්විත මවු ශාක භාවිතයෙන් නව දෙමුහුම් 150ක් සංවර්ධනය කරන ලදී. පෙර අවස්ථාවල දී සංවර්ධනය කරන ලද පළමු දුහිතෘ පරම්පරාවේ දෙමුහුම් 160ක් ක්ෂේත්‍රයේ දී ඇගයෙමින් පවතී. කාර්යසාධනයට අදාළ දත්ත රැස් කිරීම සිදු කෙරෙමින් තත්ත්වයේ පවතියි.

#### පැඟිරි

ඉහළ අස්වනු සහ උසස් ගුණත්වයෙන් යුතු නාරං, දොඩම්, ජම්බෝල සහ දෙහි ප්‍රභේද හඳුනාගැනීමේ අරමුණින් දේශීය ජනකප්ලාස්ම එකතු කිරීම සහ ඒවා ක්ෂේත්‍ර ජාන බැංකුවේ දී ඇගයීම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතියි. වසර තුළ දී නව දෙහි ජනකප්ලාස්මා 10ක් සහ නව නාංර ජනකප්ලාස්මා 4ක් එක්රැස් කොට FRDI ජාන බැංකුවෙහි ස්ථාපනය කරන ලදී. ජාන බැංකුවෙන් තෝරා ගනු ලැබූ බලාපොරොත්තු තැබිය හැකි එකතුන් වැඩිදුර ඇගයීම පිණිස ප්‍රතිවලිත අත්හදා බැලීමක් වශයෙන් ස්ථාපනය කරන ලදී. තෝරා ගනු ලැබූ එක් නාරං ප්‍රභේදයක් “හොරණ ජූසි” වශයෙන් පහතරට තෙත් කලාපයේ වගා කිරීම සඳහා නිදහස් කරන ලදී.

දෙමුහුම් සංවර්ධනය සඳහා පැණි දොඩම්, ජම්බෝල සහ නාරංවල තෝරා ගනු ලැබූ මවු ශාක අතර මුහුම්කරණ සිදු කරනු ලැබූ අතර ඇගයීම සඳහා නාරං දෙමුහුම් පැළ 200ක් ක්ෂේත්‍රයේ ස්ථාපනය කරන ලදී. පැණි දොඩම් සහ ජම්බෝල දෙමුහුම් ශාක තවාන් අවධියෙහි පවතියි.

උසස් තත්ත්වයේ ඉහළ අස්වනු ලබා දෙන බීජ රහිත හෝ බීජ අඩු විකෘති සහිත පැඟිරි ප්‍රභේද නිපදවීමේ අභිමතාර්ථයෙන් ගැමා ප්‍රවිකිරණයට ලක් කරනු ලැබූ ශාක

එල සහ ශාකමය ලක්ෂණ සඳහා අඛණ්ඩව ඇගයීමට ලක්වෙමින් පවතියි.

### ගස්ලබු

හොරණ ගස්ලබු දෙමුහුම් - 1 (රත්න කිලෝ ග්‍රෑම් 2.8 සහ Cp-13 - ග්‍රෑම් 300) ජනක ශාකවල අභිජනන බීජ සහ දෙමුහුම් බීජ (කිලෝ ග්‍රෑම් 2.7) හොරණ පිහිටි FRDI හිදී 2017 වර්ෂය තුළ දී නිපදවන ලද අතර SCS මගින් සහතික කරන ලදී. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ඇති මහගම ගොවිපළ සහ බටඅත රජයේ බීජ ගොවිපළ තුළ බීජ නිෂ්පාදන නියැදි ද ස්ථාපනය කරන ලදී.

නව ගස්ලබු ආරක් සහ පූර්වයෙන් හඳුනා ගනු ලැබූ ගස්ලබු ආර තුනක් අභිජනන ආර සංවර්ධනය කිරීම පිණිස තුන්වන ස්වපරාගන පරම්පරාව දක්වා ඉදිරියට ගෙන යන ලදී.

### පැෂන් ෆෘට්

විශාල එල සහිත වැඩි යුෂ ප්‍රමාණයක් සැපයෙන තත්ත්වයේ සංචිතයක් සහ ගුණත්වයෙන් යුත් සංයුක්ත පැෂන් ෆෘට් ප්‍රභේදයක් ගෝල්ඩ් පැෂන් වශයෙන් වාණිජ බෝග වගාව සඳහා නිදහස් කරන ලදී. බීජ ව්‍යාප්ති හැකියාව ප්‍රභේදයේ අමතර වාසිදායක තතත්ත්වයකි. පැෂන් ෆෘට් මොට්ල් වෛරසයට ඔරොත්තු දෙන ඉහළ අස්වැන්නක් සහිත තෝරා ගනු ලැබූ ප්‍රභේද පහක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සිදු කරන ලදී. පැෂන් ෆෘට්වල ස්වසංගතතාව පිළිබඳ ප්‍රවේණි අධ්‍යයනය අඛණ්ඩව සිදු කරන ලදී.

### කොස්

එකතුන් 26ක් ඇගයෙමින් පවතින අතර ඒවා අතුරින් බලාපොරොත්තු තැබිය හැකි එකතුන් දෙකක් හඳුනාගනු ලැබ වැඩිදුර ඇගයීම සඳහා ස්ථාන දෙකක සංස්ථාපනය කරන ලදී.

### බෙලි (*Aegle marmelos*)

බෙලි එකතුන් හි එක්රැස් කිරීම සහ ඇගයීම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතියි. අගයන ලද එකතුන් 36ක් අතුරින් බලාපොරොත්තු තැබිය හැකි එකතුන් 36ක් අගයන ලදී. මෙම එකතුන් දෙකෙන් බද්ධ පැළ 500ක් නිපදවන ලද අතර ඒවායෙහි අනර්ඝත්වය සහතික කර ගැනීම පිණිස තෝරාගත් ගොවීන් අතර බෙදා හරින ලදී. පුෂ්ප ජෛව විද්‍යාව සහ පුෂ්පීකරණ රටා අධ්‍යයනය නිම කරන ලද අතර අවසන් ප්‍රතිඵලය 2017 ASDA හි පළ කරන ලදී.

### අනෝදා

එකතුන් තිස් තුනක් එක්රැස් කරන ලද අතර (අනෝදා 19, වැලි අනෝදා 09, සීනි අනෝදා 03, රොලිනියා 02) ක්ෂේත්‍රයේ ස්ථාපනය කෙරිණ. එක්රැස් කිරීම සහ ඇගයීම අඛණ්ඩව සිදු කෙරේ.

## වෙනත් පලතුරු බෝග සහ දෘඪ එල බෝග

අනෝදා, සැපදිල්ලා සහ වෙරළු යනාදියෙහි පුෂ්ප රූපීය විද්‍යාව, පුෂ්ප ජෛව විද්‍යාව, පරාගන රටාව, කලංක ග්‍රාහකත්වය සහ පරාගවල ජීව්‍යතාව පිළිබඳ අධ්‍යයන මෙහෙයවන ලදී. බෝග වර්ග තුනම සඳහා වර්ෂය පුරාම කාලගුණ පරාමිතීන්වලට සාපේක්ෂව පුෂ්පීකරණ රටාව අධ්‍යයනය කරන ලදී. ප්‍රතිඵල තහවුරු කිරීම පිණිස අධ්‍යයනයන් තවදුරටත් සිදු කරගෙන යන ලදී.

පැසිෆ්ලෝරා (Passiflora), අනෝනා (Annona) සහ අනානාස් (Ananas) ගණවල අන්තර් විශේෂ මුහුම්කරණය තවදුරටත් අඛණ්ඩව සිදු කෙරෙමින් පවතියි. අන්නාසි දෙමුහුම් 12ක පුෂ්පීකරණ රටාව නිරීක්ෂණය කරන ලදී. *Passiflora miniata* සහ *Passiflora edulis flavicarpa* අතර මුහුම්කරණය සාර්ථක වූ අතර එල හටගැනීම ද සාර්ථක විය.

හිතකර විකෘති ජනනය කර ගැනීම සඳහා බෙලි, මැංගුස්ටීන් සහ සැපදිල්ලා බීජ ගැමා ප්‍රවිකිරණයට ලක් කරන ලද අතර අළුතින්ම සංවර්ධනය කරන ලද විකෘති ඇගයීම ක්‍රියාත්මක තත්ත්වයේ පවතියි.

දේශීය වශයෙන් සොයාගත හැකි විභව දෘඪ බෝග එනම් ආමන්ඩ් (*Prunus dulcis* (Mill)), වල් දෙල් (*Artocarpus nobilis*), කොස් දෙල් (*Artocarpus camansi*) හි ජනකප්ලාස්මා එක්රැස් කිරීමේ වැඩසටහන ආරම්භ කළ අතර දෘඪ ඵලයක් ලෙස භාවිතා කළ හැකි සුදුසු බෝග හෝ ප්‍රභේද හඳුනාගැනීම අරමුණ විය. විවිධ බෝගවලින් විවිධ එකතුන් දහහතරක් එක්රැස් කොට වැඩිදුර ඇගයීම පිණිස බද්ධ කරන ලදී. එසේ වුව ද බද්ධ කරන ලද පැළ මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කළ අතර මූල පද්ධතිය හා අසංගත ප්‍රතික්‍රියාවක් පෙන්නුම් කළේය. එබැවින් ඉහත සඳහන් බෝග සම්බන්ධයෙන් බද්ධ කිරීමේ තාක්ෂණය පිළිබඳ අධ්‍යයනයන් ආරම්භ කරන ලදී.

නව සර්ම කලාපීය පලතුරු බෝගයක් වන Salak හෙවත් Snake fruit (*Salacca zalacca*) වල එකතුන් හඳුන්වා දෙන ලද අතර දේශීය තත්ත්ව යටතේ ගැළපීම දැන ගැනීම පිණිස ඇගයෙමින් පවතියි. එකතුන් කිහිපයක පුෂ්පීකරණය සහ ඵල හටගැනීම නිරීක්ෂණය වූ අතර දත්ත රැස් කිරීම අඛණ්ඩව සිදු කෙරේ.

## ශෂ්‍ය විද්‍යාව

කෙසෙල් කැනක පහළ ඇවරි වෙන්කිරීම, වර්ධක උත්තේජන ශාකයට ලබාදීම සහ ඵල නෙළීමේ නිවැරදි අවස්ථාව ආදී වශයෙන් ඇතැම් විශේෂ කළමනාකරණ යෙදවීම් මගින් මිල්ලැව සුවඳැල් කෙසෙල් ප්‍රභේදයෙන් ඉහළ ඵලදාවක් සහ උසස් තත්ත්වයක් අපේක්ෂාවෙන් පරීක්ෂණ කිහිපයක් සිදු කර ඇත.

මොරොයියන් හට ගැනීමෙන් සති 15ක දී සහ 16ක දී පළමු ශාකයෙහි ඉහළ ඵලදාවක් සහ උසස් තත්ත්වයෙන් යුත් කෙසෙල් කැන් හටගත් අතර දෙවන ශාකය සම්බන්ධයෙන් ද තත්ත්වය එලෙසින් ම සාර්ථක විය.

කෙසෙල් ඇවරි අතර අක්කපාන (*Kalanchoe pinnata)* පත්‍ර විවිධ ක්‍රමවේදයන්ට අනුව ඇසිරීම මගින් කෙසෙල් ගෙඩිවල ඵලදාව සහ තත්ත්වය සාධනීය අන්දමින් ඉහළ නැංවිණ. *Kalanchoe pinnata* යෙදීම සමඟ ඇවරි වෙන් කිරීම ද කෙසෙල් ගෙඩිවල ප්‍රමාණය වැඩි කළේය.

අනෝදා (A*nnona muricata L)* වල රිකිලි බද්ධයේ සාර්ථකත්වය කෙරෙහි මූල පද්ධතියෙහි කඳේ විශ්කම්භය සහ අනුජයේ පරිණත අවධියෙහි බලපෑම අධ්‍යයනය කිරීම සඳහා පරීක්ෂණයක් පවත්වන ලදී. ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන ලද්දේ අඩක් පත්‍ර සහිත දළු සහිත අනුජය, අර්ධ පත්‍ර සහිත මේරූ රිකිල්ල හෝ පත්‍ර රහිත මේරූ රිකිල්ල (පත්‍ර සියල්ල ඉවත් කරමින්) මිලි මීටර් 2 - 4 හෝ මිලි මීටර් 5 - 7 කඳ විශ්කම්භය වූ මූල පද්ධතියකට බද්ධ කිරීමෙන් සාර්ථක ලෙස රෝපණ ද්‍රව්‍ය නිපදවා ගත හැකි බවයි.

අස්වැන්න සහ තත්ත්වය කෙරෙහි අනෝදාවල (*Annona muricata* L) විවිධ වගා පරතරයන්ගේ බලපෑම අධ්‍යයනය කිරීම සඳහා පරීක්ෂණයක් ආරම්භ කරන ලද අතර අත්හදා බැලීම අඛණ්ඩව සිදු කෙරේ.

අඹවල වියන් කළමනාකරණය, ඉහළ ඝනත්වයෙන් යුක්තව වගා කිරීම සහ PGR වල භාවිතය පිළිබඳ අධ්‍යයනය ආරම්භ කරන ලදුව අඛණ්ඩව සිදු කෙරෙමින් පවතියි.

අන්නාසිවල කිරුළ රෝපණ ද්‍රව්‍ය වශයෙන් භාවිතා කිරීමේ හැකියාව හඳුනාගැනීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. මාස 2ක් දක්වා සිවු වරක් පත්‍ර වලට පොහොර යෙදීමෙන් මාස 6කට පසු අන්නාසි කිරුළෙහි පැළ,

මූල හා අක්ෂීය මොරෙයියන්ගේ පැළ වල විශාලත්වයට සමාන විය. වර්ග තුනෙහිම ඵලයෙහි ලක්ෂණ සහ තත්ත්ව පරාමිතීන් සමාන වී තිබිණ.

## බෝග ආරක්ෂණය

### පැළෑටි ව්‍යාධිවේදය

සමෝධානිත ප්‍රවේශයක් තුළින් බහුවාර්ෂික පලතුරු ශාකවල මුල්වලට වැළඳෙන රෝග පාලනය සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. විවිධ මාධ්‍ය, විවිධ උෂ්ණත්ව මට්ටම්, pH මට්ටම් සහ ආලෝක තීව්‍රතා යටතේ සමූහ රූපවිද්‍යාත්මක හා වර්ධක ලක්ෂණ හඳුනාගන්නා ලද අතර කොස් ගස්වල මුල් හා පාදස්ථ කුණු වීමට හේතු වන ව්‍යාධිජනකයන් (*Rigidoporus microporus, Fusarium solani* සහ *Fusarium oxysporum*) සඳහා උචිතම ක්ෂුද්‍ර පාරිසරික තත්ත්ව හඳුනාගන්නා ලදී. නලස්ථ ද්විත්ව රෝපණ ක්‍රමයෙන් සහ සජීවස්ථ බඳුන් තත්ත්වවල කෘත්‍රිමව ආමුකූලනය කරන ලද මුල් කැබලි තැන්පත් කිරීමෙන් ව්‍යාධිජනකයන් පාලනය කිරීම පිණිස යෝග්‍ය සතුරන් තෝරා ගැණින. ට්‍රයිකොඩර්මා විශේෂ සඳහා ප්‍රශස්ථ මූලික ආමුකූලන බඳුන් මිශ්‍රණය තෝරා ගන්නා ලදී. නලස්ථ අධ්‍යයනය මගින් සහ පාංශු දිලීරනාශක පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් (SFST) ව්‍යාධිජනකයන් පාලනය කිරීම සඳහා විශිෂ්ටතම සර්වදේහ දිලීරනාශක තෝරා ගැණින. ව්‍යාධිජනකයන්ගේ විරුද්ධ ආසාදන හැකියාවන් නිරීක්ෂණය කරන ලදී.

පටක රෝපණ ක්‍රමවේද භාවිතයෙන් පැනමා රෝගයට ඔරොත්තු දෙන/ ප්‍රතිරෝධී කෙසෙල් විකෘති ජනන ආරම්භ කළ අතර ප්‍රවිකිරණය කරන ලද රතඹලා පටක රෝපිත පැළෑටි *Fusarium oxysporum cubensis* හි රෝගී නියැදිවල සිටුවන ලදී. නිරීක්ෂණ අඛණ්ඩව සිදු කෙරෙමින් පවතියි.

අලිපේර සහ අනෝදාවල සුලබව දැකිය හැකි පසු අස්වනු පලතුරු කුණුවීමේ රෝගය පාලනය කිරීම සඳහා ගතයුතු පියවර සම්බන්ධයෙන් අධ්‍යයනයක් ආරම්භ කෙරිණ. ඉහත බෝග හා සම්බන්ධ පලතුරු කුණුවීමේ රෝගයට හේතුකාරක වන ව්‍යාධිජනකයන් තුන් දෙනෙක් හඳුනාගන්නා ලදී. නලස්ථ තත්ත්ව යටතේ දී ව්‍යාධිජනකයන් පාලනය කිරීම පිණිස ආරක්ෂිත සංයෝජන දෙකක් හඳුනා ගන්නා ලදී. තෝරා ගනු ලැබූ සංයෝජන සහ වරණිත ජෛව විද්‍යාත්මක කාරකවල ක්ෂේත්‍ර අධ්‍යයනයක් සමඟ සජීවස්ථ අධ්‍යයනයන් සඳහා පර්යේෂණයක් සිදු කෙරෙමින් පවතී.

වයඹ සහ උතුරු මැද පළාත්වල අඹ ගස් මිය යන බව වාර්තා විය. ඊට හේතුකාරක වන ජීවියා වශයෙන් *Botryodiploidea theobromae* හඳුනා ගන්නා ලද අතර රෝගය පාලනය කිරීම සඳහා නිර්දේශ සපයන ලදී.

### කීට විද්‍යාව

*Psidium guajava* වල නිර්දේශිත සෑම ප්‍රභේදයක් මූලගැටිති නෙමටෝඩා ආසාදනයට ගොදුරුවිය හැකි තත්ත්වයේ වෙයි. පූර්ව අධ්‍යයනවල දී ප්‍රතිරෝධී මූල පද්ධතියක් හඳුනාගන්නා ලද අතර පසුව සියලුම නිර්දේශිත ප්‍රභේදවලට අයත් පේර පැළවලට එය බද්ධකොට මූල ගැටිති නෙමටෝඩාවවලට එරෙහි ව වැඩිදුර ඇගයීම් සිදු කරන ලදී. පේරවල මූල ගැටිති නෙමටෝඩා පාලනයට කුකුළු පොහොර සමඟ *Trichoderma* රෝපිතයක් පිළියෙල කෙරිණ. කල්පිටිය ප්‍රදේශයෙන් එක්රැස් කර ගන්නා ලද මූල ගැටිති නෙමටෝඩා රෝපිත, අණුකමය ක්‍රමවේද මගින් විශේෂ හඳුනාගැනීම තහවුරු කරලීම පිණිස පවත්වාගෙන යන ලදී.

පලතුරු මැස්සන් සඳහා ප්‍රදේශයක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක ප්‍රෝටීන ඇම ස්ථානීය යෙදවුම වෙනුවට

තනුකකරණය නොකළ ප්‍රෝටීන ඇම මිලි ලීටර් 5ක් සමග ස්පොයිනොසාඩ් ලීටරයට ග්‍රෑම් 0.025ක මිශ්‍රණය සහිත උගුල භාවිතා කළ හැක. මෙම ප්‍රවේශය මගින් යෙදවුම් පිරිවැය 50%කින් අඩු කර ගත හැකිය.

පලතුරු මැස්සන් සහ පැපොල් පිටි මකුණන්ගේ පරපෝෂිතයන් බෝ කිරීම සඳහා දැනට පවතින කෘමි රෝධක දැල් ගෘහ අලුත්වැඩියා කරන ලදී. පලතුරු මැස්සන් බෝ කිරීම සඳහා විද්‍යාගාර පරීක්ෂණ ආරම්භ කරන ලදී. පලිබෝධකයන් (පලතුරු මැස්සා සහ mosquito bug) වැළැක්වීම සඳහා පේර ඵල සුදු පැහැති මළුවලින් ආවරණය කිරීම වඩා සුදුසු ය.

## පාංශු සහ පෝෂණ කළමනාකරණය

පලතුරු බෝග සඳහා පැළෑටි පරීක්ෂාව පදනම් කර ගත් පොහොර තාක්ෂණය සංවර්ධනය කරන ලද අතර ගස්ලබුවල තීරණාත්මක පත්‍ර නයිට්‍රජන් මට්ටම විශ්ලේෂණය ආරම්භ කොට ඇත.

කහ පැහැති යුෂ අසාමන්‍යතාව සහ පාරභාෂක අසාමාන්‍යතාව පාලනය කිරීම සඳහා කැල්සියම්වල කාර්යක්ෂම මට්ටමත් කැල්සියම් ප්‍රතිශතයත් හඳුනාගැනීම සඳහා පරීක්ෂණයක් ආරම්භ කරන ලදී.

## ආහාර විද්‍යාව සහ තාක්ෂණය

තෝරා ගනු ලැබූ පලතුරු බෝගවල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා පැකේජයක් ගොඩනැගීම සඳහා පරීක්ෂණ සිදු කෙරෙමින් පවතියි. අන්නාසිවල අභ්‍යන්තරය දුඹුරු පැහැ ගැන්වීම අවම කිරීම පිණිස අන්නාසි පුෂ්පයෙහි විවිධ අවධි තුනක දී පත්‍රමය කැල්සියම් ඉසින ලදී. පාලකය හා සැසඳීමේ දී කැල්සියම් ප්‍රතිකාර කරන ලද ඵලවල අභ්‍යන්තර දුඹුරු පැහැ වීම සහ පාරභාෂක ආසාදන ලක්ෂණ දක්නට නොවීය.

පේරවල අස්වනු නෙළීමේ නිවැරදි අවධිය හඳුනාගැනීම සඳහා සිදු කළ පරීක්ෂණයේ දී පිරික්සන ලද භෞතික හා රසායනික පරාමිතීන්ට අනුව කොළ කහ පැහැති අවධිය වඩාත් උචිත බව අනාවරණ විය.

අනෝදාවල පරිණත දර්ශක හඳුනාගැනීමට පරීක්ෂණයක් සිදු කරන ලදී. පරීක්ෂා කරන ලද එකතුන් තුන් ආකාරය ම ද්විත්ව සිග්මාකර වර්ධක රටාවක් පෙන්නුම් කළේය. එකතුවක් තුළ පරිණත වීමට ගතවන දින ගණන මාස 4 ½ සිට මාස 8 දක්වා වෙනස් විය. ඉහත කී කාලය තුළ කාලගුණ රටාවේ වෙනස් වීම වර්ධන රටාව සමඟ සහ සම්බන්ධතාවක් නොපෙන්වීය. මෙම කරුණු හේතුවෙන් පුෂ්පීකරණ අවධිය අස්වනු නෙළීමේ දර්ශකයක් වශයෙන් සැලකිය නොහැකිය. වර්ධන සමයේදී ඵලාවරණයෙහි/ පොත්තෙහි වර්ණය පැහැදිලි කොළ පැහැයන් 5ක් තුළ වෙනස් වෙයි. පොත්තෙහි වර්ග අඟලක පිහිටි කටු සංඛ්‍යාව ද ඵලයේ වර්ධනය සමඟ වෙනස් වන අතර පරිණත අවධියේ දී එක් ප්‍රභේදයකට අදාළව වර්ග අඟලක් තුළ පිහිටන කටු සංඛ්‍යාව සමාන වෙයි. ඵලයෙහි පොත්තේ වර්ණය සහ මතුපිට කටු සංඛ්‍යාව විනාශ නොවන පරිණත දර්ශක වශයෙන් සාර්ථක ලෙස භාවිතා කළ හැකිය.

ඝනත්වය අඩු පොලිතීන්වල (LDPE) ගබඩා කිරීමෙන් පැෂන් ෆෲට්වල (*Passiflora eludis*) ජීව කාලය සති තුනක් දක්වා ඉහළ නැංවිය හැකිය. අදාළ වෙනස්කම් සම්බන්ධයෙන් පර්යේෂණ තවදුරටත් සිදු කෙරේ.

පැළ වූ මුං ඇට, බිම්මල්, සහල් පිටි, කුළුබඩු, ඝන මේද සහ ලුණු සමඟ "වෙජිටබල් ෆින්ගර්ස්" නිෂ්පාදනය සඳහා කොස් මදුලුවල ප්‍රශස්ථ මට්ටම හඳුනාගන්නා ලද අතර ප්‍රෝටීන් සංචිතය, ගබඩා කාලය සහ තත්ත්වය විශ්ලේෂණය කිරීමත් ක්ෂුද්‍ර ජීවී විශ්ල්ෂණයත් තවදුරටත් සිදු කෙරෙමින් පවතියි.

## ජෛව තාක්ෂණය

ලීටරයට මිලි ග්‍රෑම් 100ක සාන්ද්‍රණයෙන් යුත් ජෙන්ටාමයිසින් හෝ ලීටරයට මිලි ග්‍රෑම් 150ක රිෆැම්පිසින් එක් කළ සිල්වර් නයිට්‍රේට්, ජෙන්ටාමයිසින් හා ඇමොක්සිලින් සහිත මාධ්‍යයකින් මිල්ලෑව සුවඳැල් කෙසෙල් ප්‍රභේදයේ ස්ථාපිත රෝපිතවලින් ඉහළ නොනැසී පැවතීමේ කාලයක් ලබා ගත හැකි විය. ලීටරයට මිලි ග්‍රෑම් 1 TDZ යෙදූ MS මාධ්‍යය තුළ උප රෝපිතයකට ප්‍රරෝහ 6ක් බැගින් බහුගුණනය නිරීක්ෂණය කරන ලදී.

"ගන්නෝරුව රෙඩ්" යනු මෑතක දී හඳුන්වා දෙන ලද කෙසෙල් ප්‍රභේදයක් වන අතර එහි නීරෝගී රෝපණ ද්‍රව්‍ය සඳහා ඉහළ ඉල්ලුමක් පවතියි. එබැවින් නලස්ථ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ආරම්භ කරන ලද අතර මේ වන විට කුඩා පැළ 400ක් මුල් ඇදීමේ අවධියෙහි ඇත.

නාරංවල නලස්ථ කඳ බද්ධය 30%ක සාර්ථකත්වයක් පෙන්නුම් කළ අතර බද්ධ කළ කුඩා පැළවල දුර්වල මූල පද්ධතියක් සංවර්ධනය වී ඇති බව නිරීක්ෂණය කෙරිණ. පරිසරයට හුරුකිරීමේ අවධියේ දී බද්ධ පැළවලින් 40%ක් පමණක් නොනැසී තිබුණි.

මසන් ආකාර දෙකක් අංකුර බහුගුණනය වීම සඳහා පරීක්ෂා කරන ලද අතර පරීක්ෂණය තවදුරටත් සිදු කෙරේ. නිර්දේශිත ප්‍රභේද හා සසඳන විට වල් දර්ශ නලස්ථ බහුගුණනය සඳහා ප්‍රතිචාර දක්වන ලදී.

බීජ රහිත පේර එකතුන් එක්රැස් කොට අස්වැන්න සහ තත්ත්ව පරාමිතීන් සඳහා පවතින පේර ප්‍රභේද සමඟ ලේයර් කරන ලද පැළ ක්ෂේත්‍රයේදි අගයන ලදී. නලස්ථ කඳ බහුගුණනය හා මුල් ඇද්දූ ක්ෂුද්‍ර කැපුම් නිෂ්පාදන සඳහා පරීක්ෂණ අඛණ්ඩව සිදු කෙරේ.

## පලතුරු සංවර්ධන වැඩසටහන

### පලතුරු ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය (වැය ශීර්ෂය FR-285-2-2-9-2502)

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යය වන්නේ රටේ විවිධ ප්‍රදේශවල පලතුරු ගම්මාන ස්ථාපනය කිරීම, පලතුරු ගම්මානවල අවශ්‍යතාව සපුරාලීම සඳහා මවු ශාක උයන් ස්ථාපනය හා පර්යේෂණ ගොවිපල තුළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා පාසල් දැනුම්වත් කිරීමේ වැඩසටහන් තුළින් පලතුරු පරිභෝජනය ප්‍රවර්ධනය යනාදියයි. වසර තුළ දී පලතුරු රෝපණ ද්‍රව්‍ය 79,000ක් නිපදවන ලදී. විවිධ බෝගවලින් යුතු පලතුරු ගම්මාන 39ක් ස්ථාපනය කරන ලදී. මදුරුකැටිය, මුතුකණ්ඩිය, බිබිල, අඟුණකොළපැලැස්ස සහ ගන්නෝරුව පිහිටි කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානවල මවු ශාක උයන් පුළුල් කොට පවත්වාගෙන යන ලදී. පාසල් කාල වේලාව තුළ දී පිෂ්ය පරිභෝජනය අවම කොට සෞඛ්‍ය සම්පන්න ආහාර කෙරෙහි සිසුන් තුළ උනන්දුවක් ඇතිකරලීම අරමුණු කර ගනිමින් ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල්වල අලෙවිසැල් 08ක් ද හොරණ මූලික රෝහලෙහි අලෙවිසැලක්ද ස්ථාපනය කිරීමට ව්‍යවසායකයකයන් පුහුණු කොට දායකත්වය දක්වන ලදී. දේශීය නැවුම් කැපූ පලතුරු ග්‍රෑම් දෙසියයක් සහ පලතුරු යුෂ මිලි ලීටර් 300ක් රු. 25/= බැගින් අලෙවි කෙරිණ.

**වගු අංක 1.3.2: පලතුරු ගම්මාන වැඩසටහන යටතේ නිෂ්පාදිත රෝපණ ද්‍රව්‍ය**

| බෝගය | පැළ සංඛ්‍යාව |
|---|---:|
| දෙළුම් | 12,000 |
| පැණි දොඩම් | 15,000 |
| දිවුල් | 5,000 |
| නාරං | 3,000 |
| අනෝදා | 40,000 |
| දෙහි | 4,000 |

වගුව 1.3.3: නව පලතුරු ගම්මාන ස්ථාපනය සහ ස්ථාපිත පලතුරු ගම්මාන නඩත්තු කිරීම

| පලතුරු ගම්මාන වර්ගය | ගම්මාන සංඛ්‍යාව | ස්ථාපිත දිස්ත්‍රික්කය |
|---|---|---|
| දෙළුම් | 03 | හම්බන්තොට, පොළොන්නරුව, අම්පාර |
| පැණි දොඩම් | 06 | අනුරාධපුරය, කුරුණෑගල, හම්බන්තොට |
| දිවුල් | 02 | අම්පාර, මොණරාගල |
| අඹ | 04 | මාතර, හම්බන්තොට, පොළොන්නරුව, අම්පාර |
| අනෝදා | 14 | මාතලේ, රත්නපුර, ගම්පහ, මහනුවර, මඩකලපුව, අම්පාර |
| දූරියන් | 04 | මාතලේ, රත්නපුර, ගම්පහ, මහනුවර |
| රඹුටන් | 01 | රත්නපුර |
| දෙහි | 02 | අනුරාධපුරය, කුරුණෑගල |
| පේර | 01 | හම්බන්තොට |
| පැෂන් ෆෲට් | 01 | ගම්පහ |
| කෙසෙල් | 01 | මහනුවර |

## ජෛව විවිධත්ව පලතුරු වතු ව්‍යාපෘතිය (වැය ශීර්ෂ 285-FR-FRI-2-2-10-2502)

මෙම ව්‍යාපෘතිය මගින් නව පලතුරු උයන් ස්ථාපනය, දැනටමත් ස්ථාපිත පලතුරු උයන් නඩත්තුව හා ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය අරමුණු කෙරේ. රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ශක්තිමත් කිරීමේ අරමුණින් 2017 වර්ෂයේ දී හෙක්ටයාර 1ක පමණ ප්‍රදේශයක් පුරා දූරියන් සහ කෙසෙල් ඌන උපයෝජිත මවු ශාක පලතුරු උයන් ස්ථාපනය කරන ලදී. වසර තුළ දී හෙක්ටයාර 32ක ස්ථාපිත පලතුරු උයන් නඩත්තු කරන ලදී. ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය ඉදිකර අවසන් කරන ලද අතර පුහුණු මධ්‍යස්ථානය හා ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය සඳහා ගෘහ භාණ්ඩ මිල දී ගන්නා ලදී. කිලෝ මීටර් 1.5ක දුරකට මාර්ග සංවර්ධන කටයුතු නිම කෙරිණ. දැනට පවතින පැරණි ගොඩනැගිලි ගබඩා වශයෙන් අලුත්වැඩියා කොට නිම කළ අතර හෙක්ටයාර 1ක භූමි ප්‍රමාණයකට ජල සම්පාදන පහසුකම් සංවර්ධනය කරන ලදී. මවු ශාක උයන් නඩත්තු කිරීම, නව පලතුරු උයන් ස්ථාපනය සහ කුණ්ඩසාලේ ජාතික ප්‍රභේද සංරක්ෂණ මධ්‍යස්ථානයේ සහ බියගම ක්‍රීඩා පිටියේ ජෛව විවිධත්ව උද්‍යානයෙහි යටිතල පහසුකම් සංවර්ධනය ද මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදී.

## තාක්ෂණය හුවමාරුව සහ සේවා

### පුහුණු සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්

පලතුරු වගාව, පලතුරු බෝග කෙරෙහි බලපාන පලිබෝධ හා ආසාදන, ජෛව තාක්ෂණය (පටක රෝපණය), කෘෂිකර්ම නිලධාරීන්, ගොවීන්, ව්‍යවසායකයින්, ගුරුවරුන්, විද්‍යාර්ථීන් සහ කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුන් ආදී සහභාගිවූවන් 1,429කට තවාන් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් 46ක් පවත්වන ලදී. කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුන් සහ විශ්වවිද්‍යාල සිසුන් 32ක් සඳහා රැකියා

පුහුණු වැඩසටහන් පැවැත්විණ. සම්පත් දායක පුද්ගලයන් වශයෙන් විද්‍යාඥයන් 21දෙනෙක් සේවා සංස්කරණ පුහුණු වැඩසටහන්වලට සහභාගි වූහ.

පලතුරු වගාව පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා පුද්ගලයන් 2,518 දෙනෙක් ආයතනයට පැමිණියහ. විශ්වවිද්‍යාල සිසුහු දෙදෙනෙක් ඔවුන්ගේ ව්‍යාපෘති වාර්තාව සම්පූර්ණ කළ අතර HND සිසුහු 18දෙනෙක් ස්වකීය කර්මාන්තමය පුහුණු වැඩසටහන මෙම ආයතනයේ දී සම්පූර්ණ කළහ.

### ජන සන්නිවේදන වැඩසටහන

FRDI විද්‍යාඥයන්ගේ සහභාගිත්වයෙන් 2017 වසර තුළ දී බෝග වගාව, පලිබෝධ හා රෝග කළමනාකරණය, පටක රෝපණය සහ ආහාර පිරිසැකසුම පිළිබඳ ගුවන්විදුලි වැඩසටහන් විසි හයක් (ගොවි ගෙදර, ගොවිසර, ගොවිජන මඬල, ගොවිතැනට පැයක්, සාර භූමි, සහ සෙයිලම) සහ රූපවාහිනී වැඩසටහන් 8ක් (ශ්‍රද්ධා නාලිකාව 1) විකාශය කරන ලදී.

### සේවා

ක්ෂේත්‍ර චාරිකා, නියැදි රැස් කිරීම, රෝග හා පලිබෝධකයින් හඳුනාගැනීම සිදු කළ අතර වසර තුළ දී නියැදි 68ක් රෝග විනිශ්චයට ලක් කොට ගොවීන් සඳහා නිර්දේශ සපයන ලදී. පාංශු නියැදි 780ක් විශ්ලේෂණය කෙරිණ.

ගොවීන් 1800කට අධික පිරිසකට පලතුරු වගාව පිළිබඳ උපදෙස් සැපයිණි.

### රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

ආයතනය 2017 වසර තුළ රඹුටන්, දූරියන්, බෙලි, සැපදිල්ලා, අඹ, වෙරළු, වරකා, ජම්බු, කාමරංගා, මැංගුස්ටීන්, අනෝදා, පේර, නාරං, වෙම්පඩක්, ගඩුගුඩා, සිට්‍රස්, ලොවි සහ වෙනත් ඌන උපයෝජිත පලතුරු බෝගවල ප්‍රරෝහණය වූ පැළ 25,360, ලේයර් කරන ලද පැළ 584ක් සහ බීජ පැළ 10,467ක් අලෙවි කළේ ය. අන්නාසි මොරෙයියන් 935ක් ද කෙසෙල් මොරෙයියන් 750ක් ද අලෙවි කරන ලදී. රෝපණ ද්‍රව්‍ය අලෙවි කිරීමෙන් ආයතනය ඉපැයූ මුළු ආදායම රු.3,860,435 කි.

## 2018 වසර සඳහා සැලැස්ම

### බෝග ප්‍රවර්ධනය

- විවිධ කෘෂි පාරිසරික කලාපවල උසස් තත්ත්වයේ සහ ඉහළ අස්වනු දෙන අඹ වගාව සංවර්ධනය
- උසස් තත්ත්වයේ සහ ඉහළ අස්වනු දෙන අඹ දෙමුහුම් සංවර්ධනය
- වාණිජ වගාව සඳහා උසස් තත්ත්වයේ සහ ඉහළ අස්වනු දෙන දූරියන් ප්‍රභේද එක් රැස් කිරීම, ඇගයීම සහ වරණය
- දෙමුහුම්කරණය මගින් උසස් තත්ත්වයේ සහ ඉහළ අස්වනු දෙන දූරියන් සංවර්ධනය
- දෙමුහුම්කරණය මගින් උසස් තත්ත්වයේ සහ ඉහළ අස්වනු දෙන සිට්‍රස් (දොඩම් සහ නාරං) සංවර්ධනය
- වාණිජ වගාව සඳහා උසස් තත්ත්වයේ සහ ඉහළ අස්වනු දෙන පැඟිරි ප්‍රභේද එක් රැස් කිරීම, ඇගයීම සහ වරණය
- උසස් තත්ත්වයේ සහ ඉහළ අස්වනු දෙන බීජ රහිත/බීජ අඩු සිට්‍රස් විකෘති (නස්නාරං, HOCR 24) සංවර්ධනය
- ඉහළ අස්වනු දෙන උසස් තතත්වයේ ගස්ලබු දෙමුහුම්/ ප්‍රභේද සංවර්ධනය
- හොරණ ගස්ලබු දෙමුහුම් - 1 හි බීජ නිෂ්පාදනය
- දෙමුහුම්කරණය සහ ප්‍රභේදමය වරණය තුළින් කහ පැහැති පැෂන් ෆෘට් (*Passiflora edulis* f. *flavicarpa*) සංවර්ධනය

- ඉහළ අස්වනු දෙන උසස් තත්ත්වයේ කොස් සංවර්ධනය

- ස්ව සංගතතාවයෙහි ආවේණිය සහ පැෂන් ෆෘට් විචිත්‍ර වෛරස් ප්‍රතිරෝධීතාව අධ්‍යයනය.

- බෙලි ජනකප්ලාස්මා එක් රැස් කිරීම, ඇගයීම, ලාක්ෂණිකරණය සහ වරණය

- බෙලිවල පුෂ්පීය ජෛව විද්‍යාව සහ පුෂ්පීකරණ රටාව අධ්‍යයනය

- නිෂ්පාදනය සහ ගුණාත්මය ඉහළ නැංවීම පිණිස බෙලි, ජම්බු, වෙරළු, අනෝදා සහ සැපදිල්ලාවල පුෂ්පීකරණ රටාව සහ පුෂ්ප ජෛව විද්‍යාව ලාක්ෂණිකරණය

- ඉහළ අස්වනු දෙන ගුණත්වයෙන් උසස් අනෝදා ප්‍රභේද සංවර්ධනය

- බීජ රහිත පේර ප්‍රභේද සංවර්ධනය

- පැසිෆිලොරේසීස්, අනෝනේසියේ සහ බ්‍රොමෙලියේසියේ කුලවල අන්තර් විශේෂ දෙමුහුම්කරණය මගින් නව දෙමුහුම් සංවර්ධනය

- ඉහළ අස්වැන්න සහ ගුණාත්මක බව සඳහා ගඩු ගුඩා එක් රැස් කිරීම, ඇගයීම සහ වරණය

- ඉහළ අස්වනු දෙන තත්ත්වයෙන් උසස් අනෝදා ප්‍රභේද (කටු අනෝදා, සීත අනෝදා, වැලි අනෝදා) සංවර්ධනය.

- විකෘතිකරණය මගින් ඉහළ අස්වනු දෙන තත්ත්වයෙන් උසස් පලතුරු ප්‍රභේද (මැංගුස්ටීන්, බෙලි, සැපදිල්ලා) සංවර්ධනය

- දෘඪ ඵල වශයෙන් භාවිතයට ගැනීම සඳහා විභව බෝග/ප්‍රභේද හඳුනාගැනීම සහ වරණය

- සැලැක්/ස්නේක් ෆෘට් (*Salacca zalacca*) ප්‍රභේද ඇගයීම

- දෙල් එකතුන් ගවේෂණය, එක්රැස් කිරීම, හා ඇගයීම

## ශෂ්‍ය විද්‍යාව

### පාංශු සහ පෝෂක කළමනාකරණය

- අන්නාසි සඳහා හරිත තාක්ෂණික පෝෂක කළමනාකරණ පැකේජයක් හඳුනාගැනීම.

- මැංගුස්ටීන්වල කහ පැහැති යුෂ අසාමාන්‍යතාව සහ පාරභාෂක අසාමාන්‍යතාව පාලනය සඳහා ශෂ්‍ය විද්‍යාත්මක භාවිතාවන් හඳුනාගැනීම.

- දේශගුණික විපර්යාසවල බලපෑම අවම කර ගැනීමට ගස්ලබු වල පත්‍රමය N වල තීරණාත්මක මට්ටම හඳුනාගැනීම.

- මැංගුස්ටීන්වල කහ පැහැති යුෂ අසාමාන්‍යතාව සහ පාරභාෂක අසාමාන්‍යතාව කෙරෙහි Ca යෙදීමේ කාලය හා අනුපාතය බලපාන අන්දම.

- පලතුරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනයෙහි පර්යේෂණ ක්ෂේත්‍රවල පසෙහි පෝෂක තත්ත්වය.

- කොමඩුවල ගුණත්වය සහ නිෂ්පාදිතතාවයට අදාළව ශාක පෝෂක කළමනාකරණ භාවිතාවන් හඳුනාගැනීම.

### ශාක ව්‍යාධිවේදය

- පටක රෝපණය මගින් පැනමා රෝගයට ඔරොත්තු දෙන / ප්‍රතිරෝධී කෙසෙල් විකෘති හඳුන්වාදීම.

- සමෝධානික ප්‍රවේශයක් ඔස්සේ බහු වාර්ෂික පලතුරු ශාකවල මුල් ආශ්‍රිත රෝග පාලනය

- අඹවල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය සඳහා රසායනික නොවන ක්‍රම අත්හදා බැලීම.

- ජෛව විද්‍යාත්මක පාලන කාරක මගින් පේර මැලවීමේ රෝගය පාලනය.

## කීට විද්‍යාව

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් පේර (*Psidium guajava*) වගා කෙරෙන ප්‍රදේශවල මූල ගැටිති නොමටෝඩා (*Meloidogyne* spp.) පිළිබඳ ජීව විද්‍යාත්මක අධ්‍යයනය සහ පාලනය
- පලතුරු බෝගවල (අනෝදා, අඹ, රඹුටන් ආදි) කඳ විදින්නන් විශේෂ හඳුනා ගැනීම සහ පාලනය.
- සමෝධානික ප්‍රවේශයක් තුළින් අඹවල සුදු ඉටිමය ශල්ක කළමනාකරණය.
- SIT භාවිතාවන් සඳහා සාර්ථක සංවාසයන් කිරීමට අඩු පිරිවැය තාක්ෂණය භාවිතයෙන් පලතුරු මැස්සා (*Bactrocera dorsalis*) මහා පරිමාණමය වශයෙන් බෝ කිරීම (මීට අදාළ ව්‍යාපෘති යෝජනා IAEA වෙත ඉදිරිපත් කර ඇත)
- දෙල්වල පළිබෝධකයන් හඳුනාගැනීම.

## ආහාර විද්‍යාව

- කොස්වලින් නිෂ්පාදිත "වෙජී - ෆින්ගර්ස්" වල භෞත රසායනික ගුණාංග විශ්ලේෂණය, ක්ෂුද්‍ර ජීවීමය ගහණය හා ගබඩා තත්ව ඇගයීම.
- තෝරා ගන්නා ලද පලතුරු බෝගවල (අන්නාසි, පේර, අලිපේර) පසු අස්වනු හානිය අවම කිරීමට පැකේජයක් හඳුන්වාදීම.
- ඌන උපයෝජිත පලතුරු බෝගවල පෝෂණ සංයුතිය සහ රසායනික සංයෝග හඳුනා ගැනීම.
- *Annona muricata* වල පවතින ප්‍රතිඔක්සිකාරක හඳුනා ගැනීම සහ ප්‍රමාණය.

## ජෛව තාක්ෂණය

- DOA මගින් නිර්දේශිත මිල්ලැව සුවඳැල් කෙසෙල් ප්‍රභේදයේ ක්ෂුද්‍ර ප්‍රචාරණය.
- නාරං ක්ෂුද්‍ර ප්‍රචාරණය
- ඌන උපයෝජිත පලතුරු බෝගවල (මසන්) ක්ෂුද්‍ර ප්‍රචාරණය

## සංවර්ධනය

- පලතුරු ගම්මාන සංවර්ධනය
- කෙසෙල්වල පටක රෝපිත ද්‍රව්‍ය නිෂ්පාදනය
- පලතුරු බෝගවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

### තාක්ෂණය හුවමාරුව සහ පුහුණුව

- නව තාක්ෂණයන් පිළිබඳ ව්‍යාප්ති නිලධාරීන් සහ ගොවීන් පුහුණු කිරීම.
- පලතුරු වගාකරුවන්ට උපදේශක සේවා සැපයීම

## කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - මදුරුකැටිය

මදුරුකැටිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය පලතුරු බෝගවල නිෂ්පාදනය හා ඵලදායිතාව ඉහළ නැංවීමේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කරන අතර එහිදී පහතරට අතරමැදි කලාපයට (LCIZ) සහ පහතරට වියළි කලාපයට (LCDZ) අනුවර්තනය වූ බෝග කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ. නිලධාරීන්, ශිෂ්‍යයන්, ගොවීන් සහ වෙනත් පාර්ශ්වකරුවන් හට පලතුරු බෝග වගාව හා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වමින් සේවා දායකත්වය සපයයි. ශාක ප්‍රචාරණ සහ තවාන් පාලන අංශය විවිධ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා සැලකිය යුතු මට්ටමක රෝපණ ද්‍රව්‍ය සංඛ්‍යාවක් වාර්ෂිකව නිෂ්පාදනය කරයි.

## ප්‍රගතිය

අඹ, කුරක්කන්, මිරිස්, රටකජු, කව්පි හා වට්ටක්කා සඳහා ජාතික සම්බන්ධිකාරක ප්‍රභේදමය අත්හදා බැලීම් සිදු කරන ලද අතර ඊට අදාළ දත්ත අදාළ නිලධාරීන් වෙත ඉදිරිපත් කර ඇත.

## සංවර්ධනය

### පුහුණු වැඩසටහන්

ප්‍රචාරණ තාක්ෂණික ක්‍රම සහ පලතුරු බෝග කළමනාකරණය පිළිබඳව නිලධාරීන් සහ ගොවීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී. විශ්වවිද්‍යාල සිසුවියන් තම පර්යේෂණ ව්‍යාපෘතිය නිම කළ අතර ඩිප්ලෝමා සිසුහු දෙදෙනෙක්ද තාක්ෂණික විද්‍යාල සිසුහු 4දෙනෙක්ද ඔවුන්ගේ කර්මාන්තමය පුහුණුව මෙම ආයතනයේදී සම්පූර්ණ කළහ. ගොවීන් 20 දෙනෙකුට පලතුරු බෝග වගාව පිළිබඳ උපදෙස් ලබා දෙන ලදී.

### රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

වගු අංක 1.3.4: 2017 වර්ෂය තුළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

| බෝගය | සාමාන්‍ය අලෙවිය | පලතුරු ගම්මාන |
|---|---|---|
| බද්ධ කළ පැණි දොඩම් | 134 | 7,750 |
| බද්ධ කළ දිවුල් | 160 | 840 |
| බද්ධ කළ නාරං | 106 | - |
| පැෂන් ෆෲට් කඳ කැබලි | 3,289 | - |
| අනෝදා පැළ | 380 | - |
| වෙනත් | 388 | - |

## පැඟිරි පර්යේෂණ ස්ථානය - බිබිලේ

බිබිලේ, පැඟිරි පර්යේෂණ ස්ථානය පහතරට අතරමැදි කලාපයේ (LCIZ) පිහිටා ඇති අතර, සිට්‍රස් (දෙහි කුළයේ) ශාක පිළිබඳ පර්යේෂණ හා සංවර්ධනය ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා එය නිර්මාණය කරනු ලැබ ඇත. සියලු නිර්දේශිත ප්‍රභේදවල සහ තෝරාගනු ලැබූ ප්‍රභේදවල සිට්‍රස් ජනකප්ලාස්ම උයන් නඩත්තු කෙරේ. විශේෂයෙන්ම පැණි දොඩම් සහ නාරං වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලබන පලතුරු තවාන් මෙම ඒකකය සතුය.

**වගු අංක 1.3.5: 2017 වර්ෂයේදී රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

| බෝගය | සාමාන්‍ය අලෙවිය | පලතුරු ගම්මාන |
|---|---|---|
| පැණි දොඩම් (බද්ධ කළ) | 940 | 11,560 |
| රඹුටන් (බද්ධ කළ) | 200 | 1,500 |
| දෙහි | 300 | 5,000 |
| පැෂන් ෆෲට් (කැපූ කඳ කැබලි) | 1,500 | - |

## කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - මුතුකණ්ඩිය

මුතුකණ්ඩිය, කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය පහතරට වියළි කලාපයේ (LCDZ) හි පිහිටා ඇති අතර පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරම් ඉටුකිරීම සඳහා ප්‍රධාන වශයෙන් නිර්මිතය. පැඟිරි සහ වෙනත් බෝගවල ජනකප්ලාස්මා මෙම පර්යේෂණ ස්ථානයෙහි නඩත්තු කෙරේ. දිවුල් විශේෂ කොටගත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලබන පැළ තවානක් මෙම ඒකකය සතුය.

### රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

**වගු අංක 1.3.6: 2017 වර්ෂයේදී රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

| බෝගය | සාමාන්‍ය අලෙවිය | පලතුරු ගම්මාන |
|---|---|---|
| දිවුල් (බද්ධ කළ) | - | 3,100 |
| පැණි දොඩම් (බද්ධ කළ) | 89 | - |
| අනෝදා | 200 | - |
| වෙනත් | 2,750 | - |

## 2018 වසර සඳහා සැලැස්ම

### පර්යේෂණ

- සිට්‍රස් ජනකප්ලාස්ම ගවේෂණය, එක්රැස් කිරීම හා ඇගයීම.
- පහතරට වියළි / පහතරට අතරමැදි කලාපවල දී හි ඵලදායිතාව වර්ධනය කිරීම පිණිස බද්ධ *Citrus sinensis* හි විවිධ මුල පද්ධතිවල බලපෑම අධ්‍යයනය.
- දෙහිවල අවාරයේ අස්වැන්න වැඩිකිරීම සඳහා විවිධ කළමනාකරණ පිළිවෙත් අධ්‍යයනය.
- පහතරට අතරමැදි කලාපයේ හි වාණිජ වගාව සඳහා පැෂන් ෆෲට් ප්‍රභේදවල වර්ධන රටාව සහ කාර්ය සාධනය හැදෑරීම
- අස්වැන්න සහ ගුණාත්මය සඳහා පේර එකතුන් ඇගයීම.

### සංවර්ධනය

- පලතුරු බෝගවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- පලතුරු වගාව සහ උපදේශක සේවා සඳහා ගොවීන්ට පුහුණුව

## කාර්ය මණ්ඩලය

### FRDI, හොරණ

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 | 01 |
| ප්‍රධාන කෘෂි විද්‍යාඥ | 05 | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 18 | 09 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 03 | 02 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (ආර්ථික විද්‍යා ) | 01 | 01 |
| පරිපාලන නිලධාරි | 01 | 01 |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 01 | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 09 | 03 |
| සංවර්ධන නිලධාරි | 05 | 01 |
| කෘෂිකර්ම උපදේශක | 07 | 16 |
| පර්යේෂණ සහකාර | 35 | 19 |
| ඉංජිනේරු සහකාර | 01 | - |

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 10 | 10 |
| තාක්ෂණික සහායක (ඉංජිනේරු) | 01 | 01 |
| තාක්ෂණික සහායක (ව්‍යාප්ති) | 03 | 06 |
| ගොවිපළ ලිපිකරු | 01 | 01 |
| රියදුරු | 06 | 07 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකාරු | 02 | 02 |
| ගබඩාකරු | 01 | - |
| යාන්ත්‍රික ශිල්පි | 01 | - |
| වඩුකරු | 01 | - |
| පෙදරේරු | 01 | - |
| විදුලි ශිල්පි | 01 | - |
| තාක්ෂණික ශිල්පි | 01 | - |
| පර්යේෂණ උප සහකාර | 04 | - |
| බද්ධකරු | 03 | 03 |
| කාර්යාල කාර්ය සහායක | 01 | - |
| මුරකරු | 08 | 07 |
| කම්කරු (ස්ථිර) | 111 | 82 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 62 | 44 |
| කම්කරු (කොන්ත්‍රාත්) - NARP ව්‍යාපෘතිය | 18 | 18 |
| **එකතුව** | **325** | **238** |

## ARS, මදුරුකැටිය

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | - |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 04 | 01 |
| පර්යේෂණ සහකාර (විශේෂ) | 01 | - |
| සංවර්ධන නිලධාරි | 01 | - |
| කෘෂිකර්ම උපදේශක | 02 | 01 |
| පර්යේෂණ සහකාර | 02 | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | - |
| තාක්ෂණික සහායක | 0 | 04 |
| ගොවිපල ලිපිකරු | 01 | 01 |
| රියදුරු | 01 | 01 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 02 |

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| පර්යේෂණ උප සහකාර | 01 | 0 |
| බද්ධකරු | 01 | 01 |
| මුරකරු | 04 | 05 |
| කම්කරු | 26 | 21 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 09 | 09 |
| **එකතුව** | **57** | **47** |

**පැහිරි පර්යේෂණ ස්ථානය, බිබිලේ**

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | - |
| පර්යේෂණ සහකාර (විශේෂ ශ්‍රේණිය) | 01 | - |
| සංවර්ධන නිලධාරි | 01 | - |
| කෘෂිකර්ම උපදේශක | 01 | - |
| පර්යේෂණ සහකාර | - | 01 |
| තාක්ෂණික සහායක | - | 01 |
| ගොවිපල ලිපිකරු | 01 | - |
| රියදුරු | 01 | - |
| බද්ධකරු | 01 | 02 |
| මුරකරු | 03 | 04 |
| කම්කරු | 11 | 20 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 12 | 08 |
| **එකතුව** | **33** | **36** |

**ARS, මුතුකණ්ඩිය**

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි. පර්යේෂණ) | 01 | - |
| සංවර්ධන නිලධාරි | 01 | - |
| කෘෂිකර්ම උපදේශක | 01 | 01 |
| පර්යේෂණ සහකාර | 01 | - |
| මුරකරු | 03 | 03 |
| කම්කරු | 15 | 09 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 10 | 10 |
| **එකතුව** | **32** | **23** |

# 1.3.1. පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය - ගන්නොරුව

ගන්නොරුව පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය, පලතුරු බෝග වල ඵලදායිතාව හා නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ පර්යේෂණ, සංවර්ධන හා ව්‍යාප්ති ක්‍රියාකාරකම් ඉටු කරන අතර ඌන භාවිත පලතුරු බෝග සහ පලතුරු බෝග බඳුන් වල වගා කිරීම ජනප්‍රිය කිරීමෙහි ලා ප්‍රමුඛ භූමිකාවක් ඉටු කරයි. මෙම වැඩසටහන් යටතේ, බඳුන්ගත පලතුරු බෝග වගාව හා පලතුරු පැළ භාවිතා කරමින් භූමි අලංකරණය (ආහාර බෝග මගින් භූමි අලංකරණය) ට ඉහළ පුමුඛතාවක් දෙනු ලැබේ. මීට අමතරව මෙම ආයතනය, පලතුරු බෝග වගාව හා කළමනාකරණය පිළිබඳව නිලධාරීන්ට, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට, උසස් ඩිප්ලෝමා හදාරන ශිෂ්‍යයන්ට, පාසල් ශිෂ්‍යයන්ට, ගොවීන්ට හා වෙනත් පාර්ශ්වකරුවන්ට, පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් තාක්ෂණය හුවමාරු කිරීමේ හා දැනුම ප්‍රචාරණය කිරීමේ කටයුතු ද ඉටු කරයි. ශාක ප්‍රචාරණ හා තවාන් කළමනාකරණ අංශය, විවිධ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා සහ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා ද ඌන භාවිත පලතුරු බෝග විශේෂ ඇතුළුව රෝපණ ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක්, නිෂ්පාදනය කරන අතර ජාතික අවශ්‍යතාවෙන් සැලකිය යුතු රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණයක් සපයයි.

## අයවැය

**වගු අංක 1.3.1.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| **පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය - ගන්නොරුව** | | | |
| පුනරාවර්තන | 3,961,000 | 4,409,855 | 111 |
| මූලධන | 1,300,000 | 1,087,852 | 84 |
| ව්‍යාපෘති | | | |
| • පලතුරු ගම්මාන සංවර්ධනය | | | |
| ○ ප්‍රදර්ශන හා පර්යේෂණ පලතුරු උද්‍යානයක් ස්ථාපනය කොට පවත්වා ගැනීම | 500,000 | 485,355 | 97 |
| • විශේෂ ශාක අභිජනන ව්‍යාපෘතිය | | | |
| ○ මොර ප්‍රභේද සංවර්ධනය | 700,000 | 689,808 | 99 |
| • ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති | | | |
| ○ අලිපේර බෝගය සංවර්ධනය | 391,200 | 360,000 | 92 |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන | | | |
| ○ ආහාර බෝග කෙරෙහි දේශගුණික සාධක වල බලපෑම | 1,000,000 | 987,844 | 99 |
| **එකතුව** | **7,852,200** | **8,020,714** | **102** |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| **රඹුටන් පර්යේෂණ ඒකකය, එරමිණිගොල්ල** | | | |
| පුනරාවර්තන | 120,000 | 128,489 | 107 |
| මූලධන | 450,000 | 450,000 | 100 |
| ව්‍යාපෘති | | | |
| • පලතුරු ගම්මාන සංවර්ධනය | | | |
| ○ කටු අනෝදා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය | 500,000 | 500,000 | 100 |
| **එකතුව** | **1,070,000** | **1,078,489** | **101** |
| **උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපළ - අඹතැන්න** | | | |
| පුනරාවර්තන | 944,239 | 949,255 | 101 |
| මූලධන | 550,000 | 538,477 | 98 |
| ව්‍යාපෘති | | | |
| • පලතුරු ගම්මාන | 500,000 | 503,963 | 101 |
| **එකතුව** | **1,994,239** | **1,991,696** | **100** |

## ප්‍රගතිය

### පර්යේෂණ

### පලතුරු අභිජනනය - ප්‍රධාන පලතුරු

#### කෙසෙල්

ඉහළ ගුණාත්මක ගති ලක්ෂණ පෙන්වූ එක් 'ඇඹුල් කෙසෙල්' ප්‍රවේශයක් හඳුනා ගන්නා ලදී. කෙසේ වෙතත් එහි අස්වැන්න නිර්දේශිත "නදී" ප්‍රභේදයට වඩා සන්සන්දනාත්මකව අඩු ය. මීට අමතරව, වඩා සුදුසු 'ඇම්බන් කෙසෙල්' හා අළු කෙසෙල් වරණයන් ඇගයීමට ලක් කරන ලද අතර මෙම පර්යේෂණ කටයුතු දිගටම සිදු කෙරෙමින් පවතී. නව හඳුන්වා දීමක් වන 'ගන්නොරුව සීනි 1' ප්‍රභේදයේ රෝපණ ද්‍රව්‍ය නිපදවීමට රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන ක්ෂේත්‍රයක් ද පිහිටුවන ලදී.

#### පැපොල්

වක්‍රීය වරණයෙන් හා ස්ව පරාගණයෙන් වඩා සුදුසු ගුණාංග සහිත පැපොල් පෙළපත් නිෂ්පාදනය කරන ලදී. ඉහළ අස්වැන්නක් හා හොඳ ගුණාත්මක ලක්ෂණ පෙන්වූ පෙළපත් දෙකක් වැඩි දුරටත් ඇගයීම් කිරීම සඳහා හඳුනා ගන්නා ලද අතර සහාභිජාත පෙළපත් ඇති කර ගැනීමේ අරමුණින් පර්යේෂණ කටයුතු දිගටම සිදු කෙරෙමින් පවතී.

#### පේර

හොඳ ගුණාත්මක බවකින් යුතු හා ඉහළ අස්වැන්නක් ලබා දෙන පේර දර්ශයක් හඳුනා ගන්නා ලද අතර පැළ 50ක්, වැඩි දුර ඇගයීම සඳහා ක්ෂේත්‍රයේ ස්ථාපනය කරන ලදී.

#### පැණිරි

හොඳ ගුණාත්මක බවකින් යුතු ඉහළ අස්වැන්නක් ලබා දීමේ විභවයක් සහිත දොඩම් එකතුවක් හඳුනා ගන්නා ලද අතර, වැඩි දුර ඇගයීම සඳහා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සිදු කෙරෙමින් පවතී.

#### අලි පේර

වර්ෂය තුළ දී ගොවීන්ගේ ක්ෂේත්‍ර වලින් එක්රැස් කර ගන්නා ලද අලිපේර දර්ශ 15ක් හා මීට පෙර එක් රැස් කරගත්

අලිපේර දර්ශ 10ක් නිර්දේශිත ප්‍රභේද සමඟ ජාන බැංකුවෙහි ස්ථාපනය කරන ලදී.

### දූරියන්

නව දූරියන් දර්ශ 7ක ඇගයීම් සිදු කෙරෙමින් පවතී.

## ඌන භාවිත පලතුරු බෝග

ඌන භාවිත පලතුරු බෝග වල ඇගයීම් කටයුතු ක්ෂේත්‍ර ජාන බැංකු තුල දී, පර්යේෂණ ක්ෂේත්‍ර තුල හා බඳුන්වල අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

### නෙල්ලි

කුරුණෑගල වැල්ලව ප්‍රදේශයෙන් හඳුනා ගන්නා ලද ඉහළ ගුණාත්මකභාවයකින් යුතු විශාල ප්‍රමාණයේ ඵල ලබා දෙන නෙල්ලි ප්‍රභේදයක් ගන්නොරුව නෙල්ලි (රෝහණ) ලෙස නිර්දේශ කරන ලදී.

### මාදං

පිළිවෙලින් ගන්නොරුවෙන් හා හිඟුරක්ගොඩින් එක් රැස් කර ගන්නා ලද මාදං දර්ශ දෙකක් ගන්නොරුව මාදං (පර්පල් බීග්) හා ගන්නොරුව එළ දං (හිඟුරක්ගොඩ) ලෙස නම් කොට නිර්දේශ කරන ලදී.

### මොර

මාංශලය සහිත විශාල ඵල දරන විදේශීය මොර දර්ශයක් එක් රැස් කර ගන්නා ලද අතර ඊට අමතරව වැඩි දුර ඇගයීම සඳහා විකෘති අභිජනනයෙන් නිපදවා ගත් පෙළපත්ද පවත්වා ගෙන යනු ලැබේ.

### කැටම්බිල්ල

කැටම්බිල්ල දර්ශ දෙකක් එක් රැස් කර ගන්නා ලදී. කැටම්බිල්ල යනු ශ්‍රී ලංකාවට ආවේණික පලතුරු ශාකයක් වන අතර එය ඉහළ අගයකින් යුතු පලතුරු බෝගයක් ලෙස වගා කිරීමේ විභවයකින් සමන්විතය.

### බ්‍රසීලියන් චෙරි

මිහිරි රසැති ඵල නිපදවන වඩා සුදුසු ගුණාංග සහිත එක් බ්‍රසීලියන් චෙරි දර්ශයක් හඳුනා ගන්නා ලදී.

### ලෝලු

දේශීය ලෝලු ශාක හා සැසඳීමේදී විශාල ඵල සහිත වඩා සුදුසු ගුණාංග සහිත ලෝලු දර්ශයක් හඳුනා ගන්නා ලදී.

### නව පලතුරු බෝග හඳුනා ගැනීම

වෙනත් රටවල විවිධ ආකාරයට භාවිතා කරනු ලබන නංචෙ හෙවත් “ගෝල්ඩන් ස්පූන්” *(Byrsonima crassifolia)* ලෙස හඳුන්වනු ලබන විදේශීය පලතුරු බෝගය, වගා කිරීම සඳහා විභවයක් සහිත පලතුරු බෝගයක් ලෙසට හඳුනා ගන්නා ලදී.

## ශෂ්‍ය විද්‍යාව

### දේශගුණික වෙනස් වීමේ බලපෑම

කෘෂිකර්ම උපදේශක බල ප්‍රදේශ 5කින් දත්ත පත්‍රිකා 196ක් ලැබුණු අතර ව්‍යාපෘතිය තවදුරටත් සිදු කෙරෙමින් පවතී.

පලතුරු රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයට, විශේෂයෙන්ම ඌන භාවිත පලතුරු බෝග වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන කිරීම පිණිස නව තාක්ෂණවේද සොයා ගැනීමට අදාළ පර්යේෂණයන් සිදු කෙරෙමින් පවතී.

බෙලි, මසං, මොර, නෙල්ලි, කරවල කැබිල්ල, කටු අනෝදා සහ වෙරළු වැනි ඉහළ ඉල්ලුමක් සහිත ඌන උපයෝජිත භාවිත පලතුරු විශේෂ සඳහා මෙහිදි ඉහළ ප්‍රමුඛතාව ලබා දෙන ලදී.

### කටු අනෝදා

කටු අනෝදා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයේ දී, සාමාන්‍යයෙන් භාවිතා කරනු ලබන කුඤ්ඤ බද්ධය හා සැසඳීමේදී වඩාත්ම සුදුසු බද්ධ ක්‍රමය හඳුනා ගැනීමට බද්ධ කිරීමේ ක්‍රම පරීක්ෂාවට භාජනය කරන ලද

අතර ක්ෂේත්‍ර ඇගයීම් දිගටම සිදු කෙරෙමින් පවතී. කුඤ්ඤ බද්ධය හා සැසඳීමේදී අංකුර බද්ධය කටු අනෝදා සඳහා වඩා සුදුසු බද්ධ ක්‍රමයක් බව නිරීක්ෂණය විය.

### වෙරළු

වෙරළු බීජ වල තද බීජ ආවරණය ඉවත් කොට එමගින් කෙටි කාල සීමාවකින් බද්ධ කිරීමට සුදුසු පැළ ලබා ගැනීමේ තාක්ෂණ ක්‍රමවේදයක් හඳුනා ගන්නා ලදී.

## සංවර්ධනය

### පුහුණු වැඩසටහන්

පලතුරු බෝග කප්පාදු කිරීම, තවාන් කළමනාකරණය, අංකුර බද්ධ කිරීම, රිකිලි බද්ධ කිරීම, බීජ ප්‍රරෝහණය හා බඳුන්ගත පලතුරු වගාව ශාක මුල් පද්ධතිය සමඟ ආරක්ෂිතව වෙන් කොට ශාක නැවත සිටුවීම (Root balling technique) යන මාතෘකා පිළිබඳ වැඩි අවධානයක් සහිතව පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ගන්නොරුවේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ හා වෙනත් ස්ථාන වල පැවැත්වූ පුහුණු වැඩසටහන් වලට සම්පත් දායකයන් ලෙස පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානයේ නිලධාරීහු සහභාගී වූහ.

ගොවි පුහුණු වැඩසටහන් - 07 (ගොවීන් 325)

නිලධාරි පුහුණු වැඩසටහන් - 04 (නිලධාරීන් 175)

විශ්ව විද්‍යාල / ඩිප්ලෝමා / වෙනත් ශිෂ්‍ය වැඩසටහන් - 26 (ශිෂ්‍යයන් 1270)

### ශිෂ්‍ය ව්‍යාපෘති

සෑම වර්ෂයකම, විශ්ව විද්‍යාල සිසුන්ගේ පර්යේෂණ වැඩසටහන් වලට සහය දැක්වීම සිදු කරනු ලැබේ. මේ වර්ෂය තුළදී එක් උපාධි අපේක්ෂිකාවක් විසින් අපගේ අධීක්ෂණය යටතේ ස්වකීය අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘතිය නිම කරන ලදී.

### ව්‍යාප්ති ක්‍රියාකාරකම්

මෙම වර්ෂය තුළදී පලතුරු වගාව පිළිබඳව විවිධ ගුවන් විදුලි නාලිකා ඔස්සේ විකාශය කෙරුණු ගුවන් විදුලි වැඩසටහන් 6 කට පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානයේ නිලධාරීහු සහභාගී වූහ. ආයතනයට පැමිණ හෝ දුරකථනයෙන් ඉල්ලීම් කළ පලතුරු වගාකරන්නන් 180 දෙනෙකුට පලතුරු වගාව, කළමනාකරණය හා පළිබෝධ සහ රෝග කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබා දෙන ලදී.

### රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

ශාක ප්‍රචාරණ හා තවාන් කළමනාකරණ අංශයට පර්යේෂණ අංශයේ ද සහයෝගය ඇතිව බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, පලතුරු ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය හා ආහාර නිෂ්පාදන ව්‍යාපෘති යටතේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට හැකිවිය.

**වගු අංක 1.3.1.2: 2017 වර්ෂය තුළදී රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය)**

| පැළ වර්ගය | නිෂ්පාදිත පැළ සංඛ්‍යාව |
|---|---|
| සැපදිල්ලා - බද්ධ | 130 |
| දූරියන් - බද්ධ | 1000 |
| කොස් - බද්ධ | 1796 |
| කාමරංගා - බද්ධ | 2600 |
| අලිපේර - බද්ධ | 187 |
| උගුරැස්ස - බද්ධ | 686 |
| වෙරළු - බද්ධ | 250 |
| බෙලි - බද්ධ | 500 |
| වෙනත් - බද්ධ | 1500 |
| අඹ - බද්ධ | 320 |
| කටු අනෝදා - බද්ධ | 750 |

| පැළ වර්ගය | නිෂ්පාදිත පැළ සංඛ්‍යාව |
|---|---|
| මොර - බද්ධ | 200 |
| කරවල කැබිල්ල - බද්ධ | 350 |
| වෙනත් - බද්ධ | 600 |
| කටු අනෝදා - බීජ පැළ | 3600 |
| මොර - බීජ පැළ | 3300 |
| වෙනත් පැළ | 8668 |
| **එකතුව** | **26437** |

## රඹුටන් පර්යේෂණ ඒකකය - එරමිණිගොල්ල

කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි රඹුටන් පර්යේෂණ ඒකකය, රඹුටන් ආශ්‍රිත පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් මෙහෙයවීම පිණිස පිහිටුවා ඇත. මෙම ඒකකය පිහිටි භූමියෙන් වැඩි ප්‍රමාණයක් රඹුටන් වගාවෙන් ආවරණය වී ඇත. ඊට අමතරව නිර්දේශිත කොස් ප්‍රභේද වල මව් ශාක ද සිටුවා ඇත. විශේෂයෙන්ම රඹුටන්, කොස් හා මසං යන ශාක වල රෝපණ ද්‍රව්‍ය නිපදවන පලතුරු තවානක්ද මෙම ඒකකයට හිමිය.

### ප්‍රගතිය

#### රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

පලතුරු ගම්මාන ව්‍යාපෘතිය යටතේ මෙම ඒකකයේ පලතුරු පැළ තවානේදී පහත සඳහන් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ලදී.

**වගු අංක 1.3.1.3: රඹුටන් පර්යේෂණ ඒකකයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය - 2017**

| පැළ වර්ගය | නිපදවන ලද පැළ සංඛ්‍යාව |
|---|---|
| රඹුටන් බද්ධ පැළ | 1,100 |
| කටු අනෝදා බීජ පැළ | 10,000 |
| **එකතුව** | **11,100** |

## උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපළ - අඹතැන්න

අඹතැන්න උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපළ, හෙක්ටයාර 1.9ක භූමි ප්‍රමාණයකින් යුතු කුඩා ගොවිපළකි. රඹුටන්, දූරියන් හා කෙසෙල් වැනි පලතුරු ශාක සඳහා මෙම භූමි ප්‍රදේශය වෙන්කර ඇත. දූරියන්, රඹුටන්, කාමරංගා හා වෙනත් බොහෝ පලතුරු බෝග විශේෂ වල රෝපණ ද්‍රව්‍ය නිපදවන පලතුරු පැළ තවානක් මෙම ගොවිපළ සතුය.

### ප්‍රගතිය

#### රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

ඒකකයේ පලතුරු පැළ තවාන මගින්, පලතුරු ගම්මාන ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කළ අතර මේ සඳහා අරමුදල්, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයෙන් ලබා දෙන ලදී.

**වගු අංක 1.3.1.4: අඹතැන්න උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපළේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

| පැළ වර්ගය | නිපදවූ පැළ සංඛ්‍යාව |
|---|---|
| අලිපේර - බද්ධ | 350 |
| සැපදිල්ලා - බද්ධ | 950 |
| දූරියන් - බද්ධ | 1,500 |
| කොස් - බද්ධ | 550 |
| කාමරංගා - බද්ධ | 1,995 |
| ජම්බු - බද්ධ | 540 |
| පේර - බද්ධ | 145 |
| කටු අනෝදා - බද්ධ | 1,450 |
| උගුරැස්ස | 25 |
| වෙනත් - බද්ධ | 250 |
| ලෙමන් - අතු පැළ | 1,200 |
| ජම්බු - අතු පැළ | 575 |
| පේර - බීජ පැළ | 2,000 |

| පැළ වර්ගය | නිපදවූ පැළ සංඛ්‍යාව |
|---|---|
| කටු අනෝදා - බීජ පැළ | 15,000 |
| පැෂන් ෆෘට් | 1,050 |
| දෙහි බීජ පැළ | 5,500 |
| මිටි ඇඹරැල්ලා බීජ පැළ | 345 |
| පැපොල් | 890 |
| එළවළු බඳුන් පැළ | 1,121 |
| වෙනත් බීජ පැළ | 510 |
| **එකතුව** | **36,946** |

**වගු අංක 1.3.1.5: පලතුරු ගම්මාන ව්‍යාපෘතිය යටතේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

| පැළ වර්ගය | නිෂ්පාදනය කළ පැළ සංඛ්‍යාව |
|---|---|
| අනෝදා බීජ පැළ | 8,000 |
| අඹ - බද්ධ | 650 |
| **එකතුව** | **8,650** |

## 2018 වසර සඳහා සැලැස්ම

### පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය, ගන්නොරුව

#### පර්යේෂණ - පලතුරු අභිජනනය

- වැඩි අස්වනු ලබාදෙන ඉහළ ගුණාත්මයෙන් යුතු පැපොල් ප්‍රභේද සංවර්ධනය.
- මැදරට තෙත් කලාපය සඳහා ඉහළ අස්වනු ලබාදෙන ඉහළ ගුණාත්මයෙන් යුතු පැඟිරි ප්‍රභේද වරණය.
- මැදරට තෙත් කලාපය සඳහා අලිපේර ප්‍රභේද වරණය.
- මැදරට තෙත් කලාපය සඳහා ඉහළ අස්වනු ලබාදෙන ඉහළ ගුණාත්මයෙන් යුතු පේර ප්‍රභේද වරණය.
- ජානප්ලාස්ම ඇගයීමෙන් වරණය කළ 'ඇම්බන්' කෙසෙල් දර්ශ ඇගයීම.
- ක්ෂේත්‍ර තත්ව යටතේ නෙමටෝඩා ප්‍රතිරෝධී පේර බද්ධ පැළ ඇගයීම
- නිර්දේශ කිරීම සඳහා සුදුසු ජාන දර්ශ තේරීමට දූරියන් ජානප්ලාස්ම ඇගයීම
- ඌන භාවිත පලතුරු විශේෂයන් ක්ෂේත්‍රයේ වගාකොට ඇගයීම.
- බෙලි, මසං, මොර, මාදං, නෙල්ලි වැනි කැපී පෙනෙන ඌන භාවිත පලතුරු බෝගවල ජානදර්ශ ඇගයීම.
- විකෘති අභිජනනය මගින් වැඩි අස්වනු ලබාදෙන හොඳ තත්ත්වයේ මොර ප්‍රභේද සංවර්ධනය

#### ශෂ්‍ය විද්‍යාව හා වෙනත්

- මොර, බෙලි, වෙරළු, නම් නම්, මොර හා කරවල කැබිල්ල වැනි ඌන භාවිත පලතුරු විශේෂ සඳහා වර්ධක ප්‍රචාරණ ක්‍රම ඇගයීම.
- විශාල බඳුන් වල වගා කොට දේශීය පලතුරු විශේෂ ඇගයීම.
- මොර වල කෘත්‍රිම පුෂ්ප ප්‍රේරණය අධ්‍යයනය කිරීම.
- මසං, කටු අනෝදා හා මොර වල ඉක්මන් බීජ ප්‍රරෝහණය, පැළ වර්ධනය, බද්ධ කිරීමේ දී දක්වන සාර්ථකත්වය වැඩි දියුණු කිරීමට අධ්‍යයනයන් සිදු කිරීම.
- අංකුර බද්ධ හා රිකිළි බද්ධ කටු අනෝදා පැළ ක්ෂේත්‍ර තත්ව යටතේ ඇගයීම.
- පලතුරු නිෂ්පාදනය කෙරෙහි කාලගුණ වෙනස්කම් වල බලපෑම පිළිබඳ පර්යේෂණ අඛණ්ඩව සිදු කර ගෙන යෑම.
- නම් නම් වල මල් හට ගැනීම හා එල හට ගැනීම කෙරෙහි වර්ධක ප්‍රචාරණයේ බලපෑම අධ්‍යයනය කිරීම.

- නෙල්ලි, මොර හා මසං සඳහා විකල්ප ග්‍රාහක සපයා ගැනීම පිළිබඳව අධ්‍යයනය

**රඹුටන් පර්යේෂණ ඒකකය, එරමිණිගොල්ල**

- රඹුටන් හා කොස් (වරකා) වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය.

- ගොවිපලේ පහසුකම් වැඩි දියුණු කිරීම

**උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපළ, අඹතැන්න**

- පලතුරු හා වෙනත් බෝගවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- මව් ශාක පලතුරු උයනක් පිහිටුවීම.
- ගොවිපලේ පහසුකම් වැඩි දියුණු කිරීම

## කාර්ය මණ්ඩලය

### පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය - ගන්නොරුව

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| ආයතන ප්‍රධානි / සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි. පර්යේෂණ) කාර්ය භාර | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 01 |
| සංවර්ධන නිලධාරි | 02 |
| ගොවිපළ කළමනාකරු | 01 |
| පර්යේෂණ සහකාර | 02 |
| ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| තාක්ෂණ සහායක | 04 |
| ගොවිපළ ලිපිකරු | 02 |
| රියදුරු | 01 |
| පර්යේෂණ උප සහකාර | 02 |
| පැස්සුම්කරු | 01 |
| බද්ධකරු | 03 |
| මුරකරු | 13 |
| කම්කරු | 47 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 23 |
| **එකතුව** | 105 |

### රඹුටන් පර්යේෂණ ඒකකය, එරමිණිගොල්ල

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| ගොවිපළ කළමනාකරු | 01 |
| සංවර්ධන නිලධාරි | 01 |
| කෘෂිකර්ම උපදේශක | 01 |

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| බඳ්ධකරු | 01 |
| මුරකරු | 02 |
| කම්කරු | 04 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 00 |
| **එකතුව** | **10** |

## උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපළ, අඹතැන්න

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| ගොවිපළ කළමනාකරු | 01 |
| සහකාර ගොවිපළ කළමනාකරු | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 01 |
| කෘෂිකර්ම උපදේශක | 01 |
| තාක්ෂණ සහායක | 02 |
| ගොවිපළ ලිපිකරු | 02 |
| මුරකරු | 03 |
| බඳ්ධකරු | 01 |
| කම්කරු (ස්ථිර) | 12 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 05 |
| **එකතුව** | **29** |

## 1.3.2. පැළෑටි වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානය - හෝමාගම

පැළෑටි වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානය, හොරණ පිහිටි පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පරිපාලන අධ්‍යක්ෂ යටතේ ක්‍රියාත්මක ආයතනයකි. මෙම ආයතනයේ කාර්යභාරය වන්නේ පැළෑටි වෛරස් සහ වෛරස් වැනි ජීවීන් හඳුනා ගැනීමට වර්තමානයේදී උපයෝගී කර ගනු ලබන උසස් තාක්ෂණික ක්‍රම යොදා ගැනීම, විද්‍යාගාර තුළ දී සහ ක්ෂේත්‍රයේ දී වෛරස් සහ වෙනත් ජීවීන් හඳුනා ගැනීමට පරීක්ෂණ කට්ටල නිෂ්පාදනය, නිරෝධායන කාර්යයන්, වසංගත විද්‍යාත්මක විමර්ශන, උපයෝගී කර ගත හැකි වෙනත් පාලන ක්‍රම ඇගයීම, වෛරස්වලින් තොර මූලික වගා මාධ්‍ය පිරවුම් හඳුන්වා දීම, වෛරස් ප්‍රෝටීන කොපුව මගින් ඇති කරන ප්‍රතිරෝධිතාව සොයා බැලීම සහ වෙනත් ව්‍යාධිජනක ජීවීන් (දිලීර, බැක්ටීරියා, නෙමටෝඩා, වෛරොයිඩ සහ ෆයිටොප්ලාස්මා) හඳුනා ගැනීම යනාදියයි. පර්යේෂණ සහ ව්‍යාප්තියට අදාළ ක්‍රියාකාරකම් මාලාවක් ඇතුලුව තාක්ෂණික දැනුම බෙදා හැරීම දියගම පිහිටි පරිසර හිතකාමී කෘෂිකාර්මික තාක්ෂණික ඒකකය නමැති උප මධ්‍යස්ථානයෙන් සිදු කෙරේ.

### අයවැය

**වගු අංක 1.3.2.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 2,911,170 | 3,197,700 | 110 |
| මූලධන | 1,378,000 | 1,384,346 | 100 |
| ව්‍යාපෘති | | | |
| • ගැමා විකිරණය භාවිත කොට නාලස්ථ විකෘති ජනනයෙන් සහ බීජ විකෘති ජනනයෙන් දෙළුම්වල බලාපොරොත්තු තැබිය හැකි ආර සංවර්ධනය | 327,900 | 269,634 | 82 |
| • තෝරා ගනු ලැබූ පලතුරු බෝග (ගස්ලබු දෙහි සහ අන්නාසිවල විශේෂ ප්‍රභේද) සඳහා ප්‍රචාරණ ක්‍රම මගින් වෛරස්වලින් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිණිස ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීම | 1,050,000 | 1,076,880 | 103 |
| • ෆයිටොප්ලාස්මා රෝගය හඳුනාගැනීම සහ තහවුරු කර ගැනීම මෙන්ම වගාකළ බෝග තුළ ඒවායෙහි ධාරක පරාසය නිර්ණය කිරීම | 1,518,300 | 1,518,300 | 100 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| • ශ්‍රී ලංකාවේ දකුණු වියළි කලාපයේ වගා කෙරෙන කුකර්බිටේසියේ කුළයේ බෝග, මිරිස් සහ රනිලවල වෛරස් සහ වෛරස් වැනි රෝග හඳුනාගැනීම | 1,000,000 | 989,137 | 99 |
| • *Fusarium oxysporum f.sp. cubense* කෙසෙල්වල පැනමා හේතුකාරක වන *Fusarium oxysporum f.sp. cubense* රෝගය සාර්ථක ලෙස කළමනාකරණය සඳහා පසෙහි සක්‍රිය ප්‍රතිරෝධිතාවෙහි විභව භාවිතය | 1,671,700 | 1,608,418 | 96.2 |
| • අඹ සහ දූරියන්වල කඳ විදින්නන් පාලනය සඳහා සමෝධානිත පළිබෝධ පාලන වැඩසටහන | 595,000 | 458,800 | 77.1 |
| • කෘෂිකර්මදෙපාර්තමේන්තු නිර්දේශිත කෙසෙල් ප්‍රභේදයක්වන 'අග්‍රා' ප්‍රභේදය සඳහා ක්ෂුද්‍ර ප්‍රචාරණය ප්‍රොටොකෝලය ප්‍රශස්ථකරණය | 284,000 | 281,390 | 99.1 |
| • ජෛව විවිධත්වය ව්‍යාපෘතිය<br>○ පරිසර හිතකාමී කෘෂි තාක්ෂණ ඒකකය (දියගම) | 500,000 | 498,146 | 99.6 |
| **එකතුව** | **11,236,070** | **11,282,751** | **100** |

## ප්‍රගතිය

### ශාක වෛරස් විද්‍යාව

- ශ්‍රී ලංකාවේ දකුණු දිග වියළි කලාපිය ප්‍රදේශවල වැවෙන පිපිඤ්ඤා, රනිල සහ මිරිස්වලට වැළඳෙන වෛරස් සහ වෛරස් වැනි ආසාදන හඳුනාගැනීම සහ කළමනාකරණය අඟුණකොළපැලැස්ස මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සහයෝගිතාවෙන් යුතුව සිදු කරන ලදී. මෙය අඛණ්ඩව ක්‍රියාත්මක වන්නකි. 'තුඹ කරවිල' ෆයිටොප්ලාස්මාවලින් බරපතල ලෙස ආසාදනය වී ඇත. තවද එය පිපිඤ්ඤා කොළ ළප විචිත්‍ර වෛරසයෙන් හා පැපොල් මුදු පුල්ලි වෛරසයෙන්ද සුළු ප්‍රතිශතයකින් ආසාදනය වී තිබිණ. පිපිඤ්ඤාවල අනෙකුත් පොදු වෛරස් වනුයේ ෆයිටොප්ලාස්මා සහ බෙගමෝ වෛරසයි. පිපිඤ්ඤා කුඩිත්තන්ගෙන් පැතිරෙන කහ පැහැති විචිත්‍ර වෛරසය මගින් කරවිල බරපතල ලෙස ආසාදනය වි තිබිණ.

- මිරිස්වල වෛරස් රෝග කළමනාකරණය සඳහා පාරිසරික ඉංජිනේරු සංකල්පය භාවිතා කිරීම අධ්‍යයනය කරන ලදී. මිරිස් ක්ෂේත්‍ර වටා මල් වැටවල් සිටුවීමෙන් සහ පරාවර්තනමය පොලිතින් වසුන්වලින්

ආවරණය කිරීමෙන් මිරිස්වල වෛරස් රෝග ආසාදන අඩු විය.

- අන්නාසිවල අන්නාසි මැලවීමේ වෛරසය පාලනය සඳහා විවිධ පොහොර යෙදීමේ කාර්යක්ෂමතාව සොයා බැලීමට අධ්‍යයනයක් සිදු කරන ලදී. බවර් පොහොර මිශ්‍රණය යෙදීම මගින් පැළ වල රෝගයෙහි බරපතල ස්වභාවය අඩු කළ බව හඳුනා ගැණින.
- දෛනික වෛරස් හඳුනාගැනීමේ වැඩසටහනෙහිදී, විවිධ වෛරස් සඳහා ශාක නියැදි 1,500ක් පරීක්ෂා කරන ලද අතර, එමඟින් රු. 306,000/=ක අදායමක් ඉපැයිණි.

## අණුක වෛරස් විද්‍යාව

- ජාන සුසංයෝගී පැපොල් පැළ නිෂ්පාදනය සඳහා ජාන නිමැවුම් සකස් කිරීමට මූලිකය (Primer) යළි සැකසුම් කරන ලදී.
- මූලික (Primers) සඳහා සීමා ස්ථාන (Restriction sites) එක් කරන ලද අතර එමගින් ශ්‍රී ලංකාවේ පැපොල් මුදු පුල්ලි වෛරසයේ (PRSV) ප්‍රෝටීන කොපුව නිමවන ජාන ප්‍රදේශය ප්‍රගුණනය කරන ලදී. ප්‍රගුණිත ජාන කොටස අනුක්‍රම (Sequencing) නිර්ණය සඳහා යොමු කර තහවුරු කරන ලදී. පරිණාමන අධ්‍යයන කටයුතු සිදු කෙරෙමින් පවති.
- ෆයිටොප්ලාස්මා රෝගය නිර්ණය කර ගැනීම සඳහා බෝග දර්ශ 5ක් පදනම් කර ගත් සමීක්ෂණයක් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 14ක සිදු කරන ලදී. පතෝල, බණ්ඩක්කා, කරවිල, මිනීමල්, මයුරතණ, කැපුම්කීරිය, ඇටෝර, උඩවැඩියා, ගැට තුඹ, උඳුපියලිය සහ යෝධ නිදිකුම්බා යන ශාක ෆයිටොප්ලාස්මවලින් ආසාදනය වී ඇති බව තහවුරු කර ගන්නා ලදී.
- කරවිල, පතෝල, වැටකොළු සහ බණ්ඩක්කා බීජ මගින් ෆයිටොප්ලාස්මා රෝගය සම්ප්‍රේෂණය වන බව තහවුරු විය.
- ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් *Fusarium oxysporum* f.sp. *cubense* නියැදි එක්රැස් කර ගන්නා ලද අතර අණුකමය ක්‍රමවේද මගින් එය හඳුනාගන්නා ලදී. *Fusarium oxysporum* f.sp. *cubense* හි ජානමය විවිධත්වය හඳුනා ගැණින.
- අණුක ක්‍රමවේද මගින් ශ්‍රී ලංකා සහ ඉන්දියා මඤ්ඤොක්කා විචිත්‍ර වෛරස හඳුනා ගන්නා ලද අතර මෙම වෛරස් රෝග දෙක එකවර හඳුනා ගැනීම සඳහා ඩුප්ලෙක්ස් PCR (Duplex PRC) ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී.
- දෛනික වෛරස් හඳුනාගැනීමේ වැඩසටහනෙහිදී, එළවළු බෝග, පලතුරු බෝග, විසිතුරු පැළ සහ ආකන්ධ බෝග ඇතුළුව ආසාදිත යැයි සැක කෙරෙන ශාක නියැදි හාර දහස් එකසිය පනස් හතරක් (4,154) වෛරස් හඳුනා ගැනීමේ පරීක්ෂණ සඳහා ලක් කෙරිණ. එයින් උත්පාදිත අදායම රු. 1,029,000/=කි.

## පටක රෝපණය

- පටක රෝපණ තාක්ෂණය තුළින් ප්‍රශස්ථකරණය කරන ලද ක්‍රමවේදය මගින් 'අග්‍රා' නමැති කෝලිකුට්ටු විශේෂය ගුණනය වීමේ වේගය සැලකිය යුතු තරම් පහළ මට්ටමක පවතින හෙයින් එකී ක්‍රමවේදය වෙනස් කළ යුතුය. එබැවින් එම ක්‍රමවේදය වෙනස් කර ඉහත ගැටලුව මගහරවා ගැනීමට පර්යේෂණයක් ආරම්භ කරන ලදී. මේ වන විට මුල් අද්දවන අවධියේ පසුවෙයි.
- කිණක රෝපණය මගින් පවතින දෛහික කොටස් භාවිතයෙන් ශාක නැවත උත්පාදනය කරගත හැකි අතර මෙම ක්‍රමය විකෘති අභිජනන වැඩසටහනේ දී අගනා මෙවලමක්

වශයෙන් භාවිතා කළ හැකිය. මතුපිට ජීවානුහරණය, ස්ථාපනය සහ කිණක උත්පාදන පියවරයන් සාර්ථක අන්දමින් නිම කරන ලද අතර, පර්යේෂණ මේ වන විට කළල වර්ධනය අවධියෙහි පසුවෙයි.

- පටක රෝපණ විද්‍යාගාර තුළ ප්‍රතිදීප්ත ලාම්පු බහුලව භාවිතා තුළ ද සාපේක්ෂව විදුලි පරිභෝජනය ඉහළ මට්ටමක පවතියි. එබැවින්, කාර්යක්ෂම අලෝක ප්‍රභවයක් හඳුන්වාදීම වැදගත් වන අතර, එනයින් නාලස්ථ පැළවල තත්ත්වය වැඩිදියුණු වන්නා සේම එක් ශාකයක් බිහිකිරීම වෙනුවෙන් වැයවන නිෂ්පාදන පිරිවැය ද අවම කෙරෙනු ඇත. නාලස්ථ සහ හරිතාගාර පැළ වල වර්ධනය හා ගොඩනැගීම සඳහා විකල්ප විභව ආලෝක ප්‍රභවයක් වශයෙන් LED (ආලෝක විමෝචක ඩයෝඩ) සුදුසු යැයි යෝජනා වී තිබේ. එමනිසා TC කුඩා පැළවල වර්ධනය හා ගුණනය සඳහා LED හි බලපෑම අධ්‍යයනය කිරීමට පර්යේෂණයක් ආරම්භ කරන ලදී. LED පද්ධතිය යටතේ විවිධ බෝගවල රෝපිත පවත්වාගෙන යනු ලැබූ අතර පර්යේෂණය තවදුරටත් සිදු කෙරේ.

## සංවර්ධන වැඩසටහන්

### කෙසෙල්වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

- පටක රෝපිත කෙසෙල් පැළ සඳහා පවතින ඉහළ ඉල්ලුම සැපිරීම පිණිස රෝගවලින් තොර පැළ 10,000ක් නිෂ්පාදනය කිරීමේ නව වැඩසටහනක් ආරම්භ කරන ලදී. 2017 වර්ෂයේදී පැළ නවදහස් නවසිය පනහක් නිෂ්පදනය කොට බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය හරහා ගොවීන් අතර බෙදා දෙන ලදී.
- ක්ෂේත්‍රයේ සිටුවීමෙන් අනතුරුව ආනයනික දෙළුම්වල මනා වූද තත්ත්වයෙන් උසස් වූ ද ලක්ෂණ සමඟ කිණක ප්‍රේරිත පටක රෝපිත පැළ තෝරාගන්නා ලදී. තෝරාගනු ලැබූ පැළවල ගැට සහිත කොටස් රෝපණය සඳහා ක්‍රමවේදය ගොඩනගන ලදී.
- ගැමා විකිරණය භාවිතයෙන් නාලස්ථ හා බීජ විකෘති ජනනය මගින් බලාපොරොත්තු තැබිය හැකි දෙළුම් ආර සඳහා ගැමා විකිරණය කරන ලදී. කිණක හා බීජ සඳහා යෝග්‍ය LD 50 අගය හා ගැමා විකරණය මාත්‍රාවන් නිර්ණය කරන ලදී. ගැමා විකරණය කරන ලද දෙළුම් පැළ ක්ෂේත්‍රයේ සිටුවන ලදී. ශාක වල විවිධ ලක්ෂණ හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර ඇගයීම් සිදු කෙරෙමින් පවතියි.
- දේශීය දෙමුහුම් බීජ ආධාරයෙන් පටක රෝපිත දෙමුහුම් පැපොල් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ක්‍රමවේදයකට පර්යේෂණ කරන ලදී. අංකුර මතුපිට ජීවානුහරණය අංකර ගුණනය ප්‍රශස්ථකරණය කරන ලදී.
- ආනයනිත ඇපල්වලින් ලබාගත් බීජ අනුසාරයෙන් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ක්‍රමවේදයකට ගොඩනැගිම සිදු කරන ලදී. ඇපල් බීජ MS මාධ්‍යයක ප්‍රරෝහණය කෙරිණ. නාලස්ථ වශයෙන් ප්‍රරෝහණය කරන ලද ඇපල් බීජාංකුර වලින් අග්‍රස්ථ අංකුර ලබාගත් අතර, අංකුර ගුණනය හා මුල් ඇද්දවීම සඳහා ක්‍රමවේදය සාර්ථකව නිම කරන ලදී.
- පර පරාගනය මගින් නව අන්නාසි දර්ශයක් නිෂ්පාදනය සඳහා පර්යේෂණ කරන ලදී. කිවු (Kew), මුරිසි හා MG3 අන්නාසි ප්‍රභේද පර පරාගනය සඳහා යොදා ගන්නා ලදී. අන්නාසි බීජ එක්රැස් කර ගන්නා ලද අතර ප්‍රරෝහණය සඳහා හෝර්මෝනවලින් තොර MS මාධ්‍යයක නාලස්ථ රෝපණය සිදු කරන ලදී. ප්‍රරෝහිත බීජාංකුර, MS මාධ්‍යයක් තුළ අංකුර ගුණනයට, මුල් ඇද්දවීමට සහ දැඩි කිරීමට ලක් කෙරිණ. දැඩි කරන ලද

අන්නාසි පැළ ක්ෂේත්‍රයේ ස්ථාපනය කරන ලදී. වෙනස් ලක්ෂණ සහිත පැළ හඳුනා ගන්නා ලද අතර මේවා තවදුරටත් අධීක්ෂණය සඳහා මොරෙයියන් සිටුවන ලදී.

## වසංගත රෝග විද්‍යාව

- අඹ හා දූරියන්වල කඳ විදින්නන් පාලනය සඳහා සමෝධානිත පලිබෝධ පාලන වැඩසටහනෙහි අංගයක් වශයෙන් පලිබෝධනාශක වල කඳ එන්නතක් සඳහා ක්‍රමවේදයක් ගොඩනැගීම නමැති ව්‍යාපෘතියේ දෙවන වර්ෂය තෙත් කලාපයේ විවිධ දිස්ත්‍රික්කවලට අදාළව ක්‍රියාත්මක කරන ලදී. එය ප්‍රධාන වශයෙන් කුරුණෑගල වැව්ලි සමාගමට අයත් මහයාය තේ වත්තෙන් ආරම්භ කොට ක්‍රියාත්මක කෙරිණ. සමෝධානිත පාලනය සමඟ ගැටළුව සාර්ථක ලෙස පාලනය කළ හැකි බව අනාවරණ විය. කඳ එන්නත් ක්‍රමයෙන් පමණක් පලිබෝධකයා මුළුමනින්ම පාලනය නොවීය. වෙනස් වර්ෂ හා සසඳන කල්හි මෙම වර්ෂය තුළ ගම්පහ දිස්ත්‍රික්කය තුළ පලිබෝධ හානි සංඛ්‍යාව අඩු විය. කෑගල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර කෘෂිකර්ම නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
- සුදු කොරපොතු කෘමීන් ක්ෂේත්‍ර මට්ටමෙන් පැතිරීම තක්සේරුකරණය සහ අඹ සහ වෙනත් පලතුරු බෝග වල කළමනාකරණ විධි නිශ්චිත කිරීම සඳහා පැළැටි වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානය සහ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය මූලික කරගනිමින් පර්යේෂණයක් ආරම්භ කරන ලදී. මාර්ගය දෙපස වැඩෙන අඹ ගස්වලින් දත්ත එක්රැස් කර ගැණින. ග්‍රාමීය ප්‍රදේශවලට සාපේක්ෂව නගරබද ප්‍රදේශවල වැඩෙන අඹ ගස්වල පලිබෝධ හානි ඉහළ බව හඳුනාගන්නා ලදී. ආර්ද්‍රව හා පෝෂණ ආතතිවලට ගොදුරු වූ ශාකවල හානියේ බරපතල ස්වාභාවය ඉහළ මට්ටමක පැවතිණි. දූවිලි සහිත පරිසරයක දී ද එම තත්ත්වය උග්‍ර විය. 'පිටර්ප්‍රසාන්ද්' (Peterprasand) නමැති ප්‍රභේදය තුළ පලිබෝධ හානි ඉහළ මට්ටමෙන් ද ගිරා අඹ වල එය ඉතා අවම මට්ටමකින් ද නිරීක්ෂණය විය.

## ක්ෂුද්‍ර ජීවි විද්‍යාව

- පැපොල් වල පැපොල් මුදු පුල්ලි වෛරසයට එරෙහි ශාක වර්ධක උද්දීපන රයිසොබැක්ටීරියා (PGPR) යෙදීම මගින් ප්‍රේරිත ආරක්ෂණ එන්සයිම පිළිබඳ පරීක්ෂණයක් සිදු කරන ලදී. *Pseudomonas* සහ *Bacillis* spp. යන ඇතැම් රයිසොබැක්ටීරියා විශේෂ පමණක් අඩංගු රෝපණවල ආරක්ෂණය හා සම්බන්ධ එන්සයිමවල ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමේ හැකියාව පවතින බව සොයා ගන්නා ලදී. මෙම පරීක්ෂණය තවදුරටත් සිදු කෙරේ.
- මිරිස් වෛරසය පාලනය සඳහා හඳුනාගනු ලැබූ *Pseudomonas fluorescence* උප විශේෂ 5ක තනි රෝපණවල ක්ෂේත්‍ර මට්ටමේ සාඵල්‍යතාව හඳුනාගැනීම පිණිස ක්ෂේත්‍ර අත්හදා බැලීමක් සිදු කරන ලදී. උග්‍ර බැක්ටීරියා මැලවීමේ ආසාදනය හේතුවෙන් එය අසාර්ථක විය.
- *Fusarium oxysporium* sp. *Cubesence* හේතුකාරකවන, කෙසෙල්වල පැනමා රෝගය සාර්ථකව පාලනය කිරීමේ විභව ප්‍රතිරෝධී බැක්ටීරියා හඳුනාගැනීම සිදු කරන ලදී. නාලස්ථ පරීක්ෂණ මගින් විභව බැක්ටීරියා රෝපණ වර්ග පහක් හඳුනා ගැණින. බඳුන් අත්හදා බැලීමක් ආරම්භ කරන ලදී.
- පැපොල් වල පැපොල් මුදු පුල්ලි වෛරසය පාලනය සඳහා ශාක ප්‍රතිවෛරස සංයෝග භාවිතයෙහි

විභවය සොයා බැලීම සඳහා අධ්‍යයනයක් මෙහෙයවන ලදී. *Boerhavia diffusa* මුල් නිස්සාරණය සහ *Clerodendrum aculatum* පත්‍ර නිස්සාරණය පැපොල් මුදු පුල්ලි වෛරස රෝග ලක්ෂණ අවම කිරිමෙහිලා කාර්යක්ෂම බව හඳුනා ගැණින.

- පටිපාටිගත හඳුනාගැනීමේ වැඩසටහනෙහි දී රෝගකාරකය හඳුනාගැනීම පිණිස රෝග නියැදි 200ක් පමණ පරීක්ෂා කරන ලද අතර නිර්දේශද සපයන ලදී.

## තාක්ෂණික හුවමාරුව

- ව්‍යවසායකයින්, කෘෂිකර්ම උපදේශකයන්, ගුරුවරුන්, රාජ්‍ය නිලධාරීන්, NVQ ශිෂ්‍යයන්, විද්‍යාර්ථීන් සහ පාසල් සිසුන් 1000කගේ සමස්ථ සංඛ්‍යාවක් සඳහා පුහුණු වැඩසටහන් 28ක් හා ක්ෂේත්‍ර දින දෙකක් PVIC හිදී පවත්වන ලදී.
- පටක රෝපණ වැඩසටහන් 4 ක් (සිවු දින) සඳහා 32 දෙනෙකු සහභාගි විය.
- කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාල මණ්ඩලය සමඟ ක්ෂේත්‍ර දින දෙකක් මෙහෙයවන ලදී.
- නාගරික කෘෂිකර්මාන්තය නඟා සිටුවීම සඳහා "අටුකොටු පුරවමු එක්වෙමු නැගිටිමු" වැඩසටහන් යටතේ බීජ පැකට්ටු 66 ක් PVIC නිලධාරීන් අතර බෙදා දෙන ලදී.
- ආදර්ශන සැලැස්මක් වශයෙන් නාගරික කෘෂිකර්ම ආදර්ශනයක් නඩත්තු කිරීම.
- 225 දෙනෙකුගේ සහභාගිත්වයෙන් දියගම පරිසර හිතකාමී කෘෂිකර්ම තාක්ෂණ ඒකකයේ ක්ෂේත්‍ර වැඩසටහන් 05ක් පැවැත්විණ.
- තාක්ෂණික නව නිපැයුම් අන්තර්ගත පත්‍රිකා 5,500ක් බෙදා හරින ලදී.
- ක්ෂේත්‍ර චාරිකා 15ක්ද ඇතුළුව පාරිභෝගිකයන් 300කට අධික පිරිසකට තාක්ෂණික උපදෙස් සැපයිණි.

## පුහුණු

- එක් M.Phil විද්‍යාර්ථියෙක් සහ විශ්වවිද්‍යාල සතරක (ජයවර්ධනපුර, වයඹ, රජරට, පේරාදෙණිය හා රුහුණ) විද්‍යාර්ථීහු සත් දෙනෙක් අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘතිය PVIC හිදී නිම කළහ.
- සේවාස්ථ පුහුණු :- විද්‍යාර්ථීන් සිවු දෙනෙක් හා පාසල් සිසුහු සය දෙනෙක් ඔවුන්ගේ සේවාස්ථ පුහුණුව PVIC හිදී නිම කළහ.

## ගුවන් විදුලි වැඩසටහන්

- SLBC හි "ගෙවත්ත සජීවී ගුවන්විදුලි වැඩසටහන්" සඳහා නිලධාරීහු 21 දෙනෙක් සහභාගි වූහ.
- "ගුවන්විදුලි ගොවි සේවාව" මගින් මෙහෙයවන "වෙබ් FM" සඳහා නිලධාරීහු 03 දෙනෙක් සහභාගි වූහ.

# 2018 වර්ෂය සඳහා සැලැස්ම

## ශාක වෛරස් විද්‍යාව

- ශ්‍රී ලංකාවේ දකුණු දිග වියළි කලාපයේ කියුකර්බිට්ස්, රනිල සහ මිරිස් යනාදී බෝගවලට වැළඳෙන වෛරස සහ වෛරස රෝග හඳුනාගැනීම අඟුණකොලපැලැස්ස සමඟ සිදු කරන සහයෝගීතා වැඩසටහනකි. පර්යේෂණ අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.
- අන්නාසිවල, අන්නාසි පිටිමකුණාගෙන් පැතිරෙන මැලවීමේ වෛරසය (PWV) පාලනය පර්යේෂණය තවදුරටත් ක්‍රියාත්මකයි.
- මිරිස්වල වෛරස් රෝග පාලනට ශාක ප්‍රතිවෛරස් සංයෝගවල විභව භාවිතය.

- මිරිස්වල වෛරස් රෝග පාලනයට පාරිසරික ඉංජිනේරු සංකල්පය භාවිතා කිරීම. පර්යේෂණ තවදුරටත් සිදු කෙරේ.

## අණුක වෛරස් විද්‍යාව

- බීජවල ෆයිටොප්ලාස්මා හඳුනාගැනීමට ක්‍රමවේදයක් සැකසීම.
- වාණිජමය වශයෙන් පවතින බීජවල (කරවිල, පතෝල, වැටකොළු, බණ්ඩක්කා, ගස්ලබු, මිරිස්, වම්බටු) ෆයිටොප්ලාස්මා පැවතීම පරීක්ෂා කිරීම.
- අණුක ක්‍රමවේද මගින් වැල්දොඩම් වල වෛරස් රෝග හඳුනාගැනීම.
- පේර මැලවීමේ රෝගයට හේතුවන රෝගකාරකය අණුක ක්‍රමවේද මගින් හඳුනා ගැනීම.
- *Agrobacterium* යොදා ගනිමින් ජාන සුසංයෝගී පැපොල් ශාක නිපදවීම.

## පටක රෝපණය

- DOA නිර්දේශිත 'අග්‍රා' නැමැති කෙසෙල් ප්‍රභේදයේ ක්ෂුද්‍ර ප්‍රචාරණය.
- නව ප්‍රභේද බිහි කිරීම සඳහා පටක රෝපණය භාවිතයෙන් දේශීය හා විදේශීය මිදි ප්‍රභේදවලින් නව දර්ශ නිර්මාණය කිරීම.
- රෝපණාගාර සඳහා කාර්යක්ෂම සහ අඩු පිරිවැය සහිත ආලෝකකරණ පද්ධතියක් හඳුන්වාදීම.
- පටක රෝපණ මාධ්‍යයන් ඝනීකරණය සඳහා අඩු පිරිවැය අමුද්‍රව්‍ය හඳුන්වාදීම.
- පටක රෝපණ තාක්ෂණ භාවිතයෙන් තෝරාගන්නා ලද දෙළුම් දර්ශ වල දඬු කැබලි භාවිතයෙන් දෙළුම් පැළ නිපදවීම සඳහා ක්‍රමවේදයක් ගොඩනැගීම.
- ගැමා විකිරණය භාවිතයෙන් නාලස්ථ විකෘතිකරණය තුළින් දෙළුම් පෙළපත් බිහි කිරීම (කල්පිටිය ARS සමඟ සහයෝගිතාවයෙන්)
- මුරිසි, කිව් හා MG3 අන්නාසි ප්‍රභේද භාවිතා කොට පර පරාගනය මගින් නව අන්නාසි ප්‍රභේද නිෂ්පාදනය.
- දේශීය දෙමුහුම් බීජ භාවිතයෙන් පටක රෝපිත දෙමුහුම් ගස්ලබු රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය.

## වසංගත රෝග විද්‍යාව

- අඹ සහ දූරියන්වල කඳ විදින්නන් පාලනය සඳහා සමෝධානිත පලිබෝධ පාලන වැඩසටහනේ අංගයක් වශයෙන් පලිබෝධනාශකවල කඳ එන්නතක් සකස් කිරීම සඳහා ක්‍රමවේදය.
- සුදු කොරපොතු කෘමියා ක්ෂේත්‍ර මට්ටමෙන් ව්‍යාප්ති රටාව අධ්‍යයනය කිරීම සහ අඹ ශාක සහ පලතුරු බෝගවල ඒවා පාලනය නිශ්චිත කිරීම.

## ක්ෂුද්‍ර ජීවී විද්‍යාව

- සමෝධානික ප්‍රවේශයක් තුළින් පැපොල් වල පැපොල් මුදු පුල්ලි වෛරසය කළමනාකරණය.
- *Pseudomonas fluorescence* භාවිතයෙන් මිරිස්වල මිරිස් නාරටි විචිත්‍ර වෛරසයට (ChiVMV) එරෙහිව අභ්‍යන්තර ප්‍රතිරෝධිතාව ප්‍රේරණය කිරීමේ පර්යේෂණය තවදුරටත් සිදු කෙරේ.
- *Fusarium oxysporium sp. Cubesence.* හේතුවෙන් කෙසෙල්වලට වැළදෙන පැනමා රෝගය පාලනය සඳහා පාංශු ප්‍රතිරෝධයේ විභව භාවිතය. පර්යේෂණය අඛණ්ඩව සිදු කෙරේ.

## තාක්ෂණ හුවමාරුව

- කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා දැනුම්වත් කිරිමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම. - 01
- සජීවී ගුවන් විදුලි වැඩසටහන් 12කට සහභාගි වීම.

- ආදර්ශන සැලැස්මක් වශයෙන් නගරබද ගෙවතු ඒකකය පවත්වාගෙන යාම.
- පාසල් සිසුන් සඳහා පුහුණු වැඩසටහන් 12ක් පැවැත්වීම.
- ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් මෙහෙයවීම - 02
- පටක රෝපණ (සිවු දින) ව්‍යවසායක වැඩසටහන් කණ්ඩායම් 4

## පරිසර හිතකාමී කෘෂි තාක්ෂණ ඒකකය

දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණයේ අක්කර 15කින් සමන්විත උයනක් ස්ථාපනය කර තිබේ. එහි පරිසර පද්ධතිය විවිධ පලතුරු පැළ (ප්‍රධාන සහ ඌන භාවිත) සහ බහුවාර්ෂික බෝග, කුළුබඩු උයන, ඔසු පැළ එකතුව, අපනයන කෘෂිකාර්මික බෝග, දේශීය අල, භූමි අලංකරණය, පැළ තවාන් මගින් පරිසර හිතකාමී එළවළු වගා ආදර්ශණ, ජීව වායු පද්ධති, ආරක්ෂිත ගෘහ තුළ වගාව, මී මැසි පාලනය, බිම්මල් කුටිය විවිධ ජල සම්පාදන පද්ධති, කොම්පෝස්ට් සැකසීම, අංග සම්පූර්ණ කාලගුණ විද්‍යා ඒකකය සහ නැවත වන වගා සඳහා ආවේණික ශාක විශේෂ යොදා ගනිමින් වගාකළ හරිත තීරු කිහිපයකින් නිර්මාණය වී තිබේ.

- කෙසෙල් මව් ශාකවල ස්ථානිය එකතුවක් ස්ථාපනය (නුමුහුම් තත්ත්ව) කරන ලදී. ඒවායෙහි අනු ශාක (replicate) ක්ෂේත්‍ර අත්හදාබැලීම් වලට ලක් කෙරිණ.
- බිම්මල් වගාව සඳහා වගා ගෘහයක් ඉදි කරනු ලැබ ඇත.

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| **පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය** | | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 07 | 05 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 08 | 03 |
| කෘෂිකර්ම උපදේශක | 06 | 07 |
| පර්යේෂණ සහකාර | 06 | 06 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 | 04 |
| තාක්ෂණ සහායක | 01 | 01 |
| රියදුරු | 02 | 03 |
| ගබඩාකරු | 01 | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 | 01 |
| මුරකරු | 04 | 03 |
| කම්කරු | 20 | 16 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 05 | 08 |
| **උප එකතුව** | **65** | **59** |

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| **පරිසර හිතකාමී කෘෂි ඒකකය, දියගම** | | |
| කෘෂිකර්ම උපදේශක | 00 | 02 |
| කම්කරු | 00 | 01 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 00 | 06 |
| **උප එකතුව** | **00** | **09** |
| **මුළු එකතුව** | **65** | **68** |

# 1.4. වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය - බතලගොඩ

දිවයිනේ සහල් නිෂ්පාදනය 2010 වර්ෂයේදී ස්වයංපෝෂිත මට්ටම අත්පත් කරගෙන ඇති නමුදු, පසුගිය කන්න කිහිපය තුළ ප්‍රධාන වී වගා ප්‍රදේශ වල පැවති අයහපත් කාලගුණ තත්ව හේතුවෙන් සහල් නිෂ්පාදනය කෙරෙහි දැඩි බලපෑමක් ඇති විය. දිවයිනේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට, සහල් නිෂ්පාදනයේ ස්ථාවර භාවය පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳව අවධානය යොමු කරමින් වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය යහපත් කාලගුණ තත්ව හා අයහපත් කාලගුණ තත්ව යන තත්ව දෙකටම අනුවර්තා ඉහළ ජාන විභවයක් සහිත ප්‍රභේද හා සබැඳි තාක්ෂණවේදය සංවර්ධනය කිරීම සඳහා වූ වී පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන ශක්තිමත් කිරීමට නොකඩවා ප්‍රයත්න දරමින් සිටී. වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, මීට අමතරව ස්වකීය ආයතනය විසින් සංවර්ධනය කරනු ලබන නව තාක්ෂණවේද ප්‍රචාරණය කිරීමෙහි හා Bg ප්‍රභේද වල අභිජනන බීජ නිෂ්පාදනය කිරීමෙහි ද නියැලී සිටී.

## අයවැය

**වගු අංක 1.4.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 16,156,650 | 13,437,208 | 83 |
| මූලධන | 39,443,547 | 33,950,147 | 86 |
| ව්‍යාපෘති | | | |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනේ ව්‍යාපෘති | | | |
| ○ වී වල ඵලදායිතාව වැඩිදියුණු කිරීම | 3,600,000 | 3,580,132 | 99 |
| • විදේශ ව්‍යාපෘති | | | |
| ○ ග්‍රීන් සුපර් රයිස් | 2,161,000 | 2,159,783 | 100 |
| ○ සහල් අස්වනු පරතරය පියවීම | 4,000,000 | 3,473,353 | 87 |
| ○ වල් වී පාලනය හා පැළෑටිනාශක වලට දක්වන ප්‍රතිරෝධීතාව ලාක්ෂණීකරණය | 248,078 | 248,078 | 100 |
| ○ ආදර්ශ ගොවි ගම්මානයක් පිහිටවීම | 9,053,100 | 4,734,312 | 52 |
| • දේශීය ව්‍යාපෘති | | | |
| ○ යකඩ විෂ වීම සඳහා විශ්වාසනීය නිවාරණ තාක්ෂණ සංවර්ධනය කිරීම | 493,000 | 473,989 | 96 |
| ○ අහිතකර අජෛව තත්වයන්ට උචිත වී ප්‍රභේද බිහි කිරීම | 1,272,500 | 1,270,845 | 100 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| ○ ෆොස්පරස් පොහොර අවශ්‍යතාව තීරණය කිරීම | 1,450,000 | 1,444,664 | 100 |
| ○ දුඹුරු පැළ කීඩැවාගේ ජීව දර්ශ හඳුනා ගැනීම | 574,100 | 574,585 | 100 |
| ○ දේශීයව අනුවර්තන සෛල ප්ලාස්මීය පුං වඳ ආර සංවර්ධනය කිරීම | 1,000,300 | 980,052 | 98 |
| ○ වී ඵලදායිතාව ඉහළ නැංවීමට ලවණතාවට ඔරොත්තු දෙන නව වී ආර සංවර්ධනය | 1,317,600 | 1,313,681 | 100 |
| ○ ශ්‍රී ලංකාවේ මහා වී ප්‍රභේදයන්ට උෂ්ණත්වයට ඔරොත්තු දීමේ ලක්ෂණය අන්තර්ගමනය කිරීම | 1,630,700 | 1,642,162 | 101 |
| ○ කුඹුරු වල මීයන් පාලනය කිරීමට ඒකාබද්ධ පාලන ක්‍රමයක් සංවර්ධනය කිරීම | 1,358,000 | 1,344,583 | 99 |
| ○ වී ප්‍රභේද වල ධාන්‍ය තත්ව උප ලක්ෂණ දියුණු කිරීම | 743,000 | 731,022 | 98 |
| ○ සෘජුව වපුරන ලද වී සඳහා ඒකාබද්ධ වල් කළමනාකරණ ප්‍රවේශයක් | 355,100 | 359,171 | 101 |
| ○ e - පළිබෝධ නිරීක්ෂණ හා පුරෝකථන පද්ධතියක් පිහිටවීම | 568,400 | 578,688 | 75 |
| ○ ලවණතාවට හා ගංවතුර බලපෑමට නතු වන පාංශු තත්වවලට සුදුසු වී ප්‍රභේද සංවර්ධනය | 620,600 | 596,883 | 96 |
| **එකතුව** | **87,080,875** | **73,864,372** | **85** |

## ප්‍රගතිය

### පර්යේෂණ

#### වී ප්‍රභේදීය වැඩිදියුණු කිරීම

වඩා වැඩි අස්වනු විභව හා පළිබෝධ හා රෝග කෙරෙහි ඉහළ ජානමය ප්‍රතිරෝධීතාවක් දක්වන ප්‍රභේද වැඩිදියුණු කිරීම කෙරෙහි වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙහි ප්‍රභේදීය වැඩිදියුණු කිරීමේ කටයුතු, අවධානය යොමු කරයි. ලවණතාව, යකඩ විෂවීම හා ජලයෙන් යට වූ තත්ත්ව වලට ප්‍රතිරෝධය දක්වන ප්‍රභේද සංවර්ධනය කිරීම ද අපේක්ෂා කෙරේ. 2017 වර්ෂය තුළදී, පුළුල් ජාන පදනමක්, බොහෝ ජෛව සාධක වලට ප්‍රතිරෝධීතාව හා හොඳ ගුණාත්මක ධාන්‍ය සහිත ඉතා උසස් නව ආර ගොඩනැගීමෙහි ලා සැලකිය යුතු දියුණුවක් අත්පත් කරගෙන ඇත.

#### මාස 4 - 4 ½ වයස් පන්තියේ වී

නිපදවන ලද මුහුම් එකතුව 11කි. $F_1$ ගහන දහයක් හා $F_2$ - $F_4$ ගහන 9ක් ස්ථාපනය

කරන ලදී. ගහන 16කින් උසස් ප්‍රජනිත 220ක් වරණය කර ගන්නා ලදී.

ප්‍රධාන පලිබෝධ හා රෝග, ධාන්‍ය අස්වැන්න හා ධාන්‍ය තත්ව ලක්ෂණ පරීක්ෂා කිරීමට අස්වනු පරීක්ෂණයක් මගින් උසස් ආර 18ක් ඇගයීමට ලක් කරන ලදී. 14-1657 හා 12-685 අංක දරණ ආර ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂාව (NCRVT) සඳහා නම් කරන ලදී. 15-98, 16-85 හා 16-101 උසස් කළ ආර බලාපොරොත්තු තැබිය හැකි ආර ලෙස හඳුනා ගන්නා ලද අතර වැඩිදුර අත්හදා බැලීම් සඳහා වරණය කරන ලදී.

### මාස 3 ½ වයස් පන්තියේ වී

නිපදවන ලද මුහුම් එකතුව 18කි. $F_2$ සිට $F_4$ දක්වා ගහන 25ක් ස්ථාපනය කරන ලද අතර $F_5$ පරම්පරාවේ සිට ඉදිරියට ගහන 41කින් ප්‍රජනිත 650ක් වරණය කර ගන්නා ලදී.

උසස් ආර 16ක් මූලික අස්වනු අත්හදා බැලීම මගින් හා ආර 8ක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීම මගින් ඇගයීමට ලක් කරන ලද අතර Bg 10-1407, ඒකාත්මිකතාවය සහ ස්ථායිතාව (DUS) අත්හදා බැලීම සඳහා යොමු කරන ලදී.

Bg 10-2398, Bg 10-1407, Bg 10-1258 හා Bg 11- 802 යන වී ආර ගුණනය කරන ලදී.

### මාස 3 වයස් පන්තියේ වී

මුහුම් 7ක් නිපදවන ලදී. $F_2$, $F_3$ හා $F_4$ පරම්පරාවල ගහන 21ක් ස්ථාපනය කරන ලද අතර ගහන 14ක් උසස් කරන ලදී. $F_5$ පරම්පරාවේ සිට ඉදිරියට උසස් ගහන 33කින් ප්‍රජනිත 340ක් ස්ථාපනය කොට ඇගයීමට ලක් කරන ලදී.

උසස් ආර 15ක් මූලික අස්වනු අත්හදා බැලීම මගින් හා ආර 15ක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීම මගින් ඇගයීමට ලක් කරන ලද ලදී. Bg 14-2382, Bg 16-1003, Bg 16-975, Bg 15-766 හා Bg 15-822 බලාපොරොත්තු තැබිය හැකි ආර ලෙස හඳුනා ගන්නා ලදී.

Bg 11-1051 බලාපොරොත්තු තැබිය හැකි ආර NCRVT සඳහා නම් කරන ලදී.

### මාස 2 ½ වයස් පන්තියේ වී

මුහුම් 8ක් නිපදවන ලදී. $F_1$ පරම්පරා 7ක් ස්ථාපනය කරන ලදී. $F_2$, $F_3$ හා $F_4$ පරම්පරා වල විශාල ගහන 26ක් ස්ථාපනය කරන ලදී. $F_5$ පරම්පරාවේ සිට ඉදිරියට ප්‍රජනිත 531ක් උසස් කරන ලද අතර ප්‍රජනිත 91ක් වරණය කර ගන්නා ලදී.

උසස් වී ආර 20ක් හා උසස් වී ආර 5ක් පිළිවෙලින් මූලික අස්වනු අත්හදා බැලීම මගින් හා ප්‍රධාන අස්වනු අත්හදා බැලීම මගින් ඇගයීමට ලක් කරන ලද ලදී. Bg 15-1027, Bg 15-961 හා 16-2485 බලාපොරොත්තු තැබිය හැකි ආර ලෙස හඳුනා ගන්නා ලදී. Bg 10-2881 හා Bg 13-1265 ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම් වල පරීක්ෂා කරන ලදී.

### ගුණාත්මක වී

මුහුම් 16ක් නිපදවන ලදී. $F_1$ ගහන 15ක් $F_2$ පරම්පරාව දක්වා උසස් කරන ලදී. $F_2$, $F_3$ හා $F_4$ ගහන 61ක් උසස් කරන ලදී. $F_5$ සිට $F_8$ දක්වා පරම්පරා වල ප්‍රජනිත 490ක් උසස් කරන ලදී.

උසස් ආර 24ක් මූලික අස්වනු අත්හදා බැලීම මගින් හා ආර 17ක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීම මගින් ඇගයීමට ලක් කරන ලද ලදී. Bg 16-520, WAS-169-B-B-4-2-3, IR010A107 හා Bg 16-2022 බලාපොරොත්තු තැබිය හැකි ආර ලෙස හඳුනා ගන්නා ලද අතර ජාතික සමෝධානිත වී ප්‍රභේදීය පරීක්ෂණ සඳහා නම් කරන ලදී.

තව දුරටත් උසස් කිරීම සඳහා M6 පරම්පරාවේ වී ප්‍රභේද 3ක (සුවඳැල්, Bg

94-1, Bg 1165-6) විකෘත ද්‍රව්‍ය වලින් ප්‍රජනිත 75ක් වරණය කරන ලදී.

### අහිතකර තත්වයන්ට ඔරොත්තු දෙන වී

අහිතකර ලවණතාවට ඔරොත්තු දීමට පිළිදෙමුහුම් 10ක් සහ නව මුහුම් 7ක් සිදු කරන ලද අතර $BC_2F_1$ ගහන 10ක් සිටවන ලදී. $F_2$, $F_3$ හා $F_4$ පරම්පරා වලට අයත් ගහන 26ක් ස්ථාපනය කරන ලද අතර ගහන 26ක් උසස් කරන ලදී.

නිර්දේශිත හා බලාපොරොත්තු තැබිය හැකි වී ආර වලට අඩු තෙතමන අහිතකර තත්ව ප්‍රතිරෝධී ලක්ෂණය අන්තර්ගත කිරීමට සමස්ත වශයෙන් මුහුම් 13ක් සිදු කරන ලදී. $F_2$ සිට $F_4$ දක්වා පරම්පරා වලින් ගහන 27ක් ස්ථාපනය කරන ලද අතර ගහන 17ක් උසස් කරන ලදී. $F_5$ පරම්පරාවේ සිට ඉදිරියට උසස් කළ ගහන 2කින් ප්‍රජනිත 65ක් ස්ථාපනය කොට ඇගයීමට ලක් කරන ලදී.

ජනප්‍රිය වී ප්‍රභේද වලට අධික උෂ්ණත්ව අහිතකර තත්ව ප්‍රතිරෝධී ලක්ෂණය අන්තර්ගත කිරීමට මුහුම් 6ක් සිදු කරන ලදී. වියුක්ත ගහන සමඟ ඇගයීම තවදුරටත් සිදු කෙරෙමින් පවතී.

දුඹුරු පැළ කීඩැවා ට දක්වන ප්‍රතිරෝධී බව සඳහා $BC_2F_1$ ගහන 1ක් සහ $BC_1F_1$ ගහන 8ක් ඇතුළුව ගහන 9ක් රූපාණුදර්ශීයව පරීක්ෂා කරන ලදී. RM 463 හා B 121 උපයෝගී කර ගනිමින් සලකුණු සහායක වරණය සිදු කරන ලදී.

### දෙමුහුම් වී

සෛල ප්ලාස්මීය පුං වඳ ආර 57ක්, නඩත්තු ආර 57ක් හා ප්‍රතිෂ්ඨාපන ආර 181ක් පවත්වා ගන්නා ලදී. වරණය කළ දෙමාපිය ආර සමඟ සමස්තයක් ලෙස ආර 198ක් නිපදවන ලදී.

මුහුම් පරීක්ෂණ තවානේ දී $F_1$ සංයෝජන 194ක් පරීක්ෂා කරන ලදී. ඒවා අතුරින් මුහුම් 20ක් නව සෛල ප්ලාස්මීය පුං වඳ ආර හා නඩත්තු ආර සංවර්ධනය කිරීම උදෙසා පිළි දෙමුහුම් කිරීමට වරණය කරන ලදී.

දියුණු කළ පිළිදෙමුහුම් සංයෝජන (BCN i - ගහන 76, BCN ii - ගහන 49, BCN iii - ගහන 45, BCN iv - ගහන 31 හා BCN v - ගහන 71ක්), ඒවායේ පරාග මාපියන් සමග ඇගයීමට ලක් කරන ලදී.

විදේශික දෙමුහුම් 6ක් (CH3, CH4, CH5, CH6, CH7 හා CH8) දේශීය වශයෙන් සංවර්ධනය කරන ලද දෙමුහුම් 2ක් සහ Bg 403 නුමුහුම් ප්‍රභේදය සමඟ ඇගයීමට ලක් කරන ලදී. කෙසේ වෙතත්, කිසිදු විදේශීය ප්‍රභේදයක් වඩා හොඳ තත්වයේ නොවන බව අනාවරණය විය.

Bg 407H හා මෑතකදී දියුණු කළ CMS 4A/R 147 හි $F_1$ බීජ නිපදවන ලදී.

Bg CMS 1A/1B හා Bg CMS 4AB යන බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් සංයෝජන දෙකේ මූලික බීජ (එකකින් කි.ග්‍රෑ. 7 බැගින්) නිෂ්පාදනය කරන ලදී.

බිස්කට් නිෂ්පාදනය සඳහා ඉහළ ඉල්ලුමකින් සමන්විත සුගන්ධවත් වී ආරක් වන MA 2 පවත්වා ගන්නා ලදී.

මාස 3 ½ක් වයසැති රවුම් හැඩැති, රතු බීජාවරණයෙන් යුතු 14 R ප්‍රතිෂ්ඨාපිත ආර තවදුරටත් දියුණු කරන ලදී.

නව සෛල ප්ලාස්මීය පුං වඳ ආර සංවර්ධනය කිරීමට සුදුසු ප්‍රභේද වරණය කිරීම සඳහා නුමුහුම් ප්‍රභේද 16ක පුෂ්ප ලක්ෂණ අධ්‍යයනය කරන ලදී. මාස 3 ½ හා 4 වයස් කාණ්ඩ වලට අයත් වී ප්‍රභේද මධ්‍යාහ්න 12.00 සිට පස්වරු 1.00 දක්වා කාලයේ දී ඉහළ පුෂ්ප විවර වීමේ ප්‍රතිශතයක් පෙන්වූ අතර Bg 305 ප්‍රභේදය පෙරවරු 11.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා ඉහළ පුෂ්ප විවර වීමේ ප්‍රතිශතයක් වාර්තා කළේය.

1B හා 4B ආර එකිනෙකෙන් ප්‍රජනිත 80 බැගින් පවත්වා ගන්නා ලද අතර ඒවායේ පාරිශුද්ධ බව රැකීම සඳහා නඩත්තු කරන ලදී.

'පොලොන්නරුව' වරණයෙන් ලබා ගත් වියුක්ත ගහන පාරිශුද්ධ කිරීම අඛණ්ඩව සිදු කරන ලද අතර, 'සම්බා' වර්ගයේ ප්‍රජනිත 80ක් හා නාඩු වර්ගයේ ප්‍රජනිත 25ක් ඉදිරි අධ්‍යයන සඳහා වරණය කරන ලදී.

පිළි දෙමුහුම් අභිජනනය තුළින් සෛල ප්ලාස්මීය පුං වඳ ආර හයක් (BgCMS5A, BgCMS6A, BgCMS7A, BgCMS8A, BgCMS9A, BgCMS10A,) හඳුනා ගන්නා ලදී.

Bg 357 ප්‍රභේදය, ප්‍රයෝජනයට ගත හැකි ප්‍රතිෂ්ඨාපිත HRSP 668 සමඟ මුහුම් කරන ලද අතර $BC_1F_1$ ආර 15ක් වරණය කොට වඩා හොඳ ලක්ෂණ සහිත නව ප්‍රතිෂ්ඨාපිත සංවර්ධනය කිරීම සඳහා පිළි දෙමුහුම් කිරීම පිණිස උසස් කරන ලදී.

## ජෛව තාක්ෂණ විද්‍යාව තුළින් වී ප්‍රභේදීය දියුණු කිරීම

නියඟයට ඔරොත්තු දෙන අන්තර්ගමන ආර සංවර්ධනය කිරීම සඳහා පිළිදෙමුහුම් කිරීම මඟින් Bg 352 හි $BC_2F_2$ ගහන 2ක් සහ, Bf 357 හි $BC_2$ $F_2$ ගහනයක් එකක් නිපදවන ලදී. ඉතා දැඩි කෘත්‍රිම නියං තත්ව යටතේ $BC_2F_2$ ගහන 3ක් පරීක්ෂා කරන ලද අතර එක් එක් ගහනයෙන් ඉහළම අස්වනු ලබා දෙන ඒකෙකයන් දස දෙනෙක් වරණය කරන ලදී. වරණය කළ ඒකෙක 30 වාරි ජල සැපයුම් තත්ව යටතේ ගුණනය කරන ලදී.

නිර්වායු තත්ව ප්‍රතිරෝධී අන්තර්ගමන ආර සංවර්ධනය කිරීම සඳහා නිෂ්පාදනය කරන ලද Bg 366 හි $BC_2F_2$ ගහනය වරණය කරන ලදී. උසස් කළ ආර 40ක් වැඩිදුර ඇගයීම සඳහා වරණය කරන ලදී.

ජලයෙන් යටවීමට ඔරොත්තු දීමේ ලක්ෂණ සහිත Bg 360 හි $BC_2F_8$ ආර 11ක්, Bg 455 හි $BC_2F_8$ ආර 12ක් සහ Bg 379 - 2 හි $BC_2F_8$ ආර 5ක් හඳුනා ගන්නා ලදී.

බැක්ටීරියා පත්‍ර අංගමාරයට ඔරොත්තු දෙන අන්තර්ගමන ආර සංවර්ධනය කිරීම සඳහා Bg 352 හා Bg 357 ප්‍රභේද වල $BC_2F_3$ ගහන වලින් ආර 10ක් වරණය කරන ලදී.

බැක්ටීරියා පත්‍ර අංගමාරයට ඔරොත්තු දෙන උසස් කරන ලද ආර සංවර්ධනය කිරීම සඳහා පිළි ජනකයන් ලෙස Bg 358, Bg 352, At 362 හා Bg300 සමග දායක ජනකයන් ලෙස 1RBB 60 හා 1RBB 65 යොදා ගනිමින් මුහුම් 8ක් නිෂ්පාදනය කරන ලදී.

එක් ජාන දර්ශයක් තුළ කොළ පාළුවට හා බැක්ටීරියා පත්‍ර අංගමාරයට ප්‍රතිරෝධී බව යන ලක්ෂණ ද්විත්වයම අන්තර්ගත කිරීමට 'පොකුරු සම්බා' / Tetep මුහුමෙන් ලබාගත් කොළ පාළුවට ප්‍රතිරෝධී ආර 'පොකුරු සම්බා' / 1RBB 60 මුහුමෙහි $BC_2F_6$ පරම්පරාව (බැක්ටීරියා පත්‍ර අංගමාරයට ප්‍රතිරෝධී) සමග දෙමුහුම් කරන ලදී. F1 මුහුම්, බැක්ටීරියා පත්‍ර අංගමාරය සඳහා වූ Xa21 ජානය සඳහා pTa248 අණුක සලකුණු කාරකය හා කොළ පාළුවට ප්‍රතිරෝධී බව සඳහා වූ Pi54 ජානය සඳහා RM224 අණුක සලකුණු කාරකය සම්බන්ධ කිරීම මගින් තහවුරු කරන ලදී.

"පොක්කලි" සමග Bg 300 පිළි දෙමුහුම මගින් ලවණතා ප්‍රතිරෝධී ජාන මිශ්‍රිත ආර සංවර්ධනය ලෙස $BC_2F_5$ ආර 14ක් හඳුනා ගන්නා ලදී. මූලික අස්වනු අත්හදා බැලීම සඳහා ආර 2ක් ඉදිරිපත් කරන ලදී.

සුවඳැති ජාන මිශ්‍රිත ආර සංවර්ධනය කිරීම සඳහා 'සුවඳැල්' සමග Bg 360 පිළිදෙමුහුම් කිරීම මගින් ලබාගත් $BC_2F_4$ ආර 10ක් හඳුනා ගන්නා ලදී. සුවඳ මට්ටම

ඉහළ නංවනු පිණිස වරණය කළ පැළැටි ඉඟිණිමිටිය ප්‍රභේදය සමඟ දෙමුහුම් කරන ලදී.

රතු බීජාවරණය සහිත At 362 හි බීජ කැලි විකෘතකරණය මගින් සංවර්ධනය කරන ලද සුදු පැහැති බීජාවරණයකින් යුතු 16TC80 3 ½ වයස් කාණ්ඩයේ අස්වනු අත්හදා බැලීම් වල ඇගයීමට ලක් කරන ලදී. එය At 362ට වඩා අනර්ඝ ගති ලක්ෂණ පෙන්වීය.

පිළිවෙලින් Bg 94-1/ බාස්මති (වෙළඳපොල ප්‍රභේදය) සහ Bg 360හි $BC_2F_5$ / සුවඳැල්, Bg 360/ ඉඟිණිමිටිය මුහුම් භාවිතා කරමින් $BC_2F_2$ දිගැටි සිහින් හා සුගන්ධ වී ආර හා $BC_2F_5$ කෙටි රවුම් සුගන්ධ වී ආර සංවර්ධනය කරන ලදී.

$F_4$ පරම්පරා වල At 353/ Bg 300 හා Bg 300/ Bg 94-1/ $H_4$ පරතරය ඇතිව සිටුවීමටත් $F_7$ පරම්පරාවේදි ඇගයීමටත් ඒකක බීජ වංශානුක්‍රම ක්‍රමය මගින් උසස් කරන ලදී.

## ධාන්‍ය ගුණාත්මක බව

ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහනට එක් කෙරුණු සමස්ත නියැදි 1236ක් හා වැඩිදියුණු කළ අභිජනන ද්‍රව්‍ය, ප්‍රධාන ධාන්‍ය ගුණ ලක්ෂණ සඳහා පරීක්ෂාවට ලක් කරන ලද අතර සියළු ආරවල ධාන්‍ය ගුණාත්මක බව පිළිගත හැකි මට්ටමක විය.

සම්ප්‍රදායික ප්‍රභේද ඇතුළුව වී ප්‍රභේද 67ක් තෝරා ගත් පිළිගත හැකි මට්ටමේ සංවේදිතා තත්ව ගති ලක්ෂණ සඳහා ඇගයීමට ලක් කොට ගුණනය කරන ලදී.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල වෙළඳපොල වලින් හා ඇඹරුම් හල් හිමියන්ගෙන් සෘජුවම එක් රැස් කර ගත් වී නියැදි 34ක් ශ්‍රී ලාංකේය ප්‍රමිති සංශෝධනය කරනු වස් භෞතික, භෞතරසායනික ගුණ ඇතුළු ධානය තත්ව පරාමිතීන් තීරණය කිරීමට සම්මත ක්‍රමවේදයක් උපයෝගී කර ගනිමින් පරීක්ෂණාගාරයේදී විශ්ලේෂණයට ලක් කරන ලදී.

වී ප්‍රභේද 5ක පිසූ සහල් උපයෝගී කර ගනිමින් සහල් පදනම් කර ගත් යෝගට් සංවර්ධනය කරන ලද අතර සහල් පිටි උපයෝගී කර ගනිමින් තවදුරටත් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ.

අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් ලැබුණු විදේශීය ජනක ප්ලාස්ම හතලිහක ඇගයීම හා ගුණනය සම්පූර්ණ කරන ලද අතර සංරක්ෂණය සඳහා එම ජනකප්ලාස්ම පැළැටි ජාන සම්පත් මධ්‍යස්ථානයට භාර දෙන ලදී.

## රෝග කළමනාකරණය

2016/17 මහ කන්නය සහ 2017 යල කන්නය තුළ බැක්ටීරියානු පත්‍ර අංගමාරයට එරෙහිව සමස්ත වී ප්‍රවේශ 581ක් පරීක්ෂා කරන ලදී. ඒවා අතුරින් At 13-3791 ප්‍රභේදය, කන්න දෙකේදීම බැක්ටීරියා පත්‍ර අංගමාරයට එරෙහිව ප්‍රතිරෝධක ප්‍රතිචාරයක් පෙන්වීය. සොංහුආ ප්‍රභේදය, BW 16-921 හා BW 16-818 ප්‍රතිරෝධී ප්‍රතිචාර දැක්වූ අතර, වෙනත් ප්‍රවේශ 7ක් එක් කන්නයකදී පමණක් රෝගයට එරෙහිව මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී ප්‍රතිචාරයක් පෙන්වීය.

ගොයම් කොළ පාළු රෝගයට එරෙහිව සමස්ත වශයෙන් වී ප්‍රභේද 4108ක් පරීක්ෂා කරන ලදී. 2016/17 මහ කන්නයේ දී ගොයම් කොළ පාළු රෝගයට ප්‍රතිරෝධී ප්‍රවේශ ලෙස ප්‍රවේශ 1092ක් වර්ග කරන ලදී. එසේ වුවද, 2017 යල කන්නයේ දී ගොයම් කොළ පාළු රෝගය දක්නට නොලැබුණි.

කෘත්‍රිමව එන්නත් කළ තත්ව යටතේ කොපු අංගමාර රෝගය සඳහා දිලීර නාශක 4ක් ඇගයීමට ලක් කරන ලදී. එහි දී අනාවරණය වූයේ රෝගය පාලනය කිරීම සඳහා ජලය ලීටර් 10කට, පිළිවෙලින් මිලි ලීටර් 20, මිලි ලීටර් 8 සහ

මිලි ලීටර් 10 යන තනුකතා අනුපාත වලින් හෙක්සකොනසෝල්, ඇසොක්සිට්‍රෝබින් + ටෙබියුකොනසෝල් හා ප්‍රොපිකොනසෝල් පත්‍ර වලට යෙදීම ඵලදායී වන බවයි.

රෝග ලක්ෂණ නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව දින 7ක් තුළ මියුරියේට් ඔෆ් පොටෑෂ් හෙක්ටෙයාරයකට කිලෝග්‍රෑම් 10ක් අමතරව යෙදූ විට බැක්ටීරියා පත්‍ර අංගමාරයේ අඩු වීමක් නිරීක්ෂණය විය.

## පළිබෝධ කළමනාකරණය

ගොයම් මකුණාගේ කන්නමය විචලනයන් 2015/16 මහ කන්නයේ සිට අධ්‍යයනය කරන ලද අතර යල කන්නය හා සැසඳීමේදී මහ කන්නයේදී වැඩි ගහණයක් නිරීක්ෂණය විය.

වී අභිජනන ආර 2480කට ගොක් මැස්සන්ගේ හානිය පළිබෝධනාශක පිළියම් යෙදූ තත්වයක් යටතේ පළිබෝධයට ඒවායේ ප්‍රතිචාරය තීරණය කරනු පිණිස අගයන ලදී. ආර 138ක් පළිබෝධයට පහසුවෙන් ගොදුරු වන සුළු ආර ලෙස හඳුනා ගන්නා ලදී. අභිජනන වැඩසටහනෙන් මෙම ගොදුරු වන සුළු ආර ඉවත් කිරීමට යෝජනා කෙරේ.

වී ආර දෙදහස් 357ක් දුඹුරු පැළ කීඩෑවාට ප්‍රතිරෝධී මූලාශ්‍ර හඳුනා ගනු පිණිස පරීක්ෂා කරන ලදී.

ගොයම් මකුණාට එරෙහිව විවිධ අනුපාත වලින් එතිප්‍රෝල් යෙදීම පරීක්ෂාවට ලක් කරන ලද අතර හෙක්ටයාර ඒකකට එතිප්‍රෝල් මිලි ලීටර 800ක් යෙදීම ඵලදායී බව අනාවරණය විය.

වී වගාවට සම්බන්ධ මී විශේෂ හඳුනා ගැනීම, ඔවුන්ගේ ගහන හා බෝග හානි තක්සේරු කිරීම කුරුණෑගල, ගම්පහ හා පොලොන්නරුව දිස්ත්‍රික්ක වලදී සිදු කරන ලදී. වී වගාවන් හි මෙන්ම මිනිස් වාසභූමි වලද වාසය කරන මී විශේෂ ලෙස *Rattus rattus* සහ *Bandicota indica* හඳුනා ගන්නා ලදී. හීන් බණ්ඩි ඇති වන සමය මී හානියේ ඉහලම අවදානම් සහගත අවධිය වේ.

විවිධ බෝග ස්ථාපන ක්‍රම යටතේ වෙනස් පළිබෝධ ඇතිවීමේ අවස්ථා හඳුනා ගැනීමට ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කරන ලද අතර සතිපතා අන්තර වලින් කෘමි පළිබෝධ සංඛ්‍යා ලබා ගන්නා ලදී.

කලාපය තුළ සම්ප්‍රදායිකව වවන ලද හා කාබනිකව වවන ලද වී බෝග වල කඳ විදින්නාගේ පරපෝෂිතතාවයේ මට්ටම තීරණය කිරීමට අධ්‍යයනයක් පවත්වන ලදී. මෙම ප්‍රදේශයෙන් වාර්තා වූ එකම බීජ පරපෝෂිතාහය *Tetrustichus schoenobii* වූ අතර *Poecilotrapher ataeniata, Tetrustichus oyyari, Tropobracons choenobil* හා *Cotesia flavipes* උපරි පරපෝෂිතාහ/ පිලා පරපෝෂිතාහ ලෙස හඳුනා ගන්නා ලදී. පළිබෝධනාශක පිළියම් යෙදූ බෝගවල එලෙස පළිබෝධනාශක පිළියම් නොයෙදූ බෝගවලට සාපේක්ෂව කැපී පෙනෙන තරමේ අඩු කඳ විදින්නාගේ පරපෝෂිතතාවක් නිරීක්ෂණ විය. ඉහත ප්‍රදේශයෙන් නව විශේෂ වල කඳ විදින්නන්ද හමු වූ අතර මේ විශේෂ නිසැකව හඳුනාගැනීම සිදු කළ යුතුවේ. 2016 දී බෝඹුවල දී සිදු කළ මෙබඳුම පරීක්ෂණයකදී මෙම විශේෂ මුලින්ම වාර්තා විය.

## වල් කළමනාකරණය

Bg 250, Bg 251, Bg 10-2907 සහ Bg 13-1265 නම් වී ආර / ප්‍රභේද 4 කෙරෙහි MCPA ශාක වලට විෂවීම පරීක්ෂා කරන ලද අතර පරීක්ෂාවට ලක්කරන ලද අනුපාත වලදී, ධාන්‍ය අස්වනු හෝ පැලය කෙරෙහි MCPA වෙතින් කැපී පෙනෙන බලපෑමක් නොමැති බව දක්නට ලැබුණි.

පැළෑටි නාශක 4ක විවිධ විසිරුම් ප්‍රමාණ, වල් ඉවත් නොකළ පාලිත හා අතින් වල් ඉවත් කළ පාලිත තත්ව සමග වල් පාලන

කාර්යක්ෂමතාව සැසඳීමට පරීක්ෂා කරන ලදී. 75%කට වඩා වැඩි වල් පාලන කාර්යක්ෂමතාවක් සහිත ප්‍රතිරෝධී ජෛව දර්ශ ඇතුළුව තෙත් වැපුරුම් වී වගාවන්හි දක්නට ලැබෙන සියළුම තෘණ විශේෂ පාලනයේදී මෙටමිෆොප් 10% EC, රින්ස්කෝ 2.7% EC (7-15 දක්වා DAE තුළ හෙක්ටයාරයට මිලි ලීටර 500) හා මෙටමිෆොප් (8-12 DAE තුළ හෙක්ටයාරයට මි.ලී. 1200) කාෆෙන්ට්‍රෙසෝන් එතිල් (14-21 DAE තුළ හෙක්ටයාරයට ග්‍රෑම් 80) ට පසු සල්ෆෙන්ට්‍රසෝන් ලීටරයට ග්‍රෑම් 480 SC යෙදීම වඩා කාර්යක්ෂම බව අනාවරණය විය.

වී ප්‍රභේද/ ආර 10ක් ඒවායේ තෘණ සමග තරඟකාරිත්වය අගයන ලද අතර At 10-1240 හා IR04A395 ඉහළ තෘණ හා සමාන තරඟකාරිත්ව හැකියාවක් පෙන්වීය. AERON 9-3, AERON 10-26, At 10-1327, At 13-2715, Bw 11-3403 හා IRRI 156 තෘණ සමඟ තරඟකාරී ප්‍රභේද ලෙස වර්ග කරන ලද අතර Bw 12-574 හා ෂොංහුආ මධ්‍යස්ථ වශයෙන් තෘණ සමග තරඟකාරී ප්‍රභේද ලෙස වර්ග කරන ලදී.

සම්ප්‍රදායික (සුවඳැල්, පච්චපෙරුමාල්, කළු හීනටි), පැරණි වැඩිදියුණු කළ (H4, H7), හා නව වැඩිදියුණු කළ (Bg 250, Bg 251, Bg 300, Bg 450, Bg 407H) වී ප්‍රභේද ඒවා වල් වී සමඟ දක්වන තරඟකාරීබව හඳුනා ගැනීමට පරීක්ෂා කරන ලදී. 'සුවඳැල්' 0.77ක වල් වී සමඟ තරගකාරිත්වයක් පෙන්වූ අතර අඩුම ධාන්‍ය අස්වනු අඩුවීමක්ද පෙන්වීය. 'කළු හීනටි' මධ්‍යස්ථ වූ තරඟකාරිත්ව හැකියාවක් පෙන්වූ අතර පච්චපෙරුමාල් H4 සහ H7 වල් වී සමග මඳ වශයෙන් වූ තරඟකාරිත්ව හැකියාවක් පෙන්වීය. වල් වී හා තරඟකාරී ප්‍රභේද වල් වී කළමනාකරණ කට්ටල වලට අන්තර්ගත කළ හැකිය.

## පසේ සරු බව කළමනාකරණය

පාංශු පොස්පරස් අන්තර්ගතය හා වී වල අස්වැන්න කෙරෙහි පොස්පරස් භාවිතා නොකිරීම හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශිත ෆොස්පරස් යෙදීමෙන් වන දීර්ඝ කාලීන බලපෑම තීරණය කිරීමට විලෝම කන්න වලදී පොස්පරස් යෙදීම සමග සංසන්දනය කරන ලදී. වත්මන් 11වන කන්නයේදී විවිධ ප්‍රතිකර්ම අතරතුර අස්වැන්නේ කිසිදු වෙනසක් නොවීය.

රසායනික පොහොර හා කාබනික පොහොර මිශ්‍රව හා තනිව යෙදීම දීර්ඝකාලීනව වෙනත් කිසිදු පොහොර යෙදීමක් නොමැති තත්ව (පාලිත) යටතේ පරීක්ෂාවට ලක් කරන ලදී. 33 වන කන්නයේ ප්‍රතිඵල අනුව ඉහළම ධාන්‍ය අස්වැන්නක් ලබා ගැනීම සඳහා රසායනික පොහොර සමඟ කාබනික පොහොර යෙදීම ඉහළ වැදගත්කමක් ගන්නා බව දක්නට ලැබුණි. කාබනික පොහොර, NPK හා කාබනික පොහොර + NPK පාලිත තත්ව වලට එදිරිව යෙදීම හේතුවෙන් අස්වනු වැඩිවීම පිළිවෙළින් 17%, 147% හා 164% ප්‍රමාණ වල විය.

සම්මත වී ප්‍රභේදය ලෙස Bg 352 යොදා ගනිමින් නයිට්‍රජන් ප්‍රතිචාරය සඳහා මාස 3½ වයස් කාණ්ඩයට අයිති උසස් වී ආර පරීක්ෂා කරන ලදී. පරීක්ෂාවට ලක් කරන ලද ආර වලින් කිසිවක් Bg 352ට වඩා වැඩි අස්වැන්නක් ලබා නොදුණි. Bg 2907 නව මාස 2½ වයස් කාණ්ඩයේ වී ආර සියළු නයිට්‍රජන් මට්ටම් වලදී Bg 250ට වඩා වැඩි අස්වැන්නක් වාර්තා කලේ එම වයස් කාණ්ඩයේ වැඩියෙන්ම නයිට්‍රජන් වලට ප්‍රතිචාර දක්වන ආර එය බව විදහා දක්වමිනි.

පිදුරු සහිතව හා පිදුරු රහිතව පාදස්ථ හා මස්තක සැකසුම් ලෙස විවිධ පොටෑසියම් පොහොර මට්ටම් එක් කරමින් පැළැටි වල හා පසේ පොටැසියම් අන්තර්ගතය හා වී

ධාන්‍ය අස්වැන්න පිළිබඳව විමසීමට පරීක්ෂා කරන ලදී. පොටෑසියම් පොහොර යෙදීමට කැපී පෙනෙන ප්‍රතිචාරයක් වී පැළෑටියෙන් දක්නට ලැබුණි. පාලිත පොහොර යෙදීම හා සැසඳීමේදී පිදුරු සහ පොටෑසියම් පොහොර යෙදීම නිසා අස්වැන්න වැඩිදියුණු වීම 17% ප්‍රමාණයේ විය. පොටෑසියම් අවශ්‍යතාව සැපයීමට හෙක්ටයාරයකයට ටොන් 5ක පිදුරු යෙදීම ප්‍රමාණවත්ය. පාදස්ථව පිදුරු සමඟ පොටෑසියම් යෙදීම මගින් ඉහළම අස්වැන්නක් ලබා දුනි.

යකඩ, සින්ක් හා බැර ලෝහ එක්රැස් වීම පිරික්සීමට තෝරා ගත් වී ප්‍රභේද පරීක්ෂාවට ලක් කරන ලදී. At 306 ප්‍රභේදයෙන් සින්ක් ඉහළම මට්ටම (කිලෝ ග්‍රෑමයට මිලි ග්‍රෑම් 31) වාර්තා වූ අතර Bg 310 ප්‍රභේදයෙන් පහළම මට්ටම (කිලෝ ග්‍රෑමයට මිලි ග්‍රෑම් 24.6) වාර්තා විය.

Bg 300, At 303, Bg 304, At 306, Bg 358, At 362, Bw 363, Bg 366, Bw 367, Ld 368, Bg 369, H4, Bg 11-11, Bg 379-2, At 401, At 405, Bg 450, Bw 453, සුදු හීනටි හා මඩතවාළු වල අස්වනු ලබා දීමේ කාර්ය සාධනය කාබනික තත්ව යටතේ ඇගයීමට ලක් කරන ලදී. කාබනික තත්ව යටතේ හෙක්ටයාරයට ටොන් 4.74ක් ලබාදීම තුළින් At 362 එහි උසස් බව විදහා දැක්වීය. පරීක්ෂාවට ලක් කරන ලද සාම්ප්‍රදායික ප්‍රභේද හා වැඩිදියුණු කළ ප්‍රභේද අතර සංඛ්‍යා ලේඛණමය වශයෙන් කැපී පෙනෙන අස්වනු වෙනසක් දක්නට නොලැබුණි.

CIC සල්ෆොනයිට් (හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 18.75) + කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත NPK අනුපාතය, CIC මයික්‍රො V (හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 18.75) + කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත NPK අනුපාතය ලෝරන්ස්ගේ දියර පොහොර (හෙක්ටයාරයට ලීටර් 31.25) + කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත NPK අනුපාතය, ඕපෙක්ස් වී 1වන කට්ටලය + 1වන හා 2වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත N, K මතුපිට යෙදුම් පත ඕපේක්ස් වී 2වන කට්ටලය + 1වන හා 2වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත N, K මතුපිට යෙදුම් සමඟ කොම්පෝස්ට් (හෙක්ටයාරයට ටොන් 10), NPK කෘ.දෙ. නිර්දේශය සහ පොහොර භාවිතා කිරීම සිදු නොකළ තත්ව සමග ඇගයීමට ලක් කරන ලදී. පොහොර නොයෙදූ තත්ව යටතේ ලද අස්වැන්නට වඩා කැපී පෙනෙන තරමේ වඩා වැඩි අස්වැන්නක් පරීක්ෂාවට ලක් කළ සියළු පොහොර යෙදීම් මගින් ලබාදුන් අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත ප්‍රමාණ සමග සංසන්දනාත්මක අස්වැන්නක් ලබාදුනි.

පොහොර නොයෙදූ තත්ව සමග පණුවන් සහිත කොම්පෝස්ට් හෙක්ටයාරයට ටොන් 1, පනුවන් සහිත කොම්පෝස්ට් හෙක්ටයාරයට ටොන් 3, කාබනික පෙහොර (පිදුරු හෙක්ටයාරයට ටොන් 5+ හරිත පොහොර හෙක්ටයාරයට ටොන් 1 + කොම්පෝස්ට් හෙක්ටයාරයට ටොන් 4, තරමක් පිලිස්සූ දහයියා හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 625) ඇගයීමට ලක් කරන ලදී.

## ජල කළමනාකරණය සහ භූගෝලීය තොරතුරු පද්ධති

යන්ත්‍රානුසාරයෙන් ගොයම් සිටුවීම සිදු කරන ලද ක්ෂේත්‍ර වල ජලයේ ගැඹුර සමග තෘණ වල ක්‍රියාකාරිත්වය හා ගොයම් බෝගයේ ආරම්භක අවධි වල කාල සීමා අධ්‍යයනය කරන ලදී. ජලයේ ගැඹුර සෙ.මී 5ක්, සෙ.මී 0ක්, සෙ.මී -5ක් ලෙස සති එකක්, සති දෙකක් හා සති තුනක් යන කාල සීමා තිස්සේ පවත්වා ගන්නා ලදී. ජලයේ ගැඹුර සෙ.මී 0ක් හා සෙ.මී - 5ක් ලෙස පවතින් විට රළු තණ (පන් වර්ග) හා වල්වල පැවැත්ම කැපී පෙනෙන තරමේ ඉහළ මට්ටමක විය. ජලයේ ගැඹුරේ විවිධ

මට්ටම් සමග පුළුල් පත්‍ර වල පැවතීමේ වෙනසක් දක්නට නොලැබුණි. ජලය පවත්වා ගැනීමේ කාලසීමාවන් මගින් කැපී පෙනෙන වෙනස්කම් අනාවරණය නොවුණි.

Bg 340 වී ප්‍රභේදය යොදා ගනිමින් වී නිෂ්පාදනය පිළිබඳව අහිතකර ජල තත්ව කාලසීමා හා වඩාත්ම වැදගත් අවධි වල බලපෑම අනාවරණය කර ගැනීමට ක්ෂේත්‍ර පර්යේෂණයක් සිදු කරන ලද අතර ගොයම් ශාකයට පුෂ්ප හටගන්නා අවධියේදී එක් සතියක්, පශ්වාත් වර්ධක අවධියේදී සති 2ක් හා මුල් වර්ධන අවධියේදී සති 3ක් දක්වා අහිතකර ජල තත්ව වලට ඔරොත්තු දීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය විය.

ගොයම් ශාකයට අහිතකර ජල තත්ව මැඩපවත්වා ගැනීම පිණිස සැලිසිලික් අම්ලයේ බලපෑම හඳුනා ගැනීමට බඳුන් අධ්‍යයනයක් සිදු කරන ලද අතර ශාකයෙන් සිදුවන ජල හානිය අඩු කර ගැනීමට වැපිරීමෙන් පසු දින 15කදී මිලි ලීටර 20කට හෝ මිලි ලීටර 25කට මිලි මවුල 0.7ක සාන්ද්‍රණයක් සහිතව සැලිසිලික් අම්ලය යෙදීම සිදු කළ හැකි බව නිරීක්ෂණය විය. පාලිත තත්වයට සාපේක්ෂව තවත් දින හතකින් ජල සැපයුම් කාල අන්තරය දීර්ඝ කළ හැකි බවද නිරීක්ෂණය විය.

වර්ෂා පෝෂිත හා වාරිමාර්ග ජල සැපයුම් වී වගාවන් කෙරෙහි දේශගුණ තත්ව වල කාලීන විචල්‍යතාවන්හි බලපෑම අධ්‍යයනය කිරීමට පර්යේෂණ දෙකක් ආරම්භ කරන ලදී.

වාරිමාර්ග ජලය තවදුරටත් ඉතිරි කරගනු පිණිස ගොයම් ශාකයෙහි පුෂ්ප හටගන්නා සමය අතරතුර වාරිමාර්ග ජල සැපයුම සඳහා මාරුවෙන් මාරුවට තෙත් කිරීම හා වියළීමට ඉඩ හැරීමේ වඩාත්ම උචිත ක්‍රමය සොයා ගැනීමට අධ්‍යයනයක් ආරම්භ කරන ලදී.

## ශෂ්‍ය විද්‍යාව

ජාතික ඒකාබද්ධ වී ප්‍රභේදීය පරීක්ෂණ වැඩසටහන යටතේ ස්ථාන 13ක සම්මත පරීක්ෂණ ප්‍රභේද සමග නව වී ආර දහතුනක් පරීක්ෂාවට ලක් කරන ලදී. වියළි / අතරමැදි මෙන්ම තෙත් කලාප වලදී යහපත් අනුවර්තතාවක් At 13-1543 (සුදු පැහැ, දිගැති/ සිහින්) මාස 3 ප්‍රභේද හා රතු සුදුරු (රතු කෙටි/ රවුම්) මාස 3 ½ ප්‍රභේද පෙන්වීය. At 13-3791 තෙත් කලාපයේදී වඩා හොඳ අනුවර්තතාවක් පෙන්වීය.

සමාකරණය කළ අහිතකර නියං තත්ව යටතේ ඒවායේ නියඟට ඔරොත්තු දීම / නියඟ මඟහැර සිටීමේ හැකියාව හඳුනා ගැනීමට සම්මත පරීක්ෂක ප්‍රභේද ලෙස Bg 300, Bg 251, Bg 304 හා IRDTN 7-11 සමග සහභිජාත වී ආර අසූ දෙකක් වරණය කරන ලදී. පරීක්ෂාවට ලක් කරන ලද ආර අතුරින් K 3, K 4, K 6, K 7, K 10, K 11, K 14, Bg 16838, Bg 16-867, Bg 16-2397, SACHT 401, SACHT 102 හා SACHT 103 ඉහළ අස්වනු ලබාදුන් අතර ධාන්‍ය අනුපාත සම්පූර්ණ කරන ලද හෙයින් බලාපොරොත්තු තැබිය හැකි නියඟ මඟ හරින/ ඔරොත්තු දෙන ආර ලෙස හඳුනා ගන්නා ලදී.

උෂ්ණත්ව අනුක්‍රමණ කුටීරයක සමාකරණය කරන ලද අහිතකර උෂ්ණත්ව තත්ව තුනක් (පරිමණ්ඩිත / පාලිත <35 $^0$C, 35 - 37 $^0$C හා 38-40 $^0$C) යටතේ අළුතින් වැඩිදියුණු කරන ලද හා සම්ප්‍රදායික වගා ප්‍රභේද ඇතුළු මාස 3 - 3½ වයස් කාණ්ඩයේ ප්‍රභේද 20ක් ඒවායේ ශෂ්‍ය විද්‍යාත්මක හා දෛහ විද්‍යාත්මක ලක්ෂණ මත පදනම්ව ඉහළ උෂ්ණත්ව ප්‍රතිරෝධීභාවය සහිත වී ප්‍රභේද හඳුනා ගැනීමට පරීක්ෂා කරන ලදී. Bg 352 හා පච්චපෙරුමාල් පිළිවෙලින් 13.3%ක හා 20%ක ඉහළ පරාග වන්ධ්‍යතාවක් පෙන්වීය. මඩතවාළු, Bg 366 හා Bg 94-1 ඉහළ අස්වනු ලබා දුනි. සියළු උෂ්ණත්ව

ප්‍රතිකාර වලදී සියළුම ප්‍රභේද වල පරිපූර්ණ ධාන්‍ය ප්‍රතිශතය 70%ට ඉහළ වූ අතර Bg 369, කළු හීනැටි, Bg 94-1, Bg 304, පච්චපෙරුමාල්, Bg 305 හා සුදු හීනැටි වල 38-40 $^0$C දක්වා උෂ්ණත්වයේදී පරිපූර්ණ ධාන්‍ය ප්‍රතිශත >85% විය. 35 $^0$C ට ඉහළ උෂ්ණත්ව වලදී පරාග වන්ධ්‍යතාව වැඩි වූ අතර මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වලින් එබඳු සම්බන්ධතාවක් අනාවරණය නොවීය.

මාස 3 ½ වයස් කාණ්ඩයට අයත් වී ආර 8ක් (MA 2, CL 407, CL 406, CL 210, CL 107, CL 405, CL 303 හා CL 305) Bg 94-1 ට එරෙහිව ඒවායේ ශෂ්‍ය විද්‍යාත්මක ගති ලක්ෂණ හා අස්වනු විභව පරීක්ෂක විසින් කළමනාකරණය කරන ලද තත්ව යටතේ හඳුනා ගැනීමට පරීක්ෂා කරන ලදී. MA 2 මාස 3 ½ ට වැඩි කාලයක් (දින 114ක්) පරිණත වීම සඳහා ගත් අතර M 2, CL 407 හා CL 406 හි වී කරල් වල දිග Bg 94-1 හා සැසඳීමේදී සැළකිය යුතු තරම් වැඩි බවක් (P<0.056) පෙන්වූ අතර පරීක්ෂා කරන ලද වෙනත් ආර වල වී කරල් වල දිගට වඩා (>25cm) වැඩි විය. MA 2, CL 407, CL 406, CL 405 හා CL 305 යන ප්‍රභේද වල අස්වනු සැළකිය යුතු මට්ටකින් (P<0.05) ඉහළ අගයන් පෙන්වූ අතර ඒවා සම්මත පරීක්ෂා සමග සැසඳිය හැකි මට්ටමේ විය. වැඩිම ධාන්‍ය ඇට දහසක බර ලෙස Bg 94-1 හි ග්‍රෑම් 28.8 වාර්තා විය.

වැඩිපුර ජලය ඇති තත්ව යටතේ වපුරන ලද ගොයම් වල වර්ධනය හා අස්වැන්න පිළිබඳ පැලවීමේ අනුපාත හා තෝරාගත් ජලය පිරුණු ගැඹුරු මට්ටම් තුනක බලපෑම ඇගයීමට ලක් කරන ලදී. ජලය පිරුණු ගැඹුරු හා පැලවීමේ අනුපාතයට අනුව බීජ පැළ ඝනත්වය කැපී පෙනෙන මට්ටමකින් අඩු වු අතර ප්‍රරෝහ හා වී කරල් ඝනත්වවල විචල්‍යතාවක් ජලයේ ගැඹුර හෝ පැලවීමේ අනුපාත අතර දක්නට නොලැබුණි. ජලයෙන් පිරි ගැඹුර වැඩි කිරීම සමග තෘණ ඝනත්වය හා තෘණ වල වියළි බර කැපී පෙනෙන මට්ටමෙන් අඩුවිය. ජලයෙන් පිරි ගැඹුර අස්වැන්න කෙරෙහිද කැපී පෙනෙන බලපෑමක් ඇති කළේය. ජලය අධික තත්ව යටතේ වී පැල කිරීම සඳහා සෙ.මී. 2.5-5 දක්වා ජලයෙන් පිරි ගැඹුරක් සමඟ හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 100ක පැල කිරීමේ අනුපාතයක් යොදා ගැනීමේ හැකියාව මෙම ප්‍රතිඵල වලින් අනාවරණය විය.

සමස්ත වශයෙන් වී ආර 23ක්, ඔරොත්තු දෙන පරීක්ෂක ලෙස Ciherang AG1 + SUB1 හා IR 64 + AG 1 යොදාගනිමින් ස්ථාවර ජල තත්ව යටතේ ඒවායේ ප්‍රරෝහණ හැකියාව හඳුනා ගැනීමට වරණය කරන ලදී. සියළු ප්‍රභේද වල ස්ථාවර ජලය සෙ.මී. 10ට වඩා අඩු අවස්ථා වලදී ප්‍රවර්තන අගය 25%ට වඩා අඩු වූ අතර 1R 14D 202 හා 1R 14D 201 පිළිවෙළින් 24%ක හා 21%ක ප්‍රවර්තන අගයන් වාර්තා කළ අතර මෙය Ciherang AG1+SUB1, IR 14D 157 හා IR 14D 202, Ciherang AG1+SUB1 (40%) ට සාපේක්ෂව ඉහළම ප්‍රවර්තන අගය වාර්තා කළ අතර Kho Halon On සහ Mazan Red සමග සංසන්දනය කළ හැකි ≥20% ප්‍රවර්තන අගයක් IR 14D 201, IR 14D 202, IR 14D 155, Bg 310, Bg 300 (වරණය කළ), Bg 300+AG1(1), Bg 300+AG(2), Kho Halon On හා Mazan Red වාර්තා කලේය. එබැවින් IR 14D 157, IR 140202, IR 14D 201, IR 14D 155, Bg 310, Bg 300 (වරණය කළ), Bg 300 + Ag 1 (1), Bg 300+ AG (2), Kho Halon On හා Mazan Red වැඩිදුර පරීක්ෂණ සඳහා වරණය කරන ලදී.

යන්ත්‍රානුසාරයෙන් සිටවනු ලබන ගොයම් වගාවේ වර්ධනය හා අස්වැන්න පදනම් කරගෙන සුදුසු ප්‍රභේද, පවත්වාගත යුතු පරතරයට බීජ පැළ / වැටි හා පැළකිරීමේ ගැඹුර හඳුනාගැනීමට පරීක්ෂණ තුනක් සිදුකරන ලදී. මාස 4 - 4 ½ න් පරිණත වන කාණ්ඩ යටතේ Bg 403, Bg 379-2, Bg

406, Bg 450 හා Bg 454, ද මාස 3 - 3 ½න් පරිණත වන කාණ්ඩ යටතේ Bg 357, Bg 352, Bg 366, At 362, Bw 367 හා Bg 300 ද පරීක්ෂා කරන ලදී. පරතර තැබීම් මට්ටම් 4ක් (සෙන්ටි මීටර් 30x12, 30x14, 30x16, 30x18) විවිධ පැල/වැටි 3ක් (4,6,8) හා පැළ කිරීමේ ගැඹුරු 5ක් (සෙන්ටි මීටර් 3 සිට 1.5 අතර) ඇගයීමට ලක් කරන ලදී. යන්ත්‍රානුසාරයෙන් පැළ සිටුවීමේදී Bw 367, Bg 357, Bg 406, Bg 450, Bg 454, Bg 379-2 හා Bg 403 වඩා වැඩි අස්වනු ලබාදෙමින් හොඳ කාර්යසාධනයක් ද පෙන්වීය. යන්ත්‍රානුසාරයෙන් පැළ සිටුවීම සිදු කිරීමේදී පරතර මට්ටම් හෝ පැළැටි / වැටි අනුව අස්වනු අතර කැපී පෙනෙන වෙනසක් දක්නට නොලැබුණි. පැළ කිරීමේ ගැඹුර ද අස්වනු කෙරෙහි බලපෑමක් ඇති කිරීමට සමත් නොවීය. එබැවින්, පවතින පස්වර්ග මත පදනම්ව විවිධ ගැඹුරු මට්ටම් පරාසයක් යොදා ගැනීමේ හැකියාව මෙ මගින් විදහා දක්වන ලදී.

විවිධ ස්ථාපන ක්‍රම - යන්ත්‍රානුසාරයෙන් පැළ සිටුවීම, බීජ පැළ වැපිරීම හා සෘජු තෙත් වැපිරීම යටතේ Bg 357 හා At 362 (මාස 3 - 3 ½ ) හා Bg 403 සහ Bg 379-2 (මාස 4 - 4 ½ ) වී ප්‍රභේද ඇගයීමට ලක් කරන ලදී. භූමි ආවරණ ප්‍රතිශත, ප්‍රරෝහ සංඛ්‍යාව, කරල් සංඛ්‍යාව, ගොයම පීදීම 50%ක් වීමට යන දින ගණන, පරිණත කාලසීමාව හා ධාන්‍ය අස්වැන්න වාර්තා කරගන්නා ලදී. මාස 3 ½ වී ප්‍රභේද සඳහා සෘජු තෙත් වැපිරීම මගින් කලින්ම ගොයම පීදීම හා පරිණතිය වාර්තා වූ අතර යන්ත්‍රානුසාරයෙන් පැළ සිටුවීම මගින් හා සෘජු තෙත් වැපිරීම මගින්, පැළ වැපිරීමට සාපේක්ෂව කැපී පෙනෙන තරමේ වඩා වැඩි අස්වනු ලබාදුනි. එහෙත් මාස 4 වී ප්‍රභේද සඳහා පැළ වැපිරීම හා සෘජු තෙත් වැපිරීම මගින් ලැබෙනවාට වඩා වැඩිපුර අස්වැන්නක් යන්ත්‍රානුසරයෙන් පැළ සිටුවීම මගින් ලබාදුනි. ඉබ්බාගමුව හා පොලොන්නරුව ගොවි ක්ෂේත්‍ර වලදී යන්ත්‍රානුසාරයෙන් පැළ සිටුවීම මගින් හා පැළ වැපිරීම මගින් ලබාගත් අස්වැන්න සෘජු තෙත් වැපිරීම මගින් ලබාගත් අස්වැන්නට වඩා සංසන්දනාත්මකව වැඩි අස්වැන්නක් විය.

## බීජ නිෂ්පාදනය

පහත දැක්වෙන ප්‍රමාණ වල අභිජනන බීජ නිපදවන ලදී.

**වගු අංක 1.4.2: නිපදවන ලද අභිජනන බීජ ප්‍රමාණ**

| වයස් පන්තිය හා ප්‍රභේදය | බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ) | | |
|---|---|---|---|
| | මහ 2016/17 | යල 2017 | එකතුව |
| <u>දින 150-180</u> | | | |
| Bg 3-5 | 120.0 | | 120.0 |
| Bg 38 | 140.0 | | 140.0 |
| Bg 407 | 120.0 | | 120.0 |
| Bg 745 | 160.0 | | 160.0 |
| <u>මාස 04</u> | | | |
| Bg 379-2 | 82 | 82 | 164.0 |
| Bg 403 | 41 | 143.5 | 184.5 |
| Bg 406 | 41 | 20.5 | 61.5 |
| Bg 450 | 20.5 | 61.5 | 82.0 |
| Bg 455 | 20.5 | 41.0 | 61.5 |
| <u>මාස 3 1/2</u> | | | |
| Bg 94-1 | 164.0 | 143.5 | 307.5 |
| Bg 352 | 246.0 | 255.5 | 501.5 |
| Bg 357 | 61.5 | 82.0 | 143.5 |
| Bg 358 | 143.5 | 102.5 | 246.0 |
| Bg 359 | 225.5 | 82.0 | 307.5 |
| Bg 360 | 225.5 | 143.5 | 369.0 |
| Bg 369 | 20.5 | 41.0 | 61.5 |
| Bg 370 | 246.0 | 61.5 | 307.5 |
| Bg 374 | 184.5 | 41.0 | 225.5 |
| <u>මාස 3</u> | | | |
| Bg 300 | 410.0 | 307.5 | 717.5 |
| Bg 310 | 102.5 | 82.0 | 184.5 |
| දින 80 | | | |
| Bg 250 | 80.0 | 60.0 | 140.0 |
| Bg 251 | 120.0 | 80.0 | 200.0 |
| **එකතුව** | **2,974.5** | **1,830.5** | **4,805.0** |

සම්ප්‍රදායික වී ප්‍රභේදවල පහත සඳහන් සංශුද්ධ කළ බීජ ප්‍රමාණ නිපදවන ලදී.

**වගු අංක 1.4.3: නිපදවන ලද සංශුද්ධ බීජ ප්‍රමාණ**

| ප්‍රභේදය | බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ) | | |
|---|---|---|---|
| | මහ 2015/17 | යල 2017 | එකතුව |
| සුදු හීනටි | 40 | 60 | 100 |
| කළු හීනටි | 25 | 40 | 65 |
| සුවඳැල් | 20 | 40 | 60 |
| පච්චපෙරුමාල් | 30 | 60 | 90 |
| මඩතවාළු | 30 | 80 | 110 |
| පොක්කලි | 15 | 60 | 75 |
| හේරත් බණ්ඩා | | 40 | 40 |
| මුරුංගකායන් | 60 | | 60 |
| බෙහෙත් හීනටි | 30 | 50 | 80 |
| රතැල් | 20 | | 20 |
| කහවනු | | 80 | 80 |
| කුරුළු තුඩ | 20 | | 20 |

- සම්ප්‍රදායික ප්‍රභේද වල වී බීජ කිලෝග්‍රෑම් 2,863 ක් නිපදවා ගොවීන්ට අලෙවි කරන ලදී.
- ජනප්‍රිය ප්‍රභේද වල වී බීජ (පදනම්, ලියාපදිංචි කළ හා සහතික කළ) බුසල් 1,205 ක් නිෂ්පාදනය කොට අලෙවි කරන ලදී.

## විශේෂ ව්‍යාපෘති

පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

- ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහනේ ව්‍යාපෘති
  - වී වල ඵලදායිතා ප්‍රවර්ධනය
- කුඩා පරිමාණ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති
  - ග්‍රීන් සුපර් රයිස් (අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් අරමුදල් සම්පාදිත)
  - ආසියාවේ වී අස්වනු පරතරය පියවීම. (අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් අරමුදල් සම්පාදිත)
  - වල් වී කළමනාකරණය හා වල් වල පැළෑටිනාශක ප්‍රතිරෝධීතාව ලාක්ෂණීකරණය / ප්‍රමාණීකරණය. (අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් අරමුදල් සම්පාදිත)
  - ශ්‍රී ලංකාවේ වී වල උසස් ගුණාත්මක බව හා උසස් ඵලදායිතාව සඳහා ආදර්ශ ගොවි ගම්මානයක් පිහිටුවීම. (KOPIAවෙතින් අරමුදල් සම්පාදිත.)
- ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්මේ ව්‍යාපෘති
  - අහිතකර අජෛව තත්ව සඳහා වී ප්‍රභේද සංවර්ධනය
  - වී සඳහා පොස්පරස් පොහොර අවශ්‍යතාව තීරණය කිරීම.
  - දුඹුරු පැළ කීඩැවාගේ ජෛව දර්ශ හඳුනා ගැනීම.
  - දේශීයව අනුවර්තතාව දක්වන සෛල ප්ලාස්මීය පුං වඳ ආර ගොඩනැගීම.
  - කුඹුරු මීයන් පාලනයට ඒකාබද්ධ පාලන ක්‍රමයක් ගොඩ නැගීම
  - ලවණතාවට ඔරොත්තු දෙන නව වී ආර සංවර්ධනය කිරීම මගින් ලවණතාවේ බලපෑමට නතු වූ ප්‍රදේශ වල වී ඵලදායිතාව ඉහළ නැංවීම
  - දුඹුරු පැළ කීඩැවා පාලනයට පරිසර හිතකාමී ප්‍රවේශයක් ලෙස දුඹුරු පැළ කීඩැවා ට ප්‍රතිරෝධී වී ප්‍රභේද ගොඩ නැගීම

- ○ නව වියුක්ත ගහන ගොඩ නැගීම සඳහා ශ්‍රී ලංකාවේ මහා වී ප්‍රභේද වලට තාපයට ඔරොත්තු දීමේ හැකියාව අන්තර්ගමනය කිරීම.
- ○ ශ්‍රී ලංකාවේ බැක්ටීරියානු පත්‍ර අංගමාරයේ ව්‍යාධිජනකයාගේ *Xanthomonas oryzae* pv *oryzae* ව්‍යාධි ස්වරූප විවිධත්වය විමසා බැලීම.

## තාක්ෂණ ප්‍රචාරණය

- විශ්වවිද්‍යාල සිසුන්, කෘෂිකර්ම විද්‍යාල වල සිසුන්, පාසල් සිසුන් හා ගොවීන් සඳහා වී වල ධාන්‍ය ගුණාත්මක බව පිළිබඳ පුහුණු වැඩසටහන්.
- රාජාංගනය යාය 09හි ආදර්ශ ගොවි ගම්මානයක් පිහිටුවීම සඳහා සිදු කෙරෙන ක්ෂේත්‍ර ආදර්ශන හා ගොවීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් දිගටම පවත්වා ගෙන යන ලදී. ඒ අනුව විවිධ බෝග ස්ථාපන ක්‍රම සහ වල් වී පාලන කට්ටලය නිදර්ශනය කිරීම සිදු කරන ලදී.
- ගොවීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් එකොළහක් (පැළ වැපිරීම පිළිබඳව 2, ලේසර් මට්ටම් කිරීම පිළිබඳව 1, භූමිය සකස් කිරීම පිළිබඳව 3 හා මාරුවෙන් මාරුවට ජලය සැපයීම සහ වියලීමට හැරීම පිළිබඳව 5) පවත්වන ලදී.
- පහත පෙන්වා ඇති පරිදි වී පර්යේෂණ හා සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය විසින් විවිධ මට්ටම් වල විවිධ ආකාරයේ අභ්‍යාසලාභීන් ඇතුළු සමස්ථ සහභාගි වන්නන් 4,104කට පුහුණු වැඩසටහන් එක සිය හයක් පවත්වන ලදී. මීට කෘන්තකයන් හඳුනා ගැනීම හා පරිසර විද්‍යාත්මකව කෘන්තකයන් පාලනය කිරීම පිළිබඳ දින දෙකක විශේෂ පුහුණුවක් ද ඇතුළත් විය.

**වගු අංක 1.4.4: 2017 තුළදී පවත්වන ලද පුහුණු වැඩසටහන් වල සාරාංශය**

| වැඩසටහනේ ස්වරූපය | වැඩසටහන් ගණන | සහභාගි වූවන් සංඛ්‍යාව |
|---|---|---|
| ගොවි පුහුණු (එක්දින) | 22 | 706 |
| නිලධාරි පුහුණු | 29 | 857 |
| ඩිප්ලෝමා ශිෂ්‍ය පුහුණු | 09 | 566 |
| විශ්වවිද්‍යාල ශිෂ්‍ය පැමිණීම් | 09 | 529 |
| පාසල් ශිෂ්‍ය පැමිණීම් | 37 | 1356 |
| **එකතුව** | **106** | **4,014** |

- පාංශු පරීක්ෂණ පාදක පොහොර නිර්දේශකරණ වැඩසටහන හා ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ලැබුණු පස් නියැදි 740ක් විශ්ලේෂණය කරන ලදුව පරීක්ෂණ ප්‍රතිඵල පාදක කරගත් අකාබනික හා කාබනික පොහොර නිර්දේශ කිරීම් නිකුත් කරන ලදී.
- ගොවීන් විසින් ගෙනෙන ලද සාම්පල 24ක් පලිබෝධ හා රෝග නිර්ණය සඳහා පරීක්ෂාවට ලක්කරන ලද අතර පලිබෝධ හා රෝග පාලනයට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.
- ගොවි ක්ෂේත්‍ර පහක් පලිබෝධ හා රෝග නිර්ණය සඳහා පරීක්ෂාවට ලක්කරන ලද අතර පලිබෝධ හා රෝග පාලනයට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.
- වී පර්යේෂණ හා සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ නිලධාරීහු සම්පත් දායකයන් ලෙස වී නිෂ්පාදනය පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් 12කට සහභාගී වූහ.

- එක් විඩීයෝ වැඩසටහන් විකාශයකට තාක්ෂණික සහය ලබාදෙන ලදී.

- වෙනත් සංවිධාන / කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඒකක මගින් සංවිධානය කරන ලද පුහුණු 10කට සම්පත් දායකයන් ලෙස, නිලධාරීහු සහභාගි වූහ.

## පුහුණු, සම්මන්ත්‍රණ හා වැඩමුළු සහභාගිත්වය

- අණුක ජීව විද්‍යාවේ හා ජෛව තාක්ෂණවේදයේ මූලිකාංග කෘෂිකාර්මික ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය (දින 10).

- ගැමා කිරණ විකිරණය මගින් මල්, පලතුරු හා වී විකෘත අභිජනනයට ලක් කිරීම. විකිරණ අභිජනන අංශය, NARO, ජපානය, සැප්තැම්බර් 4 - නොවැම්බර් 17

- ප්‍රජා බීජ බැංකු පුහුණු වැඩසටහන. PGRC, ගන්නොරුව. 2017 දෙසැම්බර් 12-14

- අභිජනන බීජ නිෂ්පාදනය හා අග්නිදිග ආසියාවේ ප්‍රධාන බෝග සඳහා තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව. 2017 අගෝස්තු 08.

- පටක රෝපණ පර්යේෂණාගාර සහායක වෘත්තිය සඳහා ජාතික නිපුණතා ප්‍රමිති ගොඩනැගීමෙහිලා දැනුම බෙදාහදා ගැනීමේ වැඩමුළුව. ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය.

- දියුණු වෙමින් පවතින රටවල් සඳහා කෘෂිකර්ම ජෛව තාක්ෂණ යෙදවුම් පිළිබඳ සම්මන්ත්‍රණය. 2017 ජුනි 07 - ජූලි 06. බීජිං. - චීනය

- "ක්ෂේත්‍ර ගණක යන්ත්‍රය" පිළිබඳ පුහුණු පාඨමාලාව. 2017 පෙබරවාරි 23-24, IRRI, පිලිපීනය.

- පැළෑටි ආරක්ෂණයේ පර්යේෂණ ප්‍රමුඛතා සමාප්තිකරණය පිළිබඳ වැඩමුළුව - 2017 පෙබරවාරි 27, SLCARP, කොළඹ.

- පැළෑටි වෛද්‍යවරුන් සඳහා වී ගැටළු පිළිබඳ සංවර්ධන තාක්ෂණික සඟරා සඳහා ලිවීමේ වැඩමුළුව. 2017 මාර්තු 02-03, පැළෑටි ආරක්ෂණ සේවය, PGRC, ගන්නොරුව.

- ශ්‍රී ලංකාවේ එළවළු වල බීජ පාදක රෝග වල වර්තමාන තත්වය පිළිබඳ සම්මන්ත්‍රණය. 2017 මාර්තු 02, HORDI, ගන්නොරුව.

- PCCP පිළිබඳ වාර්ෂික ප්‍රගති සමාලෝචන හා පෙරමං වැඩමුළුව 2017 දෙසැ 18-19, මහනුවර.

- බෝග පලිබෝධ හා රෝග ජෛව විද්‍යාත්මකව පාලනය කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව 2017 මැයි 17-3, බීජිං, චීනය.

- ශ්‍රී ලංකාවේ කාලගුණ වෙනස්කම් වල තෙවන ජාතික සන්නිවේදන සැකසීම සඳහා GHG වට්ටෝරු සංවර්ධනය හා වෙනත් අංග පිළිබඳව ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන - 2017 දෙසැ. 12-15 බැංකුකරණ අධ්‍යයන මධ්‍යස්ථානය, රාජගිරිය.

- වී කෘෂි පරිසර පද්ධති වල කෘන්තකයන්, කෘමීන් හා තෘණ පරිසර විද්‍යාත්මකව කළමනාකරණය කිරීම පිළිබඳ පුහුණු 2017 සැප්තැම්බර් 25 - ඔක්තෝබර් 06 දක්වා, ලොස් බානෝස්, පිලිපීනය

- දත්ත කළමනාකරණය පිළිබඳ පුහුණුව. 2017 ජනවාරි 19-20, PGIS, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

- කාලගුණ වෙනස්කම් හා තිරසාර සංවර්ධනය පිළිබඳ වැඩමුළුව. 2017 පෙබරවාරි 03, CARP, කොළඹ

- නියඟ හා ගංවතුර පිළිබඳ වැඩමුළුව 2017 ජූනි 23, AICC, ගන්නොරුව

- කාලගුණ වෙනස්කම් හා පාංශු සංරක්ෂණය පිළිබඳ වැඩමුළුව 2017 ජූනි 29, ISTI, ගන්නොරුව.

- කාලගුණ වෙනස්කම් පිළිබඳ වැඩමුළුව. 2017 ජූනි 30, CARP, කොළඹ.

- කාබනික කෘෂිකර්මය පිළිබඳ වැඩමුළුව, 2017 සැප්තැම්බර් 15, PGRC, ගන්නොරුව.

- ජල හිඟය ඇති විට වී වගාව පිළිබඳ වැඩමුළුව, 2017 ඔක්තෝබර් 24, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ.

- ජෛව පොහොර හා ජෛව පලිබෝධනාශක පිළිබඳ වැඩමුළුව 2017 නොවැම්බර් 29, IWMI, බත්තරමුල්ල.

## වෙනත් ක්‍රියාකාරකම්

- සාම්ප්‍රදායික වගා ප්‍රභේද, නව හඳුන්වාදීම් හා වැඩිදියුණු කළ ආර ඇතුළත් වී ප්‍රවේශ හත්සිය පනහක් ස්ථාපනය කරන ලදුව වියළි බීජ නියැදි, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ කෙටි කාලීන ජනකප්ලාස්ම සංරක්ෂණ ඒකකයෙහි සංරක්ෂණය කරන ලදී.

- වෙනත් පර්යේෂණ ස්ථාන, පාසල්, විශ්ව විද්‍යාල, රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් උනන්දු දක්වන පාර්ශවයන් වෙත ඔවුන්ගේ ඉල්ලීම පරිදි බීජ නියැදි කට්ටල 200ක් බෙදා හරින ලදී.

- අස්වනු විභවය, පලිබෝධ හා රෝග ප්‍රතිචාර හා වෙනත් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ සඳහා විදේශීය වී ආර හයක් ඇගයීමට ලක් කරන ලදී. SAC-101 හා SAC-105 යන විදේශීය ආර, බලාපොරොත්තු තැබිය හැකි ආර ලෙස හඳුනා ගන්නා ලදී.

- ශ්‍රී ලංකා රේගුවෙන්, පාරිභෝගික කටයුතු අධිකාරියෙන් හා වෙනත් අංශ වලින් ලැබුණු විවිධ වී නියැදි ගුණාත්මක ප්‍රමිතීන් සඳහා පරීක්ෂා කරන ලදී.

- කෘෂිකර්ම විද්‍යාල/ තාක්ෂණ විද්‍යාල සිසුන් 40 දෙනකුට හා විශ්ව විද්‍යාල සිසුන් 18 දෙනෙකුට වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ තමන්ගේ ඩිප්ලෝමා පාඨමාලාවේ ආංශික පූරණයක් වන පැළැටි පුහුණු කිරීම් සිදුකිරීමට පහසුකම් සපයා දෙන ලදී.

- උපාධි අපේක්ෂක සිසුන් 6 දෙනෙකුට වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ තම පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දෙන ලදී.

- සහභාගි වන්නන් 365 දෙනෙකු ගේ සහභාගිත්වයෙන් පැවති සම්මන්ත්‍රණ / රැස්වීම් 13 කට පහසුකම් සපයන ලදී.

- වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පුහුණු මධ්‍යස්ථානයේ අළෙවි කුටියේදී රු. 65,843.00ක් වටිනා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ප්‍රකාශන විකුණන ලදී.

## 2018 වසර සඳහා සැලැස්ම

- අනුකූල තත්ව සඳහා සම්ප්‍රදායික අභිජනනය මගින් මාස 2 ½ , 3, 3 ½, හා 4 - 4 ½ වයස් පන්ති වල උසස් වී ආර සංවර්ධනය කිරීම.

- මාස 2 ½, 3, 3 ½ , 4 - 4 ½ හා 5 - 6 වයස් පන්ති වල උසස් වී ආර, මූලික අස්වනු අත්හදා බැලීම් හා ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් මගින් ඇගයීම.

- මාස 2 ½ , 3, 3 ½ , 4, 4 ½ වයස් පන්ති වල උසස් වී ආර (වැඩිදියුණු කළ පරම්පරා) ගුණනය.

- සම්ප්‍රදායික/ පිළිදෙමුහුම්කරණය හා සළකුණු සහායක වරණය හෝ විකෘති අභිජනනය මගින් අහිතකර අජෛව තත්ව වලට (නියඟ/ ජලයෙන් යටවීම/ නිර්වායු ප්‍රරෝහණය/ ඉහළ උෂ්ණත්වය/ ලවණතාව) ඔරොත්තු දෙන ගුණාත්මක උසස් ආර සංවර්ධනය.

- දෙමුහුම් දිරිය අභිජනනය තුළින් නව දෙමුහුම් සංවර්ධනය.

- ගුණනය මගින් ජනකප්ලාස්ම සංරක්ෂණය

- ලවණතාව, නියඟ, ඉහළ උෂ්ණත්ව, ජලයෙන් යටවීම හා නිර්වායු ප්‍රරෝහණයට ඔරොත්තු දීම වීමසීමට වී ප්‍රභේද පිරික්සීම.

- වැදගත් පලිබෝධ හා රෝග සඳහා අභිජනන ආර හා නව හඳුන්වා දීම පිරික්සීම.

- කාබනික තත්ව යටතේ වගාකරන ලද වී වල ධාන්‍යයෙහි බැර ලෝහ අන්තර්ගතයන් ඇගයීමට ලක් කිරීම.

- නව පොහාර අමුද්‍රව්‍ය පරීක්ෂා කිරීම.

- බැක්ටීරියානු පත්‍ර අංගමාර ව්‍යාධිජනකයාගේ ව්‍යාධි ස්වරූප විවිධත්වය පිළිබඳ විමර්ශන.

- වී වල ප්‍රධාන පලිබෝධ / රෝග සඳහා නව පලිබෝධනාශක/ දිලීරනාශක පරීක්ෂා කිරීම

- ප්‍රධාන කුඹුරු මී විශේෂ පිළිබඳව අධ්‍යයනය හා ඔවුන්ගේ සුලබතාව

- කුඹුරු මීයන් සඳහා ඒකාබද්ධ පාලන ක්‍රමයක් ගොඩනැගීම.

- විවිධ ක්‍රම අනුව සිටුවන ලද වී බෝගයන්හි පලිබෝධ හානි තක්සේරු කිරීම.

- ගොයම් මකුණන්ගේ බිජු ලෑමේ චර්යාවන් සඳහා වී වලින් වෙන් කරගත් වාෂ්පශීල සංයෝග වල දක්නට ලැබෙන රසායනික සංඝටක ඇගයීමට ලක් කිරීම.

- ගොයම් කඳ විදින්නාගේ ස්වභාවික පරපෝෂිතතාව පිළිබඳ කන්නමය විචලායයන් පිළිබඳව අධ්‍යයනය කිරීම.

- වී වල පැළ මැක්කන්, කොළ හකුළුවන්නන් හා දුඹුරු පැළ කීඩෑවන් සඳහා පෝෂකයන් මෙන්ම පැළෑටි ප්‍රතිරෝධිතා ප්‍රේරක ලෙස සිලිකා අඩංගු නිෂ්පාදන ඇගයීම.

- දුඹුරු පැළ කීඩෑවාගේ බීජ පරපෝෂිතයන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රධාන වී වගා කරන ප්‍රදේශවල ගොවීන් විසින් යොදාගනු ලබන බෝග/ පලිබෝධනාශක භාවිතාවන්හි බලපෑම.

- දුඹුරු පැළ කීඩෑවාට හා ගොක් මැස්සාට ප්‍රතිරෝධිතාව දක්වන ජාතික ඒකාබද්ධ ප්‍රභේදීය අත්හදා බැලීම් වී ආර හා අභිජනන ආර පරීක්ෂා කිරීම.

- අළුතින් අයදුම් කර ඇති පැළෑටිනාශක වල ජෛව සඵලත්වය ඇගයීම හා පැළෑටිනාශක නැවත ඇගයීම.

- වී ආර වල තෘණ මැඩ පවත්වා ගැනීමේ හැකියාව ඇගයීම

- ගොයම් ක්ෂේත්‍රයේ පැළෑටි නාශක වලට ප්‍රතිරෝධී තෘණ පිළිබඳව අධ්‍යයනය.

- වී වල තෘණ පාලනයට ක්‍රම විමර්ශනය කිරීම.
- නයිට්‍රජන් ප්‍රතිචාර සඳහා අභිජනන ආර ඇගයීම.
- ජාතික ඒකාබද්ධ වී ප්‍රභේදීය අත්හදා ලැබීම් මගින් උසස් වී ආර ඇගයීම.
- වෙනත් ජනප්‍රිය ගොයම් සිටුවීමේ ක්‍රම සමග යාන්ත්‍රිකව සිටුවන ලද වි පිළිබඳ මහා පරිමාණ ආදර්ශන
- ඉතා අඩු කාලයක් වයසැති වී ප්‍රභේද සඳහා උචිත ශෂ්‍ය විද්‍යාත්මක කට්ටලයක් ගොඩනැගීම.
- පාංශු, පොස්පරස් අන්තර්ගතය හා වී වල ධාන්‍යමය අස්වැනන් කෙරෙහි දීර්ඝ කාලීනව පොස්පරස් යෙදීමේ බලපෑම.
- පාංශු පොටෑසියම් අන්තර්ගතය හා වී වල ධාන්‍යමය අස්වැන්න කෙරෙහි පොටෑසියම් පොහොර යෙදීමේ දීර්ඝකාලීන බලපෑම.
- ගොයම් ක්ෂේත්‍ර වලට කාබනික පොහොර හා රසායනික පොහොර යෙදීමේ දීර්ඝ කාලීන බලපෑම.
- වී වගාව සඳහා දේශගුණික යෝග්‍යතාව ඇගයීම.
- වී වල අහිතකර තෙතමන තත්ව වල කාලසීමා සහ වැදගත් වර්ධන අවධි හඳුනා ගැනීම.
- ජාතික ඒකාබද්ධ වී ප්‍රභේදීය අත්හදාබැලීම් ස්ථාවල අස්වනු (APSIM Oryza හා ඇක්වා ක්‍රොප්) නිරූපණය

## බීජ නිෂ්පාදනය

- නිර්දේශිත වී ප්‍රභේද 23ක අභිජනන බීජ නිෂ්පාදනය
- උසස් ආර 16ක් ගුණනය
- තෝරාගත් සම්ප්‍රදායික වී ප්‍රභේද 12ක සංශුද්ධ කළ බීජ නිෂ්පාදනය
- ජනප්‍රිය වී ප්‍රභේද වල බිත්තර වී නිෂ්පාදනය.

## විශේෂ ව්‍යාපෘති

- ආසියාවේ වී අස්වනු පරතරය පියවීම.
- ආදර්ශ ගොවි ගම්මාන පිහිටුවීම.
- අහිතකර අජෛව තත්ව සඳහා වී ප්‍රභේද සංවර්ධනය.
- ෆොස්පරස් පොහොර අවශ්‍යතාව තීරණය කිරීම.
- ලවණතාවට ඔරොත්තු දෙන නව වී ආර සංවර්ධනය.
- පරිසර හිතකාමී පිවිසුමක් ලෙසට දුඹුරු පැළ කීඩෑවාට ප්‍රතිරෝධී නව වී ආර සංවර්ධනය.
- ශ්‍රී ලංකාවේ මහා වී ප්‍රභේද වලට උණුසුමට ඔරොත්තු දීමේ ලක්ෂණය අන්තර්ගමනය කිරීම.
- බැක්ටීරියානු පත්‍ර අංගමාර ව්‍යාධිජනකයාගේ ව්‍යාධි ස්වරූප විවිධත්වය විමර්ශනය කිරීම.
- ගොයම් ක්ෂේත්‍ර මීයන් සඳහා වූ ඒකාබද්ධ කළමනාකරණ ක්‍රමයක් ගොඩනැගීම.
- ගොයම් මකුණාගේ බිජු පරිණත භාවයට හේතු වන වී වල ඇලීල රසායන වල කාර්යභාරය.

## වී පර්යේෂණ ස්ථානය - අම්බලන්තොට

රතු බීජාවරණයෙන් යුතු ලවණතාවට ඔරොත්තු දෙන, අඩු කාලයකින් පැසෙන හා ඉහළ අස්වනු ලබාදෙන වැඩිදියුණු කළ

ධාන්‍ය තත්ව ගති ලක්ෂණ වලින් යුතු වී ප්‍රභේද බිහිකිරීම අම්බලන්තොට වී පර්යේෂණ ස්ථානයේ ප්‍රධාන අභිමතාර්ථය වන අතර එය විශේෂයෙන්ම දකුණු ප්‍රදේශයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීමට ආශ්‍රිත තාක්ෂණවේද ගොඩනැගීමේ සහ නිර්දේශිත “At” ප්‍රභේද වල අභිජනන බීජ නිෂ්පාදනයේ වගකීම ද දරයි.

## ප්‍රගතිය

### පර්යේෂණ

#### වී ප්‍රභේදීය වැඩිදියුණු කිරීම

නව මුහුම් 40ක් නිපදවන ලදී. කලින් වියුක්ත වන පරම්පරා කීපයක් වරණය කරන ලදුව වෙන් වෙන්ව පවත්වා ගන්නා ලදී. $F_5$ පරම්පරාවේ සිට ඉදිරියට ප්‍රජනිත 750ක් පමණ පවත්වා ගන්නා ලද අතර පරම්පරා උසස් කිරීම සඳහා වරණය කරන ලදී. මූලික අස්වනු අත්හදා බැලීම් වලදී, ආර 35ක් ඇගයීමට ලක් කරන ලද අතර, ආර 14ක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් 4ක ඇගයීමට ලක් කරන ලද අතර ආර 3ක් (At 13-1532, At 15-712 සහ At 15-797) ජාතික ඒකාබද්ධ වී ප්‍රභේදීය අත්හදා බැලීම් වල ඇගයීමට නම් කරන ලදී. මාස 3 වයස් කාණ්ඩයේ ප්‍රභේද තුනක් ; At 13-3048 (රතු/IB ධාන්‍ය වර්ග), At 13-2715 (රතු/ LS ධාන්‍ය වර්ග) හා At 13-1543 (සුදු/LM ධාන්‍ය වර්ග) ජාතික ඒකාබද්ධ වී ප්‍රභේදීය අත්හදා බැලීම් යටතේ පරීක්ෂා කරන ලදී. At 10-1374 (රතු/ LM ධාන්‍ය වර්ග), At 13-3791 (රතු/ LS ධාන්‍ය වර්ග) and At 11-1425 (සුදු/ LS ධාන්‍ය වර්ග) ප්‍රභේදීය අනුවර්තතා අත්හදා බැලීම් වල ඇගයීමට නම් කරන ලදී. At 10-1350 මහා පරිමාණ ප්‍රභේදීය අත්හදා බැලීම් යටතේ පරීක්ෂා කරන ලදී. At 09-898 සුදු සුගන්ධවත් ආර මහා පරිමාණ ප්‍රභේදීය අත්හදා බැලීම් යටතේ පරීක්ෂා කරන ලද අතර ඉහළ අස්වනු ලබාදෙන මූලික ප්‍රභේදයක් ලෙසට හඳුනා ගන්නා ලදී.

#### ශෂ්‍ය විද්‍යාව

2016 මහ කන්නය තුළදී ජනප්‍රිය ලෙස වගා කරනු ලබන වැඩි දියුණු කළ ප්‍රභේද 15ක හා සම්ප්‍රදායික වී ප්‍රභේද 15ක ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ ඇගයීමට ලක් කරන ලදී. සියළුම සම්ප්‍රදායික ප්‍රභේද වැඩි දියුණු කළ ප්‍රභේද වලට වඩා උසින් වැඩි වූ අතර ඒවායින් බොහොමයක් ධාන්‍ය ඇට පිරෙන අවධිය තුළදී පූර්ණ වශයෙන් හෝ කොටසක් හෝ ඇදවැටීමට ලක්වුනි. වැඩි දියුණු කළ ප්‍රභේද 4ක් හැර ඉතිරිය හෙක්ටයාරයකට ටොන් 5ට පහල වඩා අඩු අස්වැන්නක් ලබාදුනි. සමහර සම්ප්‍රදායික ප්‍රභේද ඉහළ අස්වනු සඳහා උචිත ලක්ෂණ උරුම කර ගත්තද පැළෑටියේ උස හා බැඳුණු ඇද වැටීමේ ලක්ෂණයද, ඇට හැලීම හා කරලකට ඇති නොපැසුණු නොපිරුණු බීජ ගණන ද අස්වැන්න කෙරෙහි දැඩි බලපෑමක් ඇති කිරීමට හේතු වී ඇත.

වෙනස් පරිණති කාල සීමා හා ධාන්‍ය ස්වරූප ඇති වී ප්‍රභේද 24ක බීජ සුප්තතාව අධ්‍යයනය කරන ලදී. ප්‍රභේද අතර ඉතා විශාල විචල්‍යතාවයකින් යුතු සුප්තතා කාලසීමා නිරීක්ෂණය විය. පිළිවෙලින් At 373 හා At 303 හි (දින 11ක් හා දින 55ක් වශයෙන්) කෙටිම හා දිගම සුප්තතා කාලසීමා වාර්තා වයි. පිළිවෙලින් මිලිමීටර 0.065 හා 0.075ක අඩුම ඝනත්වයකින් යුතු දහයියා පොත්ත සහිත At 373 සහ At 08-861 පිළිවෙලින් අඩුම සුප්තතා කාලසීමා වාර්තා කලේය. (අස්වැන්න ලබාගත් දින සිට දින 20කටත් අඩුවෙන්) සුගන්ධවත් ප්‍රභේද 6 අතුරින් At 373, At 898 සහ At 405 අඩුම දහයියා පොතු ඝණත්වය පෙන්වූ අතර පරීක්ෂාවට ලක් කළ ප්‍රභේද වැඩි ගණනක් හා සැසැඳීමේදී අඩුම සුප්තතා කාලසීමාද පෙන්වීය. කෙසේ වෙතත්, වඩා වැඩි දහයියා පොතු ඝනත්වයකින් යුතු ප්‍රභේද සෑම විටම දීර්ඝවූ සුප්තතා කාලසීමා ප්‍රදර්ශනය නොකලේය. තෝරාගත් ප්‍රභේද වල සුප්තතා කාලසීමා කෙරෙහි ධාන්‍ය

ස්වරූපය මගින් හෝ පරිණති කාලසීමාව මගින් බලපෑමක් ඇති නොවීය.

ජාතික ඒකාබද්ධ වී ප්‍රභේදීය අත්හදා බැලීම් වැඩසටහන යටතේ 2016/17 මහ කන්නය හා 2017 යල කන්නය තුළදී නව වී ආර 10ක් සම්මත පරීක්ෂක ප්‍රභේද සමග පරීක්ෂා කරන ලදී. ඒවා අතුරින් At 11-1425, At 13-3791, At 13-3048, At 13-1543 සහ At 13-2715 බලාපොරොත්තු තැබිය හැකි ආර ලෙස හඳුනා ගන්නා ලදී.

At 10-1374, Bw 11-3403, Bg 10-2881 හා Bg 13-1265 නම් නව උසස් වී ආර වල අනුවර්තනතාව තීරණය කිරීමට මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල අත්හදා බැලීම් 12ක් පවත්වන ලදී. At 08-898, සම්මත පරීක්ෂක ප්‍රභේදයට වඩා හොඳින් අනුවර්තනතාව පෙන්වන බව අනාවරණය විය.

එක් කරන ලද නයිට්‍රජන් කෙරෙහි At 08-1078 සහ At 1350 දක්වන ප්‍රතිචාර පරීක්ෂා කරන ලද අතර නයිට්‍රජන් හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 100ක් යෙදීම, අඩුම පලිබෝධ හා රෝග අවස්ථා සහිතව උපරිම අස්වැන්නක් ලබා ගැනීමට වඩාත්ම සුදුසු අනුපාතය බවට හඳුනා ගන්නා ලදී.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශිත නයිට්‍රජන්, ෆොස්පරස් හා පොටෑසියම් මට්ටම් වලින් 80%ක් සමග බයෝෆිල්ම් ජෛව - පොහොර, වී සඳහා වඩාත්ම ඵලදායී පොහොර සංයෝජනය බවට හඳුනා ගන්නා ලදී.

INGER යටතේ ලබා දෙන ලද නියඟයට ඔරොත්තු දෙන විදේශීය වී ආර හැත්තෑ හතක්, නියඟට ඔරොත්තු දෙන ප්‍රභේද හඳුනා ගැනීමට පාලිත තත්ව යටතේ පරීක්ෂා කරන ලදී.

## තෘණ විද්‍යාව

ජලයෙන් යටවූ තත්ව යටතේ සිටුවීමට ඒවායේ සුදුසු බව පෙන්වමින් At 362, Bw 367, At 308, At 307 හා Bg 455 වී ප්‍රභේද, වඩා වැඩි බීජ පැළ ප්‍රමාණයක්, සාමාන්‍ය වර්ධනයක් හා වඩා වැඩි අස්වැන්නක් ලබා දෙමින් හොඳ කාර්ය සාධනයක් පෙන්විය. ඍජුව වපුරනු ලබන වී බෝග සිටුවීමෙන් පසු ජල මට්ටම සෙ.මී. 5ක් උසට දින 21ක් දක්වා පවත්වා ගැනීමෙන් තෘණ 84%කින් හා පන් 72%කින් අඩුවූ අතර එබැවින් මෙලෙස බෝගයේ මුල් අවධියේදී ජලය කළමනාකරණය කිරීම තෘණ බීජ හා පන් කළමනාකරණය සඳහා කාර්යක්ෂම මෙවලමක් වන බව ගම්‍ය විය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ වී ගොවීන් අතර පැළෑටිනාශක භාවිතය පිළිබඳව සමීක්ෂණයක් පවත්වන ලදී. එහිදී විවිධ ක්‍රියාකාරී මාධ්‍ය කාණ්ඩ 3කට අයත් පැළෑටිනාශක 14ක් ප්‍රදේශයේ වී වගාවේ තෘණ පාලනයට භාවිතා කරනු ලබන බව අනාවරණය විය. ගොවීන්ගෙන් 33%ක ප්‍රතිශතයක් ප්‍රොටොපොෆයිරිනෝජන් ඔක්සිඩේස් (PPO) නිෂේධක ද ඔවුන්ගෙන් 28%ක් ALS නිෂේධන පළිබෝධනාශක ද භාවිතා කළ අතර ඉතිරිය ඇසිටයිල් CoA කාබොක්සිලේස් (ACCase) නිෂේධක භාවිතා කළහ. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියයට හැට තුනක් කාෆෙන්ට්‍රසෝන් එතිල් 240 g/1EC භාවිතා කළ අතර 27%ක් බයිස්පයිරිබැක් සෝඩියම් හා එහි පෙර - මුසු සම්මිශ්‍රණ භාවිතා කළහ.

ප්‍රදේශයේ දක්නට ලැබෙන ඉතාම කරදරකාරී තෘණ විශේෂ ලෙස *Cyperus difformis* (66%) සහ *Cyperus iria* (58%) නිරීක්ෂණය විය. දැනට දක්නට ලැබෙන තෘණ විශේෂ පාලනය කිරීමෙහි ලා වෙළඳපොලේ ලබාගත හැකි පැළෑටිනාශක ඵලදායී නොවන බව ගොවීන් 67%කගේ පැමිණිල්ල විය. ගොවීන්ගෙන් 87%ක් පැළෑටිනාශක යෙදීමට පෙර වර්ග දෙකක් හෝ තුනක් එකට මිශ්‍ර කොට භාවිතා කිරීම සිදු කර ඇත. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරය (56%ක්) කන්නයකට එක් වරක්

පැළෑටිනාශක යොදා ඇති අතර අනෙකුත් අය කන්නයකට දෙවතාවක් යොදා ඇත. ගොවීන්ගෙන් සියයට පනස් තුනක ප්‍රතිශතයක් පැළෑටිනාශක යෙදීමේදී නිර්දේශිත මාත්‍රාව අනුගමනය නොකළහ. මෙම ප්‍රදේශයේ ඉතා වැඩිම වාර ගණනක් භාවිතා කෙරෙන ALS - නිෂේධක බඳු පැළෑටි නාශක කාණ්ඩ නිසා ඒවාට ප්‍රතිරෝධී තෘණ පැවතීම, පැළෑටිනාශක අනුචිත ලෙස භාවිතා කිරීම හේතුවෙන් ඇතිවන්නට ඇත.

හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි *Cyperus difformis* ට ප්‍රතිරෝධී ජෛව දර්ශ වර්ධනය වීම හඳුනා ගැනීමට අධ්‍යයනයක් පවත්වන ලදී. එහි ප්‍රතිඵල වලින් අනාවරණය වූයේ MCPA හා බයිස්පයිරිබැක් සෝඩියම් ලීටරයකට ග්‍රෑම් 40 + මෙටමිෆොප් ලීටරයට ග්‍රෑම් 100 SC ට ප්‍රතිරෝධයක් ගොඩනැගී ඇති බවයි. මාත්‍රා ප්‍රතිචාර පරීක්ෂණ වලින් ලබාගත් $ED_{50}$ අගයන් ප්‍රදර්ශනය කළේ ප්‍රතිරෝධී ජෛව දර්ශ ගොඩනැගීම විදහා දක්වමින්, අනෙකුත් ගහන හා සැසඳීමේදී සමහර *C. difformis* ගහන MCPA වලට 1.95 වාරයක් ප්‍රතිරෝධී බව හා බයිස්පයිරිබැක් සෝඩියම් ලීටරයට ග්‍රෑම් 40 + මෙටමිෆොප් ලීටරයට ග්‍රෑම් 100 SC වලට 2.4 වාරයක් ප්‍රතිරෝධී බවයි. *C. difformis,* කාෆෙන්ට්‍රසෝන් එතිල් ලීටරයට ග්‍රෑම් 240 EC වලට දක්වන ප්‍රතිරෝධය පිළිබඳ සාක්ෂි දක්නට නොලැබුණි.

At 307, At 308, At 362, Bg 300, Bg 352, Bg 360, H4 සහ At 373 නම් නිර්දේශිත වී ප්‍රභේද අට තෘණ සමග දක්වන තාරහකාරිත්වය සඳහා ඇගයීමට ලක් කරන ලදී. වපුරා සති 6කින් පසුව H4 වී ප්‍රභේදයේ අඩුම තෘණ ගහනයක් දක්නට ලැබුණි. At 307, At 308, At 362 සහ At 352 ප්‍රභේද තෘණ සමඟ මධ්‍යස්ථ තරහකාරීත්වයක් පෙන්වීය.

## ධාන්‍ය ගුණත්වය

දේශීය වී ප්‍රභේද පනහක ධාන්‍ය දිග හා දිග පළල අනුපාතය මැන ගන්නා ලද අතර එම මිනුම්, වර්තමාන ධාන්‍ය වර්ගීකරණ සමග යහපත් අනුකූලතාවක් නොපෙන්වීය. එබැවින් ධාන්‍ය දිග මත පදනම් වූ ධාන්‍ය ප්‍රමාණය හා ධාන්‍ය දිග/පළල අනුපාතය මත පදනම් වූ ධාන්‍ය හැඩය ඒකාබද්ධ කරමින් නව වර්ගීකරණයක් යෝජනා කරන ලදී.

## විශේෂ ව්‍යාපෘති

පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

- වී ප්‍රභේද වල ධාන්‍ය ගුණත්ව ගති ලක්ෂණ වැඩිදියුණු කිරීම (NARP මගින් අරමුදල් සම්පාදිත)
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෘණ හේතුවෙන් සිදුවන අස්වනු හානි අඩු කරගැනීමට හා පැළෑටිනාශක මත රඳා පැවැත්ම අඩුකර ගැනීමට සෘජුව වපුරනු ලබන වී සඳහා ඒකාබද්ධ තෘණ කළමනාකරණ ප්‍රවේශයක් (NARP වෙතින් ප්‍රතිපාදන ලද)

## තාක්ෂණ ප්‍රචාරණය

- කෘෂිකර්ම විද්‍යාල සිසුන්ගේ ඩිප්ලෝමා පාඨමාලාවේ ආංශික පූරණයක් වන පුහුණුවීම් ලබා දෙන ලදී.
- ආයතනයට පැමිණි විශ්ව විද්‍යාල සිසුන්ට, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කාර්ය මණ්ඩලවලට, පාසල් දරුවන්ට හා ගොවීන්ට තොරතුරු ලබා දෙන ලදී.
- තම පර්යේෂණ ව්‍යාපෘති සිදු කරගෙන යාමට අවශ්‍ය පහසුකම් පශ්චාත් උපාධි සිසුන් දෙදෙනෙකුට හා උපාධි අපේක්ෂක සිසුන් දෙදෙනෙකුට ලබා දෙන ලදී.
- වී වගාවේ කාර්යක්ෂම වල් පාලනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් විස්සක් ගොවීන් හා කෘෂිකර්ම

දෙපාර්තමේන්තු නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලදී.

- වී වගාවේ කාර්යක්ෂම වල් පාලනය පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් දෙකක් සිදු කරන ලදී.
- කාර්යක්ෂම වී තෘණ කළමනාකරණ ක්‍රමෝපාය පිළිබඳ පුහුණු වැඩසටහන් පහළොවක් පවත්වන ලදී.

## අභිජනන බීජ නිෂ්පාදනය

පහත දැක්වෙන අභිජනන බීජ ප්‍රමාණයන් නිපදවන ලදී.

**වගු අංක 1.4.5: නිපදවන ලද අභිජනන බීජ ප්‍රමාණයන්**

| ප්‍රභේදය | ප්‍රමාණය (කිලෝග්‍රෑම්) | | |
|---|---|---|---|
| | මහ 2016/17 | යල 2017 | එකතුව |
| **මාස 3** | | | |
| At 307 | 140 | 140 | 280 |
| At 308 | 120 | 140 | 260 |
| At 311 | 40 | 40 | 80 |
| **මාස 3 ½** | | | |
| At 373 | 80 | 100 | 280 |
| At 362 | - | 300 | 300 |

### සහභාගි වූ පුහුණු, සම්මේලන හා වැඩමුළු

- 26 වන ආසියා පැසිෆික් තෘණ විද්‍යා සම්මේලනය. 2017 ඔක්තෝබර් 19-22, ජපානය.
- කාලගුණ වෙනස්කම් අඩු කිරීමට කෘෂිකාර්මික තාක්ෂණවේද දැනුම බෙදා හදා ගැනීම. 2017 ඔක්තෝබර් 11-17, කොරියාව.

## 2018 වසර සඳහා සැලැස්ම

- ජනක ප්ලාස්ම ඇගයීම හා දෙ මාපිය ද්‍රව්‍ය පවත්වා ගැනීම.
- දෙමුහුම්කරණය මගින් සංයුක්ත ජානමය ද්‍රව්‍ය උත්පාදනය.
- තොග හා ප්‍රජනිත වරණය මගින් මාස 3 හා මාස 3 ½ වයස් කාණ්ඩ වල බලාපොරොත්තු තැබිය හැකි ආර ඇගයීම.
- පූර්ව අස්වනු අත්හදා බැලීම හා ප්‍රධාන අස්වනු අත්හදා බැලීම මගින් උසස් වී ආර ඇගයීම.
- බලාපොරොත්තු තැබිය හැකි අභිජනන ආර ගුණනය කිරීම.
- නිර්දේශිත At වී ප්‍රභේද වල අභිජනන බීජ නිෂ්පාදනය.
- ජාතික සම්බන්ධිකාරක වී ප්‍රභේදීය අත්හදා බැලීම් හා ප්‍රභේදීය අනුවර්තතා අත්හදා බැලීම් වල අත්හදා බැලීම් සිදු කිරීම.
- ග්ලයිසීමික් දර්ශකය හා ආශ්‍රිත තත්ව උප ලක්ෂණ සඳහා වී ප්‍රභේද ඇගයීම.
- වැඩි දියුණු කළ හා සම්ප්‍රදායික වී ආර වල බැර ලෝහ අන්තර්ගතය තක්සේරු කිරීම.
- ජලයෙන් යට වූ තත්වයට ඔරොත්තු දීම සඳහා දේශීය වශයෙන් ජනප්‍රිය වී ජනකප්ලාස්ම පරීක්ෂාවට ලක් කිරීම.
- ජලයෙන් යට වූ තත්ව යටතේ විවිධාකාර වී බීජ වැපිරීමේ ක්‍රම ඇගයීම.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෘණ හා තෘණ පාලන භාවිතා පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම.
- ජාතික සම්බන්ධිකරණ වල්නාශක පරීක්ෂා කිරීමේ අත්හදා බැලීම් පැවැත්වීම.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ *Cyperus difformis* හා *Cypherus irria* ගහන පැළෑටිනාශක කෙරෙහි දක්වන ප්‍රතිරෝධය පිළිබඳව අධ්‍යයනය කිරීම.

- ජලයෙන් යට වූ තත්වයට ඔරොත්තු දීම සඳහා දේශීය වශයෙන් ජනප්‍රිය වී ජනකප්ලාස්ම පරීක්ෂාවට ලක් කිරීම සහ පරිසර හිතකාමී තෘණ කළමනාකරණ තාක්ෂණයක් ගොඩ නැගීම.
- නයිට්‍රජන් පොහොර කෙරෙහි දක්වන ප්‍රතිචාර සඳහා අළුතින් සංවර්ධනය කරන ලද වී ආර පරීක්ෂා කිරීම.
- වී වල වර්ධනය, අස්වැන්න හා ගුණත්ව පරාමිතීන් කෙරෙහි බයෝෆිල්ම් ජෛව පොහොර යෙදීමේ බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම .
- නියඟයට ඔරොත්තු දීම සඳහා විදේශීය වී ජනක ප්ලාස්ම (INGER ප්‍රභේද) පරීක්ෂා කිරීම.

## වී පර්යේෂණ ආයතනය - ලබුදූව

ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ උසස් විභවයෙන් යුතු බණිජමය පස් සහිත කුඹුරු බිම් වල ඵලදායිතාව දියුණු කිරීමට ආශ්‍රිත තාක්ෂණවේදයන් සංවර්ධනය කිරීම හා ඉහළ අස්වනු ලබා දෙන වී ප්‍රභේද සංවර්ධනය කිරීම මෙන්ම නිර්දේශිත "Ld" ප්‍රභේද වල අභිජනන බීජ නිෂ්පාදනය කිරීම ලබුදූව වී පර්යේෂණ ස්ථානයේ වගකීම වේ.

### ප්‍රගතිය

#### පර්යේෂණ

#### ප්‍රභේදීය වැඩිදියුණු කිරීම

ඉහළ අස්වනු ලබාදෙන ආර ලෙස මාස 3½ වී ආර 2ක් (Ld 12-6-22-1-1 සහ Ld 11-7-3-1) හා මාස 4 වී ආර 3ක් (Ld 13-8-9, Ld 12-3-4-2 සහ Ld 12-4-8-2-1) ඒකාබද්ධ වී ප්‍රභේදීය අත්හදා බැලීම් සඳහා නම් කරන ලදී.

මුහුම් 10ක් නිපදවන ලද අතර $F_1$ පරම්පරා 13ක්, $F_2$ පරම්පරා 5ක්, $F_3$ පරම්පරා 16ක් හා $F_4$ පරම්පරා 5ක් උසස් කරන ලදී. පහතරට තෙත් කලාපයේ උසස් විභවයකින් යුතු කුඹුරු ඉඩම් සඳහා ඉහළ අස්වනු ලබාදෙන, අනුවර්තනතාව පෙන්වන හා ගුණාත්මක බවින් යුතු වී ආර සංවර්ධනය කිරීම සඳහා $F_5$ ආර 106ක් $F_6$ ආර 82ක් හා $F_7$ ආර 101ක් පවත්වාගන්නා ලදී.

පිළිවෙලින් ලබුදූව වී පර්යේෂණ ස්ථානයේදී හා බෙන්තොට වී පර්යේෂණ ස්ථානයේදී මුහුම් 4ක $F_4$ ගහන හා මුහුම් දෙකක $F_6$ පරම්පරා වල ආර 198ක් උසස් කරන ලදී. ලවණතා බලපෑමට හසුවන ජලයෙන් යටවීමට හසුවන තත්ව සඳහා වී ආර සංවර්ධනය කිරීමට ආර 98ක් වරණය කරන ලදී.

මුහුම් දෙකකින් පැළ මැක්කන්ගෙන් උපද්‍රව සිදුවීම අඩු වී ආර 103ක් වරණය කරන ලද අතර පැළමැක්කාට ප්‍රතිරෝධීතාව සඳහා දායක මාපියන් ලෙස දහනල භාවිතා කරන ලදී.

#### ශෂ්‍ය විද්‍යාව හා පාංශු විද්‍යාව

ආම්ලික පාංශු තත්ව යටතේ ආනයනය කරන ලද ට්‍රිපල් සුපර් පොස්පේට් (TSP) සඳහා විකල්පයන් ලෙස එප්පාවල රොක් පොස්පේට් යොදා ගැනීමේ හැකියාව තීරණය කිරීමට අධ්‍යයනයක් පවත්වන ලදී. ට්‍රිපල් සුපර් ෆොස්පේට් වලට සමාන කළ හැකි අස්වනු ලබාදෙන සුදුසු මාත්‍රාවක් ලෙසට හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 88ක් මඩවන අවස්ථාවේදී හා හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 88ක් පදනම ලෙසට එප්පාවල රොක් පොස්පේට් යොදා ගැනීම හඳුනා ගන්නා ලදී.

පැරණුට් මාධ්‍යයක් ලෙස එප්පාවල රොක් පොස්පේට් හා අඩ වශයෙන් දහනය කළ දහයියා වල උචිත බව තීරණය කරන ලද අතර ඒවා පැරණුට් මාධ්‍ය ලෙස භාවිතා කිරීම යහපත් බව සොයා ගන්නා ලදී.

නව වී ආර 6ක් (මාස 2 ½ AGT 17, Bg 13-1265 හා Bg 10-288 , මාස 3, Bw 11-3403 සහ At 10-1374 හා මාස 3½ At 10-1350) යොදාගෙන ප්‍රභේදීය අනුවර්තනතා

අත්හදා බැලීම් යටතේ අත්හදා බැලීම් තුනක් සිදුකරන ලදී. ඒ අතරින් AGT 17, Bw 11-3403 හා At 10-1350 වඩා හොඳ අනුවර්තීයතාවක් පෙන්වීය.

### පැළෑටි ආරක්ෂණය

විසඳුම් ලබා දීමට, දත්ත සමුදායක් ගොඩනැගීමට, පළිබෝධ ගහණ නැඹුරුතා විශ්ලේෂණයට හා "ගොවි වෙදැදුරු" ජංගම දුරකථන යෙදුමේ උපකාරය ඇතිව වී වල පළිබෝධ හා රෝග කළමනාකරණය පිළිබඳ තීරණ ගැනීම පිණිස ගොවීන්ගේ වී පළිබෝධ හා රෝග ගැටළු ලබාගැනීමට e - පළිබෝධ අවේක්ෂණ හා පුරෝකතන පද්ධතිය ක්‍රියාවට නංවන ලදී. ලියාපදිංචි වූ ඕනෑම ගොවියෙකුට වී බෝගයේ පළිබෝධ හා ගැටළු අත්පතනය කරනු පිණිස දුරකථන යෙදවුම බාගත කරගත හැක. ලබුදූවේ, වී පර්යේෂණ ස්ථානයේ පැළෑටි ආරක්ෂණ අංශයේ විශේෂඥයෙකු විසින් විසඳුම සිංහල භාෂාවෙන් දුරකථනය වෙතට ලබා දෙනු ලැබේ.

29 වන අන්තර්ජාතික වී බැක්ටීරියානු අංගමාර තවානෙන් ලද වී ප්‍රභේද/ආර බැක්ටීරියානු පත්‍ර අංගමාර රෝගය සඳහා පරීක්ෂා කරන ලද අතර මධ්‍යස්ථව ප්‍රතිරෝධී ආර 2ක් වරණය කරන ලදී.

පිළිවෙලින් පැළමැක්කන්ට ප්‍රතිරෝධී ආර ගොඩනැගීමට නිපදවනු ලැබූ දහනල Bg 9024 හා Bg 300 මුහුම් වල $F_7$ පරම්පරා වලින් ආර එකසිය දාහතරක් සහ ආර 19ක් වරණය කරගන්නා ලදී.

2016/17 මහ හා 2017 යල කන්න වලදී දුඹුරු පුල්ලි රෝගය සඳහා උසස් අභිජනන වී ආර පරීක්ෂාවට ලක් කරන ලදී. පිළිවෙලින් මධ්‍යස්ථව ප්‍රතිරෝධී ආර හතලිස් පහක් හා 117ක් වරණය කරන ලදී.

### අභිජනන බීජ නිෂ්පාදනය

පහත සඳහන් ප්‍රමාණ වල අභිජනන බීජ ප්‍රමාණ නිපදවන ලදී.

**වගු අංක 1.4.6. :නිපදවන ලද අභිජනන බීජ ප්‍රමාණ**

| ප්‍රභේදය | බීජ ප්‍රමාණය (kg) | | |
|---|---|---|---|
| | මහ 2016/17 | යල 2017 | එකතුව |
| මාස 2½ | | | |
| Ld 253 | 82 | 102.5 | 184.5 |
| මාස 3½ | | | |
| Ld 365 | 41 | 61.5 | 102.5 |
| Ld 368 | 102.5 | 61.5 | 164 |
| Ld 371 | 20.5 | 41 | 61.5 |
| මාස 4 | | | |
| Ld 408 | 41 | 82 | 123 |
| **එකතුව** | **287** | **348.5** | **635.5** |

### තාක්ෂණ ප්‍රචාරණය

- ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංවිධානය විසින් පවත්වන ලද 'හරිත උද්‍යාන' ප්‍රදර්ශනයට සහභාගි වන ලදී.
- සබරගමුව විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන් දෙදෙනෙක් හා කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුන්ගේ පර්යේෂණ වැඩසටහන් අටක් අධීක්ෂණය කරන ලදී.
- ස්වකීය පාඨමාලාවේ ආංශික පූරණය සඳහා ඩිප්ලෝමා සිසුන් හා උපාධි අපේක්ෂක සිසුන් පුහුණු කරන ලදී.
- වී වගාව හා දේශගුණ දත්ත භාවිතා කිරීම පිළිබඳව පාසල් සිසුන් පුහුණු කරන ලදී.
- වී වගාවට අදාළව ගොවීන්ගේ ක්ෂේත්‍ර ගැටළු වලට විසඳුම් ලබාදෙන ලදී.

- ‘ගොවි වෙදැදුරු’ ජංගම යෙදවුම හා වෙබ් අඩවිය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.

**සහභාගි වූ පුහුණු, සම්මන්ත්‍රණ හා වැඩමුළු**

- සංවර්ධනය වන රටවල් සඳහා දෙමුහුම් වී විස්තීර්ණ තාක්ෂණවේද පිළිබඳ පුහුණු පාඨමාලාව 2017 මැයි 10 - අගෝස්තු 07, වැන්ෂා සිටි, චීනය
- සංවර්ධනය වන රටවල් සඳහා දෙමුහුම් වී බීජ නිෂ්පාදන තාක්ෂණ තීව්‍රකරණය පිළිබඳ e - ඉගෙනුම් පාඨමාලාව. 2017 නොවැම්බර් 27 -30, ජාතික ඵලදායිතා මහලේකම් කාර්යාලය, කොළඹ

**විශේෂ ව්‍යාපෘති**

පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

- e - පලිබෝධ අවේක්ෂණ හා පුරෝකථන පද්ධතිය ස්ථාපනය කිරීම (NARP වෙතින් ආධාර ලද)
- පහතරට තෙත් කලාපයේ ලවණතා බලපෑමට නතු ජලයෙන් යටවන සුළු පාංශු තත්වය සඳහා වී ප්‍රභේද සංවර්ධනය. (NARP වෙතින් ආධාර ලද)
- වී ජෛව පද්ධති වල ඇසිඩ් සල්ෆේට් පසෙහි දේශගුණය හා පස හා බැඳි ගැටළු කළමනාකරණය.

**වෙනත් ක්‍රියාකාරකම්**

- පර්යේෂණ ක්ෂේත්‍රය වටා ඇති වැට නවීකරණය හා අළුත් ගේට්ටුවක් සවි කිරීම.
- පැළ ගෘහය නවීකරණය
- නව ගොඩනැගිලි : පිරිසැකසුම් ඒකකය හා ගබඩා, වාහන ගරාජය, නවීකරණය කළ ගොවිපළ කාර්යාලය හා කාර්ය මණ්ඩල නිල නිවාස විවෘත කිරීමේ උත්සවය.
- ඌන භාවිත පලතුරු බෝග පවත්වා ගැනීම.

## 2018 වසර සඳහා සැලැස්ම

- නව බෝග සංයෝග පරම්පරා දෙමුහුම්කරණය හා බලාපොරොත්තු තැබිය හැකි ආර හඳුනා ගැනීමට විශාල ගහණ වරණය කිරීම.
- ජාතික සම්බන්ධීකාරක වී ප්‍රභේදීය අත්හදා බැලීම් හා ප්‍රභේදීය අනුවර්තායතා අත්හදා බැලීම් පැවැත්වීම.
- මූලික බීජ නිෂ්පාදනය
- පහතරට තෙත් කලාපයේ වී කොපු මයිටාවා සඳහා පලිබෝධ පුරෝකථන ආකෘතියක් ගොඩනැගීම.
- පැළ මැක්කාට ප්‍රතිරෝධී ආර ගොඩනැගීමට දහනල / Bg 9024 හා දහනල / Bg 300 මුහුම්වලින් වරණය කළ ආර ඇගයීම.
- බැක්ටීරියානු පත්‍ර අංගමාරයට එරෙහිව අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයේ වී ප්‍රභේද හා ආර ඇගයීම.
- මඩට වපුරන වී වගාව සඳහා ජාතික සම්බන්ධීකාරක පැළෑටි නාශක පරීක්ෂාව යටතේ නව පැළෑටිනාශක ඇගයීම.
- යකඩ විෂ වීම හා ආම්ලික බව බඳු වී අස්වැන්න සීමා කරන පාංශු අවහිරතා කාරක පිළිබඳ පරීක්ෂණ හා සමීක්ෂණ පැවැත්වීම.
- බෝග ආකෘති (DSSAT) අධ්‍යයනය.

## වී පර්යේෂණ ස්ථානය - සමන්තුරේ

නැගෙනහිර පළාතේ, විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ වී වගාව හා බැඳුනු

පර්යේෂණ අවශ්‍යතා ඉටු කිරීම හා ඵලදායිතාව ඉහළ නැංවීමට නව වී තාක්ෂණවේදයන් හඳුන්වාදීමට කටයුතු කිරීම මෙම ස්ථානයේ ප්‍රධාන අභිමතාර්ථය වේ. නිර්දේශිත ප්‍රභේද වල මූලික බීජ නිෂ්පාදනය, ජාතික සම්බන්ධීකාරක වී ප්‍රභේදීය අත්හදා බැලීම් සඳහා අත්හදා බැලීම් පැවැත්වීම හා ප්‍රදේශයේ වී ගොවීන්ගේ ක්ෂේත්‍ර ගැටළු වලට විසඳුම් සෙවීම යන ඒවා මෙම ස්ථානයේ අනෙකුත් වගකීම් වේ.

## ප්‍රගතිය

### පර්යේෂණ

නැගෙනහිර පළාතට සුදුසු උසස් වී ආර වරණය කිරීමට $F_6$ ගහණ 8ක් පවත්වාගන්නා ලදී.

ජාතික සම්බන්ධීකාරක වී ප්‍රභේදීය අත්හදා බැලීම් වැඩසටහන යටතේ මාස 3 හා 3 ½ වයස් කාණ්ඩ වල නව වී ආර 15ක් පරීක්ෂා කරන ලදී. At 13-2715 හා At 11-1425 ආර බලාපොරොත්තු තැබිය හැකි බවට හඳුනා ගන්නා ලදී.

අම්පාර දිස්ත්‍රික්කයේ ස්ථාන 6 කදී ප්‍රභේදීය අනුවර්තාතා අත්හදා බැලීම් යටතේ නව වී ආර 6 ක අත්හදා බැලීම් තුනක් පවත්වන ලදී.

සෘජු වැපිරුම් බෝග ලෙස ස්ථාන හතරක දී නව ප්‍රවේශ දෙකක් වන 11-802 හා 09-1851 පරීක්ෂා කරන ලදී. සියලුම නව ප්‍රවේශ සම්මත පරීක්ෂණ ප්‍රභේද වලට වඩා උසස් අස්වනු ලබා දෙන බව පෙන්වීය.

### තාක්ෂණ ප්‍රචාරණය

- ස්ථානයට පැමිණි ගොවීන් 286 දෙනෙකුට පමණ හා ඩිප්ලෝමාධාරීන්ට තොරතුරු සපයන ලදී.
- ගොවීන්ට උපාධි අපේක්ෂකයන්ට හා ඩිප්ලෝමා ධාරීන්ට පුහුණු වැඩසටහන් හතරක් පවත්වන ලදී.
- ගොවීන්ගේ ක්ෂේත්‍ර වලදී බීජ පැළ වැපිරීම, යාන්ත්‍රිකව පැළ උදුරා සිටවීම, කළින් මතුවන පැළෑටිනාශක යෙදීම හා පෙළට බීජ වැපිරීම පිළිබඳ ආදර්ශන දහයක් පවත්වන ලදී.
- “ ඵලදායී වල් කළමනාකරණය”, “ වී පසු අස්වනු හානි මඟ හරවාගන්නේ කෙසේද?” හා “පාංශු සාරවත් බව වැඩිදියුණු කිරීම” පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් තුනක් පවත්වන ලදී.
- කෘෂිකර්ම විද්‍යාලයේ සිසුන් තිස් හයක්, පාසල් සිසුන් 167ක්, කෘෂිකර්මය හා ආශ්‍රිත නිලධාරීන් 26 ක් හා ගොවීන් 346ක් වී වගාව, තෘණ කළමනාකරණය, පළිබෝධ හා රෝග කළමනාකරණය, පසු අස්වනු තාක්ෂණ හා කාබනික වී ගොවිතැන පිළිබඳව පුහුණු කරන ලදී.

## 2018 වසර සඳහා සැලැස්ම

- ජාතික සම්බන්ධීකාරක වී ප්‍රභේදීය අත්හදා බැලීම් හා ප්‍රභේදීය අනුවර්තාතා අත්හදා බැලීම් හා අස්වනු අත්හදා බැලීම් සිදුකිරීම.
- ජාතික ඒකාබද්ධ පැළෑටිනාශක පරීක්ෂා කිරීමේ අත් හදා බැලීම් සිදු කිරීම.
- කෙටි හා ඉතා කෙටි කාලීන නව වී ආර වල නියං ප්‍රතිරෝධීතාව හා උෂ්ණත්වයට ඔරොත්තු දීම පරීක්ෂා කිරීම.
- වී වගාවේ තෘණ පාලන ක්‍රම පිළිබඳ සමීක්ෂණය.
- මූලික බීජ නිෂ්පාදනය
- වල් වී කළමනාකරණය
- නව තාක්ෂණ ප්‍රචාරණය

## වී පර්යේෂණ ස්ථානය - පරන්තන්

විශේෂයෙන්ම උතුරු ප්‍රදේශයේ කිලිනොච්චි, යාපනය හා මුලතිවු දිස්ත්‍රික්ක වල වී වගාවේ පර්යේෂණ අවශ්‍යතා පිළිබඳව කටයුතු කිරීමේ වගකීම මෙම ස්ථානයට පැවරී ඇති අතර ඵලදායිතාව ඉහළ නැංවීමට නව වී ප්‍රභේද හා තාක්ෂණවේදයන් හඳුන්වාදීමද එය ඉටු කරයි.

## ප්‍රගතිය

### පර්යේෂණ

2016/ 17 මහ කන්නයේදී ජාතික සම්බන්ධීකාරක වී ප්‍රභේදීය අත්හදා බැලීම් වැඩසටහන යටතේ සිදු කරන ලද අත්හදා බැලීම් 2 කදී නව වී ආර 8ක් පරීක්ෂාවට ලක් කරන ලද අතර At 13-1543 (මාස 3), At 13-3048 (මාස 3 ½) හා At 13-3791 (මාස 3 ½ ) බලාපොරොත්තු තැබිය හැකි ආර ලෙස හඳුනා ගන්නා ලදී.

2017 යල කන්නයේදී ජාතික සම්බන්ධීකාරක වී ප්‍රභේදීය අත්හදා බැලීම් වැඩසටහන යටතේ සිදු කරන ලද අත්හදා බැලීම් 3 කදී නව වී ආර 17ක් පරීක්ෂාවට ලක් කරන ලද අතර At 13-2715 (මාස 3), Bg 14-567 (මාස 3 ½) හා Bg 14-509 (මාස 3 ½ ) හොඳ කාර්ය සාධනයක් පෙන්වීය.

යල කන්නයේදී ප්‍රභේදීය අනුවර්තීතා අත්හදා බැලීම් වැඩසටහන යටතේ අත්හදා බැලීම් 3ක් මගින් නව උසස් ආර 7ක් පරීක්ෂා කරන ලදී. Bg 13-1265 (මාස 3) සහ AERON 9-3 (මාස 3 ½ ) වඩා වැඩි අස්වනු ලබාදුන් අතර වඩා වැඩි අනුවර්තීතාවක් පෙන්වන බව අනාවරණය විය.

යන්ත්‍ර මගින් සිටුවන ලබන වී සඳහා පැළැටි උපරිම පරතරය සොයා ගැනීමට Bg 352 යොදා ගනිමින් අධ්‍යයනයක් පවත්වන ලදී. වැඩිම පැළැටි ඝණත්වය ලබා දීමට උචිත පරතරය ලෙස සෙමී 30 x සෙමී 16 පරතරය සුදුසු බව අනාවරණය විය. පරීක්ෂාවට ලක් කරන ලද ගැඹුරු මට්ටම් අතුරින් මෙ.මී. 2.1 පැළ කිරීමේ ගැඹුර වඩාත්ම සුදුසු ගැඹුර බවද අනාවරණය විය.

පහතරට වාරි ජල සම්පාදිත වී වගාව සඳහා විවිධ සිටුවීමේ ක්‍රම පරීක්ෂා කරන ලදී. අනෙකුත් ක්‍රම හා සැසඳීමේදී යන්ත්‍ර මගින් පැළ සිටුවීම හා පැරෂුට් පැළ සිටුවීම වඩා අරපිරිමැසුම්දායක හා ඵලදායී ක්‍රම බව අනාවරණය විය.

මුහුම් 10ක් නිපදවන ලද අතර $F_1$ පරම්පරා 10ක්, $F_2$ පරම්පරා 6ක්, $F_3$ පරම්පරා 8ක් හා $F_4$ පරම්පරා 7ක් උසස් කරන ලදී. අභිජනන ආර එකසිය තිහක් පවත්වා ගන්නා ලදී.

රතු බීජාවරණය සහිත උසස් අභිජනන වී ආර දහයක් ඇගයීමට ලක් කරන ලද අතර Ld-16-17/Ld 99-12-38 බලාපොරොත්තු තැබිය හැකි ආර ලෙස හඳුනා ගන්නා ලදී.

වියළි බීජ වැපිරීමේදී යාන්ත්‍රිකෘත තෘණ ඉවත් කිරීමේ යාන්ත්‍රය භාවිතා කිරීමේ ශක්‍යතාව පරීක්ෂා කරන ලදී. එහිදී රසායනික ක්‍රම මගින් වල් ඉවත් කිරීම හෝ අතින් වල් ඉවත් කිරීමට සාපේක්ෂව යාන්ත්‍රිකෘත වල් ඉවත් කිරීමේ යන්ත්‍රය ඵලදායී නොවන බව අනාවරණය විය.

නව පොහොර නිෂ්පාදන පරීක්ෂා කරන ලදී. පරීක්ෂා කරන ලද අනෙකුත් පොහොර හා සළකා බැලීමේදී කාබනික පොහොර සමඟ CIC සල්ෆොනයිට් හොඳ කාර්යසාධනයක් පෙන්වීය.

පොස්පේට් ද්‍රාව්‍ය කරන හා නයිට්‍රජන් තිර කරන ජෛව පොහොර වල බලපෑම පරීක්ෂා කරන ලදී. ප්‍රතිඵල වලින් පෙනී ගියේ වී වගාවේ ජෛව පොහොරක් ලෙසට *Azospirillum spp* ඵලදායී ලෙස භාවිතා කළ හැකි බවයි.

ජාතික සම්බන්ධීකාරක පැළෑටිනාශක පරීක්ෂා කිරිමේ අත්හදා බැලීම් යටතේ නව පැළෑටිනාශක 6ක් ඇගයීමට ලක් කරන ලද අතර, මෙටමිෆොබ් 10% E හා කාෆෙන්ට්‍රසෝන් එතිල් අනෙක් ඒවාට වඩා ඵලදායී බව අනාවරණය විය.

අස්වනු කාර්යසාධනය සඳහා වී ප්‍රභේද 60ක් අගයන ලදී. Bg 352, Bw 364 හා Bg 300 පරීක්ෂා කරන ලද වෙනත් අදාළ පරිනත කණ්ඩායම් ප්‍රභේද හා සැසඳීමේදී පිළිවෙලින් හෙක්ටෙයාරයට ටොන් 6.2 5.75 හා 5.4ක ඉහළ අස්වනු ලබාදුනි.

ස්වායු තත්ව සඳහා සුදුසු ආර දහයක් වර්ෂාපෝෂිත සහ වාරි ජල සම්පාදන තත්ව යටතේ පරීක්ෂා කරන ලද අතර CNI 29 හා IRDTN 07-11 වර්ෂා පෝෂිත තත්ව යටතේ බලාපොරොත්තු තැබිය හැකි ආර බවට අනාවරණය විය.

### මූලික බීජ නිෂ්පාදනය

මොඩ්ඩෙයිකරුප්පන් සම්ප්‍රදායික වී ප්‍රභේදයේ බිත්තර වී කිලෝ ග්‍රෑම් 440 ක් නිපදවන ලදී.

### තාක්ෂණ ප්‍රචාරණය

- උතුරු ප්‍රදේශයේ ගොවි ක්ෂේත්‍ර 19ක් පරීක්ෂාවට ලක් කරන ලද අතර වී පිළිබඳ ස්ථානීය සුවිශේෂී ගැටළු විසඳීමට නිර්දේශ ලබා දෙන ලදී.
- ස්ථානයට පැමිණ යාපනය, මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල පාසල් සිසුන් 180 දෙනෙකුට තොරතුරු සපයන ලදී.
- ස්වකීය පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට උපාධි අපේක්ෂක සිසුන් දෙදෙනෙකුට හා එක් පශ්චාත් උපාධි අපේක්ෂක සිසුවෙකුට පහසුකම් සපයන ලදී.
- ස්වකීය පාඨමාලා වල ආංශික පූරණයන් සඳහා පරන්තන් කෘෂිකර්ම විද්‍යාලයේ සිසුන් ව පුහුණු කරන ලදී.
- කිලිනොච්චියේ වඩ්ඩකච්චි දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයෙහි පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණනාවකට සහ මහ බැංකුව විසින් පවත්වන ලද පුහුණු සඳහා සම්පත් දායකයන් ලෙස නිලධාරීහු සහභාගි වූහ.
- එක් ක්ෂේත්‍ර දිනයක් හා ගොවි පුහුණු තුනක් පවත්වන ලදී.

### සහභාගි වූ පුහුණු, සම්මන්ත්‍රණ හා වැඩමුළු

වියළි කලාපීය කෘෂිකර්මය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2017 නොවැම්බර් 1 හා 2, කෘෂිකර්ම පීඨය, අරිවියල් නගර්, කිලිනොච්චි.

## 2018 වසර සඳහා සැලැස්ම

- උතුරු ප්‍රදේශයේ දේශීය වගා ප්‍රභේද එක් රැස් කිරීම හා සංශුද්ධ කිරීම.
- කෙටි කාලීන සිට අතරමැදි කාලසීමා දක්වා වූ රතු වී ප්‍රභේද සංවර්ධනය.
- ගුණාත්මක බීජ සපයනු පිණිස සාම්ප්‍රදායික ප්‍රභේද ගුණනය.
- උතුරු ප්‍රදේශයෙහි දී පැළ සිටුවීමේ යන්ත්‍රය පිළිබඳව ශෂ්‍ය විද්‍යාත්මක ඇගයීමක් සිදු කිරීම.
- පර්යේෂකයා හා ගොවියා අතර අස්වනු පරතරයක් පැවතීමට හේතු හඳුනා ගැනීම.
- ජාතික සම්බන්ධිකාරක ප්‍රභේදීය පරීක්ෂණ හා අනුවර්තතා පරීක්ෂණ අත්හදා බැලීම් යටතේ නව වී ආර ඇගයීම .
- ජාතික ඒකාබද්ධ පැළෑටිනාශක පරීක්ෂා කිරීමේ අත් හදා බැලීම් යටතේ පැළෑටිනාශක පරීක්ෂා කිරීම.
- මූලික බීජ නිෂ්පාදනය.

## වී පර්යේෂණ ස්ථානය, මුරුන්කන්

උතුරු ප්‍රදේශයේ, විශේෂයෙන්ම මන්නාරම් දිස්ත්‍රික්කයේ වී වගාවේ පර්යේෂණ අවශ්‍යතා සඳහා ක්‍රියා කිරීම හා ඵලදායිතාව වැඩි කිරීම සඳහා නව වී තාක්ෂණවේදයන් හඳුන්වාදීම මෙම ස්ථානයට පැවරී ඇති කාර්යභාරය වේ. ජාතික සම්බන්ධිකාරක අත්හදා බැලීම් හා කලාපයේ වී ගොවීන්ගේ ක්ෂේත්‍ර ගැටළු වලට විසඳුම් සොයා ගැනීම බඳු වෙනත් වගකීම් ද මෙම ස්ථානයට පැවරී ඇත.

### ප්‍රගතිය

#### පර්යේෂණ

ජාතික සම්බන්ධීකාරක වී ප්‍රභේදීය අත්හදා බැලීම් වැඩසටහන යටතේ නව වී ආර එකොලහක් 2016/17 මහ කන්නයේදී හා යල කන්නයේදී අත්හදා බැලීම් 2ක් මගින් පරීක්ෂා කරන ලදී. At 13 -3791 හා Bg 14 - 567 (මාස 3), හා At 13-1543 (මාස 3 ½), කෙරෙහි බලාපොරොත්තු තැබිය හැකි බව අනාවරණය විය.

පිලිපීනයේ ජාත්‍යන්තර වී පර්යේෂණ ආයතනයෙන් ලැබුණු වී ප්‍රභේද අසූවක් ඒවායේ අනුවර්තතාව හා අස්වනු කාර්යසාධනය පිරික්සීම සඳහා යල කන්නයේ දී පරීක්ෂාවට භාජනය කරන ලදී.

වීවල කඳ විදින්නා පාලනය සඳහා නිර්දේශිත මාත්‍රාව සමඟ ඩයසිනෝන් විවිධ මාත්‍රා පරීක්ෂාවට ලක් කරන ලදී. පලිබෝධය තුළ වර්ධනය වූ භව්‍ය ප්‍රතිරෝධය විදහා දක්වමින් පලිබෝධය පාලනය කිරීමෙහි ලා නිර්දේශිත මාත්‍රාවට වඩා වැඩි වූ මාත්‍රා ඉහළ කාර්ය සාධනයක් පෙන්වීය. එසේ වුව ද, මෙම ප්‍රතිඵල සනාථ කිරීම සඳහා වැඩි දුර අධ්‍යයනයන් සිදු කිරීම අවශ්‍ය වේ.

තියෝ-යූරියා පැළැටි නාශක හතක් වී වගාවේ පන් නැතහොත් පළල් පත්‍ර පැළැටි වලට එරෙහිව පරීක්ෂාවට ලක් කරන ලද අතර ඉතා දුර්වල කාර්යසාධනයක් පෙන්වීය.

#### මූලික බීජ නිෂ්පාදනය

At 308 ප්‍රභේදයේ බිත්තර වී කිලෝ ග්‍රෑම් 71ක් නිපදවන ලදී.

#### තාක්ෂණ ප්‍රචාරණය

- වී වල ක්ෂේත්‍ර සුවිශේෂී කලාපීය ගැටළු විසඳීමට තාක්ෂණික නිලධාරීන් විසින් ක්ෂේත්‍ර ගමන් 45ක් සිදු කරන ලදී.
- වී පිළිබඳ ගැටලු විසඳා ගැනීමට ස්ථානයට පැමිණි සහ දුරකතනයෙන් විමසීම් කළ ගොවීන් 240 දෙනෙකුට පමණ උපදෙස් හා නිර්දේශ ලබා දෙන ලදී.
- වී වල පලිබෝධ හා රෝග කළමනාකරණය හා වල් වී කළමනාකරණය පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් දෙකක් ජාතික ගුවන් විදුලි සේවය තුළින් පවත්වන ලදී.
- ස්ථිර බෝග සායන වැඩසටහන යටතේ උතුරු හා නැගෙනහිර පළාත් වල පැළැටි වෛද්‍යවරුන්ට නවමුකරණ පුහුණු පවත්වන ලදී.
- මුරුන්කන් හි යෝධ වැව වාරිමාර්ග කාර්යාලයේදී ගොවීන් සඳහා පුහුණු වීම් 3ක් පවත්වන ලදී.
- මන්නාරමේ සිසුන් 840 දෙනෙක් සඳහා පැළැටි ආරක්ෂාව පිළිබඳව සම්මන්ත්‍රණ 8ක් පවත්වන ලදී.

### 2018 වසර සඳහා සැලැස්ම

- FAO මූල්‍ය ආධාර ද සහිතව පාංශු හා කීට විද්‍යා පරීක්ෂණාගාරය පුනරුත්ථාපනය කිරීම.

- ක්ෂේත්‍රයේ පසුපස අන්තයේ වැට ඉදි කිරීම
- බී නිල නිවාස හතරක් පුනරුත්ථාපනය කිරීම
- බිජු ලැමේ ක්‍රියාවලියට බාධා කිරීම මගින් වී වල පැළ මැක්කන් පාලනය කිරීම.
- ගොයම් මකුණන් සඳහා උගුලක් ගොඩ නැගීම.
- තෘණ කෙරෙහි විවිධ වී ප්‍රභේද වල ඇලීලොපතික බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම.
- ජාතික සම්බන්ධීකාරක පැළටිනාශක අත්හදා බැලීම් පැවැත්වීම.
- ජාතික සම්බන්ධිකාරක වී ප්‍රභේදීය අත්හදා බැලීම් පැවැත්වීම

## කාර්ය මණ්ඩලය

**වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ**

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 | 01 |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | 01 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 26 | 13 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (ආර්ථික විද්‍යා) | 01 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 04 | 02 |
| පරිපාලන නිලධාරි | 02 | 01 |
| තොරතුරු හා තාක්ෂණ නිලධාරි | 01 | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 11 | 04 |
| සංවර්ධන නිලධාරි | 08 | 06 |
| කෘෂිකර්ම උපදේශක | 11 | 17 |
| පර්යේෂණ සහකාර | 45 | 21 |
| ඉංජිනේරු සහකාර | 01 | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 13 | 13 |
| තාක්ෂණ සහායක | 05 | 05 |
| ගොවිපළ ලිපිකරු | 01 | 01 |
| නේවාසිකාගාර පාලක | - | 01 |
| රියදුරු | 10 | 09 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 03 | 02 |
| ගබඩාකරු | 01 | 01 |
| කාර්මික ශිල්පී | 01 | 01 |

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| යාන්ත්‍රික ශිල්පි | 01 | 01 |
| පර්යේෂණ උප සහකාර | 05 | 04 |
| අරක්කැමි | 02 | 02 |
| සංචාරක බංගලා භාරකරු | 01 | 01 |
| ලොරි පවිත්‍රකරු | - | 01 |
| කාර්යාල කාර්ය සහායක | 02 | 02 |
| මුරකරු | 12 | 09 |
| කම්කරු (ස්ථිර) | 156 | 120 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 51 | 50 |
| **එකතුව** | **377** | **293** |

**වී පර්යේෂණ ස්ථානය, අම්බලන්තොට**

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 06 | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | - | 01 |
| සංවර්ධන නිලධාරි | 02 | 04 |
| කෘෂිකර්ම උපදේශක | 03 | 00 |
| පර්යේෂණ සහකාර | 04 | 05 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | 02 |
| තාක්ෂණ සහායක | 03 | 03 |
| ගොවිපළ ලිපිකරු | 01 | 01 |
| රියදුරු | 02 | 02 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 01 |
| පර්යේෂණ උප සහකාර | 02 | 01 |
| මුරකරු | 04 | 04 |
| කම්කරු (ස්ථිර) | 42 | 27 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 20 | 16 |
| **එකතුව** | **93** | **69** |

වී පර්යේෂණ ස්ථානය - ලබුදූව

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) ස්ථානභාර | 01 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 05 | 02 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | - | 01 |
| සංවර්ධන නිලධාරි | 02 | 03 |
| කෘෂිකර්ම උපදේශක | 02 | 04 |
| පර්යේෂණ සහකාර | 03 | 05 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | 03 |
| තාක්ෂණ සහායක | 01 | 03 |
| රියදුරු | 01 | 02 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 01 |
| කාර්යාල කාර්ය සහකාර | 01 | 01 |
| මුරකරු | 04 | 03 |
| කම්කරු (ස්ථිර) | 24 | 16 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 10 | 05 |
| **එකතුව** | **57** | **50** |

වී පර්යේෂණ ස්ථානය - සමන්තුරේ

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 03 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 01 | 01 |
| සංවර්ධන නිලධාරි | 05 | 06 |
| කෘෂිකර්ම උපදේශක | 03 | 01 |
| පර්යේෂණ සහකාර | 03 | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 | 02 |
| තාක්ෂණ සහායක | 03 | 03 |
| රියදුරු | 02 | 01 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 01 |
| කාර්යාල කාර්ය සහකාර | 01 | 01 |
| මුරකරු | 04 | 05 |
| කම්කරු (ස්ථිර) | 14 | 10 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 10 | 02 |
| **එකතුව** | **51** | **37** |

### වී පර්යේෂණ ස්ථානය, පරන්තන්

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 03 | 01 |
| සංවර්ධන නිලධාරි | 02 | 02 |
| කෘෂිකර්ම උපදේශක | 01 | 01 |
| පර්යේෂණ සහකාර | 03 | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | 01 |
| තාක්ෂණ සහායක | 06 | 03 |
| රියදුරු | 01 | 01 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 01 |
| මුරකරු | 03 | 02 |
| කම්කරු (ස්ථිර) | 16 | 07 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 10 | 10 |
| **එකතුව** | **48** | **31** |

### වී පර්යේෂණ ස්ථානය, මුරුන්කන්

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| පර්යේෂණ සහකාර | 01 | 01 |
| තාක්ෂණ සහායක | 03 | 02 |
| මුරකරු | 02 | 02 |
| කම්කරු (ස්ථිර) | 13 | 09 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 04 | 04 |
| **එකතුව** | **23** | **18** |

# 1.4.1. ප්‍රාදේශීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බෝඹුවල

බෝඹුවල ප්‍රාදේශීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (RRRDC), බතලගොඩ වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය (RRDI) යටතේ ක්‍රියාත්මක වන ආයතන අතුරින් එකකි. බෙන්තොට කෘෂිකර්ම පර්යේෂණායතනය (ARS), ප්‍රාදේශීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය යටතේ ක්‍රියාත්මක වන උප මධ්‍යස්ථානයක් වෙයි.

ගැටළුකාරි පසක් සහිත කුඹුරු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් කළුතර, කොළඹ, ගම්පහ යන දිස්ත්‍රික්කවල ද ගාල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්කවල ඇතැම් ප්‍රදේශවල ද සහල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා තාක්ෂණය වැඩිදියුණු කිරීමත් ව්‍යාප්ත කිරීමත් ප්‍රාදේශීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයෙහි කාර්යභාරයන්ය. තවද ප්‍රදේශය සඳහා සරිලන ජෛව, අජෛව ආතතීන්ට ඔරොත්තු දෙන වැඩි අස්වනු සහිත සුදු හා රතු නිවුඩ්ඩකින් (Pericarp) සමන්විත ප්‍රභේද හඳුන්වාදීමත් බෝඹුවල ප්‍රභේදවලට (Bw) අදාළව අභිජනන බීජ නිපදවීමත් මෙහි අනෙකුත් කාර්යයන් අතර වෙයි. අදාළ වෙනත් තාක්ෂණික හුවමාරු කටයුතු ද මෙමගින් ඉටු කෙරේ.

## අයවැය

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 7,164,720 | 6,529,996 | 91 |
| මූලධන | 1,427,819 | 1,365,501 | 96 |
| ව්‍යාපෘති | | | |
| • වී වල යකඩ විෂවීමට ඔරොත්තු දීම හඳුනාගැනීමට විශ්වසනීය ක්‍රමවේදයක් ගොඩනැගීම (NARP) | 493,000 | 473,989 | 96 |
| • ගොයම් මකුණාගේ ප්‍රජනක පරිණතභාවය සඳහා හේතුවන වී වල ඇලීලෝ රසායනිකයේ කාර්යය (*Oryza sativa*) | 222,400 | 190,683 | 86 |
| • තිරසාර වී නිෂ්පාදනයක් සඳහා ස්ථාන විශේෂිත පොහොර කළමනාකරණ පද්ධතියක් ගොඩනැගීම | 50,000 | 49,571 | 99 |
| • ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ස්ථාන විශේෂිත පොහොර නිර්දේශකරණයට පාංශු පරීක්ෂණ වැඩසටහන | 215,000 | 193,124 | 90 |
| • ධාන්‍ය තත්ත්වය කෙරෙහි වී ගබඩාකරණයේ බලපෑම අධ්‍යයනය කිරීම | 540,000 | 438,603 | 81 |
| **එකතුව** | **110,112,939** | **9,271,607** | **93** |

# ප්‍රගතිය

## පර්යේෂණ

### වී ප්‍රභේදමය වැඩිදියුණු කිරීම

විශේෂයෙන් යකඩ විෂවීම සහ ජලයෙන් යටවීම යනාදී අජෛව ආතතීන්ට සහ පළිබෝධ හා රෝග යනාදියට ඔරොත්තු දිය හැකි වැඩි අස්වනු ගෙන දෙන වී ප්‍රභේදයක් හඳුන්වාදීමේ අඛණ්ඩ උත්සාහයක ප්‍රාදේශීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය නිරත වෙයි. ඒ අනුව ප්‍රභේද අනුවර්තිතා අත්හදා බැලීම (VAT) සඳහා මාස තුනකින් අස්වනු ලබා දෙන කාණ්ඩයට අයත් Bw 11-3403 වී ආර යෝජනා කෙරිණ. 2016/17 මහ කන්නයේ NCRVT සඳහා මාස 3 ½න් අස්වනු දෙන කාණ්ඩයට අයත් Bw 14 -509 ප්‍රභේදය යෝජනා කර ඇත. 2017 යල කන්නයේ සිදු කළ මූලික අස්වනු පරීක්ෂාව (PYT) මගින් මාස 3 ½ අස්වනු කාණ්ඩයේ උසස් අභිජනන ආර 8ක් ද මාස 3ක කාලයකින් අස්වනු නිපදවන වී ආර 8ක් ද වරණය කරන ලදී.

Bw - 12-574, Bw 11-3403 Bw 14-509 යන විශිෂ්ට වී ආරවල බීජ බහු ගුණනය කරන ලදී. නිර්දේශිත ප්‍රභේදවල (Bw 351, Bw 400, Bw 451, Bw 452 සහ Bw 453) සහ බලාපොරොත්තු තැබිය හැකි වී ආර 17ක් බහු ගුණනය කෙරිණි.

### ශෂ්‍ය විද්‍යාව

යන්ත්‍රානුසාරයෙන් සිටුවන ලද වී වල අස්වැන්න හා සම්බන්ධ ලක්ෂණ වන කරල් හටගැනීමේ වේගය සහ ප්‍රරෝහණ අවධිය ඇගයීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලද අතර වර්ග මීටරයට ග්‍රෑම් 75ක බීජ අනුපාතය සුදුසු බව නිරීක්ෂණය කරන ලදී. ප්‍රරෝහණ අවධියෙහි වෙනසක් නිරීක්ෂණය නොවිය.

NCRVT හිදි, මාස 3 වී ආර වන At 13-2715 සහ At 13-1543 උසස් අස්වැන්නක් ලබා දුන්නේය. මාස 3 ½ වී ආර වන At 13-3791, Bg 14-567 Ld 11-7-3-1 සහ Bw මනා අස්වැන්නක් ලබා දුණි.

ෂොන්හුවා, AERON 9-3 සහ Bw 11-3403 ද පර්යේෂණ තත්ත්වය යටතේ මනා අස්වැන්නක් ලබා දුන් අතර ගොවීන් විසින්ද එම බීජ ප්‍රිය කරනු ලබන බව පෙණින.

ධාන්‍යවල ගුණාත්මක ලක්ෂණ කෙරෙහි වී ගබඩාකරණ තත්ත්වවල බලපෑම අධ්‍යයනය කරන ලදී. ගබඩා කිරීම සඳහා යොදා ගනු ලබන විවිධ ද්‍රව්‍ය තෝරාගනු ලැබූ වී ප්‍රභේදයන්හි ධාන්‍යවල ගුණාත්මක ලක්ෂණ කෙරෙහි විවිධ බලපෑම් ඇති කළේය.

### පළිබෝධ විද්‍යාව

පළිබෝධ හා තරඟ කිරීමේ හැකියාව නිශ්චය කර ගැනීම සඳහා පහතරට තෙත් කලාපයේ තෝරාගනු ලැබූ Bw වී ප්‍රභේද සම්බන්ධයෙන් කළ අධ්‍යයන වලදී Bw 372 සහ Bw 361 යන ප්‍රභේද පරීක්ෂණයට භාජනය කළ අනෙකුත් ප්‍රභේදවලට සාපේක්ෂව ඉහළ තරගකාරිත්වයක් පෙන්විය.

පහතරට තෙත් කලාපයේ හි රළු තෘණ සහ පළල් පත්‍ර පාලනය කිරීමේ දී පිරසොසල්ෆියුරන් එතිල් 10%WP ඉහළ සාඵල්‍යතාවයකින් යුත් නව රසායනිකයක් වශයෙන් හඳුනා ගන්නා ලදී.

නිර්දේශිත වල්නාශක (Azimsulfuron 50% WG සහ Flucetosulfuron 10%WG) දෙකක් 2017 වසර යල කන්නයේ දී නැවත ඇගයූ අතර ඉන් ලබා ගත් ප්‍රතිඵල අනුව සියලුම ආකාරයේ වල් පැළ මර්දනය සඳහා එම රසායනික දෙවර්ගයෙහි ම කාර්යක්ෂමතාවය නොවෙනස්ව පවතින බව පෙන්නුම් කර ඇත.

## ව්‍යාධිවේදය

බැක්ටීරියා අංගමාර රෝගයට හේතුවන ව්‍යාධිජනක ආකාරය (*Xanthomonas oryzae* pv *oryzae*) හඳුනා ගැනීමට අධ්‍යයනයක් ආරම්භ කෙරුණු අතර එහි විවිධ තනි ආකාර පහතරට තෙත් කලාපයේ එක් රැස්කර ගන්නා ලදී. ඒවායෙහි ව්‍යාධිජනකභාවය ද තහවුරු කර ගන්නා ලදී.

වී වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ අභිජනන ආර/ප්‍රභේද 112ක් සංවර්ධනය කරන ලද අතර බැක්ටීරියා අංගමාරයට ප්‍රතිරෝධී ප්‍රබව හඳුනාගැනීම සඳහා ඒවා පරීක්ෂා කරන ලදී. එහිදී එකදු වී ආරක් හෝ අංගමාර රෝගයට ප්‍රතිරෝධීතාවයක් නොදැක්වීය.

## කීට විද්‍යාව

BPH සඳහා NCRVT වී ආර පරීක්ෂා කිරීමේ දී මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධි ආර දෙකක් 3-3791 සහ 10 -1374 හඳුනා ගන්නා ලදී.

INGER වැඩසටහන යටතේ ලබාගත් ආර 68ක් BPH සඳහා පරීක්ෂා කරන ලදී. එයින් ආර 15ක් BPH සඳහා ප්‍රතිරෝධීතාවක් දැක් වූ අතර ආර 22ක් මධ්‍යස්ථ ප්‍රතිරෝධීතාවක් පෙන්නුම් කරන බව හඳුනාගන්නා ලදී.

ගොයම් මකුණාගේ ප්‍රජනක පරිණතභාවය සම්බන්ධයෙන් ඇලිලෝ රසායනිකවල කාර්ය භාරය නිශ්චිත කරලීම සඳහා ආරම්භ කළ අධ්‍යයනය තවදුරටත් ක්‍රියාත්මක කෙරිණ. වී පැළෑටියේ විවිධ වර්ධන අවයවල පවතින වාෂ්පශීලි ද්‍රව්‍ය හුමාල ආසවනය ක්‍රමවේදය භාවිතයෙන් වෙන වෙනම නිස්සාරණය කරන ලදී. ගැහැණු ගොයම් මකුණා ආකර්ශණය වන ප්‍රබල මාත්‍රාව නිශ්චිත කර ගැනීම සඳහා එක් එක් නිස්සාරණය සඳහා ජෛව විද්‍යාත්මක ක්‍රියාකාරිත්වය පිරික්සීමක් (Bio - assay) සිදු කළ අතර හෙක්සේන් මිලි ලීටර් 1කට නිස්සාරකයේ මයික්‍රො ග්‍රෑම් 8ක ප්‍රමාණය සඵලදායී බව සොයා ගැණින. සෑම නිස්සාරණකයක්ම සමාන සංයුතියකින් යුක්ත වූ නමුත් විවිධ සාන්ද්‍රණයන්ගෙන් සමන්විත විය.

පරිසර හිතකාමී පලිබෝධ කළමනාකරණ ක්‍රමවේදයක් නිර්දේශ කිරීමේ අරමුණින් බෝම්බුවල ක්ෂේත්‍ර තත්ත්ව යටතේ දී වී පත්‍ර හකුලන්නාට එරෙහිව ෆෙරමෝන උගුලක් අගයන ලදී. පලිබෝධකයන් පාලනය කිරීමේ උපරිම සාඵල්‍යතාව පෙන්නුම් කරමින් දින 6ක් තුළ එවැනි එක් උගුලකට සුහුඹුල් පත්‍ර හකුලන්නෝ 43ක් ග්‍රහණය වූහ.

## පාංශු විද්‍යාව

විවිධ පෝෂක කළමනාකරණ පද්ධතිවල දිගු කාලීන බලපෑම වී වල අස්වැන්න කෙරෙහි ඇති කරන බලපෑම නිශ්චය කිරීම සඳහා මෙම පරීක්ෂණය සිදු කරන ලද අතර කාබනික ද්‍රව්‍ය මුසු කිරීම මගින් අස්වැන්න ඉහළ යන බවත් පසේ රසායනික ගුණාංග ඉහළ යන බවත් පාංශු ලක්ෂණ මගින් පෙන්නුම් කෙරිණි.

වී වල යකඩ විෂවීමට ඔරොත්තු දීම සඳහා විශ්වසනීය පරීක්ෂණ ක්‍රමවේදයක් ගොඩනැංවීම පිණිස පාලිත පරිසර තත්ත්ව යටතේ යොෂිදා ද්‍රාවණය තුළ විවිධ යකඩ සාන්ද්‍රණ සමඟ වී ප්‍රභේද 10ක් පරීක්ෂාවට ලක් කරන ලදී.

## ජල කළමනාකරණය

නිර්වායුක ප්‍රරෝහණ ලක්ෂණ සහිත විවිධ වී ගහණ 10ක්, ජලයෙන් යටවී ගිය ක්ෂේත්‍ර තත්ත්වයක් යටතේ ප්‍රරෝහණය සහ ප්‍රරෝහකයේ වර්ධනය නිශ්චය කිරීම සඳහා අගයන ලදී. එයින් ගහණ 3ක් සතුටුදායක ලක්ෂණ පෙන්නුම් කළේය.

තෝරා ගනු ලැබූ වී ප්‍රභේද / ආර 3ක් ක්ෂේත්‍ර තත්ත්ව යටතේ දී වැපිරීම සම්බන්ධයෙන් අගයන ලදී. NP 14- 22-1 වී ආර ගිල් වූ තත්ත්ව යටතේ දී වඩා හොඳ

ප්‍රරෝහණයක් සහ පැළ වර්ධනයක් පෙන්නුම් කළේය.

## බීජ නිෂ්පාදනය

- නිර්දේශිත වී ප්‍රභේදවල අභිජනන බීජ පහත සඳහන් ප්‍රමාණවලින් නිපදවන ලදී.

**වගු අංක 1.4.1.2: අභිජනක බීජ නිෂ්පාදනය**

| ප්‍රභේදය | ප්‍රමාණය (Kg) | | |
|---|---|---|---|
| | මහ 2016/17 | යල 2017 | එකතුව |
| මාස 3 ½ | | | |
| Bw 364 | 41.0 | 20.5 | 61.5 |
| Bw 361 | - | - | - |
| Bw 367 | 328.0 | 307.5 | 635.5 |
| Bw 372 | 41.0 | 61.5 | 102.5 |
| මාස 2 | | | |
| Bw 272-6b | - | 20.5 | 20.5 |
| **එකතුව** | **410.0** | **410.0** | **820.0** |

- වසර තුළ දි වී ප්‍රභේද 8කට අයත් වාණිජ බීජ කිලෝ ග්‍රෑම් 7,356ක් නිපදවන ලදී.

## විශේෂ ව්‍යාපෘති

පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබීය.

- *Leptocorisa oratorius* (hemiptera:alydidae) ගොයම් මකුණාගේ ප්‍රජනක පරිණතියට අදාළව වැදගත් වන්නා වූ වී (*Oryza sativa*) වල ඇලීලෝ රසායනිකයේ කාර්යය පිරික්සීම.
- වීවල යකඩ විෂවීමට ඔරොත්තුදීම හඳුනාගැනීමට විශ්වසනිය ක්‍රමවේදයක් ගොඩනැගීම
- ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන
- තිරසාර වී නිෂ්පාදනයක් සඳහා ස්ථාන විශේෂිත පොහොර කළමනාකරණ පද්ධතියක් ගොඩනැගීම
- ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ස්ථාන විශේෂිත පොහොර කළමනාකරණ පද්ධතියක් ගොඩනැගීම
- ධාන්‍ය තත්ත්වය කෙරෙහි වී ගබඩාකරණයේ බලපෑම අධ්‍යයනය කිරීම.

## තාක්ෂණය ව්‍යාප්ත කිරීම

- වසර තුළදී විවිධ පරාමිතීන් යටතේ පස් නියැදි 2073 ද ධාන්‍ය නියැදි 64 ද කොම්පෝස්ට් නියැදි 16 ද පැළ නියැදි 8ක්ද පරීක්ෂා කරන ලදී.
- ව්‍යාප්ත නිලධාරීන්, ගොවීන්, හෙද නිලධාරීන්, ගුරුවරුන් විවිධ කාණ්ඩවල ශිෂ්‍යයන් සහ උනන්දුවක් දක්වන වෙනත් කණ්ඩායම් සඳහා විවිධ විෂයයන් යටතේ පුහුණු වැඩසටහන් 36ක් සංවිධානය කරන ලදී. මේ සඳහා සහභාගී වූ පුහුණුලාභීහු සංඛ්‍යාව 4373කි.
- විවිධ සංවිධාන මගින් පවත්වන ලද ක්ෂේත්‍ර දින 3ක් සහ ප්‍රදර්ශන 6ක් සඳහා නිලධාරිහු සම්පත් දායකයෝ වශයෙන් සහභාගි වූහ.
- විවිධ සංවිධාන මගින් පවත්වන ලද වැඩසටහන් වැඩමුළු 12ක් සඳහා නිලධාරීහු සම්පත් දායකයෝ වශයෙන් සහභාගී වූහ.
- මධ්‍යස්ථානයේ නිලධාරීන් විසින් පවත්වන ලද සමස්ථ අභ්‍යන්තර සම්මන්ත්‍රණ සංඛ්‍යාව 12කි.
- කාබනික වී වගාව පිළිබඳ ගුවන් විදුලි වැඩසටහනක් (සුභාරති) සඳහා නිලධාරීහු දෙදෙනෙකු සහභාගි වූහ.
- පහතරට තෙත් කලාපයේ වී වගාව යාන්ත්‍රීකරණය සම්බන්ධයෙන් එක් ක්ෂේත්‍ර දිනයක් පවත්වන ලදී.

## සහභාගි වූ පුහුණු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

නිලධාරිහු පහත සඳහන් පුහුණු, සම්මන්ත්‍රණ සඳහා සහභාගි වූහ.

- සංවර්ධනය වෙමින් පවතින රටවල බෝගවලට හානි කරන කෘමීන් හා ව්‍යාධිජනකයන් සඳහා ජෛව විද්‍යාත්මක පාලනය පිළිබඳ පුහුණු පාඨමාලාව. 2017-05-17 සිට 2017-05-31 දක්වා, බීජිං, චීනය.
- සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කෘෂිකාර්මික ජෛව තාක්ෂණික භාවිතාවන් පිළිබඳ සම්මන්ත්‍රණය 07.06.2017-06-07.201, බීජිං, චීනය.
- සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දෙමුහුම් වී විස්තීර්ණ තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව 10.5.2017 - 07.08.2017, චැන්ග්ෂුආ, චීනය
- සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ග්‍රීන් සුපර් දෙමුහුම් වී අභිජනනය, බීජ නිෂ්පාදනය සහ වගා තාක්ෂණය. 01.09.2017 -13.10.2017, චැන්ග්ෂුආ, චීනය
- නිෂ්පාදනය සඳහා වී පර්යේෂණ. 14.08.2017 - 01.09.2017 ජාත්‍යන්තර වී පර්යේෂණ ආයතනය (IRRI), පිලිපීනය
- සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දෙමුහුම් වී බීජ නිෂ්පාදන තාක්ෂණය තීව්‍රකරණය 28.06.2017 - 26.08.2017, චැන්ග්ෂුආ, චීනය.
- මධ්‍යම මට්ටමේ නිලධාරීන් සඳහා උසස් පුහුණු වැඩමුළුව 11.10.2017 - 17.10.2017, RDA ජියෝන්ජු, කොරියාව.

## 2018 වසර සඳහා සැලැස්ම

### වී ප්‍රභේදමය වැඩිදියුණු කිරීම

- සාම්ප්‍රදායික අභිජනන තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් වී ප්‍රභේද සංවර්ධනය
- ජලයෙන් යටවීමට සහ යකඩ විෂවීමට ඔරොත්තු දෙන වී ප්‍රභේද හඳුන්වා දීම
- BLB ප්‍රතිරෝධතාව සඳහා Bw වී ප්‍රභේද වැඩිදියුණු කිරීම
- BLB ආසාදනයට ප්‍රතිරෝධි වී ප්‍රභේද රූපිකමය සහ අණුකමය පරීක්ෂා මගින් තෝරා ගැනීම
- සාම්ප්‍රදායික වී ප්‍රභේද බහුගුණනය
- අභිජනන බීජ නිෂ්පාදනය

### ශෂ්‍ය විද්‍යාව

- NCRVT සහ VAT වැඩසටහන් යටතේ වී ආර ඇගයීම
- යාන්ත්‍රික ක්‍රමයෙන් සිටුවන ලද වී පැළවල අස්වැන්න සම්බන්ධයෙන් අදාළ ලක්ෂණ වන අස්වනු නිෂ්පාදන වේගය සහ ප්‍රරෝහණ අවධිය ඇගයීම
- වී වල යකඩ විෂ වීමට ඔරොත්තු දීම සඳහා විශ්වසනීය පරීක්ෂණයක් ගොඩනැගීම
- යාන්ත්‍රික පැළ සිටුවීම සඳහා සුදුසු Bw වී ප්‍රභේදයක් හඳුන්වා දීම

### පළිබෝධ විද්‍යාව

- යාන්ත්‍රික ක්‍රමයට සිටුවන ලද වී වගාවක වල් පැළැටි කාර්යක්ෂම ලෙස පාලනය කිරීම සඳහා බලවේග වල් පැළැටි මඩින යන්ත්‍රය භාවිතා කළ යුතු නිසි අවධිය හඳුනා ගැනීම
- ප්‍රරෝහණ අවධි දෙකක පසුවන වී තවාන් යොදා ගනිමින් යාන්ත්‍රානුසාරයෙන් සිටුවන ලද වී වගාවක පළිබෝධ ඝනත්වය සහ පළිබෝධ පාලන කාර්යක්ෂමතාව ඇගයීම

- ජාතික සම්බන්ධීකරණ පැළෑටි නාශක වරණීය අත්හදා බැලීමේ (NCHST) වැඩසටහන යටතේ වල් පැළෑටිනාශක විශ්ලේෂණය

## ව්‍යාධිවේදය

- ගොයම් කොළ පාළුව සහ බැක්ටීරියාමය අංගමාරය යන රෝග සඳහා අභිජනන වී ආර, NCRVT වී ආර සහ INGER වී ආර පරීක්ෂා කිරීම.
- පහතරට තෙත් කලාපයේ *Xanthomonas oryzae* pv. *oryzae* වල ව්‍යාධිජනක ආකාරයේ විවිධත්වය හඳුනාගැනීම.

## කීට විද්‍යාව

- කළුතර දිස්ත්‍රික්කයේ වී වල ගොයම් කඳ විදින්නන් සහ ගොයම් කොළ හකුලන්නන් සඳහා ස්වභාවික පරපෝෂිතතාව අධ්‍යයනය.
- දුඹුරු පැළ කීඩාවා හා පැළ මැක්කාගේ හානියට ඔරොත්තු දෙන වී ආර පරීක්ෂා කිරීම

## පාංශු පෝෂක කළමනාකරණය

- පහතරට තෙත් කලාපයේ වැඩෙන වී වලට පෝෂණ කළමනාකරණ පද්ධතියේ දීර්ඝ කාලීන භාවිතයේ බලපෑම විශ්ලේෂණය
- ධාන්‍ය අස්වැන්න සහ වී වල සින්ක් සංචිතය කෙරෙහි සින්ක් ලබා දීමේ විවිධ ක්‍රමවල බලපෑම
- පහතරට තෙත් කලාපයේ ගොයම් පැළ වැඩීම කෙරෙහි නව පොහොර වර්ග විශ්ලේෂණය
- තිරසාර වී නිෂ්පාදනයක් සඳහා ස්ථාන විශේෂිත පොහොර වර්ග විශ්ලේෂණය
- තිරසාර වී නිෂ්පාදනයක් සඳහා ස්ථාන විශේෂිත පොහොර කළමනාකරණ පද්ධතියක් ගොඩනැගීම
- ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ස්ථාන විශේෂිත පොහොර නිර්දේශකරණයට පාංශු පරීක්ෂා කිරීමේ වැඩසටහන පවත්වාගෙන යාම

## ජල කළමනාකරණය

- නිර්වායු ප්‍රරෝහණ ලක්ෂණ සහිත වී ගහණ ඇගයීම
- පහතරට තෙත් කලාපයේ යන්ත්‍රානුසාරයෙන් සිටුවන ලද වී වගාවෙහි බලවේග වල්පැළ නෙළනය මගින් පලිබෝධ පාලනය කෙරෙහි ජල කළමනාකරණයෙහි බලපෑම අධ්‍යයනය

# වී පර්යේෂණ ස්ථානය - බෙන්තොට

පහතරට තෙත් කලාපයේ හි පිහිටා ඇති බෙන්තොට වී පර්යේෂණ ස්ථානය (RRS), බෝඹුවල පිහිටි RRRDC හි උප මධ්‍යස්ථානයකි. ගංවතුර තත්ත්වයනට නිරන්තරයෙන් පත්වන සහ ලවණතාවෙන් අධික ප්‍රදේශවල වී වගාව සඳහා තාක්ෂණය වැඩිදියුණු කිරීම කෙරෙහි මෙම ආයතනය මගින් වැඩි අවධානයක් යොමු කෙරේ.

## ප්‍රගතිය

### පර්යේෂණ

අඩු මිල දහයියා වගා මාධ්‍යයෙහි වර්ධනය වන පොස්ෆේට් ද්‍රාවණය කළ හැකි මූල ගැටිති දිලීර වෙන් කොට පොස්පරස් ජෛව පොහොරක් වශයෙන් සංවර්ධනය කරන ලදී. මෙම ජෛව පොහොර එක් කිරීමෙන් වී අස්වැන්න ඉහළ යන්නේ දැයි පරීක්ෂා කරන ලදී.

ජෛව පොහොර හි ජීව කාලය අධ්‍යයනය කිරීමේ දී මාධ්‍යය තුළ පොස්පරස් ද්‍රාවක දිලීරවලට මාස 6ක ජීව කාලයක් පැවති බවත් එම කාලය ශීතකරණ තත්ත්වය යටතේ දී ($8^0C$) තවදුරටත් දීර්ඝ කර ගත හැකි බවටත් නිරීක්ෂණය විය.

වී මූල ගෝලයෙන් නිස්සාරණය කරන ලද පොස්පේට් ද්‍රාවක රයිසොබැක්ටීරියා වර්ග තුනක් බහු ගුණනය කිරීම සඳහා ලාභදායි උචිත මාධ්‍යයක් හඳුනාගැනීමට පරීක්ෂණ සිදු කරන ලදී. පොස්පේට් ද්‍රාවක රයිසොබැක්ටීරියා බහුගුණනය සඳහා බත් කැඳ සහ පොල් වතුර අඩංගු මාධ්‍යය යොදා ගත හැකි බව හඳුනා ගන්නා ලදී.

උස් බිම් වල වගා කිරීම සඳහා සුදුසු ප්‍රවේණි දර්ශ හඳුනා ගැනීමට පරීක්ෂණයක් මෙහෙයවන ලද අතර Aeron 9-3 සහ Aeron 20-25 යන වී ආර දෙක සුදුසු ප්‍රවේණි දර්ශ ලෙස හඳුනා ගන්නා ලදී. NCRVT වැඩටහන යටතේ බලාපොරොත්තු තැබිය හැකි විවිධ වයස් කාණ්ඩවලට අයත් වී ආර පරීක්ෂා කරන ලද අතර මාස 3 ½ කාණ්ඩය යටතේ Ld 11-7315 ගුණාත්මක වී ප්‍රභේදයක් විය. At 13-3048 සහ At 13-3791 පරීක්ෂා කරන ලද අනෙකුත් මාස 3 ½ වයස් කාණ්ඩයේ වී ආර වලට වඩා ඉහළ අස්වැන්නක් පෙන්නුම් කළේය.

### බීජ නිෂ්පාදනය

ඉකුත් වසරේ දී වී ප්‍රභේද 7කට අයත් වාණිජ බීජ කිලෝ ග්‍රෑම් 2,608ක් නිෂ්පාදනය කරන ලදී.

### තාක්ෂණය ව්‍යාප්ති කිරීම

- විවිධ ආයතනවලින් සංවිධාන කරන ලද ක්ෂේත්‍ර දින සහ ප්‍රදර්ශන සඳහා නිලධාරිහු සම්පත් දායකයන් වශයෙන් සහභාගි වූහ.
- ආයතනය වෙත පැමිණි ගොවීන් හට උපදෙස් සහ තොරතුරු ලබා දෙන ලදී.
- පුහුණු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු
- සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දෙමුහුම් වී විස්තීර්ණ තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව 10.5.2017 - 07.08.2017, වැන්ග්ෂුආ, චීනය

## 2018 වසර සඳහා සැලැස්ම

- NCRVT සහ VAT වැඩසටහන යටතේ වී ආර ඇගයීම.
- වී වගාව සඳහා පොස්පරස් සහ නයිට්‍රජන් ජෛව පොහොර හඳුන්වා දීම.
- හිතකර පාංශු ක්ෂුද්‍ර ජීවීන් කෙරෙහි පළිබෝධනාශක වල බලපෑම අධ්‍යයනය
- සෝර්ජාන් වගා ක්‍රමය සඳහා නව බෝගවල උචිතතාව පරීක්ෂා කිරීම
- සෝර්ජාන් වගා ක්‍රමය සඳහා කාර්යක්ෂම වල් පැළ පාලනයක් හඳුනා ගැනීම
- ජලයෙන් යටවීමට සහ ලවණතාවයට ඔරොත්තු දෙන වී ආර පරීක්ෂා කිරීම
- Bg 455, Bw 372 සහ Bw 367, Bg 252 සුවඳැල් සහ Bg 38හි වාණිජ බීජ නිෂ්පාදනය

## කාර්ය මණ්ඩලය

### කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, බෝඹුවල

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ( කෘෂිකර්ම පර්යේෂණ) | 06 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 05 |
| සංවර්ධන නිලධාරී | 01 |

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| කෘෂිකර්ම උපදේශක | 06 |
| පර්යේෂණ සහකාර | 13 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 06 |
| ගොවිපළ ලිපිකරු | 01 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| රියදුරු | 04 |
| මුරකරු | 04 |
| කම්කරු (ස්ථිර) | 44 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 13 |
| **එකතුව** | **107** |

## වී පර්යේෂණ ස්ථානය, බෙන්තොට

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂිකර්ම පර්යේෂණ) ස්ථාන භාර | 01 |
| සංවර්ධන නිලධාරි | 01 |
| කෘෂිකර්ම උපදේශක | 03 |
| පර්යේෂණ සහකාර | 02 |
| තාක්ෂණ සහායක | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| රියදුරු | 01 |
| මුරකරු | 02 |
| කම්කරු (ස්ථිර) | 08 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 12 |
| **එකතුව** | **33** |

# 1.5. ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය - පේරාදෙණිය

තිරසර පිළිවෙතකින් ජාතික කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීමෙහිලා විද්‍යාත්මක පදනමකින් යුතුව භූමිය සහ ජලය යන සම්පත් ප්‍රශස්ථ අන්දමින් භාවිතයට ගැනිමේ කාර්ය භාරය උසුලන්නේ ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයයි. ජනගහනය වර්ධන වේගය හා බෑදුණු ඉඩම් පරිහරණ රටාවේ පරිවර්තනයන් පාංශු හා ජල සම්පත් ගුණාත්මක ලෙසත් ප්‍රමාණාත්මක ලෙසත් හීන කරලීමට හේතු වී ඇති අතර දේශගුණික විපර්යාස මෙන්ම එහි අත්‍යන්ත තත්ත්ව එකී සම්පත් මත අතිරේක අහිතකර බලපෑමක් සිදු කර තිබේ. මෙම සාධක පාංශු ඛාදනය, පස නිසරු වීම, ලවණීකරණය, කෘෂිකර්මාන්තය සඳහා ජලයේ උපයෝජ්‍යතාව හීන වීම සේ ම පස සහ ජලය දූෂණය වේගවත් කරයි. එබැවින් ස්වභාවික සම්පත් විශේෂයෙන්ම පස හා ජලය යන සම්පත් සංරක්ෂණය කරන අතරතුර අධිකරණමය උපයෝගිතාව ඉලක්ක කර ගත් ශිල්පීය ක්‍රම ගොඩනැංවීම අත්‍යවශ්‍ය කාර්යයක් වී තිබේ.

මධ්‍යස්ථානයේ ප්‍රධාන පර්යේෂණ විෂය පථයට අයත් වන්නේ පාංශු සංරක්ෂණය සහ ජලාධාරක කළමනාකරණය, භූමියේ ගැළපීම විශ්ලේෂණය, කෘෂි - කාලගුණ විද්‍යා සහ දේශගුණ විපර්යාස, භූ තොරතුරු විද්‍යාව සහ දුරස්ථ සංවේදනය, පසේ හා ජලයේ ගුණාත්මකභාවය විශ්ලේෂණය මෙන්ම ගොවිපළ ජල කළමනාකරණය ලෙස පුළුල් පරාසයක් ගනියි. පාංශු සංරක්ෂණ පනත ක්‍රියාවට නැංවීම, දිවයින තුළ කෘෂි කාලගුණ විද්‍යාත්මක නිරීක්ෂණ ජාලය නඩත්තු කිරීම, තාක්ෂණය බෙදා හැරීම සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් පුද්ගලයන්ගේ නොයෙක් සංවර්ධන ව්‍යාපෘති සඳහා අදාල වන තාක්ෂණික සහාය සැපයීමයි.

## අයවැය

**වගු අංක 1.5.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 3,352,649 | 3,266,354 | 97 |
| මූලධන | 8,887,000 | 8,499,519 | 96 |
| ව්‍යාපෘති | | | |
| • පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම | 5,000,000 | 4,964,000 | 99 |
| • ජාතික කෘෂිකර්ම පර්යේෂණ වැඩසටහන (NARP) | 225,000 | 220000 | 98 |
| • ජාතික ආහාර වැඩසටහන (NFPP) | 21,600,000 | 17,859,000 | 83 |
| **එකතුව** | **39,064,649** | **34,808,873** | **89** |

## ප්‍රගතිය

### පර්යේෂණ

### නිශ්චිත කාල පරතරවලින් දිගු කාලීන දේශගුණ අනාවැකි නිකුත් කිරීම

එළැඹෙන මාසවල පැවතිය හැකි කාලගුණ තත්ත්වය පිළිබඳ විස්තර කරමින් වසර පුරාම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි, නිශ්චිත කාල පරතරවලදී කාලගුණ අනාවැකි නිකුත් කරන ලදී. එ පරිදි ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා මාර්ගගත ක්‍රමයට, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මෙන් ම තාක්ෂණික චක්‍රලේඛ ඔස්සේ අදාළ පාර්ශ්වකරුවන් වෙත ලැබෙන සේ මෙම වාර්තා බෙදා හැරිණි.

### බෝග කළමනාකරණය සඳහා තීරණ ගැනීමේ මෙවලමක් වශයෙන් කාලගුණය මත පදනම් වූ සංඥා පද්ධතියක් හඳුන්වා දීම

කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද කෘෂිකාර්මික වැදගත්කමකින් යුත් හදිසි කාලගුණ වෙනස්වීම් කෘෂිකාර්මිකව අර්ථදායි සහ වැදගත් කෙටි පණිවුඩ පාඨයක් බවට පරිවර්තනය කෙරේ. මෙම පණිවුඩ NAICC මගින් ලියාපදිංචි පුද්ගලයෝ වෙත යැවෙති. කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන යන අංශ දෙකෙන්ම ලියාපදිංචි පුද්ගලයන් සංඛ්‍යාව මේ වන විට 2,000 ඉක්මවා ඇත.

### එළවළු, පළතුරු සහ වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව සඳහා අවකාශිය සහ කාලීන විභව්‍යතාව හඳුනාගැනිම

ශ්‍රී ලංකාව අනේක විධ ස්වභාවික සම්පත්වලින් ගහණය වූ රටක් වන අතර කෘෂි ආර්ථික විවිධත්වය ඉන් එකකි. එසේ වුව ද ආහාර බෝග නිෂ්පාදන විවිධත්ව විභව්‍යතාව වැඩි කිරීමට අතීතයේ සිටම නන් අයුරින් ප්‍රයත්න දරා ඇති නමුදු රටෙහි කෘෂිකාර්මික නිෂ්පාදනතාව ඉහළ නැංවීම සඳහා මෙම විභව්‍යතාවය උපයෝජනය කිරීමට ප්‍රමාණවත් අවධානයක් නොයෙදුණු ප්‍රදේශ වර්තමානයේ දී පවා හමුවෙයි. මීට අමතරව භූමිය ශීඝ්‍රයෙන් දූෂණය වීමත් සමග වර්තමානයේ දී වෙනස්වන සහ විචල්‍ය දේශගුණය ආහාර නිෂ්පාදන පරිශ්‍රමය කෙරෙහි අතිරේක තෙරපුමක් ඇති කොට තිබේ. එබැවින් අඛණ්ඩ ආහාර නිෂ්පාදනයක් තහවුරු කිරීම පිණිස අවාරයේ වගා කල හැකි ආහාර බෝග වගා කළ හැකි ප්‍රදේශ සහ ස්ථාන හඳුනාගනිමින් වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ පලතුරු නිෂ්පාදනය ඉහළ නැංවීමේ අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. අදාළ බෝගවලට සරිලන ප්‍රදේශ තෝරා ගැනීමේ දී දේශගුණය පස සහ භූමි ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කෙරිණි.

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස එළවළු සඳහා ස්ථාන 12ක් ද පලතුරු සඳහා ස්ථාන 05ක් ද වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා ස්ථාන 19ක් ද තෝරා ගන්නා ලදී. එළවළු සඳහා තෝරා ගනු ලැබූ භූමි භාග වනුයේ කෝන්ගහවෙල, අට්ටාපිටිය, හාගරාපිටිය, සැලගම, පට්ටන්පිටිය, නේතියගනේ, ලැමසූරිය, කීර්තිබණ්ඩාරපුර, පන්නල, මැල්සිරිපුර, දිද්දෙනිය සහ ගලේවෙල යන ප්‍රදේශයි. පලතුරු බෝග සඳහා නව ස්ථාන වශයෙන් දොඹගස්ලන්ද, පල්ලේපොළ, වාසලකෝට්ටේ, ගලේවෙල සහ දේවහුව වෙයි. අවාරයේ වැවෙන වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා තෝරා ගනු ලැබූ ප්‍රදේශ කහටගස්දිගිලිය, කටියාව, ඉපලෝගම, අතුන්ගම, නීරමුල්ල, ලබුනොරුව, ඇකිරියන්කුඹුර. වහව, නාගදීපය, පිටකුඹුර, ලොග්ගල් ඔය, ආඳාඋල්පත, ඇඹිලිපිටිය, කොළඹගේ ආර, එරමිණිය - (අඟුණකොළ පැලැස්ස), උඩවලවේ සහ ගන්නෝරුව හි පිහිටා ඇත.

## එල් නිනෝ හි දකුණුදිග දෝලනයෙහි බලපෑමත් සමඟ ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වර්ෂාපතන රටාවේ අන්තර් ඍතුමය වෙනස්වීම්

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වර්ෂාපතන ඍතු සතර මත ENSO අවස්ථාවන් හි බලපෑම අවබෝධ කර ගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදුකරන ලදී. වියළි කලාපය පුරා විසිරී ගිය ස්ථාන 11 කින් එක්රැස් කර ගත් 1976-2017 (පෙබරවාරි) දක්වා දෛනික වර්ෂාපතන කාල ශ්‍රේණි ඒ සඳහා යොදා ගන්නා ලදී. සාමුද්‍රික නිනෝ දර්ශකය (ONI) ඇසුරින් එම කාලය තුළ එල් නිනෝ සහ ලා නිනා වර්ෂ හඳුනාගත් අතර එම කාලය තුළ තෝරා ගනු ලැබූ වර්ෂාපතන රටාවන්හි මධ්‍යන්‍යය ශේෂ නිෂ්ක්‍රිය වර්ෂවල එම රටාවන් හා සංඛ්‍යාත්මකව සසඳා බලන ලදී. එල් නිනෝ වර්ෂ සහ වියළි කලාපයේ ප්‍රථම අන්තර් මෝසම් ඍතුව තුළ වර්ෂාපතනය අතර දැඩි සම්බන්ධතාවක් පවතින බව මෙහි දී අනාවරණ විය.එය එතරම් වැදගත් නොවුව ද, වියළි කලාපයේ එල් නිනෝ වසර තුළ දැඩි වර්ෂාපතනයක් පවතින බව ප්‍රකට විය. එල් නිනෝ වසර තුළදී නිරිත දිග මෝසම් සමයෙහිදී වියළි කලාපයේ පැහැදිලිවම ඉහළ වර්ෂාපතනයයක් පවතිනු දක්නට ලැබිණි. වියළි කලාපයේ එල් නිනෝ වසරවල දෙවන අන්තර් මෝසම් ඍතුමය වර්ෂාපතනයෙහි ධනාත්මක විෂමතාවක් පෙන්නුම් කළ අතර ලා නිනා වර්ෂ සම්බන්ධයෙන් එහි ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් පැවතිණි. ප්‍රතිඵල මඟින් ඊසාන දිග මෝසම් වල ඍතුවල ලා නිනා වර්ෂවල පැහැදිලි ධනාත්මක විෂමතාවක් පෙන්නුම් කෙරුණු අතර ඊසාන දිග මෝසම් ඍතුවල එල් නිනෝ වර්ෂ තුළ වැඩි වියළි තත්ත්වයක් පෙන්නුම් කරන ලදි.

## ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ආක්‍රමණික විශේෂවල විශේෂ ව්‍යාප්ති අනුරූපණ භාවිතයෙන් ඉහළ - අවදානම් කෘෂි - පාරිසරික කලාප හඳුනා ගැනීම

*Mimosa pigra, Annona glabra, Lantana camara, Prosopis juliflora* සහ *Parthenium histerophorus* යනාදිය කෘෂිකාර්මික හා ආහාර සුරක්ෂිතතාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ආක්‍රමණික ශාක ගණයෙහි ලා සැලකේ. කාලීන පාලනයක් සහ කළමනාකරණ පියවරයන් සඳහා භූමි කළමනාකරුවන්ට මෙම විශේෂවල විභව ප්‍රදේශ ලබා ගත නොහැකි විය. මෙම අධ්‍යයනය මඟින් මැක්සෙන්ට් ආදර්ශය භාවිතයෙන් වත්මන් දේශගුණික විපර්යාසයන් යටතේ මෙම ආක්‍රමක විශේෂ සඳහා සුදුසු දේශගුණික ප්‍රදේශ අනුරූපණය කෙරිණි. එක් එක් විශේෂයෙහි ආදර්ශ පුරෝකථනයක් සඳහා ඉහළ ප්‍රතිචාරාත්මක විචල්‍යතා මෙම අධ්‍යයනය තුළින් හඳුනාගන්නා ලදි. සලකා බලන ලද විශේෂ 5 කට ඉහළ අවදානම් කෘෂි ආර්ථික පාරිසරික කලාප සහ ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප මත මැක්සන්ට් (Maxent) පුරෝකථන අතිපිහිත විය. ප්‍රතිඵල වන සිතියම්, ආක්‍රමනික විශේෂ පාලනය හා කළමනාකරණය සඳහා තොරතුරු පාදක කරගත් තීරණ ගැනීම පිණිස භූමි කළමනාකරුවන්ට ඉතා වැදගත් මෙවලමක් වනු ඇත. අධ්‍යයනය අවසන් කරන ලද අතර පර්යේෂණ පත්‍රිකාව පළ කර තිබේ.

## අවකාශීය ප්‍රතිගමන ආදර්ශන ශිල්පක්‍රම භාවිතයෙන් ශ්‍රී ලංකාවේ ජාතික පාංශු කාබනික කාබන් සිතියම ගොඩනැඟීම

පාංශු කාබනික කාබන් (SOC) යනු ගෝලීය වශයෙන් පිළිගනු ලැබූ ප්‍රධාන තිරසාර දර්ශකයකි. රසායනික, භෞතික හා ජෛවවිද්‍යාත්මක ලක්ෂණ වර්ධනය කරනු ලබන බැවින් SOC පසේ සාරවත්භාවයට ද වැදගත් වේ. ශ්‍රී

ලංකාවට අදාළ SOC ව්‍යාප්තිය ඉහළ විභේදන බලයක් (30m) සමඟින් ගෝලීය SOC සිතියම් දත්ත යාවත්කාලීන කිරීමට ආසියාතික පාංශු සහයෝගීතාවේ තාක්ෂණික මඟපෙන්වීම යටතේ උද්‍යානබෝග පර්යේෂණ මධ්‍යස්ථානයේ ඒකාබද්ධතාවයෙන් ශ්‍රී ලංකාවේ SOC සිතියම ගොඩනගන ලදි. SOC හි ද්විතියික අවකාශීය දත්ත (ස්ථාන 322ක) විවිධ මූලාශ්‍රවලින් ඒකරාශී කර ගන්නා ලද අතර සහවිචලනය, උන්නතාංශය, ප්‍රමාණකරණය කරන ලද වෘක්ෂලතා දර්ශකය (NDVI), බෑවුම, මාසික සාමාන්‍ය උෂ්ණත්වය සහ මාසික වර්ෂාපතනය වශයෙන් ගෙන ප්‍රතිගමනය උපදවන ප්‍රවේශය භාවිතයෙන් SOC සිතියම ගොඩනැගීම සඳහා පදනමක් ලෙස ද භාවිතා කරන ලදි. ශ්‍රී ලංකාවේ SOC සිතියම ගොඩනංවන අතර එහි වැඩිදුර තහවුරු කිරීම සහ නිරවද්‍යතා තක්සේරුකරණය 2018 වර්ෂයේ දී සම්පූර්ණ කිරීමට නියමිතය.

## නියං සහ ඉහළ උෂ්ණත්වවලට නැඹුරු කෘෂිකාර්මික ප්‍රදේශ හඳුනා ගැනීම සහ අනුවර්තනතා ක්‍රියාමාර්ග සඳහා අවකාශීය සහ සෘතුමය කෘෂි - පාරිසරික පරිසර වර්ගීකරණය

නියඟය යනු ස්වභාව ධර්මයේ සැඟවුණු ව්‍යසනයකි. එය බොහෝ විට හඳුන්වන්නේ "රූ රා යන ප්‍රපංචයක්" ලෙස වන අතර එහි බලපෑම කලාපයෙන් කලාපයට වෙනස් වේ. නියඟය ආරම්භය සහ අවසානය තීරණය කිරීම අපහසුය. නියං තත්ත්ව පවතින ප්‍රදේශවල කටයුතු කිරීමේදී කැපී පෙනෙන අන්දමේ ප්‍රවේශ දෙකකි. 1. ගතික ආකෘති සමග නිරන්තරයෙන් නියඟය තක්සේරු කිරීම සහ 2. ඓතිහාසික නියං තත්ත්ව ප්‍රවණතා සහ සංඛ්‍යාත මත පදනම්ව නියං අවදානම ඇති ප්‍රදේශ නිර්ණය කිරීම. දුරස්ථ සංවේදී චන්ද්‍රිකා දත්තවලින් ව්‍යුත්පන්න කරන ලද වෘක්ෂලතා දර්ශක මත පදනම්ව බෝග තත්ත්ව තක්සේරුකරණය භාවිතයෙන් නියං ප්‍රවණතාවක් ඇති ප්‍රදේශ සිතියම්කරණය කෙරෙහි මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කෙරිණ. නියං සංඛ්‍යාත තක්සේරුකරණය සහ නියං ප්‍රවණතාවක් ඇති ප්‍රදේශ සිතියම්කරණය සඳහා වසර 16 ක් (2001 සිට 2016) සඳහා කාල පරිච්ඡේද MODIS නිදහස් චන්ද්‍රිකා දත්ත භාවිතා කරන ලදි. ශ්‍රී ලංකාවේ නියං ප්‍රවණතා ප්‍රදේශ සිතියම ගොඩනඟන ලද අතර එය අවසන් කෙරෙමින් පවතියි. මෙම අධ්‍යයනය FCRDI හි "දේශගුණික තිරසර බෝග ප්‍රභේද සංවර්ධනය සහ ශ්‍රී ලංකාවේ වගා තාක්ෂණය ඔස්සේ ආහාර ආරක්ෂණය සහතික කරලීම" නමැති ජාතික පර්යේෂණ කවුන්සිලයේ (NRC) ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතියකි. ව්‍යාපෘතිය 2018 වසර දක්වා ක්‍රියාත්මක වේ.

## ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් GIS ප්‍රවේශයන් හරහා ආහාර නිෂ්පාදනයේ ජාතික ඇගයීම හා අධීක්ෂණය කිරීම

ශ්‍රී ලංකාව තුළ වගා කළ හැකි බෝග වගා කිරීම මගින් විදේශ විනිමය ඉතිරි කර ගැනීමත් වසර පුරා නිෂ්පාදනය තුළින් ජාතික ජනාධිපති ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් දියත් කරන ලද ජාතික වැඩසටහනක් වශයෙන් ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන හැඳින්විය. ග්‍රාම නිලධාරි මට්ටමින් වගා බිම් කාණ්ඩවල ආහාර නිෂ්පාදන ඉලක්ක සිතියම්කරණය බදුල්ල, හම්බන්තොට, කෑගල්ල, නුවර එළිය, පොළොන්නරුව සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවලට අදාළ ව සම්පූර්ණ කර ඇත.

## කන්නමය බෝග විවිධාංගීකරණය සඳහා ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ යෝග්‍ය කුඹුරු ඉඩම් හඳුනා ගැනීම

බෝග විවිධාංගීකරණය සඳහා ප්‍රධාන වාරි මාර්ග යටතේ ඇති කුඹුරු ඉඩම් හඳුනාගැනීම සඳහා ක්ෂේත්‍ර විමර්ශන සිදුකෙරිණි. ජලය හිඟ කන්නවලදී කුඹුරු ඉඩම්වල වෙනත් බෝග වගාව ඵලදායිතාවය ඉහළ නැංවීම හා එමගින් ගොවීන්ගේ ආදායම ඉහළනැංවීම සඳහා සාර්ථක පිවිසුමකි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පරාක්‍රම සමුද්‍රයේ වාරි යෝජනා ක්‍රමයෙහි නව නගර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කෙත්වතු යායෙහි සවිස්තරාත්මක පාංශු සමීක්ෂණයක් සහ අපවහන තක්සේරුකරණයක් සම්පූර්ණ කර ඇති අතර බෝග යෝග්‍යතා පංති පෙන්නුම් කරන සිතියම් ගොඩනගා අවසන්ය. OFC වගා ආදර්ශනය ස්ථාපනය කිරීමට නියමිත අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව 2018 වසර සඳහා පර්යේෂණ සිදු කිරීමට නියමිතය.

## වියළි කලාපයේ පාංශු ඛාදන උවදුරු තක්සේරුකරණය, ලාක්ෂණීකරණය සහ සිතියම්කරණය

වියළි කලාපයේ ඛාදන උවදුරු පිළිබඳ අවකාශීය තොරතුරු සීමා සහිත අතර මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ GIS යටතේ විශ්ව පාංශු හායන සමීක්ෂණය ඇසුරින් වියළි කලාපයේ පාංශු ඛාදන උවදුරු සිතියම ගොඩ නැංවීමයි. 1) ශාස්ත්‍රීය ග්‍රන්ථවල පළ කරනු ලැබ ඇති පාංශු සිතියම් සහ සෝදා පාළු අගයයන් භාවිතයෙන් පාංශු ඛාදනතාව (K) 2) NASA වෙබ් අඩවියෙන් ලබාගත් ASTER GDEM චන්ද්‍රිකා උන්නතාංශ දත්ත භාවිතයෙන් බෑවුම් සාධකය (SL) 3) එක් එක් භූමි - භාවිත පංතියක් සඳහා පළකරන ලද කළමනාකරණ සාධක නියම කළ 1:50000 ඩිජියල් භූමි පරිභෝජන සිතියම භාවිතයෙන් කළමනාකරණ සාධකය (P) 4) NDVI සහ C සාධකය අනුරූපණ ව්‍යුත්පන්න කිරීම මඟින් ලැන්ඩ් සැට් (Land Sat) (30m) 2015 චන්ද්‍රිකා දත්ත භාවිතයෙන් වෘක්ෂලතා ආවරණය (C) සාධකය ද ඇසුරින් සමස්ථ ශ්‍රී ලංකාව සඳහා පාරිසරික පාංශු ඛාදන සිතියම ගොඩනැංවූ අතර පෙර අත්හදා බලන ලද සමීක්ෂණ සමඟ වාර්ෂික වර්ෂාපතනය භාවිතයෙන් පාංශු ඛාදන සිතියම නිර්මාණය කරන ලදී.

## සබරගමුව පළාතේ පාංශු ඛාදන උවදුරු පාංශු ඛාදන උවදුරු තක්සේරුකරණය හා භූමි උපයෝගීතාවය සැළසුම් කිරීම සඳහා එය යොදා ගැනීම

පාංශු ඛාදනය යනු භූමිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන ගැටළුවකි. භූමි හායනය තක්සේරු කිරීම සහ එබඳු තීව්‍ර ලක්ෂණ හඳුනාගැනීම, තිරසාර භූමි කළමනාකරණයක් සඳහා පාංශු සංරක්ෂණ ප්‍රදේශ ප්‍රමුඛතාකරණය අවශ්‍ය වේ. එබැවින් ඛාදන උවදුරු සිතියම් සකස් කිරීම සහ ප්‍රාදේශීය පරිමාණයේ බෝග යෝග්‍යතාව විශ්ලේෂණය මධ්‍යම කඳුකරයේ භූමි හායනය අඩු කිරීම සඳහා අත්‍යවශ්‍යය. මධ්‍යම සහ ඌව පළාත්වල භූමි හායන තක්සේරුකරණය සිදු කර ඇතත් සබරගමුව පළාත සඳහා නිසි තක්සේරු කරණයක් සිදු කර නොමැත. එබැවින් මෙම පර්යේෂණයේ අරමුණ වූයේ සබරගමුව පළාත සඳහා භූමි හායන තත්ත්වතක්සේරුකරණය, ප්‍රාදේශීය පරිමාණයේ බෝග යෝග්‍යතාව විශ්ලේෂණය සහ සිතියම්කරණයයි. භූමි හායන තක්සේරුකරණය සඳහා භූ අවකාශයීය තාක්ෂණය සහ විශ්ව පාංශු හානි සමීකරණය (USLE) භාවිතා කරන ලදී. සබරගමුව පළාත සඳහා ඩිජිටල් උන්නතාංශ ආකෘතිය සහ විභව ඛාදන උවදුරු සිතියම පිළියෙල කරන ලදී. විභව ඛාදන සිතියම් මත අතිපිහිත වූ භූමි භාවිත/ භූමි ආවරණ සිතියම් මඟින් ඛාදන උවදුරු සිතියම් ව්‍යුත්පන්න කරන ලදී. සබරගමුව

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ ගොවි සම්මුඛ සාකච්ඡා ඇසුරින් ප්‍රශ්නාවලි සමීක්ෂණයක් සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ භාවිතයෙන් ඛාදන උවදුරු සිතියමෙහි නිරවද්‍යතාව තක්සේරුකරණය කරන ලදී. 61%ක භූමි ප්‍රමාණයක් අවදානම් ශ්‍රේණියේ පැවතිනි. මෙම ඛාදන ප්‍රවණතාවක් ඇති ප්‍රදේශ බහු වාර්ෂික පද්ධති තුළ උපයෝගී කරගත යුතු අතර එමගින් ඛාදනය අවම කරගත හැකිවේ.

## කෘෂිකාර්මික තොරතුරු ව්‍යාප්තිය සඳහා GIS වෙබ් ද්වාරයක්

GIS ඒකාබද්ධ කරමින් සහ දත්ත පදනම කළමනාකරණ පද්ධතියක් (DBMS) මගින් ගොඩනංවන වෙබ් පාදක පද්ධතිය GIS සහ DBMS තාක්ෂණයන් පිළිබඳ දැනුම නොමැතිව වුව ද භාවිතා කරුවන්ට භාවිතා කිරීමේ පහසුව සලසයි. තව ද විවිධ වූ භාවිතාකරුවන් අතර අවකාශයීය තොරතුරු හා තාක්ෂණික විශේෂඥතාව හුවමාරු කර ගැනීමට ඉඩ සැලසේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ කෘෂිකර්මාන්තය හා සම්බන්ධ දත්ත, තොරතුරු හා සිතියම් ගවේෂණය සඳහා වෙබ් අඩවි පදනම් කර ගත් අන්තර් ක්‍රියාකාරී තොරතුරු සහ සිතියම්කරණ ද්වාරයක් ගොඩනැංවීමයි. මෙම වෙබ් ද්වාරය නිපදවීම සඳහා QGIS මෘදුකාංගයෙහි විවෘත මූලාශ්‍රය යොදා ගැනේ. අත්හදා බැලීමක් වශයෙන් Arc GIS ගිණුමෙන් වෙබ් වෙබ් පහසුකමක් ගොඩනඟන ලද අතර එය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හා සම්බන්ධ කරන ලදී. (www.agridept.gov.lk /බෝග යෝග්‍යතාව / වෙබ් GIS පහසුකම). මීට අමතරව මෙම වෙබ් පහසුකම ජාතික ඩිජිටල් යටිතලපහසුකම (NSDI) සහ ශ්‍රී ලංකා ICT නියෝජ්‍යායතනය හා සම්බන්ධ කෙරෙනු ඇත.

## ශ්‍රී ලංකාවේ පාංශු ඛාදන සිතියම සහ භූමි හායන උවදුරු සිතියම් පුනර්කථනය කිරිම සඳහා වර්ෂාපතන තීව්‍රතා විෂමතාවන් හඳුනාගැනීම

භූමි හා ජල සම්පත් කළමනාකරණය සඳහා දේශගුණික වෙනස්වීම හා භූමිය මත එහි බලපෑම පිළිබඳ අවබෝධය ඉතා වැදගත් වේ. ශ්‍රී ලාංකික සන්දර්භය තුළ වර්ෂාපතන රටාවේ වෙනස්වීමක් වාර්තාවන අතර එය අධික වර්ෂාපතන තත්ත්වවල වැඩිවීමක් ලෙස පෙන්නුම් කළද වාර්ෂික මුළු වර්ෂාපතනයේ පැහැදිලි වෙනසක් වාර්තා නොකරයි. ඒ අනුව වැසි සහිත තත්ත්වවලදී අධික වර්ෂාපතනයක් බලාපොරොත්තු විය හැක. එබැවින් මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වර්ෂාපතනයේ පාංශු ඛාදන බලයෙහි වත්මන් වෙනස්කම් සමඟ වර්ෂාපතන ඛාදනතා සිතියම යළි සකස් කිරීමත් 1980 වසරේ දි සහ වර්තමානයේ දී වර්ෂාපතන ඛාදනතාවය සංසන්දනය කිරිමත් ශ්‍රී ලංකාවේ වර්ෂාපතන තීව්‍රතාවයට සාපේක්ෂව භූමි හායනයෙහි වෙනස්කම් හඳුනාගැනීමත් ය. කෘෂි - කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 18 ක වසර 20 කට අදාළ වර්ෂාපතන දත්ත ලබා ගන්නා ලද අතර විකරණය කරන ලද ෆර්නියර් අනුක්‍රමණය ක්‍රමය යටතේ දත්ත විශ්ලේෂණය කරන ලදී. මෙම පර්යේෂණය අඛණ්ඩව සිදුකෙරේ.

## ශ්‍රී ලංකාවේ ප්‍රධාන බෝගවගා පරිසර සඳහා තිරසර සාරවත් බව කළමනාකරණ උපක්‍රම (භෞතික, රසායනික, ජෛව විද්‍යාත්මක) සංවර්ධනය

ශ්‍රී ලංකාවේ සෑම පරිපාලන දිස්ත්‍රික්කයකම ප්‍රධාන ආහාර නිෂ්පාදන ගොවිතැන් පද්ධතියෙහි දැනට පවතින පාංශු සාරවත්භාවය හඳුනාගැනීමට 2016 වසරේ දි ක්ෂේත්‍ර සමීක්ෂණයක් සිදු කරන ලද අතර 2017 වසරේ දී ද එය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. තිරසාර සාරවත්

බව කළමනාකරණ උපක්‍රම (භෞතික, රසායනික සහ ජෛවවිද්‍යාත්මක) සඳහා එක් එක් ගොවිතැන් පද්ධතියෙහි පාංශු නියැදි සහ මතුපිට සහ භූ ගත ජල නියැදි හා ගොවීන්ගේ අදහස් එක් රැස් කර ගන්නා ලදී. 2016 සහ 2017 වසරේ දී දිස්ත්‍රික්ක 14 ක ගොවිපළ පද්ධති 33 ක තොරතුරු රැස් කෙරිණ. (අනුරාධපුර, බදුල්ල, කොළඹ, ගාල්ල, ගම්පහ, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, නුවරඑළිය, පුත්තලම සහ රත්නපුර). සංවර්ධිත තිරසාර සාරවත්භාවය කළමනාකරණ උපක්‍රම වුයේ ලවණතාවයෙන් බලපෑම් සිදු වූ තත්ත්ව ප්‍රතිෂ්ඨාපනය සඳහා දිය බරිත ප්‍රදේශවල ප්‍රමාණවත් තරම් ද්‍රාව්‍ය ලවණ ක්ෂිරණය වීමට සැලැස්වීම, ජලාධාරක භූමි සඳහා පාංශු සහ ආර්ද්‍රව සංරක්ෂණ ක්‍රම යොදා ගැනීම, කෘෂි ළිං පාදක කරගත් යෝග්‍ය වාරිමාර්ග භාවිතාවන් යොදා ගැනීම, නිර්දේශිත පොහොර අඛණ්ඩව භාවිතා කිරීම වෙනුවට පිදුරු ප්‍රතිචක්‍රීයකරණය, ගොවිපල වාරිමාර්ග තාක්ෂණය සම්බන්ධයෙන් කාර්යක්ෂම උපයෝගය, මුහුදු ජලය රට තුළට ඇතුළු වීම වැළැක්වීමේ හා ගංවතුරින් ආරක්ෂාවීමේ බාධක සවිකිරීම, පවතින පාංශු ගැටළුවලට ප්‍රතිරෝධී සුදුසු සහල් ප්‍රභේද වගා කිරීම, කුඹුරුවල යල කන්නයේදී වගා කෙරෙන වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා කාර්යක්ෂම වාරිමාර්ග භාවිතාවන් උපයෝජනය, වැලි පසෙහි පෝෂක ක්ෂය - වීම පාලනය සඳහා රසායනික පොහොර කොටස් වශයෙන් උෂ්ණත්ව ඉහළයාම පාලනය සඳහා Regosols වල උෂ්ණත්වය ඉහළයාම පාලනය සඳහා පස මතුපිට නිරන්තරයෙන් තෙත් කිරීම යනාදියයයි. දිවයිනෙහි අනෙකුත් දිස්ත්‍රික්කද ආවරණය කිරීම පිණිස මෙම පර්යේෂන 2018 වසරේදීද සිදු කෙරේ.

**සංරක්ෂණය සඳහා බරපතල ලෙස ජලය බැස යන ප්‍රදේශ හඳුනා ගැනීමට ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ ප්‍රධාන ජල මාර්ගවල ජලයේ ගුණත්වය පාලනය කිරීම**

2014 වසරේ සැප්තැම්බර් මස දී මෙම අධ්‍යයනය ආරම්භ කෙරුණ අතර මහවැලි ගං ද්‍රෝණියේ ඉහළ පෝෂක ප්‍රදේශයේ ප්‍රධාන ගංගාවේ ස්ථාන 9ක් සහ තොරාගත් අතු ගංගාවල ස්ථාන 16ක් පරීක්ෂාවට ලක් කරන ලදී.ජල නියැදි මාසිකව රැස් කර ගන්නා ලද අතර pH, EC සහ පාරදෘශ්‍යතාව සඳහා පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ දී පරීක්ෂණ සිදු කරන ලදී. ප්‍රතිඵල අනුව අතු ගංගා ප්‍රධාන නදියෙන් ලබා ගෙන පරීක්ෂා කරන ලද ජල නියැදි 900 කින් 34 % බීමට සුදුසු පාරදෘෂ්‍යතා මට්ටම (8 NTU) ඉක්මවා තිබෙන අතර ජල නියැදිවලින් 69 % ක් pH 7.0 ට වැඩි භාෂ්මිකතා අගයක් පෙන්වා ඇත. ජල නියැදිවලින් 88 % ක් පහළ ලවණතා මට්ටමක (< 0.25 dS/m) තිබුණි. තව ද මාස 8ක් තුළ පාරදෘශ්‍යතාවයේ මාසික මධ්‍යයනය ප්‍රධාන නදිය හා සැසඳීමේ දී සාපේක්ෂවඉහළ අගයක් ගත් අතර ප්‍රධාන නදියෙහි සහ අතු ගංගාවල අධ්‍යයන කාලය තුළ පාරදෘශ්‍යතාවයේ මධ්‍යනාය පිළිවෙලින් 17 සහ 12 NTU විය. ඊට පරස්පර වශයෙන් තෙත් කලාපයේ මාස 9ක් තුළ pH අගයේ මාසික මධ්‍යනාය සාපේක්ෂව ඉහළ වූ අතර මාස 11ක් තුළ EC හි මාසික මධ්‍යනාය ප්‍රධාන නදිය හා සැසඳීමේ දි අතු ගංගාවල ඉහළ අගයක් පෙන්නුම් කළේ ය. අධ්‍යයන කාල සීමාවේ දී pH අගයේ මධ්‍යනාය 6.9 ක් සහ 7.2 ක් වූ අතර EC අගය ප්‍රධාන නදිය හා අතු ගංගාවල පිළිවෙලින් 0.083ක් සහ 0.109 dS/m ක් විය. මෙම අධ්‍යයනය තුළින්, විශේෂයෙන්ම නාගරික පරිසර තුළ ප්‍රධාන ගංගාවට සෘජුවම පස් බැහැර කිරීම ජලයේ භෞතික

පාරදෘෂ්‍යතාව කෙරෙහි බලපාන බව අනාවරණ විය. තවද, ලවණතාව, භාෂ්මිකතාව සහ ද්‍රාවිත ඝනවලට සාපේක්ෂව ජලයේ පවිත්‍රතාව අතු ගංගාවල මෙන්ම ප්‍රධාන ගංගාවෙහි ද සතුටුදායක මට්ටමක පැවතිණි. ජලයේ ගුණාත්මක තත්ත්වය දිගු කාලීනව පරීක්ෂා කිරීම සඳහා මෙම අධ්‍යයනය 2018 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක වෙයි.

### ගොවිතැන් පද්ධතිවල ජෛව විවිධත්වය වැඩි දියුණු කිරීම සඳහා පාංශු සහ ජල සංරක්ෂණය සහ දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීම

ගොවිපළ තුළ නියමු අධ්‍යයනයක් 2014 වසරේ දී ආරම්භ කරන ලද අතර ගොවිපළ පද්ධතියෙහි පාංශු සහ ජල සම්පත් සංරක්ෂණයේ අගය ආදර්ශනය සඳහා එතැන් සිට එම අධ්‍යයනය සිදු කර ගෙන යන ලදී. තෝරා ගනු ලැබූ ගොවිපළ පද්ධති වන්නේ උඩුදුම්බර ප්‍රදේශයේ මහනුවර වන උයන (මැදරට අන්තර්මධ්‍ය කලාපය) ගිරිබාව ප්‍රදේශයේ ගෙවතු සහ ජල පෝෂක උස් බිම් (පහතරට වියළි කලාපය) සහ මිල්ලනිය ප්‍රදේශයේ ඔවිට බිම් සහ ගෙවතු (පහතරට තෙත් කලාපය) යනාදියයි. සම්පත්වල ගුණාත්මකභාවය නිගමනය කිරීම සඳහා මතුපිට පස්, මතුපිට ජලය සහ භූගත ජලය එක් රැස් කර ගන්නා ලදී. ඊට අමතරව, විවිධ ගම්මානවල පාංශු සහ ජල සංරක්ෂණ කටයුතු සඳහා යෝග්‍ය තාක්ෂණික ක්‍රම පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමට 2016 හා 2017 වසරේ දී ක්ෂේත්‍ර ආදර්ශන 10 ක් ස්ථාපනය කෙරිණ. කළුගල 3 ක් ද පඩුපොළ 1 ක්ද ගම්පොළ 3 ක්ද වන්නිකුඩාවැව 2 ක් ද පහළ ගිරිබාව 1 ක් ද බෙල්ලන්තුඩාව 1 ක් ද වශයෙන් එම ආදර්ශන ස්ථානගත කෙරිණ. ක්ෂේත්‍ර ආදර්ශන මත පදනම්ව පසුගිය වසර 2 තුළ ක්ෂේත්‍ර දින 7 ක් පවත්වන ලදී. මෙය 2018 වසරේ දි ද ක්‍රියාත්මක කිරීමට නියමිතය. තවද, වගා බිම්වල පසේ සාරවත්භාවය තක්සේරුකරණය පදනම් කර ගත් ක්ෂේත්‍ර නිරීක්ෂණය සඳහා සටහනක් ගොඩනංවන ලද අතර එය ස්වකීය වගාබිම්වල පසේ සාරවත්භාවය සරලව තක්සේරු කර ගැනීම මගින් ගොවීන්ට ප්‍රතිලාභ අත්කර ගැනීම පිණිස විය.

### කෘෂි ළිං පද්ධතිවල ජල ඵලදායිතාව ඉහළ නැංවීම

2016 වසරේ දී ආරම්භ කරන ලද මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ කෘෂි ළිං පද්ධතියෙහි උපයෝජිත වාරි ජල සැපයුම් ක්‍රමවල වත්මන් තත්ත්වය හඳුනා ගැනීමේ සහ ජල සුරැකුම් ක්‍රමවල ගොවි අනුවර්තනතා මට්ටම් තක්සේරුකරණය කිරීමයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෘෂි ළිං ගොවිපළ පද්ධති යටතේ ජල පෝෂක උස් බිම් අළලා මෙම අධ්‍යයනය සිදු කරන ලදි. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාප සතරක ව්‍යුහගත ප්‍රශ්නාවලියක් ඒ සඳහා යොදා ගන්නා ලදී. 2017 වර්ෂයේ දී උතුරු-මැද පළාතේ ගොවීන් 63 ක් ද වයඹ පළාතේ ගොවීන් 18 ක්ද තෝරා ගෙන පුහුණුව ලබා දීමෙන් අනතුරුව 0.25 ac ක් සඳහා සුදුසු විසිරි ජල වහන කට්ටල බෙදා දෙන ලදි. රජයේ නිලධාරීන් 200කට පුහුණුව ලබා දෙන ලදී. ඉතිරි වැඩ ප්‍රමාණය 2018 වසරේ දි සම්පූර්ණ කිරීමට නියමිතය

### න්‍යෂ්ටික තාක්ෂණය භාවිතයෙන් ජලාධාරක ප්‍රදේශවල පාංශු ඛාදනය තක්සේරු කිරීම

විවිධ භූමි පරිහරණ විධි යටතේ කෘෂි පාරිසරික කලාපවල පාංශු ඛාදන තත්ත්ව පිළිබඳ තොරතුරු අඩු වීම පාංශු සංරක්ෂණ වැඩසටහන් සාර්ථකව ක්‍රියාවට නැංවීමට ඇති ප්‍රධාන අවාසිදායක තත්ත්වයයි. පාංශු සංරක්ෂණය සඳහා දැනට නිර්දේශ කර ඇති පිරිවිතර තරමක් පැරණි වන අතර වෙනස්වන සුළු දේශගුණික තත්ත්ව යටතේ රටේ භූමි හායනය සාර්ථක ලෙස අවම කිරීමට මෙම

නිර්ණායක ප්‍රතිශෝධනය කළ යුතු ය. 137C සහ 210Pb යන විකිරණශීලී සමස්ථානික භාවිතයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පේඩිකුලම ප්‍රදේශයේ තෝරාගත් දියබස්නාවල පාංශු ඛාදනය තක්සේරු කරන ලදී. කොළඹ පරමාණුක ශක්ති මණ්ඩලයේ දි මෙම නියැදි විශ්ලේෂණය කෙරෙමින් පවතියි. මෙම අධ්‍යයනය 2018 වසරේ දී ද ක්‍රියාත්මකයි.

## පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම (SC පනත)

පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් NRMC විසින් දරනු ලැබේ. මේ යටතේ සිදුකෙරෙන ක්‍රියාකාරකම් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල ඒකාබද්ධතාව තුළින් සිදු කෙරේ.වසර තුළ දී මධ්‍යම, සබරගමුව සහ ඌව යනාදී පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු විසින් රු. මිලියන 1.5 බැගින් වෙන් කර තිබුණි. නිසි පාංශු සංරක්ෂණ ක්‍රම/ ව්‍යුහ ක්ෂුද්‍ර ජල බස්නා ගොවි ක්ෂේත්‍රවල ස්ථාපනය කරන ලදී. සංරක්ෂණ වපසරිය තුළ තනි ආදර්ශන ස්ථාපනය කිරීමට වඩා ක්ෂුද්‍ර පෝෂක ස්ථාපනයට ප්‍රමුඛත්වයක් ලබා දෙන ලදි. වැඩසටහන තුළින් දිස්ත්‍රික්ක 7ම අක්කර 130ක් වූ ගොවි ක්ෂේත්‍ර ආවරණය කරන ලදී. ක්ෂුද්‍ර දිය බස්නා 12ක් සංරක්ෂණය කිරීමට අමතරව සබරගමුව පළාතේ තනි ආදර්ශන 12 ස්ථාපනය කරන ලදී. අනපේක්ෂිත කාලගුණික වෙනස්වීම් හේතුවෙන් වසර තුළ පාංශු සංරක්ෂණ ක්‍රමවලට අහිතකර තත්ත්වයක් උද්ගත වූ අතර භෞතික වශයෙන් 90% ක ප්‍රගතියක් අත් කර ගත හැකි විය. පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වෙන් කළ මුළු ප්‍රතිපාදනවලට සාපේක්ෂව අත්කර ගත් සමස්ථ මූල්‍ය ප්‍රගතිය 95% කි.

වියළි කලාපයේ (අනුරාධපුරය, පොළොන්නරුව හා මොණරාගල IP) බඩඉරිඟු වගා බිම් පාංශු සංරක්ෂණ බැම් යෙදීම මඟින් සාර්ථක ලෙස සංරක්ෂණය කරන ලදී. ජාතික ආහාර වැඩසටහන යටතේ නියමු ව්‍යාපෘතියක් වශයෙන් මෙම වසරේ දී අක්කර 150ක් සංරක්ෂණය කෙරිණ.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බීජ නිෂ්පාදන ගොවිපළවල්වල පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම

මෙම වසරේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගොවිපළවල, පර්යේෂණ ගොවිපළවල සහ සේවාස්ථ පුහුණු ආයතනවල සාර්ථක අන්දමින් පාංශු සංරක්ෂණ සැලසුම් සහ ක්‍රියාත්මක කිරීම් සිදු කෙරිණ. රජයේ බීජ ගොවිපළ සංරක්ෂණය සඳහා රු. මිලියන 3 ක් වෙන් කර ඇත. සීතා එළිය, මීපිළිමාන සහ කුණ්ඩසාලය බීජ ගොවිපළවල් මෙම වැඩසටහන යටතේ සංරක්ෂණය කරන ලද අතර එහි 100%ක භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය අත් කර ගත හැකි විය.

## පාර දෙපස පුවරු

පාංශු සංරක්ෂණයේ වැදගත්කම සහ එහි නීතිමය විධිවිධාන පෙන්නුම් කරමින් පාර දෙපස පුවරුසවි කිරීම පොදු ජනතාව අතර දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ ඵලදායි මාර්ගයක් බව පෙනී යයි. එබැවින් පාර දෙපස පුවරු 5ක් (ටොපෑස්, ඇල්ල, දුන්හිඳ, රොසැල්ල සහ උලපනේ) පාංශු සංරක්ෂණය පිළිබඳ අර්ථවත් නිමැවුමක් සහිත ස්ටිකරයක් යොදා අලුත්වැඩියා කරන ලදී.

## තාක්ෂණික ව්‍යාප්තිය සහ දැනුම කළමනාකරණය

### පාංශු හා ජල සංරක්ෂණය පිළිබඳ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්, ඉඩම් සංවර්ධනය, තිරසාර ඉඩම් කළමනාකරණය, පාංශු සංරක්ෂණ පනත වෙනත් අදාළ විෂය ක්ෂේත්‍ර පිළිබඳ පුහුණු කිරීමේ හා දැනුම්වත් කිරීමේ වැඩසටහන්

#### පුහුණු වැඩසටහන්

- “ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තු නිලධාරීන්” සඳහා පාංශු සංරක්ෂණ හා ඉඩම් සංවර්ධනය පිළිබඳ සිවු දින විශේෂ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන ගන්නෝරුව ISTI හි දි පවත්වන ලද අතර නිලධාරීහු තිස්එක් දෙනෙකු පුහුණු කරන ලදහ.
- ඌව පළාත් නිලධාරින් සඳහා බිඳුණුවැව සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ දි පුහුණු වැඩසටහන් 16ක් පවත්වන ලදී.
- මාතර දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම උපදේශක නිලධාරීන් සඳහා තෙලිජ්ජවිල පුහුණු මධ්‍යස්ථානයේ දී ද මොණරාගල දිස්ත්‍රික් කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා බිබිල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයේ දී ද පුහුණු වැඩසටහන් 16ක් පවත්වන ලදී.
- දියලුම, නිකපොත ගම්මානවල තෝරා ගනු ලැබූ ගොවීන්ට ගොවි නායකත්ව පුහුණුව ලබාදෙන ලදී.
- ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමේ ශිෂ්‍යයන්ට නවයාලතැන්න දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයේ දි ද පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- පාංශු සංරක්ෂණ පනත පිළිබඳ දැනුවත් කිරීමක් සමඟ පාංශු සංරක්ෂණය හා ඉඩම් සංවර්ධනය සඳහා නිලධාරීන් 130 ක් සහ ජාතික වෘත්තීය සිසුහු 34 ක් පුහුණු කරන ලදහ.
- පේරවත්ත, කොලබිස්ස, පන්විල, හඟුරන්කෙත වැලිකඩ, පිටවල සහ වත්තේගම යන ප්‍රදේශවල පාංශු හා ජල සංරක්ෂණ කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන් සහ මහවැලි අධිකාරියේ තෝරාගත් ගොවීන් සඳහා එක් දින වැඩසටහන් හයක් පැවැත්වීම. (පුහුණු කළ සමස්ථ සංඛ්‍යාව 246 කි.)
- ජාතික කෘෂි නිෂ්පාදන වැඩසටහන යටතේ බඩ ඉරිඟු වගා පුහුණු වැඩසටහන සඳහා අනුරාධපුරය, දිස්තික්කය, ඉපලෝගම, තිරප්පනේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම සහකාර අධ්‍යක්ෂ කොට්ඨාස, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ සහ මැදිරිගිරිය බඩඉරිඟු වගා කලාප සඳහා පාංශු හා ජල සංරක්ෂණ කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 14 ක් පැවැත්වීම. (ගොවින් 252ක් පුහුණු කරන ලදී.)
- කරපිංච සහ බිබිලේ කෘෂිකර්ම පාසල් සිසු සිසුවියන් සඳහා පාංශු පැතිකඩ, පස් වර්ග, පස හා ජල සංරක්ෂණය සඳහා වැඩසටහන් දෙකක් පැවැත්වීම (සිසුහු 87 දෙනෙක් සහභාගී වූහ.)
- විශ්වවිද්‍යාල සිසුන් සඳහා පාංශු පැතිකඩ විස්තරය, පාංශු හා ජල සංරක්ෂණය පිළිබඳ වැඩසටහන් දෙකක් පැවැත්වීම (සිසුන් 94 ක් සහභාගි වූහ)
- කළුතර දිස්ත්‍රික් තාක්ෂණික නිලධාරීහු පනස් දෙදෙනෙක් ඉඩම් සංවර්ධන හා පාංශු සංරක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ බෝම්බුවෙල ISTI හි පුහුණු කරන ලදහ.
- තෝරාගත් ගොවීන් 78 දෙනෙකු සඳහා පාංශු සංරක්ෂණය හා පාංශු සංරක්ෂණ පනත පිළිබඳ වටකැලේදී පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

- කුණ්ඩසාලේ පාංශු සංරක්ෂණ පුහුණු ඒකකය තුළ NRMC නිලධාරීන් 14 ක් සඳහා විශේෂ පුහුණුවක් පවත්වන ලදී.

- පාංශු සංරක්ෂණ හා තිරසාර ඉඩම් කළමනාකරණය පිළිබඳ වයඹ පළාතේ පුහුණුකරුවන් සඳහා පුහුණු වැඩසටහන් තුනක් පවත්වන ලදී. (නිපධාරීහු 103ක් සහභාගී වූහ.)

- පාංශු සංරක්ෂණය හා ඉඩම් සංවර්ධනය පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහනක් නිළධාරීන් සහ ගොවිජන නියෝජිතයන් 18 දෙනෙක් සඳහා පිළිමතලාව ගොවිජන පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ.

- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තෙමේන්තුව හා සහයෝගතාවයෙන් නිලධාරිහු 8 දෙනෙකු සහ දෙල්තොට ප්‍රදේශයේ තෝරාගනු ලැබූ ගොවීහු 30 දෙනෙකු සඳහා පාංශු සංරක්ෂණ හා පාංශු සංරක්ෂණ පනත පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

- බුලත්කොහුපිටිය, කරඳවත්ත, තෝරාගත් ගොවීන් 30 දෙනෙකු පාංශු සංරක්ෂණ පිළිබඳ දැනුවත් කිරීම.

## වැඩමුළු

- DOA හි "හරිත කවය" හා ඒකාබද්ධව පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරයේ දී පාරිසරික තිරසරභාවය සඳහා පාංශු සංරක්ෂණය" තේමාව යටතේ ලෝක පාරිසරික දින සම්මන්ත්‍රණය පවත්වන ලදී. (නිලධාරීහු අනූ අට (98) දෙනෙක් සහභාගී වූහ.)

- ගුරුදෙණිය ගුරු පුහුණු මධ්‍යස්ථානයේ සහ කෑගල්ල සණස මධ්‍යස්ථානයේ දි පරිසර අමාත්‍යාංශයේ සහයෝගිතාවයෙන් පාංශු හා ජල සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ 2 ක් පවත්වන ලදී. (ගුරුවරු 297 ක් සහභාගී වූහ)

- පරිසර අමාත්‍යාංශයේ සහෙයෝගීතාවෙයන් පස හා ජල සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳව කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද විශේෂ සම්මන්ත්‍රණය. ගුරුවරු සහ සිසුන් හයසියයක් සහභාගී වූහ.

- "ග්‍රහලෝක සඳහා සැලකිලිමත් වීම භූමියෙන් ආරම්භ වේ" තේමාව යටතේ ලෝක පාංශු දින සැමරුම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව හැටන් හි රුවන්පුර ප්‍රදේශයේ පැවැත්විණ. (නිලධාරීහු 75 ක් සහ ගොවීහු 100 ක් සහභාගී වූහ.)

## ප්‍රදර්ශන

පහත දැක්වෙන ප්‍රදර්ශනවල තාක්ෂණික ව්‍යාප්ති කටයුතු සිදු කිරීම සඳහා NRMC නිලධාරීහු සහභාගී වූහ.

- කාර්මික ප්‍රදර්ශනය, වලල මධ්‍ය මහා විද්‍යාලය, වලල.

- කෘෂිකර්ම හා පාරිසරික ප්‍රදර්ශනය, මදිනා මධ්‍ය මහා විද්‍යාලය, වත්තේගම

- කෘෂිකාර්මික හා පාරිසරික ප්‍රදර්ශනය, පුෂ්පදාන විද්‍යාලය, මහනුවර

## මුද්‍රිත ද්‍රව්‍ය

පහත මුද්‍රිත ද්‍රව්‍ය සකස් කොට නිෂ්පාදනය කරන ලදී.

- පාංශු සහ ජල සංරක්ෂණ ක්ෂේත්‍ර අත්පොත් 10,000 ක්

## ගුවන්විදුලි වැඩසටහන්

රංගිරි දඹුලු සේවාව, කඳුරට සේවය සහ කොළඹ ගුවන්විදුලි සේවාව මගින් විසුරුවා හරින ලද, පාංශු සංරක්ෂණය, දේශගුණික විපර්යාස සහ පරිසරය ආශ්‍රිත

ගැටළු පිළිබඳ වැඩසටහන් 5 කට NRMC නිලධාරීහු සහභාගි වූහ. තවද, පාංශු සංරක්ෂණය, දේශගුණික විපර්යාස සහ වෙනත් ආශ්‍රිත ප්‍රශ්න පිළිබඳ රූපවාහිනී වැඩසටහන් 3 කට ද ඔවුහු සහභාගී වූහ.

## ගොවිපළ සංවර්ධනය

ගොවිපළ සංවර්ධනය සමඟ පාංශු සහ ජල සංරක්ෂණ ක්‍රියාකාරකම් සීතා එළිය රජයේ ගොවිපළ, කුණ්ඩසාලේ රජයේ ගොවිපළ, සීතා එළිය කෘෂි තාක්ෂණික උද්‍යානය සහ හොරණ දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය යනාදි ස්ථානවල සිදු කරන ලදී.

## තාක්ෂණික සහාය

මධ්‍යස්ථානයයේ ප්‍රධාන ක්‍රියාකාරකම් අතුරින් එකක් වන්නේ විවිධ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික සහාය සහ විශේෂඥ දැනුම ලබා දීමයි. 2017 වසරේ දී පහත තාක්ෂණික සහායන් සපයන ලදී.

- සාරවත්බව පිළිබඳ දීපව්‍යාප්ත සමීක්ෂණය පහසු කරලීමට HORDI සඳහා කුඹුරු ඉඩම් ව්‍යාප්ති සිතියම සහ කොටු සැලසුම් යෝජනා ක්‍රමය ග්‍රාම නිලධාරි මට්ටමින් (GN) සහාය ලබා දීම
- ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම නිලධාරී අඩවි සිතියම් සංවර්ධනය සඳහා සමාජ ආර්ථික හා සැලසුම්ම මධ්‍යස්ථානය (SEPC) සමඟ සහයෝගිතාව
- ශ්‍රී ලංකාවේ කජුවල විභව ව්‍යාප්ති සිතියම ගොඩනැඟීම සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය සමඟ සහයෝගිත්වයෙන් කටයුතු කිරීම.
- ඉහළ මහනුවර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා කෘෂිකාර්මික ඉඩම් සිතියම් ගොඩනැංවීම.
- කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුඹුරු ඉඩම් ප්‍රමාණවලට අදාළව 1:50000 සංඛ්‍යානයන් පදනම් කර ගත් භූ ලක්ෂණාත්මක සිතියම් සකස් කිරීම.
- ධර්මරාජ විද්‍යාලයේ පළතුරු වගා ඉඩම්වල පාංශු සහ ජල සංරක්ෂණ පියවරයන් ස්ථාපනය සඳහා තාක්ෂණික සහාය සැපයීම.
- ජාතික රුක් රෝපණ වැඩසටහන යටතේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාංශු සහ ජල සංරක්ෂණ පියවරයන් ස්ථාපනය සඳහා තාක්ෂණික සහාය සැපයීම.
- ඌව, සබරගමුව සහ මධ්‍යම පළාත් ආදර්ශන බිම්වල පාංශු සහ ජල සංරක්ෂණ පියවරයන් ස්ථාපනය සඳහා තාක්ෂණික සහාය සැපයීම.
- පිළිමතලාව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පාංශු සහ ජල සංරක්ෂණ පියවරයන් ස්ථාපනය කිරීම සඳහා සැකැස්ම තක්සේරුකරණය සහ තාක්ෂණික මඟ පෙන්වීම

## තාක්ෂණික කමිටු නියෝජනය

- දේශගුණික විපර්යාස අනුවර්තනය පිළිබඳ ජාතික විද්වත් කමිටුවේ සාමාජිකයෙකු ලෙස සේවය කිරීම. පරිසර අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකාවේ ප්‍රජා පාදක දේශගුණික වෙනස්වීම්වලට අනුවර්තනය වීම පිළිබඳ ව්‍යාපෘතියේ තාක්ෂණික උපදේශකයෙකු ලෙස සේවය කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ශ්‍රී ලංකාව.
- බංග්ලාදේශයේ ඩකාහි පාලක මණ්ඩල සාමාජිකයෙකු ලෙස සාර්ක් කෘෂිකර්ම මධ්‍යස්ථානයේ සේවය කරන ලදී.
- දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීම සඳහා ජාතික මෙහෙයුම් කමිටුවේ කටයුතු කිරීම, මහවැලි හා පරිසර අමාත්‍යාංශය.

- දේශගුණික විපර්යාස හා ස්වභාවික විපත් පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවේ සේවය කිරීම, ජාතික විද්‍යා පදනම.

- ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික කමිටුවේ සේවය කරන ලදී. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ සභාව (SLCARP).

## 2018 වසර සඳහා සැලැස්ම

### පර්යේෂණ

- කාලගුණ විද්‍යා පාර්තෙම්න්තුව සමඟ ඒකාබද්ධව කෘෂි දේශගුණික කලාප මට්ටමින් දේශගුණික අනාවැකි කීම.

- බෝග කළමනාකරණය සඳහා තීරණාත්මක මෙවලමක් ලෙස කාලගුණය පදනම් කරගත් අනතුරු ඇඟවීම් පද්ධතියක් ගොඩනැගීම

- දක්ෂිණ ධ්‍රැවීය එල් නිනෝ බලපෑම යටතේ ශ්‍රී ලංකාවෙහි තෙත් සහ අතරමැදි කලාපයන්හි වර්ෂාපතන රටාවෙහි අන්තර්-ඍතුමය විචල්‍යතාව.

- ඍතුමය වැසි ආරම්භ වීමත් සමග දිවයිනේ වියළි කලාපයේ ඍතුමය ලක්ෂණ හඳුනා ගැනීම.

- ප්‍රධාන වශයෙන් වී වගා කෙරෙන ප්‍රදේශවල දිගු කාලීන උෂ්ණත්ව සාමාන්‍ය හා සසඳන විට දේශගුණික විපර්යාසයේ බලපෑම (2010 න් පසු) සමඟ උෂ්ණත්ව වෙනස්වීම් හඳුනාගැනීම.

- ශ්‍රී ලංකාවේ පාංශු කාබනික කාබන් සිතියමෙහි නිරවද්‍යතාව තක්සේරු කිරීම සහ එය අවසන් කිරිම.

- නොගැඹුරු භූගත ජලය ලබාගැනීම සඳහා මාර්ගෝපදේශ ගොඩනැඟීම

- ඍතුමය වැසි හට ගැනිම සහ කාලපරිච්ඡේදය පිළිබඳ සමවර්ෂාපතන සිතියම් ගොඩනැඟීම.

- දේශගුණික සුපිරි කෘෂිකාර්මික තාක්ෂණය පිළිබඳ ගොවීන්ගේ අවබෝධය

- ශ්‍රී ලංකාවේ - DL1. විවිධ කෘෂි පාරිසරිකයන් සමඟ ඇතැම් දිස්ත්‍රික්කවල පලතුරු වගාව කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපෑම පිළිබඳ ගොවීන්ගේ අවබෝධය.

- රඹුටන් ශාකවල මල් හටගැනීම කෙරෙහි දේශගුණය වෙනස්වීම්වල බලපෑම අධ්‍යයනය.

- වෙනස්වන හා විචල්‍ය දේශගුණික තත්ත්ව යටතේ ප්‍රධාන පලතුරු බෝගවල ප්‍රජනක හා ඵලදායිතා සාධක වල චර්යාත්මක වෙනස්කම් අධ්‍යයනය කිරීම. ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය සමඟ සහයෝගිතාවයෙන් යුක්තව කටයුතු කිරිම.

- ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමවල විභව්‍ය බෝග විවිධාංගිකරණ ඉඩම් හඳුනා ගැනීම.

- වෙබ් අඩවි පදනම් කරගත් කෘෂිකාර්මික තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරිම.

- ගිරිබාව, කළුගාල සහ මිල්ලනිය යන නියමු ස්ථාන තුනක ස්වාභාවික පරිසර පද්ධතිවල කෘෂිකාර්මික පාරිසරික පද්ධතිවල පාරිසරික පද්ධති සේවා ඇගයීම තක්සේරු කිරීම.

- විවිධ භූමි පරිභෝජනයන් යටතේ විවිධ පාංශු ශ්‍රේණිවල තෙත් හා වියලි සමූහන ස්ථායීතාවය සහ විවිධ පාංශු භෞතික හා රසායනික පරාමිතීන් අතර සම්බන්ධතාවය.

- න්‍යෂ්ටික තාක්ෂණ ක්‍රම භාවිතයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ දිය බස්නා මූලවල පාංශු ඛාදනය තක්සේරු කිරිම

- ගම්පහ සහ ගාල්ල දිස්තික්කවල කුඹුරු ඉඩම් අත්හැර දැමීම නිසා ගොවීන් මුහුණපාන ජෛවකායික හා සමාජ ආර්ථික සංරෝධන තක්සේරු කිරිම සහ විභව මැදිහත්වීම් ගවේෂණය කිරීම.

- වියළි කලාපයේ වැසි පෝෂක උස් බිම් වගාවෙහි බෝග නිෂ්පාදනයෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වැසි ජලය එක්රැස් කිරීමේ පොකුණු සෑදීමේ විභව්‍යතාව අධ්‍යයනය කිරීම.

- වැසි ඇද වැටීම තීව්‍රතා කාල සංඛ්‍යාතය අධ්‍යයනය කිරිම.

- මහවැලි ගං දියෙහි ගුණාත්මකභාවය අධීක්ෂණය.

- ජාතික කෘෂි - කාලගුණ නිරීක්ෂණ ජාලය සහ එහි දත්ත සමුදාය ශක්තිමත් කිරීම හා නඩත්තු කිරීම.

- මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගිතාවයෙන් පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ ව්‍යාපෘති සඳහා පාංශු සංරක්ෂණ සහ කුණාටු ජල කළමනාකරණ මාර්ගෝපදේශය.

- පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම.

- පාදක සිතියම් සහ භූ-අවකාශීය විශ්ලේෂණය, පාංශු මිනුම් සහ ඉඩම් ඇගයීම් සිතියම් සඳහා GIS සහාය ලබා දීම.

## කාර්ය මණ්ඩලය

### NRMC, පේරාදෙණිය

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 | 01 |
| ප්‍රධාන කෘෂි විද්‍යාඥ | 03 | 02 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 06 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 25 | 05 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 05 | 03 |
| පරිපාලන නිලධාරි | 01 | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 04 | 02 |
| සංවර්ධන නිලධාරී | 06 | 05 |
| පාංශු සමීක්ෂක | 05 | 03 |
| කෘෂිකර්ම උපදේශක | 07 | 13 |

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| පර්යේෂණ සහකාර | 07 | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 07 | 07 |
| තාක්ෂණික සහකාර | 01 | 01 |
| රියදුරු | 07 | 07 |
| ගබඩාකරු | 01 | 01 |
| පර්යේෂණ උප සහකාර | 02 | 02 |
| කාර්යාල කාර්ය සහායක | 01 | 02 |
| මුරකරු | 03 | 03 |
| කම්කරු | 09 | 08 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 05 | 03 |
| **එකතුව** | **107** | **73** |

## NRMC උප ඒකකය - කුණ්ඩසාලේ

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 02 | - |
| කෘෂිකර්ම උපදේශක | 02 | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 | - |
| ගොවිපල කළමනාකරු | 02 | - |
| රියදුරු | 01 | - |
| ගබඩාකරු | 01 | - |
| කාර්යාල කාර්ය සහායක | 01 | - |
| මුරකරු | 04 | - |
| කම්කරු | 01 | - |
| කම්කරු (කොන්ත්‍රාත්) | 15 | 03 |
| **එකතුව** | **32** | **04** |

# 2.1. බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නොරුව

විදේශික පළිබෝධ රටට ඇතුළුවීම වැළැක්වීම, පරිසර හිතකාමී, තාක්ෂණික ශක්‍යතාවයෙන් හා ආර්ථික සාධ්‍යතාවයෙන් යුතු පළිබෝධ කළමනාකරණ උපාය මාර්ග ප්‍රවර්ධනය, පළිබෝධ පාලනය සඳහා උචිත ගුණාත්මක පළිබෝධනාශක ලබාගත හැකිබව සහතික කිරීම, ආරක්ෂාකාරී ලෙස පළිබෝධනාශක පරිහරණය තහවුරු කිරීම, ගුණාත්මක බීජ ලබා ගත හැකි බව සහතික කිරීම මගින් බීජ කර්මාන්තය වැඩි දියුණු කිරීම, ආහාර බෝග වල ජාන සම්පත් සංරක්ෂණය හා ඒවායේ උපයෝගීතාවට දිරි දීම යන සියල්ල මගින් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අංශය ආරක්ෂා කර ගැනීම, බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයේ (SCPPC) අනුගම්‍ය කාර්ය භාරය වේ.

ඉහත කාර්යයන් බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය යටතේ ඇති ප්‍රධාන ඒකක පහ වන ජාතික ශාක නිරෝධායන සේවය, පැළෑටි සංරක්ෂණ සේවය, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය, බීජ සහතික කිරීම සේවය සහ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය මගින් ඉටු කරනු ලබයි. බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය මගින් පහත පනත් වලට අදාල නියාමන කාර්යයන් ද සිදුකරනු ලබයි.

- දේශීය කෘෂිකර්මය ආරක්ෂා කිරීමට හා පරිසරයට අවම හානියක් වන ලෙස ඵලදායි පළිබෝධ කළමනාකරණ ක්‍රම ප්‍රවර්ධනය සඳහා 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත .
- මානව සෞඛ්‍යයට හා පරිසරයට අවම හානියක් වන උසස් තත්ත්වයේ පළිබෝධනාශක සුලභතාව තහවුරු කිරීම සඳහා 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත.
- බීජ කර්මාන්තයට හානි විය හැකි අයථා කටයුතු වලින්, ගොවීන් මෙන්ම බීජ පරිහරණය කරන්නන් ද ආරක්ෂා කිරීම සඳහා 2003 අංක 22 දරන බීජ පනත.

## අයවැය

බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය වෙත පුනරාවර්තන හා මූලධන වැය ශීර්ෂයන් යටතේ ලැබුණු ප්‍රතිපාදන හා සිදු කරන ලද වියදම් පහත වගු අංක 2.1.1 පරිදි වේ.

**වගු අංක 2.1.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 60,119,674 | 52,689,811 | 88 |
| මූලධන | 42,277,151 | 41,511,284 | 98 |
| **එකතුව** | **102,396,825** | **94,201,095** | **93** |

## ප්‍රගතිය

### නියාමන කටයුතු

### 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනතේ නව විධිවිධාන

2017 මුල් භාගයේදී 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනතේ විධිවිධාන කෙටුම්පත පිළිබඳ අදහස් හා යෝජනා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන ලදී. එම අදහස් හා යෝජනා ලැබීමෙන් අනතුරුව අදාළ විධිවිධාන පිළිබඳව සාකච්ඡා කිරීමටත්, අවසන් නිගමනයන්ට එළඹීමටත් වැඩමුළු අටක් හා රැස්වීම් ගණනාවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අදාල නිලධාරීන් සමඟ පවත්වන ලද අතර, අනතුරුව, වැඩමුළු හා රැස්වීම්වලදී එළඹුණු අදහස් හා යෝජනා, සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා විධිවිධාන කෙටුම්පතට ඇතුළත් කරන ලදුව කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට බාර දෙන ලදී.

### 2003 අංක 22 දරන බීජ පනතේ විධිවිධාන කෙටුම්පත්

2003 අංක 22 දරන බීජ පනතේ නව විධිවිධාන සිංහල හා ඉංග්‍රීසි භාෂා වලින් සම්පූර්ණ කරන ලද අතර කෙටුම්පත 2016 වර්ෂයේදී අදහස් හා යෝජනා ලබාගැනීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට බාර දෙන ලදී. එහි දෙමළ භාෂා පරිවර්තනය 2017 වර්ෂයේදී බාර දෙන ලදී.

බීජ ප්‍රමිතීන් යාවත්කාලීන කිරීමට එක් වැඩමුළුවක් අදාල නිලධාරීන් සමඟ පවත්වන ලදී.

### බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය සඳහා කාර්ය මණ්ඩල තොරතුරු පද්ධතිය

බීජ සහතික කිරිම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතන 5කි. දැනට මෙම මධ්‍යස්ථානය යටතේ සේවය කරන සේවකයින් සංඛ්‍යාව 850කි. විවිධ කාරණා සඳහා සේවක තොරතුරු එක් රැස් කර ගැනීමේ අවශ්‍යතාව පැන නගින අතර සමහර ඉල්ලීම් සඳහා ඉතා කෙටි කාලයකින් තොරතුරු ලබා දිය යුතු වේ. මෙබඳු අවස්ථා වලදී අතින් සිදු කරනු ලබන තොරතුරු එක් රැස් කිරීම් සඳහා සැළකිය යුතු කාලයක් ගත වන අතර අත් වැරදීම් සඳහා ඇති ඉඩ කඩ ද බෙහෙවින් වැඩිය. එම නිසා එක් එක් අංශයේ දැනට සේවය කරන සේවක සංඛ්‍යාව, ඔවුන්ගේ රැකියා භූමිකා, සේවා ඉතිහාසය හා සුදුසුකම් යනාදිය අන්තර්ගත සමස්ථ කාර්ය මණ්ඩල තොරතුරු ගබඩා කිරීමට කාර්යක්ෂම වෙබ් පාදක තොරතුරු පද්ධතියක් සකස් කරන ලදී. මෙම වෙබ් පාදක තොරතුරු පද්ධතියේ මූලික අත් හදා බැලීම සිදු කරන ලදී. SCPPC යටතේ ඇති සියළු ආයතන වලින් තොරතුරු එක් රැස් කිරීම දැන් සිදු කෙරෙමින් පවතී.

### e-Phyto මාර්ග ගත බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය

අන්තර්ජාතික ශාක ආරක්ෂණ සම්මුතිය (IPCC), එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික පරිගණක මධ්‍යස්ථානය (UNICC) හා ඔස්ට්‍රේලියානු රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, වෙනත් රටවල් සමඟ මාර්ග ගත හා තොරතුරු හුවමාරු යාන්ත්‍රණයක් ඔස්සේ ශාක ස්වස්ථතා සහතික නිකුත් කිරීම සඳහා e-Phyto ගෝලීය ප්‍රවේශයට (Global hub) ප්‍රවිෂ්ඨ වීම සඳහා ජාතික පද්ධතියක් සංවර්ධනය කෙරෙමින් පවතී. මෙම පද්ධතියට, ජාතික ශාක නිරෝධායන සේවය (NPQS) හා එහි උප ඒකක වල වර්තමාන ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධතා පද්ධතියක් ඇත. ක්‍රියාත්මක කිරීමේ අදියරේදී මෙම ව්‍යාපෘතියේ පද්ධති පරිපාලනය (එනම්, තාක්ෂණික කළමනාකරණය) බීජ සහතික කිරිම හා

පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයෙහි යටතට පවරනු ලැබේ.

### ස්ථිර බෝග සායන වැඩසටහන පිළිබඳ තොරතුරු පද්ධතිය

බීජ සහතික කිරිම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයෙහි සහයෝගිත්වය ඇතිව පැළෑටි සංරක්ෂණ සේවය විසින් මෙම ස්ථිර බෝග සායන වැඩසටහන පවත්වනු ලැබේ. ඩෙස්ක්ටොප් පරිගණක හා ඇන්ඩ්‍රොයිඩ් මාදිලියේ ජංගම දුරකථන සඳහා ගොඩ නගන ලද ජාල පාදක පද්ධතියකට, ස්ථිර බෝග සායන පිළිබඳ තොරතුරු සායන වාර්තා ගොවීන්ගේ තොරතුරු, බෝග වල රෝග විනිශ්චය තොරතුරු ඇතුළත් කරනු ලැබේ. බෝග සායන පිළිබඳ විස්තරාත්මක තොරතුරු විශ්ලේෂණයට හා වාර්තා ලබා ගැනීමට මෙම වෙබ් පාදක පද්ධතිය ප්‍රයෝජනවත් වේ.

### නිලධාරි ශිෂ්‍යත්ව තොරතුරු පද්ධතිය

මෙම පද්ධතිය ද SCPPC හා එහි උප ඒකක වලට අනුයුක්ත නිලධාරීන්ගේ විදේශීය ශිෂ්‍යත්ව වලට අදාළ තොරතුරු කළමනාකරණයට සහාය වන ජාල පාදක පද්ධතියකි.

### සම්මන්ත්‍රණ / දැනුවත් කිරීමේ වැඩසටහන් / පුහුණු කිරීම

- ශාක ආරක්ෂක පනත හා ශාක නිරෝධායනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 7ක් සඳහා සම්පත් දායකයෙකු ලෙස බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයේ තාක්ෂණික නිලධාරියෙක් සහභාගි විය. එම වැඩසටහන් සඳහා පුහුණුලාභීන් ලෙස කෘෂිකර්ම හා වාරිමාර්ග දෙපාර්තමේන්තු වල බලය ලත් නිලධාරීන් 160ක් හා පොලිස් දෙපාර්තමේන්තුවේ අභ්‍යාසලාභී නිලධාරීන් 90ක් සහභාගි වූහ.
- ජාතික ශාක නිරෝධායන සේවය (NPQS) විසින් 2017 තුළ දී ආනයන බලපත්‍ර 4,365ක් නිකුත් කරන ලදී. 2017 වර්ෂය තුළදී ආනයනය කරන ලද එළවළු හා පලතුරු බීජ ප්‍රමාණයන් පහත වගු වලින් දැක්වේ.

**වගු අංක 2.1.2: 2017 වර්ෂය තුළදී වරායන් හා ගුවන්තොටුපළවල් හරහා ආනයනය කරන ලද සමස්ත එළවළු බීජ ප්‍රමාණ**

| # | බෝගය | ප්‍රමාණය (කි.ග්‍රෑ) | | | # | බෝගය | ප්‍රමාණය (කි.ග්‍රෑ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වරාය | ගුවන් තොටුපල | එකතුව | | | වරාය | ගුවන් තොටුපල | එකතුව |
| 1. | බෝංචි | 113,400.0 | 0.1 | 113,400.1 | 15. | වැටකොළු | 4,135.7 | 75.5 | 4,211.2 |
| 2. | බීට් රූට් | 15,570.8 | 1,510.1 | 17,080.9 | 16. | මුරුංගා | - | 209.0 | 209.0 |
| 3. | කරවිල | 3,200.9 | 71.3 | 3,272.2 | 17. | බණ්ඩක්කා | 2,191.5 | 8,280.9 | 10,472.4 |
| 4. | බ්‍රොකොලි | 10.0 | 0.0 | 10.0 | 18. | Pakchoi | 30.00 | 40.00 | 70.00 |
| 5. | ගෝවා/චීන ගෝවා | 1,168.7 | 964.1 | 2,132.9 | 19. | ස්වීට් පෙපර්/ බෙල් පෙපර් ආදිය | 5.4 | 50.62 | 1,355.06 |
| 6. | කැරට් | 39,740.6 | 235.1 | 39,975.7 | 20. | හොට් පෙපර්/මාළු මිරිස්/මිරිස් පෙපර් | 5,066.0 | 784.2 | 5,850.1 |

| # | බෝගය | ප්‍රමාණය (කි.ග්‍රෑ) | | | # | බෝගය | ප්‍රමාණය (කි.ග්‍රෑ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වරාය | ගුවන් තොටුපල | එකතුව | | | වරාය | ගුවන් තොටුපල | එකතුව |
| 7. | සෙලිරි | 17.5 | - | 17.5 | 22. | ලොකු ළූණු | 4,200 | 2,500.00 | 6,700.0 |
| 8. | චයිනීස් කේල් | 272.3 | - | 272.3 | 23. | රතු ළූණු | - | 1,250.00 | 1,2500.00 |
| 9. | පිපිඤ්ඤා | 2,031.0 | 730 .4 | 2,761.4 | 24. | රාබු/චීන රාබු | 9,804.5 | 305.1 | 10,109.5 |
| 10. | වම්බටු | 517.1 | - | 517.1 | 25. | ස්කොෂ් | 255.0 | 70.0 | 325.0 |
| 11. | නෝකෝල් (කෝල්රාබි) | 930.0 | 625.1 | 1,555.1 | 26. | තක්කාලි | 957.2 | 130.8 | 1,087.9 |
| 12. | ලීක්ස් | 12,502.2 | 0.0 | 12,205.2 | 27. | කංකුං (උස් බිම්) | 1,033.0 | - | 1,033.0 |
| 13. | සලාද | 278.4 | 4.7 | 283.1 | 28. | මෑ | 4,334.6 | 0.1 | 4,344.7 |

**වගු අංක 2.1.3: 2017 වර්ෂය තුළදී වරායන් හා ගුවන්තොටුපළවල් හරහා ආනයනය කරන ලද සමස්ත පලතුරු හා වෙනත් බීජ ප්‍රමාණ**

| # | බෝගය | ප්‍රමාණය (කි.ග්‍රෑ) | | | # | බෝගය | ප්‍රමාණය (කි.ග්‍රෑ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වරාය | ගුවන් තොටුපල | එකතුව | | | වරාය | ගුවන් තොටුපල | එකතුව |
| 1. | පැපොල් | 1.2 | 6.1 | 7.3 | 5. | ස්වීට් කෝන් | 412.0 | 100.00 | 512.0 |
| 2. | පැණි කොමඩු | 9,151.0 | 748.1 | 9,899.1 | 6. | බඩඉරිඟු | 1,324,581.3 | 54.0 | 1,324,635.3 |
| 3. | බීජ අර්තාපල් | 1,602,340.2 | - | 1,602,340.2 | 7. | මල්බීජ | 0.1 | 113.0 | 113.1 |
| 4. | කොමඩු | 10.00 | - | 10.00 | 8. | තෘණබීජ | 925.0 | - | 925.0 |
| 5. | සෝගම් | 28,000.0 | - | 28,000.0 | | සෝගම් (සත්ව ආහාර) | - | 300.0 | 300.0 |

## 2018 වසර සඳහා සැලැස්ම

- දළ දේශීය නිෂ්පාදිතයට (GDP) කෘෂිකර්මයේ දායකත්වය වැඩිකරන බීජ, පැළෑටි, රෝපණ ද්‍රව්‍ය හා කෘෂි රසායන ද්‍රව්‍ය ඵලදායීව හා ආරක්ෂිතව භාවිතය පහසු කිරීම සඳහා, සුදුසු විධිවිධාන ක්‍රියාවට නැංවීම.
- 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනතේ විධිවිධාන, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් පසු ගැසට් කිරීමට ක්‍රියා කිරීම.
- 2003 අංක 22 දරන බීජ පනතේ විධිවිධාන ගැසට් කිරීමට ක්‍රියා කිරීම.
- බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයේ ස්ථාපිත කර ඇති ආගන්තුක ශාක ඒකකය උපයෝගී කර ගනිමින්, ශ්‍රී ලංකාවේ ආක්‍රමණික ආගන්තුක ශාක විශේෂ පාලනය කිරීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
- 2003 අංක 22 දරන බීජ පනත යටතේ ලේබල් තොරතුරු නිකුත් කිරීම පිළිබඳ දන්න සමුදායක් ගොඩ නැගීම.

- ඌව පලාතේ, ඌව පලාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට නිල වෙබ් අඩවියක් නිර්මාණය කිරීම.
- බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයේ පාලනයට යටත්ව ක්‍රියාත්මක වන සියළු ආයතන වල තාක්ෂණික ප්‍රගතිය නියාමනය කිරීම.
- පළිබෝධනාශක ආරක්ෂා සහගතව භාවිතා කිරිමට දිරි ගැන්වීම.
- උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට අදාළ ගැළපෙන ප්‍රතිපත්ති, තීරණ හා සැලසුම් සකස් කිරීම.
    - දිවයිනේ බීජ කර්මාන්තය ඉහළ නැංවීම.
    - දිවයින තුළ හොඳ ගුණාත්මක බවින් යුතු රෝපණ ද්‍රව්‍ය වැඩිදියුණු කිරීම.
    - ජාතික ශාක ස්වස්ථතා පද්ධතිය ශක්තිමත් කිරීම.
    - නියාමන ක්‍රියාමාර්ග ඒකරාශී කිරීම.
    - කෘෂිකර්මාන්තයේ වඩාත්ම ඵලදායී හා ආරක්ෂිත පළිබෝධ පාලන ක්‍රමෝපායන් ප්‍රවර්ධනය කිරීම.
    - අදාළ රටවලට ශාක හා ශාක නිෂ්පාදන අපනයනය කිරීම සඳහා වන නිල පාලන ක්‍රමවේද ඇගයීමට ලක් කිරීම.
    - පලතුරු හා එළවළු සඳහා අදාල ශාක නිරෝධායන අවශ්‍යතා වලට ගැළපෙන ගොවිපළ සහතික කිරීමේ ක්‍රමයක් ගොඩනැගීම.

## කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 | - |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 05 | 02 |
| පරිපාලන නිලධාරි | 01 | - |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | - | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 04 | 01 |
| සංවර්ධන නිලධාරි | 04 | 03 |
| කෘෂිකර්ම උපදේශක | 01 | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 12 | 09 |
| රියදුරු | 04 | 03 |
| කාර්යාල කාර්ය සහායක | 02 | 02 |
| කම්කරු | 05 | 07 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 02 | 02 |
| **එකතුව** | **42** | **32** |

# 2.1.1. බීජ සහතික කිරීමේ සේවය - ගන්නොරුව

බීජ සහතික කිරීමේ සේවය ගොවීනට සපයනු ලබන බීජ හා රෝපණ ද්‍රව්‍යයන්හි ගුණාත්මකබව තහවුරු කිරීමට අදාල නියාමන කාර්යයන් සිදු කරයි.

වගකීම්

- බීජ පනත ක්‍රියාත්මක කිරීම
- ගුණනයට පෙර වී, එළවළු, වෙනත් ක්ෂේත්‍ර බෝග, අර්තාපල් සහ රෝපණ ද්‍රව්‍ය වල ගුණාත්මක බව සහතික කිරීම. වී, එළවළු, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ අර්තාපල්වල, වෙළඳ බීජ සහ රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මකබව සහතික කිරීම.
- පලතුරු පැළ සහතික කිරීම සහ පලතුරු පැළ තවාන් ලියාපදිංචිය.
- යෝග්‍ය පලතුරු මවු ශාක තෝරා ගැනීම හා ලියාපදිංචිය.
- දේශීය සහ ආනයනික බීජවල ප්‍රරෝහණය, ජීව්‍යතාවය, පාරිශුද්ධතාවය සහ තෙතමනය රසායනාගාර පරීක්ෂණ වලට භාජනය කිරීම.
- ආනයනික සහ දේශීයව නිෂ්පාදනය කරන බීජ වල ගුණාත්මක බව පරීක්ෂා කිරීම උදෙසා පශ්චාත් පාලන ක්ෂේත්‍ර අත්හදා බැලීම.
- නව බෝග ප්‍රභේද නිදහස් කිරීමට පෙර ඒවායේ විශේෂියතාවය, ඒකාත්මිකතාවය සහ ස්ථායිතාව (DUS) පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම.
- බීජ ස්වස්ථතා පරීක්ෂා සිදු කිරීම.
- බීජ පනත සම්බන්ධව ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ බීජ වගාකරුවන්, පැළ තවාන්කරුවන්, බීජ අලෙවිකරුවන් සහ නිලධාරීන් පුහුණු කිරීම සහ දැනුවත් කිරීම.
- ව්‍යවහාරික බීජ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම මගින් ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ ක්ෂේත්‍ර ගැටළුවලින් මිදීම උදෙසා විසඳුම් සොයා බැලීම.
- බීජවල ගුණාත්මක බව වර්ධනය කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ කටයුතු.
- ගබඩා තත්ව යටතේ ගබඩා කර ඇති බීජ තොග වල ගුණාත්මය කලින් කලට පරීක්ෂා කිරීම හා තොග බණ්ඩය කිරීම.
- වෙළඳපලට යැවීමට පෙර ආනයනික එළවළු සහ අතිරේක ආහාර බෝග බීජ නාමකරණය කිරීම.
- දත්ත පද්ධති කළමනාකරණය සහ අධීක්ෂණය.
- පලතුරු පැළ තවාන්කරුවන්ගේ නාමාවලිය වාර්ෂිකවද බීජ නිෂ්පාදකයන්ගේ නාමාවලිය කන්න වශයෙන්ද මුද්‍රණය කිරීම.

## අයවැය

විවිධ වැයශීර්ෂ සහ ව්‍යාපෘති යටතේ ප්‍රතිපාදන සහ වියදම 2.1.1.1 වගුව යටතේ පෙන්වනු ලබයි.

**වගු අංක 2.1.1.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 20,526,562 | 18,670,705 | 91 |
| මුලධන | 17,245,000 | 19,414,067 | 113 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| **ව්‍යාපෘති** | | | |
| • බීජ පනත | 15,000,000 | 14,991,840 | 100 |
| • AFACI (සංක්‍රමනික රෝග සහ ආසියානු කලාපයේ කෘමි පළිබෝධකයින් සඳහා වසංගතවේදය පිළිබඳ තොරතුරු හුවමාරු පද්ධතියක් සැකසීම පිළිබඳ සහයෝගිතා වැඩසටහන (IPM)) | 4,832,000 | 4,770,000 | 99 |
| • ගොවිපල ඒකක (වැ.ශී. 1504) | 5,000,000 | 4,749,200 | 95 |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන | 4,000,000 | 3,980,902 | 100 |
| **එකතුව** | **66,603,562** | **66,576,714** | **100** |

## ප්‍රගතිය

- බීජ නිෂ්පාදනය සඳහා වගා කල වී හෙ. 4,676 වෙනත් ක්ෂේත්‍ර බෝග හෙ. 1900, එළවළු හා පලතුරු හෙ. 156 සහ අර්තාපල් හෙ. 77ක්ද පරීක්ෂා කරනු ලැබිය.
- බිත්තර වී මෙ.ටො. 12,739ක් වෙනත් ක්ෂේත්‍ර බෝග මෙ.ටො. 1573, එළවළු බීජ මෙ.ටො. 48 සහ අල බීජ මෙ.ටො. 701 නියෝජනය වන සේ බීජ නියැදි 15,428ක්ද කුඩා ආකන්ද 1,087,416ක්ද පරීක්ෂා කරනු ලැබීය.
- 2016 හා සැසඳීමේදී 2017 වර්ෂයේදී බිත්තර වී ලියාපදිංචි ප්‍රමාණය 23%ක් අඩු වු නමුත් වෙනත් ක්ෂේත්‍ර බෝග ලියාපදිංචි විය. 174%කින් වැඩි වු අතර එළවළු 77%කින් වැඩි විය.
- වගා බිම් ප්‍රමාණය අඩු වීම හා සමාන්තරව බිත්තර වී නිෂ්පාදන ප්‍රමාණය 11%කින් අඩුවිය. 2016 හා සංසන්දනාත්මකව වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු නිෂ්පාදනය පිළිවෙලින් 164% සහ 67%ක් ලෙස වැඩි විය.
- සහතික කළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්නා වු උද්‍යාන බෝග පැළ තවාන් 324ක්, ලියාපදිංචි සහ සහතික කළ අතර බද්ධ පලතුරු පැළ 577,777ක් ලේබල් කරමින් සහතික කරනු ලැබිණ.
- මවු ශාක 586 තෝරාගන්නා ලද අතර තත්ත්ව සහතිකකරණය කල බවට ලේබල් කරන ලදී.
- බීජවල DUS පරීක්ෂණ වැඩසටහන යටතේ සහල් ප්‍රභේද 11, වෙනත් ක්ෂේත්‍ර බෝග 15ක්, එළවළු බෝග ප්‍රභේද 6ක්, පලතුරු ප්‍රභේද 1 සහ මවු පෙළපත් 2ක් අගයන ලදී.
- ගන්නොරුව, සීතාඑළිය, බටඅත, කරදියනාරු සහ මහඉලුප්පල්ලම පිහිටුවා ඇති පසු පාලන ක්ෂේත්‍ර I - VI වලදී, සහල්, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ අර්තාපල් පසු පාලන නියැදි 830ක් පරීක්ෂා කරනු ලැබීය.
- ආනයනික එළවළු බීජ නියැදි 149ක් පරීක්ෂා කරනු ලැබිණි.
- එළවළු සහ වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ තොග වලින් පිළිවෙලින් 2,518ක් සහ

3,653 වතාවත් ලෙස තොග බෙදා වෙන් කිරීම සිදු කරන ලදී.

- හදිසි බීජ මිලදී ගැනීමේ වැඩසටහන යටතේ බිත්තර වී නියැදි 1,064ක් (මෙ.ටො. 5,540) ලබාගත් අතර එයින් නියැදි 789 (මෙ.ටො. 4,803) ක් සමත් වූ අතර අතිරේක ආහාර බෝග නියැදි 161 (මෙ.ටො. 62.7) ලබාගත් අතර ඒ සියල්ල සමත් විය.
- බීජවල ගුණාත්මක බව සහතික කිරීමේ පද්ධතියට බීජ ස්වස්තතා පරීක්ෂණය හඳුන්වාදෙනු ලැබූ අතර, බීජ ස්වස්ථතා නියැදි 152ක් පරීක්ෂණයට භාජනය කෙරිණි.
- බීජ පනත යටතේ බීජ හසුරුවන්නන් 917ක් ලියාපදිංචි කරනු ලැබූ අතර 890ක ලියාපදිංචිය අලුත් කරනු ලැබිණි.
- බීජ පනත යටතේ විවිධ බීජ සහ රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන් විසින් යොදා ගනු ලැබූ ලේබල 160ක් සඳහා අනුමැතිය ලබාදුණි.
- බීජ පනත යටතේ පැමිණිලි 21ක් විභාග කොට අවශ්‍ය පියවර ගනු ලැබිණි.
- බීජ සඳහා නිසි වෙළඳපළක් සැපයීමේ අරමුණින් බීජ හසුරුවන්නන්ගේ පරිශ්‍ර 262ක් පිරික්සනු ලැබිණි.
- ජාතික බීජ කවුන්සිලය පිහිටුවනු ලැබූ අතර, පළමු කමිටු රැස්වීම 2017.11.29 දින පැවැත්විණි.
- බීජ පනත සහ නිෂ්පාදන කටයුතු සම්බන්ධයෙන් රජයේ සහ පෞද්ගලික අංශයේ නිලධාරීන්, බීජ ගොවීන් සහ බීජ හසුරුවන්නන් 5,606ක් පුහුණු කරනු ලැබිණි.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා බිත්තර වී වල ප්‍රභේද පාරිශුද්ධතාවය සම්බන්ධයෙන් පැනනගින ගැටළු විසඳීම සඳහා වූ ක්ෂේත්‍ර දිනයක් ගන්නොරුව පසු පාලන ඒකක Iහිදී පැවැත්විණි.
- ආනයනික එළවළු හා වෙනත් ක්ෂේත්‍ර බෝග 13ක් සඳහා මෙරට වෙළඳපල තුල අලෙවියේදී භාවිතා කල හැකි වන සේ නාමකරණයන් “ආනයන බීජ වල නම් වෙනස් කිරීමේ කමිටුව” මගින් අනුමත කර ලබා දෙන ලදී.
- පරන්තන්වල බීජ පරීක්ෂණ රසායනාගාරය, මුරුන්කන් සහ රිකිල්ලගස්කඩ බීජ සහතික කිරීමේ කාර්යාල සහ ගන්නොරුව පසු පාලන I හි නව ගොඩනැගිලි විවෘත කිරීම සිදු කරන ලදී.
- මහඉලුප්පල්ලම පසු පාලන ක්ෂේත්‍ර IV සඳහා විසිරුම් ජලසම්පාදන පද්ධතියක් ස්ථාපිත කරන ලදී.
- බීජ සහතික කිරීමේ මධ්‍යස්ථානයේ සෑම අංශයකටම අදාළ වාහන සහ ගොඩනැගිලිවල අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කිරීම් සිදු කරන ලදී.
- 2017 වසර තුල ගුවන්විදුලි වැඩසටහන් 7ක් සහ රූපවාහිනි වැඩසටහන් 5ක් විකාශනය කරන ලදී.
- දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත බෝගවල මවු ශාක, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වගාකරුවන් වෙත ලබාදීම සඳහා වැඩසටහනක් සකස් කරන ලදී.
- GPS තාක්ෂණය යොදා ගනිමින්, මවු බෝග පිහිටන ස්ථාන සිතියම් ගත කිරීම ආරම්භ කරන ලදී. 2017 දී GPS අනුරූපණ ප්‍රදේශ 634කින් ලබාගන්නා ලදී.

## බිත්තර වී සහතික කිරීම

2017 වසර තුල, සහතික කළ බිත්තර වී නිෂ්පාදන වැඩසටහන සඳහා තනි පුද්ගල ගොවින් මෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ, සමුපකාර සමිති, පළාත් සභා, ගොවිජන කේන්ද්‍ර,

මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවි සංවිධාන, පෞද්ගලික ආයතන, රාජ්‍ය නොවන සංවිධාන වැනි රාජ්‍ය සහ පෞද්ගලික අංශ ලියාපදිංචි කරනු ලැබිණි.

බිත්තර වී නිෂ්පාදනය සඳහා ලියාපදිංචි සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙ. 4,676ක් වූ අතර මෙයින් පෞද්ගලික අංශයේ දායකත්වය 71%කි. විවිධ මූලාශ්‍ර සහ බීජ පන්ති යටතේ සහතික බිත්තර වී නිෂ්පාදනය සඳහා ලියාපදිංචි භූමි ප්‍රමාණය 2.1.1.2 වගුව මගින් පෙන්වනු ලබයි. 2016 වර්ෂය හා සැසඳීමේදී 2017 වර්ෂයේ බිත්තර වී නිෂ්පාදනය සඳහා ලියාපදිංචි ප්‍රමාණය 23%ක අඩුවීමක් පෙන්නුම් කරන අතර එම තත්ත්වය නියං තත්ත්වය හේතුවෙන් ගොවි බිම් ආශ්‍රිතව දැඩි ජල හිඟකම නිසා ඇතිවූවකි. මීට අමතරව, නිෂ්පාදන ඉලක්ක කෙරෙහි ගංවතුර තත්ත්වයන් දැඩි බලපෑමක් එල්ල කළ අතර, දිවයිනේ ගොවි බිම් හෙක්ටෙයාර විශාල ප්‍රමාණයකට දැඩි බලපෑම් ඇතිවිණ.

**වගු අංක 2.1.1.2: 2016 සහ 2017 වර්ෂ වලදී බිත්තර වී නිෂ්පාදන ප්‍රමාණය**

| ප්‍රභවය | බීජ පන්තිය | 2016 | | 2017 | | පිළිගත් % |
|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කළ ප්‍රමාණය (හෙ.) | ලියාපදිංචි ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කළ ප්‍රමාණය (හෙ.) | |
| පර්යේෂණ ස්ථාන | අභිජනන | 5.88 | 5.12 | 6.29 | 5.99 | 95 |
| රජයේ ගොවිපළ | අත්තිවාරම් I | 50.80 | 38.86 | 75.96 | 74.34 | 98 |
| | අත්තිවාරම් II | | | 1.60 | 1.60 | 100 |
| | ලියාපදිංචි I | 604.57 | 565.05 | 659.23 | 631.90 | 96 |
| | ලියාපදිංචි II | 30.45 | 30.24 | 32.60 | 31.20 | 100 |
| | සහතික I | 106.07 | 89.68 | 26.30 | 26.30 | 100 |
| | සහතික II | 11.13 | 9.72 | 3.00 | 2.80 | 93 |
| | වෙළඳ II | | | 1.20 | 1.20 | 100 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | අත්තිවාරම් I | 1.42 | 0.61 | 0.40 | 0.40 | 100 |
| | ලියාපදිංචි I | 154.45 | 74.39 | 49.79 | 43.24 | 87 |
| | සහතික I | 363.56 | 302.02 | 418.65 | 284.96 | 68 |
| | සහතික II | 40.08 | 30.97 | 0.40 | 0.40 | 100 |
| | වෙළඳ II | | | 83.20 | 67.80 | 81 |
| පෞද්ගලික වගාකරුවන් | ලියාපදිංචි I | 512.51 | 379.05 | 118.86 | 111.46 | 94 |
| | සහතික I | 3885.33 | 2729.89 | 3067.48 | 2480.23 | 81 |
| | සහතික II | 315.99 | 250.91 | 118.23 | 100.43 | 85 |
| | වෙළඳ I | 7.49 | 1.62 | 10.83 | 10.03 | 93 |
| | වෙළඳ II | | | 2.20 | 1.60 | 73 |
| **එකතුව** | | **6,089.3** | **4,508.3** | **4,676.22** | **3,875.88** | **83** |

2017 වර්ෂය තුළදී බිත්තර වී මෙ.ටො. 12,739ක ප්‍රමාණයක් නියැදිගත කරනු ලැබූ අතර මෙයින් රසායනාගාර පරීක්ෂණ මගින් මෙ.ටො. 10,681ක් පිළිගනු ලැබිණි. (වගුව 2.1.1.3) කොන්ත්‍රාත් වගාකරුවන් සහ පෞද්ගලික වගාකරුවන්ගේ නිෂ්පාදන ප්‍රමාණ පිළිවෙලින් මෙ.ටො. 6,458 (51%) සහ මෙ.ටො. 6,272 (49%) විය. දැඩි නියං තත්ත්ව සහ කාලගුණ විපර්යාසයක් තිබියදී වුව, රජය සහ කොන්ත්‍රාත් වැඩසටහන් මගින් නිෂ්පාදිත බිත්තර වී ප්‍රමාණය 2016 හා සංසන්දනාත්මකව 18%කින් වැඩි විය.

**වගු අංක 2.1.1.3: 2016 හා 2017 වර්ෂ තුළදී පරීක්ෂා කළ බිත්තර වී ප්‍රමාණය සහ පිළිගත් ප්‍රතිශතය**

| ප්‍රභවය | 2016 | | 2017 | |
|---|---|---|---|---|
| | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො.) | පිළිගත් ප්‍රතිශතය (%) | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො.) | පිළිගත් ප්‍රතිශතය (%) |
| පර්යේෂණ මධ්‍යස්ථාන | 8.48 | 92.5 | 8.7 | 94 |
| රජයේ ගොවිපළ | 3453.7 | 89.8 | 4591.3 | 89 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | 1328.4 | 83.4 | 1866.8 | 84 |
| පෞද්ගලික වගාකරුවන් | 9632.5 | 79.5 | 6272.2 | 80 |
| **එකතුව** | **14,411.5** | | **12,739.0** | |

## වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ සහතික කිරීම

වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය යටතේ සම්පූර්ණ ලියාපදිංචි භූමි ප්‍රමාණය හෙ. 1900ක් වූ අතර මෙයින් කොන්ත්‍රාත් වගාකරුවන් ලියාපදිංචි ප්‍රමාණය 85%කි. වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදන වැඩසටහන සඳහා බඩඉරිඟු, මුං, රටකජු, තල, කව්පි, කුරක්කන්, කොල්ලු, අබ, උඳු සහ සෝයා බෝංචි ඇතුලත් වේ. විවිධ ප්‍රභවයන් සහ විවිධ පන්ති යටතේ බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි භූමි ප්‍රමාණය 2.1.1.4 වගුව මගින් පෙන්වනු ලැබේ. ජලය හිඟ ප්‍රදේශවල වී නිෂ්පාදනයට වඩා වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීමට යොමු වීම තුලින්, 2016 වසරට වඩා 2017 වසරේදී, වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනයේ ලියාපදිංචි ප්‍රමාණය 174%කින් අතිවිශාල ලෙස වැඩි විය. පසුගිය වසර හා සංසන්දය කිරීමේදී 2017 වසරේදී දෙමුහුම් බීජ නිෂ්පාදන සැලකිය යුතු මට්ටමක් දක්වා ඉහළ ගියේය.

**වගු අංක 2.1.1.4: 2016 සහ 2017 වර්ෂ තුළදී වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදිත භූමි ප්‍රමාණය**

| ප්‍රභවය | බීජ පන්තිය | 2016 ලියාපදිංචි භූමි ප්‍රමාණය (හෙ.) | 2016 පරීක්ෂා කළ භූමි ප්‍රමාණය (හෙ.) | 2017 ලියාපදිංචි භූමි ප්‍රමාණය (හෙ.) | 2017 පරීක්ෂා කළ භූමි ප්‍රමාණය (හෙ.) | පිළිගත් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| පර්යේෂණ මධ්‍යස්ථාන | අභිජනන | 5.46 | 5.38 | 3.98 | 3.75 | 94 |
| රජයේ ගොවිපළ | අත්තිවාරම් | 16.58 | 13.38 | 30.21 | 28.70 | 95 |
| | ලියාපදිංචි I | 43.09 | 37.24 | 61.31 | 56.88 | 93 |
| | ලියාපදිංචි II | | | 0.4 | 0.4 | 100 |
| | සහතික I | 7.29 | 4.45 | 6.4 | 4.8 | 75 |
| | සහතික II | 1.42 | 0.81 | | | |
| | දෙමුහුම් | 2.02 | 1.82 | 6.6 | 6.2 | 94 |
| | වෙළඳ I | 2.83 | 2.63 | 1.01 | 1.01 | 100 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | අත්තිවාරම් | | | 2.83 | 2.83 | 100 |
| | ලියාපදිංචි I | 98.28 | 74.29 | 320.20 | 245.80 | 77 |
| | ලියාපදිංචි II | 4.45 | 4.45 | 31.42 | 24.92 | 79 |
| | සහතික I | 261.7 | 194.09 | 868.21 | 811.76 | 93 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | ලියාපදිංචි II | 164.57 | 76.11 | 211.70 | 150.00 | 71 |
| | දෙමුහුම් | | | 7.40 | 7.40 | 100 |
| | වෙළඳ I | 27.63 | 12.04 | 160.08 | 121.22 | 76 |
| | වෙළඳ II | 31.28 | 27.94 | 11.30 | 8.40 | 74 |
| පෞද්ගලික වගාකරුවන් | ලියාපදිංචි I | 6.07 | 0.81 | 2.40 | 2.40 | 100 |
| | සහතික I | 11.53 | 4.66 | 133.62 | 128.20 | 96 |
| | සහතික II | 6.58 | 0.4 | | | |
| | වෙළඳ I | 1.21 | 0.2 | 18.92 | 18.18 | 96 |
| | වෙළඳ II | 0.81 | 0.81 | 16.30 | 15.20 | 93 |
| | දෙමුහුම් | | | 5.8 | 5.4 | 93 |
| **එකතුව** | | **692.8** | **457.3** | **1,900.09** | **1,643.45** | **86** |

2017 වර්ෂය තුළදී වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ මුළු නිෂ්පාදනය මෙ.ටො. 1573ක් වූ අතර මෙම නිෂ්පාදනයෙන් 82.5%ක් සහතික කරනු ලැබිණි. මෙම ප්‍රමාණය 2016 වර්ෂය හා සැසඳීමේදී 164%ක සුවිශාල වැඩිවීමකි. 2.1.1.5 වගුව මගින්

විවිධ ප්‍රභවයන් මගින් නිෂ්පාදනය කරනු ලැබූ බීජ ප්‍රමාණයන් සහ පිළිගත් ප්‍රතිශතයක් පෙන්නුම් කරනු ලබයි. මීට අමතරව 2017 දී වෙනත් ක්ෂේත්‍ර බෝග මෙ.ටො. 332ක් 'සී' නියැදි සඳහා පරීක්ෂා කළ අතර ඉන් 77%ක් පිළිගනු ලැබීය. 'සී' නියැදි යනු, දිර්ඝ කාලයක් තුල ශිත තත්ත්වයේ ගබඩා කොට, එම බීජ වල තත්ත්වය සම්බන්ධයෙන් කාලයෙන් කාලයට රසායනාගාර පරීක්ෂාවට ලබාගන්නා වූ බීජ සාම්පලය.

**වගු අංකය 2.1.1.5: 2016 සහ 2017 වර්ෂ තුළදී පරීක්ෂා කළ වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ ප්‍රමාණය**

| ප්‍රභවය | 2016 | | 2017 | |
|---|---|---|---|---|
| | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො) | පිළිගත් ප්‍රමාණය (%) | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො) | පිළිගත් ප්‍රමාණය (%) |
| පර්යේෂණ මධ්‍යස්ථාන | 2.4 | 69.7 | 2.3 | 89 |
| රජයේ ගොවිපළ | 82.7 | 91.7 | 315.0 | 81 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | 502.7 | 91.4 | 1025.2 | 86 |
| පෞද්ගලික වගාකරුවන් | 6.7 | 83.9 | 230.8 | 71 |
| **එකතුව** | **594.5** | | **1,573.3** | |

## එළවළු බීජ නිෂ්පාදනය සහතික කිරීම

එළවළු බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි භූමි ප්‍රමාණය හෙ. 156ක් වූ අතර මෙයින් 66%ක් පෞද්ගලික සහ කොන්ත්‍රාත් වගාකරුවන් ගේය. 1996 සිට එළවළු බීජ නිෂ්පාදන වැඩසටහන සඳහා වූ භූමි ප්‍රමාණය 77%ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. 2.1.1.6 වගුව මගින් විවිධ ප්‍රභවයන් සහ බීජ පන්ති යටතේ ලියාපදිංචි භූමි ප්‍රමාණය පෙන්නුම් කරනු ලබයි. මෙම බීජ නිෂ්පාදන වැඩසටහන සඳහා තක්කාලි, බණ්ඩක්කා, මිරිස්, රතු ළූණු, ලොකු ළූණු, පතෝල, බෝංචි, බටු කරවිල, රාබු, වැටකොළු, මාළුමිරිස්, මෑ, පිපිඤ්ඤා, වට්ටක්කා, තම්පලා, එළවළු, කව්පි, දඹල, කොමඩු සහ පැපොල් ඇතුලත් කොට තිබුණි.

**වගු අංකය 2.1.1.6: 2016 සහ 2017 වර්ෂ වලදී විවිධ ප්‍රභවයන් සහ පන්ති යටතේ එළවළු බීජ නිෂ්පාදනය භූමි ප්‍රමාණය (හෙ.)**

| ප්‍රභවය | බීජ පන්ති | 2016 | | 2017 | | |
|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි භූමි ප්‍රමාණය (හෙ.) | පිළිගත් භූමි ප්‍රමාණය (හෙ.) | ලියාපදිංචි භූමි ප්‍රමාණය (හෙ.) | පිළිගත් භූමි ප්‍රමාණය (හෙ.) | පිළිගත් ප්‍රතිශතය (%) |
| පර්යේෂණ මධ්‍යස්ථාන | අභිජනන | 1.71 | 1.21 | 1.34 | 1.16 | 87 |

| ප්‍රභවය | බීජ පන්ති | 2016 | | 2017 | | |
|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි භූමි ප්‍රමාණය (හෙ.) | පිළිගත් භූමි ප්‍රමාණය (හෙ.) | ලියාපදිංචි භූමි ප්‍රමාණය (හෙ.) | පිළිගත් භූමි ප්‍රමාණය (හෙ.) | පිළිගත් ප්‍රතිශතය (%) |
| රජයේ ගොවිපළ | මූලික | 1.42 | 1.21 | 12.63 | 11.50 | 91 |
| | ප්‍රමිති I | 19.5 | 14.4 | 30.40 | 25.59 | 84 |
| | ප්‍රමිති II | | | 1.00 | 1.00 | 100 |
| | දෙමුහුම් | 0.2 | 0.2 | 1.02 | 0.87 | 85 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | ප්‍රමිති I | 30.27 | 20.63 | 36.01 | 28.71 | 80 |
| | ප්‍රමිති II | | | 20.71 | 20.41 | 99 |
| | වෙළඳ I | | | 1.10 | 1.10 | 100 |
| පෞද්ගලික වගාකරුවන් | ප්‍රමිති I | 34.81 | 26.01 | 47.40 | 39.70 | 84 |
| | වෙළඳ I | | | 4.60 | 4.20 | 91 |
| **එකතුව** | | **88.43** | **63.66** | **156.21** | **134.24** | **86** |

**වගු අංක 2.1.1.7: 2016 සහ 2017 වර්ෂ වලදී පරීක්ෂා කළ එළවළු බීජ ප්‍රමාණය**

| ප්‍රභවය | 2016 | | 2017 | |
|---|---|---|---|---|
| | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො) | පිළිගත් ප්‍රතිශතය (%) | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො) | පිළිගත් ප්‍රතිශතය (%) |
| පර්යේෂණ මධ්‍යස්ථාන | 0.30 | 91.25 | 0.11 | 98 |
| රජයේ ගොවිපළ | 7.55 | 86.17 | 27.1 | 82 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | 11.56 | 95.93 | 14.9 | 67 |
| පෞද්ගලික වගාකරුවන් | 9.27 | 94.33 | 5.9 | 72 |
| **එකතුව** | **28.68** | | **48.0** | |

2017 වර්ෂය තුළදී සම්පූර්ණ එළවළු බීජ නිෂ්පාදනය මෙ.ටො. 48ක් වූ අතර මෙයින් මෙ.ටො. 37ක් සහතික කරනු ලැබිණි. 2016 වර්ෂය හා සැසදීමේදී මෙය 67%ක වැඩිවීමකි. පරීක්ෂා කළ ප්‍රමාණය සහ විවිධ ප්‍රභවයන්ගෙන් පිළිගත් ප්‍රතිශතය 2.1.1.7 වගුව මගින් පෙන්නුම් කරනු ලබයි. එමෙන්ම, මෙ.ටො. 69ක් 'සී' නියැදි ලෙස පරීක්ෂාවට භාජනය වූ අතර ඉන් 95%ක් පිළිගනු ලැබිණි.

## බීජ අර්තාපල් සහතික කිරීම

විවිධ බීජ පන්ති යටතේ වගා කළ අර්තාපල් භූමි ප්‍රමාණය 2.1.1.8 වගුව මගින් පෙන්නුම් කරනු ලබයි. බීජ අර්තාපල් වගා කළ සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙ. 77ක් වූ අතර ජනප්‍රිය බීජ

අර්තාපල් ප්‍රභේද (ග්‍රැනෝලා) මෙ.ටො. 701ක් සහතික කරනු ලැබිණි. 2016 වසර හා සැසඳීමේදී 2017 වර්ෂයේදී ලියාපදිංචි භූමි ප්‍රමාණය 14% වැඩි වූ අතර නිෂ්පාදනය 1.96%කින් අඩු විය. ආරක්ෂිත ගෘහ තුල කුඩා ආකන්ද 1,087,416ක් නිෂ්පාදනය කරනු ලැබීය. එය 2016 හා සැසඳීමේදී 20%ක අඩුවීමකි. විවිධ මූලාශ්‍ර යටතේ පරීක්ෂණයට භාජනය කරන ලද කුඩා ආකන්ද ප්‍රමාණය වගු අංක 2.1.1.9 පෙන්නුම් කෙරේ.

**වගු අංක 2.1.1.8 : 2016 සහ 2017 වර්ෂවලදී බීජ අර්තාපල් වගා භූමි ප්‍රමාණය**

| ප්‍රභවය | පන්තිය | 2016 ලියාපදිංචි භූමි ප්‍රමාණය (හෙ.) | 2016 පිළිගත් භූමි ප්‍රමාණය (හෙ.) | 2017 ලියාපදිංචි භූමි ප්‍රමාණය (හෙ.) | 2017 පිළිගත් භූමි ප්‍රමාණය (හෙ.) | පිළිගත් ප්‍රමාණය (හෙ.) |
|---|---|---|---|---|---|---|
| රජයේ ගොවිපළ | පූර්ව මූලික | 0.19 | 0.19 | | | |
| | මූලික | 5.82 | 5.41 | 16.72 | 16.3 | 247.19 |
| | සහතික I | 50.51 | 49.20 | 0.13 | 0.13 | 1.73 |
| | සහතික II | | | 39.11 | 38.51 | 372.74 |
| පෞද්ගලික වගාකරුවන් | සහතික I | 10.93 | 10.93 | 20.24 | 20.24 | 69.35 |
| | සහතික II | | | 0.81 | 0.81 | 100 |
| **එකතුව** | | **67.45** | **65.73** | **77.01** | **75.99** | **701.01** |

**වගු අංකය 2.1.1.9 : අර්තාපල් කුඩා ආකන්ද නිෂ්පාදනය**

| ප්‍රභවය | | 2016 ප්‍රමාණය | 2016 කුඩා ආකන්ද ප්‍රමාණය | 2017 ප්‍රමාණය | 2017 කුඩා ආකන්ද ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| රජයේ ගොවිපළ | පැළ සංඛ්‍යාව | 50,067 | 877,980 | 86,404 | 769,735 |
| | වපසරිය (ව.මී.) | 1,961 | 333,959 | 1,543 | 224,109 |
| පෞද්ගලික වගාකරුවන් | පැළ සංඛ්‍යාව | 4,710 | 73,102 | 18,401 | 93,572 |
| | බඳුන් ප්‍රමාණය | 1,970 | 18,925 | | |
| | වපසරිය (ව.මී.) | 100 | 60,000 | | |
| **එකතුව** | | | **1,363,966** | | **1,087,416** |

## තොග විභජනය

බීජ නිෂ්පාදන වැඩසටහන් සඳහා බීජ නිකුත් කිරීමට පෙර ගබඩාකර ඇති සහතික කරන ලද බීජ තොග කුඩා ප්‍රමාණ වලට විභජනය කෙරේ. සහතික කරන ලද ගබඩා කර ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හා පෞද්ගලික අංශයේ බීජ, නිෂ්පාදකයින් හට එම බීජ තොග විභජනය කිරීම සඳහා බීජ සහතික කිරීමේ සේවයේ සේවය ලබාගත හැකිය.

2017 වසර තුල, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු බීජ වල විභජනය කර ඇති බීජ තොග පිලිබඳ දත්ත වගු අංක 2.1.1.10හි දැක්වේ.

**වගු අංක 2.1.1.10 : තොග විභජනන ප්‍රමාණය 2017**

| බෝගය | තොග සංඛ්‍යාව | තොග ප්‍රමාණය (කි.ග්‍රෑ) | තොග විභජන සංඛ්‍යාව |
|---|---|---|---|
| වෙනත් ක්ෂේත්‍ර බෝග | 258 | 26,364.5 | 3,653 |
| එළවළු | 583 | 3,806.8 | 2,518 |
| **එකතුව** | **841** | **30,171.3** | **6,171** |

## බීජ පරීක්ෂණ

පේරාදෙණිය, මහඉලුප්පල්ලම, අලුත්තරම සහ බටඅත යන බීජ පරීක්ෂණයේදී ගුණාත්මය සහතිකකරණය සඳහා බීජ නියැදි 15,428ක් පරීක්ෂා කරනු ලැබිණි.

## බීජ ස්වස්ථතා පරීක්ෂණ ඒකකය

බීජ වලින් හටගන්නා රෝගකාරක පරීක්ෂා කිරීම සඳහා බීජ සාම්පල 152ක්, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තු බීජ සෞඛ්‍ය පරීක්ෂණාගාරයේදී පරීක්ෂණයට භාජනය කෙරිණි.

## රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම

රජයේ පැල තවාන් සහ පෞද්ගලික පැල තවාන්වල වගා කරනු ලැබූ පලතුරු පැල 577,777ක් සහතික කර නාමකරණය කරනු ලැබිණි. (වගුව 2.1.1.11)

**වගු අංක 2.1.1.11: 2016 සහ 2017 වර්ෂයන්හි සහතික කළ බද්ධ පලතුරු පැළ සංඛ්‍යාව**

| විශේෂය | සහතික කළ පැළ සංඛ්‍යාව | |
|---|---|---|
| | 2016 | 2017 |
| අඹ | 328,707 | 323,160 |
| රඹුටං | 109,999 | 51,334 |
| දොඩම් | 251,477 | 184,388 |
| අලිපේර | 5,081 | 2,395 |
| දූරියන් | 2,818 | 4,813 |
| කොස් | 4,257 | 7,831 |
| පෙයාර්ස් | 1,653 | 1,764 |
| ගොරකා | | 1,482 |
| වෙනත් | 1,009 | 610 |
| **එකතුව** | **704,101** | **577,777** |

## පැල තවාන් ලියාපදිංචිය

2017 වර්ෂයේදී ලියාපදිංචි කළ සම්පූර්ණ පැළ තවාන් සංඛ්‍යාව 324කි.

## මවු ශාක සහතික කිරීම

2016 වර්ෂය තුළදී අඹ, රඹුටං, දෙහි, දූරියන්, කාමරංගා සහ උගුරැස්ස මවු ශාක 586ක් තෝරා ලියාපදිංචි කෙරිණි.

**වගු අංකය 2.1.1.12: 2016 සහ 2017 වර්ෂයේදී ලියාපදිංචි කළ සම්පූර්ණ මවු ශාක සංඛ්‍යාව**

| විශේෂය | ලියාපදිංචි කළ පැල සංඛ්‍යාව | |
|---|---|---|
| | 2016 | 2017 |
| අඹ | 99 | 518 |
| රඹුටං | 42 | 41 |
| දෙහි | 50 | 20 |
| අලිපේර | 1 | |

| විශේෂය | ලියාපදිංචි කළ පැල සංඛ්‍යාව | |
|---|---|---|
| | 2016 | 2017 |
| දූරියන් | 32 | 2 |
| කොස් | 4 | |
| වෙනත් | 7 | 5 |
| **එකතුව** | **235** | **586** |

## පශ්චාත් පාලන පරීක්ෂණ

බීජ සාම්පල 830ක් ඇගයීම් උදෙසා පසු පාලන පරීක්ෂණ සිදු කරනු ලැබිණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තු සහතික බීජ, විවිධ බෝග ප්‍රභේදයන්හි ආනයනික බීජ, අර්තාපල් බීජ, වෙළඳපලින් ලබා ගත් බීජ සහ ගැටළුකාරී බීජ මේ යටතේ පරීක්ෂා කරනු ලැබිණි. විවිධ බෝග කාණ්ඩයන් යටතේ සිදු කළ පසු පාලන පරීක්ෂණ සංඛ්‍යාව (2.1.1.13 වගුවෙහි) දැක්වේ.

**වගු අංක 2.1.1.13: පරීක්ෂා කළ පසු පාලන නියැදි සංඛ්‍යාව**

| බෝග කාණ්ඩය | පරීක්ෂා කළ තොග සංඛ්‍යාව |
|---|---|
| වී | 120 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග | 146 |
| එළවළු | 239 |
| පලතුරු | 3 |
| අර්තාපල් | 108 |
| ගැටළුකාරි සාම්පල | 18 |
| දෙමුහුම් පරීක්ෂාව | 14 |
| පර්යේෂණ නියැදි | 110 |
| වෙනත් | 39 |
| **එකතුව** | **830** |

## DUS පරීක්ෂණය

ගන්නෝරුව පසු පාලන ක්ෂේත්‍ර වලදී සහල් ප්‍රභේද හයක් (At 08-617, At - 1078, Bg 08-1909, Bg 1258, Bw 11-3403, Bw 3-1198, CIC 2.5-2, IRDTN 7-11, MA - 2, Zhonghuna -1) පරීක්ෂණයට භාජනය කරන ලදී. එමෙන්ම එළවළු ප්‍රභේද 6ක් සහ වෙනත් ක්ෂේත්‍ර බෝග වර්ග 15ක් පලතුරු ප්‍රභේද 1 සහ මවු පෙළපත් 2ක් ගන්නොරුව, මහඉලුප්පල්ලම සහ බටඅත පසු පාලන ක්ෂේත්‍ර වලදී ද පරීක්ෂාවට ලක් කෙරිණි. සමාලෝචිත වසර තුල සහල් ප්‍රභේද 6ක්, එළවළු ප්‍රභේද 1 සහ වෙනත් ක්ෂේත්‍ර බෝග වර්ග 13ක, එක් පලතුරු ප්‍රභේදයක් සහ එහි මවු පෙළපත් 2ක DUS පරීක්ෂණ සම්පුර්ණ කරනු ලැබිණි. (වගුව 2.1.1.14)

**වගු අංකය 2.1.1.14 : පැවැත් වූ DUS පරීක්ෂණ සංඛ්‍යාව**

| බෝග කාණ්ඩය | පවත්වනු ලැබූ පරීක්ෂණ සංඛ්‍යාව | සම්පූර්ණ කළ පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|
| වී | 11 | 6 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග | 15 | 13 |
| එළවළු | 6 | 1 |
| පලතුරු | 3 | 3 |
| **එකතුව** | **35** | **23** |

## බීජ පනත ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ ඉතාමත් වැදගත් අංශයක් වන බීජ කර්මාන්තයට ඉතාමත් අහිතකර තත්ත්වයන් උදාකරන අකටයුතුකම් වලින් ගොවියා සහ බීජ හසුරුවන්නන් ආරක්ෂා කිරීමේ අරමුණු ඇතිව 2003 අංක 22 දරන බීජ පනත 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. 2017 වර්ෂය තුළදී බීජ හසුරුවන්නන් 917දෙනෙකු අලුතෙන් ලියාපදිංචි වනු ලැබූ අතර 890දෙනෙකුගේ ලියාපදිංචි අලුත් කරනු ලැබිණි. පැමිණිලි 21ක් ලැබුණු අතර එම පැමිණිලි පිළිබඳ පරීක්ෂා කොට ගොවීන්

ආරක්ෂා කිරීම උදෙසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබිණි.

වර්තමාන තත්ත්වයට යෝග්‍ය පරිදි ප්‍රවේශවීම උදෙසා බීජ හසුරුවන්නන්ගේ පරිශ්‍ර 262ක් අහඹු ලෙස පරීක්ෂා කල අතර වෙළඳපලට නිකුත් කිරීමට පෙර බීජ හා රෝපණ ද්‍රව්‍ය විධිමත් ආකාරයෙන් හැසිරවීම උදෙසා ඔවුන්ට අවශ්‍ය උපදෙස් දෙනු ලැබිණි. බීජ සහ රෝපණ ද්‍රව්‍ය වල නිෂ්පාදනය සහ බෙදාහැරීමේ තත්ත්වය උසස් මට්ටමෙන් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමේ අරමුණින්, ජාතික බීජ කවුන්සිලයේ ප්‍රථම කමිටු රැස්වීම 2017 නොවැම්බර් 29 දින පැවැත්විණි. ලේබල් 160ක් අනුමත කරන ලද අතර, රාජ්‍ය හා පුද්ගලික අංශයේ නිලධාරීන් සහ බීජ හසුරුවන්නන් 3,365ක් දැනුවත් කිරිම සඳහා පුහුණු වැඩසටහන් 35ක් පවත්වන ලදී.

## පර්යේෂණ සහ සංවර්ධන

### පර්යේෂණ ව්‍යාපෘති

- ආසියානු කලාපයේ සංක්‍රමණික රෝග සහ කෘමි පළිබෝධකයින් සඳහා වසංගතවේදය පිළිබඳ තොරතුරු හුවමාරු පද්ධතියක් සැකසීම පිළිබඳ සහයෝගීතා වැඩසටහන (IPM) (AFACI)
- එළවළු බීජ ආස්තරණ ආලේපනය කිරිමේ තාක්ෂණය වැඩිදියුණු කිරීම

### ගුවන් විදුලි වැඩසටහන්

බීජ සහතික කිරීමේ සේවය 2017 වර්ෂයේදී ගුවන් විදුලි වැඩසටහන් 7ක් සඳහා සහභාගි විය. එනම්, කඳුරට සේවයේ "අස්වැන්න", ස්වාධින රූපවාහිනියේ "ගොවිජන මඩල", ස්වදේශිය සේවයේ "ගොවි ගෙදර" වැඩසටහන් 2ක්, රන්ගිර ගුවන් විදුලි සේවයේ "රන්සවිය", වයඹ ගුවන් විදුලියේ වැඩසටහන් 2කටද සහභාගි විය.

### රූපවාහිනි වැඩසටහන්

බීජ පනත, ක්ෂේත්‍ර අධීක්ෂණ අංශයේ බහුවාර්ෂික බෝග වගා අංශයේ සහ බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රභේදීය අංශයේ කාර්යන් පිළිබඳව වූ ජාතික රූපවාහිනියේ "ගොවිබිමට අරුණළු" සහ "නුගසෙවන" යන රූපවාහිනි වැඩසටහන් 5ක් සඳහා සහභාගි විය.

### පුහුණු වැඩසටහන්

ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම උදෙසා නිලධාරීන්ගේ සහ බීජ හසුරුවන්නන්ගේ දැනුම වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන් බීජ සහතික කිරීමේ සේවය මගින් අඛණ්ඩව පැවැත්වේ. (වගුව 2.1.1.15)

**වගු අංක 2.1.1.15: පුහුණු කරනු ලැබු නිලධාරීන් සහ බීජ හසුරුවන්නන්ගේ සංඛ්‍යාව**

| පුහුණු වැඩසටහන් | පුහුණු වූ සංඛ්‍යාව |
|---|---|
| බීජ ගොවීන් | 193 |
| තවාන්කරුවන් | 176 |
| රාජ්‍ය සේවකයන් | 1095 |
| පෞද්ගලික බීජ හසුරුවන්නන් | 224 |
| වෙනත් බීජ හසුරුවන්නන් | 553 |
| **එකතුව** | **2,241** |

## ආනයනික බීජ නාමකරණය

වෙනත් ක්ෂේත්‍ර බෝග සහ බෝග වර්ග ආනයනය කිරීමෙන් අනතුරුව, ඒවා ශ්‍රී ලංකාවේ ගොවිනට හුරුපුරුදු නාමයන්ගෙන් වාණිජකරණය කරනු ලැබේ. නාමකරණ කමිටුව බීජ සහතික කිරීමේ සේවයේ අතිරේක අධ්‍යක්ෂවරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වන අතර, එහි අනෙකුත් සාමාජිකයන් බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, උද්‍යාන බෝග පර්යේෂණ හා සවංර්ධන ආයතනය සහ ජාතික ශාක නිරෝධායන සේවය යන ආයතන නියෝජනය කරයි. මෙම කමිටුව 2013 දී ආරම්භ කරන ලද අතර, සමාගම් 16ක් සඳහා නාමකරණ 70ක් අනුමත කරන ලදී.

## විදේශීය පුහුණු

පහත වගුවෙන් දැක්වෙන ලෙස නිලධාරීන් දහනව දෙනෙකු සඳහා චීනය, ජපානය, ඉන්දුනීසියාව, ඊජිප්තුව සහ තායිලන්තය යන රටවල් වලදී පුහුණු පාඨමාලා ලබා දෙන ලදී.

**වගු අංක 2.1.1.16: 2017 වර්ෂය තුල විදේශ පුහුණු**

| රට | පුහුණු සඳහා නිලධාරීන් සංඛ්‍යාව | පුහුණු මාතෘකා |
|---|---|---|
| ජපානය | 1 | උසස් තත්ත්වයේ බීජ බෙදා හා සඳහා බීජ ප්‍රභේද ආරක්ෂණය සඳහා වූ ගුණාත්ම පාලන ක්‍රමවේදයන් |
| චීනය | 9 | හරිත ආර්ථික සහ පරිසර ආරක්ෂණය, කාබනික බෝග වගාව, සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කෘෂි නිෂ්පාදන වල ගුණාත්මක තත්ත්වය සහ ආරක්ෂාව, දෙමුහුන් බඩඉරිඟු වැඩිදියුණු කිරීමේ තාක්ෂණය, මී මැසි පාලනය, දෙමුහුම් වී වැඩි අස්වනු තාක්ෂණය |
| ඊජිප්තුව | 1 | එළවළු නිෂ්පාදනය |
| ඉන්දුනීසියාව | 1 | ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ වැඩමුළුව |

## 2018 වසර සඳහා සැලැස්ම

- සහතික කරන ලද බීජ මඟින් 30%ක් වූ ජාතික බිත්තර වී අවශ්‍යතාවය පූර්ණ කර ගැනීම උදෙසා බීජ සහතික කිරීමේ සේවය බලගැන්වීම.
- පරන්තන් බීජ පරීක්ෂණාගාරය ක්‍රියාත්මක කරමින් උතුරු පළාතේ බීජවල ගුණාත්මක තත්ත්වය පරීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම.
- විශේෂයෙන් බීජ ඇසුරුම් කිරීම, ගබඩා කිරීම සහ කල් ඉක්තුවීමේ දින පිළිබඳව බීජ හසුරුවන්නන් විසින් මුහුණදෙන ගැටළු සම්බන්ධයෙන් බීජ පර්යේෂණ පැවැත්වීමට බීජ පර්යේෂණ ඒකක ස්ථාපිත කිරීම.
- බීජ හසුරුවන්නන් සඳහා ලියාපදිංචි කිරීමේ ජංගම පද්ධතියක් ස්ථාපිත කිරීම.
- ප්‍රධාන බෝග වල බීජ මගින් පැතිරෙන රෝග සඳහා ව්‍යාධිජනකයින් හඳුනාගැනීමට සමීක්ෂණ පැවැත්වීම.
- ප්‍රධාන බෝගවල බීජමය ව්‍යාධිජනක හඳුනාගැනීම සඳහා වූ පර්යේෂණ තාක්ෂණයන් හඳුනා ගැනීම.
- ගබඩා කරන්නා වූ එළවළු බීජවල ගබඩා කිරීමේ හැකියාව සහ බීජ ස්වස්ථතාව පිළිබඳව බීජවල ඇතිවන

ව්‍යාධිජනක වල බලපෑම අධ්‍යයනය කිරීම.

- මනා ලෙස බීජ ගබඩා කිරීම සඳහා සියෝලයිට් බිඩ් තාක්ෂණය යොදා ගනිමින් බීජ වියලීමේ තාක්ෂණය වැඩිදියුණු කිරීම.
- බීජ කර්මාන්තයේ අකටයුතුකම් මඟහරවන අතර රට තුළ ඉහළ ගුණාත්මක තත්තවයෙන් යුත් බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාගැනීම උදෙසා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ බීජ හසුරුවන්නන් අතර වූ බීජ නිෂ්පාදන ක්‍රියාවලිය නියාමනය උදෙසා බීජ පනත ක්‍රියාත්මක කිරීම.
- සියලුම බීජ හසුරුවන්නන් අතර බෙදා හැරීම සඳහා ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් සැකසීම.
- DUS පරික්ෂාව සිදුකිරීම සඳහා තෝරාගත් බෝග ප්‍රභේද සඳහා ජාතික මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙල කිරීම.
- වෙනත් ක්ෂේත්‍ර බෝග කාණ්ඩයට අයත් ප්‍රභේද හඳුනා ගැනීම සඳහා ජංගම දුරකථන මෘදුකාංගයක් නිර්මාණය කිරීම.
- එක් එක් වගා කාලයන්හිදී බීජ නිෂ්පාදකවරුන්ගේ නාමාවලිය සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකවරුන්ගේ නාමාවලිය සැකසීම හා බෙදාහැරීම
- බීජ හසුරුවන්නන් සඳහා බෝග මාර්ගෝපදේශ සංග්‍රහයන් ප්‍රකාශයට පත්කිරීම.
- ජනතාව දැනුවත් කිරීම උදෙසා මවු ශාක නාමාවලියක් ප්‍රකාශයට පත් කිරීම.
- පලතුරු පැළ ලාක්ෂණීකරණය
- බීජ ගොවීන් සහ තවාන්කරුවන් සඳහා ගුණාත්මක තත්ත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා පුහුණු මොඩියුල සකස් කිරීම.
- මොණරාගල බීජ සහතික කිරීමේ සේවයේ උප කාර්යාලයක් ඉදිකිරීම.
- බීජ සහතික කිරීමේ සේවයේ ඒකක කාර්ය මණ්ඩලය සහ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම.

## කාර්ය මණ්ඩලය

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 02 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 12 |
| කෘෂිකර්ම උපදේශක (විශේෂ) | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 03 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 02 |
| සංවර්ධන නිලධාරි | 16 |
| කෘෂිකර්ම උපදේශක | 110 |
| පර්යේෂණ සහකාර | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 09 |
| තාක්ෂණ සහායක | 43 |
| බීජ කාර්මික | 18 |
| රියදුරු | 15 |
| පස් අඳින යන්ත්‍ර | 03 |
| ගබඩා භාරකරු | 01 |
| විදුලි ශිල්පි | 01 |
| පර්යේෂණ උප සහකාර | 03 |
| බීජකරු | 31 |
| ගබඩාකරු | 01 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| මුරකරු | 36 |
| කම්කරු (ස්ථිර) | 104 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 32 |
| **එකතුව** | **448** |

## 2.1.2. පැළෑටි සංරක්ෂණ සේවය - ගන්නොරුව

1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනතේ සඳහන් කෙරෙන නියාමන ක්‍රියාකාරකම් දිවයින තුළදී ඉටු කිරීම පැළෑටි සංරක්ෂණ සේවයට පැවරී ඇති සුවිශේෂී කාර්යභාරය වේ. දිවයිනට ඇතුල්වන විදේශික පලිබෝධයක් බෝග වලට හානිදායක ලෙස ක්‍රියාත්මක වන අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් උචිත පාලන හා අවදානම අඩු කිරීමේ ක්‍රියා මාර්ග යොදා ගැනීමේ වගකීම පැළෑටි සංරක්ෂණ සේවය සතු වේ.

පලිබෝධ/ රෝග පැතිරීම පාලනය කිරීම, වී හා එළවළු පිළිබඳ ක්ෂේත්‍ර මට්ටමේ සමෝධානික පලිබෝධ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නියාමනය හා ඇගයීම, ධූමායනය මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ වල බීජ ගබඩා තොග වල පලිබෝධ කළමනාකරණය සහ පලිබෝධනාශක හා පලිබෝධ කළමනාකරණය පිළිබඳව පර්යේෂණ හා පරීක්ෂණ පැවැත්වීම පැළෑටි සංරක්ෂණ සේවයේ ප්‍රධාන කාර්යයන් ලෙස දැක්විය හැක.

එමෙන්ම, කෘෂිකාර්මික පරිසර කෙරෙහි ජලජ වල් පැළෑටි හා ආක්‍රමණික පැළෑටි වලින් ඇති කෙරෙන බලපෑම අවම කිරීම, නිලධාරීන් හා ගොවීන් පුහුණු කිරීම, නව පලිබෝධනාශක නියමු පරිමාණයෙන් ඇගයීම, කෘෂිකාර්මික බෝග වල පැළෑටි ස්වස්ථතාව තහවුරු කිරීමට නිර්දේශිත පලිබෝධනාශකවල සඵලත්වය යළි තහවුරු කිරීම යන කාර්යයන්ද පැළෑටි සංරක්ෂණ සේවයට පැවරී ඇති කාර්යයන් වේ.

මීට අමතරව වර්තමානයේ දිවයිනේ දිස්ත්‍රික්ක 24ක ක්‍රියාත්මක වන වැඩසටහනක් වන ස්ථිර බෝග සායන වැඩසටහනේ (PCCP) ක්‍රියාකාරකම් සමායෝජනය කිරීමේ කාර්ය භාරය ද පැළෑටි සංරක්ෂණ සේවයට පැවරී ඇත.

**දැක්ම**

පැළෑටි සංරක්ෂණය තුළින් ජාතික සෞභාග්‍යය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය අත්පත් කර ගැනීම.

**මෙහෙවර**

1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනතේ ප්‍රතිපාදන ක්‍රියාවට නැංවීම මගින් පලිබෝධ හා ආක්‍රමණික ආගන්තුක විශේෂ සෞඛ්‍ය සම්පන්න ලෙස, අඩු පිරිවැයකින්, පරිසර හිතකාමී ලෙස හා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම, ප්‍රවර්ධනය හා සංවර්ධනය.

## අයවැය

**වගු අංක 2.1.2: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 2,112,947 | 1,814,598 | 86 |
| මූලධන | 2,094,000 | 1,648,915 | 79 |
| ව්‍යාපාති | | | |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන | 1,800,000 | 1,580,000 | 88 |
| **එකතුව** | **6,006,947** | **5,043,513** | **84** |

## ප්‍රගතිය

### 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම

පැළෑටි සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීමට බලයලත් නිලධාරීන් ලෙස නව නිලධාරීන් 119 දෙනෙක් (වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් නිලධාරීන් 24 දෙනෙක් හා ජාතික පැළෑටි නිරෝධායන සේවයෙන් නිලධාරීන් 95 දෙනෙක්) සෘජුවම පත් කරන ලදී. ඔවුන්ට,

- 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනතේ නීති සම්පාදක පසුබිම පිළිබඳව,
- ක්ෂේත්‍ර මට්ටමේ දී පැළෑටි සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳව,
- ශ්‍රී ලංකාවේ දී නිරෝධායන වැදගත්කමකින් යුතු නව පළිබෝධ පිළිබඳව,
- ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය පිළිබඳව හා,
- ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ (IAS) හඳුනා ගැනීම හා කළමනාකරණය කිරීම පිළිබඳව පුහුණුවීම් ලබා දෙන ලදී.

1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත පිළිබඳව බලයලත් නිලධාරීන් හතලිස් පස් දෙනෙක් ගන්නොරුව සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේදී පුහුණු කරන ලදී.

### සමෝධානික පළිබෝධ කළමනාකරණය (IPM) ප්‍රවර්ධනය හා යහපත් කෘෂිකාර්මික භාවිතා (GAP)

මානව සෞඛ්‍ය හා පරිසරය කෙරෙහි ඉතා අඩු බලපෑමක් සහිතව පැළෑටි සුරක්ෂිතතාව පවත්වා ගැනීම සඳහා සිදු කරනු ලබන ක්‍රියාකාරකම් / ක්‍රියාදාම සමෝධානික පළිබෝධ කළමනාකරණය (IPM) හා යහපත් කෘෂිකාර්මික භාවිතා (GAP) ලෙස හැඳින්වේ. ගොවි ක්ෂේත්‍ර මට්ටමේදී කාර්යක්ෂම පළිබෝධ කළමනාකරණයක් සඳහා රසායනික නොවන පළිබෝධ කළමනාකරණ ක්‍රමවේද භාවිතා කිරීම ප්‍රවර්ධනය කරමින් පළිබෝධ නාශක භාවිතය අවම කිරීමට විශේෂ අවධානයක් යොමු කරමින් IPM හා GAP පිළිබඳව ව්‍යාප්ති නිලධාරීන්ගේ හා ගොවි ප්‍රජාවේ දැනුම ඉහළ නැංවීමට වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන වී, එළවළු, පලතුරු හා වෙනත් ක්ෂේත්‍ර බෝග යන බෝග වර්ග හතර පිළිබඳව අවධානය යොමු කරන ලදී.

#### • වී IPM / GAP වැඩසටහන

ශ්වේත විප්ලවය යනු පළිබෝධනාශක බුද්ධිමත්ව භාවිතා කිරීම ප්‍රවර්ධනය කරන කෘෂිකර්ම දෙපාර්තමේන්තු නව සංකල්පයයි. මෙම වැඩසටහනේ ප්‍රධාන අභිමතාර්ථය වන්නේ පළිබෝධනාශක හේතුවෙන් ඇතිවන සෞඛ්‍ය ගැටළු හා පරිසර දූෂණය මැඩ පැවැත්වීමට පළිබෝධනාශක භාවිතය අඩු කිරීමයි. මෙම වර්ෂය තුළදී, මෙම පුහුණුවීම් වලදී ව්‍යාප්ති නිලධාරීන් 210 දෙනෙකුට ගොවීන් 295 දෙනෙකුට සමෝධානික පළිබෝධ කළමනාකරණ සංකල්ප පිළිබඳව පුහුණුව ලබා දෙන ලදී. මෙහිදී විශේෂයෙන් අවධානය යොමු කෙරුනේ, ගොවි ක්ෂේත්‍ර තත්ව යටතේ යොදාගත හැකි විවිධ ක්‍රමෝපාය භාවිතා කිරීම මගින් පළිබෝධ හා ස්වභාවික සතුරන් එක් එක් වර්ධන අදියරේදී හඳුනා ගැනීම පිළිබඳවත් පළිබෝධ ගහනය ආර්ථික වශයෙන් හානිදායක මට්ටමට පහළින් පවත්වා ගැනීම පිළිබඳවත් වේ. මෙම සංකල්ප කෘෂි පාරිසරික පද්ධතියේ ස්වාභාවික සතුරන් සංරක්ෂණය කිරීම සමඟ හොඳින් ගැළපෙන අතර හානිදායක නොවන මට්ටම් වලින් පළිබෝධ ගහන පාලනය කර ගැනීමට ද බාධා නො කරයි.

- **එළවළු පලතුරු, අතිරේක ක්ෂේත්‍ර බෝග හා ගෙවතු IPM වැඩසටහන**

එළවළු සඳහා ආරක්ෂිත, අඩු පිරිවැයක් සහිත, පරිසර හිතකාමී හා ප්‍රායෝගික IPM කට්ටල ගොඩ නැගීමට හා ඒවා ව්‍යාප්ති නිලධාරීන් හා ගොවීන් අතර ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම නිලධාරීන් හා ගොවීන් සඳහා කෘත්‍රිම පලිබෝධනාශක (කෘත්‍රිම පලිබෝධනාශක භාවිතාව අඩු කිරීම සඳහා ස්වාභාවික / ශාකමය පලිබෝධනාශක ප්‍රවර්ධනය) වෙනුවට විකල්පයක් ලෙස ශාකමය පලිබෝධනාශක ප්‍රවර්ධනය පිළිබඳව නිලධාරීන් හා ගොවීන් පුහුණු කරන ලදී.

විවිධ ස්ථාන වලදී ව්‍යාප්ති නිලධාරීන් 656 දෙනෙකු ට පුහුණු වැඩසටහන් ගණනාවක් ගණනාවක් පවත්වන ලද අතර ගොවීන් 857 දෙනෙක් සඳහා පුහුණුව ලබා දෙන ලදී. මෙම තාක්ෂණය ප්‍රවර්ධනයට රූපවාහිනී වැඩසටහන් දෙකක් හා ගුවන් විදුලි වැඩ සටහන් හතක් ද විකාශය කරන ලදී.

### වල් නාශක නියමු පරිමාණ පරීක්ෂාව

ස්වකීය ජෛව සාර්ථකත්වය පරීක්ෂා කිරීම සඳහා ගොවි ක්ෂේත්‍ර තත්ව යටතේ නිර්දේශිත වල්නාශක වල අපේක්ෂිත විශිෂ්ටතාව හා වඩා අඩු යෙදීමේ අනුපාත වලට වඩා හොඳ අගයන් පෙන්වන නව වල්නාශක අටක් ඇගයීමට ලක් කරන ලදී.

### ජලජ වල් පැළෑටි සඳහා ජෛව පාලන වැඩසටහන

පැළෑටි සංරක්ෂණ සේවය, සැල්විනියා (*Salvinia molesta*) සඳහා *Cyrtobagous salviniae* හා *Neochetina bruichi* මෙන්ම ජපන් ජබර (*Eichhornia crassipes*) සඳහා *Neochetina eichhorniae* යන ජෛව පාලන කාරක වල රෝපණ පවත්වා ගනී. රජය, පුද්ගලික අංශය හෝ රාජ්‍ය නොවන සංවිධාන වල ඉල්ලීම් වලට අනුව මෙම ජෛව පාලන කාරක හඳුන්වා දීම සිදු කරන ලදී. උදාහරණයක් ලෙස, කොත්මලේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දී ජෛව පාලන කාරක මුදා හැරීමට සමගාමීව දින දෙකේ පුහුණු වැඩසටහනක් පවත්වා නිලධාරීන් 25 දෙනෙක් පුහුණු කරන ලදී. මුදා හරින ලද ජෛව පාලන කාරකයේ ජීවන චක්‍රය හා ඉලක්ක ගත වල් පැළෑටිය සමග දක්වන අන්තර්ක්‍රියා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මේ සෑම අවස්ථාවකදීම පවත්වන ලදී. මෙම වැඩසටහන යටතේ බොහෝ දිස්ත්‍රික්ක වල දැඩි ලෙස ආපදාවට පත් ජලාශ 23කට ජෛව පාලන කාරක හඳුන්වා දෙන ලද අතර පාර්ශව කරුවන් 244 දෙනෙක් සඳහා පුහුණුව ලබා දෙන ලදී.

### ස්ථිර බෝග සායන වැඩසටහන

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්සත් රාජධානියේ කෘෂිකාර්මික ජෛව විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික මධ්‍යස්ථානය (CABI) අතර සහයෝගිතා වැඩසටහනක් වන ස්ථිර බෝග සායන වැඩසටහන (PCCP) 2013 මාර්තු සිට පැළෑටි සංරක්ෂණ සේවය වෙත පැවරී ඇත.

මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ ස්ථිර බෝග සායන වැඩසටහන ස්ථාපනය කර කළමනාකරණය කිරීමට දේශීය ධාරිතාව වැඩිදියුණු කිරීම තුළින් ජාතික පැළෑටි ස්වස්ථතා පද්ධතිය ශක්තිමත් කිරිමයි.

ඵලදායිතාව වැඩි දියුණු කරන තිරසාර කෘෂිකාර්මික භාවිතා ප්‍රවර්ධනය කිරීම, සුළු ගොවියාගේ ජීවනෝපාය වර්ධනය කිරීම හා ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම CABI සමග හවුල් වැඩසටහනේ අරමුණ වේ.

බෝග සායන කළමනාකරණයේ ජාතික කොටස්කරුවන් සමග සහයෝගයෙන්

කටයුතු කිරීමට ජාතික වගකීම් ආයතනය (NRO) ලෙස වගකීම් පැළෑටි සංරක්ෂණ සේවයට පවරා දෙන ලදී.

PCCP හි සුවිශේෂී සිදුවීම් කිහිපයක් පහත දැක්වේ.

පර්යේෂණ හා ව්‍යාප්ති අංශයෙන් තෝරාගත් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් පහත සඳහන් අංශ වලට අදාල මොඩියුල 1,2,3 හා 4 මගින් "ජ්‍යෙෂ්ඨ පුහුණු කරුවන්" ලෙස පුහුණු කරන ලදී.

- පැළෑටි වෛද්‍යවරයෙක් වන්නේ කෙසේද?
- පැළෑටි ස්වස්ථතා ගැටළු කළමනාකරණය.
- තාක්ෂණික ලේඛකයෙකු වන්නේ කෙසේද? හා කොළ සහ කහ ලැයිස්තු
- බෝග සායන නියාමනය හා ඇගයීම.

මෙම වර්ෂය තුළදී, දිස්ත්‍රික්ක 08ක හා අන්තර් පලාත් දිස්ත්‍රික්ක 5 ක කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන් 382ක් පැළෑටි වෛද්‍යවරුන් ලෙස පුහුණු කරන ලදී.

දිවයිනේ ජාතික පුහුණුකරුවන් සඳහා බොහෝ පුහුණු වැඩමුළු පැළෑටි සංරක්ෂණ සේවය විසින් සංවිධානය කරන ලදී. එමෙන්ම ප්‍රගති සමාලෝචනයක් හා මෙම ස්ථිර බෝග සායන වල ඉදිරිමග පිළිබඳ හමුවක් 2017 දෙසැම්බර් 18 හා 19 යන දින වල අධ්‍යක්ෂ ජනරාල් වරයා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන), කෘෂිකර්ම දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ මණ්ඩලය, පලාත් අධ්‍යක්ෂ වරු හා කෘෂිකර්ම ව්‍යාප්ති අංශයේ අනෙකුත් සියළු නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන් ගේ සහභාගිත්වයෙන් මහනුවර ටොපැස් හෝටලයේදී පැවැත්විනි.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ වල ගබඩා කළ බීජ සඳහා ධූමායනයට තාක්ෂණික සහාය

අම්බලන්තොට, පැල්වෙහෙර, කන්තලේ, පොළොන්නරුව, මුරුන්කන්, කිලිනොච්චි, මහඉලුප්පල්ලම, නිකවැරටිය හා අළුත්තරම කෘෂිකර්ම දෙපාර්තමේන්තු බීජ ගබඩා වල ගබඩා පලිබෝධ ආක්‍රමණ පාලනයට බීජ වර්ග මෙට්‍රික් ටොන් 4683.73 ක් (වී මෙට්‍රික් ටොන් 3682.79, වෙනත් ක්ෂේත්‍ර බෝග මෙට්‍රික් ටොන් 785.14 හා එළවළු බීජ මෙට්‍රික් ටොන් 216.3) ධූමායනය කරන ලදී.

## ක්ෂේත්‍රයේ මීයන් පාලනයට තාක්ෂණික සහය

දිස්ත්‍රික්ක කිහිපයක කුඹුරු වල මීයන් පාලනයට කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් හතලිස් හය දෙනෙක් හා ගොවීන් 107 දෙනෙක් පුහුණු කරන ලදී.

## ආක්‍රමණික වල් පැළෑටි පාලනයට තාක්ෂණික සහය

බොහෝ ප්‍රදේශවල පාර්තේනියම් (*Parthenium hysterophorus*), ඇලිගේටර් (*Alternanthera philoxeroides*) හා යෝධ නිදිකුම්බා (*Mimosa pigra*) වැනි ආක්‍රමණික වල් පැළෑටි පාලනය කිරීමේ වැඩසටහන්වලට තාක්ෂණික සහාය ලබා දෙන ලදී. මෙම වැඩසටහන යටතේ විදේශ ආක්‍රමණික විශේෂ පාලනය කිරීම පිළිබඳව නිලධාරීන් 333 දෙනෙක් හා ගොවීන් 46 දෙනෙක් පුහුණු කරන ලදී.

මෙම තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා එක් රූපවාහිනී වැඩසටහනක් විකාශය කරන ලදී.

## පලිබෝධ නිරීක්ෂණ වැඩසටහන්

දිස්ත්‍රික්ක 19ක ව්‍යාප්ති ප්‍රදේශ වලින් එක් රැස් කර ගන්නා ලද වී පලිබෝධ ආසාදන දත්ත වලින් දත්ත සමුදායක් ගොඩනගන ලදී. මෙම දත්ත ප්‍රස්තාරික නිරූපණ සහිත සාරාංශයක් ලෙස නැවත ඔවුන් වෙත ලබා දෙන ලදී. මීට අමතරව පලිබෝධ තත්ව වල වර්තමාන සිදු වීම් පිළිබඳව ගොවීන් විමර්ශනාත්මකව තැබීමට ගුවන් විදුලිය මගින් පලිබෝධ

වල වර්තමාන තත්ව පිළිබඳ කෙටි පණිවිඩ නිරතුරුව විකාශය කරන ලදී.

### පූජනීය බෝධි වෘක්ෂ වල පලිබෝධ / රෝග පාලනය

වෙයන්, දිලීර රෝග වැනි සමහර පලිබෝධ / රෝග ආසාදන වලින් බොහෝ ඓතිහාසික විහාරස්ථාන වලට අයත් පූජනීය බෝ වෘක්ෂ තුනක් ආරක්ෂා කර ගැනීම පිණිස පිළියම් කරන ලදී.

### ප්‍රදර්ශන

මාකඳුර, ප්‍රාදේශීය කෘෂිකර්ම හා පර්යේෂණ මධ්‍යස්ථානයේ පැවති "තිරසාර රටක් - සුවදායී හෙටක්" ප්‍රදර්ශනයේදී පැළෑටි සංරක්ෂණ සේවයේ පරිසර හිතකාමී පලිබෝධ කළමනාකරණ තාක්ෂණ හා වෙනත් ක්‍රියාකාරකම් මහජනතාවට ආදර්ශනය කර පැහැදිලි කරන ලදී.

## 2018 වසර සඳහා සැලැස්ම

- 1999 අංක 35 දරණ පැළෑටි සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම
- ස්ථිර බෝග සායන වැඩසටහන ප්‍රවර්ධනය කිරීම
- වී, එළවළු, පලතුරු හා ගෙවතු සඳහා සමෝධානික පලිබෝධ කළමනාකරණය (IPM) හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) ප්‍රවර්ධනය කිරීම.
- වල් නාශක නියමු පරිමාණ පරීක්ෂාව.
- ජලජ වල් පැළෑටි සඳහා ජෛව පාලන වැඩසටහන
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ වල බීජ ගබඩා ධූමායනයට තාක්ෂණික සහය.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු පරිශ්‍රයේ වෙයන් පාලනයට තාක්ෂණික මාර්ගෝපදේශ.
- කුඹුරුවල මීයන් පාලනයට තාක්ෂණික මාර්ගෝපදේශ
- ආක්‍රමණික වල් පැළෑටි පාලනයට තාක්ෂණික සහය
- අනතුරුදායක කෘෂිකාර්මික පලිබෝධ ගැටළු පාලනයට තාක්ෂණික මාර්ගෝපදේශ
- පලිබෝධ නිරීක්ෂණ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.
- ශාකසාර පලිබෝධනාශක භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- පූජනීය "බෝ" වෘක්ෂ වල පලිබෝධ / රෝග පාලනය.
- කෘෂිකාර්මික ප්‍රදර්ශන වල සක්‍රීය සහභාගීත්වය.

## කාර්ය මණ්ඩලය

### පැළෑටි සංරක්ෂණ සේවය - ගන්නොරුව

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ | 01 | 0 |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | 09 | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 02 | 00 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 11 | 01 |

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| සංවර්ධන නිලධාරි | 01 | 02 |
| කෘෂිකර්ම උපදේශක | 05 | 04 |
| පර්යේෂණ සහකාර | 0 | 01 |
| තාක්ෂණ සහකාර | 0 | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 | 03 |
| රියදුරු | 05 | 05 |
| ලොරි පවිත්‍රකරු | 01 | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 | 01 |
| මුරකරු | 02 | 02 |
| කම්කරු | 07 | 05 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 02 | 01 |
| **එකතුව** | **48** | **28** |

## පැළෑටි සංරක්ෂණ ඒකකය - මහඉලුප්පල්ලම

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 01 | 01 |
| කෘෂිකර්ම උපදේශක | 03 | 01 |
| රියදුරු | 01 | 00 |
| කම්කරු | 01 | 00 |
| **එකතුව** | **06** | **02** |

## පැළෑටි සංරක්ෂණ ඒකකය - බෝඹුවල

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 01 | 0 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | 01 |
| කෘෂිකර්ම උපදේශක | 02 | 02 |
| කම්කරු | 01 | 00 |
| **එකතුව** | **05** | **03** |

## 2.1.3. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය - පේරාදෙණිය

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය 1980 අංක 33 දරණ පළිබෝධනාශක පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා 1984 වර්ෂයේ පිහිටුවන ලද අතර, පළිබෝධ පාලනය කිරීම සහ මිනිස් සෞඛ්‍ය හා පරිසරයේ සුරක්ෂිතතාවය උදෙසා උසස් තත්ත්වයේ පළිබෝධනාශක සහතික වීම එහි මූලික අභිප්‍රායයි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සහ ආනයනික පළිබෝධනාශක නියාමනය කිරීම, එම පළිබෝධනාශකවල තත්ත්වය සහ ඒවා ආරක්ෂිතව භාවිත කිරීම පිළිබඳ සහතික වීම මෙන්ම, කෘෂි නිෂ්පාදනවලට උපරිම අවශේෂ ප්‍රමාණය තක්සේරු කිරීම හා ප්‍රකාශයට පත්කිරීම (MRL) යන කාර්යන් ඉටුකිරීමට බලය පැවරුණු ආයතනය වන්නේ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයයි. එහි ප්‍රධාන කාර්ය පථයට පහත සඳහන් කාර්යන් අන්තර්ගතව ඇත.

(අ) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන පළිබෝධනාශක ලියාපදිංචි කිරීම.

(ආ) ආනයන අවසරපත් ලබාදීම

(ඇ) ලේබල් සහ වෙළඳ දැන්වීම් නියාමනය.

(ඉ) පළිබෝධනාශක ආනයනකරුවන්, පළිබෝධ පාලන වැඩසටහන් සහ වෙළඳුන් ලියාපදිංචි කිරීම

(ඊ) ආනයනික පළිබෝධනාශක අහඹු ලෙස පරීක්ෂා කිරීම.

(උ) කෘෂි නිෂ්පාදනවල පළිබෝධනාශක අවශේෂ පරීක්ෂා කිරීම.

නව ප්‍රයත්නයන් ලෙස, ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වැඩසටහන් අතර ප්‍රධාන කාර්ය සාධන අවකාශ සඳහා පිළියම් ලබාදෙනු වස්, ප්‍රධාන ක්ෂේත්‍ර ක්‍රියාකාරී ප්‍රගතිය හා පනත යටතේ වූ අනෙකුත් කාර්යයන් අධීක්ෂණය සඳහා අනු කමිටුවක් පිහිටුවීමට 2017 දෙසැම්බර් මාසයේදී කෘෂිකර්ම ජනරාල්වරයා වෙත සංදේශයක් භාරදෙන ලදී.

### අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ ලද වාර්ෂික ප්‍රතිපාදන හා දරන ලද වියදම් පහත වගුවෙහි දැක්වේ.

**වගු අංක 2.1.3.1 : වාර්ෂික ඇයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) | අදායම (රු.) |
|---|---|---|---|---|
| පුනරාවර්තන | 4,722,439 | 4,507,023 | 95 | |
| මූලධන | 3,200,000 | 2,913,104 | 91 | |
| ශ්‍රී ලංකාවේ පළිබෝධනාශක වලින් ඇතිවිය හැකි අහිතකර බලපෑම අවම කිරීම. (විශේෂ ප්‍රතිපාදන) | 5,000,000 | 4,997,084 | 100 | |
| 1. ලියාපදිංචි ගාස්තු | - | - | | 7,285,000 |
| 2. නැවත ලියාපදිංචි කිරීමේ ගාස්තු | - | - | | 788,000 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) | අදායම (රු.) |
|---|---|---|---|---|
| 3. පළිබෝධනාශක අලෙවිකරුවන්ගේ බලපත්‍ර ගාස්තු | - | - | | 558,850 |
| 4. පළිබෝධ පාලන සේවා ලියාපදිංචි ගාස්තු | - | - | | 160,000 |
| 5. පළිබෝධ පාලන සේවා අළුත් කිරීමේ ගාස්තු | - | - | | 265,000 |
| 6. ආනයන බලපත්‍ර ගාස්තු | - | - | | 720,000 |
| 7. සමාගම් ලියාපදිංචි කිරීමේ ගාස්තු | - | - | | 1,550,000 |
| 8. කෘෂි රසායන අලෙවි කිරීමේ හා තාක්ෂණික සහායක අයදුම්පත් ගාස්තු | - | - | | 20,100 |
| 9. විවිධ | - | - | | 27,120 |
| **එකතුව** | 12,922,439 | 12,417,211 | 96 | 11,374,070 |

## ප්‍රගතිය

### පළිබෝධනාශක ලියාපදිංචිය

සියළු පළිබෝධනාශක ආනයනය, දිවයින තුල නිෂ්පාදනය කිරිම සහ භාවිතයට පෙර, පළිබෝධනාශක පනත යටතේ ලියාපදංචි කිරීම අත්‍යාවශ්‍ය වේ. ශ්‍රී ලංකාව තුල පළිබෝධනාශක අලෙවි කිරීමට අපේක්ෂා කරන සමාගම් විසින්, එම පනතේ 6 වන වගන්තියේ ප්‍රකාර පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේදී අත්‍යාවශ්‍ය කරුණු අනුව, තම අයදුම්පත් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

සාමාන්‍යයෙන්, අයදුම්පත්‍ර ලියාපදිංචි කිරීම අරමුණු කොට ගන්නේ, නව පළිබෝධනාශක ක්‍රියාකාරී අංග, හෝ පවත්නා පළිබෝධනාශක සඳහා නව නිෂ්පාදන, හෝ පවත්නා නිෂ්පාදනයක නව භාවිතාවන් ලියාපදිංචි කිරීම යන කාරණයයි.

### පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍ර සමාලෝචනය කිරීමේ කාල පරාසය

පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍ර ඇගයුම් කිරීම කාර්යක්ෂම ලෙසත් විශාල කාලයක් නොයවා ඉටු කිරීම සඳහා සියළු අයදුම්පත්‍ර සඳහා කාලානුරූපි ඇගයුම් කාලරාමුවක් ඉදිරිපත් කරන ලද අතර අයදුම්පත්‍ර ලියාපදිංචි කිරීමේ තීරක කාලවකවානුව ලෙස ‘2017 ජූලි’ ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. පසුගිය වර්ෂවල සිට මෙතෙක් එක් රැස් වූ එවැනි අයදුම්පත්‍ර 17ක් ප්‍රාරම්භක ඇගයීම් කටයුතු සඳහා අදාළ නිෂ්පාදන සම්බන්ධ ඇගයුම්කරුවන්ට පවරන ලදී.

### පළිබෝධනාශක නව ලියාපදිංචි කිරීමේ කටයුතුවල තත්ත්වය

2017 වර්ෂය තුලදී නව ලියාපදිංචි කිරීම් සඳහා අයදුම්පත්‍ර මිටි 14ක් පළිබෝධනාශක කාර්යාලය වෙත ලැබිණි. මෙයින් 6ක් මාස 9 -12 අතර සාමාන්‍ය

කාල පරාසයක් තුල සමාලෝචනයට ලක් කල අතර, අයදුම්පත්‍ර 14ක් සම්බන්ධයෙන් පසුව ඇගයීම් කරන ලදී. පහත ලැයිස්තුවෙන් දැක්වෙනුයේ නව පළිබෝධනාශක හෝ නව සංයෝග හෝ කලින් ලියපාදිංචි කල පළිබෝධනාශකවල නව මූලයන් පිළිබඳ තොරතුරුය.

- නව අණු - Bentazone 48% SL, Hymexazol 26% SL, Pymetrozine 5% WG, Halosulfuron- methyl 75% WG
- නව සංයෝග - Cyhalofop-butyl 6% + Pyribenzoxim 2.5% EC, MCPA 7.5% + Propanil 60% DF, Propanil 23% + Oxadiazon 8% EC
- නව මූලයක් - Pendimethalin 30% EC, Buprofezin 40% SC, Emamectin Benzoate 5% SG, Acetamiprid 20% SP, Pretilachlor 30% EC, Pymetrozine 5% WG, Azoxystrobin 12% + Tebuconazole 20% SC

2017 වර්ෂයේදී කෘෂිකර්මාන්තයේ ලියාපදිංචි සක්‍රිය පළිබෝධනාශක ද්‍රව්‍ය ප්‍රමාණය 110 දක්වා ඉහල නංවමින් නව්‍ය සක්‍රිය ද්‍රව්‍ය 3ක් ලියාපදිංචි කරනු ලැබිය

අළුතෙන් එක්කල මෙම සියළු ක්‍රියාකාරී ද්‍රව්‍ය ALS නිශේධන/ සල්ෆොනිල් වර්ගයේ වල්පැළෑටි නාශක ලෙස කාණ්ඩගත කර ඇති බැවින්, අලෙවියේදී සහ භාවිතයේදී දැඩි නිර්දේශ ලබා දී ඇත.

අදාළ වර්ෂය තුල නව සක්‍රිය ද්‍රව්‍ය සමග පළිබෝධනාශක සංයෝග 6ක් ලියාපදිංචි කොට ඇත; එනම්, Nicosnlfuron (4% OD), Halosulfuronmethyl (75% WG) සහ Traafamone (20% SC), සමග අතිරේක සංයෝග 3ක්, එනම්, Acetamiprid 20% Sp, Azoxystrobin 25% සහ Buprotezin 25% Sc, ලියාපදිංචි කළ දැනට පවත්නා ලැයිස්තුවට එක්කර ඇත.

## පළිබෝධනාශක නැවත ලියාපදිංචි කිරීම

නව විද්‍යාත්මක සහ නියාමන ප්‍රමිතිකරණ සම්බන්ධයෙන් නිෂ්පාදනය නැවත තක්සේරු කල වසරේ සිට වසර 3ක් පමණක් දක්වා එම නිෂ්පාදනයේ ලියාපදිංචිය වලංගු වේ. මෙම කාර්ය ක්‍රමය යටතේ, නිෂ්පාදනයේ ආරක්ෂණය, ගුණාත්මක තත්ත්වය සහ කාර්ය සාධනය නව්‍ය වශයෙන් ජනනය කරන ලද විෂ සහ වඩාත් විශ්වසනීය මූලයන්ගෙන් යුත් නිෂ්පාදන තත්ත්ව පරීක්ෂා හරහා අගයනු ලැබේ. (උදා: යහපත් පරීක්ෂණාගාර පිළිවෙත්, GLP සම්පාදිත සහ බලයලත් රසායනාගාර) වර්තමානය වන විට වාණිජමය පළිබෝධනාශන නිෂ්පාදන 600කට වඩා සංඛ්‍යාවක් සාමාන්‍ය භාවිතයේ (බොහෝ විට කෘෂි පළිබෝධනාශක) ගෘහාශ්‍රිතව සහ සීමාකරන ලද වර්ගීකරණයන් යටතේ භාවිත වේ. අදාළ වර්ෂය තුල පහත සඳහන් පරිදි ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී.

- නව ලියාපදිංචි කිරීම් සඳහා අයදුම්පත්‍ර පිළිගැනීම - 55
- නැවත ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර පිළිගැනීම - 197
- නැවත ලියාපදිංචි කිරීමේ සහතික සැකසීම - 49
- නැවත ලියාපදිංචි කිරීමේ සහතික සැකසීම - 180

අදාළ වර්ෂය තුල ලියාපදිංචිය සහ නැවත ලියාපදිංචිය සඳහා නිෂ්පාදන 229ක් සුදුසුකම් සම්පූර්ණ කර තිබු අතර පළිබෝධනාශක පනතේ 7වන වගන්තිය ප්‍රකාර වසර 3ක් සඳහා ලියාපදිංචි අවසරපත් නිකුත් කරනු ලැබීය.

## අතිරේක පළිබෝධනාශක සහ “දෙවන පෙල” පළිබෝධනාශක ලියාපදිංචිකරුවන් සඳහා වූ නව මාර්ගෝපදේශ

පළිබෝධනාශක වෙළඳ භාණ්ඩයක් ලෙස ලියාපදිංචි කිරීමේදී පළිබෝධනාශක පනත යටතේ අදාළ විධිවිධාන කාණ්ඩ 2ක් යටතේ විස්තර විභාග කොට ඇත. එනම්, (1) මූලික නිෂ්පාදන අපේක්ෂිත කරුණු සඳහා ලියාපදිංචි කරන මුත්, පූර්ණ වශයෙන් ආනයන සහ අලෙවිකරණ කටයුතු අදාළ ලියාපදිංචිකරු වෙත පැවරීම (2) අතිරේක ලියාපදිංචිකරුවකු විසින් ආනයනය සහ අලෙවිකරණය සඳහා වූ අතිරේක ලියාපදිංචිය සඳහා විස්තෘත අවසරයක් ලබා දෙමින්, අදාළ නිෂ්පාදනය තමා විසින්ම ආනයනය සහ අලෙවිකරණය කිරීමට සලසමින් මූලික නිෂ්පාදනය ලියාපදිංචි කිරීම.

මීට අමතර, මූලික ලියාපදිංචිකරු විසින් ආනයනය කරන ලද තොග අවසන් වූ පළිබෝධනාශක බෙදා හැරීමට අතිරේක පාර්ශවකරුවන්ට ඉඩ සලසමින්, විස්තෘත වෙළඳපල අවසරය සහිතව අතිරේක වෙළඳපල ලියාපදිංචි කටයුතු සිදුකිරීම මෑත කාලීනව නැගී එන ප්‍රවණතාවක් බවට පත්ව ඇත.

එවැනි අවස්ථාවල, මූලික ලියාපදිංචිකරුවන් සහ අතිරේක ලියාපදිංචිකරුවන් යන සියළුදෙනා විසින් අනුකූලතාවය එකෙනෙහිම දැක්විය හැකි මාර්ගෝපදේශ යෝජනා කරන ලදී. 2017 වසරේ දෙසැම්බර් මාසයේදී නිකුත් කරන ලද චක්‍රලේඛයකින් සියළු ලියාපදිංචිකරුවන් නිෂ්පාදකයාගේ තොරතුරු හුවමාරුව හා අනුකූලවන ලෙස ඉල්ලා සිටි අතර, අතිරේක ලියාපදංචි කිරීම් වල විස්තෘත බැරකම් සහ අනයන හා වෙළඳාම් අදියේදී වාර්ෂික දත්ත සැපයීමේදී ව්‍යාජ දත්ත ලබාදීමෙන් වැළකෙන ලෙසටත් සියළු ලියාපදිංචිකරුවන්ගෙන් ඉල්ලා සිටින ලදී.

## බෝග ක්ෂේත්‍ර හරහා පළිබෝධනාශක නිර්දේශ එක්තැන් කිරීම

යුරෝපා කොමිසමේ විගණන වාර්තාවේ (යොමුව DG (SANTE)/2016–8787–MR ශ්‍රී ලංකාවේ විගණනය 2016 සැප්තැම්බර් 14-22) 17 වන වගන්තිය ප්‍රකාර, එනම් තේ සම්බන්ධයෙන් නම්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය ද තේ සඳහා භාවිතා කල හැකි පළිබෝධනාශක ලැයිස්තුවක් සම්බන්ධයෙන් චක්‍රලේඛ නිකුත් කරයි. එසේ වුව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය හෝ තේ පර්යේෂණ ආයතනය පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ අධිකාරීත්වය සමග යාවත්කාලීන නොවන අතර, ඇතැම් අවස්ථාවන්හිදී තහනම් කරන ලද සක්‍රිය කාරක භාවිත එම හෝ අධිකාරීත්වය විසින් නිෂ්ප්‍රභා කරන ලද පැළෑටි සංරක්ෂණ නිෂ්පාදන භාවිතා වේ. බලය ලත් නිෂ්පාදන සම්බන්ධයෙන් පූර්ණ සහ යාවත්කාලීන කරන ලද ලේඛන සුලබ නොවීම, විවිධ බලාධිකාරීන් විසින් නිර්දේශිත භාවිතයන් පිළිබඳ විසංවාදි තොරතුරු ඉදිරිපත් කිරීම යන කරුණු හේතුවෙන් වැවිලිකරුවන් / පරිභෝජකයන් ද ගැටළුකාරී තත්ත්වයනට මුහුණ දීම පිළිබඳ විගණකරුවන්ගේද සැලකිල්ල යොමු වී ඇත.

ඉහත හෙළිදරව්වීම මත පදනම් වෙමින්, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නායකත්වය යටතේ, විවිධ වූ ආයතනික පර්යාස ඔස්සේ මෙතෙක් නිකුත් කරන ලද නිර්දේශ අත්පොත් / චක්‍රලේඛ / උපදෙස් යන සියල්ල විමර්ශණය කිරීමට අනු කමිටුවක් පත් කරන ලදී. මෙම ප්‍රයත්තයේ අවසාන ප්‍රතිඵලය වනුයේ, ජාතික අවශ්‍යතා අනුව වඩාත් කාලානුරූපී වූ පළිබෝධනාශක නිර්දේශ සකස් කිරීම වන අතර, එයින් වැවිලිකරුවන්/ පරිභෝජකයන් හට පැළෑටි සංරක්ෂණ නිෂ්පාදන පිළිබඳ වූ යාවත්කාලීන කරන ලද එමෙන්ම ස්ථිර තොරතුරු දුලබ වීමේ

අවහිරතා මගහැරේ. විවිධ නිෂ්පාදන සම්බන්ධ පර්යේෂණ ආයතන අනුව නිලමය වශයෙන් නිර්දේශිත පැළෑටි සංරක්ෂණ නිෂ්පාදන සම්බන්ධයෙන් පොදු සැලැස්මක් මත 2017 අප්‍රේල් 10 වන දින වන විට අවශ්‍ය දත්ත සම්පාදනය කරන ලදී.

## පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශන කමිටුව සහ එහි ක්‍රියාකාරීත්වය

පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශ කමිටුව (PeTAC) 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ 1995 දී ස්ථාපිත කරනු ලැබූ අතර එහි ප්‍රථම රැස්වීම 1995.01.27 දින පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ පළිබෝධනාශක පිළිබඳ වූ රෙගුලාසි සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය ගැටළු වලදී පළිබෝධනාශක රෙජිස්ට්‍රාවරයාට උපදෙස් ලබා දීම සඳහා මෙම කමිටුව ස්ථාපිත කරන ලදී. මෙම කමිටුව විසින් නිත්‍ය අන්තර අතර වඩාත් ක්‍රමික අන්දමින් ව්‍යාපාරික රැස්වීම් 6ක් පවත්වා (අවසන් සිකුරාදා ඇරඹෙන මාස 2ක අන්තරය) සුවිශේෂී ජයග්‍රහණ අත්පත් කර ගත් වසරක් ලෙස 2017 වසර හැඳින්විය හැක.

2017 පෙබරවාරි මාසයේදී පැවති 84 වන රැස්වීම් සැසියේදී, 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 5 (2) වගන්ති ප්‍රකාර කෘෂිකර්ම අමාත්‍යාවරයාගේ නියෝග පරිදි නව කමිටුවේ නීති සම්පාදනය කර, නීතිමය පරිනිරික්ෂණය සඳහා නීතිපති වෙත ඉදිරිපත් කරන ලදී. එසේ ලැයිස්තුගත කරන ලද නීතින් 17ක් විධිමත් ලෙස අනුමත කරන ලදී. වසර 3ක් තම සේවය ලබාදුන් සාමාජිකයන් වෙනුවට 2017 ජූනි මාසයේදී නව සාමාජිකයන් පත්කරන ලදී. නවක පත්වීම් ලද සාමාජිකයන් හට 2017 ජුලි 6 සිට වර්ෂ 3ක කාලයක් සඳහා (PeTAC) නියෝජනය කිරීමට බලය ඇත.

## ලියාපදංචි කිරීමේ ගැටළුවලදී වෙනත් ආයතන සමග සම්බන්ධීකරණය

ශ්‍රී ලංකාවේ තිරසාර පළිබෝධනාශක කළමනාකරණ කිරීමේ ක්‍රියාවලියේදී, පළිබෝධනාශක පිළිබඳ පූර්ව ඇගයීම් කටයුතු සිදු කිරීම ඉතා තීරණාත්මක කටයුත්තකි. විවිධ නිෂ්පාදන ප්‍රභේද වන කෘෂි, මහජන සෞඛ්‍ය, කාර්මික පළිබෝධනාශක යන අංශ සම්බන්ධ තාක්ෂණික අනු කමිටු, පාරිභෝගික පළිබෝධනාශක සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ සිදු කිරීම සහ අනුමත කිරීමේ යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක වේ. පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 5 (1) b වගන්තියෙන් පවරා ඇති බලතල ප්‍රකාර, මෙම අනුකමිටු ස්ථාපිත කර ඇත.

2017 වසර තුලදී කෘෂි පළිබෝධනාශක අනුකමිටු රැස්වීම් 3ක් පවත්වා ඇති අතර (24 සිට 27 දක්වා) ඉල්ලුම් පත්‍ර 131ක් පරීක්ෂාවට භාජනය කරන ලදී. එනම්, දිලීරනාශක සම්බන්ධ ඉල්ලුම් පත්‍ර (20), වල්නාශක (45), කෘමිනාශක (18), නෙමටෝඩානාශක (03), මිටිසයිඩ් (01), මොලසිසයිඩ් (01), කෘත්‍රිම මූල සහිත පළිබෝධනාශක, එනම්, කාබනික දිලීරනාශක (ශාක නිස්සාරක), කාබනික වල්නාශක (ශාක නිස්සාරක), ජෛව පාලන කාරක (දිලීර නාශක සහ නොමටෝඩානාශක වැනි), ක්ෂුද්‍රජීවී කෘමිනාශක, ක්ෂුද්‍රජීවී නෙමටෝඩානාශක සහ ඛණිජ දිලීරනාශක.

මහජන සෞඛ්‍ය පළිබෝධනාශක අනුකමිටුවේ රැස්වීම් 4ක් ද (13-16) කාර්මික පළිබෝධනාශක අනුකමිටුවේ රැස්වීම් 1ක්ද (9 දින) වශයෙන් අදාල වසර තුල කමිටු රැස්වීම් පැවැත්විණි.

අනුකමිටු ඇගයීම්වලදී පහත සඳහන් තීරණවලට එළඹිණ

1. මදුරු මර්ධන සඳහා ආධාර වශයෙන් ලබාදීමේ අරමුණින් සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා M/S ෆුමිකිලා

විසින් ඉල්ලුම් කරන ලද ගෘහාශ්‍රිත කෘමිනාශක තොගයක්, ලෝක සෞඛ්‍ය සංගමයේ නිර්දේශ සාන්ද්‍රණ හා අනුකූල නොවීම හා/හෝ, දේශීය වශයෙන් නිර්දේශිත නිෂ්පාදන හා සක්‍රිය ද්‍රව්‍ය වල සාන්ද්‍රණ හා අනුකූල නොවීම හේතුවෙන් ප්‍රතික්ෂේප කරනු ලැබිය.

2. කෘමිනාශක අඩංගු වූ තීන්ත වර්ග තොගයක් (Inesfly® 5A IGR NG Paint, Transfluthrin IGR Paint, & Inesfly® Carbapaint 10) නව්‍ය සංකල්පයකින් මදුරුවන්ට එරෙහි "කෘමිනාශක අවශේෂ ස්ප්‍රේ" (IRS) වශයෙන් මහජන සෞඛ්‍ය අනුකමිටුව විසින් නිර්දේශ කරන ලදී. එහි අවශේෂ සාඵල්‍යතාව දේශීය කාලගුණ තත්ත්වයනට ගැලපේද යන්න තීරණය කිරීම සඳහා ජෛව සාඵල්‍යතා ඇගයුමක් අඛණ්ඩව සිදු වේ.

3. වී අලෙවි මණ්ඩලය විසින් ඩෙල්ටාමෙත්‍රීන් (deltamethrin) අඩංගු Zerofly® ඇසුරුම් මළු යොදාගැනීම පිළිබඳ කෘෂි පළිබෝධනාශක අනුකමිටුව එහි නිර්දේශය ලබා දෙන ලදී. ඇසුරුමෙහි ඇති වී වල තෙතමනය උරා ගැනීමට ඉඩ නොහරිමින් ගබඩා කර ඇති නිෂ්පාදන නරක් වීමට අවම අවදානමක් සහිත වායුරෝධන පොලිතීන් ඇසුරුම පිළිබඳ කෘෂි පළිබෝධනාශක අනුකමිටුවේ විශේෂ අවධානය යොමු විය.

4. සාඵල්‍යතාවය සහ අවශේෂ පිළිබඳ සැලකිලිමත් වෙමින් එකම පළිබෝධනාශක නිෂ්පාදනයක ද්විත්ව ක්‍රියාකාරී සක්‍රිය දිලීරනාශක ද්‍රව්‍ය (නිදසුන් : Azoxystrobin 120 ග්‍රෑ/l + Tebuconazole 200 ග්‍රෑ/l SC) නිර්දේශ කිරීමේ සංකල්පය කෘෂි පළිබෝධනාශක අනුකමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

5. මිරිස් වැනි කෘෂි බෝගයන්ගෙන් සුදු මැස්සා වසංගතය සහ කොළ කොඩ වීමේ රෝගයෙන් බෝග විනාශවීම පිළිබඳ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අනතුරු හඟවන ලදී. එබැවින්, පුමුඛ ඇගයීම් සඳහා නව්‍ය කෘමිනාශක කණ්ඩායම් 2ක් තෝරා ගන්නා ලදී; එනම් Sulfoxaflor 50% WG (4C IRAC වර්ගයේ ක්‍රියාකාරීත්ව, Nicotinic Acetylcholine Receptor) සහ Pymetrozine 50% WG (9B IRAC වර්ගයේ ක්‍රියාකාරීත්වය, Modulators of Chordotonal Organs).

6. කොළ එළවළුවල කෙටි අවශේෂමය කෘමිනාශක සම්බන්ධයෙන් පුමුඛ අවධානය යොමු කරන ලදී. Pymetrozine 50% WG (9B IRAC වර්ගයේ ක්‍රියාකාරීත්වය, Chordotonal ඉන්ද්‍රියන් වර්ධක) සඳහා කොළ එළවළු මත එම කොළ බුදින හොමෝප්ටරානුවන් පාලනය කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

## මාර්ගෝපදේශන මාලාවක් සකස් කිරීම සහ උද්භිද පළිබෝධනාශක ඇතුළු ජෛව පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ තත්ත්ව

ශ්‍රී ලංකාව තුළ සාධනීය ජෛව පළිබෝධනාශක නිෂ්පාදනය සහ භාවිතය සඳහා කටයුතු සම්පාදනය කිරීමෙහිලා PeTAC සමග එක්ව, යාවකාලීන ලියාපදිංචි කිරීමේ යාන්ත්‍රණයක් යෝජනා කරන ලදී. "රජයේ පර්යේෂණ ආයතනයක් තුළ ජෛව සාඵල්‍යතා ඇගයීම් සෑහීමකට පත්විය හැකි ආකාරයෙන් පවත්වා, එමෙන්ම, ඊට සමගාමීව, රසායනික සංයෝග විශ්ලේෂණය කිරීම, හඳුනාගැනීම සහ නිවැරදිව දැක්වීම මත, පනත යටතේ ලියාපදිංචි කිරීමට අදාළ අවශ්‍ය වන අනෙකුත් අවශ්‍යතා පූර්ණය කරනු ඇතැයි යන පදනම මත යාවකාලීන ලියාපදිංචි කිරීම සඳහා අවසර ලබා දිය හැක."

මෙම යෝජිත යාන්ත්‍රණය මඟින් දේශීය ජෛව පළිබෝධනාශක නිෂ්පාදනයන් සඳහා තම නිෂ්පාදන ලියාපදිංචි කරවා ගැනීමටත්, දේශීය වෙළඳපලේ තම නිෂ්පාදන ප්‍රවර්ධනය කර ගැනීම සඳහාත් යම් සහනයක් හිමි වේ.

ඒ අතර, ක්ෂුද්‍රජීව පළිබෝධනාශක දකුණු ආසියාව තුල භාවිත කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා වූ කලාපීය උපදේශන වැඩමුළුවක් 2017 අගෝස්තු 21-23 දක්වා, ඉන්දියාවේ බැන්ගලරුහි NBAIR හිදී පැවැත්විණ. එහිදී, ජෛව පළිබෝධනාශක පිළිබඳ නව්‍ය අවබෝධයක් හා අනාගත සැලසුම් සඳහා මං පෙත් විවර විය. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නිලධාරියෙකු මෙම වැඩමුළුව සඳහා සහභාගී විය.

ජෛව පළිබෝධනාශක දේශීය වශයෙන් නිපදවීම සඳහා උරදීමේ සමස්ථ කැපවීමේ කොටසක් ලෙස, ශ්‍රී ලංකාවේ ජෛව පළිබෝධනාශක ලියාපදිංචි කිරීම පිළිබඳව 2016.10.28 දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැවති උපදේශනාත්මක වැඩමුළුවේදී යෝජිත පසු විපරම් ක්‍රියාකාරකම් පරිදි, ඊට අදාළවම යෝග්‍ය වූ තාක්ෂණික මාර්ගෝපදේශ විමසමින්, ජෛව පළිබෝධනාශක ඇගයීම් කමිටුව නව සාමාජිකයන් පත් කොට ගනිමින් ශක්තිමත් කරනු ලැබීය; මෙම නව සාමාජිකත්වය භාණ්ඩ පර්යේෂණ ආයතන හා අධ්‍යයන ආයතනවල විශිෂ්ඨ විද්‍යාඥයන් නියෝජනය විය. මෙම නව සාමාජිකයන් බඳවා ගැනීමට හේතු වුයේ, සාමාජිකයන් විශ්‍රාම යාම සහ ජෛව පළිබෝධනාශක නිෂ්පාදනයේ යෙදී සිටි සාමාජිකයන් කිහිපදෙනෙකු අතර තිබූ මතභේදාත්මක තත්ත්වයයි. ඉහත සාමාජික නාම යෝජනා 2017.12.26 වන දිනදී කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විධිමත් ලෙස අනුමත කරන ලදී.

දිවයින තුල ජෛව පළිබෝධනාශක හඳුන්වාදීම සඳහා ව්‍යවසායකත්ව අභිප්‍රායන් පවතී. මෙම කරුණේදී, විවිධ මූලයන්ගෙන් යුත් ජෛව පළිබෝධනාශක ලියාපදිංචි කිරිමේ අවශ්‍යතාවය පිළිබඳ විද්වත් කණ්ඩායමක් විසින් ඇතැම් යෝජනා සාකච්ඡාවට භාජනය කරන ලද අතර ඒවා ඇගයීමද සිදුකරනු ලැබිණි. පහත සඳහන් නිෂ්පාදන සම්බන්ධයෙන් ජෛව සාඵල්‍යතා ඇගයුම් සිදු කිරීමට එම විද්වත් කාණ්ඩයම අවසර ලබා දෙන ලදී.

Termaron® කීට ව්‍යාධිජනක දිලීර *Metarhizium anisopliae*- ශ්‍රී බයෝටෙක් ලංකා (පුද්ගලික) සමාගම, කඳ විදින්නා කීට ව්‍යාධිජනක දිලීර *Beauveria bassiana*, බිබිළ කොළ පාළුවට ප්‍රතිවිරුද්ධ දිලීර *Tricoderma viride* + *Tricoderma harzianum*– ශ්‍රී බයෝටෙක් ලංකා (පුද්ගලික) සමාගම, ස්වභාවික කෘමිනාශක උද්භිද - එස්. මයිකල්, ශ්‍රී ලංකාව, උද්භිද දියරය (කෘමි වාරක) - ඩග්ලස් පීරිස්, ශ්‍රී ලංකාව, දේශීයව නිෂ්පාදිත කෘමි වාරකය - හේමමාලි ප්‍රනාන්දු, ශ්‍රී ලංකා, සාරභූමි ඇග්‍රෝ කෘමි වාරකය - උදාර රාජරත්න, ශ්‍රී ලංකාව, ජෛව පළිබෝධනාශක ක්‍රියාකාරිත්වය සහිත දියර පොහොර - බයෝක්‍රොප් ඉකෝ ලංකා, ස්වභාවික කෘමිනාශක - එච්.ජී.එම්.සී. බණ්ඩාර, ශ්‍රී ලංකාව

## පළිබෝධනාශක සමාගම් ලියාපදිංචි කිරීම

සියළුම පළිබෝධනාශක සමාගම් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි විය යුතු අතර, මෙමඟින් අංක 1870/63 හා 2014-07-10 දින දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 5 (අ) 5 (ආ) වගන්ති ප්‍රකාරව, මානව සෞඛ්‍ය, පරිසරය සහ සත්ව සම්පත් සුරක්ෂිතව පවත්වාගෙන යාම පිණිස පළිබෝධනාශක ව්‍යාපාර සම්බන්ධ සියළුම කාර්යයන්

පරිමිත ආකාරයෙන් දැඩි ලෙස ඇගයීම අරමුණු කෙරේ.

2017 දෙසැම්බර් මස වන විට සමාගම් පැතිකඩ 91ක් ඇගයීමට ලක් කොට ඇත. ඉහත රෙගුලාසි හා අනුකූලව පළිබෝධනාශක ව්‍යාපාරය පවත්වාගෙන යාමට යෝග්‍ය වන පරිදි සමාගම් 40ක් සහතික කරන ලද අතර සහතික පත්‍ර නිකුත් කරන ලදී.

උචිත ප්‍රමිතීන් සමග අනුකූලත්වය පැහැදිලි කිරීම සඳහා මෙකී නියාමන හා කළමනාකරණ සැකැස්මෙන් සමාගම වෙත වගකීම පවරා ඇත. මේ සම්බන්ධයෙන් පොදු අනුකූලත්වය පිළිබඳ අඛණ්ඩ මඟ පෙන්වීමක් 2014.07.17, 2016.02.23 හා 2016.10.25 යන චක්‍රලේඛ තුලින් සමාගම් වෙත ලබා දී ඇති අතර, 2017.01.30 දින අංක RP/2017-02 දරණ චක්‍රලේඛයෙන් ගුණාත්මක තත්ත්වය, සෞඛ්‍ය හා පාරසරික ආරක්ෂක අංග පිළිබඳ බලතල සමාගම් වෙත ලබා දී ඇත.

එමෙන්ම, ඉහත ඡේදය ප්‍රකාර සහතික කිරීමේ ක්‍රියාවලියේ අත්‍යවශ්‍යතාවයන් හා සක්‍රිය වශයෙන් අනුකූලවේද යන්න ඉහත වැඩසටහන යටතේ සියළුම බලපත්‍රලාභීන් කලින් කලට (බොහෝ විට වාර්ෂිකව) පරීක්ෂාකර බලනු ලැබේ.

## කෘමි පාලනය කිරීමේ සේවාවේ තත්ත්වය සහ නීතිවිරෝධි ක්‍රියාවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග

පළිබෝධ පාලන සේවා ආයතනය සඳහා බලපත්‍ර ලබා දීමට පවත්නා වත්මන් ක්‍රමය, සාමාන්‍ය පළිබෝධ පාලනය, පූර්ව/පසු ඉදිකිරීම් වලදී ව්‍යුහාත්මක ලෙස වේයන් මර්ධනය, සීමිත හා අනෙකුත් පළිබෝධනාශක භාවිතයෙන් පූර්ව හා පසු නිරෝධායන ධූමකරණය පළිබෝධ පාලන විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පූර්ව අත්දැකීම්, පුහුණු කුසලතා, උපකරණ සුලභතාවය වැනි වූ තාක්ෂණික හැකියාව සහ යටිතල පහසුකම් පාදක කොට ගනී. 2017 වර්ෂය තුල අවශ්‍ය ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසු ආයතන 2ක් ලියාපදිංචි කරන ලදී. 2010.02.25 දිනැති අංක 1655/7 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ එලකරන ලද පනතේ 26 වන වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් සිදුකරන ලද රෙගුලාසි අනුව, සුදුසුකම් ලත් පළිබෝධනාශක පාලන සේවා ආයතනයක් ලෙස බලපත්‍ර නිකුත් කිරීමට පෙර සියළු ආයතන සඳහා පළිබෝධනාශක තාක්ෂණ අනු කමිටු (PeTAC) විසින් අනුමැතිය ලබා දී ඇත.

2010 අංක 01 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ රෙගුලාසි යටතේ වූ ප්‍රතිපාදන අනුව සියළු පළිබෝධ පාලන සේවා සපයන්නන් තම සේවා සැපයීම සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී බලපත්‍රය ලබා ගත යුතුය.

ඇතැම් ආයතන / උපදේශන ආයතන විධිමත් අධිකාරියක් ලබා නොගනිමින් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත පළිබෝධ පාලන සේවා සැපයීමේ නියැලී සිටිම පිළිබඳ 2017 පෙබරවාරි මසදී PCS/02/2017 රාජ්‍ය නිවේදනයක් නිකුත් කරනු ලැබීය.

මෙම රාජ්‍ය නිවේදනය මගින් අදාළ නීති හා රෙගුලාසි පිළිපැදිම පිළිබඳ සියළු වගකිව යුතු සිවිල් වැසියන් දැනුවත් කරනු ලැබීය. එයින්, එවැනි බලපත්‍ර රහිත ආයතන වල රැකියාවේ නිරත වීම හෝ සේවය කිරීමෙන් වැළකිම සඳහා පොදු ජනයා උනන්දු කරනු ලැබීය. www.doa.gov.lk වෙබ් අඩවියේ අනුමත පළිබෝධ පාලන කාර්යයේ යෙදෙන්නන් පිළිබඳ ප්‍රසිද්ධ කර ඇති අතර ඕනෑම පුද්ගලයකු හට පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් නිකුත් කරනු ලබන වලංගු බලපත්‍ර පිළිබඳ විමසිය හැක.

2017.02.23 දින ‘ දිනමිණ ’ පුවත්පතේ අවශ්‍ය මග පෙන්වීම් සහිතව අනුමත ආයතන පිළිබඳ විස්තර ඇතුලත් සම්පූර්ණ ලැයිස්තුවක් ‘විශ්වසනීය හා ඵලදායි පළිබෝධ පාලන සේවයක් සඳහා පළිබෝධ පාලනය කිරීමේ ආයතන මහජනතාව විසින් තෝරා ගන්නේ කෙසේද’ යන මැයින් රාජ්‍ය නිවේදනයක් එල විය.

## ලේබල් සහ ප්‍රචාරණ ද්‍රව්‍ය පරීක්ෂාවට භාජනය කිරීම

පාරිභෝගිකයාගේ අන්තය දක්වා යෝග්‍ය තොරතුරු ලබාදීමට අනුබල දෙමින් ලේබල අනුමත කිරීමේ කාර්යය පුනර් කාර්යයක් බවට පත්ව ඇති ක්‍රියාපටිපාටියකි. පනතේ 18වන වගන්තියෙන් කියැවෙන්නේ, දිවයින තුල පළිබෝධනාශක ගබඩා කිරීම, ප්‍රවාහනය, බෙදාහැරීම, විකිණීම, අලෙවිය සඳහා ලබාදීම හෝ දිවයින තුල යැවීමේ කාර්යයේදී ඒ හා සම්බන්ධ වන ඕනෑම ලිඛිත, මුද්‍රිත හෝ ප්‍රස්ථාරික ලේඛණයක අදාළ පළිබෝධක ද්‍රව්‍ය පිළිබඳ අනුමත ලේබලයේ සඳහන් කළ යුතු බව ප්‍රකාශ වේ. අදාළ වසර තුළ පරීක්ෂණයට භාජනය කල ලේබල් සහ වෙළඳ දැන්වීම් ප්‍රමාණය පිළිවෙලින් 1047ක් සහ 152ක් වේ.

## ක්‍රියාකාරි පිළිවෙල අනුව පළිබෝධනාශක ලේබල කේත කිරීමේ යෝජිත පද්ධතිය

නිත්‍ය කළමනාකරණය සඳහා සක්‍රිය ද්‍රව්‍ය මාරු කිරීම (කෘමිනාශක, පැළෑටිනාශක, දිලීරනාශක ආදියෙහි) පූර්ණ වශයෙන් ඒවා ක්‍රියාකරන ආකාරයේ වෙනස්කම් මත පදනම් විය යුතුය. එබැවින්, ඉතා ඉක්මන් පියවරක් වශයෙන් පළිබෝධනාශක ලේබලවල පළිබෝධනාශක ක්‍රියාකරන ආකාරය පිළිබඳ වූ කේතයක් ඇතුලත් කිරීම සඳහා පහත සඳහන් කාලීන මුල් පියවර ගනු ලැබීය. එම කේතක නාමකරණය, කෘමිනාශක ප්‍රතිරෝධක ක්‍රියාකාරී කමිටුව (IRAC) http://www.irac-online.org/modes-of-action, දිලීරනාශක ප්‍රතිරෝධ ක්‍රියාකාරි කමිටුව (FRAC) - http://www.frac.info/docs/default-source/publications/frac-code-list/frac-code-list-2016.pdf සහ පැළෑටිනාශක ප්‍රතිරෝධන ක්‍රියාකාරී කමිටුව (HRAC) - http://wssa.net/wp-content/uploads/herbicideMOAClassification.pdf. මේ අනුව, ඉහත මාර්ගෝපදේශන අනුව නැවත ලියාපදිංචි කිරීමේදී පවත්නා සියළු ලේබල් යාවත්කාලීන කරන ලදී. පළිබෝධනාශක, ජනප්‍රිය කරවීම සඳහා පූර්ව ක්‍රියාමාර්ග ගැනිමෙන් සහ පළිබෝධනාශක තෝරාගැනීමෙන්, ක්‍රමික ක්ෂේත්‍ර වැඩසටහන් හරහා අවශ්‍ය දැනුවත් කිරීම් ලබාදීමෙන් හා පළිබෝධනාශක නිවැරදි ලෙස තෝරා ගැනීමෙන් යන කටයුතු හරහා පළිබෝධනාශක ප්‍රතිරෝධිතාව කළමනාකරණය තීව්‍ර කල හැකි බව විශ්වාස කෙරේ.

පහත සඳහන් ක්‍රියාකාරකම් මුල්කර ගත් අරමුණු සාක්ෂාත් කර ගන්නා ලදී.

(1) කෘෂිකාර්මික, ගෘහාශ්‍රිත සහ මහජන සෞඛ්‍ය පළිබෝධනාශක ලේබල් අනුමැතිය සඳහා පරීක්ෂාවට භාජනය කිරීම - 1047

(2) කෘෂිකාර්මික, ගෘහාශ්‍රිත සහ මහජන සෞඛ්‍යයට අදාළ ප්‍රවර්ධන ද්‍රව්‍ය අනුමැතිය සඳහා පරීක්ෂාවට භාජනය කිරීම - 152

## සල්ෆොනිල් යූරියා sulfonyl urea/ALS නිෂේධන පැළෑටිනාශක අලෙවිකිරීමේ තත්ත්ව

ALS නිෂේධක ඇතුළු සල්ෆොනිල් යූරියා කඩිනමින් යෙදීම තුලින් කුඹුරුවල තෘණ වර්ග වැඩීමට එරෙහිව යෝග්‍ය වූ ප්‍රතිරෝධතාව ජනනයක්/ වරණයක්

පෙන්නුම් කරන ලදී. මේ අනුව, සීමා කිරීම් සහ කලාපිය නිර්දේශ වැනි ක්‍රියාකාරකම් ඇතුලත්ව ප්‍රතිරෝධක කළමනාකරණය සඳහා ප්‍රතිසංස්කරණ යොදා ගන්නා ලෙස පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙ පර්යේෂණ සහ ව්‍යාප්ති අංශ වලින් සහ පළිබෝධනාශක කර්මාන්තයෙන් ඉල්ලා සිටියි.

2017 ජුනි 19 -20 යන දිනවල පැවති 25 වන කෘෂි පළිබෝධනාශක අනු කමිටුවේදී සහයෝගීත්ව ඇගයුම් ප්‍රතිඵල ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, වී වගාවේදී සල්ෆොනිල් යුරියා ALS නිෂේධක පැළෑටිනාශක යෙදීම නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් 2017 ජුනි 30 වන දින පැවති 86 වන (PeTAC) සමුළුවේදී පහත සඳහන් තීරණ අනුමත කරන ලදී.

වී වගාවේදී සල්ෆොනිල් යුරියා ALS නිශේධක ඵලදායි ලෙස යෙදීම තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ඉදිරි නිර්දේශ සිදුකරන ලදී.

(1) Bispyribac-sodium 10% SC & 20% WP, Orthosulfamuron 50% WG & Propyrisulfuron 10% SC අන්තර්ගත ඒකල පැළෑටි නාශක සංයෝග භාවිතය අත්හිටුවන ලදී.
(2) Pyrazosulfuron-ethyl 10% WP, Flucetosulfuron 10% WG හි අන්තර්ගතයන් සඳහා පමණක් අලෙවි කිරීමට සහ දිවයින පුරා භාවිත කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.
(3) Fenoxaprop-*p*-ethyl 6.9% + Ethoxysulfuron-ethyl 2% OD, Azymsulfuron 50% WG හි අන්තර්ගතයන් කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර සහ රත්නපුර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි තෙත් කලාපය සඳහා පමණක් නිර්දේශ කරන ලදී.

අදාළ නිර්දේශ සහ සීමාවන් දක්වමින් ලේබල සංශෝධනය කර සිංහල සහ දෙමළ භාෂා ද්විත්වයෙන් සකස් කරන ලද උපදෙස් මාලා සමඟ යොමු කරන ලෙස අදාළ පළිබෝධනාශක ලියාපදිංචිකරුවන්ගෙන් ඉල්ලා සිටින ලදී. පළිබෝධනාශක වෙළඳුන් සහ ව්‍යාප්ති නිලධාරීන් හරහා බෙදා හැරීම සඳහා ගොවි උපදෙස් පත්‍රිකා සිංහල භාෂාවෙන් 25,000කට නොඅඩු ලෙස මෙම ද්විභාෂාවන්ගෙන් පත්‍රිකා හැකි ප්‍රමාණයකින් මුද්‍රණය කරන ලෙස සියළු ලියාපදිංචිකරුවන්ට දන්වන ලදී. අවශ්‍ය දැනුවත් කිරීම් මුද්‍රිත මාධ්‍ය හරහා ද ලබා දෙන ලදී.

## ලියාපදිංචි කරන ලද පළිබෝධනාශක සම්බන්ධයෙන් ජෛව සාඵල්‍යතා අත්හදා බැලීම් සිදුකිරීම

පනත යටතේ ලියාපදිංචි වූ සියළු කෘෂි පළිබෝධනාශක සෑම වසර 6කට වරක් ඒවායේ ජෛව සාඵල්‍යතාවය සම්බන්ධයෙන් නැවත පරීක්ෂණයට භාජනය කරනු ලබයි. (යොමුව : 2014:04:10 දිනැති අංක 1870.63 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය) 2017 මාර්තු මාසයේදී පරීක්ෂණ ක්‍රමවේද අනුකූලනය කිරීමත්, පළිබෝධනාශක ලියාපදිංචි කිරීම සහ ජෛව සාඵල්‍යතා අත්හදා බැලීම් අතර දැඩි අසමායෝජනය වැළැක්වීම සඳහාත් විෂයානුබද්ධව ක්‍රියාකාරී කණ්ඩායම් සමග සබඳතා ආරම්භ කරන ලදී. විශේෂයෙන්, යුරෝපා සංගමය විසින් මෑතකදී සිදුකරන ලද ශ්‍රී ලංකාවේ පළිබෝධනාශක කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වූ විගණනයේදී (යොමුව : (SANTE)/2016-8787-MR 2016 සැප්තැම්බර් 14-22 ශ්‍රී ලංකාවේ විගණන) පළිබෝධනාශක නිර්දේශ කිරීමේ ක්‍රමවේදය (2016) සහ (PeTAC) Deltamethrin, Quinalphos, Profenophos සහ Acephate අඩංගු නොවූ ලියාපදිංචි කරන ලද පළිබෝධනාශක පිළිබඳ වූ විධිමත් ලැයිස්තුව හේතුවෙන්

යුරෝපා සංගමයේ විගණන නිලධාරීන්හට නිරවද්‍ය තීරණ ගැනීමට නොහැකි විය. මේ සම්බන්ධයෙන් පළිබෝධනාශක තාක්ෂන අනු කමිටුවද (PeTAC) Deltamethrin, Quinalphos, Profenophos සහ Acephate පිළිබඳ ජෛව සාඵල්‍යතා අත්හදා බැලීම් තත්ත්ව සම්බන්ධයෙන් අවධානය යොමු කළ අතර, මෙම පළිබෝධනාශක සම්බන්ධයෙන් වසර ගණනාවකින් පර්යේෂණ පවත්වා නොතිබූ බැවින් ඒවා ලියාපදිංචි කිරීමේ කටයුතුද ප්‍රමාද වී තිබුණි. පුදුමයකට මෙන්, මෙම පළිබෝධනාශක සම්බන්ධයෙන් විද්‍යාත්මක හේතුන් පිළිබඳව නියාමන කටයුතු මෑත කාලීනව සිදුවී නොතිබුණි.

කවර හෝ පළිබෝධනාශකයක් පිළිගත නොහැකි අවදානම් තත්ත්වයක් සහ / හෝ විද්‍යාත්මක සාක්ෂි ප්‍රකාර දුර්වල ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරන්නේද එවැනි පළිබෝධනාශක අත්හිටුවීමේ අවශ්‍යතාවයක් පැනනගී නම්, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් විමසා (DGA) කෘෂි පළිබෝධනාශක තාක්ෂණ අනුකමිටුව විසින් එම තීරණය ගැනීමට අවසර ඇත. මෙම තත්ත්වය යටතේ, ඕනෑම පළිබෝධනාශයක් සම්බන්ධ අත්හදා බැලීම් අඛණ්ඩව පවත්වාගෙන යා යුතු බවට තීරණය විය.

## පනතේ නිර්වචන ඌනපූර්ණය කිරීම සඳහා පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම

වර්තමානයේ භාවිතා වන “පළිබෝධනාශක” යන්නට “විකර්ෂක” සහ “විෂබීජනාශක” ලෙස වර්ගීකරණය කොට ඇති විවිධ ආලේප ද ඇතුලත් වේ. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය පනත යටතේ නියාමනය කලයුතු “ධූසර නිෂ්පාදන” (gray products) සම්බන්ධයෙන් වූ මූලික ලැයිස්තුව පිළිබඳ සාකච්ඡා ආරම්භ කරන ලදී. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත, ‘සාම්ප්‍රදායික නොවන’ පළිබෝධනාශක හෝ ‘පළිබෝධනාශක නිර්වචන’ පළිබෝධනාශක වන නිෂ්පාදන හෝ ‘විකර්ශක’ ආයනයන / ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත්‍ර ලැබී තිබුණි. ඒ හා සම්බන්ධ මූලික සාකච්ඡාවන්හිදී එම නිෂ්පාදන, පනතේ අවශ්‍යතාවන් අනුව තක්සේරු කරන්නේද එසේ නොමැතිනම් පනත යටතේ නිදහස් කිරීමට අවසර දෙන්නේද යන්න පිළිබඳ තීරණ ගැනීමට සිදුවිය. PeTAC මගින් එකී තීරණ වලට එළඹීමට පෙර ඒ සඳහා පරිකල්පන ලබා දීම සඳහා අදාළ විෂය විශේෂඥ අනු කමිටු වෙත එම සාකච්ඡා යොමු කරන ලදී.

පැළෑටි වර්ධක නියාමකයන් (PGR) සහ පළිබෝධනාශක හා පළිබෝධනාශක නොවන වර්ගීකරණයන් අතර පැළෑටි වර්ධක නියාමක පුමුඛ සීමාවන් සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා පවත්වනු ලැබීය. නිදසුනක් ලෙස 2,4 -D යනු පැළෑටි වර්ධක නියාමකයක් (PGR) වන අතර නිර්දේශිත PGR මාත්‍රාව ඉක්මවුවොත්, එය පළිබෝධනාශකයක් ලෙස ක්‍රියාත්මක වනු ඇත. වර්තමානයේ පවත්නා PGR නියාමනය කිරීමේ යාන්ත්‍රණය කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු අනුකමිටුවක් හරහා ක්‍රියාත්මක වේ. අනාවරක භාවිතයෙන් ඇතැම් පැළෑටි ආරක්ෂණ නිෂ්පාදන ප්‍රතිරෝධක ඇති කිරීමට හැකියාවක් ඇතිවීමත් එම අනාවරක මගින් පළිබෝධ වලට එරෙහිව බෝග ප්‍රතිශක්තිය වැඩි කල හැකි බැවින්, අදාළ විෂය වෙත ඵලදායි අයුරින් මැදිහත් වීම සඳහා පැළෑටි වර්ධක නියාමක අතර පැහැදිලි බෙදීමක් තිබිය යුතුබව ඉස්මතු කර ඇත. කෘෂි පළිබෝධනාශක අනු කමිටුව පනත යටතේ වූ බලතල හරහා පැළෑටි වර්ධක නියාමක තක්සේරු කිරිමෙහිලා වූ සාකච්ඡා සිදුවෙමින් පවතී. මෙම කරුණු තවදුරටත් පැහැදිලි කිරීම සඳහා PGR අනු කමිටුවේදී පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය ක්‍රියාත්මක වනු ඇත.

## විශ්ලේෂණ රසායානාගාරය

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ විශ්ලේෂණ රසායනාගාරය සඳහා 2017 මැයි 12 දින සිට අවුරුදු 3ක් සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ISO/IEC: 17025 ප්‍රමිතිකරණය ලබා දෙන ලදී. ඒ අනුව, ප්‍රතීතන පථය තුල රැඳෙමින් මහජනයා සඳහා විශ්ලේෂණ සේවා ලබාදීමේ හැකියාව මෙම රසායානාගාරයට හිමි වේ. (පළිබෝධනාශක තක්සේරු කිරීම සහ අධීක්ෂණය කිරීම හා අනුකූලවූ විධි නියෝගය ප්‍රකාර) මුල් කාලීනව ශාස්තු ව්‍යුහය පනතේ 23 (2) වගන්තිය හා ගැලපෙන පරිදි අතිවිශේෂ ගැසට් පත්‍රයකින් ප්‍රකාශයට පත් කළ නිවේදනයක් මගින් යෝජනා කරන ලද නමුදු පසුව අමාත්‍ය මණ්ඩල සංදේශයක් හරහා අනුමත කල යුතු බවට යෝජනා කරන ලද බැවින්, අනුමැතිය සඳහා 2017 දෙසැම්බර් මසදී අමාත්‍යමණ්ඩල සංදේශ කෙටුම්පතක් සකස් කරනු ලැබීය. එමෙන්ම, විෂාණු ද්‍රව්‍ය අතපත ගෑම එහි පවතින අවදානම හේතුවෙන් රසායනාගාර කාර්ය මණ්ඩලයට ද රසායනාගාර අවදානම් දීමනාව හිමි වේ.

## ISO/IEC 17025:2005 දක්වා වූ ප්‍රතීතන කාර්යාවලිය

- මුලාරම්භක ඇගයුම 2016.11.10 වන පවත්වන ලද අතර ඇගයුම භාර දුන් දිනය වන 2017.02.08 දින අනනුකූල වීම සම්බන්ධ නිවැරදි කිරීමේ කටයුතු සිදුවිය.
- 2017.02.08 වන දින ප්‍රමිතිකරණ කාර්ය සංග්‍රහයේ 2වන සංශෝධනය නිකුත් කරන ලද අතර, ISO/IEC 17025 ප්‍රතීතනකරණය 2017.05.19 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රදානය කරන ලදී.
- 2017 දෙසැ. 07-08 ප්‍රථම ආවේක්ෂණ ඇගයුම් SLAB මගින් පවත්වන ලද අතර, ඇගයුම සම්බන්ධයෙන් කිසිදු අනනුකූලතාවයක් පැන නොනැඟුණි. ප්‍රමිතිකරණ කාර්ය සංග්‍රහයේ 03 වන සංශෝධනය 2017.11.20 දින නිකුත් කරන ලදී.
- 2017.01.30 සිට 2017.02.01 දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, සාජා, SAIF Zone මෛත්‍රෙහම් ඇප්ලිකේෂන් සෙන්ටර් හි දී පවත්වන ලද ජල විශ්ලේෂණය සම්බන්ධයෙන් වූ පුහුණු වැඩමුළුවේදී රසායානාගාර කාර්ය මණ්ඩලය සඳහා ප්‍රායෝගික මාර්ගෝපදේශනයක් ලබාදෙන ලදී.

පලතුරු සහ (කොළ එළවළු ඇතුලත්ව) එළවළු වල පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ පථය තුල, එකී කාලය තුල පැවති සක්‍රිය ද්‍රව්‍ය 26ක්ද (නිද: Chlorothalonil, Captan, Diazinon, Tebuconazole, Profenophos, ආදිය) organochlorines ඇතුළු තහනම් කරන ලද පළිබෝධනාශක සක්‍රිය ද්‍රව්‍ය 37ක් (නිද: DDT, Aldrin, Endrin, Ethion, Dicofol ආදිය) ඇතුලත්ව තිබිණි.

## ජාතික පළිබෝධනාශක අවශේෂ මෙහෙයුම් පද්ධතිය

අපනයනික සහ ආනයනික ද්‍රව්‍ය ඇතුලත් ශ්‍රී ලංකාවේ නැවුම් එළවළු සහ පලතුරු සම්බන්ධයෙන් වූ යෝජනා පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණය ජාතික මෙහෙයුම් වැඩසටහන සඳහා මිලියන 17.5ක මුල්‍යාධාර ලබා දෙන ලදී.

EU MRLs, 0.01 ppm අවශේෂ මට්ටමට වඩා ඉහල සංවේදිතාවයකින් යුත් පළිබෝධනාශක අවශේෂ (LOD) සහිත විශ්ලේෂණ රසායනාගාර තෝරා ගන්නා ලදී. විශේෂ ආර්ථික මධ්‍යස්ථාන (DEC), අපනයන වෙළඳපල සඳහා නිෂ්පාදන කටයුතු සිදුකරන ගොවිපල සහ ඇසුරුම් මධ්‍යස්ථාන සහ කටුනායක ගුවන් තොටුපලේ පැළෑටි නිරෝධායන මධ්‍යස්ථානය යන ආයතනවලින් නියැදි රැස්කර ගන්නා ලදී. දේශිය සහ අපනයනික භාණ්ඩ නියෝජනය වන අයුරින් (නිද: යුරෝපා සංගමයේ අවශ්‍යතා

පරිදි) කෘෂි නිෂ්පාදන සඳහා පුමුඛ ස්ථානය ලබා දෙන ලදී. සියළු නියැදි CODEX නියැදිකරන ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් රැස් කරගන්නා ලදී. සමස්ථ ඇගයුම් ප්‍රතිඵල (2016-2017) වගු අංක 2.1.3.2 හි දැක්වේ.

**වගු අංක 2.1.3.2: යුරෝපා සංගමයේ (EU) රෙගුලාසි ප්‍රකාර කෘෂි නිෂ්පාදන සම්බන්ධයෙන් (පලතුරු සහ කොළ එළවළු ඇතුලත් එළවළු) පළිබෝධනාශක අවශේෂ අනාවරණය කරගැනීමේ ප්‍රමාණය සහ MRL අතික්‍රමණ ප්‍රමාණය**

| බෝගය | විශ්ලේෂිත සාම්පල සංඛ්‍යාව* | LOD වලට ඉහල සහ EU MRL වලට පහල සංඛ්‍යාව ප්‍රතිශතය | EU MRL වල ඉහළ සංඛ්‍යාව ප්‍රතිශතය** |
|---|---|---|---|
| තක්කාලි | 30 | 20 (67) | 10 (33) |
| මාළු මිරිස් | 29 | 17 (59) | 12 (41) |
| ගෝවා | 27 | 19 (70) | 08 (30) |
| මෑ | 14 | 10 (71) | 04 (29) |
| බණ්ඩක්කා | 25 | 24 (96) | 01 (04) |
| පතෝල | 23 | 13 (57) | 10 (43) |
| මිරිස් | 15 | 09 (60) | 06 (40) |
| කරවිල | 39 | 37 (95) | 02 (05) |
| නිවිති | 13 | 10 (77) | 03 (23) |
| බටු | 05 | 03 (60) | 02 (40) |
| ගොටුකොළ | 49 | 21 (43) | 28 (57) |
| මුකුණුවැන්න | 28 | 17 (61) | 11 (39) |
| තම්පලා | 04 | 03 (75) | 01 (25) |
| කතුරුමුරුංගා | 09 | 06 (67) | 03 (33) |
| කංකුන් | 10 | 08 (80) | 02 (20) |
| තලන බටු | 02 | 02 (100) | 0 |
| මුරුංගා | 02 | 02 (100) | 0 |
| කොහිල | 01 | 01 (100) | 0 |
| ලබු | 01 | 01(100) | 0 |
| පිපිඤ්ඤා | 06 | 06 (100) | 0 |
| වැටකොළු | 02 | 02 (100) | 0 |
| වට්ටක්කා | 01 | 01 (100) | 0 |
| දඹල | 09 | 09 (100) | 0 |
| එළුනු මල් | 03 | 03 (100) | 0 |

| බෝගය | විශ්ලේෂිත සාම්පල සංඛ්‍යාව* | LOD වලට ඉහල සහ EU MRL වලට පහල සංඛ්‍යාව ප්‍රතිශතය | EU MRL වල ඉහළ සංඛ්‍යාව ප්‍රතිශතය** |
|---|---|---|---|
| අඹ | 06 | 06 (100) | 0 |
| පැපොල් | 08 | 06(75) | 02 (25) |
| අන්නාසි | 03 | 03(100) | 0 |
| පේර | 03 | 03 (100) | 0 |
| බෙල් පෙපර් | 04 | 02 (50) | 02 (50) |
| අර්තාපල් | 29 | 18 (62) | 11 (38) |
| ළූණු | 34 | 19 (56) | 15 (44) |
| බෝංචි | 12 | 10 (83) | 02 (17) |
| තිබ්බටු | 02 | 01 (50) | 01 (50) |
| අඟුණකොළ | 02 | 02 (100) | 0 |
| අළු කෙසෙල් | 03 | 03 (100) | 0 |
| කෙසෙල් | 02 | 01 (50) | 01 (50) |
| කෙසෙල් මුව | 01 | 01 (100) | 0 |
| දෙල් | 01 | 01 (100) | 0 |
| කීඩාරම් අල | 01 | 01 (100) | 0 |
| මුරුංගා කොළ | 01 | 01 (100) | 0 |
| රාජ අල | 02 | 02 (100) | 0 |
| දිවුල් | 01 | 01 (100) | 0 |
| දොඩම් | 21 | 12 (57) | 09 (43) |
| මිදි | 03 | 01 (33) | 02 (67) |
| ඇපල් | 12 | 05 (42) | 07 (58) |
| නාරං | 01 | 0 | 01 (100) |
| **එකතුව** | **499** | **343 (69)** | **156 (31)** |

සටහන : අනාවරණය කරගත් පළිබෝධනාශක: Hexaconazole, Tebuconazole, Fenobucarb (BPMC), Diazinon, Thiamethoxam, Imidacloprid, Profenophos, Quinalphos, Captan, Novaluron, Acephate, Acetamiprid, Azoxystrobin, Buprofezin, Carbendazim, Etofenprox, Thiophanate-methyl, Thiodicarb, Bifenthrin, Pendimethalin, Oxyfluorfen, Chlorpyriphos, Prothiophos, Deltamethrin, Cadusafos, Phenthoate, Chlorothalonil, Fipronil.

අනාවරණ සීමාව (LOD) = 0.01 ppm except Fipronil (0.005 ppm) & Tebuconazole (0.02 ppm)

මෙම ප්‍රතිඵල තුලින් පෙන්නුම් කෙරෙන්නේ නියැදි 69%ක් යුරෝපා සංගමය විසින් ප්‍රකාශයට පත් කරන ලද උග්‍ර පළිබෝධනාශක අවශේෂ මට්ටම උල්ලංඝනය කර නොමැති බවයි; නියැදි 31%ක් පමණක් යුරොප්පා සංගමයේ උපරිම අවශේෂ සීමාවන් (MRL) ඉක්මවා ගොස් ඇත. එම අනාවරණය කරගත් අවශේෂ සෞඛ්‍ය කෙරෙහි බලපාන්නේද යන්න මෙතෙක් කිව නොහැක, කෙසේවුවද, අපනයන සඳහා වු ඇතැම් බෝග යුරෝපා සංගමයේ වෙළඳපොලේද ප්‍රතික්ෂේප විය හැකි බවට වු සාධක පවතී; එනම් අවශේෂ මට්ටම 40%ක් ඉක්ම වු බෝග වන, මාළුමිරිස්, පතෝල, මිරිස්, වම්බටු, ගොටුකොළ, මුකුණුවැන්න සහ බෙල් පෙපර්ය. එලෙසම, දොඩම්, මිදි, ඇපල් යන නාරං වැනි ආනයනික අයිතම සම්බන්ධයෙන්ද පළිබෝධනාශක අවශේෂ මට්ටම් (දේශිය වශයෙන් අනුමත MRL අනුව) ලාක්ෂණීකරණය කිරීම අවශ්‍ය වේ.

වගු අංක 2.1.3.3 හි තෝරාගත් දේශිය කෘෂි නිෂ්පාදන සම්බන්ධයෙන් පළිබෝධනාශක අවශේෂ සීමා සංසන්දනාත්මකව දක්වා ඇති අතර, එහි CODEX (දේශිය උපරිම අවශේෂ සීමා නිර්ණ) සහ EU උපරිම අවශේෂ සීමා (MRL) ප්‍රකාශයට පත්කොට ඇත. ඒ අනුව, නියැදි 17කින් එක් නියැදියක් පමණක් (5.9%) CODEX උපරිම අවශේෂ සීමාව ඉක්මවයි. එබැවින්, දේශිය කෘෂි නිෂ්පාදන මිනිස් පරිභෝජනය සඳහා වු පළිබෝධනාශක ආරක්ෂා මට්ටමේ පවතින බව ප්‍රකාශ කල හැක.

**වගු අංක 2.1.3.3. තෝරාගත් කෘෂි නිෂ්පාදන සම්බන්ධයෙන් CODEX සහ EU MRL මට්ටම් උල්ලංඝනය කිරීම පිළිබඳ වු පළිබෝධනාශ අවශේෂ තත්ත්ව**

| බෝගය | පළිබෝධනාශක නාමය | EU MRL මි.ග්‍රෑ/ කි.ග්‍රෑ | CODEX මි.ග්‍රෑ/ කි.ග්‍රෑ | අනාවරණය කර ගත් අවශේෂ | උල්ලංඝනය කිරීම EU MRL | උල්ලංඝනය කිරීම CODEX MRL |
|---|---|---|---|---|---|---|
| බෝංචි | ක්ලොෆ්ලුආසුරොන් | 0.01 | 05 | 0.05 | Yes | No |
| බෙල්පෙපර් | මැන්කොසෙබ් | 0.01 | 01 | 0.01 | No | No |
| කරවිල | ප්‍රොෆෙනොෆොස් | 0.01 | 03 | 0.01 | No | No |
| බටු | ක්ලොරන්ත්‍රැනිලිප්‍රෝල් | 0.02 | 0.6 | 0.03 | Yes | No |
| ගෝවා | ප්‍රොෆෙනොෆොස් | 0.01 | 01 | 0.05 | Yes | No |
| මාළුමිරිස් | ෆිප්රෝනිල් | 0.02 | 0.2 | 0.05 | Yes | No |
| මිරිස් | ප්‍රොෆෙනොෆොස් | 0.01 | 03 | 0.01 | No | No |
| අඹ | ඉමිඩා ක්ලෝප්‍රිඩ් | 0.005 | 01 | 0.01 | Yes | No |
| ඇණු | ක්ලොරන්ත්‍රැනිලිප්‍රෝල් | 0.05 | 02 | 0.05 | No | No |
| අර්තාපල් | මැන්කොසෙබ් | 0.01 | 0.2 | 0.05 | Yes | No |
| වට්ටක්කා | ප්‍රොෆෙනොෆොස් | 0.01 | 03 | 0.01 | No | No |
| පතෝල | ප්‍රොෆෙනොෆොස් | 0.02 | 03 | 0.01 | No | No |
| තක්කාලි | ක්ලොරන්ත්‍රැනිලිප්‍රෝල් | 0.02 | 0.6 | 0.06 | Yes | No |
| ගෝවා | ටෙබුකානසෝල් | 0.01 | 01 | 0.05 | Yes | No |
| පතෝල | ටෙබුකානසෝල් | 0.01 | 01 | 0.07 | Yes | No |
| ඇපල් | ප්‍රොෆෙනොෆොස් | 0.01 | 0.05 | 0.02 | Yes | No |
| අර්තාපල් | ෆිප්රෝනිල් | 0.02 | 0.02 | 0.05 | No | Yes |
| **උල්ලංඝනය කිරීම් මුළු ගණන ( EU MRL) %** | | | | | **10/17 (59%)** | |
| **උල්ලංඝනය කිරීම් මුළු ගණන (CODEX MRL) %** | | | | | | **1/17 (5.9%)** |

### නීතිමය කටයුතු සඳහා ව්‍යාජ පළිබෝධනාශක පිළිබඳ FTIR මගින් අනාවරණය කිරීම සහ වාර්තා කිරීම

ව්‍යාජ, නීතිවිරෝධි පළිබෝධනාශක ගොවිනගේ සෞඛ්‍යයට මෙන්ම පරිසරයට සහ ආර්ථිකය කෙරෙහිද දැඩි අවධානමක් ඇති කරයි. නීතිවිරෝධි පළිබෝධනාශක හසුකරගැනමටත් නිෂ්පාදන බාල කිරීම පිළිබඳ සොයා බැලීමටත් FTIR (Fourier-transform infrared spectroscopy) නන් අයුරින් උපකාර වී ඇත. කාබනික සිලිකන් ලෙස ග්ලයිෆොසේට් සංයෝග ලීටර 32,000 නීතිවිරෝධි ලෙස අපනයන කිරීම සම්බන්ධයෙන් වූ පාරිභෝගික නඩු අංක PREV/2017/252/CCR/1318 එය කාබනික සිලිකන් බවට තහවුරු කරනු ලැබුයේ FTIR මගිනි. එමෙන්ම, ක්ෂේත්‍ර නියැදි 6ක් (ROP/UN/17/138, 140,141,142,144 සහ 145) ග්ලයිෆොසේට් ලෙස හඳුනාගන්නා ලදී. 2017.03.23 දිනැති මුන්දලම පොලිස් නඩුවේදී නියැදි කිහිපයක්, MOIB–170/129 PR/146/2017 දිඹුලාපතන ග්ලයිෆොසේට් සෝදිසියේදී නියැදි 2ක්ද, පුත්තලම් Willowsate® ග්ලයිෆොසේට් පිරික්සුමේදී නියැදි 5ක්ද අනුරාධපුරයෙන් නියැදි 3ක් ද වශයෙන් එම නියැදි ග්ලයිෆොසේට් බවට හඳුනාගත් අතර, පරීක්ෂණ සඳහා උපකාරී වීම පිණිස විශ්ලේෂණ සහතික නිකුත් කරන ලදී. පාරිභෝගික නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය අධීක්ෂණය කිරීමෙහිලා ලියාපදිංචි කරන ලද පළිබෝධනාශක සඳහා යොමු දත්ත පද්ධතියක් (“fingerprint”) සකස් කිරීමෙහිලා වගකීම දරන්නේ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයයි.

### පසු ලියාපදිංචි කිරීමේ කාර්යයන් සහ ක්ෂේත්‍ර සුපරීක්ෂණය

#### පළිබෝධනාශක වෙළඳුන්ගේ දත්ත පද්ධතියක් සකස් කිරීම

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පළිබෝධනාශක වෙළෙඳුන්ගේ දත්ත පද්ධතියක් (PDD) විධිමත් අයුරින් නඩත්තු නොකිරීම නිසා, ඵලදායි ලෙස තීරණ වලට එළඹීමේදී සහ පනත ක්‍රියාත්මක කිරීමේදී අනුකූලතා අධීක්ෂණ කටයුතු සිදුකිරීමේදී නිරන්තරයෙන් අභියෝග වලට මුහුණදීමට සිදුවේ. පනතේ විධිවිධාන ප්‍රකාර පළිබෝධනාශක වෙළඳුන්ගේ ලියාපදිංචි කිරීමේ කාර්යයන් මන්දගාමී ස්වරූපයෙන් සිද්ධවීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවද අවස්ථා ගණනාවකදී ප්‍රශ්න කොට ඇත.

මෙහි ප්‍රතිඵලයක් ලෙස පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් 2017 ජුලි මසදී දිවයින පුරා සිටින පළිබෝධනාශක වෙළඳුන්ගෙ සම්පූර්ණ තොරතුරු පද්ධතියක් සැකසීමට මුලපුරන ලදී. පරිපාලනමය සහ නීතිමය කටයුතු සඳහා එකී දත්ත අවශ්‍යතා වඩාත් අන්තර් ක්‍රියාකාරී බව සහ පරිශීලනය සඳහා පහසුවීම සහතික කරලීම සඳහා, පළිබෝධනාශක වෙළඳ දත්ත පද්ධතිය සඳහා අවශ්‍ය තොරතුරු, පළාත්/ අන්තර් පළාත්/ මහවැලි කලාපවලින් ඉල්ලා සිටින ලදී.

#### වෙළඳ බලපත්‍ර ලබාදීම සහ සුපරීක්ෂණ කටයුතුවල සමස්ථ තත්ත්වය

යම් සුවිශේෂී හේතුවක් මත බලපත්‍ර අහෝසි නොකරන්නට, පළිබෝධනාශක බලපත්‍ර එක් වසරක් සඳහා බලපැවැත්වේ. නිකුත් කල දිනය සහ වෙනත් හේතූන් පාදක කොට ගනිමින් වසරක් සඳහා බලපැවැත්වෙන බලපත්‍ර වසර පුරාවට යාවත්කාලින කරනු ලැබේ. වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේදී නියාමන අවශ්‍යතාවයක් ලෙස රු. 550.00ක

වාර්ෂික ගාස්තුවක් අයකෙරේ. මෙයින් ඉපැයූ මුළු ආදායම රු. 558,850.00ක් විය. බලපත්‍ර ලබාදුන් වෙළඳ සැල් සංඛ්‍යාව 1,021කි.

2017 වසරේදී පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නිලධාරීන් විසින් සුපරීක්ෂණයට ලක් කල වෙළඳසැල් සංඛ්‍යාව 45කි. සුපරීක්ෂණයේදී ඇතැම් වෙළඳ සැල් පරීක්ෂාවට භාජනය විය. එවැනි වෙළඳසැල්වල තත්ත්වය වැඩිදියුණු කිරීමට වෙළඳසැල් හිමියන්ට උපදෙස් ලබා දුන් අතර, ඒ අතරම පසු විපරම් කටයුතු සිදුකිරීමට බලාත්මක නිලධාරීන්ට දන්වන ලදි. පළිබෝධනාශක වෙළඳ කටයුතු සිදුකිරීමේදී ඇතැම් අඩු ලුහුඬුතා කිහිපයක් විය. එනම්, ගබඩාවල වාතාශ්‍රය නොමැති වීම, කල් ඉකුත් වූ නිෂ්පාදන ගබඩාකර තිබීම, පළිබෝධනාශක සහතික ලබා ගැනීමට ප්‍රමාද වීම සහ ගෘහස්ථ කාණ්ඩ යටතේ ලියාපදිංචි නොකළ නිෂ්පාදන තිබීම ආදී කරුණුය. කෘෂිකර්ම දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2017.12.12 දිනැතිව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය මඟින් යොමු කරන ලද සංදේශය මඟින් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක ප්‍රගතිය සහ පනත යටතේ වූ වෙනත් ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා අනු කමිටුවක් ස්ථාපිත කළ යුතු බවට නිර්දේශ කරනු ලැබීය

**වගු අංක 2.1.3.4: 2017.12.31 දිනට දිස්ත්‍රික් මට්ටමෙන් ස්ථාපිත කර තිබූ වෙළඳසැල් සංඛ්‍යාව සහ ලියාපදිංචි කරන ලද වෙළඳසැල් සංඛ්‍යාව**

| දිස්ත්‍රික්කය | වෙළඳසැල් සංඛ්‍යාව | ලියාපදිංචි වෙළඳසැල් සංඛ්‍යාව | ප්‍රගතිය % |
|---|---|---|---|
| අම්පාර | 137 | 135 | 98.5 |
| අනුරාධපුර | 118 | 31 | 26.3 |
| බදුල්ල | 156 | 93 | 59.6 |
| මඩකලපුව | 61 | - | - |
| කොළඹ | 47 | 44 | 93.6 |
| ගම්පහ | 24 | 17 | 70.8 |
| ගාල්ල | 91 | 53 | 58.2 |
| හම්බන්තොට | 51 | 41 | 80.4 |
| යාපනය | 43 | 33 | 76.7 |
| කළුතර | - | 07 | - |
| මහනුවර | 145 | 68 | 46.9 |
| කෑගල්ල | 73 | 09 | 12.3 |
| කුරුණෑගල | 354 | 104 | 29.4 |
| මහවැලි - C | 11 | 11 | 100.0 |
| මහවැලි - (Emb) | - | 41 | - |
| මහවැලි - G | 21 | 12 | 57.1 |
| මහවැලි - H | - | 21 | - |
| මාතලේ | 43 | 22 | 51.2 |
| මාතර | 111 | 19 | 17.1 |

| දිස්ත්‍රික්කය | වෙළඳසැල් සංඛ්‍යාව | ලියාපදිංචි වෙළඳසැල් සංඛ්‍යාව | ප්‍රගතිය % |
|---|---|---|---|
| මන්නාරම | - | - | - |
| මොණරාගල | 33 | 23 | 69.7 |
| මුලතිව් | - | - | - |
| නුවරඑළිය | 173 | 88 | 50.9 |
| පොළොන්නරුව | 41 | 41 | 100.0 |
| පුත්තලම | 110 | 21 | 19.1 |
| රත්නපුර | 127 | 74 | 58.3 |
| ත්‍රිකුණාමලය | 33 | 13 | 39.4 |
| වව්නියාව | 19 | - | - |
| වන්නි | - | - | - |
| **එකතුව** | **2022** | **1021** | **50.5** |

### පළිබෝධනාශක අලෙවිකරුවන් පුහුණු කිරීම

1999 අංක 01 දරන (අලෙවි සහ සැපයුම්) පළිබෝධනාශක පාලන පනත (2011.07.27 දිනැති අංක 1716/23 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය) යටතේ පනවා ඇති රෙගුලාසි වලට අනුව සියළුම පළිබෝධනාශක අලෙවිකරුවන් ජාතික වෘත්තීය සුදුසුකම් IV වන මට්ටමේ නිපුණතා සහතිකය ලබාගෙන තිබිය යුතුය. ඉහත සඳහන් අවශ්‍යතා අනුව, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය දිස්ත්‍රික්ක මට්ටමේ බලයලත් නිලධාරීන් සමඟ එක්ව විධිමත් අලෙවිකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් මෙහෙයවනු ලබයි. 2017 වර්ෂයේදී අලෙවිකරුවන් 89 දෙනෙකුට කෘෂි රසායන අලෙවි සහ තාක්ෂණික සහායක පුහුණු ලබා දෙන ලදී. සම්බන්ධිත වැඩසටහනක් ලෙස, අලෙවි සහතිකරණ කටයුතු සඳහා එක් දින පුහුණු හරහා අවශ්‍ය පුහුණු ලබාදීමෙන් අනතුරුව අලෙවිකරුවන් 355ක් සහතික කරන ලදී.

2016 වර්ෂයේදී කෘෂි රසායන අලෙවි සහ තාක්ෂණික සහායක පුහුණුව සම්පූර්ණ කරන ලද අභ්‍යාසලාභීන් සඳහා අවසන් ඇගයීම් 2017 වර්ෂයේ ජනවාරි 25 වැනි දින සිට ඔක්තෝම්බර් 26 දින දක්වා පැවැත් වූ අතර 2017 දෙසැම්බර් මාසය වන විට සහතික කරන ලද එවැනි අභ්‍යාසලාභීන් සංඛ්‍යාව 893ක් විය

### පනත යටතේ නම් කරන ලද බලයලත් නිලධාරීන් සමඟ සක්‍රියව සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

මෑත කාලීනව පළිබෝධනාශක ක්ෂේත්‍ර නියාමන ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ විශාලතම අභියෝගය වූයේ පනතේ 21වැනි වගන්තිය යටතේ නම් කරන ලද බලයලත් නිලධාරීන් සමඟ පැවති දුර්වල සම්බන්ධීකරණයයි. 2017 දෙසැම්බර් මාසය වන විට බලයලත් නිලධාරීන් 117ක් සිටින අතර ක්ෂේත්‍ර නියාමන කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා නිසියාකාර සම්බන්ධීකරණ අත්‍යවශ්‍ය වේ. 2017 වර්ෂයේදී, බලයලත් නිලධාරීන්ගේ කලාපීය රැස්වීම් 04ක් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් මෙහෙයවන ලදී. නෛතික කටයුතු සම්බන්ධයෙන් බලයලත් නිලධාරීන් අතර නිශ්චිතභාවය ගොඩනැගීම සඳහා 2017 නොවැම්බර් 07 වැනි දින වවුනියාව දිස්ත්‍රික්ක කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේදී "පළිබෝධනාශක පාලන පනත යටතේ උසාවි නඩුවක් හසුරුවනු ලබන්නේ කෙසේද" යන තේමාව යටතේ

නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ විසින් දේශනයක් සිදු කරන ලදී.

### නීති විරෝධීව ග්ලයිෆොසේට් ආනයනය කිරීම සම්බන්ධයෙන් පවතින අභියෝග සහ ගැටළු

2015.10.23 දිනැති සහ අංක 1937/35 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදන මගින් ග්ලයිෆොසේට් අඩංගු සියළුම නිෂ්පාදන ලියාපදිංචි කිරීම අවලංගු කිරීම අලෙවි කිරීම නවතා දැමීමේ රෙගුලාසි පනවන ලදී. නීතිරෝධී පළිබෝධනාශක අනාවරණය කර ගැනීමට මෙන්ම උසාවියේ නඩු පැවරීම සහ විමර්ශන සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය, රේගු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ විශේෂ කාර්යසාධන බලකාය සමඟ ශක්තිමත්ව සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය පසුබිම පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් ගොඩනඟන ලදී.

ඉහත විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් දැඩි ලෙස පරීක්ෂාකාරී වන මෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2017 ජනවාරි මසදී ඉල්ලීමක් කරන ලදී.

මෙහි ප්‍රතිඵලයක් ලෙස රේගු දෙපාර්තමේන්තුව මගින් සිද්ධීන් කීපයක් පිළිබඳව සෝදිසි කිරීම් සහ විමර්ශන කටයුතු සිදු කළ අතර නීතිවිරෝධී තොග සම්බන්ධයෙන් තහනම් කිරීමේ කටයුතු සිදු කරන ලදී.

**වගු අංක 2.1.3.5: 2017 වර්ෂයේදී උසාවි නඩු තුනක් ගොනු කළ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වෙන් වගුවෙහි දැක්වේ**

| දිනය | උසාවි නඩු අංකය සහ | චූදිතයා | තීරණය |
|---|---|---|---|
| 2017/07/04 | 95486/17 අනුරාධපුර | එන්. නිලන්ත මුනිදාස | 2017.10.20 දින රු. 75,000ක මුදලක් අය කෙරිණි. |
| 2017/07/20 | 17178/17 දෙහිඅත්තකණ්ඩිය | කීර්ති ශ්‍රී රවිනාථ වික්‍රමනායක | 2017.03.16 දින රු. 50,000ක දඩ මුලක් අය කරන ලදී. |
| 2017/10/30 | 36198/17/P2 පුත්තලම | මොහොමඩ් හසන් අබ්දුල් ගානි | 2017.10.30 දින රු. 100,000.00ක දඩ මුදලක් අය කරන ලදී. |

තොග පාදකව ඇසුරුම් නිෂ්කාශනය නිකුත් කිරීමට පෙර ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ගුණාත්මක ප්‍රමිතීන් සඳහා අනුකූලතාවය සහතික කිරීම පිණිස පළිබෝධනාශක නියැදි දැඩි පරීක්ෂාවට භාජනනය කරන ලදී. මැන්කොසෙබ්, මැනෙබ් සහ මෙතිරාම්වල එතිලීන් තයෝයූරියා අඩංගු නිපැයුම් නිෂ්පාදනය කිරීමේදී සහ පසුව සිදුවන විසංයෝජනයේදී අපද්‍රව්‍ය බිහි කරනු ලබන බැවින් නිෂ්පාදන ගුණාත්මක පරාමිතීන් පනවන ලදී.

අපද්‍රව්‍ය සහ තෙතමන අන්තර්ගතය පිරිවිතර වලට අනුකූලව පවතින්නේද යන්න පරීක්ෂා කරන බැලීම සඳහා අනුකූලතා අධීක්ෂණ කාර්යයක් ලෙස එතිලීන් තයෝයූරියා / ප්‍රොපිලීන්

තයෝයූරියා අපද්‍රව්‍ය සහ අන්තර්ගත තෙතමන පරීක්ෂා කර බැලීම සඳහා මැන්කොසෙබ්, මැනෙබ්, මෙතිරාම් සහ ප්‍රොපිනෙබ් අඩංගු නිෂ්පාදන වල තොග නියෝජක සම්බන්ධයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය ස්වාධීන /ප්‍රතීත රසායනාගාරයක් තුළදී නියැදි පරීක්ෂාවක් සිදු කරන ලදී.

මීට අමතරව මැන්කොසෙබ්, මැනෙබ්, මෙතිරාම් සහ ප්‍රොපිනෙබ් දිලීරනාශකවල ගුණාත්මක පාලනය පිළිබඳව 2017 අගෝස්තු මස නිකුත් කරන ලද චක්‍රලේඛය මගින් ඌනපූරක නිර්දේශයක් ලෙස මැන්කොසෙබ්, මැනෙබ්, මෙතිරාම් සහ ප්‍රොපිනෙබ් අඩංගු නිෂ්පාදන තොග සියල්ලම සැකසුම් කිරීමේදී දැඩිව අනුගමනය කළ යුතු අමතරව පූර්වෝපාය ක්‍රියාමාර්ග ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම ඌනපූරක නිර්දේශයට තෙතමනයට ඔරොත්තු දෙන ඇසුරුම් ද්‍රව්‍ය යෙදීම, අවශ්‍ය පරිදි සීල් කිරීම, ඇසුරුම් කිරීමේදී අධීක්ෂණය කිරීම, ආර්ද්‍රතාව පාලනය කිරීම සඳහා නැවත ඇසුරුම් කිරීම සහ ගබඩා පහසුකම්, වායුගෝලීය උෂ්ණත්වය පාලනය කිරීම සහ ඇසුරුම් සහ නැවත ඇසුරුම් සඳහා ඇතුළත අතුරුණු ඇතුළත් වේ.

තොග පදනම මත නියැදිවල ගුණාත්මකභාවය විශ්ලේෂණය කිරීමෙන් පසුව මෙම වසරේදී දෛනික කටයුත්තක් ලෙස ඇසුරුම් සහ වෙළඳපළ නිෂ්කාශන 235ක් නිකුත් කරන ලදී. ගුණාත්මක විශ්ලේෂණය මෙම වාර්තාවේ සඳහන් කර ඇති පරිදි වත්මන් තත්ත්වය අනුව සිදු කරන ලදී.

### ආනයන අනුමැතිය ලබා ගැනීම සඳහා තත්ත්ව සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන නව නීති

ආනයන අනුමැතීන් ලබා දීමට පෙර තත්ත්ව සහතික සඳහා පළිබෝධනාශක තොග සියල්ලක්ම පරීක්ෂාවට ලක් කරනු ලැබේ. ඒ අනුව, ආනයන බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ඇතැම් ලිපි ලේඛණ අනිවාර්ය වන අතර ප්‍රමිති තත්ත්ව සහතිකයම අදාළ අවශ්‍යතාවයන් සපුරාලීමත් සම්පූර්ණ විය යුතුය.

පළිබෝධනාශක කර්මාන්තයෙන් ලද අදහස් වලට ප්‍රතිචාරයක් ලෙස පළිබෝධනාශකවල තත්ත්ව සහතික ශක්තිමත් කිරීම සඳහා පහත දැක්වෙන විකල්ප යාන්ත්‍රණයන් පිළිගැනීම සඳහා අනුමැතිය පළිබෝධනාශක තාක්ෂණ සහ උපදේශක කමිටුව විසින් ලබා දෙන ලදී.

1. අදාළ පිළිගැනීම් යටතේ දෙන ලද පිරිවිතර අනුව වසරකට වරක් ස්වාධීන ප්‍රතීත රසායනාගාරයකින් දෙන ලද තත්ත්ව සහතික ඉදිරිපත් කිරීම. (දැනට සිදු කෙරෙන පරිදි බැර ලෝහ විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් කිරීමේ නීති අනුව)

2. නිෂ්පාදකයාගේ / සංයෝගකරුගේ/ සැපයුම්කරුගේ ස්වකීය රසායනාගාරයක් මගින් නියමිත පරාමිතීන් සහිතව සෑම තොගයකටම නිකුත් කරන ලද තත්ත්ව සහතිකය ඉදිරිපත් කිරීම.

## වෙනත්

### රසායනාගාරය මගින් සිදු කරන ලද / අධීක්ෂණය කරන ලද පර්යේෂණ කටයුතු

- මහනුවර දිස්ත්‍රික්කයේ සහල් වල අඩංගු වරණීය බැර ලෝහ ආසාදිත විශ්ලේෂණය කිරීම. මේ සඳහා නියැදි 68ක් විශ්ලේෂණය කරන ලදී. රසදිය, ආසනික්, කැඩ්මියම්, සෙලිනියම් සහ ඊයම් වල මධ්‍යනය අගයන් පරීක්ෂා කිරීමෙන් ලද ප්‍රතිඵලවලට අනුව එම බැර ලෝහ අවසර දිය හැකි මට්ටමෙන් දෛනිකව ශරීරගත වන ප්‍රමාණය සහල් නියැදි 98%ක (ආනයනික, සාම්ප්‍රදායික, දේශීය සන්නාමකරණ ලද සහ දේශීයව නිපදවන ලද)

නොඉක්මවූ බව අනාවරණය විය. ඊයම් වල (ආනයනික සහ සාම්ප්‍රදායික සහල්වල අඩංගු) සහ සෙලිනියම්වල (ආනයනික සහල්වල අංඩගු) උපරිම අගයන් අනුව ගණනය කළ විට සහල් නියැදි 12%ක අවසර දිය හැකි මට්ටමේ දෛනිකව ශරීරගතවීමේ ප්‍රමාණය ඉක්මවන බැව් අනාවරණය විය.

- යුරෝපා සංගමයට අපනයන කරන ලද පලතුරු සහ එළවළුවල අඩංගු පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණය කිරීම සහ ඩයසිනොන් අවශේෂ සඳහා ක්ලෝරීන් ප්‍රතිකර්මය මගින් ඇති කරන බලපෑම.

- ශ්‍රී ලංකාවේ මහවැලි නදියෙන් වරණාත්මකව ලබාගත් බැර ලෝහවල දූෂිත මට්ටම් විශ්ලේෂණය කිරීම. මෙම ගංගාවේ ස්ථාන 15කින් ලබාගත් ජල නියැදි 84ක් බැර ලෝහ සම්බන්ධයෙන් විශ්ලේෂණය කරන ලදී.

- ජාතික පළිබෝධනාශක අවශේෂ වැඩසටහන සඳහා පලතුරු සහ එළවළුවල අඩංගු පළිබෝධනාශක අවශේෂ මට්ටම් විශ්ලේෂණය කරන ලදී. මේ සඳහා පලතුරු සහ එළවළු නියැදි 100ක් විශ්ලේෂණය කර ප්‍රකාශිත දේශිය උපරිම පළිබෝධනාශක මට්ටම් සමඟ සසඳන ලදී.

### ප්‍රමාණවත් පරිදි විකල්ප යොදා ගත හැකි අවස්ථාවන්හිදී පළිබෝධනාශක බහුලව භාවිත කිරීම වැලැක්වීම

2017.06.30 දින පළිබෝධනාශක තාක්ෂණික උපදේශක කමිටු වේ 86වැනි රැස්වීමේදී සිදු කෙරුණු සාකච්ඡාවට අනුව සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ II වන අන්තරායක පංතියට අයත් අතිශයින්ම හානිදායක පළිබෝධනාශක සංයෝගයක් වන ප්‍රොෆෙනෆොස් (පාලනයකින් තොරව අවභාවිතා කිරීම සහ අවශේෂ අඩංගු) අධික ලෙස භාවිත කිරීම පිළිබඳව 2011/10/26 දින 26වැනි වරට පැවති කෘෂි පළිබෝධනාශක අනු කමිටුවට යොමු කරන ලදී. අඛණ්ඩවම වසර 6කදී මෙය පිටරටින් ගෙන්වීම 50%කින් අඩු කිරීමට යෝග්‍ය විකල්ප පළිබෝධනාශක පරීක්ෂා කර නිර්දේශ කරන තුරු ගොක් මැස්සා පාලනය කිරීම සඳහා මෙම පළිබෝධනාශකය නිර්දේශ කිරීම සීමා කිරීමට අනු කමිටුව යෝජනා කරන ලදී. 2017/12/29 දින 89වැනි වරට පවත්වන ලද පළිබෝධනාශක තාක්ෂණික උපදේශක කමිටු රැස්වීමේදී ගන්නා ලද තීරණයට අනුව පසුගිය අඛණ්ඩ වසර 6 සඳහා ආනයනික ප්‍රොෆෙනෆොස් 50% සාන්ද්‍ර තෛලෝදකයේ කි.ලී. 203ක් වූ සාමාන්‍ය ප්‍රමාණය පාදකව සලකා බැලූ විට අන්තර් කාලයට අදාළ ප්‍රොෆෙනෆොස් 50% සාන්ද්‍ර තෛලෝදය සඳහා වන ප්‍රමාණය (එනම් 50%) කි.ලී. 100ක් වේ.

මීට අමතරව, මහජනතාවගේ සුරක්ෂිතභාවය උදෙසා, ජනතාවගේ සුරක්ෂිතතාව පිණිස, ආනගත නියාමක පාලනය සහ අන්තර්ජාතික යොමු කිරීම් සඳහා, පහත සඳහන් නියාමන තීරණ ක්‍රියාත්මක කිරීමට තීරණය කෙරිණි.

1. ශ්‍රී ලංකාවේ තහනම් පළිබෝධනාශක ලෙස රොටර්ඩෑම් සම්මුතියට ඒසින්ෆොස් මෙතිල්, බයිනොපැක්රිල්, ක්ලොරොබෙන්සිලේට්, ඩයිනිට්රො-ඕතො-ක්‍රෙසොල්, ඩයිනොසෙබ්, 1, 2-ඩයිබ්‍රොමෝතේන්, එතිලින් ඩයික්ලොරයිඩ්, ෆ්ලූඔරොඇසිටමයිඩ්, හෙක්සක්ලොරොබෙනිසින්, ටොක්සෆීන්, ට්‍රයිබියුටිල් - ටින් සංයෝග සහ බෙනෙමිල් පළිබෝධනාශකවල නියාමන දැනුම්දීම.
2. පාර්ශ්ව දෙකක් හා කීපයක් සෞඛ්‍ය සහ පාරිසරික හේතු සම්බන්ධයෙන් තහනම් කරන ලද හෝ දැඩි ලෙස සීමා කරන ලද සහ එම පාර්ශ්ව මගින් සාකච්ඡා කෙරෙනු පරිදි PIC

ක්‍රියාපරිපාටියට ලක් කිරීමට තීරණය කරන ලද පළිබෝධනාශක සහ කර්මාන්තශාලාවල භාවිතා කරන රසායන ද්‍රව්‍යයන් III වන ඇමුණුමෙහි ඇතුළත් වේ.

3. ශ්‍රී ලංකාවේ පළිබෝධනාශක භාවිතයේ කොන්දේසි වලට අදාළව, ක්ලෝප්‍රිපෝස් 40% EC, ප්‍රොෆෙනොපොස් 50% EC සහ ඇබිමෙක්ටින් 1.8 EC, උග්‍ර උපද්‍රව සහිත පළිබෝධනාශක ලෙස රොටර්ඩෑම් සම්මුතිය වෙත දැනුම් දීම.
4. ඔක්සිඩිමෙටොන් මීතයිල්, ට්‍රයඩිමෝෆ්, ට්‍රිච්ලෝෆොන් සහ 2,4 - D යන ලියාපදිංචි නොකල පළිබෝධනාශක ශ්‍රී ලංකාව තුල තහනම් කරන ලද පළිබෝධනාශක ලෙස නියාමනය කිරීම.

වගන්ති (11) හි අනුවගන්ති (1) ප්‍රකාර අවලංගු කිරීමට යටත්ව, පළිබෝධනාශක පනත යටතේ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් අනුවගන්ති (4) ප්‍රකාර දැනුම් දෙන ලදුව, සහ 2017.04.21 දින පවත්වන ලද 85 වන PeTAC රැස්වීමේදී අනුමත කරන ලද කෙටුම්පත නීතිපති වෙත යොමු කරන ලදී.

## පළිබෝධනාශක භාවිතයේදී ආරක්ෂිත ඇඳුම් කට්ටල භාවිත කිරීම ක්‍රියාත්මක කිරීම

ඉහත කටයුත්ත සඳහා මුලපුරනු වස්, ගොවීන් සඳහා පුද්ගල ආරක්ෂක කට්ටල බෙදා දීමේ වැඩසටහනක් 2017.03.09 දින විල්ගමුවේදී (හෙට්ටිපොල) පැවැත්විණ.

## ශ්‍රී ලංකාව තුල හිස් පළිබෝධනාශක බඳුන් කළමනාකරණය

අක්‍රමවත් ලෙස හිස් පළිබෝධනාශක බඳුන් බැහැර කිරීම ඉතා උග්‍ර පාරිසරික ගැටළුවක් බවට පත්වී ඇත. පළිබෝධනාශක හිස් බඳුන් එක්රැස් කිරීම සඳහා වූ යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇති අතර එය පසුගිය වසරේ සිට ක්‍රියාත්මක වෙමින් පවතී. ක්‍රොප්ලයිෆ් ශ්‍රී ලංකා ආයතනය මගින් බඳුන් එක් රැස්කිරීමේ කාර්ය සිදුකරනු ලබයි. 2017 ජූනි 21 -22 සහ 2017 සැප්. 21 -22 දක්වා පිළිවෙලින් පුත්තලම / හලාවත සහ නුවරඑළිය / වැලිමඩ ප්‍රදේශයන්හිදි ක්‍රෝප්ලයිෆ් ශ්‍රී ලංකා ආයතනය හා එක්ව හිස් බඳුන් එක්රැස් කිරිමේ වැඩසටහන් ඇතුළු අවශ්‍ය කරුණු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම ප්‍රයත්නය අතර කාලය තුලදී පොලිසැක් මළු 138ක් පුරවා හිස් වීදුරු හා ප්ලාස්ටික් බඳුන් එක්රැස් කිරීමට හැකි වු අතර, අවසානයේදී හිස්බඳුන් M/s පිරාමල් ග්ලාස් පෞද්ගලික සමාගම හරහා ප්‍රතිශක්තීකරණය කිරීමට යොමු කරනු ලැබීය.

## කල් ඉකුත් වු පළිබෝධනාශක සහ නීතිමය ලෙස රාජසන්තය කරන ලද පළිබෝධනාශක තොග කළමනාකරණය

2016 දෙසැම්බර් මස වන විට රජයේ ගොවිපල සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තු පර්යේෂණ ආයතනවලින් එක්රැස් කරගන්නා ලද කල් ඉකුත් වු පළිබෝධනාශක ප්‍රමාණය මෙ.ටො. 26ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළිබෝධනාශක සඳහා ආරක්ෂිත ගබඩා පහසුකම් සැපයීම පිළිබඳ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් මූලික සාකච්ඡා ආරම්භ කරනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය තුල (FCRDI) තිබෙන ආරක්ෂිත ගබඩා පහසුකම්, කල් ඉකුත් වු පළිබෝධනාශක කළමනාකරණය කිරිම සඳහා ආරක්ෂිත විකල්පයක් ලෙස භාවිත කරයි.

2017 වසර තුල කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රාදේශිය ආයතන 19ක් පරීක්ෂාව භාජනය කල අතර ඝණ පළිබෝධනාශක කි. ග්‍රෑ. 807ක් සහ ද්‍රාව්‍ය

පළිබෝධනාශක ලීටර 270ක් ගබඩා කරන ලදී. පැවති කල් ඉකුත්වූ පළිබෝධනාශක ප්‍රමාණයට මෙ.ටො. 0.4ක් එක් කරමින් සම්පූර්ණ ප්‍රමාණය ලෙස මෙ.ටො. 1.47ක් ඉහත පහසුකම යටතේ ආරක්ෂිත ලෙස ගබඩා කරනු ලැබීය.

අධිකරණය මඟින් රාජසන්තක කරන ලද පළිබෝධනාශක පනත යටතේ ගබඩා කිරීම සඳහා යථෝක්ත ගබඩා පහසුකම උපකාරී විය. මෙම වසරේ ඝන පළිබෝධනාශක කි. ග්‍රෑ. 68ක් සහ ද්‍රාව්‍ය පළිබෝධනාශක ලීටර 406ක් අධිකරණ තීන්දු මත ආරක්ෂිත ගබඩාකරණයට ලක්කල අතර ද්‍රාව්‍ය පළිබෝධනාශක ලී. 809ක් සඳහා අධිකරණ තීන්දු ලබා ගැනීමේ පොරොත්තු ලේඛණයේ රැඳී සිටියි. මේ අනුව, 2017 දෙසැම්බර් වන විට නීතිමය වශයෙන් රාජසන්නක කරන ලද පළිබෝධනාශක ප්‍රමාණය මෙ.ටො. 1.87කි)

## රසායනික ප්‍රතිපත්ති සම්බන්ධිකරණය සහ ජාත්‍යාන්තර සහභාගීත්වය

2017 අප්‍රේල් 24 සිට මැයි 05 දක්වා ස්විට්සර්ලන්තයේ, ජිනීවා හිදී, ජාත්‍යාන්තර වෙළඳාමේදී ඇතැම් අන්තරායක රසායනික ද්‍රව්‍ය සහ පළිබෝධනාශක (RC COP8) සඳහා පෙර දැනුවත්කිරීමෙන් අවසර ලබා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ වූ රොටර්ඩෑම් සම්මුතියේ 8වන සාමාජික සම්මන්ත්‍රණය සහ නොනැසී පවත්නා කාබනික දූෂ්‍යකාරක (POP) පිළිබඳ ස්ටෝක්හෝම් සම්මුතියේ 8වන සාමාජික සම්මන්ත්‍රණය පවත්වන්නට යෙදිනි.

තොරතුරු හුවමාරුව පිළිබඳ වූ තායිලන්තයේදී මැතකදී පැවති වැඩමුළුවේදී ඒ සඳහා ලබාදුන් අවස්ථාව සහ සහයෝගය සම්බන්ධයෙන් හා (බාසල්, රෝටර්ඩෑම් සහ ස්ටොක්හෝම් සම්මුතීන් සඳහා ආසියානු පැසිෆික් කලාපීය ප්‍රාරම්භක රැස්වීමේ 2017, 2017 මාර්තු 6 - 8, බැංකොක්, තායිලන්තය) රොටර්ඩෑම් සම්මුතිය යටතේ දැනුවත් කිරීම් වැඩිකිරීම සහ ශ්‍රී ලංකාව තුල මෑතකදී පළිබෝධනාශක සහ ඇතැම් සංයෝග තහනම් කිරීම සඳහා සිදුකරන ලද ක්‍රියාකාරකම් වාර්තා කිරීමට සිදුකරන ලද විශිෂ්ඨ උත්සාහය සම්බන්ධයෙන් ඉන්දුනිසියාවේ පැවති වැඩමුළුවේදීද (රොටර්ඩෑම් සම්මුතියේ නිලලත් ජාතික බලධාරීන් සඳහා දැනුවත් කිරීම් වැඩිකිරීම ඉලක්ක කොට ගත් *APPPC* උප කලාපීය පුහුණු වැඩමුළුවේදී ද, 2017 මාර්තු 13 - 17, සුරබයා, ඉන්දුනිසියාව) ශ්‍රී ලංකාව තම කෘතඥතාව පල කර සිටියේය.

සම්මුතීන් යටතේ යෝජිත පළිබෝධනාශක ඇගයීම පිළිබඳ රසායනික විමසුමේදී පහත සඳහන් නිලධාරීන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය නියෝජනය කරමින් සහභාගි වූහ.

- ආචාර්ය ජේ.ඒ. සුමිත් මයා (පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්) ස්ටොක්හෝම් සම්මුතිය යටතේ (සැසිය : 2014 මැයි - 2018 මැයි) නොනැසී පවත්නා කාබනික දූෂ්‍යකාරක විමසුම් කමිටුව (POPRC) සඳහා සහභාගි වීය.
- චම්පා මාගමගේ මිය (සහකාර අධ්‍යක්ෂ, කෘෂි පර්යේෂණ) ස්ටොක්හෝම් සම්මුතිය යටතේ (සැසිය : 2017 මැයි - 2020 මැයි) රසායනික විමසුම් කමිටුව (CRC) සඳහා සහභාගි විය.

## පළිබෝධනාශක අවශේෂ සහ කෘෂි නිෂ්පාදනවල උපරිම අවශේෂ සීමා පිළිබඳ වූ ජාතික දත්ත පද්ධතිය

ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය සඳහා ජාතික පළිබෝධනාශක අවශේෂ මෙහෙයුම් වැඩසටහනක් සකස් කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරමින් දේශිය ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ අවධානය යොමු කරනු ලැබීය. වත්මනෙහි විවිධ

මානයන්ගෙන් පළිබෝධනාශක අවශේෂ හඳුනාගැනීම සඳහා විශ්ලේෂණ පහසුකම් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සකස් කරමින් පවතින අතර, යථෝක්ත අවශේෂ සම්බන්ධ මෙහෙයුම් කටයුතු වත්මන් නිලධාරි මණ්ඩලය මගින් සුපරීක්ෂාකාරි ලෙස සිදුවෙමින් පවතී.

පළිබෝධනාශක ආහාර බෝග සඳහා භාවිත කිරීම (පූර්ව අස්වනු අන්තර, PHI) සහ ආහාර අස්වනු අතර (දවස් 7-21) කාල සීමාවන් (දවස්) සහ එවැනි බෝගවල අන්තර්ගත උපරිම අවශේෂ සීමාවන් සම්බන්ධයෙන් 2017 ජුනි මසට පෙර පවත්නා එකම නිල නිවේදනය වන්නේ 1986.12.24 දිනැති අංක 433/9 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයයි. එම නිවේදනයේ පූර්ව වාර්තාව තුල වර්ග/ 13ක් සඳහා වූ කෘමි නාශක පිළිබඳ සඳහන් වන අතර කාලයත් සමග එම වාර්තාව යල් පැනගිය තත්ත්වයක පවතී. ඒ අනුව 1980 අංක 26 දරණ ආහාර පාලන පනත ප්‍රකාර, කෘෂි නිෂ්පාදනවල ආරක්ෂිත සීමා ප්‍රකාශයට පත්කිරීම සඳහා පැවරි ඇති බලතල ප්‍රකාර, 2017.06.14 දිනැති අංක 2023/34 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය හරහා කලාපීය/ ජාත්‍යන්තර ලෙස භාවිත කරනු ලබන සාමාන්‍ය පළිබෝධනාශක සහ CODEX උපරිම අවශේෂ සීමා පිළිබඳ අවසන් වාර්තාවක් ප්‍රකාශයට පත් කල අතර එහි පළිබෝධනාශක සක්‍රිය ද්‍රව්‍ය 66ක් සම්බන්ධයෙන් බෝග/ආහාර භාණ්ඩ 39ක් සඳහා උපරිම අවශේෂ සීමා 221 අඩංගු කොට තිබිණි.

භාවිතයේ තිබෙන සක්‍රිය කෘෂි පළිබෝධනාශක අන්තර්ගතයන් 110ක් අතුරින්, දේශීය / ආනයනික සහ අපනයනික කෘෂි නිෂ්පාදන සම්බන්ධ පළිබෝධනාශක අවශේෂ පෘථුල වශයෙන් දැක්වීම සඳහා බලයලත් විශ්ලේෂණ රසායනාගාරවල (ISO/IEC 17025: 2005) බාහිර සේවා භාවිත කරන ලදී. (තරඟකාරි ලංසු භාවිත කොට තෝරාගන්නා ලදී)

## විදේශ රටවලින් ආනයන කරනු ලබන ධාන්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය සහ ආරක්ෂාව නියාමනය කිරීම සඳහා ඒ හා අදාළ නීතීන් හා නියමයන් පිළිබඳ තොරතුරු ඉල්ලීම

ශ්‍රී ලංකාව වෙත සපයනු ලබන කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්ව පාලනයට අදාළ ප්‍රතිපාදන සැපයීම පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා රුසියානු තානාපති කාර්යාලය සමග නිල සන්නිවේදන කටයුතු සිදු කරනු ලදී. පළිබෝධනාශකවලට අදාළ ජාතික, ප්‍රමිතීන් ප්‍රකාශ කිරීමෙහිලා පළිබෝධනාශක, රෙජිස්ට්‍රාර් කාර්යාලය බැඳී සිටි; ඒ අනුව, දේශීය වශයෙන් ලියාපදිංචි කරන ලද පළිබෝධනාශක 66ක් සඳහා අවශ්‍ය උපරිම අවශේෂ සීමාවන් 2017.06.14 දිනැති අංක 2023/34 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

## යුරෝපා සංගමයේ විගණන කටයුතු සහ පසු විපරම් කටයුතු

2016 සැප්තැම්බර් 12 -23 කාල වකවානුවේදී අපයනය කිරීමට අපේක්ෂා කල (Ref. DG (SANTE)/2016–8787–MR) පැළැටි වලින් සකස් කල ආහාරවල පළිබෝධනාශක පාලනය ඇගයීම සඳහා ශ්‍රී ලංකාවේ සිදු කල විගණයට ප්‍රතිචාරයක් වශයෙන්, යුරෝපා සංගමය විසින් හඳුනාගන්නා ලද අවශ්‍ය පසු විපරම් කටයුතු ක්‍රියාත්මක සැලැස්ම පහත පරිදි දක්වා තිබිණි.

- පලතුරු සහ එළවළු සම්බන්ධයෙන් පළිබෝධනාශක අවශේෂ මෙහෙයුම් වැඩසටහන් පැවැත්වීම.
- කොළ එළවළු සඳහා පළිබෝධනාශක නිර්දේශ ප්‍රකාශයට පත් කිරීම.
- කෙටි පූර්ව අස්වනු අන්තර (PHI) සඳහා යොදන පළිබෝධනාශක

ලියාපදිංචි කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබාදීම.

### ඉදිරිපත් කළ වාර්තා

පළිබෝධනාශකවල අවදානම අඩු කිරීම පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තු මහජන ගිණුම් කාරක සභාව වෙත 2017 සැප්තැම්බර් 22 දින භාර දෙන ලදී.

### ලැබූ සම්මාන

පී.ඩබ්.වයි. ලක්ෂානි මිය - “Quechers තාක්ෂණය යොදා ගත් Gc/MS භාවිතයෙන්” එළවළු වවන ප්‍රදේශ කිහිපයක තෝරාගත් එළවළු වර්ග කිහිපයක පළිබෝධනාශක අවශේෂ පරීක්ෂාව පිළිබඳ පර්යේෂණය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සම්මන්ත්‍රණයේදී හොඳම ඉදිරිපත් කිරීම සඳහා වූ සම්මානය.

### M/s මැක්වුඩ් (පෞද්) සමාගම කෘෂි රසායනික කටයුතු නැවැත්වීම.

M/s මැක්වුඩ් (පෞද්) සමාගම විසින් තම කෘෂි රසායනික කටයුතු අහවර කිරීමේදී, කල් පිරුණු යල් පැන ගිය පළිබෝධනාශක හේතුවෙන් පරිසරයට හානි සිදුවීම වැලැක්වීම හා මිනිස් සෞඛ්‍ය ආරක්ෂා කරගනු වස් එම සමාගම විසින් පසු විපරම් කටයුතු සිදු කළ යුතු බවට පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් පූර්වයෙන් නියම කරන ලදී.

### පළිබෝධනාශක පනත යටතේ නිකුත් කරන ලද M/s පොල්කෙමෙක්ස් (පෞද්.) සමාගමේ පළිබෝධනාශක බලපත්‍රය තහනම් කිරීම

2017 අගොස්තු 31 වන දින පැවති 87 වැනි PeTAC සමුළුවේ උපදෙස් පරිදි, 2017 අගොස්තු 31 වන දින හෝ ඊට පෙර සිදුකරන ලද ක්‍රියාවන්වල ප්‍රතිඵලයක් හේතුවෙන්, M/s පොල්කෙමෙක්ස් (පෞද්.) සමාගම සඳහා පළිබෝධනාශක පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රය වසර 2ක් සඳහා අත්හිටුවන ලදී. මෙම ක්‍රියාමාර්ගය පනතේ 11 වන වගන්තිය ප්‍රකාර සිදුකරන ලදී. කෙසේවුවද, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත සිදුකරන ලද අභියාචනයට ප්‍රතිචාර ලෙස 2017 දෙසැම්බර් 29 වන දින පැවති 89 වන PeTAC රැස්වීමේදී තහනම් කිරීමේ තීරණය ලබා දෙන තුරු පූර්වයෙන් සිදුකල තහනම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොවුණි. එබැවින්, එම තීරණය කල්දමන ලද අතර එය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වීමට පෙර අහෝසි කරන ලදී.

## 2018 වර්ෂය සඳහා සැලැස්ම

- නව ලියාපදිංචි කිරීම් සහ නැවත ලියාපදිංචි කිරීම් සඳහා ඉල්ලුම්පත් බාර ගැනීම.
- නව ලියාපදිංචි කිරීම් සහ නැවත ලියාපදිංචි කිරීම් සඳහා ඉල්ලුම්පත් ලිපි ගොනු ඇගයීම.
- නව ලියාපදිංචි කිරීම් සහ නැවත ලියාපදිංචි කිරීම් සඳහා සහතික සකස් කිරීම
- පළිබෝධනාශක තාක්ෂණික සහ උපදේශන කමිටු රැස්වීම් (PeTAC)
- පළිබෝධනාශක අනුකමිටු රැස්වීම් (කෘෂි පළිබෝධනාශක අනු කමිටු, ගෘහස්ථ සහ මහජන සෞඛ්‍ය පිළිබඳ පළිබෝධනාශක අනු කමිටුව, කාර්මික පළිබෝධනාශක අනු කමිටුව)
- පළිබෝධනාශක කර්මාන්තය සහ අනෙකුත් පාර්ශවකරුවන් සමග කථිකාවත.

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පළිබෝධනාශක ඇගයුම් සම්බන්ධීකරණය (ජෛව සාඵල්‍යතාවය පිළිබඳ) සියළු ඉලක්ගත කණ්ඩායම් දැනුවත් කිරීම, සුරක්ෂිත භාවිතය හා පළිබෝධනාශක නීතිමය වශයෙන් විකිණීම සහතිකකිරීම, පළිබෝධනාශකවලට අදාළ දත්ත එක්රැස් කිරීම සහ සම්පාදනය කිරීම**

- මාධ්‍ය වැඩසටහන් සහ ප්‍රදර්ශන
- කෘෂි රසායන අලෙවිය සහ තාක්ෂණික සහකාරවරුන් (ASTA) සහ වෙළෙඳුන් පුහුණු කිරීම / සහතිකකරණය.
- බලයලත් නිලධාරීන් සහ බලාත්මක නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්
- පළිබෝධනාශක ලියාපදිංචි කිරීම සඳහා සංශෝධිත මාර්ගෝපදේශ/ සමාගම් ලියාපදිංචි කිරීම සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම.
- ආනයනික සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම, සම්පාදනය සහ බෙදාහැරීම (මහබැංකු, විශ්ව විද්‍යාල, පර්යේෂකයන්, රාජ්‍ය ආයතන ආදිය)

**අනුකූලතා අධීක්ෂණ කටයුතු (නිෂ්පාදන ගුණාත්මක තත්ත්වය සහ පරිසරයේ තිබෙන පළිබෝධනාශක අවශේෂ/ පනත උල්ලංඝනය කිරීමට එරෙහිව ක්‍රියාමාර්ග)**

- ආනයන අවසරපත් නිකුත් කිරීම.
- ආනයන නියැදි අනුමැතීන් නිකුත් කිරිම
- පරිභෝජන පදනම මත ගුණාත්මක සහතික ඇගයීම
- අනුමැතිය සඳහා ලේබල පරීක්ෂාව
- අනුමැතිය සඳහා ප්‍රචාරණ ද්‍රව්‍ය පරීක්ෂාවට භාජනය කිරීම.
- සැකසුම් කර්මාන්තශාලා පරීක්ෂා කිරීම.
- පළිබෝධනාශක දූෂ්‍යකාරක පරීක්ෂා කිරීම.
- අනුමත කරන ලද නැවත ඇසුරුම් කිරීමේ පහසුකම් සහ ගබඩා පරීක්ෂා කිරීම.
- ධූමකරණ පරිශ්‍ර සහ ගෘහාශ්‍රිත පළිබෝධකයන් පාලනය කිරීමේ නිරතවන්නන් පරීක්ෂා කිරීම සහ සහතිකරණය
- හිස් පළිබෝධනාශක බඳුන් අපහරණය සහ කළමනාකරණය කිරීම සඳහා වැඩසටහන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- පළිබෝධ පාලන සේවා ලියාපදිංචි කිරීම.
- වගකිවයුතු පදනමෙන් නිරෝධායන සහ පූර්ව නැව්ගත කිරිම සඳහා $CH_3Br$ අනුමත කිරීම.
- පළිබෝධපාලන සේවා සඳහා ($CH_3Br$ හාර) සීමා කරන ලද පළිබෝධනාශක අවසරපත් නිකුත් කිරීම.
- පළිබෝධනාශක අලෙවි සැල් පරීක්ෂාව
- ක්ෂේත්‍ර පැමිණිලි විභාග කිරීම.
- පනත උල්ලංඝනය කිරීමට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම සහ නඩු දැමීම
- වෙළඳුන් පුහුණු කිරීමේ සහතික නිකුත් කිරීම
- බලයලත් නිලධාරීන් විසින් වෙළඳ සහතික නිකුත් කිරීම.
- ඉල්ලුම්පත් පිළිගැනීම සඳහා යෝග්‍යතාවය සම්බන්ධ පරීක්ෂන වාර්තා ලබාගැනිමට, වෛද්‍ය පර්යේෂණ ආයතනය හා වෙනත් පර්යේෂණ ආයතන වෙත සාම්පල යැවීම.

- පරිභෝජනය පාදකව නියැදිවල ගුණාත්මක තත්ත්ව විශ්ලේෂණය ප්‍රකාරව සැකසුම් අනුමැතීන් නිකුත් කිරීම.
- එළවළු, පලතුරු සහ ජලය තුළ පවතින පළිබෝධනාශක අවශේෂ මට්ටම තහවුරු කර ගැනීම සඳහා අනුකූලතා අධීක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම.
- ආහාර සහ ජලය තුළ ඇති බැර ලෝහ විශ්ලේෂණය
- සංයුති විශ්ලේෂණය
- යෝග්‍යතාවය සඳහා පරීක්ෂණ වාර්තා ලබා ගැනීම (ජෛව සාඵල්‍යතාවය හා බැර ලෝහ වාර්තා)
- යුරෝපා සංගමයේ විගණන යටතේ අවශේෂ දත්ත විශ්ලේෂණය.

**අභ්‍යන්තර සහ අන්තර් දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ ආයතන ආදිය සඳහා තාක්ෂණික විශේෂඥයන්/ සාමාජිකයන්/ සම්පත් දායකයන් ලෙස සහභාගී වීම.**

## කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් | 01 | - |
| ප්‍රධාන විද්‍යාඥ (ධූලක) | 01 | - |
| පළිබෝධනාශක නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් | 01 | - |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 08 | 05 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 02 | 02 |
| පර්යේෂණ සහකාර (විශේෂ ශ්‍රේණිය) | 01 | - |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 02 | 02 |
| සංවර්ධන නිලධාරි | 04 | 04 |
| කෘෂිකර්ම උපදේශක | 06 | 07 |
| පර්යේෂණ සහකාර | 07 | 07 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 05 | 05 |
| තාක්ෂණ සහායක | 03 | 01 |
| රියදුරු | 03 | 03 |
| ගබඩාකරු | 01 | 01 |
| පර්යේෂණ උපසහකාර | 01 | - |
| කාර්යාල කාර්ය සහායක | 01 | 01 |
| මුරකරු | 02 | 01 |
| කම්කරු | 02 | 02 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 05 | 05 |
| **එකතුව** | **58** | **46** |

## 2.1.4. පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය - ගන්නොරුව

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය පිහිටුවනු ලැබුයේ පැළෑටි ජාන සම්පත් ගවේෂණය, එක්රැස් කිරීම හා සංරක්ෂණය කිරීම වෙනුවනි. එම මූලික අරමුණ කරා යාමේදී, කෘෂිකාර්මික බෝගවල භූමි දර්ශ, පාරම්පරික ප්‍රභේද, වනදර්ශ, පාරම්පරික ප්‍රභේද, වැඩිදියුණු කල ප්‍රභේද, දෙමහුම් ප්‍රභේද හා ඒවායේ දෙමාපිය දර්ශද සංරක්ෂණය කරයි. එමෙන්ම සංරක්ෂිත ජානප්ලාස්ම ගුණනය, ව්‍යාප්තිය, මෙන්ම බෝග වැඩි දියුණු කිරීම සඳහා යොදා ගන්න අතර මෙම ජාන සම්පත් රූප විද්‍යාත්මකව හා ජෛව රසායනිකව හා අනුක විද්‍යාත්මකව ලාක්ෂණිකරණයටද ලක් කෙරේ. පැළෑටි ජාන සම්පත් සංරක්ෂණයෙදී බීජ සඳහා මාධ්‍ය කාලින සහ කෙටි කාලින බීජ සංරක්ෂණයද සෙසු බෝග වර්ග සඳහා නලස්ථ සංරක්ෂණය මෙන්ම අධිශීත සංරක්ෂණයද, ක්ෂේත්‍ර ජාන බැංකුද භාවිතා කරයි. මේ වන විට බීජ සංරක්ෂණ අංශය තුල බීජ අනුක්‍රමික (accessions) 1510ද නලස්ථ සංරක්ෂණ අංශයේ අනුක්‍රමික 250ක් සහ අධිශීත සංරක්ෂණය පර්යේෂණ මට්ටමින් පවතී.

මෙම වාර්තාව මගින් පැළෑටි සම්පත් මධ්‍යස්ථානයේ 2017 වසරේ ප්‍රගතිය පිළිබඳ සාරාංශගත ඉදිරිපත් කිරීමක් සිදු කෙරේ.

### අයවැය

**වගු අංක 2.1.4.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 9,733,973 | 9,440,112 | 97 |
| මූලධන | 9,530,000 | 8,682,497 | 91 |
| ව්‍යාපෘති | | | |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන (NFPP) | 1,000,000 | 984,040 | 98 |
| • ආසියානු ආහාර සහ කෘෂිකර්ම සහයෝගීතා ව්‍යාපෘතිය (AFACI) | 1,740,000 | 1,720,706 | 99 |
| • ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති (NARP) | 1,194,643 | 1,205,623 | 101 |
| • ආහාර සහ පෝෂණය සඳහා ජෛව විවිධත්වය (BFN) | 27,997,000 | 27,876,850 | 100 |
| • දේශගුණික විපර්යාස කෙරෙහි ජෛව විවිධත්ව අනුවර්තනය (BACC) | 665,000 | 643,831 | 97 |
| **එකතුව** | **51,860,616** | **50,560,659** | **97** |

## ප්‍රගතිය

### ජානප්ලාස්ම ගවේෂණය සහ එක්රැස් කිරීම

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ ගවේෂණ ඒකකය මගින් බෝග සහ බෝගවල වන දර්ශ එක්රැස් කිරීමේ කටයුතු අඛණ්ඩව සිදුකරන ලදී. (වගු අංක 2.1.4.2)

**වගු අංක 2.1.4.2: ගවේෂණ මගින් එක්රැස් කරගත් සහ පර්යේෂණ ආයතනවලින් ලද ජානප්ලාස්ම නියැදි සංඛ්‍යාව**

| බෝග කාණ්ඩය | එක්රැස් කරගත් නියැදි සංඛ්‍යාව | පර්යේෂණ ආයතනවලින් ලද ජානප්ලාස්ම සංඛ්‍යාව |
|---|---|---|
| වී | 57 | 82 |
| එළවළු | 180 | 17 |
| ධාන්‍ය | 27 | 10 |
| බඩඉරිඟු | 6 | - |
| තෙල් බෝග | 4 | 27 |
| මුල් හා ආකන්ද | 34 | 31 |
| අනෙකුත් | 4 | 51 |
| **එකතුව** | **312** | **217** |

### බීජ ද්‍රව්‍ය සංරක්ෂණය කිරීම

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ බීජ සංරක්ෂණ ඒකකය මගින් ජානප්ලාස්ම ශීත තත්වයේ ගබඩා කර තැබීම සහ ප්‍රයෝජනය සඳහා නියැදි බෙදා හැරීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරනු ලබයි. 2017 වසරේදී නව අනුක්‍රමික 703ක් ජාන බැංකුවෙහි සංරක්ෂණය කරඇති අතර ගුණනය කළ අනුක්‍රමික 335ක් සංරක්ෂණය කරන ලදී. වසර අවසන් වන විට ජාන බැංකුව සතු මුළු අනුක්‍රමික ප්‍රමාණය 15,110ක් විය. (වගු අංක 2.1.4.3)

**වගු අංක 2.1.4.3: ජාන බැංකුවේ වත්මන් සංරක්ෂණ තත්ත්වය**

| බෝග කාණ්ඩය | එකතුන් සංඛ්‍යාව |
|---|---|
| වී සහ ආශ්‍රිත විශේෂ | 5243 |
| වෙනත් ධාන්‍ය සහ ආශ්‍රිත විශේෂ | 1853 |
| ධාන්‍ය රනිල | 2290 |
| එළවළු රනිල | 1739 |
| සොලනේසියේ කුලයේ එළවළු, කුළුබඩු සහ ආශ්‍රිත විශේෂ | 1472 |
| කුකර්බිට් කුලයේ එළවළු | 901 |
| බ්‍රැසිකේසියේ කුලයේ එළවළු | 31 |
| ඇණු | 21 |
| වෙනත් එළවළු | 480 |
| කොළ එළවළු | 202 |
| මුල් හා ආකන්ද | 9 |
| අඹ සහ ආශ්‍රිත විශේෂ | 140 |
| තෙල් බෝග | 467 |
| තන්තුමය බෝග | 67 |
| ඖෂධීය ශාක | 30 |
| පලතුරු | 165 |
| **එකතුව** | **15,110** |

## ජානප්ලාස්ම බෙදාහැරීම

2017 වර්ෂයේදී, ගොවීන්, පර්යේෂණ මධ්‍යස්ථාන, රාජ්‍ය නොවන සංවිධාන සහ විශ්ව විද්‍යාලවල ඉල්ලීම මත විවිධ බෝග ප්‍රභේදවල අනුක්‍රමික 846ක් බෙදා දෙන ලදී.

**වගු අංක 2.1.4.4: 2017 වසරේදී බෙදා හරින ලද ජානප්ලාස්ම**

| ආයතනය | බෙදා හරින ලද සාම්පල සංඛ්‍යාව |
|---|---|
| විශ්ව විද්‍යාල | 89 |
| පර්යේෂණ ස්ථාන | 295 |
| ගොවින් සහ වෙනත් පුද්ගලයන් | 224 |
| අනෙකුත් ආයතන | 238 |
| **එකතුව** | **846** |

## ගබඩා තත්ත්ව යටතේ බීජ වල හැසිරීම පිළිබඳ පර්යේෂණ

1985, 1990 සහ 1991 දී සංරක්ෂණය කරන ලද පහත සඳහන් බීජ වල (එනම්, බඩඉරිඟු, ඉදල් ඉරිඟු, කුරක්කන්, තණහාල්, කව්පි, මුං, මෑ, හාල්මැස්සන් දඹල, *Solanum* Spp., එළබටු, තක්කාලි, වට්ටක්කා, පිපිඤ්ඤා, කැකිරි, තම්පලා) ජීව්‍යතාවය සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලදී. මෙම බීජ අතුරින් බඩඉරිඟු, ඉදල් ඉරිඟු, කැකිරි, කව්පි, එළබටු, වට්ටක්කා, තණහාල් සහ *Solanum* Spp., අඩු ජීව්‍යතාවයක් පෙන්නුම් කල අතර අනෙකුත් බෝග 85%කට වඩා වැඩි ප්‍රරෝහණ ප්‍රතිශතයක් පෙන්නුම් කලේය.

## ජානප්ලාස්ම ගුණනය

පහත සඳහන් ජාන ප්ලාස්ම ගුණනය කර සංරක්ෂණය සඳහා ජාන බැංකුවට භාරදී ඇත. (වගු අංක 2.1.4.5)

**වගු අංක 2.1.4.5: 2017 වසරේදී ගුණනය කරන ලද අනුක්‍රමික සංඛ්‍යාව**

| බෝගය | විද්‍යාත්මක නාමය | එකතුන් සංඛ්‍යාව |
|---|---|---|
| තම්පලා | *Amaranthus* sp. | 04 |
| අළු පුහුල් | *Benincasa hispida* | 01 |
| කතුරුමුරුංගා | *Sesbania grandiflora* | 01 |
| තෝර පරිප්පු | *Cajanus cajan* | 01 |
| කරවිල | *Momordica charantia* | 24 |
| උඳු | *Vigna mungo* | 41 |
| ආලන්ගා | *Ipomoea alba* | 01 |
| වම්බටු | *Solanum melongena* (L.) | 29 |
| මිරිස් | *Capsicum* sp. | 66 |
| අබ | *Brassica juncea* | 01 |
| බෝංචි | *Phaseolus vulgaris* (L.) | 47 |
| කවුපි | *Vigna unguiculata* (L.) | 82 |
| පිපිඤ්ඤා | *Cucumis sativus* (L.) | 01 |
| කුරක්කන් | *Eleusine coracana* (L.) | 04 |

| **බෝගය** | **විද්‍යාත්මක නාමය** | **එකතුන් සංඛ්‍යාව** |
|---|---|---|
| තණහාල් | *Setaria italica* (L.) | 91 |
| මුං | *Vigna radiate* (L.) | 02 |
| රටකජු | *Arachis hypogaea* | 09 |
| කොල්ලු | *Macrotyloma uniflorum* (L.) | 11 |
| කැකිරි | *Cucumis melo* (L.) | 02 |
| ලිමා බෝංචි | *Phaseolus lunatus* | 01 |
| වැටකොළු | *Luffa acutangula* | 25 |
| බඩඉරිඟු | *Zea mays* | 04 |
| අබ | *Brassica juncea* | 01 |
| බණ්ඩක්කා | *Abelmoschus esculentus* (L.) | 129 |
| පෙනෙල | *Cardiosprmum halicacabum* | 01 |
| වට්ටක්කා | *Cucurbita maxima* (L.) | 01 |
| රතු ළූණු | *Allium cepa* (L.) | 07 |
| වී | Oryza *sativa* (L.) | 34 |
| තල | *Sesamum indicum* | 04 |
| මෑ | *Vigna unguiculata* (L.) | 87 |
| පතෝල | *Trichosanthes cucumerina* (L.) | 10 |
| ඉදල් ඉරිඟු | *Sorghum bicolor* (L.) | 89 |
| සෝයා බෝංචි | *Glycine max* | 20 |
| නිවිති | *Spinacia oleracea* | 04 |
| සූරිය කාන්ත | *Helianthus annuus* | 01 |
| තක්කාලි | *Lycopersicon esculentum* Mill. | 33 |
| වඳුරු මෑ | *Mucuna pruriens* | 01 |
| දඹල | *Psophocarpus tetragonolobus* (L.) | 29 |
| **එකතුව** | | **899** |

## ජානප්ලාස්ම ලක්ෂණීකරණ සහ ඇගයීම

රූප විද්‍යාත්මක ලක්ෂණ අනුව මිරිස්, ඉදල් ඉඟුරු සහ බණ්ඩක්කා අනුක්‍රමික ලාක්ෂණීකරණය කරන ලදී. මිරිස් සහ බණ්ඩක්කා වල සාර්ථක විය හැකි වර්ග, අස්වනු ඇගයීම සඳහා තෝරා ගන්නා ලදී. ලාක්ෂණීකරණ තොරතුරු දත්ත කළමනාකරණ අංශයට භාරදෙනලදී.

වගු අංක 2.1.4.6: 2017 වසරේදී ලක්ෂණීකරණයට සහ ඇගයීමට ලක් කළ ජනකප්ලාස්ම

| බෝගය | විද්‍යාත්මක නාමය | ලාක්ෂණීකරණය / ඇගයීම සිදුකල එකතුන් සංඛ්‍යාව | තෝරාගන්නා ලද එකතුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ඉදල් ඉඟුරු | *Glycine max* (L.) | 89 | - |
| මිරිස් | *Capsicum* Sp. | 66 | 5 |
| බණ්ඩක්කා | *Abelmoschus esculentus* (L.) | 129 | 20 |
| **එකතුව** | | **284** | **25** |

## ආහාර සහ පෝෂණය සඳහා ජෛව විවිධත්වය (BFN)

ජෛව විවිධත්ව සංරක්ෂණය හා තිරසාර භාවිතය තුලින් මාතෘ පෝෂණය හා යහ පැවැත්ම වැඩිදියුණු කිරීම මුඛ්‍ය පරමාර්තථය කරගනිමින් GFE ආයතනයේ මුල්‍ය දායකත්වයෙන් ක්‍රියාත්මක වන BFN ව්‍යාපෘතිය ප්‍රධාන අංග 3ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්, දැනුම පාදක කොටගත් ප්‍රතිපත්තිය, නියාමන රාමුව සහ වෙළඳපළ පිළිබඳ දැනුම යනාදියයි. ගිරිබාව, උඩුකුඹුර සහ නිවුන්හැල්ල ප්‍රදේශ වල සිදුකරන ලද නියමු ව්‍යාපෘති වලදී, කෘෂි ජෛව විවිධත්වය, ආහාර විවිධත්වය සහ ඒ හා බැඳුණු පාරම්පරික දැනුම රැස්කර ගන්න ලද අතරම ඒවා වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී. BFN ව්‍යාපෘතිය මගින් දැනට බෝග විශේෂ 28ක අයත් පාරම්පරික/දේශීය ප්‍රභේද 58ක පෝෂණ සංයුතියේ විශ්ලේෂණය කොට එම දත්ත මගින් BFN වෙබ් අඩවිය යාවත්කාලින කර ඇත.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂි ව්‍යාපාර අංශය සමග එක්ව කෘෂි විවිධත්වය හා ඉහල පෝෂණ අගයක් හා වටිනාකමක් ඇති බෝග හා ආහාර නිෂ්පාදනය, අගය ඉහල නැංවීම හා අලෙවිකරණය වැඩිදියුණු කිරීමත්, ඒ සඳහා ක්‍රමවේද හඳුනා ගැනීමත්, අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීමත්, විධිමත් සමීක්ෂණ හා ඉලක්ක කණ්ඩායම් අතර පවත්වන ලද සාකච්ඡා යොදා ගනිමින් සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ ඌණ භාවිත ආහාරයට ගත හැකි ශාක විශේෂ වල උද්භිද විද්‍යාත්මක හා පාම්පරික දැනුම එක්රැස් කිරීම මේ වනවිට සිදුකරගෙන යමින් පවතී. තවද නියමු ප්‍රදේශ ඉලක්ක කරගත් ගෙවතු විවිධාංගිකරණ වැඩසටහන් දියත්කර ඇත. මේ සඳහා එක් ප්‍රදේශයකින් පවුල් 50ක් බැගින් තෝරාගෙන ඇති අතර එමගින් වැඩමුළු හා තාක්ෂණික දැනුම ලබා දෙන ලදී. තවද දේශීය වැල් අල වගා කිරීම ඉහල නැංවීම හා ගොවිපවුල් නගා සිටුවීමට අරනායක ප්‍රදේශයේ පවුල් 70ක්ද නිවුල්හැල්ල ප්‍රදේශයේ පවුල් 30ක් සඳහා වැල් අල වගා කිරීමේ ව්‍යාපෘති ආරම්භ කර ඇත. ඌනභාවිත ආදර්ශ පලතුරු උද්‍යාන (ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය-1, පාසැල් - 2; පෝෂදායි ඖෂධීය ආහාර හා බිමවර්ග භාවිතය පිළිබඳ කාන්තාවන් සඳහා වූ ස්වයං රැකියා වැඩසටහන, "පෝෂණ ගුණයෙන් යුතු ඖෂධීය ආහාර සහ බීම" පිළිබඳ කෘෂි වට්ටෝරු පොත සැකසීම යනාදිය සිදුකරන ලදී. වැඩිදියුණු කළ මානව පෝෂණය හා යහපැවැත්ම සඳහා දේශීය කෘෂි විවිධාංගීකරණය සංරක්ෂණය කිරිම හා උපයෝජනය ප්‍රවර්ධනය කිරිම සඳහා බහු මාධ්‍ය ප්‍රවේශය; රූපවාහිනි සහ ගුවන්විදුලි වෙළඳ දැන්වීම නිෂ්පාදනය හා ප්‍රචාරණය, හෙළ බොජුන් වෙළඳසැල්

වැඩිදියුණු කිරීම; දිවයින පුරා ආහාර පිසීමේ තරඟ, සාකච්ඡා සංසඳ, සම්මන්ත්‍රණ සහ විදී නාට්‍ය සමග ලෝක ආහාර දිනය සැමරීම සඳහා ජාතික ආහාර උත්සවයක් 2017 ඔක්තෝබර් 16 දින පැවැත්විණි.

### කෘෂි ජෛව විවිධත්ව සංරක්ෂණය එක් තලයකට ගෙන ඒම, ජීවනෝපාය සඳහා ශ්‍රී ලංකාවේ කෘෂි ආර්ථික පද්ධතිය තුල භාවිතය සහ දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය කිරීමේ ව්‍යාපෘතිය (BACC)

මෙම ව්‍යාපෘතියේ පරමාර්තය වුයේ දේශගුණික විපර්සායන්ට අනුවර්තනය වීම සඳහා තෝරාගත් කෘෂි පාරසරික පද්ධති තුනට සාම්ප්‍රදායික ජාන සම්පත් ලබාදීම, ගුණනය කිරීම සහ සුලබ කිරීමයි. එවැනි මූලික ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ. පර්යේෂකයන් හා ව්‍යාපෘති ස්ථාන 3ක ගොවීන්ගේ දායකත්වයෙන් සහභාගීත්ව ප්‍රභේද වරණ වැඩසටහන් PGRC පර්යේෂණ ක්ෂේත්‍ර තුලදී පැවැත්විණි. වැඩසටහන තුලදී ගොවීන් බණ්ඩක්කා වගා ක්ෂේත්‍රයේ සිය ක්ෂේත්‍ර අත්දැකීම් සහ සාම්ප්‍රදායික දැනුම හුවමාරු කර ගත්හ. ගොවි ක්ෂේත්‍රවල බෝග අධ්‍යයන සඳහා සාම්ප්‍රදායික බණ්ඩක්කා එකතුන් 5ක් තෝරා ගන්නා ලදී. ගොවීන්ගේ ඉල්ලීම මත, බෝග විවිධාංගීකරණය ඉහළ දැමීම සඳහා විවිධ එළවළු විශේෂවල සාම්ප්‍රදායික ප්‍රභේද ගුණනය කිරීමත්, ව්‍යාපෘති ස්ථානවල බෝග විවිධත්වය ව්‍යාප්ත කිරීම සඳහා එම ප්‍රභේද හඳුන්වා දීමත් සිදු කරන ලදී.

ගොවීන්, ව්‍යාප්ති නිලධාරීන්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, පශු වෛද්‍ය පීඨය සමග ඒකාබද්ධව, ජෛව විවිධත්ව පොලක් උඩු කුඹුර ව්‍යාපෘති ස්ථානදී පවත්වන ලදී. මෙය ව්‍යාපෘති ස්ථාන පුරා පවතින බෝග සහ බෝග විශේෂ විවිධාංගීකරණය ඇගයීම අරමුණු කරගෙන සංවිධානය කරන ලදී. එක් එක් ව්‍යාපෘති ස්ථාන සඳහා ප්‍රජා ජෛව විවිධත්ව ලේඛණ (CBR) ස්ථාපිත කරමින් බෝග විවිධාංගීකරණ කටයුතු ලේඛන ගත කරන ලදී. සාම්ප්‍රදායික බෝග සඳහා ගොවිපල සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා එක් එක් ව්‍යාපෘති භූමිය තුල ප්‍රජා බීජ බැංකු ස්ථාපිත කිරීම ආරම්භ කරන ලදී. මෙම ප්‍රජා බීජ බැංකු සංකල්පය පිළිබඳ ගොවීන් දැනුවත්ව සිටින අතර, පාරම්පරික බීජ සංරක්ෂණ ක්‍රම භාවිතා කිරීම පිළිබඳ ගොවීන් සමග සාකච්ඡා පවත්වනු ලැබීය.

## ජෛව තාක්ෂණය

### සාම්ප්‍රදායික වී ප්‍රභේදවල කුඩා විවිධත්ව නියෝජිත එකතුවක් සකස් කිරීම

SSR සලකුණු යොදා ගනිමින් සම්ප්‍රදායික වී ප්‍රභේද වල රූප විද්‍යාත්මක සහ අණුක ලාක්ෂණිකරණය මත පදනම්ව, වාණිජමය වශයෙන් වැදගත් සාම්ප්‍රදායික වී ප්‍රභේද 11කින් (සුදු හීනටි, කළු හීනටි, සුවඳැල්, පච්චපෙරුමාල්, කුරුළුතුඩ, මඩතවාළු, පොක්කලි, සුදුරු සම්බා, මුරුංගකායන්, වෙද හීනටි, හේරත් බණ්ඩා) ලබා ගත් නියෝජිත එකතුන් (core collection) හඳුනා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය සිදු කරන ලදී. එක් එක් වී ප්‍රභේදය සඳහා නියෝජිත එකතුවක් හඳුනා ගන්නා ලදී.

මෙම තොරතුරු වාණිජ වගාවන් සඳහා, සංරක්ෂණ කටයුතු සඳහා මෙන්ම භාවිතය සහ බීජ සහතික කිරීමේ කාර්යයන්වලදී ප්‍රභේද තහවුරු කරගැනීම සඳහා උපයෝගී කරගත හැක.

### නියඟයට ඔරොත්තු දීම සඳහා වූ වී ජානප්ලාස්මවල රූපානුදර්ශීය සහ අණුකවිද්‍යාත්මක ලාක්ෂණිකරණය

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික කෘෂි පර්යේෂණ සැලැස්ම (NARP) මගින් ප්‍රතිපාදන සැලසෙන අතර, අධ්‍යයනයේ අරමුණු වුයේ නියඟයට ඔරොත්තු දෙන

ප්‍රභේද වැඩිදියුණු කිරීම සඳහා රූපානුදර්ශීය සහ අණුක සලකුණු කිරීමේ දත්ත යොදාගනිමින් නියඟයට ඔරොත්තු දෙන එකතුන් හඳුනා ගැනීමයි. *Oryza eicchingari* ඉතා හොඳින් නියඟයට ඔරොත්තු දෙන ප්‍රභේදීය ලක්ෂණ පෙන්නුම් කරන අතර, රූපානුදර්ශීය ලක්ෂණීකරණය මත පදනම්ව, ගොඩහීනටි, ඇල්වී, පොඩිනියං වී යන ප්‍රභේද ද නියං තත්ත්වයකට ඔරොත්තු දෙන පෙළ (lines) ලෙස හඳුනා ගැනින. නිර්දේශිත ප්‍රභේදය වන Bg 300 ද නියඟයට ඔරොත්තු දීමේ ලක්ෂණ පෙන්නුම් කලේය. ජාන සලකුණු 3ක් සඳහා ජාන ප්‍රකාශන විශ්ලේෂණ සිදුකරන ලද අතර, නියඟය හා සම්බන්ධ ගති ලක්ෂණ පෙන්නුම් කරන ප්‍රභේද සඳහා ගතිලක්ෂණ සමූහනයක් සිදුකරන ලදී.

## අනෝදා ජානප්ලාස්මවල අණුක විද්‍යාත්මක ලාක්ෂණීකරණය

පලතුරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය - හොරණ, පලතුරු පර්යේෂණ මධ්‍යස්ථානය - ගන්නොරුව සහ අඹතැන්න යන මධ්‍යස්ථානවල තිබෙන අනෝදා එකතුන් (Annona muricata) සඳහා ISSR සලකුණු 14ක් භාවිත කරමින් ජාන විවිධත්වය අනුක විද්‍යාත්මකව විශ්ලේෂණය කරන ලදී. ප්‍රධාන අනෝදා උද්‍යාන වන බදුල්ල ඇතුළු යාපනය, පේරාදෙණිය, අවිස්සාවේල්ල, කෑගල්ල, ගම්පොළ, මැදවල සහ කුණ්ඩසාලය යන ස්ථාන වලින් නියැදි ලබා ගන්නා ලදී. ජාන විවිධත්වය ගණනය කිරීම සඳහා නියැදි 50ක් යොදා ගත් අතර, දත්ත විශ්ලේෂණය අඛණ්ඩව සිදු වේ. මෙම පර්යේෂණයේදී අනාවරණය කරගත් තොරතුරු, ලෙස වාණිජමය සහ කෘෂි ආර්ථිකමය වශයෙන් වැදගත් වන්නා වූ ලක්ෂණ සහිත ප්‍රභේද හඳුනා ගැනීමට සුදුසු අනුක සලකුණු හඳුනා ගන්න ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා NARP වෙතින් ප්‍රතිපාදන ලබා දෙන ලදී.

## බණ්ඩක්කා වනදර්ශ වල කහ නාරටි විචිත්‍ර වෛරස් රෝගයට (YVMV) ප්‍රතිරෝධී ජාන සලකුණු කිරීම

ජාතික පර්යේෂණ සභාව මගින් අරමුදල් සම්පාදිත මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මගින් ජනප්‍රිය බණ්ඩක්කා ප්‍රභේදයක් වන MI-7 ප්‍රභේදයට වන බණ්ඩක්කා විශේෂයක් වන කපුකිනිස්ස (*Abelmochus angulosus)* සතු කහ නාරටි විචිත්‍ර වෛරස් රෝගයට ප්‍රතිරෝධී ජාන අණුක තාක්ෂණය මගින් සලකුණු කිරීම ආරම්භ කෙරිණි. එම වන බණ්ඩක්කා විශේෂය සතු මෙම ප්‍රතිරෝධී ජානය, ආකලන වශයෙන් නිලීන ජාන දෙකකින් පාලනය වන බැව් සිදු කරන ලද ප්‍රවේණි අධ්‍යයනයෙන් අනාවරණය විය. RAPD පූර්වක 75කට වඩා වැඩි ප්‍රමාණයක් යොදා ගනිමින් අණුක විශ්ලේෂණය සිදුකරන ලදී. ප්‍රතිරෝධතාවක් දැක්විය හැකි, බහුරූපීතාවක් සහිත RAPD පූර්වක 3ක් හඳුනා ගන්නා ලදී. SCAR සලකුණු කිරීම කරමින් පවතී.

## SSR සලකුණු (Simple Sequence Repeat) යොදා ගනිමින් 'නයි මිරිස්' වල (*Capsicum chinense* Jacq.) ජානමය විවිධත්වය විශ්ලේෂණය කිරීම

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ බීජ බැංකුවේ සංරක්ෂණය කොට ඇති 'නයි මිරිස්' ජානප්ලාස්ම වල ජානමය විවිධත්වය හඳුනාගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කෙරිණි. *C. annuum* 2ක් *C. frutescens* 2ක් සහ *C. baccatum* 1ක් වශයෙන් තෝරාගත් ප්‍රභේදයන්හි නයි මිරිස් ජානප්ලාස්ම 25ක් සඳහා SSR සලකුණු 22ක් යොදා ගනිමින් අණුක විද්‍යාත්මක ලාක්ෂණීකරණය සිදු කර ලදී. ජානයේ බණ්ඩ විශ්ලේෂණය මඟින් ජාන පරතරය පදනම්ව තෝරා ගත් ජානප්ලාස්ම කාණ්ඩ 3කට වෙන් කෙරුණි. නයි මිරිස් එකතුන් සියල්ල එක් පොකුරකට

කාණ්ඩගත කෙරිණි. නිවැරදිව හඳුනා නොගත් ඇතැම් එකතුන් ජාන විශ්ලේෂණ ප්‍රතිඵල අනුව නිරවද්‍ය කරනු ලැබීය. මෙම අධ්‍යයනය 'නයි මිරිස්' ප්‍රභේද තෝරා ගැනීමේ වැඩසටහනේදී සහ සංරක්ෂණ කටයුතු වලදී ප්‍රයෝජනවත් වනු ඇත. මෙය IMPGR ප්‍රතිපාදිත ව්‍යාපෘතියකි.

## විවිධත්වය සහ අනුපිටපත් විශ්ලේෂණය සඳහා තෝරාගත් වැල් අල එකතුන්වගේ රූපීය සහ අණුක ලාක්ෂණිකරණය

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ සංරක්ෂණ කර ඇති වැල් අල එකතුන් වල ජානමය විවිධත්වය සහ ඒවායේ අනුපිටපත් විශ්ලේෂණය කිරීම සඳහා මෙම අධ්‍යයන සිදුකරනු ලැබිය.

වැල්අල එකතුන් 80ක් සඳහා ක්ෂේත්‍ර ඇගයීම්, රූපවිද්‍යාත්මක හා අණුක ලාක්ෂණිකරනය සිදුකරන ලදී. මෙම අධ්‍යයනයෙන් හඳුනාගත් ජානමය විවිධත්වය අභිජනන වැඩසටහන් සහ සංරක්ෂණ කටයුතු සඳහා ප්‍රයෝජනවත් වනු ඇත. මෙය IMPGR අරමුදලින් සම්පාදිත ව්‍යාපෘතියකි.

## නලස්ථ සහ පැළ ගෘහ තත්ත්වයන් යටතේ වැල් අල, බතල, අර්තාපල් සහ කෙසෙල් ජාන සම්පත් සංරක්ෂණය සහ නඩත්තු කිරීම

PGRC කාර්යපථයට අනුව, මෙම වැඩසටහනේ අභිප්‍රාය වනුයේ, විශේෂයෙන් අල වර්ග සහ ආකන්ද බෝග, මෙන්ම අලිංගික ප්‍රචාරණය වන බෝග වල ජානප්ලාස්ම සංරක්ෂණය කිරීම සහ පවත්වා ගැනීමයි. බතල 106ක්, ඩයස්කොරියා විශේෂයේ අල වර්ග 80ක්, අර්තාපල් 16ක්, කෙසෙල් 20ක්, සහ ඉන්නල එකතුන් 21ක් ඇතුළු එකතුන් 242ක් නලස්ථව සංරක්ෂණය කිරීමත්, ඊට අමතරව බතල, වැල්අල, කෙසෙල් සහ ඉන්නල පැල ගෘහ තුල සහ ක්ෂේත්‍රයේ නඩත්තු කිරීමත් සිදු කෙරිණි.

## දීර්ඝ කාලීන සංරක්ෂණය සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා වැල්අල ක්ෂුද්‍ර බීජ අල භාවිතය අධ්‍යනය (NARP ව්‍යාපෘතිය)

මෙම පර්යේෂණයේ අභිප්‍රාය වූයේ වැල්අල ක්ෂුද්‍ර බීජ යොදා ගනිමින් වැල්අල සංරක්ෂණය කිරීමේ හැකියාව අධ්‍යයන කිරීමයි. ක්ෂුද්‍ර බීජ ජනනය සඳහා නලස්ථ තත්ත්ව සහ වැල් අල සංරක්ෂණ කිරීමේ හැකියාව විමර්ශනය කරන ලදී. එකතුන් 04ක් සඳහා නලස්ථ තත්ත්ව යටතේ ක්ෂුද්‍ර බීජ ජනනයට සුදුසු මාධ්‍ය හඳුනා ගත්අතර ක්ෂුද්‍ර බීජ ප්‍රතිජනනය කිරීමේ තත්ත්ව පරීක්ෂා කිරීමද සිදුවෙමින් පවතී. වැල් අල අනුක්‍රමික 3ක (11,29,117) ජනනය කරන ලද ක්ෂුද්‍ර බීජ උෂ්ණත්වයන් 3ක් යටතේ ගබඩා කළ හැකි කාලය හඳුනා ගැනීම සඳහා ගබඩා කරන ලදී.

## පලතුරු බෝග ජානප්ලාස්ම අධිශීත සංරක්ෂණය.(Cryopreservation)

මෙම අධ්‍යයනයේ අරමුණු වූයේ අඩුම උෂ්ණත්ව තත්ත්ව යටතේ (-196C$^{0}$) පලතුරු බෝග ජනකප්ලාස්ම දීර්ඝ කාලීන සංරක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීමයි. අධිශීත සංරක්ෂණය. ඒකකය ස්ථාපිත කරන ලදී. මෙය ශ්‍රී ලංකාවේ බෝග ජානප්ලාස්ම අධිශීත සංරක්ෂණය. කිරීමේ ප්‍රථම ප්‍රයත්නයයි. මෙම වැඩසටහන යටතේ අධිශීත සංරක්ෂණය සඳහා මූලික තත්ත්ව විමර්ශණය කරන ලදී. කෙසෙල්, පැපොල් සහ පැෂිරි වල අධිශීත සංරක්ෂණය සඳහා තෙතමන මට්ටම හඳුනාගන්නා ලදී.

## පැළෑටි ජාන සම්පත් තොරතුරු කළමනාකරණ ක්‍රමය

මේ වන විට මෙම දත්ත පද්ධතියෙහි එකතුන් 14,839ක ක්ෂේත්‍ර දත්ත සහ වී, බඩඉරිඟු, කුරක්කන්, තණහාල්, ඉදල්

ඉරිඟු, කවුපි, මුං, උඳු, සෝයා බෝංචි, තෝර පරිප්පු, රටකජු, බෝංචි, දඹල, මෑ, වම්බටු, තක්කාලි, මාළු මිරිස්, බණ්ඩක්කා, වට්ටක්කා, පතෝල, කරවිල, තම්පලා, නියං වැටකොළු, අබ සහ තල ඇතුළු බෝග 25ක ලාක්ෂණීකරණ දත්ත අන්තර්ගත වේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ මධ්‍යස්ථාන සහ වෙනත් ආයතනය වල සංරක්ෂිත පලතුරු ශාක පිළිබඳ දත්ත ලබාගැනීම සඳහා සමාලෝචනයක් සිදු කරන ලදී. එහිදී, GPS ඛණ්ඩාංක (දේශාංශ සහ අක්ෂාංශ) ඇතුළුව පලතුරු ශාක වල තොරතුරු වාර්තා ගත කරන ලදී. පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ දත්ත පද්ධතිය තුල පලතුරු ශාක 1700ක තොරතුරු ඇතුලත් කොට ඇත.

## පුහුණු සහ දැනුවත් කිරිමේ වැඩසටහන්

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය විසින් පැළෑටි හා ජාන සම්පත් සංරක්ෂණය පිළිබඳ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි. ගොවි කණ්ඩායම් විශාල සංඛ්‍යාවක් පැළෑටි ජාන සම්පත් පිළිබඳ දැනුම් ලබා ගැනීම සඳහා මෙම ආයතනය වෙත පැමිණියහ. (වගුව 2.1.4.7) විශේෂයෙන්, රයිගම, බණ්ඩාරගම, ගම්පහ සහ දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශවලින් ගොවි කණ්ඩායම් 4ක් තෝරා ගන්නා ලද අතර පැළෑටි ජාන සම්පත් සංරක්ෂණයේ ප්‍රයෝජනය සහ ප්‍රජා මූලික ජාන බැංකු වැඩිදියුණු කිරිම පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී. ගොවීන් විසින් වැදගත් ජනකප්ලාස්ම සියයකට වඩා එක්රැස් කරගන්නා ලදී.

**වගු අංක 2.1.4.7: පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව**

| පුහුණු වැඩසටහන් | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| විශ්වවිද්‍යාල සිසුන් | 400 |
| කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුන් | 624 |
| සේවාස්ථ පුහුණු සිසුන් | 38 |
| පාසැල් සිසුන් | 2,401 |
| ගුරුවරුන් | 400 |
| වෙනත් නිලධාරීන් | 100 |
| ගොවි කණ්ඩායම් | 260 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ වෙනත් දෙපාර්තමේන්තු | 230 |
| පර්යේෂණ වල නියැලි ශිෂ්‍යයන් | 6 |
| **එකතුව** | **4,459** |

## පර්යේෂණ නිබන්ධන

- වී වල රූපවිද්‍යාත්මක සහ ජාන විවිධතාවය මත පදනම්ව විවිධ ‘මුරුන්ගකායන්’ වී එකතුන් වල (Oryza sativa L.) ජාන විවිධාංගීකරණය අධ්‍යයනය කිරීම.
- SSR සළකුණු යොදා ගනිමින් ‘සුදු හීනටි’ සහ ‘වෙද හීනටි’ යන සාම්ප්‍රදායික වී ප්‍රභේදවල ජාන විවිධත්වය විශ්ලේෂණය කිරීම.
- රූප විද්‍යාත්මක සහ අණුක විද්‍යාත්මක ලාක්ෂණිකරණය මත පදනම්ව සාම්ප්‍රදායික වී ප්‍රභේදයක් වන ‘හේරත් බණ්ඩා’ (Oryza Sativa L.) ප්‍රභේදයේ ජාන වි විවිධත්වය අධ්‍යනය.
- කාචමය ක්‍රමෝපාය (vitrification) භාවිතයෙන් ‘ඇඹුල් කෙසෙල්’ ප්‍රභේදයේ අධිශීත සංරක්ෂණය කරීම සඳහා මාධ්‍යයන් හඳුනා ගැනීම.

- බිදිති කාච ක්‍රමය (droplet vitrification) උපයෝගී කොට ගෙන 'පුලතිසි' (Musa Spp.) කෙසෙල් ප්‍රභේදය සඳහා අධිශීත සංරක්ෂණය මාධ්‍යයන් අධ්‍යනය.
- සංක්ෂිප්ත විජලනය(encapsulation-dehdration) මගින් ඇඹුල් දොඩම්වල අංකුර(Citrus aurantium) අධිශීත සංරක්ෂණය සඳහා ක්‍රමවේදයක් අධ්‍යනය.
- රූපවිද්‍යාත්මක ලාක්ෂණීකරණය මත පදනම්ව දඹල වල (Vigna) අන්තර් හා අන්තඃ විශේෂවල ජානමය විවිධත්වය ඇගයීම
- ආසාධිත අර්තාපල් එකතුන් සඳහා ප්‍රතිජීවක වල බලපෑම සෙවීම

## 2018 වසර සඳහා සැලැස්ම

- සාම්ප්‍රදායික ප්‍රභේද, නිර්දේශිත ප්‍රභේද, අනෙකුත් ජාන තොග සහ බෝගවල වන දර්ශ පිළිබඳ ගවේෂණය සහ පැළෑටි ජාන සම්පත් එක්රැස් කිරීම.
- පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය, නඩත්තු කිරීම සහ බෙදා හැරීම.
- විවිධ බෝගවල ජානප්ලාස්ම ගුණනය කිරීම.
- ජානප්ලාස්ම ලක්ෂණීකරණය, ඇගයීම සහ ජාන විශ්ලේෂණය.
- සාම්ප්‍රදායික වී ප්‍රභේදවල කුඩා විවිධත්ව එකතුවක් සකස් කිරීම.
- SSR සලකුණු යොදා ගනිමින් නයි මිරිස්වල (Capsicum chinense Jacq.) ජාන වී විවිධත්වය විශ්ලේෂණය කිරීම.
- තෝරාගත් වැල් අල එකතුන්ගේ විවිධත්වය සහ අනුපිටපත් විශ්ලේෂණය කිරීම සඳහා රූපීය සහ අණුක ලාක්ෂණීකරණය.
- දඹල විශේෂ වල වන දර්ශ පිළිබඳ විවිධත්වය තහවුරු කරගැනීම.
- නලස්ථ සහ පැල ගෘහ තත්ත්ව යටතේ වැල්අල, බතල, අර්තාපල් සහ කෙසෙල් ප්‍රභේද සංරක්ෂණය සහ පවත්වාගෙන යාම.
- අධිශීත සංරක්ෂණය සඳහා ක්‍රමවේද දියුණු කිරීම.
- බතල විශේෂ වල ක්ෂේත්‍ර ඇගයීම සහ රූපවිද්‍යාත්මක ලාක්ෂණීකරණය
- පැලෑටි සම්පත් සංරක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කිරීම.
- පැලෑටි ජාන සම්පත් බෙදාහැරීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම.
- දීර්ඝ කාලීන සංරක්ෂණ ක්‍රමයක් ලෙස වැල්අල ක්ෂුද්‍ර බීජ ගබඩා කිරීමේ හැකියාව සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හැකියාව අධ්‍යයනය.

## කාර්ය මණ්ඩලය

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | 04 |
| තොරතුරු හා සනිවේදන තාක්ෂණ නිලධාරි | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 02 |
| සංවර්ධන නිලධාරි | 03 |

| **තනතුර** | **දැනට සිටින සංඛ්‍යාව** |
|---|---|
| කෘෂිකර්ම උපදේශක | 03 |
| පර්යේෂණ සහකාර | 05 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 07 |
| තාක්ෂණ සහායක | 03 |
| රියදුරු | 04 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකාරු | 01 |
| ගබඩාකරු | 01 |
| විදුලි ශිල්පි | 02 |
| තාක්ෂණ ශිල්පි | 01 |
| පර්යේෂණ උප සහකාර | 03 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| ලොරි පවිත්‍රකරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| මුරකරු | 04 |
| කම්කරු | 32 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 08 |
| **එකතුව** | **88** |

## 2.1.5. ජාතික ශාක නිරෝධායන සේවය - කටුනායක

දිවයිනේ කෘෂිකර්මය හා ආශ්‍රිත කර්මාන්ත වල සංවර්ධනය සඳහා පලිබෝධ වලින් තොර ශාක හා ශාක නිෂ්පාදන ආනයනයට හා අපනයනයට පහසුකම් සැලසීම ශ්‍රී ලංකාවේ ජාතික ශාක නිරෝධායන සේවය (NPQS) ට පැවරී ඇති වගකීම වේ. මෙම වගකීම සාක්ෂාත් කර ගැනීමට පර්යේෂණ හා සේවය අරමුණු කරගෙන නිරෝධායන ක්‍රියාකාරකම් යන අංශ දෙකටම අවධානය යොමු කෙරේ. මෙකී ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ උද්භිද ස්වස්ථතා සහතික කිරීම හා පරීක්ෂාව, ආනයන හා අපනයන ශාක හා ශාක නිෂ්පාදන ප්‍රතිකර්ම කිරීම, රඳවා ගත් ශාක නිෂ්පාදන පරීක්ෂා කිරීම, පලිබෝධ අවදානම පිළිබඳ විශ්ලේෂණ, පලතුරු හා එළවළු සඳහා ක්ෂේත්‍ර සහතික කිරීම හා ඇසුරුම් ගෘහ ලියාපදිංචි කිරීම සහ නියැදීම, ශාක හා ශාක නිෂ්පාදන වලට ආනයන බලපත්‍ර නිකුත් කිරීම, සබඳතා කණ්ඩායම් (ජාතික පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතන හා මධ්‍යස්ථාන) සඳහා සිදුකරන පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා ශාක නිරෝධායනයේ සියළු අංශ පිළිබඳ දැනුම ප්‍රචාරණය යන ඒවාය. 2017 වර්ෂය තුළදී, ආනයනික භාණ්ඩ පිළිබඳව සිදු කරන ලද පරීක්ෂණ වලදී නියාමන අවධානය යොමු විය යුතු බොහෝ පලිබෝධ ජාතික ශාක නිරෝධායන සේවයේ තාක්ෂණික අංශ විසින් හඳුනා ගන්නා ලද අතර මෙලෙස හඳුනා ගත් සමහර පලිබෝධවල පුරෝකථනය කරන ලද හානිකර භාවය හේතුවෙන් දිවයිනට ඇතුළු වීම වැළක්වීමට දැඩි ලෙස නියාමනය කරන ලදී. මෙලෙස ජාතික ශාක නිරෝධායන සේවයට ආක්‍රමණශීලී ආගන්තුක පලිබෝධ ඇතුළුවීමෙන් දිවයින ආරක්ෂා කර ගැනීමට හැකි විය. (වගු අංක 2.1.5.1) මෙම වාර්තාව 2017 වර්ෂය තුළදී සිදුකළ ආර්ථික, තාක්ෂණික හා සේවා මූලික ක්‍රියාකාරකම් වලින් ලබාගත් ජයග්‍රහණයන් විදහා දක්වයි.

**2.1.5.1වගුව : ජාතික ශාක නිරෝධායන සේවය මගින් ගන්නා ලද පියවර තුළින් ශ්‍රී ලංකාවට නව පලිබෝධ ඇතුල්වීම වැළක්වීම (මෙම පලිබෝධ හඳුනා ගන්නා ලද අතර ඒවා ඇතුල්වීම වළක්වන ලදී)**

| තාක්ෂණික අංශය | පරීක්ෂා කරන ලද ආනයන සංඛ්‍යාව | හඳුනා ගත් පලිබෝධ |
|---|---|---|
| වල් පැළෑටි විද්‍යාව | 123 (විවිධ) | *Brassica tournefortii*, *Galium aparine*, *Lactuca scariola*, *Argemone ochroleuca*, *Convolvulus arvensis*, *Polygonum* sp., *Chenopodium album*, *Euphorbia dentate*, *Ambrosia trifida*, *Polygonum cuspidatum*, *Bromus* sp., *Cuscuta* sp., *Polygonum convolvulus*, *Picris echioides* |
| ව්‍යාධිවේදය | 26 (බීජ අර්තාපල්) | *Streptomyces reticuculissabies* and *Spongospora subterranea* sub sp. *subterranea* |
| ගුවන් තොටුපල ඒකකය | 26 | *Thrips* spp.,*Pieris rapae*, *Trichoplusia* spp., *Leucinodes orbonalis*, Family – Diaspididae, *Anthracnose* spp., *Erwinia* spp., |

## අයවැය

පුනරාවර්තන, මූලධන හා ව්‍යාපෘතීන් යටතේ ලද ප්‍රතිපාදන හා කළ වැය කිරීම් 2.1.5.2 වගුවේ දක්වා ඇත.

**2.1.5.2 වගුව: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 9,813,779 | 9,863530 | 101 |
| මූලධන | 8,700,000 | 6,565670 | 75 |
| ව්‍යාපෘති | | | |
| • ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන - 1 | 12,000,000 | 11,645,184 | 97 |
| • ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන - 2 | 10,000,000 | 9,745,731 | 97 |
| • ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති | 2,350,000 | 2,336,430 | 99 |
| • ශ්‍රී ලංකාවේ අපනයන විභවතා සහිත පලතුරු වල පලතුරු මැසි විශේෂ ( උදා: *Bactrocera dorsalis* පාලනයට ගැමා විකිරණ ප්‍රතිකාර සම්මත සංවර්ධනය කිරීම | 3,700,000 | 3,690,532 | 100 |
| • ගෝවා සහ තක්කාලි පළිබෝධ පාලනයට ජෛව විද්‍යාත්මක කෘමි පළිබෝධ කාරක රාශි ලෙස වැවීම (ශ්‍රී ලංකාවේ කෘමි පළිබෝධ පාලන ගිලන් හලක් පිහිටුවීමේ ආරම්භක පියවර) | 4,000,000 | 3,954,000 | 99 |
| **එකතුව** | **50,563,779** | **44,410,545** | **95** |

## ප්‍රගතිය

### පැළෑටි නිරෝධායන මෙහෙයුම් අංශය

2017 වර්ෂය තුළදී පැළෑටි නිරෝධායන මෙහෙයුම් අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත 2.1.5.3 වගුවේ සඳහන් වේ.

| | ක්‍රියාකාරකම | සාධන |
|---|---|---|
| 01 | අන්තර් නිරෝධන ලියාපදිංචි කිරීම | 399 |
| 02 | යවන ලද අන්තර් නිරෝධන වාර්තා ගණන | 398 |
| 03 | පරීක්ෂාවන් ලියාපදිංචි කිරීම (අපනයන ද්‍රව්‍ය) | 1,481 |
| 04 | ප්‍රවේශ ස්ථාන වලට යවන ලද පරීක්ෂණ වාර්තා ගණන | 1,380 |

|  | ක්‍රියාකාරකම | සාධන |
|---|---|---|
| 05 | පරීක්ෂාව සඳහා කොහු නිෂ්පාදන ලියාපදිංචිය | 476 |
| 06 | පරීක්ෂා කළ කොහු නිෂ්පාදන සඳහා වාර්තා | 407 |
| 07 | පරීක්ෂාව සඳහා ලබාදුන් ආනයනික බීජ අර්තාපල් ලියාපදිංචිය | 24 |
| 08 | පරීක්ෂා කළ බීජ අර්තාපල් සඳහා වාර්තා | 24 |
| 09 | පරීක්ෂාව සඳහා ලබාදුන් නියැදි ලියාපදිංචිය | 55 |
| 10 | යුරෝපීය සංගම් අපනයන සඳහා ක්ෂේත්‍ර සහතික කිරීම | 301 |
| 11 | නිකුත් කරන ලද ආනයන බලපත්‍ර ගණන | 4,472 |
| 12 | කොරියානු දැල් ගෘහ ලියාපදිංචිය. | 02 |

මෙම අංශය විසින් ශාක නිරෝධායන ක්‍රියාකාරකම් වලට සම්බන්ධ ඉහත කී ක්‍රියාකාරකම් හැර පැළෑටි නිරෝධායනයේ විවිධ පාර්ශ්වකරුවන්ට (උපාධි අපේක්ෂකයන්ට/ ඩිප්ලෝමා හා පාසල් සිසුන්ට/ ගුරුවරුන්ට/ අපනයන කරුවන්ට/ ආනයන කරුවන්ට යනාදී වශයෙන්) ශාක නිරෝධායන ක්‍රියාකාරකම් හා ක්‍රියාදාම පිළිබඳව පුළුල් පුහුණු වැඩසටහන් 22ක් සම්බන්ධීකරණය කොට ක්‍රියාත්මක කරන ලදී. ජාතික ශාක නිරෝධායන සේවයේදී ශාක නිරෝධායන නිලධාරීන්ගේ කුසලතා වර්ධනයට පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 08ක් පවත්වන ලදී. මීට අමතරව, පළිබෝධ ඇතුළත් වීම වැළක්වීමට ආරම්භක පියවර ලෙස පළි බෝධ අවදානම් විශ්ලේෂණ ක්‍රියාවට නැංවීම සඳහා පළිබෝධ තත්ත්ව හා සමහර බෝග පිළිබඳ ශෂ්‍ය විද්‍යාත්මක භාවිතා වලට අදාළ තොරතුරු, ගමනාන්ත රටවල් වලට සපයන ලදී.

## කීට විද්‍යා අංශය

### අපනයන හා ආනයන තොග වල කෘමි පළිබෝධ, මයිටාවන්, වට පණුවන් සිටී දැයි පරීක්ෂා කිරීම.

#### (අ) අපනයන

- විසිතුරු අපනයන පැළ තවාන් 30කින් විසිතුරු අපනයන පැළ 13,396ක නියැදි ලබාගෙන පැළෑටි පරපෝෂිත වටපණුවන් සඳහා පරීක්ෂා කරන ලදී.
- පැළෑටි නියැදි 68ක් පරපෝෂිත වටපණුවන්ගෙන් ආසාදිතවී තිබුණි.
- කෘමි පළිබෝධ, ගොළුබෙල්ලන් හා මයිටාවන් සඳහා විසිතුරු අපනයන පැළෑටි නියැදි 17,356ක් පරීක්ෂා කරන ලද අතර නියැදි 46ක් ආසාදිතව තිබුණි.
- කෘමි පලිබෝධ, මයිටාවන් හා පැළෑටි පරපෝෂිත වට පණුවන් සඳහා කොහු කර්මාන්ත ශාලා 27කින් ලබාගත් අපනයන කොහු නියැදි 302ක් ලබාගන්නා ලද අතර නියැදි 01ක් ආසාදිතවී තිබුණි.
- විසිතුරු අපනයන පැළෑටි තවාන්, පලතුරු හා එළවළු ක්ෂේත්‍ර සහ කොහු කර්මාන්ත ශාලා වලින් ලබා දෙන ලද වෙනත් විශේෂ නියැදි 34 ක් පළිබෝධ පාලනය අරමුණු කර ගෙන ශාක පරපෝෂිත වට පණුවන් හා කෘමි පළිබෝධ සඳහා පරීක්ෂා කරන ලද අතර ඉන් කිසිවක් අහිතකර ජීවීන් ගෙන් ආසාදිතවී නො තිබුණි.

#### (ආ) ආනයන

- වරායේදී ආනයනික බීජ අර්තාපල් තොග 26ක් පරීක්ෂා කරන ලදී. නියෝජන නියැදි 81ක් එක්රැස් කොට කෘමි පළිබෝධ හා පැළෑටි පරපෝෂිත වට පණුවන් සඳහා පරීක්ෂා කරන ලද අතර ඉන් කිසිවක් අහිතකර ජීවීන්ගෙන් ආසාදිත වී නො තිබුණි.

- දෙමුහුම් බඩඉරිඟු, රටකජු, කජු, කොකෝවා කේක්, ලෙමන් ෆයින් කට්, කරදමුංගු ඇට, රබර් දැව, Mucuna ඇට, Tampico කෙඳි, දෙමුහුම්වී, Spagnum පීට් මොස්, පැසවූ කොකෝවා ඇට, Moringa ඇට, රයි තණ, අළුත් ඉඟුරු , මිදි ඇට, වෙරි ස්ටෝන් ඇට, කළු ගම්මිරිස්, වම්බටු, ඒගාර් වුඩ් ඇට, බොත්තම් බිම්මල්, යනාදිය ඇතුළත් ආනයනික රෝපණ ද්‍රව්‍ය 708ක් කෘමි පළිබෝධ, මයිටාවන් හා පැළැටි පරපෝෂිත වට පණුවන් සඳහා පරීක්ෂා කරන ලද අතර ඉන් නියැදි 15ක් සාමාන්‍ය ගබඩා පළිබෝධ වලින් ආසාදිත බව අනාවරණය විය.

### (අ) පුහුණු

විශ්ව විද්‍යාල, තාක්ෂණික විද්‍යාල හා පාසල් ශිෂ්‍යයන් විශාල සංඛ්‍යාවක් කීට විද්‍යා අංශයේදී පුහුණුව ලැබූහ.

### ආ) පර්යේෂණ වැඩසටහන්

- ශ්‍රී ලංකාවේ අපනයන විභවතා සහිත පලතුරුවල පලතුරු මැසි විශේෂ (*Bactrocera dorsalis)* පාලනයට ගැමා විකිරණ ප්‍රතිකාර සම්මත සංවර්ධනය කිරීම.

- අපනයනය සඳහා වූ පත්‍රමය එළවළු ක්ෂේත්‍ර කෘමි පළිබෝධ වලින් ආසාදිත වීමේ වර්තමාන තත්වය හඳුනා ගැනීම.

## ව්‍යාධිවේදී අංශය

මෙම අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් ආනයන සහ අපනයන තොගවල ව්‍යාධිජනකයින් පරීක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

### (අ) අපනයන

- **විසිතුරු පැළ හා කොහු නිෂ්පාදන**

සමස්තයක් ලෙස විසිතුරු පැළ තවාන් හා කොහු කර්මාන්ත ශාලා 476 කින් එක් රැස් කර ගන්නා ලද අපනයන සඳහා විසිතුරු පැළ / කොහු නියැදි 12,255ක් ශාක ව්‍යාධිජනකයින් සඳහා පරීක්ෂා කරන ලද අතර අපවිත්‍ර වී ඇති බවට හඳුනා ගන්නා ලද නියැදි 02 ක් ප්‍රතික්ෂේප කරන ලදී.

**වගු අංක 2.1.5.4: ඉහළ ව්‍යාධිජනක අපවිත්‍රනයක් සහිත තොග සංඛ්‍යාව**

| ව්‍යාධිජනකය | තොග/ නියැදි සංඛ්‍යාව | ගන්නා ලද පියවර |
|---|---|---|
| *T. paradoxa* | 35 | 01ක් ප්‍රතික්ෂේප කරන ලදී.<br>28ක් ප්‍රතිකාරයෙන් පසු නිදහස් කරන ලදී. |
| *Geotrichum* Spp. | 31 | ප්‍රතිකාරයෙන් පසු නිදහස් කරන ලදී. |
| *Colletotrichum* Spp. | 7 | ප්‍රතිකාරයෙන් පසු නිදහස් කරන ලදී. |
| *Rhizoctonia Spp.* | 1 | ප්‍රතික්ෂේප කරන ලදී. |

- **පටක රෝපිත පැළ**

විසිතුරු පැළ තවාන්/ පර්යේෂණාගාර 476 කින් එක් රැස් කර ගන්නා ලද පටක රෝපිත නියැදි 216,845ක් ශාක ව්‍යාධිජනක සඳහා පරීක්ෂා කරන ලද අතර ශාක ව්‍යාධිජනක වලින් (*Erwinia chrysanthemi* හා *Erwinia carotovora* උප විශේෂය *carotovora)* අපවිත්‍ර වී ඇති බවට හඳුනා ගන්නා ලද නියැදි 03ක් ප්‍රතික්ෂේප කරන ලදී.

- **ආහාර, පලතුරු සහ එළවළු**

නියැදි 11ක් පිළිබඳ විමර්ශන සිදු කරන ලද අතර ඒ සියල්ල පිළි ගත හැකි තත්වයේ තිබුණි.

### (ආ) ආනයන

- **බීජ අර්තාපල්**

(කොළඹ වරායෙන්/ලබා ගත්) විමර්ශන 26 ක් තුළින් බීජ අර්තාපල් නියැදි 81 ක් එක් රැස් කර ගන්නා ලද අතර ඉන් තොග / සංචිත 03ක බීජ අර්තාපල් *Strptomyces reticulissabies* හා *Spongospora subterranean* උප විශේෂය *subterranean* වලින් දූෂිතව තිබූ බැවින් ප්‍රතික්ෂේප කරන ලදී.

- **බීජ සහ වෙනත් රෝපණ ද්‍රව්‍ය**

සමස්තයක් ලෙස ශාක ව්‍යාධිජනක සඳහා නියැදි 54ක් පරීක්ෂා කරන ලද අතර ඒවායේ හානිදායක ව්‍යාධිජනක නොමැති බව සොයා ගන්නා ලදී.

- **ආහාර**

නියැදි 261ක් පරීක්ෂා කරන ලද අතර ඒ සියල්ල පිළිගත හැකි තත්වයේ තිබුණි.

- **විවිධ**

නියැදි 70ක් පරීක්ෂා කරන ලද අතර ඒ සියල්ල පිළිගත හැකි තත්වයේ තිබුණි.

### (ඇ) ඉදිරිපත් කළ නියැදි පරීක්ෂා කිරීම

- සම්පූර්ණ වශයෙන් නියැදි 23 පරීක්ෂා කරන ලදී.

### (ඈ) පුහුණු වැඩසටහන්

NPQS හා ව්‍යාධිවේද අංශයේ මෙහෙයවීමෙන්, වර්ෂය තුළදී පුහුණු වැඩසටහන් (එක් දින පුහුණු) 14ක් පවත්වනු ලැබිණි.

### (ඉ) පර්යේෂණ වැඩසටහන්

- අපනයන කොහු තොග වල දිලීර හා බැක්ටීරියා අපවිත්‍රන පවතින්නේ දැයි විමර්ශනය කිරීම.

- ජෛව රසායනික හා අණුක ක්‍රම මගින් *Aglaonema*වල මෘදු කුණු වීමේ රෝගට හේතු කාරකය ලාක්ෂණීකරණය කිරීම හා හඳුනා ගැනීම සහ සුදුසු පාලන ක්‍රමවේද හඳුන්වා දීම.

- ආනයනික බඩ ඉරිඟු වල *Pantoea stewartii* පවතින්නේ දැයි විමර්ශනය කිරීම.

- මස්තු විද්‍යාත්මක ක්‍රම උපයෝගී කරගැනීමෙන්, ආනයනික බීජ අර්තාපල්වල අර්තාපල් වෛරස් (PVY, PVM, PVS, PLRV සහ PVX) හඳුනා ගැනීම.

- ආනයනික බීජ අර්තාපල් වල *Clavibacter michiganensis* උපවිශේෂය *sepedonicus* හි අණුක හඳුනාගැනීම.

## වල් පැළෑටි විද්‍යා අංශය

### (අ) අපනයන තොග පරීක්ෂා කිරීම.

- **කොකෝ පීට්**

නිෂ්පාදන වර්ග 488ක් අන්තර්ගත තොග 370ක් පරීක්ෂා කරන ලදී. පරීක්ෂා කරන ලද නිෂ්පාදන අතරින්, නියැදි 66ක් වල් පැළෑටි බීජ හා පස් වලින් දූෂිත බව සොයා ගන්නා ලදී.

- **ධාන්‍ය හා කුළු බඩු**

2017 වර්ෂයේ පළමු හා දෙවන කාර්තු තුළ අප්‍රේල් දක්වා තොග 45කට අයත් මුළු නිෂ්පාදන වර්ග 151ක් පරීක්ෂා කරන ලදී. 2107 මැයි වලින් පසු මෙම අංශය වෙතට නියැදි කිසිවක් භාර දී නොමැති අතර කිසිදු තොගයක් පරීක්ෂා කිරීමද සිදු නො කරන ලදී.

- **පැළ කිරීම සඳහා වූ පැළෑටි**

පැළෑටි වර්ග 1770කට වඩා අන්තර්ගත තොග 25ක් සෝදිසි කොට වල් පැළෑටි හෝ පාංශු අපාවනය සඳහා පරීක්ෂා කරන ලද අතර ඉන් තොග 01ක් පස් පැවතීම හේතුවෙන් පරීක්ෂණයෙන් අසමත් විය.

### (ආ) ආනයන තොග පරීක්ෂා කිරීම.

- **පැළ කිරීම සඳහා වූ බීජ**

ආනයන තොග 123ක් පරීක්ෂා කළ අතර එයින් තොග 11ක් නිරෝධායන වල් පැළෑටි බීජ වලින් අපවිත්‍ර වී ඇතිබව සොයාගන්නා ලදී. තොග තුනක් දිලීරනාශක - පෝෂක මිශ්‍රණයකින් පූර්ව ආලේපනය කොට තිබූ බැවින් කොන්දේසි සහිතව මුදා හරින ලද අතර ඒවා මගින් හානිකර වල් පැළෑටි රට තුළට ඇතුළුවීම වැළක්වෙන පරිදි වල් පැළෑටි විද්‍යා අංශයේ සමීප අධීක්ෂණය යටතේ සීමිත සංවෘත ප්‍රදේශයක වගා කරන ලෙසට ආනයනකරුවන්ට උපදෙස් දෙන ලදී.

- **ධාන්‍ය**

කරදමුංගු, කළු ගම්මිරිස්, සුදු දුරු යනාදිය අන්තර්ගත විවිධ තොග 39ක් පරීක්ෂා කළ අතර එයින් තොග 04ක් නිරෝධායන වල් පැළෑටි පැවතීම හේතුවෙන් පර්යේෂණාගාර පරීක්ෂා වලින් අසමත් විය.

- **වෙනත් ශාකමය ද්‍රව්‍ය**

ටැම්පිකෝ කෙඳි, බිම්මල් මාධ්‍ය, සත්ව ආහාර යනාදී විවිධ ශාකමය ද්‍රව්‍ය 20ක් වල් පැළෑටි බීජ තිබේ දැයි විමසීමට පරීක්ෂා කරන ලද අතර ඉන් එක් තොගයක් හානිකර වල් පැළෑටි විශේෂ පැවතීම හේතුවෙන් පරීක්ෂණයෙන් අසමත් විය .

පරීක්ෂා කළ තොග වල තිබී අනාවරණය කර ගන්නා ලද තෘණ විශේෂ හා ඒවායේ නියාමන තත්වය 2.1.5.5 වගුවේ පෙන්වා ඇත. නියාමනය කරන ලද තෘණ වලින් අපවිත්‍ර වී තිබූ තොග ආනයනකරු වෙත මුදා නොහරින ලෙස උපදෙස් ලබා දෙන ලදී.

**වගු අංක 2.1.5.5: තොග වල තිබී අනාවරණය කර ගන්නා ලද තෘණ විශේෂ**

| විශේෂය | නියාමන තත්වය | බෝගය |
|---|---|---|
| *Brassica tournefortii* | නිරෝධායන වල් පැළෑටි | බී ළූණු, අබ, මල් ගෝවා |
| *Galium aparine* | නිරෝධායන වල් පැළෑටි | කැරට්, තෘණ බීජ, මල් ගෝවා |
| *Lactuca serrriola* | නිරෝධායන වල් පැළෑටි | බී ළූණු, පරිප්පු, බර්මුඩා තෘණ |
| *Argemone ochroleuca* | නිරෝධායන වල් පැළෑටි | සෝයා බෝංචි, කැරට්, රාබු, බී ළූණු |
| *Convolvulus arvensis* | නිරෝධායන වල් පැළෑටි | බී ළූණු |
| *Polygonum* sp. | නිරෝධායන වල් පැළෑටි | බී ළූණු, කැරට් |
| *Chenopodium album* | නිරෝධායන වල් පැළෑටි | කැරට්, මල් ගෝවා |
| *Euphorbia dentata* | නිරෝධායන වල් පැළෑටි | බී ළූණු |
| *Ambrosia trifida* | නිරෝධායන වල් පැළෑටි | සෝයා බෝංචි |
| *Polygonum cuspidatum* | නිරෝධායන වල් පැළෑටි | බී ළූණු, රාබු |
| *Bromus* sp. | නිරෝධායන වල් පැළෑටි | බර්මුඩා තෘණ, මාෂ බෝග |
| *Cuscuta* sp. | නිරෝධායන වල් පැළෑටි | *Brassica* විශේෂ (අබ, ගෝවා මල් ආදි) |
| *Picris echioides* | නිරෝධායන වල් පැළෑටි | කැරට් |
| *Convolvulus sp* | නියාමනය නොකළ | බී ළූණු, සෝයා බෝංචි, බීට් |

## (ඇ) බාරදෙන ලද නියැදි

පරිසරවේදීන්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පළාත්/ නගර සභා, පරිසර අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙනත් ආයතන බඳු රාජ්‍ය අංශයේ ආයතන හා විවිධ ආනයන කරුවන් හා අපනයන කරුවන් විසින් හානිකර වල් පැළෑටි හඳුනා ගැනීමට හානිකර ලෙස සැක කරනු ලබන පැළෑටි වල හානිකරභාවය තහවුරු කර ගැනීමට පැළෑටි නියැදි ලබා දෙන ලදී.

2017 වර්ෂය තුළදී මෙබඳු නියැදි 37 ක් පරීක්ෂා කරන ලදී. මීට අමතරව, විවිධ ක්ෂේත්‍ර සමීක්ෂණ වලදී එක් රැස් කර ගන්නා ලද විශේෂ 135කට අයත් නියැදි 187ක් හඳුනා ගන්නා ලද අතර ඒවායේ අවදානම් තත්වය තහවුරු කරන ලදී.

## (ඈ) නියාමන ක්‍රියාකාරකම්

- **වල් පැළෑටි අවදානම් විශ්ලේෂණය**

දිවයිනට ගෙන්වීමට ඉල්ලා සිටින ලද *Ageratum* විශේෂය, *Dichondra* විශේෂය, *Hypericum* විශේෂය යනාදී පැළෑටි විශේෂ සඳහා ශීඝ්‍ර වල් පැළෑටි අවදානම් විශ්ලේෂණ 87 ක් සිදු කරන ලදී.

- **පශ්චාත් ප්‍රවේශ නිරෝධායනය**

2017 වර්ෂය තුළදී, *Echinodorus* විශේෂ 14ක්, *Bambus abalcoa* සහ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද වෙනත් උණ විශේෂ කිහිපයක් සඳහා පශ්චාත් ප්‍රවේශ නිරෝධායන අධ්‍යයන සිදු කරන ලදී.

## (ඉ) පුහුණු හා දැනුවත් කිරීම

පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පහත සඳහන් පරිදි පවත්වන ලදී. දේශීය හා විදේශීය නියෝජිතයන් හා අමුත්තන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී කණ්ඩායම් 07, ශිෂ්‍යයන් හා උපාධි අපේක්ෂක කණ්ඩායම් 14ක් සඳහා එක් දින පුහුණුවක්, NPQS හි අභ්‍යන්තර පුහුණුවේ නියුතු සිසුන් 20 දෙනෙක් හා වල් පැළෑටි විද්‍යා අංශය විසින් සහතික කරන ලද පාරිභෝජන ද්‍රව්‍ය වල පැළෑටි ස්වස්ථතා ගුණත්ව සහතික කිරීම පිළිබඳව අපනයන කරුවන්ට වශයෙනි.මීට අමතරව, වල් පැළෑටි විද්‍යා අංශය හා එක්ව උපාධි අපේක්ෂක සිසුහු දෙදෙනෙක් ස්වකීය උපාධි අපේක්ෂක පර්යේෂණ ව්‍යාපෘති නිම කළහ.

## (ඊ ) පර්යේෂණ

පහත සඳහන් මාතෘකා පිළිබඳව පර්යේෂණ අධ්‍යයන 6ක් සිදු කරන ලදී.

- පැළෑටි විශේෂයක් ආක්‍රමණික විශේෂයක් බවට පත් වීමට තුඩු දෙන පූර්ව ප්‍රරෝහණ ගති ලක්ෂණ හඳුනා ගැනීම.
- නව විදේශික පැළෑටි විශේෂ වල වර්ගීකරණමය හඳුනා ගැනීමෙහි ලා DNA ඇඟිලි සළකුණු වල කාර්යක්ෂමතාව ඇගයීම.
- නියාමනය කරන ලද වල් හඳුනා ගැනීම සඳහා මෙවලමක් ලෙස DNA ඇඟිලි සළකුණු යොදා ගැනීම.
- විසිතුරු පැළෑටි කර්මාන්තය තුළින් විදේශික ජලජ පැළෑටි ස්වාභාවික පරිසරයට විනිවේධනය කිරීමේ හැකියාව අධ්‍යයනය කිරීම
- රූප විද්‍යාත්මක ගති ලක්ෂණ පදනම් කරගෙන *Abutilon* (Family Malvaceae) හි වර්ගීකරණමය හඳුනා ගැනීම: පැළෑටි නිරෝධායන මෙහෙයුම් සඳහා යොමුව
- වර්ණය අනුව තේරීම භාවිතා කරමින් බී ඇණු බීජ වලින් අපවිත්‍ර කාරක වල් බීජ වෙන් කර ගැනීමේ කාර්යක්ෂමතාව ඇගයීම.

### (උ) සමීක්ෂණ හා නිරීක්ෂණ

වයඹ හා බස්නාහිර පලාත් වල පිහිටි ජලජ පැළෑටි අපනයන කර්මාන්ත ආසන්නයේ ඇති ජලජ හා අර්ධ ජලජ විශේෂ පිළිබඳව එක් සමීක්ෂණයක් පවත්වන ලදී.

### (ඌ) ආශ්‍රේය එකතුන්

තෘණ විද්‍යා අංශය පහත සඳහන් ආශ්‍රේය එකතුන් තුන පවත්වා ගනී: තෘණ බීජ, ශාකාගාර, ජීවී ජලජ පැළෑටි.

වල් පැළෑටි බීජ එකතුව විවිධ වල් විශේෂ 37කින්, ශාකාගාර එකතුව නව ආදර්ශ 58කින් හා ජීවී ජලජ පැළෑටි එකතුව නව විශේෂ 11කින් ඉහළ නංවන ලදී.

## ජෛව ආරක්ෂාව සහ අන්තර්ජාතික සම්බන්ධතා අංශය

2017 වර්ෂයේ දී ජෛව ආරක්ෂා අංශය විසින් ඉටු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් හා අත් පත් කරගත් ප්‍රගතිය පහත දැක්වේ.

### (අ) අපනයන සඳහා පළිබෝධ අවදානම් විශ්ලේෂණය

කෘෂිකාර්මික පාරිභෝජන භාණ්ඩයක් සඳහා වෙන යම් රටක් සමඟ නව වෙළඳ ක්‍රියාකාරකමක් ඇරඹීමේදී අපනයනය කරනු ලබන රටින් ශාක ස්වස්ථතා තත්වය පිළිබඳ තහවුරු කිරීමක් අවශ්‍ය වේ. නව අපනයන භාණ්ඩය පිළිබඳව, අපනයනය කරනු ලබන රට විසින් ආනයනය කරනු ලබන රටේ ශාක ආරක්ෂක සංවිධානය වෙතට විධිමත් ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු වේ. එවිට අපනයනය කරනු ලබන රටේ ජාතික ශාක ආරක්ෂක සංවිධානය විසින් කර්මාන්තය, ඒ හා බැඳුනු පළිබෝධ අවදානම සහ පළිබෝධ අවදානම් කළමනාකරණය කිරීමේ දේශීය ක්‍රම පිළිබඳව තොරතුරු සැපයිය යුතු වේ.

2017 වර්ෂය තුළදී, මෙම අංශයට,

- ඔස්ට්‍රේලියාව වෙත ඩ්‍රැගන් ෆෘට්, පේර, පැෂන් ෆෘට්, මැංගුස්, කටු අනෝදා සහ රඹුටන් සඳහා,
- චීනය වෙත ඩ්‍රැගන් ෆෘට් සහ අන්නාසි සඳහා,
- නවසීලන්තය වෙත අන්නාසි සඳහා,
- චීනය වෙත සැකසූ තිරිඟු සඳහා සහ චිලී දේශය වෙත සහල් සහ සහල් පිටි සඳහා,

නව වෙළඳ සබඳතා ගොඩ නගා ගැනීමට හැකි විය.

### (ආ) ආනයන සඳහා පළිබෝධ අවදානම් විශ්ලේෂණය

නව භාණ්ඩයක් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන විට, ඒ හා බැඳි පළිබෝධ අවදානම, ආනයන අවශ්‍යතා ගොඩ නගනු ලබන ආකාරය මත පදනම්ව විශ්ලේෂණය කළ යුතු වේ. 2017 වර්ෂය තුළදී, ශීඝ්‍ර පළිබෝධ අවදානම් විශ්ලේෂණ 27ක් සිදු කරන ලදී.

### (ඇ) අන්තර්ජාතික සහයෝගිතාව

චිලී රටෙන් ශ්‍රී ලංකාවට බිලූ බෙරි හා boldo පත්‍ර ආනයනය කිරීමට සහ චිලී දේශයට ශ්‍රී ලංකාවෙන් සහල් සහ සහල් පිටි අපනයනය කිරීමට, ශ්‍රී ලංකාව විසින් චිලී රාජ්‍යය සමඟ ගිවිසුමකට එළඹෙන ලදී.

- ආනයන අවශ්‍යතා, අපනයන අවශ්‍යතා, ප්‍රතිකාර අවශ්‍යතා, ශාක ස්වස්ථතාවන්හි අනනුරූපතා සහ ශාක ස්වස්ථතා සහතික වල පිළිගත හැකි බව පිළිබඳව විවිධ රටවල් සමඟ නිල සන්නිවේදන 56 ක් සිදු කරන ලදී.

ශාක ස්වස්ථතාවන්හි අනනුකූලතා දැන්වීම් 55ක් සහ යුරෝපීය සංගමයෙන් ලද RASFF (ආහාර සහ පෝෂණ සඳහා කඩිනම් සෝදිසි පද්ධතිය) ආහාර සුරක්ෂිතතා ගැටළු පිළිබඳ දැන්වීම් 12ක් අදාළ පාර්ශවකරුවන් වෙතට සන්නිවේදනය කරන ලදී. ඒ අනුව අදාල

අනනුකූලතා සඳහා ගත යුතු නිවැරදි කිරීමේ ක්‍රමවේද සිදු කිරීම පහසු වේ.

- ශ්‍රී ලංකාව වෙනුවෙන් නව සහ සංශෝධනය කළ අන්තර්ජාතික සම්මත පිළිබඳව අදහස් දැක්වීම.
- කැපූ මල් ආනයන, චිලී දේශයෙන් boldo පත්‍ර හා බිලූ බෙරි ආනයන, පොල් මද ආනයන, අයර්ලන්තයෙන් පීට් මොස් (ජීර්ණක පාසි) ආනයන, බ්‍රසීලයෙන් සෝයා ආහාර ආනයන, එළවළුවක් ලෙස හාතාවාරිය ආනයන හා ජපානයෙන් බිලූබෙරි පැළ ආනයන පිළිබඳව පළිබෝධ අවදානම් විශ්ලේෂණ 08 ක් සම්පූර්ණ කරන ලදී.

## පිළියම් තාක්ෂණ අංශය

- අපනයනකරුවන්ට (අපනයන තොග සඳහා) සහ ආනයනකරුවන්ට (රඳවාගත් තොග සඳහා) ධූමකරණ සේවා සැපයීම.
- ශාක හා ශාක නිෂ්පාදන වල අපනයන තොග වල පූර්ව හා පශ්චාත් ධූමකරණ ක්‍රියාවලිය අධීක්ෂණය
- අන්තර් ජාතික ශාක ස්වස්ථතා මානයන් අංක 15 (ISPM 15) සඳහා අන්තර්ජාතික ප්‍රමිතීන් යටතේ තාප ප්‍රතිකාර සපයන්නන් ලියාපදිංචි කිරීම.
- තාප ප්‍රතිකාර සපයන්නන් ප්‍රමිතිකරණය කිරීම හා විගණනය කිරීම
- මොන්ට්‍රියල් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය යටතේ පිහිටවූ ජාතික ඕසෝන් ඒකකය සමඟ තොරතුරු බෙදා හදා ගැනීම සඳහා QPS අවශ්‍යතාවලට මෙතිල් බ්‍රෝමයිඩ් පාරිභෝජනය නියාමනය කිරීම.
- ඕස්ට්‍රේලියානු ධූමකරණ සඳහා බලය ලබා දීමේ යෝජනා ක්‍රමය (Australian Fumigation Accreditation Scheme) යටතේ ලියාපදිංචි මෙතිල් බ්‍රෝමයිඩ් ප්‍රතිකාර සපයන්නන් සඳහා දෙරට ඒකාබද්ධව ධූමකරණ විගණනය හා සමාලෝචනය. (Joint System Review)
- පිළියම් තාක්ෂණය ලබාදෙන්නන් හට සහ වෙනත් අදාළ පාර්ශ්වයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ඕස්ට්‍රේලියාවේ කෘෂිකර්ම හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලැබූ (2017 නිරෝධායන නියාමන රැස්වීම, ලාඔසය) හා 2017 සංවර්ධන වැඩසටහන සඳහා රාජ්‍ය සහයෝගිතාව, ඉන්දුනීසියාව මගින් සංවිධානය කරන ලද නිරෝධායන ප්‍රතිකර්ම හා වෙනත් හවුල්කාර රටවල් සමඟ තොරතුරු බෙදා හදාගැනීමට අදාළ අන්තර්ජාතික හවුල් වලට සහභාගි වීම.
- ඩිප්ලෝමාධාරීන්ට හා විශ්වවිද්‍යාල සිසුන්ට ආයතනය තුළ පුහුණුව හා උපාධි අපේක්ෂකයන්ට පර්යේෂණ ව්‍යාපෘති සඳහා අවස්ථා සැපයීම.
- ශාක හා ශාක නිෂ්පාදන සඳහා නිරෝධායන හා නිරෝධායන නොවන ධූමකරණයන් උදෙසා Vapormate®හා ECO2 Fome යන ධූමකාරක මෙම රටතුළ ස්ථාපනය කිරීම සඳහා NARP ව්‍යාපෘතියට අදාළ පර්යේෂණ කාර්යයන්.

### (අ) අපනයන තොග සඳහා ධූමකරණ සේවාව

2017 වර්ෂය තුළදී, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද ශාක හා ශාක නිෂ්පාදන තොග 30ක් සඳහා ආනයනය කරන රටවල ශාක ස්වස්ථතා අවශ්‍යතාව පරිදි මෙතිල් බ්‍රෝමයිඩ් ධූමකරණ ලබා දෙන ලදී. (වගු අංක 2.1.5.6)

**වගු අංක 2.1.5.6:2017 වර්ෂය තුළදී කටුනායක NPQS හි දී අපනයන තොග සඳහා සිදු කරන ලද වාණිජ ධූමකරණ**

| භාණ්ඩ වර්ගය (අපනයන) | ධූමකරණ සංඛ්‍යාව |
|---|---|
| කොහු හා කොහු නිෂ්පාදන | 23 |
| ලී සහ ලී අයිතමයන් | 04 |
| වෙනත් | 03 |
| **එකතුව** | **30** |

ආනයනික තොග සඳහා, රඳවා ගත් තොග වල ආනයන ශාක ස්වස්ථතා තත්ව සම්පූර්ණ කිරීමට NPQS හි දී තොග 08 ක් ධූමකරණයට ලක් කරන ලදී. **(වගු අංක 2.1.5.7)**

**වගු අංක 2.1.5.7: 2017 වර්ෂය තුළදී කටුනායක NPQS හි දී ආනයන/ රඳවා ගත් තොග සඳහා සිදු කරන ලද වාණිජ ධූමකරණ**

| භාණ්ඩ වර්ගය (ආනයන) | ධූමකරණ සංඛ්‍යාව |
|---|---|
| කැපූ මල් | 06 |
| ලී සහ ලී අයිතමයන් | 01 |
| කුළු බඩු (කරදමුංගු) | 01 |
| **එකතුව** | **08** |

ශාක ස්වස්ථතා ක්‍රියාදාමය ශක්තිමත් කරනු වස් ශාක ස්වස්ථතාසහතික කිරීමෙහි පිළියම් තාක්ෂණ තොරතුරු දැක්වීමට අපනයන තොග 306 ක් NPQS හි අධීක්ෂණය යටතේ බලය ලත් පිළියම් තාක්ෂණය සපයන්නන් විසින් ධූමකරණ සිදු කරන ලදී. (වගු අංක 2.1.5.8)

**වගු අංක 2.1.5.8: NPQS යටතේ භාණ්ඩ වශයෙන් ධූමකරණයට ලක් කරන ලද තොග**

| භාණ්ඩය | තොග සංඛ්‍යාව |
|---|---|
| කොහු | 230 |
| කුළු බඩු | 50 |
| ආහාර ද්‍රව්‍ය | 15 |
| වෙනත් | 11 |
| **එකතුව** | **306** |

### (ආ) මොන්ට්‍රියල් ප්‍රොටොකෝලය යටතේ මෙතිල් බ්‍රෝමයිඩ් පාරිභෝජනය නියාමනය

ශ්‍රී ලංකාව මොන්ට්‍රියල් ප්‍රොටොකෝලයේ අත්සන්කරුවෙකු වන බැවින්, මෙතිල් බ්‍රෝමයිඩ් භාවිතා කිරීමට අවසර ලැබෙන්නේ නිරෝධායනයට හා පූර්ව නැව්ගත කිරීමේ අභිප්‍රායන් සඳහා පමණකි. මොන්ට්‍රියල් ප්‍රොටොකෝලය අනුගමනය කිරීම පිණිස අපනයන කරුවන් ගෙන් ලැබෙන සියළු මෙතිල් බ්‍රෝමයිඩ් ධූමකරණ ඉල්ලීම් පිළියම් තාක්ෂණ අංශය විසින් පරීක්ෂාවට ලක් කරනු ලැබේ.2017 වර්ෂය තුළදී මෙතිල් බ්‍රෝමයිඩ් ධූමකරණ යෝග්‍යතාවය සඳහා ඉල්ලීම් 8,306 ක් අධීක්ෂණය කරන ලද අතර මෙතිල් බ්‍රෝමයිඩ් ධූමකරණ සිදු කිරීමට මාර්ගගත අවසර ලබා දෙන ලදී. මෙලෙස ලද ඉල්ලීම් වලින් ඉල්ලීම් 4ක් අදාළ නිරෝධායනය හා පූර්ව නැව්ගත කිරීමේ අභිප්‍රායන් යටතට නො වැටෙන බැවින් ප්‍රතික්ෂේප කරනු ලැබිණි.

### (ඇ) තාප ප්‍රතිකාර පහසුකම පිළිබඳ ක්‍රියාකාරකම්

ISPM 15 යටතේ ලියාපදිංචි ප්‍රතිකාර සපයන්නන් ප්‍රමිතිකරණය කිරීමේ ක්‍රියාදාමය දිගටම කරගෙන යනලද අතර ISPM 15 යටතේ අලුතෙන් ආයතන 03ක් ලියාපදිංචි කරන ලදී.

**පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන්**

- පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකයේ සහයෝගිත්වය ඇතිව කොළඹ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ දී පිළියම් තාක්ෂණය සපයන්නන්, අපනයන කරුවන්, ආනයන කරුවන්, නෞකා කරුවන් හා රාජ්‍ය නිලධාරීන් සඳහා QPS අරමුණු උදෙසා මෙතිල් බ්‍රෝමයිඩ් භාවිතය නියාමනය කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

- අනුරාධපුර සේවාස්ථ පුහුණු ආයතනයේ දී (ISTI) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නව පත්වීම් ලාභී පළිබෝධ කළමනාකරණ කණ්ඩායම සඳහා ධූමකරණය හා ධාන්‍ය ගබඩා ධූමකරණය පිළිබඳ පුහුණුවක් පවත්වන ලදී.

**(ඇ) ඕස්ට්‍රේලියානු ධූමකරණ සඳහා බලය ලබා දීමේ ක්‍රමවේදය (AFAS) යටතේ ලියාපදිංචි මෙතිල් බ්‍රෝමයිඩ් ප්‍රතිකාර සපයන්නන් සඳහා ඒකාබද්ධ සමාලෝචන විගණනය (JSR) සිදු කරන ලදී.**

ඕස්ට්‍රේලියානු කෘෂිකර්ම හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව AFAS යටතේ ලියාපදිංචි ධූමකරණ සමාගම් විගණනයට ලක් කරන ලද අතර 2017 වර්ෂය සඳහා AFAS සමඟ අනුකූල වන බැවින් සියළු සමාගම් පිළිගන්නා ලදී.

**(ඉ) ඩිප්ලෝමාධාරීන්ට හා විශ්වවිද්‍යාල සිසුන්ට වැඩබිම තුළ පුහුණුව හා උපාධි අපේක්ෂකයන්ට පර්යේෂණ ව්‍යාපෘති සඳහා අවස්ථා සැපයීම.**

- ඩිප්ලෝමා ශිෂ්‍ය කණ්ඩායම් හතකට නිරෝධායන පිළියම් තාක්ෂණය පිළිබඳව පුහුණුව ලබා දෙන ලදී.

- එක් උපාධි අපේක්ෂක පර්යේෂකයෙකුට පුහුණුව ලබා දෙන ලද අතර හෙතෙම ස්වකීය පර්යේෂණ වැඩසටහන පිළියම් තාක්ෂණ අංශයේදී සිදු කළ අතර එම පර්යේෂණ නිබන්ධනය 2018 ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික පර්යේෂණ සම්මේලනයට ඉදිරිපත් කිරීමට තෝරා ගන්නා ලදී.

**(ඊ) පර්යේෂණ ක්‍රියාකාරකම්**

ධූමකරණයේදී භාවිතා කරන ධූමකාරකයක් ලෙස දියර ෆොස්ෆීන් හඳුන්වා දීමට අධ්‍යයන සිදු කරන ලද අතර පහත සඳහන් පළිබෝධ පිටු දැකීමට ධූමකරණ ප්‍රමිතීන් ගොඩ නගන ලදී.

- **අපනයනය කිරීම සඳහා අඹ වල පලතුරු මැස්සාගේ ජීවන චක්‍රයේ අවස්ථා මර්ධනය**

අඹවලට නිරෝධායන පිළියම් තාක්ෂණ ක්‍රමයක් ලෙස/ පසු අස්වනු ආසාදන වලින් තොරවීම සඳහා සහ පලතුරු මැස්සා පාලනයට දියර ෆොස්ෆීන් (E02FUME®) ඝන මීටරයට ග්‍රෑම් 100ක් (2g $PH_3/m^3$ හෝ 1,400 ppm $PH_3$) යොදා පැය 24 ක නිරාවරණ කාල සීමාවක් ලබා දුන් විට ප්‍රතිඵල ලබා දෙන බව සොයා ගන්නා ලදී.

- **අපනයනය කිරීම සඳහා කරවිල වල කොමඩු මැස්සාගේ ජීවන චක්‍රයේ අවස්ථා මර්ධනය**

කරවිල වලට නිරෝධායන පිළියම් තාක්ෂණ ක්‍රමයක් ලෙස/ පසු අස්වනු ආසාදන වලින් තොර වීම සඳහා දියර ෆොස්ෆීන් (E02FUME®) ඝන මීටරයට ග්‍රෑම් 100ක් (2 g $PH_3/m^3$ හෝ 1,400 ppm $PH_3$) යොදා පැය 24 ක නිරාවරණ කාල සීමාවක් ලබා දුන් විට ප්‍රතිඵල ලබා දෙන බව සොයා ගන්නා ලදී.

- **කෙටු සහල් වල ධාන්‍ය පළිබෝධ මර්ධනය**

කෙටු සහල් වල ගුල්ලන් පාලනයට දියර ෆොස්ෆීන් (E02FUME®) ඝන මීටරයට ග්‍රෑම් 50ක් (1g $PH_3/m^3$ හෝ 700ppm $PH_3$) යොදා පැය 36ක නිරාවරණ කාල

සීමාවක් ලබා දීම සුදුසු බව සොයා ගන්නා ලදී.

මෙම මාතෘකාව පාදක කර ගත් පර්යේෂණ පත්‍රිකාවක් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික පර්යේෂණ සභාව විසින් පිළි ගන්නා ලදී.

## ශාක නිරෝධායන ස්ථානය - ගුවන්තොටුපළ, කටුනායක

ශාක නිරෝධායන ස්ථානය, ආනයනය කරන ලද ශාක සහ ශාක නිෂ්පාදන පරීක්ෂා කිරීම හා මුදා හැරීමත් අපනයනය කරනු ලබන ශාක සහ ශාක නිෂ්පාදන සඳහා ශාක ස්වස්ථතා සහතික නිකුත් කිරීමත් යන ප්‍රධාන සේවාවන් ඉටු කරයි. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ශාක නිරෝධායන ස්ථානයේ සමස්ත ආදායම ප්‍රධාන වශයෙන් උපයනු ලබන්නේ ආනයන අපනයන පරීක්ෂණ ගාස්තු අය කිරීමෙන් හා ශාක ස්වස්ථතා සහතික නිකුත් කිරීමෙනි. 2017 වර්ෂයේ මුළු ආදායම රුපියල් 9,456,495.00 ක් වූ අතර රුපියල් 704,936.00ක් ශාක ස්වස්ථතා සහතික 58,828 ක් නිකුත් කිරීමෙන් උපයා ගන්නා ලදී. 2017 වර්ෂයේ ආනයන අපනයන පරීක්ෂණ 58,839 ක් සිදු කොට රුපියල් 8,750,850.00ක් උපයා ගන්නා ලදී.

### අපනයන

**වගු අංක 2.1.5.9: 2016හා 2017 තුළ අපනයනය කරන ලද තොග ගණන**

| භාණ්ඩය | 2017 | 2016 |
|---|---|---|
| කැපූ විසිතුරු පත්‍ර | 4,986 | 5,239 |
| සජීවී පැළෑටි | 1,367 | 1,450 |
| මුල් නො ඇදුනු කඳ කැබලි | 111 | 70 |
| මුල් ඇදුනු කඳ කැබලි | 51 | 80 |
| පලතුරු | 14,191 | 14,549 |
| එළවළු | 18,708 | 17,685 |
| පොල් | 494 | 865 |
| තේ | 5,834 | 5,959 |
| ජලජ පැළෑටි | 143 | 135 |
| කොහු | 744 | 693 |
| බුලත් | 5,774 | 5,457 |
| අළුත් මල් | 204 | 226 |
| කුළුබඩු | 930 | 636 |
| දුම්කොල | 166 | 121 |
| පොල් තෙල් | 250 | 369 |
| වෙනත් | 384 | 426 |
| දැවමය අයිතම | 65 | 43 |
| පොල් නිෂ්පාදන | 595 | 251 |
| බීජ | 6 | 11 |
| හාල් | 4 | 22 |
| රබර් | 1 | 0 |
| තිරිඟු පිටි | 0 | 6 |

**වගු අංක 2.1.5.10: 2016 තුළ අපනයනය කරන ලද ප්‍රමාණය**

| අපනයනය කරන ලද භාණ්ඩය | කැලි ගණන | කිලෝ ග්‍රෑම් |
|---|---|---|
| පලතුරු | 0 | 7,297,375 |
| එළවළු | 0 | 9,152,193 |
| පොල් | 0 | 82,919.48 |
| තේ | 0 | 435,065.9 |
| බුලත් | 0 | 4,747,569 |
| කුළුබඩු | 0 | 137,000.3 |
| දුම්කොල | 0 | 534,576.2 |
| පොල් තෙල් | 76.8326 | 157,791.2 |
| වෙනත් | 330,399/8.35 | 257,709.6 |
| දැවමය අයිතම | 3,257 | 4,095.06 |
| පොල් නිෂ්පාදන | 2,200/166.12 | 176,427.5 |

| අපනයනය කරන ලද භාණ්ඩය | කැලි ගණන | කිලෝ ග්‍රෑම් |
|---|---|---|
| බීජ | 0 | 134.215 |
| කැපූ විසිතුරු පත්‍ර | 123,405,001 | 12,260.5 |
| සජීවී පැළෑටි | 24,202,610 | 10,776.67 |
| කැපූ මල් | 124,760 | 663.95 |

**වගු අංක 2.1.5.11: යුරෝපීය සංගම් රටවලට යැවීමට නියමිත වූ අභ්‍යන්තරිකව ප්‍රතික්ෂේපිත පලතුරු හා එළවළු**

| භාණ්ඩය | කිලෝ ග්‍රෑම් |
|---|---|
| බණ්ඩක්කා | 35,829.1 |
| මැංගුස් | 3344 |
| කතුරු මුරුංගා කොළ | 3,007.6 |
| නිවිති | 2,910.5 |
| මුරුංගා කොළ | 3,121.5 |
| තලන බටු | 2,798.8 |
| බටු | 2,477.33 |
| ලූණු මල් | 2,443.3 |
| අල වර්ග | 1,549.4 |
| තම්පලා | 1,509.4 |
| මුකුණුවැන්න | 1,306 |
| ගොටුකොළ | 1,178 |
| අඹ | 1,137.8 |
| මෑ | 1,103.19 |
| පතෝල | 836 |
| අඹ (Curry Mango) | 827.3 |
| රඹුටන් | 470.9 |
| පැපොල් | 568.3 |
| කෙසෙල් | 473.95 |
| දඹල | 341.8 |
| තිබ්බටු | 420.9 |
| කරවිල | 281 |
| අන්නාසි | 228 |
| මාළු මිරිස් | 225.5 |

| භාණ්ඩය | කිලෝ ග්‍රෑම් |
|---|---|
| කහ | 184 |
| අඟුණ කොල | 158.9 |
| අනෝදා | 109 |
| ලූණු | 328 |
| අමු මිරිස් | 90 |
| පේර | 86.3 |
| වැටකොළු | 81.7 |
| රම්පෙ | 76 |
| දිවුල් | 73.8 |
| මිශ්‍ර පලා | 66.25 |
| තුඹ කරවිල | 58.5 |
| කරපිංචා | 55.5 |
| බුලත් කොළ | 55 |
| බෝංචි | 28 |
| කංකුං | 23 |
| දෙල් | 21 |
| වෙනත් | 143 |
| **එකතුව** | **70,027.52** |

## (අ) ආනයන

ගුවනින් ප්‍රවාහනය කරනු ලබන ශාක හා ශාක නිෂ්පාදන වලින් බොහොමයක් කල් තබා ගත නොහැකි ඒවා වන අතර මේවායින් බොහොමයක් ගුවන් භාණ්ඩ ලෙස ගෙන්වනු ලැබේ. මේවායින් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් ගුවන් මගීන් විසින් හෝ ගුවන් මගීන් මගින් ගෙන එනු ලැබේ. 2017 වර්ෂයේදී, මුළු ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 183.374ක් පමණ වූ අතර එය සංඛ්‍යාත්මකව 3,074,423කි. ඕකිඩ්, ඇඩිනියම් යනාදිය අන්තර්ගත ජීවී පැළෑටි, රෝස බඳු නැවුම් මල්, වියළි ශාක, නැවුම් පලතුරු, එළවළු හා එළවළු බීජ සාමාන්‍ය ආනයන විය.

## (ආ) මගී පර්යන්තයෙහි රඳවා ගත් භාණ්ඩ

මෙම භාණ්ඩ දිවයිනට ජෛව ආරක්ෂණ අවදානමක් ඇති කරමින් ප්‍රධාන වශයෙන් ශාක ස්වස්ථතා සහතික හෝ ආනයන බලපත්‍ර රහිතව ගෙන්වනු ලබන ඒවාය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ශාක නිරෝධායන ස්ථානය විසින් කිලෝග්‍රෑම් 6,502.744ක සහ ප්‍රධාන වශයෙන් නැවුම් පලතුරු, නැවුම් මල් හා කුළු බඩු කොටස් 2,714ක් රඳවා ගන්නා ලදී. මෙලෙස රඳවා ගත් භාණ්ඩ ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණය යටතේ ජාතික ශාක නිරෝධායන සේවයේ දී විනාශ කරන ලදී.

අධීක්ෂණය කිරීම හා ශාක ස්වස්ථතා සහතික නිකුත් කිරීමට අමතරව අපනයන කරුවන්, පාසල් හා විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් හා රජයේ නිලධාරීන්ට පුහුණු හා දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්විම මගින් ශ්‍රී ලාංකික ආනයන වල ශාක ස්වස්ථතා ප්‍රමිති ප්‍රවර්ධනයට සහාය වීම ද මෙම ඒකකය විසින් සිදු කරනු ලැබේ. NPQS කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ශාක නිරෝධායන ස්ථානය විසින් සහතික කළ ක්ෂේත්‍ර, ඇසුරුම් ගෘහ, හා විවිත්‍ර පත්‍ර තවාන් විගණනය කිරීමද සිදු කරනු ලැබේ. අන්තර්ජාතික පැළෑටි ආරක්ෂණ සම්මුතියේ (IPPC) යටතේ e-phyto ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. ඊට අතිරේකව ශ්‍රී ලංකා රේගුව විසින් මෙහෙයවනු ලබන තනි වින්ඩෝ පද්ධති (Single Window System) බඳු ඉලෙක්ට්‍රොනික පද්ධති ආරම්භ කිරීම මගින් පවතින ශාක ස්වස්ථතා පද්ධතිය වැඩිදුර ප්‍රවර්ධනය කිරීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ශාක නිරෝධායන ස්ථානය විසින් ස්වකීය උපරිම සහයෝගී දායකත්වය ලබා දී ඇත.

## ශාක නිරෝධායන ස්ථානය - ගුවන්තොටුපළ, කටුනායක

ශාක නිරෝධායන ස්ථානය, ආනයනය කරන ලද ශාක සහ ශාක නිෂ්පාදන පරීක්ෂා කිරීම හා මුද්‍රා හැරීමත් අපනයනය කරනු ලබන ශාක සහ ශාක නිෂ්පාදන සඳහා ශාක ස්වස්ථතා සහතික නිකුත් කිරීමත් යන ප්‍රධාන සේවාවන් ඉටු කරයි. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පැළෑටි නිරෝධායන ස්ථානයේ සමස්ත ආදායම ප්‍රධාන වශයෙන් උපයනු ලබන්නේ ආනයන අපනයන පරීක්ෂණ ගාස්තු අය කිරීමෙන් හා ශාක ස්වස්ථතා සහතික නිකුත් කිරීමෙනි. 2017 වර්ෂයේ මුළු ආදායම රුපියල් 9,456,495.00ක් වූ අතර රුපියල් 704,936.00ක් ශාක ස්වස්ථතා සහතික 58,828ක් නිකුත් කිරීමෙන් උපයා ගන්නා ලදී. 2017 වර්ෂයේ ආනයන අපනයන පරීක්ෂණ 58,839 ක් සිදු කොට රුපියල් 8,750,850.00ක් උපයා ගන්නා ලදී.

### අපනයන

**වගු අංක 2.1.5.9: 2016හා 2017 තුළ අපනයනය කරන ලද තොග ගණන**

| භාණ්ඩය | 2017 | 2016 |
|---|---|---|
| කැපූ විසිතුරු පත්‍ර | 4,986 | 5,239 |
| සජීවී පැළෑටි | 1,367 | 1,450 |
| මුල් නො ඇදුනු කඳ කැබලි | 111 | 70 |
| මුල් ඇදුනු කඳ කැබලි | 51 | 80 |
| පලතුරු | 14,191 | 14,549 |
| එළවළු | 18,708 | 17,685 |
| පොල් | 494 | 865 |
| තේ | 5,834 | 5,959 |
| ජලජ පැළෑටි | 143 | 135 |
| කොහු | 744 | 693 |
| බුලත් | 5,774 | 5,457 |

| භාණ්ඩය | 2017 | 2016 |
|---|---|---|
| අළුත් මල් | 204 | 226 |
| කුළුබඩු | 930 | 636 |
| දුම්කොළ | 166 | 121 |
| පොල් තෙල් | 250 | 369 |
| වෙනත් | 384 | 426 |
| දැවමය අයිතම | 65 | 43 |
| පොල් නිෂ්පාදන | 595 | 251 |
| බීජ | 6 | 11 |
| හාල් | 4 | 22 |
| රබර් | 1 | 0 |
| තිරිඟු පිටි | 0 | 6 |

**වගු අංක 2.1.5.10: 2016 තුළ අපනයනය කරන ලද ප්‍රමාණය**

| අපනයනය කරන ලද භාණ්ඩය | කැලි ගණන | කිලෝ ග්‍රෑම් |
|---|---|---|
| පලතුරු | 0 | 7,297,375 |
| එළවළු | 0 | 9,152,193 |
| පොල් | 0 | 82,919.48 |
| තේ | 0 | 435,065.9 |
| බුලත් | 0 | 4,747,569 |
| කුළුබඩු | 0 | 137,000.3 |
| දුම්කොළ | 0 | 534,576.2 |
| පොල් තෙල් | 76.8326 | 157,791.2 |
| වෙනත් | 330,399/8.35 | 257,709.6 |
| දැවමය අයිතම | 3,257 | 4,095.06 |
| පොල් නිෂ්පාදන | 2,200/166.12 | 176,427.5 |
| බීජ | 0 | 134.215 |
| කැපූ විසිතුරු පත්‍ර | 123,405,001 | 12,260.5 |
| සජීවී පැළෑටි | 24,202,610 | 10,776.67 |
| කැපූ මල් | 124,760 | 663.95 |

**වගු අංක 2.1.5.11: යුරෝපීය සංගම් රටවලට යැවීමට නියමිත වූ අභ්‍යන්තරිකව ප්‍රතික්ෂේපිත පලතුරු හා එළවළු**

| භාණ්ඩය | කිලෝ ග්‍රෑම් |
|---|---|
| බණ්ඩක්කා | 35,829.1 |
| මැංගුස් | 3344 |
| කතුරු මුරුංගා කොළ | 3,007.6 |
| නිවිති | 2,910.5 |
| මුරුංගා කොළ | 3,121.5 |
| තලන බටු | 2,798.8 |
| බටු | 2,477.33 |
| ලූණු මල් | 2,443.3 |
| අල වර්ග | 1,549.4 |
| තම්පලා | 1,509.4 |
| මුකුණුවැන්න | 1,306 |
| ගොටුකොළ | 1,178 |
| අඹ | 1,137.8 |
| මෑ | 1,103.19 |
| පතෝල | 836 |
| මාළු අඹ | 827.3 |
| රඹුටන් | 470.9 |
| පැපොල් | 568.3 |
| කෙසෙල් | 473.95 |
| දඹල | 341.8 |
| තිබ්බටු | 420.9 |
| කරවිල | 281 |
| අන්නාසි | 228 |
| මාළු මිරිස් | 225.5 |
| කහ | 184 |
| අඟුණ කොල | 158.9 |
| අනෝදා | 109 |
| ලූණු | 328 |
| අමු මිරිස් | 90 |
| පේර | 86.3 |
| වැටකොළු | 81.7 |
| රම්පෙ | 76 |

| භාණ්ඩය | කිලෝ ග්‍රෑම් |
|---|---|
| දිවුල් | 73.8 |
| මිශ්‍ර පලා | 66.25 |
| තුඹ කරවිල | 58.5 |
| කරපිංචා | 55.5 |
| බුලත් කොළ | 55 |
| බෝංචි | 28 |
| කංකුං | 23 |
| දෙල් | 21 |
| වෙනත් | 143 |
| **එකතුව** | **70,027.52** |

### (අ) ආනයන

ගුවනින් ප්‍රවාහනය කරනු ලබන ශාක හා ශාක නිෂ්පාදන වලින් බොහොමයක් කල් තබා ගත නො හැකි ඒවා වන අතර මේවායින් බොහොමයක් ගුවන් භාණ්ඩ ලෙස ගෙන්වනු ලැබේ. මේවායින් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් ගුවන් මගීන් විසින් හෝ ගුවන් මගීන් මගින් ගෙන එනු ලැබේ. 2017 වර්ෂයේදී, මුළු ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 183.374 ක් පමණ වූ අතර එය සංඛ්‍යාත්මකව 3,074,423කි. ඕකිඩ්, ඇඩෙනිම් යනාදිය අන්තර්ගත ජීවී පැළෑටි, රෝස බඳු නැවුම් මල්, වියළි ශාක, නැවුම් පලතුරු, එළවළු හා එළවළු බීජ සාමාන්‍ය ආනයන විය.

### (ආ) මගී පර්යන්තයෙහි රඳවා ගත් භාණ්ඩ

මෙම භාණ්ඩ දිවයිනට ජෛව ආරක්ෂණ අවදානමක් ඇති කරමින් ප්‍රධාන වශයෙන් ශාක ස්වස්ථතා සහතික හෝ ආනයන බලපත්‍ර රහිතව ගෙන්වනු ලබන ඒවාය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ශාක නිරෝධායන සේවය විසින් කිලෝග්‍රෑම් 6,502.744ක සහ ප්‍රධාන වශයෙන් නැවුම් පලතුරු, නැවුම් මල් හා කුළු බඩු කොටස් 2,714ක් රඳවා ගන්නා ලදී. මෙලෙස රඳවා ගත් භාණ්ඩ ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණය යටතේ ජාතික ශාක නිරෝධායන සේවයේ දී විනාශ කරන ලදී.

අධීක්ෂණය කිරීම හා ශාක ස්වස්ථතා සහතික නිකුත් කිරීමට අමතරව අපනයන කරුවන්, පාසල් හා විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් හා රජයේ නිලධාරීන්ට පුහුණු හා දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම මගින් ශ්‍රී ලාංකික ආනයන වල ශාක ස්වස්ථතා ප්‍රමිති ප්‍රවර්ධනයට සහාය වීම ද මෙම ඒකකය විසින් සිදු කරනු ලැබේ. NPQS කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ශාක නිරෝධායන සේවය විසින් සහතික කළ ක්ෂේත්‍ර, ඇසුරුම් ගෘහ හා විවිත්‍ර පත්‍ර තවාන් විගණනය කිරීමද සිදු කරනු ලැබේ. අන්තර්ජාතික පැළෑටි ආරක්ෂණ සම්මුතියේ e-phyto හා ශ්‍රී ලංකා රේගුව විසින් මෙහෙයවනු ලබන තනි වින්ඩෝ පද්ධති බඳු ඉලෙක්ට්‍රොනික පද්ධති ආරම්භ කිරීම මගින් පවතින ශාක ස්වස්ථතා පද්ධතිය වැඩිදුර ප්‍රවර්ධනය කිරීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ශාක නිරෝධායන සේවය විසින් ස්වකීය උපරිම සහයෝගී දායකත්වය ලබා දී ඇත.

## ශාක නිරෝධායන ස්ථානය, වරාය, කොළඹ

කොළඹ වරායේ පිහිටි ශාක නිරෝධායන මධ්‍යස්ථානය, තොග ප්‍රමාණ වලින් යුතු ශාක හා ශාක නිෂ්පාදන ඇතුළත් ආනයන හා අපනයන නෞකා භාණ්ඩ සියල්ලම පාහේ හුවමාරු වන ප්‍රධාන පිවිසුම් හා පිටවීම් ස්ථානයකි. තේ, රබර්, පොල් නිෂ්පාදන, කුළු බඩු හා ආහාර ද්‍රව්‍ය ප්‍රධාන අපනයන අයිතම වන අතර රෝපණ ද්‍රව්‍ය ලෙස බීජ, පලතුරු, දැව, සත්ව ආහාර හා මිරිස්, පරිප්පු, කොත්තමල්ලි, අර්තාපල්, ළූණු යනාදී වෙනත් සියළු ප්‍රධාන ආනයනික පාරිභෝජන ද්‍රව්‍ය ශාක නිරෝධායන සේවයේ අවධානයට ලක් වන ඒවා වේ.

## ප්‍රගතිය

නිකුත් කරන ලද ශාක ස්වස්ථතා සහතික - 43,605

ශාක ස්වස්ථතා සහතිකවලින් ලද ආදායම - රු. 523,260

නෞකා භාණ්ඩ පරීක්ෂා කිරීම් සංඛ්‍යාව - 43,026

නෞකා භාණ්ඩ පරීක්ෂා කිරීම්වලින් ලද ආදායම - රු. 6,453,900

මුළු ආදායම - රු.6,977,160

මුළු අපනයන නැව් භාණ්ඩ සංඛ්‍යාව - 38,492

මුළු ප්‍රමාණය - මෙට්‍රික් ටොන් 1,499,744.23

මුළු ආනයන නැව් භාණ්ඩ සංඛ්‍යාව - 25,769

මුළු ප්‍රමාණය - මෙට්‍රික් ටොන් 2,412,924

මුළු විනාශ කිරීම් සංඛ්‍යාව - 08

මුළු ප්‍රතිකාර කිරීම් සංඛ්‍යාව - 44

## ශාක නිරෝධායන ස්ථානය - ගන්නෝරුව

2017 වර්ෂයේ මෙම ඒකකය මගින් ඉටුකළ කාර්යයන් යටතට ශාක ස්වස්ථතා සහතික නිකුත් කිරීම, පැළ තවාන් පරීක්ෂාව, අවශ්‍ය උපදෙස් ලබාදීම, දුම්කොළ අපනයන තොග වල පූර්ව හා පශ්චාත් ධූමකරණ පරීක්ෂාව සහ ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට අදාළ ජෛව විද්‍යාත්මක පාලන පර්යේෂණ වැඩ කටයුතු ඇතුළත් වේ.

### ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන

- ගෝවා සහ තක්කාලි පළිබෝධ පාලනය සඳහා ජෛව විද්‍යාත්මක කෘමි පළිබෝධ පාලන කාරක තොග වශයෙන් ඇති කරන ලදී (ශ්‍රී ලංකාවේ කෘමි පළිබෝධ පාලන ගිලන් හලක් පිහිටුවීමේ ආරම්භක පියවර).
- දියමන්ති පිට සලබයාගේ පරපෝෂිතාභ තුනක් හඳුනා ගන්නා ලදී.
- කෘත්‍රිම ආහාර වේල් තිස් පහක් විධිමත්ව සකසා අත් හදා බලන ලද අතර ඉන් ආහාර වේල් තුනක් විද්‍යාගාරයේදී කෘමීන් තොග වශයෙන් ඇති කිරීම සඳහා උචිත බව අනාවරණය විය.
- මෙම ප්‍රතිඵල මත පදනම්ව, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන ලද "තිරසාර සංවර්ධනයේ ජාතික මංගල්ලය" නමින් යුතු ප්‍රදර්ශනය සඳහා පෝස්ටර් හා අත් පත්‍රිකා පිළියෙල කරන ලදී.
- මහනුවර, නුවරඑළිය හා අනුරාධපුර දිස්ත්‍රික්ක වල හෙක්ටෙයාර 50 ක පමණ භූමි ප්‍රදේශයක් තුළ පරපෝෂිතයන් මුදා හැරීම් 30 කට වඩා වැඩි ප්‍රමාණයක් සිදු කරන ලදී.
- දැනුවත් භාවය ඇති කිරීමේ වැඩසටහන් 15ක් (15) මහනුවර, නුවරඑළිය හා අනුරාධපුර දිස්ත්‍රික්ක වලදී පවත්වන ලදී.

වර්ෂය තුළදී ශාක ස්වස්ථතා සහතික 244ක් නිකුත් කරන ලද අතර, පැළ තවාන් පරීක්ෂා කිරීම් 25ක් සිදු කොට තවාන් කරුවන්ට අවශ්‍ය උපදෙස් ලබාදෙන අතර ක්ෂේත්‍ර අධීක්ෂණ 12ක් සිදු කර අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී. මීට අමතරව මාවිල්මඩ ලංකා දුම්කොළ සමාගම මගින් සිදු කරන ලද දුම්කොළ අපනයන සඳහා පූර්ව හා පශ්චාත් ධූමකරණ පරීක්ෂා 52ක් සිදු කරන ලදී.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි තාක්ෂණ උද්‍යානයේ ශාක නිරෝධායන අංශය අධීක්ෂණයට ලක් කරන ලදී.

## පැළෑටි නිරෝධායන ස්ථානය- ගුවන්තොටුපල, මත්තල

කර්මාන්ත ශාලා 09 ක්අධීක්ෂණය කරන ලද අතර නියැදි 09 ක් කෘමි පළිබෝධ හා ශාක ව්‍යාධිජනක සඳහා පරීක්ෂා කරන ලදී. අවසන් පරීක්ෂණ වාර්තා ප්‍රවේශ

ස්ථාන වලට බාර දෙන ලද අතර එක් ශාක ස්වස්ථතා සහතිකයක් පමණක් නිකුත් කරන ලදී.

- ශාක හා ශාක නිෂ්පාදන ආනයන හා අපනයන වල නිරෝධායන අංශය පිළිබඳව ජාතික ශාක නිරෝධායන සේවයේ (කටුනායක) දෙ දින තාක්ෂණ සැසි වලට සහභාගි වන ලදී.
- ගන්නොරුව හා අඟුණකොළපැලැස්ස සේවාස්ථ පුහුණු ආයතන විසින් පවත්වන ලද සාමාන්‍ය කෘෂිකර්මයේ සියළු තාක්ෂණික අංශ පිළිබඳව පුහුණු වැඩසටහන් දහයකට සහභාගි වන ලදී.

## 2018 වර්ෂය සඳහා සැලැස්ම

### ගුණාත්මක ශාක හා ශාක නිෂ්පාදන අපනයන ප්‍රවර්ධනය

- අපනයන පැළ තවාන් පරීක්ෂාව
- අපනයන ශාක හා ශාක නිෂ්පාදන කර්මාන්තශාලා පරීක්ෂාව
- අනෙකුත් කෘෂිකර්මාන්තය හා සම්බන්ධ අපනයන පරීක්ෂා (වෙන් වෙන් වශයෙන් පටක රෝපණ පැළ ඇගයීම)
- නියැදි ගත කිරීම
- ලේඛන පරීක්ෂාව
- ශාක ව්‍යාධිජනකයින් රසායනාගාරයේදී පරීක්ෂාව
- ශාක කෘමීන් රසායනාගාරයේදී පරීක්ෂාව
- ශාක නෙමටෝඩාවන් රසායනාගාරයේදී පරීක්ෂාව
- වල් පැළෑටි/ පස් රසායනාගාරයේදී පරීක්ෂාව
- අවසාන පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම

### ආනයනික බීජ අර්තාපල් වල ගුණාත්මකබව තහවුරු කර ගැනීම

- බීජ අර්තාපල් ප්‍රවේශ ස්ථානයේදී පරීක්ෂාව
- නියැදිගත කිරීම
- ලේඛන පරීක්ෂාව
- පැළෑටි ව්‍යාධිජනකයින් රසායනාගාරයේදී පරීක්ෂාව
- පැළෑටි කෘමීන් රසායනාගාරයේදී පරීක්ෂාව
- පැළෑටි නෙමටෝඩාවන් රසායනාගාරයේදී පරීක්ෂාව
- අවසාන පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම

### ආනයනික ශාක හා ශාක නිෂ්පාදනවල ගුණාත්මකබව තහවුරු කරගැනීම

- ප්‍රවේශ ස්ථාන පරීක්ෂාව
- නියැදිගත කිරීම
- ලේඛන පරීක්ෂාව
- ජාතික ශාක නිරෝධායන සේවය වෙත ප්‍රවේශ ස්ථානයෙන් ඉදිරිපත් කරන නියැදි ලබාගැනීම
- ශාක ව්‍යාධිජනකයින් රසායනාගාරයේදී පරීක්ෂාව
- ශාක කෘමීන් රසායනාගාරයේදී පරීක්ෂාව
- ශාක නෙමටෝඩාවන් රසායනාගාරයේදී පරීක්ෂාව
- වල් පැළෑටි රසායනාගාරයේදී පරීක්ෂාව
- පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- අවසාන පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- නිදහස් කිරීම
- පිළියම් තාක්ෂණය සම්බන්ධ නිර්දේශයන්
- ප්‍රති අපනයනය හෝ විනාශකිරීම

## ආනයනික බීජ වල ගුණාත්මකබව තහවුරු කිරීම

- ප්‍රවේශ ස්ථාන පරීක්ෂාව
- නියැදිගත කිරීම
- ලේඛන පරීක්ෂාව
- ජාතික ශාක නිරෝධායන සේවය වෙත ප්‍රවේශ ස්ථානය මගින් ඉදිරිපත් කරන නියැදි ලබාගැනීම
- ශාක ව්‍යාධිජනකයින් රසායනාගාරයේදී පරීක්ෂාව
- ශාක කෘමීන් රසායනාගාරයේදී පරීක්ෂාව
- ශාක නෙමටෝඩාවන් රසායනාගාරයේදී පරීක්ෂාව
- වල්පැළ රසායනාගාරයේදී පරීක්ෂාව
- පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- අවසන් පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- නිදහස් කිරීම
- පිළියම් තාක්ෂණය සම්බන්ධ නිර්දේශය
- ප්‍රති අපනයනය හෝ විනාශ කිරීම

## ශාක ස්වස්ථතා අවශ්‍යතාවන් සපුරාලීමෙන් තොරව ආනයන වැළක්වීම

- ලේඛන පරීක්ෂාව
- නියැදිගත කිරීම
- ජාතික ශාක නිරෝධායන සේවය වෙත ප්‍රවේශ ස්ථානය මගින් ඉදිරිපත් කරන නියැදි ලබාගැනීම
- රඳවාගත් පැළ වල ව්‍යාධිජනකයින් සඳහා පරීක්ෂා කිරීම
- රඳවාගත් පැළ වල කෘමි පලිබෝධ සඳහා පරීක්ෂා කිරීම
- ශාක පරපෝෂිත නෙමටෝඩාවන් පරීක්ෂා කිරීම
- වල් පැළෑටි පරීක්ෂා කිරීම
- පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- අවසාන පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- පිළියම් තාක්ෂණය සම්බන්ධ නිර්දේශයන්
- පිළියම් තාක්ෂණය සම්බන්ධ අධීක්ෂණ
- ප්‍රති අපනයනය
- විනාශ කිරීම

## පසු ප්‍රවේශ නිරෝධායනය

- ක්ෂේත්‍ර පරීක්ෂාව
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පැළ තබාගැනීම
- නිර්දේශයන්
- අවසාන වාර්තා ඉදිරිපත් කිරීම

## අපනයන හා ආනයන ශාක හා ශාක නිෂ්පාදන වල හමුවන පලිබෝධකයින් ඉවත් කිරීම සඳහා

### පිළියම් තාක්ෂණය භාවිතය

ජාතික ශාක නිරෝධායන සේවයෙහිදී ධූමකරණය

- ජාතික ශාක නිරෝධායන සේවයෙහි පරිශ්‍රයෙන් පරිබාහිරව සිදුකරන ධූමකරණයන් අධීක්ෂණය
- ධූමකරණ වාර්තා නිකුත් කිරීම
- ධූමකරණ සමාගම් සඳහා මාර්ගගත අනුමැතිය

## ආශ්‍රෙය එකතු නඩත්තුව

- වල් පැළෑටි විශේෂ සහ වල් පැළෑටි බීජ
- කෘමීන්
- රෝග ආදර්ශනයන්
- සජීවී ජලජ පැළටි

## අදාළ පාර්ශ්වයන් සඳහා පුහුණු හා දැනුවත්වීමේ වැඩසටහන්

- පුහුණු
- උපාධි අපේක්ෂක/ ඩිප්ලෝමා සිසුන් අධීක්ෂණය
- දැනුවත්වීමේ වැඩසටහන්
- වැඩමුළු
- සම්මන්ත්‍රණ

## නිරෝධායනය සම්බන්ධ පර්යේෂණ

- පළිබෝධ සමීක්ෂණ
- පළිබෝධ අවදානම් විශ්ලේෂණය
- වල් පැළෑටි නියාමන පරීක්ෂණ
- ව්‍යාධිවේද පර්යේෂණ
- කීට විද්‍යාත්මක පර්යේෂණ
- නිරෝධායන පිළියම් තාක්ෂණය සම්බන්ධ පර්යේෂණ

## පැළ තවාන්, පලතුරු සහ එළවළු ක්ෂේත්‍ර හා ඇසුරුම් ගෘහ ලියාපදිංචිය

- නම්කරන ලද රටවල් සඳහා පැළ අපනයන
- ක්ෂේත්‍ර පරීක්ෂණ
- කර්මාන්තශාලා හා ඇසුරුම් ගෘහ
- විගණන
- වාර්තා ඉදිරිපත් කිරීම

## ප්‍රතිකර්ම ලබාදෙන්නන් සතු පහසුකම් ඇගයීම

- ස්ථාන පරීක්ෂාව
- විගණන
- වාර්තා ඉදිරිපත් කිරීම

## ආනයන බලපත්‍ර හා ශාක ස්වස්ථතා සහතික නිකුත් කිරීම

- ඉලෙක්ට්‍රොනික ශාක ස්වස්ථතා සහතික නිකුත් කිරීමේ පද්ධතිය ස්ථාපනය කිරීම.
- ලේඛන ව්‍යාජ ලෙස සැකසීම වැළැක්වීමට වැඩි දියුණු කළ ආරක්ෂක අංග සහිත නව සහතිකයක් හඳුන්වා දීම.
- ආනයන හා අපනයන ලේඛන නිෂ්කාශන ක්‍රියා දාමය රේගුවේ ASYCUDA පද්ධතිය සමඟ ඒකාබද්ධ කරනු ලැබේ.

## කාර්ය මණ්ඩලය

### ජාතික ශාක නිරෝධායන සේවය - කටුනායක

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 05 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 04 |
| පරිපාලන නිලධාරි | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 05 |
| පර්යේෂණ සහකාර (අධි ශ්‍රේණිය) | 01 |
| පර්යේෂණ සහකාර | 09 |
| කෘෂිකර්ම උපදේශක | 19 |
| තාක්ෂණ සහායක | 05 |
| තාක්ෂණ සහායක (ඉංජිනේරු ) | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 06 |
| රියදුරු | 04 |
| විදුලි ශිල්පි | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| මුරකරු | 05 |
| විශේෂ කම්කරු (සනීපාරක්ෂක කොන්ත්‍රාත්) | 01 |
| කම්කරු (ස්ථිර) | 08 |
| කම්කරු(කොන්ත්‍රාත්) | 11 |
| **එකතුව** | **91** |

## ශාක නිරෝධාන සේවය - ගුවන් තොටුපළ, කටුනායක

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ(සංවර්ධන) | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 03 |
| කෘෂිකර්ම උපදේශක (අධි ශ්‍රේණිය) | 01 |
| පර්යේෂණ සහකාර (අධි ශ්‍රේණිය) | 0 |
| කෘෂිකර්ම උපදේශක | 24 |
| පර්යේෂණ සහකාර | 05 |
| තාක්ෂණ සහායක | 19 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| කම්කරු (ස්ථිර) | 03 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 03 |
| **එකතුව** | **61** |

## ශාක නිරෝධායන සේවය - වරාය, කොළඹ

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 04 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 05 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 02 |
| පර්යේෂණ සහකාර (අධි ශ්‍රේණිය) | 01 |
| කෘෂිකර්ම උපදේශක | 14 |
| පර්යේෂණ සහකාර | 05 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| කම්කරු (ස්ථිර) | 01 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 02 |
| **එකතුව** | **37** |

## ශාක නිරෝධායන සේවය - ගන්නොරුව

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) - ස්ථාන භාර නිලධාරි | 01 |
| පර්යේෂණ සහකාර | 01 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 02 |
| **එකතුව** | **04** |

## ශාක නිරෝධායන සේවය - මත්තල/ හම්බන්තොට

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) - ස්ථාන භාර නිලධාරි | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 01 |
| කෘෂිකර්ම උපදේශක | 02 |
| තාක්ෂණ සහායක | 01 |
| රියදුරු | 01 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 02 |
| **එකතුව** | **08** |

## 2.2. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය - පේරාදෙණිය

කවර හෝ කෘෂිකාර්මික නිෂ්පාදනයක ගුණාත්මක බව, ප්‍රමාණය හා නිෂ්පාදන පිරිවැය තීරණය කිරීමෙහි ලා බීජ හා රෝපණ ද්‍රව්‍ය, ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. මෙම සියලු අංශයන් ගෙන් ප්‍රතිලාභ අත් පත් කර දීමේ මං පෙත් විවර කර දෙනු ලබන්නේ උසස් ගුණාත්මක බවින් යුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය මගිනි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ආයතන මගින් සංවර්ධනය කරනු ලබන දේශීය වශයෙන් නිර්දේශිත සියලු බෝග ප්‍රභේද වල මූලික බීජ හා සහතික කළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රධාන වගකීම වේ. වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු, අර්තාපල් වල සහතික කළ බීජ සඳහා වන ජාතික අවශ්‍යතාවයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම හා සැපයීම හා පලතුරු බෝග වල සහතික කළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ තවත් ප්‍රධාන වගකීමක් වේ. මීට අමතරව, සහතික කළ බිත්තර වී වල ආරක්ෂක තොග පවත්වා ගැනීම ද සිදු කරනු ලැබේ.

පෙර කී මූලික බීජ හා සහතික කළ රෝපණ ද්‍රව්‍ය නිපදවීම සඳහා ස්වකීය විෂය පථය යටතට ගැනෙන බීජ ගොවිපළ 27ක්, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය සතුය. එසේ වුවද, දිවයින පුරා විසිරී පවතින ප්‍රාදේශීය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) ඒකක 14ක් මගින් කොන්ත්‍රාත් වගාකරුවන් මාර්ගයෙන් සහතික කළ බීජ වී, වෙනත් ක්ෂේත්‍ර බෝග හා එළවළු බෝග වල සම්මත බීජ නිෂ්පාදනය කරනු ලැබේ. වර්තමානයේදී, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, තම කාර්යයන් ඉටු කරනු ලබන්නේ අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන), අතිරේක අධ්‍යක්ෂ (වී හා වෙනත් ක්ෂේත්‍ර බෝග), අතිරේක අධ්‍යක්ෂ (එළවළු, රෝපණ ද්‍රව්‍ය හා අළෙවි ප්‍රවර්ධන), අතිරේක අධ්‍යක්ෂ (අර්තාපල්), ප්‍රධාන කාර්යාල නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂවරුන්ගේ මඟ පෙන්වීම යටතේ ඉහත සඳහන් ප්‍රාදේශීය මධ්‍යස්ථාන මගිනි.

බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ මෙහෙවර වන්නේ ශ්‍රී ලාංකීක ගොවි ප්‍රජාවට තරඟකාරී මිල ගණන් යටතේ තත්ත්වයෙන් උසස් බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම සහතික කිරීම වේ.

රජයේ ගොවිපළ වලදී මූලික බීජ හා සහතික කළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, බීජ නිෂ්පාදකයන්ට මූලික බීජ සැපයීම, කොන්ත්‍රාත් වගාකරුවන් මගින් සහතික කළ බීජ ගුණනය හා වාණිජ වගාකරුවන්ට සහතික කළ බීජ සැපයීම, රජයේ ගොවිපළ කළමනාකරණය කිරීම, බීජ ව්‍යවසාය සංවර්ධනය හා සමායෝජනය කිරීම, ස්වාරක්ෂක බීජ තොග පවත්වා ගැනීම හා බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයුම සමායෝජනය කිරීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

මේ සියලු ක්‍රියාකාරකම් ඉටු කිරීමට දිවයින පුරා විසිරුණු නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාල 16ක්, බීජ ගොවිපළ 27ක්, විශේෂ ඒකක (එළවළු බීජ මධ්‍යස්ථානය, බෝංචි බීජ මධ්‍යස්ථානය හා බීජ අර්තාපල් ගබඩා) 3ක් සහ විකුණුම් මධ්‍යස්ථාන 30ක් ලෙස ඒකක 77ක් බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වා ගෙන යනු ලබයි.

## අයවැය

**වගු අංක 2.2.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 25,354,617 | 23,540,194 | 93 |
| මූලධන | 51,669,635 | 51,158,678 | 99 |
| **ව්‍යාපෘති** | | | |
| • කඩිනම් බීජ ගොවිපළ සංවර්ධන වැඩසටහන | 120,000,000 | 119,208,608 | 99 |
| • බීජ නිෂ්පාදන හා මිල දී ගැනීමේ වැඩසටහන | 498,020,000 | 494,183,131 | 99 |
| • බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන වැඩසටහන | 100,000,000 | 99,916,010 | 100 |
| • දේශීය බීජ අර්තාපල් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම | 60,000,000 | 59,336,318 | 99 |
| **එකතුව** | **855,044,252** | **847,342,939** | **99** |

## ප්‍රගතිය

### බීජ වී නිෂ්පාදනය හා සැපයුම

#### මූලික බීජ වී නිෂ්පාදනය

සමස්තයක් වශයෙන් ප්‍රභේද 33ක මූලික බීජ වී (අත්තිවාරම් හා ලියාපදිංචි පන්ති වල බීජ වී) රජයේ බීජ ගොවිපළ වල නිෂ්පාදනය කරනු ලැබේ. බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය හා ඒ යටතේ ක්‍රියාත්මක වන පර්යේෂණ මධ්‍යස්ථාන මගින් සපයනු ලබන අභිජනන බීජ යොදා ගනිමින් අත්තිවාරම් බීජ වී නිපදවනු ලැබේ. එලෙස නිපදවන ලද බීජ වී යොදා ගනිමින් ලියාපදිංචි කළ බීජ වී නිපදවනු ලබන අතර පාරිභෝජනයට ගනු ලබන වී නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන සහතික කළ බීජ වී නිපදවනු ලබන්නේ ලියාපදිංචි කළ බීජ වී යොදා ගැනීමෙනි.

සාමාන්‍ය යල කන්නයකදී වගා කරනු ලබන භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 500,000ක් පමණ වන අතර එය සාමාන්‍ය මහ කන්නයකදී හෙක්ටයාර 780,000ක් පමණ වේ. මෙලෙස වාර්ෂිකව හෙක්ටයාර 1,280,000ක පමණ වී වගා කරනු ලැබේ.

මෙම භූමි ප්‍රමාණයේ වගාව සඳහා වාර්ෂිකව බුසල් 6,400,000ක පමණ සහතික කළ බීජ වී අවශ්‍යතාවක් පවතින අතර මෙම සහතික කළ බීජ වී ප්‍රමාණය නිපදවීමට ලියාපංදිචි කළ බීජ වී බුසල් 160,000ක් අවශ්‍ය වේ.

2016/17 මහ කන්නයේ දී ලියාපදිංචි කළ බීජ වී බුසල් 67,145ක් සහ 2017 යල කන්නයේ දී බුසල් 43,962ක් වශයෙන් රජයේ බීජ ගොවිපළ වල නිෂ්පාදනය කරන ලද අතර සමස්ත ලියාපදිංචි කළ බීජ වී නිෂ්පාදනය 111,107ක් විය. මීට අමතරව, කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන වැඩසටහන මගින් ලියාපදිංචි කළ බීජ වී බුසල් 5,992ක් නිෂ්පාදනය කරන ලදී. මෙ ලෙස, 2017 වර්ෂයේ දී සමස්ත ලියාපදිංචි කළ බීජ වී නිෂ්පාදනය බුසල් 117,049ක් විය. ඒ අනුව සමස්ත ජාතික ලියාපදිංචි කළ බීජ වී අවශ්‍යතාවයෙන් 71%කට වඩා වැඩි ප්‍රමාණයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයා ඇති අතර

මෙම ප්‍රමාණය සමස්ත ජාතික ලියාපදිංචි බීජ වී අවශ්‍යතාවයෙන් හිතකර සැපයුමක් ලෙස පුළුල්ව පිළිගත් 25%ක ප්‍රමාණයක් හොඳින් ඉක්මවීමකි.

2017 දී රජයේ බීජ ගොවිපළ දහයක මූලික බිත්තර වී නිෂ්පාදනය 2.2.2 වගුවෙන් විදහා දැක්වෙයි.

**වගු අංක 2.2.2: 2017 දී රජයේ ගොවිපළ වල මූලික බීජ වී නිෂ්පාදනය**

| ගොවිපළ | 2016/17 මහ | | | 2017 යල | | | එකතුව | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | FSP | RSP | CSP | FSP | RSP | CSP | FSP | RSP | CSP | |
| කන්තලේ | 569 | 9401 | 0 | 876 | 8932 | 0 | 1445 | 18333 | 0 | 19778 |
| මල්වත්ත | 383 | 8323 | 0 | 458 | 2532 | 23 | 841 | 10855 | 23 | 11719 |
| පොළොන්නරුව | 1496 | 17532 | 259 | 684 | 6720 | 166 | 2180 | 24252 | 425 | 26857 |
| අම්බලන්තොට | 474 | 3120 | 1042 | 265 | 1766 | 147 | 739 | 4886 | 1189 | 6814 |
| කරදියනාරු | 307 | 4583 | 1531 | 142 | 3729 | 654 | 449 | 8312 | 2185 | 10946 |
| මුරුන්කන් | 0 | 5437 | 394 | 0 | 0 | 0 | 0 | 5437 | 394 | 5831 |
| බටඅත | 175 | 1618 | 327 | 168 | 1165 | 83 | 343 | 2783 | 410 | 3536 |
| අලුත්තරම | 494 | 6506 | 552 | 400 | 7912 | 520 | 894 | 14418 | 1072 | 16384 |
| මහඉලුප්පල්ලම | 765 | 6654 | 268 | 298 | 8957 | 1429 | 1063 | 15611 | 1697 | 18371 |
| පරන්තන් | 179 | 3861 | 521 | 69 | 2249 | 1135 | 248 | 6110 | 1656 | 8014 |
| ඉඟිණිමිටිය | 0 | 110 | 184 | 0 | 0 | 0 | 0 | 110 | 184 | 294 |
| **එකතුව බුසල්** | **4,842** | **67,145** | **5,078** | **3,360** | **43,962** | **4,157** | **8,202** | **111,107** | **9,235** | **128,544** |

FSP - මූලික බීජ වී RSP - ලියාපදිංචි කළ බීජ වී CSP - සහතික කළ බීජ වී

## සහතික කළ බීජ වී නිෂ්පාදනය

රටට අවශ්‍ය සහතික කළ බීජ වී අවශ්‍යතාව, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් නිපදවනු ලබන ලියාපදිංචි කළ බීජ වී යොදා ගනිමින් ප්‍රධාන වශයෙන් පෞද්ගලික ගොවීන් හා වෙනත් පෞද්ගලික ආයතන මගින් නිපදවනු ලබයි.

බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, ස්වාරක්ෂක තොගයක් ලෙස තබා ගැනීමට වාර්ෂිකව රුපියල් මිලියන 90ක් පමණ වැය කරමින් ස්වකීය කොන්ත්‍රාත් බීජ වී නිෂ්පාදන වැඩසටහන මගින් සහතික බීජ වී බුසල් 60,000ක් මිල දී ගනී. 2017 වර්ෂයේ දී, මෙම වැඩසටහන මගින් සහතික බීජ වී බුසල් 48,501ක් මිල දී ගන්නා ලදී.

මීට අමතරව, 2017 වර්ෂයේ දී ඇති වූ හදිසි තත්ව සඳහා සැපයීමට (දකුණු පළාතේ ගංවතුරෙන් හානියට පත් ප්‍රදේශ සඳහා හා උතුරු මැද හා වයඹ පළාත් වල නියඟයෙන් හානියට පත් ප්‍රදේශ සඳහා) වාණිජ හා ප්‍රරෝහණය පරීක්ෂා කරන ලද බීජ වී බුසල් 90,192ක් මිල දී ගන්නා ලදී. 2017 වර්ෂය තුළ තුළ දී ප්‍රාදේශීය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාල විසින්, ලියාපදිංචි කළ, සහතික කළ, වාණිජ හා ප්‍රරෝහණය පරීක්ෂා කළ බීජ වී මිළදී ගැනීම 2.2.3 වගුවේ දැක්වේ.

**වගු අංක 2.2.3: 2017 තුළ දී ප්‍රාදේශීය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාල විසින් සිදු කළ ලියාපදිංචි, සහතික, වාණිජ හා ප්‍රරෝහණය පරීක්ෂා කළ  බීජ වී මිළදී ගැනීම්**

| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපය | 2016/17 මහ | | | | 2017 යල | | | | එකතුව | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | RSP | CSP | Com | GT | RSP | CSP | Com | GT | RSP | CSP | Com | GT | |
| අළුත්තරම | 595 | 3551.5 | 157 | 0 | 0 | 1959 | 0 | 21307 | 595 | 5510.5 | 157 | 21307 | 27569.5 |
| පැල්වෙහෙර | 0 | 1925 | 0 | 0 | 0 | 154 | 100 | 860 | 0 | 2079 | 100 | 860 | 3039 |
| පොළොන්නරුව | 0 | 2216 | 0 | 255 | 0 | 3099 | 648 | 18966 | 0 | 5315 | 648 | 19221 | 25184 |
| මහඉලුප්පල්ලම | 0 | 595 | 1286 | 0 | 0 | 486 | 7140 | 16525 | 0 | 1081 | 8426 | 16525 | 26032 |
| අම්පාර | 0 | 3953 | 8468 | 0 | 0 | 3534 | 0 | 7453 | 0 | 7487 | 8468 | 7453 | 23408 |
| කන්තලේ | 0 | 1971 | 1579 | 0 | 0 | 415 | 853 | 904 | 0 | 2386 | 2432 | 904 | 5722 |
| කිලිනොච්චි | 0 | 4790 | 890 | 0 | 0 | 308 | 240 | 0 | 0 | 5098 | 1130 | 0 | 6228 |
| බටඅත | 0 | 4107 | 0 | 0 | 0 | 4006 | 0 | 0 | 0 | 8113 | 0 | 0 | 8113 |
| කරදියනාරු | 0 | 0 | 0 | 0 | 0 | 594 | 0 | 0 | 0 | 594 | 0 | 0 | 594 |
| නිකවැරටිය | 764 | 7093 | 313 | 0 | 285 | 1380 | 1174 | 784 | 1049 | 8473 | 1487 | 784 | 11793 |
| තෙලිජ්ජවිල | 2927 | 0 | 0 | 0 | 1421 | 380 | 0 | 0 | 4348 | 380 | 0 | 0 | 4728 |
| වවුනියා | 0 | 1646 | 290 | 0 | 0 | 339 | 0 | 0 | 0 | 1985 | 290 | 0 | 2275 |
| **එකතුව** | **4,286** | **31,847.5** | **2,983** | **255** | **1,706** | **16,654** | **10,155** | **66,799** | **5,992** | **48,501.5** | **23,138** | **67,054** | **144,685** |

RSP - ලියාපදිංචි බීජ වී   CSP - සහතික බීජ වී   Com - වාණිජ බීජ වී

GT - ප්‍රරෝහණය පරීක්ෂා කළ බීජ වී

**වගු අංක 2.2.4: 2017 වර්ෂයේ දී බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද බීජ වී නිෂ්පාදන වල සාරාංශය**

| වැඩසටහන | FSP | RSP | CSP | Com | GT | එකතුව |
|---|---|---|---|---|---|---|
| ගොවිපළ වැඩසටහන | 8202 | 111107 | 9235 | 0 | 0 | 128544 |
| කොන්ත්‍රාත් වැඩසටහන | 0 | 5992 | 48501.5 | 0 | 0 | 54493.5 |
| හදිසි බීජ වී මිල දී ගැනීම් | 0 | 0 | 0 | 23138 | 67054 | 90192 |
| **එකතුව** | **8,202** | **117,099** | **577,36.5** | **23,138** | **67,054** | **2,732,29.5** |

FSP - අත්තිවාරම් බීජ වී   RSP - ලියාපදිංචි බීජ වී   CSP - සහතික බීජ වී

Com - වාණිජ බීජ වී   GT- ප්‍රරෝහණය පරීක්ෂා කළ බීජ වී

## බීජ වී නිකුත් කිරීම

පිළිවෙලින් 2017 යල සඳහා බීජ වී බුසල් 95,583 ක ප්‍රමාණයක් ද , 2017/18 මහ කන්නය සඳහා බීජ වී බුසල් 152,587ක ප්‍රමාණයක් ද නිකුත් කරන ලදී. මෙලෙස, 2017 වර්ෂය තුළදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් බුසල් 248,169ක් වූ සමස්ත බීජ වී ප්‍රමාණයක් නිකුත් කරන ලදී. (වගු අංක 2.2.4.)

**වගු අංක 2.2.5: 2017 තුළ දී බීජ වී නිකුත් කිරීම**

| බීජ පංතිය | 2017 යල සඳහා | 2017/18 මහ සඳහා | මුළු එකතුව |
|---|---|---|---|
| අත්තිවාරම් | 406 | 1171 | 1,577 |
| ලියාපදිංචි | 48,525 | 60908 | 109,433 |
| සහතික කළ | 44,451 | 34170 | 78,621 |
| වාණිජ | 1,787 | 9865 | 11,652 |
| ප්‍රරෝහණය පරීක්ෂා කළ | 414 | 46473 | 46,887 |
| **එකතුව (බුසල්)** | **95,582** | **152,587** | **248,169** |

## වෙනත් ක්ෂේත්‍ර බෝග වල බීජ නිෂ්පාදනය හා සැපයීම

2016 - 2018 ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන සඳහා අවශ්‍ය වන බීජ වලින් සැලකිය යුතු ප්‍රමාණයක් සැපයීමේ අරමුණ සහිතව 2017 වර්ෂය සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ වෙනත් ක්ෂේත්‍ර බෝග වල බීජ නිෂ්පාදනය, සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, අවශ්‍ය වන සියළුම අත්තිවාරම් හා ලියාපදිංචි යන කාණ්ඩ වල සියළුම මූලික බීජ නිෂ්පාදනය කොට සැපයීමට ඉලක්ක කරයි. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් බඩ ඉරිඟු හා රට කජු හැර අනෙකුත් බෝග වල සමස්ත ජාතික සහතික බීජ අවශ්‍යතාවෙන් 25%ක පමණ ප්රතිශතයක් සැපයීමට ඉලක්ක කරනු ලැබේ. බඩ ඉරිඟු ප්‍රධාන වශයෙන් ආනයනික දෙමුහුම් බීජ යොදා ගනිමින් වගා කරනු ලබන අතර විවෘතව පරාගිත ප්‍රභේද වල බඩ ඉරිඟු බීජ සඳහා ශ්‍රී ලංකාවේ පවතින ඉල්ලුම සමස්ථ අවශ්‍යතාවෙන් 5% කට වඩා අඩු ප්‍රතිශතයක් ගනී. බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශය විසින් මෙම ප්‍රමාණය සැපයීමට ඉලක්ක කරනු ලැබේ. අඩු ගුණන අනුපාතය (1:10), ඒකක වපසරියන් සඳහා වන වැඩි බීජ අවශ්‍යතාවය ඉහළ බීජ අනුපාතය (හෙක්ටෙයාරයට කිලෝ ග්‍රෑම් 100) සහ බීජ අත්පත් කර ගන්නා විශාල පරිමාව හේතුවෙන් ඉලක්කගත සහතික කළ රට කජු බීජ නිෂ්පාදනය ජාතික අවශ්‍යතාවයෙන් සියයට 15ක් වේ.

ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය හා ඊට අනුබද්ධ ඒකක වලින් සපයනු ලබන අභිජනන බීජ යොදා ගනිමින් අත්තිවාරම්, ලියාපදිංචි, සහතික හා වාණිජ යන කාණ්ඩ හතරට අයත් වෙනත් ක්ෂේත්‍ර බෝග දහයක ප්‍රභේද 36ක් ගුණනය කොට නිෂ්පාදනය කරන ලදී. එසේ වුවද, බීජ ඉල්ලුමට සාපේක්ෂව සහතික හෝ වාණිජ බීජ ප්‍රමාණයවත් නොවීම හේතුවෙන් පවතින විකල්ප වලින් සංසන්දනාත්මකව වඩා හොඳ බීජ සපයනු පිණිස ප්‍රරෝහණය පරීක්ෂා කළ බීජ ද මිල දී ගෙන සපයන ලදී. ඒවා ප්‍රරෝහණය පරීක්ෂා කළ බීජ ලෙස නම්

කළ ද, එම බීජ මිල දී ගැනීමේදී සැලකිය යුතු සියළු වැදගත් ගුණාත්මක පරාමිතීන් පරීක්ෂාවට ලක් කරන ලදී.

## 2017 වර්ෂයේ වෙනත් ක්ෂේත්‍ර බෝග වල මූලික බීජ (අත්තිවාරම් හා ලියාපදිංචි) නිෂ්පාදනය

අත්තිවාරම් බීජ නිෂ්පාදනය රජයේ බීජ ගොවිපළ වල පමණක් සිදු කෙරෙන අතර ලියාපදිංචි බීජ නිෂ්පාදනය රජයේ බීජ ගොවිපළ වල මෙන්ම කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන ක්‍රමය යටතේ ද සිදු කෙරේ.

2017 වර්ෂයේදී අත්තිවාරම් බීජ කිලෝ ග්‍රෑම් 22,309ක් හා ලියාපදිංචි බීජ කිලෝ ග්‍රෑම් 164,357ක් මෙම ක්‍රම දෙක යටතේ නිෂ්පාදනය කරන ලදී. පූර්ව වර්ෂයේ නිෂ්පාදනය හා සැසඳීමේදී 2017 වර්ෂයේ දී වෙනත් ක්ෂේත්‍ර බෝග වල අත්තිවාරම් හා ලියාපදිංචි බීජ නිෂ්පාදනය 2016 වර්ෂයේ දී නිෂ්පාදනය කළ ප්‍රමාණයට බොහෝ දුරට සමාන වේ.

## රජයේ බීජ ගොවිපළ වල වෙනත් ක්ෂේත්‍ර බෝග වල බීජ නිෂ්පාදනය

රජයේ බීජ ගොවිපල වල වෙනත් ක්ෂේත්‍ර බෝග කාණ්ඩයට අයත් බෝග වල අත්තිවාරම් හා ලියාපදිංචි පන්තිවල බීජ නිෂ්පාදනය සිදු කෙරේ. එම බීජ නිෂ්පාදන ක්‍රියාවලියෙහිදී බීජ තොග වල ශ්‍රේණිය පහත් වීමෙහි ප්‍රතිඵලයක් ලෙස සහතික හා වෙළඳ බීජ ලැබීම සිදු වේ. වගු අංක 2.2.6 මගින් එක් එක් රජයේ බීජ ගොවිපළෙන් වෙනත් ක්ෂේත්‍ර බෝගවල මූලික බීජ නිෂ්පාදනයට සිදු කෙරුණු දායකත්වය ද, වගු අංක 2.2.7 මගින් රජයේ බීජ ගොවිපළ වලින් සිදු කෙරුණු වෙනත් ක්ෂේත්‍ර බෝගවල බීජ නිෂ්පාදනය ප්‍රභේද හා පන්ති අනුව ද විදහා දැක්වෙයි.

**වගු අංක 2.2.6: 2017 වර්ෂය තුළදී රජයේ බීජ ගොවිපළවල වෙනත් ක්ෂේත්‍ර බෝගවල මූලික බීජ නිෂ්පාදනය (අත්තිවාරම් සහ ලියාපදිංචි) (කිලෝ ග්‍රෑම්)**

| **ගොවිපළ** | උඳු | මුං | කව්පි | රටකජු | බඩඉරිඟු | බඩඉරිඟු (Hy) | තල | කුරක්කන් | මිරිස් (OPV) | මිරිස් (Hy) | සෝයා බෝංචි | ලොකු ළූණු (බීජ) | අඩනහිරියා | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මහ ඉලුප්පල්ලම | 211.5 | 482.3 | 731 | 0 | 3341.53 | 1171 | 126 | 841.1 | 34.5 | 68.4 | 2063.5 | 73.9 | 0 | **9144.73** |
| බටඅත | 991 | 630 | 3204 | 742 | 9407 | 1477 | 464 | 6441 | 58.7 | 0 | 2338 | 18.1 | 0 | **25770.8** |
| අළුත්තරම | 0 | 1036 | 1331 | 0 | 3182.4 | 0 | 186 | 0 | 105.9 | 0 | 0 | 0 | 0 | **5841.3** |
| පොළොන්නරුව | 163 | 644 | 351.5 | 0 | 548.8 | 0 | 49 | 2229 | 39 | 0 | 985 | 15.2 | 0 | **5024.5** |
| කුණ්ඩසාලේ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 14.5 | 0 | 0 | 22.8 | 0 | **37.3** |
| පරන්තන් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 360 | 0 | 0 | 0 | 0 | 0 | **360** |
| මුරුන්කන් | 430 | 0 | 532 | 2120 | 190 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **3272** |
| පැල්වැහැර | 0 | 0 | 29.5 | 80 | 0 | 0 | 0 | 0 | 0 | 19.2 | 0 | 0 | 0 | **128.7** |
| මිද්දෙනිය | 0 | 208 | 630 | 12 | 0 | 0 | 849.5 | 103 | 0 | 0 | 0 | 16.4 | 0 | **1818.9** |
| මල්වත්ත | 0 | 0 | 1393 | 1220 | 0 | 0 | 30.3 | 426 | 35 | 0 | 0 | 0 | 0 | **3104.3** |
| කන්තලේ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | |
| ඉඟිණිමිටිය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | |
| එළුවන්කුලම | 0 | 0 | 0 | 893 | 0 | 0 | 116.5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **1009.5** |
| කරදියනාරු | 91.5 | 115 | 279 | 1120 | 1080 | 13 | 0 | 0 | 22 | 0 | 0 | 0 | 0 | **2720.5** |
| **එකතුව** | **1887** | **3115.3** | **8481** | **6187** | **17749.7** | **2661** | **1821.3** | **10400.1** | **309.6** | **87.6** | **5386.5** | **146.4** | **0** | **58232.53** |
| **වෙනත් පංති වලින් නිෂ්පාදනය කළ බීජ** | 0 | 0 | 490 | 202 | 9231 | 0 | 15 | 27 | 0 | 0 | 0 | 0 | 1826 | 11791 |
| **මුළු එකතුව** | **1887** | **3115.3** | **8971** | **6389** | **26980.7** | **2661** | **1836.3** | **10427.1** | **309.6** | **87.6** | **5386.5** | **146.4** | **1826** | **70023.53** |

**වගු අංක 2.2.7 : 2017 වර්ෂය තුළදී රජයේ බීජ ගොවිපළවල වෙනත් ක්ෂේත්‍ර බෝගවල මූලික බීජ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්) (බීජ නිෂ්පාදනය ප්‍රභේද හා පන්ති අනුව)**

| බෝගය | ප්‍රභේදය | 2016/17 මහ | | | | 2017 යල | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Found | Reg | Cert | Com | Found | Reg | Cert | Com | Year Total |
| උඳු | MI 1 | 346.5 | 1205.5 | 0 | 0 | 205 | 0 | 0 | 0 | **1757** |
| | අනුරාධ | 0 | 0 | 0 | 0 | 0 | 130 | 0 | 0 | **130** |
| මුං ඇට | MI 5 | 208 | 115 | 0 | 0 | 271 | 0 | 0 | 0 | **594** |
| | MI 6 | 445 | 550.8 | 0 | 0 | 1416 | 109.5 | 0 | 0 | **2521.3** |
| කව්පි | බොම්බෙ | 0 | 279 | 0 | 0 | 29.5 | 0 | 0 | 0 | **308.5** |
| | වරුණි | 456 | 2773.5 | 0 | 0 | 1260 | 1267 | 0 | 0 | **5756** |
| | ධවල | 0 | 286 | 0 | 0 | 553.5 | 98.5 | 0 | 0 | **938** |
| | ANKCP 1 | 344 | 0 | 0 | 0 | 5.5 | 0 | 0 | 0 | **349.5** |
| | MICP 1 | 106 | 547 | 0 | 490 | 0 | 476 | 0 | 0 | **1619** |
| සෝයා බෝංචි | PB 1 | 953 | 2002 | 0 | 0 | 523.5 | 587 | 0 | 0 | **4065.5** |
| | MISB 1 | 0 | 1321 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **1321** |
| බඩඉරිඟු | රුවන් | 0 | 0 | 0 | 0 | 0 | 652.4 | 0 | 0 | **652.4** |
| | භද්‍රා | 1588 | 13471.7 | 0 | 9231 | 1355 | 682 | 0 | 0 | **26327.9** |
| | MIHY 1 | 0 | 1477 | 1081.4 | 0 | 103 | 0 | 0 | 0 | **2661.43** |
| රටකජු | තිස්ස | 3799 | 188.5 | 0 | 0 | 1280 | 0 | 0 | 202 | **5469.5** |
| | ඉන්දි | 0 | 86 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **86** |
| | අඟුණ ජම්බෝ | 0 | 0 | 0 | 0 | 742 | 0 | 0 | 0 | **742** |
| | ANKG 1 | 12 | 80 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **92** |
| තල | උමා | 249 | 1114.3 | 86 | 0 | 0 | 332 | 0 | 15 | **1796.3** |
| | මාලී | 29.5 | 0 | 0 | 0 | 10.5 | 0 | 0 | 0 | **40** |
| කුරක්කන් | රවි | 0 | 618.6 | 0 | 27 | 0 | 0 | 360 | 0 | **1005.6** |
| | රාවණ | 0 | 1715 | 0 | 0 | 529 | 0 | 0 | 0 | **2244** |
| | ඕෂධ | 1549 | 4679 | 0 | 0 | 268 | 681.5 | 0 | 0 | **7177.5** |
| මිරිස් බීජ | MI 2 | 35 | 0 | 0 | 0 | 22 | 0 | 0 | 0 | **57** |
| | KA 2 | 144.9 | 0 | 0 | 0 | 14.5 | 0 | 0 | 0 | **159.4** |
| | MICH 3 | 49 | 0 | 0 | 0 | 44.2 | 0 | 0 | 0 | **93.2** |
| | MICH HY 1 | 0 | 0 | 68.4 | 0 | 0 | 0 | 19.2 | 0 | **87.6** |
| අඹනහිරියා | | 0 | 0 | 0 | 132 | 0 | 0 | 0 | 1694 | **1826** |
| ලොකු ළූණු බල්බ | MIBO 1 | 96.7 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **96.7** |
| | දඹුල්ල රතු | 49.7 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **49.7** |
| **එකතුව** | | **10460** | **32509.9** | **1235.8** | **9880** | **8632** | **5016** | **379.2** | **1911** | **70024.03** |

**Found.** - අත්තිවාරම් **Reg.** - ලියාපදිංචි කළ **Cert.** - සහතික කළ **Com.** - වාණිජ

## වෙනත් ක්ෂේත්‍ර බෝගවල කොන්ත්‍රාත් බීජ නිෂ්පාදනය

කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන ක්‍රමය මගින් ලියාපදිංචි බීජ අවශ්‍යතාවෙන් කොටසක් හා ඉලක්කගත සහතික බීජ ප්‍රමාණය නිපදවනු ලැබේ. වඩා උසස් පන්ති වල බීජ නිෂ්පාදන ක්‍රියාදාමයේදී බීජ පන්තිය පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස, වාණිජ බීජ කුඩා ප්‍රමාණයක් ද ලැබේ. කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන ක්‍රමය යටතේ වෙනත් ක්ෂේත්‍ර බෝගවල බීජ නිෂ්පාදනය 2.2.8 හා 2.2.9 වගු වල දැක්වේ.

**වගු අංක 2.2.8 : 2017 තුළදී කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන ක්‍රමය මගින් නිෂ්පාදනය කරන ලද වෙනත් ක්ෂේත්‍ර බෝගවල බීජ ප්‍රමාණ සහ ප්‍රාදේශීය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාල මගින් ප්‍රරෝහණය පරීක්ෂා කළ බීජ ලෙස මිල දී ගත් බීජ ප්‍රමාණ (කිලෝ ග්‍රෑම්) - නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ බල ප්‍රදේශ මට්ටමින්.**

| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | මිල දී ගත් බීජ ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | උඳු | මුං | කව්පි | රටකජු | බඩ ඉරිඟු | තල | කුරක්කන් | මිරිස් | සෝයා බෝංචි | ලොකු ළූණු | |
| මහඉලුප්පල්ලම | 10100.9 | 159 | 946.5 | 606 | 0 | 4798 | 0 | 28.75 | 214484.5 | 0 | 231,123.7 |
| පැල්වැහැර | 10811 | 10705 | 8675 | 9673.5 | 2123.8 | 1263.5 | 7316.05 | 1493 | 33415 | 0 | 85,475.9 |
| අළුත්තරම | 6440.5 | 78111 | 12171 | 22938.5 | 6482 | 245 | 3810.5 | 0 | 0 | 0 | 130,198.5 |
| නිකවැරටිය | 80406 | 39292.5 | 3534.5 | 70331 | 22315.3 | 4857 | 50 | 216 | 0 | 0 | 221,002.3 |
| බටඅත | 0 | 86658 | 709.5 | 3526 | 0 | 1000 | 0 | 0 | 0 | 49 | 91,942.5 |
| වවුනියා | 34846 | 0 | 576 | 39865 | 3319.9 | 0 | 0 | 130.5 | 0 | 0 | 78,737.4 |
| අම්පාර | 0 | 589 | 7887.5 | 3100.5 | 4928.35 | 0 | 0 | 0 | 0 | 0 | 16,505.4 |
| කිලිනොච්චි | 2343 | 0 | 253 | 17165 | 385 | 0 | 2488 | 0 | 0 | 0 | 22,634.0 |
| පොළොන්නරුව | 14327 | 430.5 | 0 | 4404 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 19,161.5 |
| කරදියනාරු | 0 | 0 | 598.5 | 26700 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 27,298.5 |
| කන්තලේ | 112 | 0 | 0 | 45 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 157.0 |
| **එකතුව** | **159,386.4** | **215,945** | **35,351.5** | **198,354.5** | **39,554.35** | **12,163.5** | **13,664.55** | **1,868.25** | **247,899.5** | **49** | **924,236.55** |

**වගු අංක 2.2.9: 2017 වසර තුළදී කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන ක්‍රමය මගින් නිෂ්පාදනය කරන ලද වෙනත් ක්ෂේත්‍ර බෝගවල බීජ ප්‍රමාණ සහ ප්‍රාදේශීය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාල මගින් ප්‍රරෝහණය පරීක්ෂා කළ බීජ ලෙස මිල දී ගත් බීජ ප්‍රමාණ (කිලෝ ග්‍රෑම්) - බීජ පන්ති අනුව**

| බෝගය | ප්‍රභේදය | 2016/17 මහ | | | | | 2017 යල | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Found. | Reg. | Cert. | Com. | GT | Reg. | Cert. | Com. | GT | |
| උඳු | MI 1 | 0 | 14004 | 15009.5 | 15983.5 | 44131 | 1424.5 | 31273 | 6058.7 | 20402 | 148285.7 |
| | අනුරාධ | 0 | 2429 | 634.5 | 1636.5 | 0 | 3052.5 | 2601.5 | 746.7 | 0 | 11100.7 |
| මුං | MI 5 | 0 | 0 | 0 | 0 | 0 | 1357 | 0 | 0 | 0 | 1357 |
| | MI 6 | 0 | 2149.5 | 12796.5 | 552.5 | 756 | 31731.5 | 83314.5 | 11002.5 | 72285 | 214588 |
| කව්පි | බොම්බේ | 0 | 43 | 70 | 58 | 0 | 0 | 0 | 0 | 0 | 171 |
| | වරුණි | 0 | 494 | 1409.5 | 0 | 0 | 4425.5 | 12316 | 488.5 | 0 | 19133.5 |
| | ධවල | 0 | 808 | 2607.5 | 56 | 287 | 782 | 7306 | 1154 | 0 | 13000.5 |
| | ANKCP 1 | 0 | 385 | 324.5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 709.5 |
| | MICP 1 | 0 | 0 | 87 | 0 | 0 | 0 | 1778 | 472 | 0 | 2337 |
| සෝයා බෝංචි | PB 1 | 0 | 8495 | 137775 | 7355.5 | 0 | 9760 | 84514 | 0 | 0 | 247899.5 |
| බඩඉරිඟු | රුවන් | 0 | 1037.4 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1037.4 |
| | භද්‍රා | 0 | 12471.9 | 11579.75 | 0 | 0 | 463.4 | 2513.7 | 0 | 0 | 27028.75 |
| | MIHY 1 | 3319.9 | 385 | 0 | 0 | 0 | 0 | 7783.3 | 0 | 0 | 11488.2 |
| රටකජු | තිස්ස | 0 | 10454 | 82534.5 | 5380.5 | 21938 | 15237 | 31013 | 22664.5 | 7962 | 197183.5 |
| | ඉන්දි | 0 | 384.5 | 0 | 0 | 0 | 0 | 432 | 0 | 0 | 816.5 |
| | ටිකිරි | 0 | 354.5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 354.5 |
| තල | උමා | 0 | 78 | 1253.5 | 0 | 409 | 2359 | 2194.5 | 4816.5 | 1053 | 12163.5 |
| කුරක්කන් | රවි | 0 | 50 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 50 |
| | රාවණ | 0 | 0 | 0 | 0 | 0 | 1768 | 720 | 0 | 0 | 2488 |
| | ඕෂධ | 0 | 0 | 2137.5 | 0 | 0 | 1925 | 6929 | 135 | 0 | 11126.5 |
| මිරිස් බීජ | MI 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 593.028 | 0 | 0 | 593.028 |
| | KA 2 | 0 | 0 | 0 | 130.5 | 0 | 0 | 216 | 0 | 0 | 346.5 |
| | ගල්කිරියාගම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 520.579 | 0 | 0 | 520.5786 |
| | MICH 3 | 0 | 0 | 28.755 | 0 | 0 | 0 | 379.446 | 0 | 0 | 408.201 |
| ලොකු ළූණු බල්බ | **දඹුල්ල වරණය** | 0 | 0 | 0 | 49 | 0 | 0 | 0 | 0 | 0 | 49 |
| **එකතුව** | | **3319.9** | **54022.8** | **268248** | **31202** | **67521** | **74285.4** | **276398** | **47538.4** | **101702** | **924236.56** |

**Found.** - අත්තිවාරම් **Reg.** - ලියාපදිංචි කළ **Cert.** - සහතික කළ **Com.** - වාණිජ **GT.** - ප්‍රරෝහණය පරීක්ෂා කළ

**වගු අංක 2.2.10 : 2017 වර්ෂය තුළදී  වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදන වල මුළු එකතුව.**

| බෝගය | ප්‍රභේදය | Found. | Reg. | Cert. | Com. | GT. | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| උඳු | MI 1 | 551.5 | 16634 | 46282.5 | 22042.2 | 64532.5 | 150042.7 |
| | අනුරාධ | 0 | 5611.5 | 3236 | 2383.2 | 0 | 11230.7 |
| මුං | MI 5 | 479 | 1472 | 0 | 0 | 0 | 1951 |
| | MI 6 | 1861 | 34541.3 | 96111 | 11555 | 73041 | 217109.3 |
| කව්පි | බොම්බේ | 29.5 | 322 | 70 | 58 | 0 | 479.5 |
| | වරුණී | 1715.5 | 8960 | 13725.5 | 488.5 | 0 | 24889.5 |
| | ධවල | 553.5 | 1974.5 | 9913.5 | 1210 | 287 | 13938.5 |
| | ANKCP 1 | 349.5 | 385 | 324.5 | 0 | 0 | 1059 |
| | MICP 1 | 106 | 1023 | 1865 | 962 | 0 | 3956 |
| සෝයා බෝංචි | PB 1 | 1476.5 | 20844 | 222289 | 7355.5 | 0 | 251965 |
| | MISB 1 | 0 | 1321 | 0 | 0 | 0 | 1321 |
| බඩඉරිඟු | රුවන් | 0 | 1689.8 | 0 | 0 | 0 | 1689.8 |
| | භද්‍රා | 2943.2 | 27089 | 14093.45 | 9231 | 0 | 53356.65 |
| | MIHY 1 | 0 | 0 | 14149.63 | 0 | 0 | 14149.63 |
| රටකජු | තිස්ස | 5079 | 25879.5 | 113547.5 | 28247 | 29900 | 202653 |
| | ඉන්දි | 0 | 470.5 | 432 | 0 | 0 | 902.5 |
| | ටිකිරි | 0 | 354.5 | 0 | 0 | 0 | 354.5 |
| | අඟුණ ජම්බෝ | 742 | 0 | 0 | 0 | 0 | 742 |
| | ANKG 1 | 12 | 80 | 0 | 0 | 0 | 92 |
| තල | උමා | 249 | 3883.3 | 3534 | 4831.5 | 1462 | 13959.8 |
| | මාලි | 40 | 0 | 0 | 0 | 0 | 40 |
| කුරක්කන් | රවි | 0 | 668.6 | 360 | 27 | 0 | 1055.6 |
| | රාවණ | 529 | 3483 | 720 | 0 | 0 | 4732 |
| | ඔෂධ | 1817 | 7285.5 | 9066.5 | 135 | 0 | 18304 |
| මිරිස් බීජ | MI 2 | 57 | 0 | 593.028 | 0 | 0 | 650.028 |
| | KA 2 | 159.4 | 0 | 216 | 130.5 | 0 | 505.9 |
| | ගල්කිරියාගම | 0 | 0 | 520.5786 | 0 | 0 | 520.5786 |
| | MICH 3 | 93.2 | 0 | 408.201 | 0 | 0 | 501.401 |
| | MICH HY 1 | 0 | 0 | 87.6 | 0 | 0 | 87.6 |
| ලොකු ළූණු සත්‍ය බීජ | MIBO 1 | 96.7 | 0 | 0 | 0 | 0 | 96.7 |
| | දඹුල්ල වරණය | 49.7 | 0 | 0 | 49 | 0 | 98.7 |
| අඩනහිරියා | | 0 | 0 | 0 | 1826 | 0 | 1826 |
| **එකතුව** | | **22309.1** | **164357** | **547840.6** | **90531.4** | **169222.5** | **994260.6** |

**Found.** - අත්තිවාරම් **Reg.** - ලියාපදිංචි කළ **Cert.** - සහතික කළ

**Com.** - වාණිජ **GT.** - ප්‍රරෝහණය පරීක්ෂා කළ

වගු අංක 2.2.11 : 2017 වර්ෂය තුළදී වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනයේ ඉලක්ක සපුරා ගැනීම්.

| බෝගය | 2017 වර්ෂය සඳහා වාර්ෂික ජාතික බීජ අවශ්‍යතාව (කි. ග්‍රෑ) (NFFP 16-18 අනුව ) | බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය වෙතින් සැපයීමට ඉලක්කකල ප්‍රතිශතය | 2017 දී නිෂ්පාදනය කරන ලද බීජ ප්‍රමාණය (කි. ග්‍රෑ) | නිෂ්පාදනය කරන ලද බීජ ප්‍රමාණය ජාතික බීජ අවශ්‍යතා වේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| උඳු | 356,480 | 25 | 161,273.00 | 45 |
| කුරක්කන් | 61,745 | 25 | 24,091.00 | 39 |
| මුං | 691,478 | 25 | 219,060.00 | 32 |
| සෝයා බෝං චි | 1,074,575 | 25 | 253,286.00 | 25 |
| මිරිස් | 18,081 | 25 | 2,265.00 | 13 |
| කව්පි | 399,960 | 25 | 44,322.00 | 12 |
| රටකජු | 1,869,300 | 15 | 204,744.00 | 11 |
| තල | 211,640 | 25 | 13,999.00 | 07 |
| බඩඉරිඟු | 2,226,148 | 05 | 69,196.00 | 03 |

උඳු, කුරක්කන්, මුං හා සෝයා බෝංචි වල බීජ නිෂ්පාදන ඉලක්ක සියයට සියය ඉක්මවා අත් පත් කර ගෙන ඇති අතර මිරිස්, කව්පි, බඩ ඉරිඟු හා රටකජු බීජ වල නිෂ්පාදන ඉලක්ක සියයට 50% ඉක්මවා අත්පත් කර ගෙන ඇත. එසේ වුවද රටෙහි විසිරි පවතින අධික දෙමුහුම් බඩඉරිඟු වගාවන් හේතුවෙන්, බෝග හුදෙකලා කිරීමේ පරතර පවත්වා ගැනීමට අපහසු වීම විවෘත පරාගිත බඩඉරිඟු බීජ නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට අපහසුවීමට ප්‍රධාන හේතුවක් විය. අහිතකර කාලගුණ තත්ව වල දැඩි බලපෑමට ලක්වූ බැවින් තල වගා වලින් අඩු අස්වනු ලැබුණි. (නිෂ්පාදන ඉලක්ක වලින් ~ 25%ක්)

දෙමුහුම් වෙනත් ක්ෂේත්‍ර බෝග වල බීජ නිෂ්පාදනය වැඩි විය. පළමු වතාවට දෙමුහුම් මිරිස් බීජ කිලෝ ග්‍රෑම් 87ක් නිෂ්පාදනය කරන ලදී. 2016 වර්ෂයේ දෙමුහුම් බඩ ඉරිඟු බීජ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් 1,962) ට වඩා වැඩි ප්‍රමාණයක් වන කිලෝ ග්‍රෑම් 14,149ක් මෙම වර්ෂයේ දී නිෂ්පාදනය කරන ලදී.

නිරන්තර වියළි කාලගුණ තත්ව හා අකල් වැසි පැවතිය ද, සමස්ත වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය සළකා බැලීමේ දී 2017 වර්ෂයේ මුළු වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් 994,260) 2016 වර්ෂයේ මුළු වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් 1,117,999) ට වඩා මඳ වශයෙන් අඩු විය. 2016 හා

2017 වසර දෙකෙහි සමස්ත බීජ නිෂ්පාදනයන් ආසන්න වශයෙන් සමාන වුවද 2016 වසරට වඩා අඩු, පැලවීම පරීක්ෂාකල බීජ ප්‍රමාණයක් 2017 වසරේදී මිලදී ගෙන තිබීම විශේෂත්වයකි. එනම් 2017 වසරේ වැඩි බීජ ප්‍රතිශතයක් සපයා ගෙන ඇත්තේ පිළිගත් පන්තිවලට අයත් බීජ මගිනි.

## 2017 වර්ෂය තුළදී වෙනත් ක්ෂේත්‍ර බෝග වල බීජ නිකුත් කිරීම්

2017 යල හා 2017/18 මහ කන්න සඳහා ක්ෂේත්‍ර බෝග බීජ නිකුත් කිරීම 2.2.12 වගුවේ දැක්වේ. 2017 යල සඳහා සමස්ත වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිකුත් කිරීම මෙට්‍රික් ටොන් 490ක් වූ අතර 2017/18 මහ කන්නය සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ මෙට්‍රික් ටොන් 336ක් නිකුත් කරන ලදී. එබැවින්, 2017 වර්ෂය තුළදී නිකුත් කරන ලද වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 826කි. මෙම ප්‍රමාණය, 2016 වර්ෂය තුළදී නිකුත් කරන ලද වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ ප්‍රමාණයට (මෙට්‍රික් ටොන් 683) කැපී පෙනෙන ලෙස වැඩිවීම විශේෂත්වයකි.

## වගු අංක 2.2.12 : 2017 වර්ෂය තුළදී ක්ෂේත්‍ර බෝග බීජ නිකුත් කිරීම (කිලෝග්‍රෑම්)

| බෝගය | 2017 යල | | | | | | 2017/18 මහ | | | | | | 2017 වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Found. | Reg. | Cert. | Com. | GT | Total | Found. | Reg. | Cert. | Com. | GT | Total | Found. | Reg. | Cert. | Com. | GT | Total |
| උඳු | 914 | 3,503 | 8,998 | 8728.92 | 6301.5 | 28,445 | 421 | 9,349 | 11,294 | 2,517 | 30,430 | 54,011 | 1,335 | 12,852 | 20,292 | 11,246 | 36,732 | 82,456 |
| මුං | 687.5 | 1,883 | 40,797 | 16,513 | 7285.3 | 67,166 | 535.1 | 5,477 | 23,403 | 6,357 | 10,440 | 46,212 | 1,223 | 7,360 | 64,200 | 22,870 | 17,725 | 113,378 |
| කව්පි | 415 | 5,489 | 8,570 | 535 | 394.75 | 15,404 | 755.5 | 12,810 | 10,578 | 2,339 | 0 | 26,482 | 1,171 | 18,299 | 19,149 | 2,873 | 395 | 41,887 |
| සෝයා | 798 | 10636 | 48,948 | 38,929 | 157841 | 257,151 | 50 | 5,835 | 21,004 | 3,320 | 13,230 | 43,439 | 848 | 16,471 | 69,952 | 42,249 | 171,071 | 300,590 |
| බඩඉරිඟු (OPV) | 413 | 3,086 | 2494.75 | 0 | 0 | 5,993 | 285.7 | 10,050 | 9,968 | 370 | 0 | 20,674 | 699 | 13,136 | 12,463 | 370 | 0 | 26,667 |
| දෙ මුහුම් බඩඉරිඟු | 387 | 986 | 3843.5 | 1860.45 | 0 | 7,077 | 2 | 510.75 | 11184 | 551.25 | 0 | 12,248 | 389 | 1,497 | 15,027 | 2,412 | 0 | 19,325 |
| රටකජු | 3,716 | 17,425 | 49,493 | 8,456 | 15,448 | 94,537 | 1,712 | 13,227 | 50,568 | 34,422 | 19,730 | 119,659 | 5,428 | 30,652 | 100,061 | 42,878 | 35,178 | 214,197 |
| තල | 282.1 | 909.95 | 1,428 | 202.75 | 5176 | 7,999 | 56.05 | 408.4 | 1082.4 | 980 | 25 | 2,551 | 338 | 1,318 | 2,510 | 1,182 | 5,201 | 10,550 |
| කුරක්කන් | 134.8 | 1328.3 | 3298.92 | 202.75 | 0 | 4,965 | 54 | 7,532 | 2,909 | 0 | 0 | 10,495 | 189 | 8,860 | 6,208 | 203 | 0 | 15,460 |
| මිරිස් බීජ | 123.84 | 52.75 | 554 | 0 | 0 | 731 | 23.875 | 167.32 | 710.53 | 60.46 | 0 | 962 | 148 | 220 | 1,265 | 60 | 0 | 1,693 |
| අඬනහිරියා | 0 | 0 | 0 | 582 | 0 | 582 | 0 | 0 | 0 | 172 | 0 | 172 | 0 | 0 | 0 | 754 | 0 | 754 |
| ලොකු ළූණු බල්බ | 0 | 0 | 5 | 2 | 0 | 7 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 5 | 2 | 0 | 7 |
| **එකතුව** | **7,870** | **45,298** | **168,431** | **76,012** | **192,447** | **490,058** | **3,895** | **65,367** | **142,701** | **51,088** | **73,855** | **336,906** | **11,765** | **110,665** | **311,132** | **127,100** | **266,301** | **826,963** |

Found - අත්තිවාරම් බීජ   Reg. - ලියාපදිංචි කළ බීජ   Cert - සහතික කළ බීජ   Com. - වාණිජ බීජ   GT - ප්‍රරෝහණය පරීක්ෂා කළ බීජ

## එළවළු බීජ නිෂ්පාදනය හා සැපයීම

දිවයිනේ වගා කරනු ලබන එළවළු බෝග වර්ග 19ක (දෙමුහුම් ප්‍රභේද 10ක් ඇතුළුව) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත එළවළු ප්‍රභේද 67ක් තිබේ.

## මූලික බීජ නිෂ්පාදනය

මූලික බීජ නිෂ්පාදනය රජයේ බීජ ගොවිපළ 8ක සිදු කරන ලදී. (2.2.13 වගුව) 2017 වසරේ නිපදවන ලද සමස්ත බීජ ප්‍රමාණය 2016 දී නිපදවන ලද සමස්ත බීජ ප්‍රමාණය (කිලෝ ග්‍රෑම් 1,961) මෙන් දෙගුණයක් තරම් විය.

**වගු අංක 2.2.13: 2017 දී රජයේ ගොවිපළවල එළවළු මූලික බීජ නිෂ්පාදනය**

| බෝගය | නිපදවන ලද ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | | |
|---|---|---|---|
| | 2016/17 මහ | 2017 යල | එකතුව |
| තම්පලා | 331.4 | 299.9 | **631.3** |
| බෝංචි | 1279.3 | 237.3 | **1516.6** |
| කරවිල | 3.4 | 20.1 | **23.5** |
| බටු | 37.4 | 0 | **37.4** |
| බුෂිටාවෝ | 129.4 | 159.7 | **289.1** |
| පිපිඤ්ඤා | 8.3 | 0 | **8.3** |
| වැටකොළු | 2.7 | 0 | **2.7** |
| මෑ | 253.5 | 0 | **253.5** |
| බණ්ඩක්කා | 0 | 720.0 | **720.0** |
| වට්ටක්කා | 0 | 28.0 | **28.0** |
| පතෝල | 70.3 | 212.3 | **282.6** |
| කොමඩු | 99.2 | 0 | **99.2** |
| තිබ්බටු | 210.7 | 0 | **210.7** |
| තක්කාලි | 32.7 | 2.6 | **35.3** |
| **එකතුව** | **2458.3** | **1679.9** | **4138.2** |

## සම්මත එළවළු බීජ නිෂ්පාදනය

රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ ආයතන ද සම්මත බීජ නිෂ්පාදනයේ නියැලී සිටී. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය මගින් සිදුකරන කොන්ත්‍රාත් වැඩසටහන යටතේ සම්මත බීජ පමණක් නිපදවනු ලැබේ. රජයේ බීජ නිෂ්පාද ගොවිපළ 14 හි සහ බීජ නිෂ්පාදන කලාප 5ක (අළුත්තරම, කුණ්ඩසාලේ, නිකවැරටිය, මහඉලුප්පල්ලම හා වවුනියා) කොන්ත්‍රාත් වැඩසටහන යටතේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් නිපදවන ලද සම්මත එළවළු බීජ ප්‍රමාණය 2.2.14 වගුවේ දැක්වේ. 2017 වර්ෂයේ සමස්ත නිෂ්පාදනය පෙර වර්ෂයේ නිෂ්පාදනයට (කිලෝ ග්‍රෑම් 10,653.5) සම්පූර්ණයෙන්ම වාගේ සමාන විය. සමහර බෝග වර්ග වල අතිරේක තොග පැවතීම, සාමාන්‍ය ඉල්ලුම සහ කල් පසු වීම නිසා බීජ නරක් වීමෙන් වූ හානි හේතුවෙන් නිෂ්පාදනය සීමිත විය.

**වගු අංක 2.2.14 : බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් 2017 දී සම්මත එළවළු බීජ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)**

| බෝගය | ගොවිපළ වැඩසටහන | | | කොන්ත්‍රාත් වැඩසටහන | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 2016/17 මහ | 2017 යල | එකතුව | 2016/17 මහ | 2017 යල | එකතුව | |
| තම්පලා | 0 | 178.2 | 178.2 | 0 | 0 | 0 | 178.2 |
| බෝංචි | 249.9 | 302.2 | 552.1 | 3010.5 | 0 | 3010.5 | 3562.6 |
| කරවිල | 230.5 | 0 | 230.5 | 14.7 | 26.47 | 41.17 | 271.67 |
| බටු | 164 | 51.2 | 215.2 | 2.5 | 0 | 2.5 | 217.7 |
| බුෂිටාවෝ | 20 | 0 | 20 | 0 | 0 | 0 | 20 |
| මාළුමිරිස් | 246.5 | 358.15 | 604.65 | 2 | 0 | 2 | 606.65 |
| පිපිඤ්ඤා | 0 | 0 | 0 | 31.7 | 72 | 103.7 | 103.7 |
| වට්ටක්කා | 89.4 | 0.6 | 90 | 0 | 0 | 0 | 90 |
| වැටකොළු | 0 | 39.3 | 39.3 | 73 | 0 | 73 | 112.3 |
| මෑ | 548.6 | 146.4 | 695 | 0 | 187.6 | 187.6 | 882.6 |
| බණ්ඩක්කා | 978.3 | 113 | 1091.3 | 85.8 | 197.2 | 283 | 1374.3 |
| පතෝල | 0 | 763.8 | 763.8 | 71.5 | 78 | 149.5 | 913.3 |
| නිවිති | 101.8 | 0 | 101.8 | 431.7 | 0 | 431.7 | 533.5 |
| තක්කාලි | 20.4 | 60.7 | 81.1 | 0 | 2.3 | 2.3 | 83.4 |
| දඹල | 117.5 | 139.6 | 257.1 | 209.1 | 0 | 209.1 | 466.2 |
| කොමඩු | 45 | 171.4 | 216.4 | 0 | 0 | 0 | 216.4 |
| මිරිස් - වැරණියා | 63.5 | 22.2 | 85.7 | 0 | 0 | 0 | 85.7 |
| **එකතුව** | **2875.4** | **2346.75** | **5222.15** | **3932.5** | **563.57** | **4496.07** | **9718.22** |

## දෙමුහුම් එළවළු බීජ නිෂ්පාදනය

අළුත්තරම, කුණ්ඩසාලේ, මහඉලුප්පල්ලම, පෙලොන්නරුව හා අබේපුස්ස යන ගොවිපළ වල තක්කාලි, කරවිල හා පිපිඤ්ඤා බෝගවල $F_1$ දෙමුහුම් බීජ නිෂ්පාදනය කරන ලදී. (වගුව 2.2.15.)

**වගු අංක 2.2.15.: රජයේ ගොවිපළ වල දෙමුහුම් එළවළු බීජ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්) - 2017.**

| බෝගය | 2016/17 මහ | 2017 යල | එකතුව |
|---|---|---|---|
| තක්කාලි | 7.0 | 0 | 7.0 |
| කරවිල | 0 | 41.6 | 41.6 |
| පිපිඤ්ඤා | 65.595 | 28.4 | 93.995 |
| **එකතුව** | **72.595** | **70.0** | **142.595** |

2017 වර්ෂයේ එළවළු බීජ වල නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමේ දී පහත සඳහන් ගැටලු සෘණාත්මකව බලපා ඇත.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දෙමුහුම් එළවළු ප්‍රභේද 10ක් නිකුත් කරන ලද නමුත්, බණ්ඩක්කා වල "OK H 1", තක්කාලි "භාතිය" හා මාළු මිරිස් "ප්‍රාර්ථනා" වැනි දෙමුහුම් ප්‍රභේදවල අවශ්‍ය මාපිය පරම්පා වල පාරිශුද්ධතාවය නොමැතිවීම නිසා දෙමුහුම් බීජ නිෂ්පාදන සීමා විය.
- මූලික බීජ වල ජානමය අස්ථායීතාව (පහළ මට්ටමේ පාරිශුද්ධතාව) හේතු කොට ගෙන තක්කාලි වල "තිළිණ" ප්‍රභේදයේ හා දඹල වල "ක්‍රිෂ්ණා" ප්‍රභේදයේ සම්මත බීජ නිෂ්පාදනය කිරීම නතර කිරීමට සිදුවිය.
- මෙම වසර පුරාවට පැවති අහිතකර කාලගුණික තත්ත්වය එනම් දැඩි නියගය හා අධික වර්ෂාව වගා ක්ෂේත්‍රවල කරන ලද අහිතකර බලපෑම නිසා අපේක්ෂිත බීජ නිෂ්පාදනය අඩුවීමට බලපාන ලදී. දැඩි නියගය නිසා පරාග ජීව්‍යතාව නොමැතිවී පරාගනය අසාර්ථක වීම, අස්වනු නෙලන අවස්ථාවලද පැවති වර්ෂාව නිසා අස්වනු ගුණාත්මයට බලපාන ලදී.
- තවද පවතින ඉහල නිෂ්පාදන වියදමට අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් මිලදී ගැනීමේ මිල අඩු නිසා කොන්ත්‍රාත් බීජ නිෂ්පාදනකයින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට බීජ ලබාදීම අත්හැරීමද මිලදී ගැනීමේ ඉලක්ක පහල යාමට හේතුවිය.

## 2017 වර්ෂය තුළ දී එළවළු බීජ සැපයීම.

බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ විකිණුම් කවුළු (කවුළු 33ක්) හා ලියාපදිංචි අලෙවි ජාලය හරහා එළවළු බීජ බෙදා හැරීම සිදුකරන ලදී. මෙම අලෙවි ජාලයට ගොවිජන සේවා මධ්‍යස්ථාන, සමූපකාර සමිති, ගොවි සංවිධාන, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු හා පෞද්ගලික අංශයේ ලියාපදිංචි බීජ වෙළෙන්දන් අයත් වේ. සාමාජිකයන් සක්‍රීය කිරීම හා නව අලෙවි කරුවන් බඳවා ගැනීම මගින් 2017 වර්ෂයේ දී මෙම අලෙවි ජාලය තවදුරටත් ශක්තිමත් කරන ලදී. 2017 වන විට සිටින මුළු සක්‍රීය අලෙවිකරුවන් සංඛ්‍යාව 300ක් පමණ වේ. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් සපයන ලද එළවළු බීජ ප්‍රමාණ 2.2.16 වගුවේ දැක්වේ.

**වගු අංක 2.2.16.: කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයන ලද එළවළු බීජ (කිලෝග්‍රෑම්) - 2017**

| බෝගය | 2017 යල සඳහා නිකුත් කිරීම | | | | | | 2017 / 18 මහ සඳහා නිකුත් කිරීම | | | | | | මුළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අභිජනන | මූලික | සම්මත | වාණිජ | දෙමුහුම් | එකතුව | අභිජනන | මූලික | සම්මත | වාණිජ | දෙමුහුම් | එකතුව | එකතුව |
| බෝංචි | 65.7 | 30 | 2432.259 | 0 | 0 | 2527.959 | 100 | 633.15 | 3913.75 | 0 | 0 | 4646.9 | 7174.859 |
| කරවිල | 3.82 | 39.3 | 548.534 | 18.59 | 0 | 610.244 | 242.425 | 47.605 | 517.25 | 0 | 12.93 | 820.21 | 1430.454 |
| බටු | 6.875 | 30.8 | 64.435 | 0 | 9 | 111.11 | 0.36 | 55.385 | 216.69 | 0 | 11.525 | 283.96 | 395.07 |
| බුෂිටාවෝ | 10 | 59.9 | 303.65 | 0 | 0 | 373.55 | 30 | 40.505 | 2249.873 | 0 | 0 | 2320.378 | 2693.928 |
| මාළු මිරිස් | 0 | 4.3 | 223.65 | 0 | 0 | 227.95 | 0.1 | 2.7 | 290.85 | 0 | 0 | 293.65 | 521.6 |
| කැරට් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 3.7 | 0 | 0 | 0 | 3.7 | 3.7 |
| පිපිඤ්ඤා | 1.075 | 3.65 | 307.364 | 0 | 0.1 | 312.189 | 3.69 | 5.25 | 729.45 | 0 | 0.1 | 738.49 | 1050.679 |
| වැටකොළු | 0 | 7.05 | 261.05 | 0 | 0 | 268.1 | 0 | 20.3 | 281.54 | 0 | 0 | 301.84 | 569.94 |
| මෑ | 4 | 181 | 460.7 | 0 | 0 | 645.7 | 26.8 | 149.7 | 3195.355 | 0 | 0 | 3371.855 | 4017.555 |
| බණ්ඩක්කා | 5.625 | 59.05 | 498.885 | 0 | 0 | 563.56 | 10.2 | 86.9 | 1740.33 | 0 | 0 | 1837.43 | 2400.99 |
| වට්ටක්කා | 0 | 2 | 38.93 | 0 | 0 | 40.93 | 0 | 1.3 | 84 | 0 | 0 | 85.3 | 126.23 |
| තිබ්බටු | 0 | 0.09 | 0 | 0 | 0 | 0.09 | 0 | 0.09 | 0 | 0 | 0 | 0.09 | 0.18 |
| රාබු | 0 | 0.5 | 200.71 | 0 | 0 | 201.21 | 0 | 41.65 | 933.9 | 0 | 0 | 975.55 | 1176.76 |
| පතෝල | 4.73 | 91.65 | 557.65 | 0 | 0 | 654.03 | 1.85 | 127.75 | 526.15 | 0 | 0 | 655.75 | 1309.78 |
| නිවිති | 0 | 1 | 31.9 | 0 | 0 | 32.9 | 0.2 | 2.1 | 532.825 | 0 | 0 | 535.125 | 568.025 |
| පැණි කොමඩු | 0 | 1.75 | 4 | 00 | 0 | 5.75 | 0.25 | 0 | 73.3 | 0 | 0 | 73.55 | 79.3 |
| තක්කාලි | 0.43 | 3.495 | 53.58 | 0 | 1.31 | 58.815 | 0.54 | 2.325 | 109.83 | 46.2 | 1.27 | 160.165 | 218.98 |
| දඹල | 24.75 | 0 | 381.6 | 28.5 | 0 | 434.85 | 0 | 46.4 | 474.8 | 1743.17 | 0 | 2264.368 | 2699.218 |
| තම්පලා | 0.6 | 3.4 | 82.2 | 0 | 0 | 86.2 | 0 | 207.6 | 27 | 0 | 0 | 234.6 | 320.8 |
| **එකතුව** | **127.605** | **518.94** | **6451.097** | **47.09** | **10.41** | **7155.137** | **416.415** | **1474.41** | **15896.893** | **1789.37** | **25.825** | **19602.911** | **26758.048** |

## 2017 වර්ෂයේ දී "එක් වෙමු නැගිටිමු. අටුකොටු පුරවමු." වැඩසටහන සඳහා ගෙවතු වගා එළවළු බීජ ඇසුරුම් සැපයීම.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2016-2018 සඳහා වූ ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා බෝග 6ක එළවළු බීජ අන්තර්ගත ගෙවතු වගා ඇසුරුම් කට්ටල 577,197ක් සැපයීමට බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය ට හැකි විය. මීට අමතරව, ඉහත වැඩසටහන යටතේ තවාන් පැල නිපදවීමට මිරිස්, මාළු මිරිස්, තක්කාලි හා බටු බීජ එකතුවක් සහිත කුඩා ඇසුරුම් (ග්‍රෑම් 10) 56,946ක් බෙදා හරින ලදී.

## 2017 වර්ෂයේ දී බීජ අර්තාපල් නිෂ්පාදනය හා නිකුත් කිරීම

බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන සීතා එළියේ (නුවරඑළිය දිස්ත්‍රික්කය) පිහිටි බීජ ගොවිපළ වලදී පමණක් ක්‍රියාත්මක කෙරේ.

2017 වර්ෂයේ දී පූර්ව මූලික ($G_0$) ක්ෂුද්‍ර ආකන්ද නිෂ්පාදනය 1,060,744 වූ අතර එම ප්‍රමාණය 2016 වර්ෂයේ පූර්ව මූලික ($G_0$) ක්ෂුද්‍ර ආකන්ද නිෂ්පාදනය ට වඩා තරමක් වැඩි විය. පොලි ගෘහ ක්‍රියාකාරකම් හූ රෝපිත ක්‍රමයේ සිට වායු රෝපිත ක්‍රමය ට මාරු වීම හේතුවෙන් 2017 වර්ෂය තුළ දී ඵලදායිතාව ඉහළ නැංවීමට නො හැකි විය.

2017 වර්ෂයේ දී සමස්ත මූලික හා සහතික කළ බීජ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 653.31 ක් වූ අතර මෙම ප්‍රමාණය 2016 නිෂ්පාදනය ට වඩා තරමක් වැඩි විය. 2017 වර්ෂය තුළ පැවති නියගය අර්තාපල් බෝගයට බල පෑ අතර අපේක්ෂිත ඉලක්ක අත් පත් කර ගැනීම සීමා වීමට මෙය හේතු විය.

සංවර්ධන අරමුදල් හරහා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් ආනයනික බීජ අර්තාපල් වල මිල හා සැසඳීමේ දී ඉතා ඉහල සහනදායී මිලකට ගොවීන් වෙත බීජ අර්තාපල් සැපයීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හැකි විය.

සීතා එළිය ගොවිපළේ අළුතින් ඉදි කරන ලද පොලි ගෘහ සංකීර්ණයෙහි $G_1$ ක්ෂුද්‍ර ආකන්ද නිෂ්පාදනය කිරීම ආරම්භ කරන ලදී. මේ නිසා, 2019 වර්ෂයේ සිට ඉදිරියට බීජ නිෂ්පාදනයේ අඛණ්ඩ ඉහළ යෑමක් අපේක්ෂා කළ හැකි ය.

**වගු අංක 2.2.17 : 2017 වර්ෂය තුළදී (ග්‍රැනෝලා ප්‍රභේදයේ) පූර්ව මූලික ($G_0$) ක්ෂුද්‍ර ආකන්ද, මූලික ($G_1$, $G_2$ හා $G_3$) සහ සහතික කළ ($C_1$,$C_2$) බීජ අර්තාපල් නිෂ්පාදනය**

| කන්නය | පූර්ව මූලික ($G_0$ ක්ෂුද්‍ර ආකන්ද සංඛ්‍යාව) | මූලික (මෙට්‍රික් ටොන්) | සහතික කළ (මෙට්‍රික් ටොන්) | එකතුව (මෙට්‍රික් ටොන්) |
|---|---|---|---|---|
| 2016/17 මහ | 1,060,744 | 8.565 | 104.031 | 112.596 |
| 2017 යල | | 228.253 | 312.461 | 540.714 |
| **එකතුව** | **1,060,744** | **236.818** | **416.492** | **653.31** |

**වගු අංක 2.2.18 : 2017 වර්ෂය තුළදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයන ලද බීජ අර්තාපල් ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)**

| ප්‍රභේදය | 2017 යල | 2017/18 මහ | එකතුව |
|---|---|---|---|
| ග්‍රැනෝලා (මූලික හා සහතික කළ) | 123.807 mt | 524.923 mt | **648.73 mt** |
| ග්‍රැනෝලා (ක්ෂුද්‍ර ආකන්ද) | 591,790 Nos. | 629,346 Nos. | **1,221,136 Nos.** |

## 2017 වර්ෂයේ දී රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා සැපයීම

ගොවිපළ අත්තිකාරම් ගිණුම යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගොවිපළ 27ක (බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශයේ ගොවිපල් 22, පර්යේෂණ අංශයේ ගොවිපල 4, ව්‍යාප්ති පුහුණු ගොවිපල 1) රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය යටතේ පලතුරු බෝගවල බද්ධ පැළ, මුල් ඇදුනු දඬු කැබලි, බීජ පැළ හා මොරෙයියන් නිපදවන ලදී. මීට අමතරව ඖෂධ පැල, වන අල, කුළු බඩු සඳහා යොදාගන්නා පැල වර්ග නිපදවූ ලබයි.

සමස්ත රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය 1,141,776ක් වූ අතර මෙම ප්‍රමාණය 2016 නිෂ්පාදනයට වඩා තරමක් අඩු ප්‍රමාණයක් වශයෙන් පෙන්වූයේ පැවති කාලගුණික වෙනස්වීම් අනුව එල දැරීම් වෙනස්වීම නිසා ග්‍රාහක සඳහා බීජ ලබාගැනීමට අපහසුවීම හා වියළි තත්ත්ව යටතේ බද්ධ අංකුර ලබාගැනීමට සීමා වීමයි.

තවද සමහර තවාන් සඳහා ජලය සපයා ගැනීමද දුෂ්කරවීම. නිෂ්පාදනයට සෘජුව බලපාන ලදී.

2016 වසරට වඩා නිකුත් කිරීම් වැඩි වශයෙන් පෙන්වන ලද්දේ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් ඒ සඳහා පැළ නිකුත් කිරීමට සිදුවීමත්ය.

**වගු අංක 3.19. : 2017 දී කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා සැපයුම**

| බෝගය | නිෂ්පාදනය | නිකුත් කිරීම් |
|---|---|---|
| **බද්ධ කළ පැළ** | | |
| අලිපේර | 8,578 | 9,302 |
| බෙලි | 21,372 | 22,082 |
| දූරියන් | 17,241 | 14,303 |
| දිවුල් | 22,903 | 12,301 |
| කොස් | 35,132 | 21,721 |
| පේර | 1,398 | 655 |
| උගුරැස්ස | 7,145 | 5,363 |
| දෙහි | 13,556 | 6,696 |
| අඹ | 219,395 | 150,035 |
| නාරං | 21,986 | 17,827 |
| ජම්බු | 2,705 | 2,395 |
| දොඩම් | 26,658 | 27,002 |
| රඹුටන් | 53,389 | 49,819 |
| සැපදිල්ලා | 2,975 | 2,503 |
| කාමරංගා | 12,131 | 10,983 |
| පෙයාස් | 5,003 | 3,958 |
| ඇපල් | 49 | 53 |
| වෙරළු | 2,446 | 2,453 |
| අනෝදා | 10,383 | 12,201 |
| මැංගුස් | 1,967 | 1,650 |
| ගාසිනියා | 7,150 | 6,583 |

| බෝගය | නිෂ්පාදනය | නිකුත් කිරීම |
|---|---|---|
| අධි ශ්‍රේණියේ පැළ | 8,599 | 6,184 |
| වෙනත් | 6,336 | 5,748 |
| **උප එකතුව** | **508,497** | **391,817** |
| **මුල් ඇද්දවූ අතු/ කඳ කැබලි** | | |
| මිදි | 1,550 | 1,243 |
| ජම්බු | 12,612 | 11,823 |
| දෙළුම් | 134 | 131 |
| ලෙමන් | 7,851 | 6,533 |
| වැල් දොඩම් | 1,302 | 1,643 |
| ඩ්‍රැගන් ෆෲට් | 1,376 | 984 |
| කතුරුමුරුංගා | 7,184 | 4,375 |
| අධි ශ්‍රේණියේ පැළ | 110 | 115 |
| වෙනත් (ගම්මිරිස්, බුලත් යනාදිය) | 1,449 | 2,459 |
| **උප එකතුව** | **41,800** | **36,192** |
| **බීජ පැළ** | | |
| ඇඹරැල්ලා | 11,153 | 10,830 |
| කාමරංගා | 5,411 | 1,634 |
| පැපොල් | 39,817 | 63,542 |
| දෙළුම් | 87,643 | 78,489 |
| බෙලි | 1,853 | 377 |
| පේර | 95,741 | 87,127 |
| කතුරුමුරුංගා | 4,415 | 3,811 |
| වෙරළු | 2,833 | 695 |
| උගුරැස්ස | 1,150 | 458 |
| දූරියන් | 5,363 | 148 |
| කුරු මුරුංගා | 9,252 | 7,960 |
| දෙහි | 111,951 | 67,602 |

| බෝගය | නිෂ්පාදනය | නිකුත් කිරීම |
|---|---|---|
| දොඩම් | 6,577 | 79 |
| මැංගුස් | 5,258 | 2,587 |
| නෙල්ලි | 9,575 | 4,878 |
| අනෝදා | 88,234 | 30,932 |
| වැල් දොඩම් | 17,807 | 36,471 |
| කජු | 1,250 | 947 |
| අධි ශ්‍රේණියේ පැළ | 716 | 601 |
| වෙනත් (සියඹලා, පුවක්, තේක්ක, මැහෝගනි, කොහොඹ, පොල් යනාදිය) | 17,208 | 13,621 |
| **උප එකතුව** | **523,207** | **412,789** |
| **මොරෙයියන්** | | |
| කෙසෙල් | 12,604 | 17,583 |
| අන්නාසි | 52,782 | 67,032 |
| වෙනත් | 2,886 | 2,550 |
| **එකතුව** | **68,272** | **87,165** |
| **මුළු එකතුව** | **1,141,776** | **927,963** |
| එළවළු බඳුන් (මිරිස්, මාළු මිරිස්, තක්කාලි, බටු) | 28,059 | 33,261 |

## ගොවිපළ අත්තිකාරම් ගිණුමේ කාර්යසාධනය - 2017

### වගු අංක 2.2.20: ගොවිපළ අත්තිකාරම් ගිණුම - 2017

| | ගොවිපළ | කාරක ලාභය (රු.) | ශුද්ධ ලාභය/ අලාභය (රු.) |
|---|---|---|---|
| 1. | අළුත්තරම | 10,504,580.66 | 3,385,437.76 |
| 2. | අම්බලන්තොට | 178,172.66 | -1,793,154.87 |
| 3. | අඹේපුස්ස | 3,212,039.09 | -1,940,682.49 |
| 4. | බටඅත | -6,727,152.94 | -11,183,349.77 |
| 5. | බණ්ඩාරගම | 452,537.76 | -300,289.59 |
| 6. | කඳපොල | 11,070,934.36 | 6,593,487.71 |
| 7. | කන්තලේ | 23,378,123.24 | 20,725,345.68 |
| 8. | කුණ්ඩසාලේ | 3,882,458.90 | 692,950.23 |
| 9. | කරදියනාරු | 5,462,982.02 | 1,539,339.43 |
| 10. | මහ ඉලුප්පල්ලම | 6,399,976.90 | 94,546.38 |
| 11. | මල්වත්ත | 4,014,091.14 | -290,041.14 |
| 12. | මීපිළිමාන | 3,812,435.88 | 1,773,303.86 |
| 13. | මිද්දෙණිය | -5,216,385.41 | -8,196,786.25 |
| 14. | මුරුන්කන් | 4,834,729.42 | 1,348,831.92 |
| 15. | පිදුරුතලාගල | 7,906,691.04 | 5,443,367.22 |
| 16. | පොළොන්නරුව | 35,538,369.54 | 26,183,256.32 |
| 17. | පරන්තන් | 5,648,971.81 | 2,838,443.61 |
| 18. | පැල්වැහැර | 3,622,766.07 | 3,762,590.98 |
| 19. | රහංගල | 1,654,934.83 | -2,582,934.44 |
| 20. | සීතා එළිය | 9,918,909.27 | 9,006,994.04 |
| 21. | තෙලිජ්ජවිල | -595,689.44 | -1,347,864.85 |
| 22. | උඩරදැල්ල | 10,067,619.89 | 6,469,772.00 |
| 23. | උල්පොතගම | -919,757.84 | -2,346,526.26 |
| 24. | වල්පිට | 2,198,183.78 | -575,120.53 |
| 25. | වීරපාන | -2,876,780.31 | -4,693,128.40 |
| 26. | වෙනත් ඒකක | 155,059,186.85 | 136,300,999.15 |
| **එකතුව** | | **292,482,929.18** | **190,908,787.70** |
| **ඒකාබද්ධ ගිණුමට අනුව** | | **295,431,250.254** | **190,908,787.70** |

## 2018 වර්ෂය සඳහා සැලැස්ම

- අඹේපුස්ස, කුණ්ඩසාලේ, එළුවන්කුලම, මිද්දෙණිය හා බටඅත රජයේ ගොවිපළ වල උස්සාන හා ප්‍රධාන වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීම (ප්‍රතිපාදන - රු.මිලියන 35.0)
- පූර්ව පිරිසිදුකාරක හා ශෝෂක සහිත ස්වයංක්‍රිය බීජ සැකසුම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. (ප්‍රතිපාදන - රු.මිලියන 18.0 )
- බටඅත, එළුවන්කුලම හා අළුත්තරම ගොවිපළ වල නව ගබඩා ඉදි කිරීම. (ප්‍රතිපාදන - රු.මිලියන 33.0)

## කාර්ය මණ්ඩලය

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ | 02 |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | 19 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) | 11 |
| පරිපාලන නිලධාරි | 02 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 03 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 03 |
| සංවර්ධන නිලධාරි | 47 |
| කෘෂිකර්ම උපදේශක | 136 |
| ගොවිපළ යාන්ත්‍රික උපදේශක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 60 |
| තාක්ෂණ සහායක | 110 |
| ගොවිපළ ලිපිකරු | 26 |
| රියදුරු | 68 |
| පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු | 34 |
| ගබඩාකරු | 22 |

| තනතුර | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|
| යන්ත්‍රාගාර උපස්ථායක | 02 |
| යන්ත්‍ර ශිල්පි | 06 |
| වඩුකරු | 02 |
| පෙදරේරු | 01 |
| විදුලි කාර්මික | 01 |
| කාර්මික ශිල්පි | 02 |
| යාන්ත්‍රික ශිල්පි | 04 |
| බද්ධකරු | 36 |
| සංචාරක බංගලා භාරකරු | 06 |
| ලොරි සහායක | 06 |
| කාර්යාල කාර්ය සහායක | 07 |
| මුරකරු | 154 |
| කම්කරු (ස්ථිර) | 1,332 |
| සනීපාරක්ෂක කම්කරු | 24 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 464 |
| **එකතුව** | **2,592** |

# 2.4. සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය - පේරාදෙණිය

සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය, සමාජ ආර්ථික පර්යේෂණ හා කෘෂිකාර්මික ප්‍රතිපත්ති විශ්ලේෂණ මෙහෙයවීමෙහිලා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවටත්, කෘෂිකර්ම අමාත්‍යාංශයටත් උපදෙස් ලබා දෙන ප්‍රධාන ආයතනය ලෙස කටයුතු කරන අතරතුර කෘෂිකාර්මික ප්‍රතිපත්ති සැකසීම, පර්යේෂණ සිදු කිරීම හා සංවර්ධන සැලසුම් සැකසීමත් සිදු කරයි. මීට අමතරව, සංඛ්‍යාලේඛන ඒකකයක් මාර්ගයෙන් කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන තොරතුරු සම්පාදනය කිරීම ද සිදු කරනු ලැබේ. එමෙන්ම දේශීය හා විදේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක වන කෘෂිකර්ම දෙපාර්තමේන්තු ව්‍යාපෘති වල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමද මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි. 2017 වර්ෂයේදී, ආර්ථික හා මූල්‍ය ශක්තතාව, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වල සමාජ පිළිගැනීම හා කෘෂිකර්මයේ ආයෝජන හා යෙදවුම් ප්‍රතිපත්ති කෙරෙහි සමාජ ආර්ථික පර්යේෂණ හා ප්‍රතිපත්ති විශ්ලේෂණ වල අවධානය යොමු විය. උපාය මාර්ග සංවර්ධනය කිරීමෙහිලා ප්‍රතිපත්ති සම්පාදකයන්ට තොරතුරු සැපයීම මගින් විශේෂයෙන්ම ගෝලීය මෙන්ම දේශීය ආර්ථික පරිසරයන්හි වෙනස්කම් ද රාජ්‍ය ප්‍රතිපත්ති වල මෑත කාලීන වෙනස්කම්ද යන සන්දර්භ තුළ ආහාර හිඟය සම්බන්ධවූ ගැටළු විසඳීමට මධ්‍යස්ථානය දායක විය. දිස්ත්‍රික්ක හා කන්න පදනම යටතේ සියළු ප්‍රධාන ආහාර බෝගවල පිරිවැය හා ඵල පිළිබඳ දත්ත සමුදායක් ගොඩනැගීමට පුළුල් වැඩසටහනක් දිගටම පවත්වා ගෙන යන ලදී. එමෙන්ම, වර්ෂය තුළදී පර්යේෂණ ධාරා 7ක් යටතේ සමාජ ආර්ථික පර්යේෂණ හා දත්ත සමුදාය කළමනාකරණය කිරීමේ කාර්යයන් ඉටු කිරීමටද සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය සම්බන්ධ විය.

## අයවැය

**වගු අංක 2.3.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 5,526,000 | 5,301,146 | 96 |
| මූලධන | 3,727,095 | 3,194,263 | 86 |
| **එකතුව** | **9,253,095** | **8,495,409** | **92** |

## ප්‍රගතිය

### බෝග නිෂ්පාදනයේ පිරිවැය හා ඵල

වී, අතිරේක ආහාර බෝග, අල හා ආකන්ද බෝග සහ එළවළු සඳහා වූ 2016 යල, 2016/17 මහ හා 2017 යල කන්න වල පිරිවැය හා ඵල අධ්‍යයන ප්‍රකාශයට පත් කරන ලදී. නිෂ්පාදනයේ සමස්ත පිරිවැය, සාමාන්‍ය අස්වනු, ගොවියාට ලැබෙන මිල හා ශුද්ධ හා දළ ආදායම් හා නිෂ්පාදනයේ ඒකක පිරිවැය යන ඒවා මෙම දත්තයන්ට ඇතුළත් වේ. ගොවිපළ මට්ටමේදී බෝග නිෂ්පාදනය හා අලෙවිකරණය පිළිබඳ තීරණ ගැනීමට මෙන්ම ජාතික මට්ටමේ ප්‍රතිපත්ති තැනීමේදී ද මෙම දත්ත ප්‍රයෝජනවත්ය. 2016/17 මහ කන්න සඳහා එක්රැස් කළ දත්ත විශ්ලේෂණය

කරන ලද අතර ඒවා ප්‍රකාශනය සඳහා සකස් කෙරෙමින් පවතී. තවද 2017 යල සඳහා ප්‍රාථමික දත්ත එකතුව සම්පූර්ණ කර ඇත.

## AgStat 2017

ආහාර බෝග අංශය පිළිබඳ ඉතා වැදගත් තොරතුරු ඇතුළත් කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන පිළිබඳ පොතක් සකස් කොට 2018 ජනවාරි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී. AgStat 2017 XIV වෙළුමේ සමාජ ආර්ථික දත්ත, ඉඩම් භාවිතා වර්ග, වපසරිය හා නිෂ්පාදනය, ආනයනය සහ අපනයනය, ඒක පුද්ගල උපයෝජ්‍යතාව, තොග හා සිල්ලර මිල වැනි බොහෝ තොරතුරු ඇතුළත් විය. මෙම පොත් පිංචේ අන්තර්ගත සංඛ්‍යාලේඛනමය තොරතුරු කෘෂිකර්මය කෙරෙහි උනන්දුවක් දක්වන බොහෝ පාර්ශවකරුවන් විසින් පුළුල් ලෙස භාවිතා කරන ලදී.

## පර්යේෂණ වල සුවිශේෂී ජයග්‍රහණ

### SRP සම්මත තුළින් ශ්‍රී ලංකාවේ වී පදනම් කරගත් කෘෂිකර්මාන්ත අංශයේ තිරසාර භාවය

ශ්‍රී ලාංකීය ජනතාවගේ ප්‍රධාන ආහාරය වන සහල් දිවයිනේ බහුලවම වගා කෙරෙන ආහාර භෝගය වන අතර ශ්‍රී ලංකාවේ වාර්ෂික ඒක පුද්ගල සහල් පාරිභෝජනය කිලෝ ග්‍රෑම් 110කි. ලෝකයේ සහල් නිෂ්පාදනයත් පාරිභෝජනයත් සමඟ සළකා බැලීමේදී ශ්‍රී ලංකාව ඉතා ලසු ස්ථානයක් සළකුණු කළද ශ්‍රී ලාංකීය වී ක්ෂේත්‍රය මගින් ලෝක තිරසාර සම්මතයන් අත්පත් කර ගැනීම ප්‍රමුඛ වැදගත්කමක් දරයි. එහෙයින් තිරසාර මට්ටම් හඳුනා ගැනීමට හැකියාව ලබා දෙන SRP (Sustainable Rice Platform) සම්මත වලට අනුව ශ්‍රී ලාංකික වී ගොවීන් ඇගයීම පිණිස මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කරන ලදී. පොලොන්නරුව හා රාජාංගනය ප්‍රදේශ වලින් අහඹු ලෙස තෝරා ගත් ගොවීන් විසි දෙනෙකු යොදා ගනිමින් දත්ත එක් රැස් කරනු පිණිස 2016 යල කන්නයේදී සමීක්ෂණයක් සිදු කරන ලදී. දත්ත එක් රැස් කිරීම, දත්ත සමූහනය හා විශ්ලේෂණය සඳහා සම්මත දත්ත එක් රැස් කිරීමේ උපකරණය යොදා ගන්නා ලදී. 2015/16 මහ කන්නය පිළිබඳව දැනටමත් එකතු කර ඇති දත්ත ද අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී. නිමානය කිරීම් වලට අනුව සාමාන්‍ය SRP අගය අත්‍යවශ්‍ය කාර්ය සාධන මට්ටමට වඩා මඳක් පහළ අගයක් වන 59.9ක් වූ අතර ඉහළම අගය 73ක් හා පහළම අගය 48ක් විය. මහ හැරුණු පැවතිය යුතු අගය පරාසය 6 -14 දක්වා විය. ප්‍රධාන ඉලක්ක අට අතරින් ගොවිපල කළමනාකරණය පහළම අගය අත් කර ගත් අතර ශ්‍රම තත්ව වලට ඉහළම සාමාන්‍ය අගය හිමි විය.

### නිර්දේශිත රටකජු ප්‍රභේද වල අනුවර්තනය කර ගැනීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනය හා ආශ්‍රිත සාධක

මොණරාගල, මුලතිව්, කුරුණෑගල හා පුත්තලම වැනි ප්‍රධාන වශයෙන් රට කජු වගා කරනු ලබන දිස්ත්‍රික්ක වල මෙම අධ්‍යයන සිදු කරන ලදී. දත්ත විශ්ලේෂණය හා වාර්තා සකස් කිරීම අවසන් කර ඇති අතර නිර්දේශිත රටකජු ප්‍රභේද වල අනුවර්ත්‍යතා අනුපාතය 37% ක් වන බව අනාවරණය වූ අතර සමීක්ෂණයට ලක් කෙරුණු ගොවීන්ගෙන් බහුතර සංඛ්‍යාවක් දැනුවත්ව සිටියේ "තිස්ස" ප්‍රභේදය පිළිබඳව පමණි. නිර්දේශිත රටකජු ප්‍රභේද වල අනුවර්තනය කර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් ගුණත්වයෙන් යුතු බීජ නියමිත අවස්ථා වලදී ලබා ගත හැකිවීම, ව්‍යාප්ති සේවය සමඟ සම්බන්ධවීම හා ණය ලබා ගත හැකි වීම යන කරුණු ඉහළ සම්බන්ධතාවක් පෙන්වීය.

## හම්බන්තොට දිස්ත්‍රික්කයේ තල වගාවට බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කිරීම

සමස්ත දිවයිනේ තල නිෂ්පාදනය හා සළකා බැලීමේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ වගා කරන ලද භූමි ප්‍රමාණය හා තල නිෂ්පාදනය පහළ යාමේ නැඹුරුවක් පෙන්වන බව අධ්‍යයනයෙන් අනාවරණය විය. මෙම දිස්ත්‍රික්කයේ ඉඩම් හිභය, ඉඩම් භාවිතාව පිළිබඳ රාජ්‍ය රෙගුලාසි, අවාසිදායක වර්ෂාපතන රටාව සහ ප්‍රදේශයේ වන සතුන් තල නිෂ්පාදනයට බලපෑ ප්‍රධාන අවහිරතා විය.

## හම්බන්තොට දිස්ත්‍රික්කයේ එළවළු වගාවල ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රම IPM භාවිතා කිරීමට අදාල අභියෝග හා රසායනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ රටා

ප්‍රදේශයේ ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රම (IPM) ක්‍රියාත්මක කිරීමට අදාල සාධක හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ පහතරට එළවළු වගාවන්හි රසායනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ රටා නිරාවරණය කර ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. මෙම අධ්‍යයනය විෂය පිළිබඳ ශාස්ත්‍රීය පොත් පත් සමාලෝචනය සහ ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් ප්‍රදේශයේ සිදු කරන ලද සමීක්ෂණ පරීක්ෂණයක් යන ඒවාගේ යහපත් සම්මිශ්‍රණයකි. දත්ත එක් රැස් කිරීම සිදු කරන ලද අතර දත්ත විශ්ලේෂණය මේ වන විට සිදු කෙරෙමින් පවතී.

## යැපුම් ප්‍රතිඵලය වැඩි දියුණු කිරීමෙහි ලා “හෙල බොජුන් හල” නිපැයුමේ කාන්තා සහභාගිත්වය ඇගයීම

“හෙල බොජුන් හල” වැඩසටහනේ වත්මන් තත්වය විමසීමට හා වැඩසටහන තුළින් ගෘහස්ථ යැපුම් ප්‍රතිඵලයේ ප්‍රවර්ධනය විමසීමට සිදු කළ සමීක්ෂණ පර්යේෂණය මෙම අධ්‍යයනයට පදනම් විය. මේ වන විට නිසියාකාරව සකසන ලද ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කෙරෙමින් පවතින අතර දත්ත විශ්ලේෂණය සිදු කෙරෙමින් පවතී.

## එළවළු බීජ වල ගුණාත්මක බව පිළිබඳව ශ්‍රී ලංකාවේ වෙළඳපොල මට්ටමේ දක්නට ලැබෙන ඌණතා

බීජ වල ගුණාත්මක බව හොඳ බෝග නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා පූර්ව අවශ්‍යතාවක් වේ. බීජ සහතික කිරීමේ සේවයේ තත්ව පාලනය යටතේ නිපදවනු ලබන වාණිජ වශයෙන් ලබා ගත හැකි වර්ගයේ සම්මත බීජ සඳහා ආරම්භක ද්‍රව්‍ය වන්නේ මූලික බීජ යි. වෙළඳපොලේ ලබා ගත හැකි බීජ වල තත්වය සහතික කිරීමේ අවශ්‍යතාවය, වෙළඳපොලේ ඇති පූර්ණ වශයෙන් සහතික කළ හා කොටස් වශයෙන් සහතික කළ බීජ හා සහතික නො කළ බීජ යන දෙවර්ගය පැවතීම හේතුවෙන් වඩාත් ඉස්මතුව පෙනේ. මෙවන් තත්වයකදී, ගොවීන්ට දේශීය ප්‍රභේද වල ගුණාත්මක බීජ සැපයීමට රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශයද වගකිව යුතු වුවද වෙළඳපොලේ ලබා ගත හැකි බීජ වල ගුණාත්මක බව පිළිබඳ සහතික කිරීමක් නොලැබේ. පවතින්නා වූ මෙම තත්වය පිළිබඳව සළකා බලා වෙළඳපොලෙන් ලබා ගත හැකි එළවළු බීජ වල ගුණාත්මක බව පිළිබඳ ඌණතා පිරිමැසීමට මෙම අධ්‍යයනය සිදු කරන ලදී. බහු-පියවර ස්ථරගත අහඹු නියැදීමේ ක්‍රමෝපාය පදනම් කර ගෙන සමීක්ෂණය සිදු කරන ලද අතර එය දිස්ත්‍රික්ක 4ක එළවළු බෝග 10ක් සඳහා සිදු කරන ලදී. සමස්ත නියැදි ප්‍රමාණය 350කි. පූර්ණ පර්යේෂණාගර පරීක්ෂාවක් සිදු කරන ලද අතර බීජ සාම්පල වලින් 86%ක පර්යේෂණාගාර ප්‍රරෝහණය 75%ක් විය. බීජ සාම්පල වලින් 72%ක් පමණක් සමාන්‍යයෙන් බීජ වල තිබිය යුතු තෙතමන පරාසයේ විය. සංවේදීතා විශ්ලේෂණයෙන් අනතුරුව සිදු කරන ලද ප්‍රත්‍යාගමන විශ්ලේෂණයෙන් අනාවරණය වූයේ තෙතමනයේ ප්‍රතිලෝමය 1%කින් අඩු කළ විට (තෙතමන ප්‍රතිශතය වැඩි

කිරීම) පර්යේෂණාගාර ප්‍රරෝහණය 1 - 2.3කින් අඩු විය. අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොලේ එළවළු බීජ වල ගුණාත්මක බව පිළිබඳ ගැටළු පවතින බව අනාවරණය විය.

### බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ බිත්තර වී සඳහා මිල නියම කිරීමේ සූත්‍රයක් ගොඩ නැගීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ බීජ කර්මාන්තය සඳහා වැදගත් දායකත්වයක් ලබා දෙයි. නිෂ්පාදිත බීජ මිල කිරීම සඳහා ක්‍රමවත් මිල නියම කිරීමේ ප්‍රතිපත්තියක් නොමැති බැවින් මෙම අධ්‍යයනය වී සඳහා මිල නියම කිරීමේ සූත්‍රයක් ගොඩ නැගීමට අපේක්ෂා කරයි. ගොවිපලෙහි වගා කළ හැකි වපසරිය පදනම් කර ගෙන චක්‍ර ස්ථාවර පිරිවැය වෙන් කරන ලදී. බිත්තර වී සඳහා මිල නියම කිරීමේ සූත්‍රයක් ගොඩ නගන ලද අතර බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ ගොවිපල වලදී උපරිම මිල හඳුනා ගැනීමට පරීක්ෂාවට ලක් කරන ලදී.

### සම්ප්‍රදායික වී ප්‍රභේද හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් එළි දක්වන ලද නව වැඩි දියුණු කළ වී ප්‍රභේද වල ආර්ථික ඇගයීම

2015 මහ බැංකු වාර්තාවට අනුව දළ දේශීය නිෂ්පාදිතයට වී මගින් ලැබෙන දායකත්වය 1.9%කි. සංගණන දත්ත අනුව, 1995 දී ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂිත බව අත් පත් කර ගත්තේය. අද වන විට ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අනුව අප විසින් අත් පත් කරගෙන ඇති ස්වයංපෝෂිතතා අනුපාතය 150%කි. වර්තමානයේදී අප නිරතුරුවම යෙදෙන කාලීන සංවාදය බවට පත් වී ඇත්තේ කාබනික කෘෂිකර්මය වෙතට යොමු වනු පිණිස සම්ප්‍රදායික ප්‍රභේද වෙතට යොමු වන්නේද යන්නයි. මෙබඳු හැසිරීමක ආර්ථික බලපෑම් පිළිබඳව මෙම අධ්‍යයනය අවධානය යොමු කරයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රභේද වලට සාපේක්ෂව සම්ප්‍රදායික ප්‍රභේද වල පිරිවැය සංසන්දනයක් විශ්ලේෂණයට ඇතුළත් විය. එමෙන්ම, ආහාර උපයෝජ්‍යතාව කෙරෙහි බලපෑම, ස්වයංපෝෂිතතා අනුපාතය හා වගාවන් මගින් ගෙවීම් ශේෂයට කෙරෙන බලපෑම් ද මෙහිදී විමසා බලන ලදී. අධ්‍යයනයේ ප්‍රතිඵල විදහා දැක්වූයේ සම්ප්‍රදායික ප්‍රභේද වෙතට නැවත යොමු වීම යනු ආර්ථිකයේ ආපසු ගමනක් වන බවයි.

### අග්නිදිග ආසියානු රිකාඩියානු අධ්‍යයන: බංග්ලාදේශය, ශ්‍රී ලංකාව, තායිලන්තය හා වියට්නාමය

බංග්ලාදේශය, ශ්‍රී ලංකාව, තායිලන්තය හා වියට්නාමය විසින් ස්වකීය රටවල් වලදී බෝග ශුද්ධ ආදායම (NR) පිළිබඳව රිකාඩියානු විශ්ලේෂණය බැගින් පවත්වන ලදී. ස්වකීය මෝසම් හා වියළි කාල සීමා මත ස්වකීය කන්න සුළු වශයෙන් වෙනස්ව රඳා පවතින බවට මෙම රටවල් විසින් අර්ථ දක්වන ලදී. ඔවුන් විසින් සමහර අවස්ථා වලදී ස්වකීය ප්‍රතිගමන වල මඳ වශයෙන් වෙනස් වන විචල්‍යතාද අන්තර්ගත කරන ලදී. වියළි කාල සීමාවේදී උෂ්ණත්වය සුවිශේෂී වූයේ ශ්‍රී ලංකාවේදී හා වියට්නාමයේදී පමණි. මෝසම් කාල සීමාව තුළදී ශ්‍රී ලංකාව, තායිලන්තය හා වියට්නාමයේදී උෂ්ණත්වය සුවිශේෂී විය. බංග්ලා දේශයේදී උෂ්ණත්ව සංගුණක සුවිශේෂී නොවිය. ශ්‍රී ලංකාවේදී හා තායිලන්තයේදී වියළි කාල සීමාවේදී අවක්ශේපණය සුවිශේෂී විය. ශ්‍රී ලංකාවේදී හා බංග්ලා දේශයේදී තෙත් කාල සීමාවේදී අවක්ශේපණය සුවිශේෂී විය. ශ්‍රී ලංකාවේ තායිලන්තයේ හා වියට්නාමයේ ගොවිපල භූමි ප්‍රමාණ කැපී පෙනෙන සුළු විය. ගොවිකම් පද්ධතියෙන් ලද ශුද්ධ ආදායම කාලගුණ වෙනස සමඟ සෘණාත්මකව සම්බන්ධ බවද අනුවර්තනය කර ගැනීමේ හැකියාව පවතින විටදී පවා ඉන් කැපී පෙනෙන තරමේ හානියකට හේතු වන

බවද මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය.

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ මිශ්‍ර එළවළු බෝග වගාවේ ආර්ථිකය

මිශ්‍ර එළවළු බෝග වගාව සිදු කරන ගොවි ප්‍රජාවේ සමාජ ආර්ථික සාධක හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අභිලාෂය විය. මිශ්‍ර එළවළු බෝග වගා පද්ධතියකට සුදුසු හොඳම බෝග සංකලනය හඳුනා ගැනීමට එය ප්‍රයෝජනවත් වනු ඇත. අධ්‍යයනයට මූලික දත්ත පදනම් වන අතර විශ්ලේෂණ සිදු කෙරෙමින් පවතී.

## ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනයට දේශගුණ විචල්‍යතාවන් හි බලපෑම්

කෘෂිකාර්මික නිෂ්පාදන කාලගුණ විචල්‍යතා වලට ගොදුරු විය හැකි බව සමස්ත ලෝකයටම බලපාන කාරණයකි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වී නිෂ්පාදන කලාප වලින් ලබා ගත් එක් රැස් කළ දත්ත හරස්කඩ උපයෝගී කර ගනිමින් මධ්‍යනය උෂ්ණත්වයට හා වර්ෂාපතන විචල්‍යතාවට වී නිෂ්පාදනය දක්වන ප්‍රතිචාර්යතාව විශ්ලේෂණයට ලක් කරන ලදී. එක් ගොවිපලක් සඳහා නිමැවුම ස්ථාවර ආවරණ සමීකරණ යොදා ගනිමින් උෂ්ණත්වයේ හා වර්ෂාපතනයේ (වෙනත් සම්මත පාලනද සමඟ) වර්ගජ ශ්‍රිතයක් ලෙසට ආදර්ශනය කරන ලදී. විවිධ දේශගුණ විපර්යාස අවස්ථා යටතේ වී අස්වැන්න කෙරෙහි බලපෑම ආදර්ශනයට මොන්ටි කාලෝ සමාකරණ භාවිතා කරන ලදී. වර්ධක සමයේ දේශගුණ විචල්‍යතා හේතුවෙන් වී නිෂ්පාදනයට සෘණාත්මක බලපෑම් ඇතිවිය හැකි බව විදහා පෙන්වමින් මධ්‍යනය උෂ්ණත්වය හා වර්ෂාපතනය යන දෙකම නිෂ්පාදනය මත අවතල, ඒකවිධ නොවන බලපෑම් ඇති කරන ලදී. උෂ්ණත්ව සාමාන්‍යයේ ප්‍රමාණවත් ඉහළයෑම් හා වර්ෂාපතනයේ විචල්‍යතා මගින් නොපැහැදිලි තරමේ කුඩා බලපෑමක් පමණක් වන බව අනාවරණය විය. එසේ වුවද, සෙන්ටිග්‍රේඩ් අංශක 2 ඉක්මවන සමාන්‍ය උෂ්ණත්වයේ ඉහළ නැගීමක් මගින් වී නිෂ්පාදනය කෙරෙහි දැඩි සෘණාත්මක බලපෑම් ඇති වීමේ හැකියාව පවතී. උදාහරණයක් ලෙසට, සෙන්ටිග්‍රේඩ් අංශක 4ක සමාන්‍ය උෂ්ණත්වයේ ඉහළ නැගීමක් මගින් හෝ වෙනස් වන වර්ෂාපතනයද ඊට එක්වූ විට වී නිෂ්පාදනයේ අස්වැන්නෙන් දළ වශයෙන් 30%ක් දක්වා වූ අස්වනු අඩු වීමක් සිදු විය හැක. ශ්‍රී ලංකාවේ හා වෙනත් සංවර්ධනය වෙමින් පවතින රටවල වී නිෂ්පාදනය ආර්ථික කාර්ය සාධනයේ ප්‍රධාන සංඝටකයක් වන බැවින් කාලගුණ වෙනස්කම් මගින් අනාගතයේදී බරපතල ආර්ථික ව්‍යාකූලතා හා ආහාර සුරක්ෂිතතා ගැටළු ඇති වීමේ ඉඩකඩ පවතී.

## "පසු අස්වනු කළමනාකරණය හා ශ්‍රී ලංකාවේ පලතුරු වලට අගය එකතු කිරීම." නම් ව්‍යාපෘතිය පිළිබඳ පදනම් සමීක්ෂණය - (සාක් සංවර්ධන අරමුදලෙන් ප්‍රතිපාදන ලද)

සාක් සංවර්ධන අරමුදල විසින් ශ්‍රී ලංකාවේ පලතුරු නිෂ්පාදනයේ පසු අස්වනු කළමනාකරණය හා ඊට අගය එකතු කිරීම සම්බන්ධයෙන් ආයෝජනය කිරීම් සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතියට නවීන ඇසුරුම් ගෘහයක් හා ස්වකීය ප්‍රදේශයේ හා ආසන්න ප්‍රදේශ වල පලතුරු ගොවීන් සැළකිය යුතු සංඛ්‍යාවක් සමඟ ගණුදෙනු කරන දක්ෂ ව්‍යවසායකයන් සඳහා අවශ්‍ය වන උපකරණද සමඟ සැකසුම් මධ්‍යස්ථානද ලබා දෙන ලදී.

ව්‍යවසායකයා සමඟ ගණුදෙනු කරන පලතුරු ගොවීන්ගේ වර්තමාන තත්වය තීරණය කිරීම මෙම අධ්‍යයනයේ සාමාන්‍ය අභිමතාර්ථය විය. ව්‍යුහ ස්ථාපනය කරන ලද ස්ථාන 7ක ව්‍යවසායකයන් සමඟ ගණුදෙනු කරන පලතුරු ගොවීන්ගේ තෝරා ගත් නියැදියෙන් මූලික දත්ත එක් රැස් කිරීම මෙම අධ්‍යයනයේ දී සිදු කරන ලදී.

මහනුවර ප්‍රදේශයේ ගොවීන්ගෙන් ඉතා අඩු සංඛ්‍යාවක් අස්වනු එකතු කරන අවස්ථාවේදී පරිණත බව පෙන්වීමේ දර්ශක උපයෝගී කර නොගන්නා බව සහ පෙර හා පසු අස්වනු මෙහෙයුම් අනුගමනය නොකරන බවද අනාවරණය විය. මාතලේ ප්‍රදේශයෙන් අනාවරණය වූ ඉතාම සුවිශේෂී සොයා ගැනීම වූයේ එහි පලතුරු ගොවීන් ගෙන් 75%ක් අඩුම පසු අස්වනු හානියක් හා ඉහළම ලාභයක් ලබා දෙන TJC අඹ ප්‍රභේදය වගා කිරීමට පෙළඹී ඇති බවයි. දඹුල්ල ප්‍රදේශයේ ගොවීන්ගෙන් බහුතරය අඹ (TJC ප්‍රභේදය) හා පැපොල් (රෙඩ් ලේඩි ප්‍රභේදය) වගා කරති. සාපේක්ෂව වඩා ඉහළ මිලක් ලබා දෙන බැවින් කෙසෙල් වර්ග අතරින් "සීනි" හා "ඇඹුල්" ප්‍රභේද බහුතරයක් විසින් වගා කරනු ලැබේ. අනුරාධපුර ප්‍රදේශයේ ඉහළම විභවතාව පැපොල් වලට ඇති අතර ගොවීහු ඉතා හොඳ මිලක් ලබති. මෙම ප්‍රදේශයේ ගොවීන් ගෙන් 50%ක් පරිණත වීම පෙන්වන දර්ශක භාවිතා කරති. අඹ වලට 25%ක් පමණ වන කැපී පෙනෙන පසු අස්වනු හානියක් පවතී.

### පලතුරු ගම්මාන ඇගයීම (ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන 2016 - 2018)

පලතුරු නිෂ්පාදනය හා රට තුළ පලතුරු සුලභතාව ඇති කිරීමට එක් එක් ග්‍රාම නිලධාරි වසමෙහි පලතුරු ගම්මාන පිහිටුවීමේ ව්‍යාපෘතියක් ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන (2016 - 2018) මඟින් ආරම්භ කරන ලදී. 2016 වර්ෂය තුළ, පලතුරු වර්ග 18ක් නියෝජනය කරන පලතුරු ගම්මාන 1373ක් ස්ථාපනය කරන ලදී. පළමු අදියරේදී පලතුරු ගම්මාන 31ක් අතර ඇගයීම් සිදු කරන ලදී. මෙම පලතුරු ගම්මාන දිස්ත්‍රික්ක 13ක (කොළඹ, මහනුවර, මාතලේ මාතර, රත්නපුර, හම්බන්තොට, කළුතර, නුවරඑළිය, මොණරාගල, කෑගල්ල, ගම්පහ සහ බදුල්ල) පිහිටුවා ඇති අතර ඒවා රඹුටන්-1, අනෝදා-9, පැපොල්-1, මැංගුස්-3, පැණි දොඩම්-6, අඹ-2, පැෂන් ෆෲට්-1, දිවුල්-2, ජම්නාරන්-1, අන්නාසි-2, දූරියන්-2 සහ පෙයාස්-1 වශයෙන් වූ පලතුරු වර්ග 12ක් නියෝජනය කරයි. අධ්‍යයනයෙන් අනාවරණය වූයේ අන්නාසි ගම්මාන වල හැර අනෙත් ඒවායේ සමස්ථ පැල නියැදියෙන් (පැල 18,987) 70%ක් නිරීක්ෂණ ගමන් වාර වලදී සජීවී ව පැවති බවයි. ඉන් වැඩි දුරටත් අනාවරණය වූයේ පැල කිරීමට පෙර හා පැල කිරීමෙන් පසු සමස්ථ පැල නියැදියෙන් 16%ක් මිය ගිය අන්නාසි ගම්මාන (ගම්පහ) සම්බන්ධයෙන් නම් දක්නට ලැබුණේ පැල වලින් 90%ක් ක්ෂේත්‍රයේ වර්ධනය වූ බවයි. සැම පැණි දොඩම්, දිවුල්, ජම්නාරන් හා අඹ නියැදි වලින් පැල 70%කට වඩා ක්ෂේත්‍රයේ පැල වූ බව ප්‍රතිඵල වලින් අනාවරණය විය. රඹුටන්, පැෂන් ෆෲට් හා අනෝදා වල සමාන්‍ය සජීවී පැළ අනුපාතය 68%ක් වන බවට ගණන් බලන ලදී. අනෙත් ඒවාට සාපේක්ෂව ඉතා අඩු මට්ටමක් වන 50%කට වඩා අඩු සජීවී පැල අනුපාතයක් දූරියන් හා මැංගුස් සම්බන්ධයෙන් නිරීක්ෂණය විය. මෙලෙස පලතුරු පැල හානි වීම සිදු වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දිගු කල් පැවති නියං තත්වය, වන සත්ව හානි හා නුසුදුසු ක්ෂේත්‍ර කළමනාකරණ භාවිතාවන් වේ. ප්‍රතිඵල අනුව ප්‍රතිලාභීන්ට නව තාක්ෂණය හා ක්ෂේත්‍ර කළමනාකරණ භාවිතාවන් හඳුන්වා දී පුහුණුව ලබා දිය යුතු අතර රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීමට සුදුසු කාලය (වැසි කාලය) සළකා බැලීම ද අවශ්‍ය වේ.

## සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය විසින් පවත්වන ලද සම්මන්ත්‍රණ/ වැඩමුළු/ පුහුණු වැඩසටහන්

### විවිධ කමිටු වලට සහභාගිවීම

- සමාජ ආර්ථික හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සමාජ ආර්ථික හා ප්‍රතිපත්ති

විශ්ලේෂණ පිළිබඳ ජාතික කමිටුවේ සාමාජිකයෙකු ලෙස තවදුරටත් කටයුතු කරයි.

- අතිරේක අධ්‍යක්ෂවරයා කෘෂිකර්ම දෙපාර්තමේන්තු මිල කමිටුවේ සභාපති ලෙස තවදුරටත් කටයුතු කරයි.
- අතිරේක අධ්‍යක්ෂවරයා ජාතික වෙළඳ පහසුකරණ කමිටුව (NTFC) සඳහා වූ කෘෂිකර්ම දෙපාර්තමේන්තු වෙළඳ පහසුකරණ ක්‍රියාකාරී කණ්ඩායමෙහි කටයුතු කළේය.

## බෝග පුරෝකතනය

සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයේ මාසික ප්‍රකාශනයක් වන 'බෝග පුරෝකතනය' නම් ප්‍රකාශනය වී, වෙනත් ක්ෂේත්‍ර බෝග හා එළවළු වගා වල මාසික ප්‍රගතිය නියාමනය කරයි. මෙම වාර්තාව, බෝග වගාව, නිෂ්පාදනය පුරෝකතනය කිරීම, නිෂ්පාදනයේ ප්‍රාදේශීය ව්‍යාප්තිය, අස්වනු නෙළීමේ කාලසීමා, සීමාන්තික කාලගුණ තත්ව, පළිබෝධ හා රෝග යනාදිය පිළිබඳව පවතින තත්වයට අදාළ තොරතුරු සපයයි. ජාතික මට්ටමේ ප්‍රධාන ප්‍රතිපත්ති තීරණයන්ට එළඹීමට විවිධ පාර්ශ්වකරුවන්ට මහ පෙන්වීම මෙ මගින් සිදු කෙරේ. 2016/17 මහ අවසන් භාගය, 2017 යල, 2017/18 මහ පූර්ව භාගය ආවරණය වන පරිදි බෝග පුරෝකතන වාර්තා 12ක් වර්ෂය තුළදී පිළියෙල කරන ලදී. ක්ෂේත්‍ර මට්ටමෙන් ඇරඹී ජාතික මට්ටම දක්වා දත්ත ගලා යෑමේ කාර්යක්ෂමතාව ඉහළ නංවන "බෝග පුරෝකතන තොරතුරු පද්ධතිය" ලෙස නම් කරන ලද මෘදුකාංගයක් ජාතික කෘෂිකාර්මික තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ (NAICC) සහාය ඇතිව බෝග පුරෝකතන ඒකකය විසින් ගොඩ නගන ලදී. පද්ධතිය මගින් බෝගවල පවතින තත්වයට අදාළව අවශ්‍ය වන සියළු තොරතුරු උත්පාදනය කෙරෙයි. බෝග පුරෝකතන ඒකකය, NAICC හා මහවැලි ඇතුළු දීප ව්‍යාප්ත කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සහාය ඇතිව දැනුම්වත් කිරීමේ වැඩමුළු මාලාවක් පැවැත්වීය.

## සපයන ලද ප්‍රතිපත්ති මාර්ගෝපදේශනය

ප්‍රධාන ආහාර බෝග පිළිබඳව ආහාර සුරක්ෂිතතා තත්වය හා දේශීය ගොවිපල ආදායම පවත්වා ගැනීමට උපකාර කරන ප්‍රතිපත්ති මර්ගෝපදේශන ඇතුළත් ස්ථානීය හා පූර්ව අනතුරු හැඟවීමේ වාර්තා විශාල ප්‍රමාණයක් සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය විසින් සකස් කරන ලද අතර එම තොරතුරු ජීවන වියදම් කමිටුවේ රැස්වීම් වලදී ඉදිරිපත් කරන ලදී.

## ව්‍යාපෘති සැකසුම හා බාරදීම සම්බන්ධීකරණය

ජාතික ආහාර නිෂ්පාදන සැලස්ම (NFPP) ක්‍රියාවට නැංවීම 2017 වර්ෂය සඳහා ද සිදු කරන ලදී. සියළු ව්‍යාපෘති, ආහාර බෝග නිෂ්පාදන හා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහනට අයත් වන අතර එක් එක් මෙහෙයුම් ක්ෂේත්‍ර යටතට ගැනෙන ව්‍යාපෘති වලින් වැඩි ප්‍රමාණයක් 2016 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබේ. ඒ අනුව, විවිධ මෙහෙයුම් ක්ෂේත්‍ර යටතට ගැනෙන යෝජනා 12ක් එකතු කර ආකෘති පරීක්ෂා කර, තුලනය කොට, සම්පාදනය කරන ලදුව කෘෂිකර්ම අමාත්‍යාංශයට භාර දෙන ලදී. යෙදවුම් කළමනාකරණය, ස්වභාවික සම්පත් කළමනාකරණය හා දේශගුණික වෙනස්කම් වලට අනුවර්තනය වීම, තරුණ හා කාන්තා සහභාගිත්වය, දැනුම කළමනාකරණය, ආහාර සුරක්ෂිතතාව, පාරිභෝගික සෞඛ්‍ය හා තෘප්තිමත් භාවය, සහ පර්යේෂණ හා තාක්ෂණවේද සංවර්ධනය යන අංශ මෙහෙයුම් ප්‍රදේශ යටතට ගැනේ. රාජ්‍ය හා පුද්ගලික අංශ වල සහභාගිත්වය මගින් ගුණාත්මක බීජ පහසුවෙන් ලබා ගැනීම තහවුරු කිරීම,

කෘෂි - ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම, තරුණ හා කාන්තා කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන, ඊ - කෘෂිකර්ම හා තොරතුරු පද්ධතිය මගින් කාර්යක්ෂමව සේවාවන් හුවමාරු වන ක්‍රමයක් ගොඩ නැගීම හා බහුමාධ්‍ය ප්‍රවේශය මගින් ජනතාවට සේවාවන් ලබා ගැනීම පහසු කිරීම, පලිබෝධනාශක භාවිතාව අවම කිරීම, ආහාර නිෂ්පාදනයේදී ප්‍රමාණය ඉක්මවූ ලෙස රසායනික පොහොර හා වෙනත් හානිදායක ද්‍රව්‍ය භාවිතා කිරීම අඩු කිරීම හා ඒ පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම යන කාරණා පිළිබඳව මෙම ව්‍යාපෘති වල මූලික අවධානය යොමු විය.

### වැඩසටහන්/ ව්‍යාපෘති සම්බන්ධීකරණය

සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය යටතේ වූ ව්‍යාපෘති හා අවබෝධතා ගිවිසුම් සම්බන්ධීකරණය කිරීම තවදුරටත් සිදුකරයි.

### ජාතික වශයෙන් වැදගත් වන කේන්ද්‍රීය ස්ථාන වල කටයුතු කිරීම

- බහු ආංශික වෙළඳාම හා ආර්ථික සහයෝගිතාව සඳහා වූ බෙංගාල බොක්ක මූලාරම්භයෙහි කෘෂිකර්මය පිළිබඳ ජාතික කේන්ද්‍රීය ස්ථානය ලෙස සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා කටයුතු කළේය.
- දුප්පත්කම පිටු දැකීම හා තිරසාර කෘෂිකර්මය සඳහා වූ මධ්‍යස්ථානයේ ජාතික කේන්ද්‍රීය ස්ථානය ලෙස සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා කටයුතු කළේය.

## 2018 වර්ෂය සඳහා සැලැස්ම

- වර්තමාන කෘෂිකාර්මික තොරතුරු ඇතුළත් පොත් පිංචක් සම්පාදනය කිරීම - AgStat. XIV.
- ශ්‍රී ලංකාව සඳහා “බෝග පුරෝකතන තොරතුරු පද්ධතියක්” ගොඩ නැගීම.
- බෝග පුරෝකතන වාර්තා 2017/18 මහ, 2018 යල, 2018/19 මහ
- වගා කිරීමේ පිරිවැය පිළිබඳ අධ්‍යයනය. 2017 යල, 2017/18 මහ, 2018 යල

### සමාජ ආර්ථික පර්යේෂණ

- **නිෂ්පාදන ආර්ථික විද්‍යාව** - ඵලදායිතාව හා වාසිදායක බව පිළිබඳ විශ්ලේෂණ, මිනුම් වල අර්ථ ක්‍රම, නිෂ්පාදන පුරෝකතනය
- **කෘෂිකර්ම අලෙවිකරණය හා මිල විශ්ලේෂණය** - අගය දාම විශ්ලේෂණය, අලෙවිකරණ පද්ධති, මිල විශ්ලේෂණය, පාරිභෝගික හැසිරීම
- **ග්‍රාමීය සංවර්ධනය** - කෘෂිකාර්මික ණය / ක්ෂුද්‍ර මූල්‍ය, තාක්ෂණ ප්‍රචාරණය හා ප්‍රතිග්‍රහණය, ලිංගභේද ප්‍රතිමාන, කෘෂිකර්ම රක්ෂණය
- **කෘෂිකර්ම ප්‍රතිපත්ති විශ්ලේෂණය** - යෙදවුම්, භූමිය, මිල, ආහාර, පර්යේෂණ හා වෙළඳ ප්‍රතිපත්ති, තරඟකාරිත්වය
- **කෘෂිකර්ම ව්‍යාපෘති විශ්ලේෂණය හා සැලසුම්කරණය** - සැලසුම්කරණය, ව්‍යාපෘති සමායෝජනය, සැකසීම, තක්සේරු කිරීම හා ඇගයීම
- **අන්තර්ජාතික වෙළඳාම හා අන්තර්ජාතික සබඳතා** - වෙළඳ ගිවිසුම් පිළිබඳ අධ්‍යයනය, ලෝක හා කලාපීය නැඹුරුතා,

අන්තර්ජාතික සහයෝගීතාව හා අවබෝධතා ගිවිසුම්

- **පාරිසරික හා සම්පත් ආර්ථික විද්‍යාව** - කාලගුණ වෙනස්කම් හා තිරසාර කෘෂිකර්මය පිළිබඳ අධ්‍යයන, බාහිරස්ථ දේ

## කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | 00 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 | 00 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 02 | 00 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | 23 | 12 |
| පරිපාලන නිලධාරි | 01 | 00 |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 21 | 11 |
| සංඛ්‍යාලේඛන සහකාර | 02 | 00 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 05 | 00 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්මය) | 11 | 00 |
| සංවර්ධන නිලධාරි | 08 | 12 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 08 | 07 |
| තාක්ෂණික සහායක | 03 | 03 |
| රියදුරු | 06 | 06 |
| කාර්යාල කාර්ය සහායක | 01 | 01 |
| කම්කරු | 04 | 03 |
| කොන්ත්‍රාත් කම්කරු | 02 | 01 |
| **එකතුව** | **99** | **56** |

# 3.1 ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය - පේරාදෙණිය

කෘෂිකාර්මික ව්‍යාප්තිය, අධ්‍යාපනය සහ පුහුණුව තුලින් කෘෂිකාර්මික විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ දැක්ම වන අතර ගොවීන් පුමුඛ සේවාලාභීන්ගේ ආර්ථික සහ සමාජීය පුනර්ජීවය සහතික කිරීම සඳහා වූ විෂය පථයට අයත් බෝග වලට ගැලපෙන්නා වූ තාක්ෂණික අවශ්‍යතා හඳුනා ගෙන කෘෂිකාර්මික ව්‍යාප්තිය, පුහුණු කිරීම් සහ අධ්‍යාපනය තුලින් මානව සම්පත් සංවර්ධනය කරමින් තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් උදෙසා කැපවීම මෙම මධ්‍යස්ථානයේ මෙහෙවර වේ.

ගොවි ප්‍රජාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම මෙන්ම මෙරට ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස ආහාර බෝග අංශයේ ඉහළම ඵලදායිතා මට්ටම සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙම මධ්‍යස්ථානයේ කාර්යඵල ප්‍රධාන අංශ 4ක් වන කෘෂිකර්ම ව්‍යාප්තිය, පුහුණු කිරීම්, කෘෂිකාර්මික අධ්‍යාපනය සහ විභාග කෙරෙහි කේන්ද්‍රගතව පවතින අතර අදාළ ඒකක මගින් ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරමාර්ථ සාක්ෂාත් කරගනු පිණිස පහත දැක්වෙන කාර්යයන් ඉටු කරනු ලබයි.

- දිවයින පුරා වී, අනෙකුත් ක්ෂේත්‍ර බෝග පලතුරු සහ එළවළු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අන්තර් පළාත් ඒකක 06 මගින් ප්‍රධාන ජල සම්පාදන ක්‍රම යටතේ ඍජු ව්‍යාප්ති වැඩසටහන් මෙහෙය වීම.
- පළාත් සභා සහ මහවැලි ප්‍රදේශ සමඟ එක්ව සිදු කරන සහයෝගිතා ව්‍යාප්ති වැඩසටහන්.
- ව්‍යාප්ති නිලධාරීන්, ගොවීන්, ව්‍යවසායකයන් සහ වෙනත් පුද්ගලයින් සඳහා පුහුණු වැඩසටහන් සේවා සංස්කරණ අභ්‍යාස ආයතන 03ක, දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන 04ක සහ ගොවිපළ යාන්ත්‍රිකරණ පුහුණු මධ්‍යස්ථානය යන ස්ථාන වලදී පැවැත්වීම.
- කුණ්ඩසාලේ, පැල්වෙහෙර, අඟුණකොළපැලැස්ස, වවුනියාව සහ කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලවලදී 'කෘෂිකාර්මික නිෂ්පාදනය සහ තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා' පාඨමාලාව (NVQ - 6 මට්ටම) මෙහෙය වීම.
- වාරියපොල, ලබුදූව, බිබිල පාලමුණ, අනුරාධපුර සහ පරන්තන් යන කෘෂිකර්ම විද්‍යාලවලදී 'කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා' පාඨමාලාව (NVQ -5 මට්ටම) මෙහෙය වීම.
- ලබුදූව සහ වාරියපොල කෘෂිකර්ම විද්‍යාල, බිබිලේ උද්‍යාන බෝග පුහුණු සහ සංවර්ධන ආයතනය, සේවා සංස්කරණ අභ්‍යාස ආයතන 02ක (අඟුණකොළපැලැස්ස හා හංසයාපාලම) සහ දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන 02කදී (වීරවිල හා පොළොන්නරුව) NVQ 3 - 4 මට්ටමේ කෘෂිකාර්මික පාඨමාලා මෙහෙය වීම.
- තරුණ ගොවි සමාජ කටයුතු මෙහෙය වීම.
- බිඳුණුවැව මී මැසි සංවර්ධන ඒකකය මගින් මී මැසි සංවර්ධන කටයුතු මෙහෙය වීම.
- කෘෂි ව්‍යාපාර උපදේශන, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) ක්ෂුද්‍ර ජල සම්පාදන සහ ආරක්ෂිත කෘෂිකර්මය පිළිබඳ වැඩසටහන් මෙහෙය වීම.

- කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් මෙහෙය වීම, ‘හෙළ බොජුන්’ අලෙවි සැල් පිහිටුවමින් සහ ඒවා පවත්වාගෙන යමින් මහජනතාව අතර දේශීය ආහාර පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම.
- බිබිලේ උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනයේ උද්‍යාන බෝග සංවර්ධන සහ පුහුණු කටයුතු.
- කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික/ ජාතික ඩිප්ලෝමා පාඨමාලා වල විභාග, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ විභාග, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම.
- මාකඳුර, කාබනික කෘෂිකර්මාන්තය සඳහා වූ විශිෂ්ඨතා කේන්ද්‍රයේදී කාබනික පොහොර නිෂ්පාදනය හා උපයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.

## අයවැය

**වගු අංක 3.1.1: වාර්ෂික අයවැය - 2017**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 120,657,472 | 85,504,730 | 71 |
| මූලධන | 143,640,261 | 125,553,155 | 87 |
| ව්‍යාපෘති | | | |
| *කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ අරමුදල්* | | | |
| • ඉඩම් හා ඉඩම් සංවර්ධනය | 13,000,000 | 12,863,658 | 99 |
| • කෘෂි විද්‍යාල සංවර්ධනය | 55,000,000 | 47,196,676 | 86 |
| *අමාත්‍යංශ වැය ශීර්ෂ යටතේ අරමුදල්* | | | |
| • ශ්‍රී ලංකාව තුල දේශිය වශයෙන් ගැලපෙන GAP වැඩසටහන් හඳුන්වා දීම. | 1,600,000 | 900,000 | 56 |
| • AFACI GAP විවිධ දිස්ත්‍රික්ක තුල වෙළඳපොල වෙත යැවිය හැකි අස්වනු වලට අනුව වත්මන් පොහොර යෙදීමේ ප්‍රොටෝකෝල ඇගයීම. | 238,400 | 238,400 | 100 |
| • එළවළු වගාව සඳහා තිරසාර වූ පැළෑටි පෝෂක කළමනාකරණ පැකේජ සකස් කිරීම. | 800,000 | 786,000 | 98 |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන - 2017 (සහල්) | 13,390,000 | 13,057,000 | 98 |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන - 2017 (මිරිස්) | 16,320,000 | 14,379,100 | 88 |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන - 2017 (බඩඉරිඟු) | 57,707,000 | 57,641,000 | 100 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන - 2017 (සෝයා) | 79,320,000 | 77,107,500 | 97 |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන - 2017 (මුං) | 2,780,000 | 2,340,400 | 84 |
| • තරුණ ආකර්ෂණය සමඟ වාණිජ ගොවිපළ සහ කෘෂි ව්‍යාපාර | 5,800,000 | 4,270,000 | 74 |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන 2017 : GAP හරහා දේශිය සහ අපනයන වෙළඳපල වෙත යවන කෘෂි නිෂ්පාදන ගුණාත්මක තත්වය හා සුරක්ෂිතතාව තහවුරු කිරීම | 27,800,000 | 23,760,000 | 85 |
| • ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන 2017 (හෙළ බොජුන් හරහා වත්මන් ආහාර රටාව වෙනස් කිරීම) | 57,000,000 | 43,477,198 | 76 |
| • මී මැසි පාලන සංවර්ධන වැඩසටහන | 15,000,000 | 9,093,500 | 61 |
| • කාබනික පොහොර නිෂ්පාදනය සහ උපයෝගිතාව ප්‍රවර්ධන කිරීම | 15,500,000 | 11,992,000 | 77 |
| • මාකඳුර, කාබනික පොහොර සඳහා විශිෂ්ඨතා කේන්ද්‍රය. | 16,000,000 | 7,533,000 | 47 |
| • මාකඳුර, කාබනික පොහොර සඳහා විශිෂ්ඨතා කේන්ද්‍රය කුසලතා සංවර්ධන වැඩසටහන (FMTC) | 59,086,200 | 51,156,905 | 87 |
| **එකතුව** | **700,639,333** | **588,850,222** | **84** |

## ප්‍රගතිය

### විශේෂ ව්‍යාපෘති

#### 1. කෘෂිකර්ම විද්‍යාල සංවර්ධන වැඩසටහන

කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වෙහෙර, වවුනියාව, කරපිංච යන ප්‍රදේශවල පිහිටි කෘෂි විද්‍යාල 5ක (NVQ level 6) යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය 2013 වසරේදී ආරම්භ කර මේ දක්වා ක්‍රියාත්මක කෙරේ. කරපිංච කෘෂි විද්‍යාලයේ දෙමහල් අධ්‍යයන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2017 වසරේදී නිම කරන ලදී. කුණ්ඩසාලේ කෘෂි විද්‍යාලයේ විජේරාම නේවාසිකාගාරයේ අළුත්වැඩියා කටයුතු හා තෙමහල් අධ්‍යයන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ද නිම කරන ලදී. වවුනියා කෘෂි විද්‍යාලයේ මුළුතැන්ගෙය, භෝජනාගාරය, ගොවිපල කාර්යාල සහ ප්‍රධාන ගබඩා සංකීර්ණයේ වහල අළුත් වැඩියා කිරීමේ කටයුතු ද 2017 වසරේදී නිම කෙරිණි. පැල්වෙහෙර කෘෂි විද්‍යාලයේ විද්‍යාගාර පහසුකම් සහ

නේවාසිකාගාර පහසුකම් වැඩිදියුණු කරන ලදී. අඟුණකොළපැලැස්ස කෘෂි විද්‍යාලයේ ශ්‍රවණාගාරයක් සහිත දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම 2017 වසරේදී ආරම්භ කරන ලද අතර 2018 වසරේදී ද එම කාර්ය අඛණ්ඩව සිදු වනු ඇත.

### 2. නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ ගොවිපළ යාන්ත්‍රිකරණ පුහුණු මධ්‍යස්ථානය සඳහා නේවාසිකාගාරය ඉදිකිරීම

මෙම විශේෂ ව්‍යාපෘතිය අනුරාධපුර ගොවිපළ යාන්ත්‍රිකරණ පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකාගාර පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2015 වර්ෂයේදී ආරම්භ කර මේ දක්වා ක්‍රියාත්මක කෙරේ. නේවාසිකාගාර ඒකක 07ක් ඉදිකිරීම 2015 වසරේදී ආරම්භ කරන ලද අතර එම කටයුතු 2016 සහ 2017 වසර දක්වා අඛණ්ඩව සිදු කරන ලදී. මෙම නේවාසිකාගාර ඒකක 07 තුල එක් ඒකකයක අභ්‍යාසලාභීන් 12 දෙනෙකු බැගින් අභ්‍යසලාභීන් 84 දෙනෙකු සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීමට හැක. සමාලෝචිත වසර තුල නේවාසිකාගාර 7ක් ඉදිකිරීම් කටයුතු ඒ අවට භූමි අලංකරණය සහ ගොඩනැගිලි වල අත්‍යවශ්‍ය අළුත්වැඩියා කටයුතු ද නිම කරන ලදී.

### 3. ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන - වී

මෙම ව්‍යාපෘතියේ අභිප්‍රාය වනුයේ පරිසර හිතකාමී, ඉහළ අස්වනු ලබා දෙන වගා පිළිවෙත් අනුගමය කිරීම සඳහා ගොවීන් අභිප්‍රේරණය කිරීමයි. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා සී සෑම, බීජ වැපිරීම, පැළ සිටුවීම සහ වී වගාවේ වල් පැළ ඉවත් කිරීම සඳහා කෘෂි යන්ත්‍ර හඳුන්වාදෙන ලදී. මෙම යන්ත්‍රසූත්‍ර හඳුන්වාදීම පරිසර දූෂණය අවම කිරීමට ආධාර වනවා පමණක් නොව වගා කටයුතුවල විවිධ අවස්ථා වලදී මතුවන කම්කරු හිඟයටද පිළියමක් වෙයි. මෙම ව්‍යාපෘතිය යටතේ බීජ පැළ විසුරුවීමේ (පැරෂුට් ක්‍රමය) පිළිබඳ දැනුවත් කිරීම සඳහා ආදර්ශන පවත්වන ලදී. ආදර්ශන ස්ථාපිත කිරීම සඳහා අන්තර් පළාත් සහ පළාත් සඳහා පිළිවෙලින් පැරෂුට් තැටි 33,700ක් සහ 67,940 බැගින් බෙදා හරින ලදී. යූරියා යෙදීම කාර්යක්ෂම කිරීම සඳහා පත්‍ර වර්ණ සටහන් 1,585ක් ගොවීන් අතර බෙදා හරින ලදී.

බීජ පැළ වැපිරීමේ ක්‍රමය, පත්‍ර වර්ණ සටහන් සහ කාබනික පොහොර භාවිතයෙන් කාර්යක්ෂම පොහොර කළමනාකරණය සම්බන්ධයෙන් ගොවීන් සහ නිලධාරීන් සඳහා දැනුම සහ නිපුණතාවය ලබා දීම සඳහා පුහුණු වැඩසටහන් 323ක් පවත්වන ලදී.

පැළ සිටුවීමේ යන්ත්‍ර භාවිතයෙන් පැළ සිටුවීම පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම සඳහා ආදර්ශන 148ක් පවත්වන ලදී. අනුරාධපුර අන්තර් පළාත් ප්‍රදේශය තුල කුඹුරු අක්කර 20ක් ආවරණය කරමින් කාබනික දියර පොහොර භාවිතය පිළිබඳ වූ ආදර්ශන පැවැත්වීම සඳහා අත්හදා බැලීම් 20ක් ස්ථාපිත කරන ලදී. නියං තත්ත්වය හේතුවෙන් අඩපන වූ බීජ වී නිෂ්පාදනය නගා සිටුවීමේ අරමුණින් බිත්තර වී බුසල් 3,582ක් බෙදා හරින ලදී. කුඹුරු අක්කර 55ක් සඳහා බිත්තර වී නිෂ්පාදනය කරනු ලබන ගොවීන් 55ක් ලියාපදිංචි කරන ලදී. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) කාර්යාල සහ කෘෂි විද්‍යාල වෙත ලබාදීම සඳහා ගොයම් සිටුවීමේ යන්ත්‍ර සහ බලවේග වල් නෙලීමේ යන්ත්‍ර මිලදී ගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ගොවිපළ යාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථානය වෙත සූක්ෂම මට්ටම් කිරීමේ උපකරණ 2ක් හා ගොවිපළ යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය වෙත නියර බැඳීමේ යන්ත්‍රයක් ද ලබා දෙන ලදී.

## 4. ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන මිරිස් ගම්මාන

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථ වනුයේ වියළි මිරිස් ආනයනය අවම කරමින්, වසර පුරාම මිරිස් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීමත්, අවාරයේ වගාව වැඩි කිරීමත්ය.

ජලය භාවිත කිරීම කාර්යක්ෂමව සිදු කිරීමට ඉඩ සලසාලනු වස්, ජල සම්පාදන කට්ටල සහ ජල පොම්ප ලබාදීම 2016 වසරේදී ආරම්භ කරන ලද අතර එම කාර්යය 2017 වසරේදී නිම කරන ලදී. 50%ක ගොවි දායකත්වය යටතේ අක්කර ½ විසිරුම් ජලසම්පාදන කට්ටල සහ විදුලි/ඉන්ධන ජල පොම්ප ලබා දෙන ලදී. විදුලි ජල පොම්ප 65ක්ද, ඉන්ධන ජල පොම්ප 99ක්ද, විසිරුම් ජලසම්පාදන ඒකක 69ක්ද ගොවීන් වෙත ලබා දෙන ලදී. 50% ගොවි දායකත්වය යටතේ පොලිතීන් මලු 337,950ක් ලබා දෙන ලදී. වගා වපසරිය ඉහල නැංවීමේ අපේක්ෂාවෙන් බීජ කි.ග්‍රෑ. 215ක් ගොවීන් වෙත නොමිලයේ ලබා දෙන ලදී. වාණිජ මිරිස් ගොවිපල ස්ථාපිත කිරීමේ අරමුණින් තවාන් තැටි 9,165ක් ලබා දෙන ලදී. මිරිස් වගාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් නව වගා ප්‍රදේශවල භූමි සැකසීම සඳහා වූ වියදම ගොවීන් වෙත ලබා දෙන ලදී. භූමිය හෙක්ටයාරයක් සකස් කිරීම සඳහා රු. 10,000ක් ලබා දෙන ලද අතර භූමි හෙක්ටයාර 424.75ක කටයුතු නිම කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් තවාන් කළමනාකරණය, ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත්, ක්ෂුද්‍ර ජල සම්පාදනය, කෘමි සහ රෝග කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් ගොවීන් සඳහා ක්‍රියාත්මක කරන ලදී. ක්‍රියාත්මක කරන ලද මුළු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 147කි. අදාල වසර තුල ක්ෂේත්‍ර දින 10ක් සම්පූර්ණ කරන ලද අතර, මිරිස් කොළ කොඩවීමේ සංකීර්ණය පාලනය කිරීමේ ආදර්ශන 14ක් ස්ථාපිත කරන ලදී. (අක්කර 1/8 ආදර්ශන)

## 5. ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන - සෝයා බෝංචි

මෙම ව්‍යාපෘතියේ අරමුණු වනුයේ සෝයා වගාව ජනප්‍රිය කරවීම සහ ජාතික අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා නිෂ්පාදිතාවය ඉහල නැංවීමයි. 2016 වසරේදී ආරම්භ කරන ලද කෘෂි ළිං 05ක් ඉදිකිරීමේ කටයුතු 2017 දී නිම කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ඉඩම් හෙක්ටයාර 6,477ක් සඳහා නොමිලයේ බීජ ලබා දෙන ලදී. හෙක්ටයාර 1,760ක භූමි වපසරියක් සඳහා නොමිලයේ ආමුකුලන සපයා දෙන ලදී. නව වගා ප්‍රදේශ තුල භූමි සැකසීම සඳහා හෙක්ටෙයාරයකට රු. 4000 බැගින් ලබාදෙන ලද අතර, හෙක්. 500ක භූමි සැකසීමේ කටයුතු සිදුකරන ලදී. හෙක්ටයාර 164ක භූමි ප්‍රදේශයක් තුල සිදුකරන ලද කොන්ත්‍රාත් බීජ නිෂ්පාදනය සඳහා මුලික බීජ සහ ලියාපදිංචි ගාස්තු ලබා දෙන ලදී. මෙම වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමට ගොවීන් සඳහා පුහුණු පංති 40ක් පවත්වන ලදී. ගොයම් සිටුවීමේ යන්ත්‍ර 8ක්, බීජ වැපිරීමේ යන්ත්‍ර 4ක් සහ අස්වනු නෙලන යන්ත්‍ර 2ක් නොමිලේ ගොවි සංවිධානය වෙත ලබා දෙන ලදී.

## 6. ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන - බඩඉරිඟු

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ බඩඉරිඟු වගා වපසරිය ඉහල දැමීම සහ නිෂ්පාදිතාව ඉහල නැංවීම තුලින් බඩඉරිඟු ආනයන ප්‍රමාණය අවම කිරීමයි. යල කන්නයේ කුඹුරුවල බඩඉරිඟු වගාව ස්ථාපිත කිරීම සඳහා 50%ක ගොවි දායකත්වය යටතේ හෙක්. 314ක භූමි ප්‍රමාණයක් සඳහා බීජ ලබාදෙන ලදී. 50% ගොවි දායකත්වය යටතේ මහ කන්නයේ දේශීය සහ ආනයනික දෙමුහුම් බීජ සපයමින් ආදර්ශන ස්ථාපිත කරන ලදී. පසුගිය යල කන්නයේ මුහුණ දීමට සිදුවූ නියං තත්ත්වයේ බලපෑම අවම කිරීමේ අපේක්ෂාවෙන්, මහ කන්නයේදී නව ප්‍රදේශවල බඩඉරිඟු වගාව ස්ථාපිත කිරීම සඳහා 50% ගොවි දායකත්යට යටතේ

බඩඉරිඟු බීජ සපයන ලදී. හෙක්. 800ක භූමි වපසරියක් තුල ප්‍රභේදීය ආදර්ශන ස්ථාපිත කරමින් දේශීය දෙමුහුම් බීජ ජනප්‍රිය කරවීම සඳහා දේශීය දෙමුහුම් බඩඉරිඟු බීජ (MI බඩඉරිඟු දෙමුහුම් 01 ප්‍රභේදයේ බීජ) නොමිලයේ ලබා දෙන ලදී. වගා පිරිවැය අවම කිරීමේ අරමුණින් යුතුව යාන්ත්‍රිකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා ගොවි සංවිධාන වෙත කෘෂි යන්ත්‍ර නොමිලයේ සපයන ලදී. රෝද 4 ට්‍රැක්ටරයට අමුණා භාවිතා කළ හැකි බීජ වප්කර 03ක්, අතුරුයත් යැමේ උපකරණ 6ක්, කොළ මඩින යන්ත්‍ර 2ක්, වැටි බැඳීමේ යන්ත්‍ර 6ක් ගොවි සංවිධාන වෙත ලබා දෙන ලදී.

පූර්ව හා පසු අස්වනු තාක්ෂණය සම්බන්ධයෙන් දැනුම වැඩිදියුණු කිරීම උදෙසා පුහුණු වැඩසටහන් 120ක් පවත්වන ලදී. “පොප්කෝන්” වගාව ජනප්‍රිය කරවීම අරමුණු කොට ගනිමින් ආදර්ශන ස්ථාපිත කිරීම සඳහා නොමිලයේ බීජ ලබා දෙන ලදී. අනුරාධපුර, කුරුණෑගල හා මොණරාගල, තෝරා ගත් ප්‍රදේශවල සහ හමුදා කඳවුරු කිහිපයක (මැණික් ෆාම්, මැක් ෆාම්, පෙරයකට්ටු සහ වෙල්ලිකුලම් ෆාම්) කොන්ත්‍රාත් බීජ නිපදවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන හෙක්ටෙයාර 12ක භූමි ප්‍රදේශයන් තුල ක්‍රියාත්මක කරන ලද අතර, කොන්ත්‍රාත් වගාකරුවන් වෙත පොහොර, බීජ සහ රසායන ද්‍රව්‍ය නොමිලයේ සපයන ලදී. දේශීය දෙමුහුම් බීජ නිෂ්පාදනය කරන ලද කොන්ත්‍රාත් සහ ලියාපදිංචි බීජ නිෂ්පාදනයන්ගේ නිෂ්පාදන මිලදී ගන්නා ලද අතර, එසේ මිලදී ගත් මුළු බීජ ප්‍රමාණය කි.ග්‍රෑ. 14,077ක් විය.

### 7. ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන - මුං වගාව

මෙම ව්‍යාපාතියේ ප්‍රධාන පරමාර්ථය වනුයේ ජාතික මුං නිෂ්පාදනය ඉහල නැංවීමය. මෙම ව්‍යාපෘතිය තුලින් මුං වගාවේ යෙදී සිටින ගොවීන්ගේ ආදායම ඉහල නැංවීම, රසායනික ද්‍රව්‍ය භාවිතා කිරීම අවම කිරීම, ඵලදායි කෘෂිකර්මාන්තයේ යෙදීම සඳහා කාන්තාවන් ධෛර්යමත් කිරීම, අගය එකතුකල නිෂ්පාදන වැඩි කිරීම, පසු අස්වනු හානිය අවම කිරීම, ගොවීන්ගේ මට්ටමේදී ගබඩා පහසුකම් ඉහළ නැංවීම සහ මුං වගාවේ යාන්ත්‍රිකරණය සිදුකිරීම යන කරුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ලදී.

මෙම ව්‍යාපෘතියේදී සහතික කරන ලද බීජ නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි කල බීජ නොමිලයේ බෙදා දෙන ලදී. මෙහිදි, හෙක්ටයාරයකට කි.ග්‍රෑ.25 බැගින් ලියාපදිංචි කරන ලද බීජ සපයන ලද අතර සහතික කරන ලද බීජ නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා ලද භූමි වපසරිය හෙක්. 131 විය. බීජ ගබඩා කිරීම සඳහා නව තාක්ෂණයක් ලෙස ත්‍රිත්ව ස්ථර සහිත මළු 7500ක් ප්‍රතිලාභීන් 2300ක් අතර නොමිලයේ බෙදා දෙන ලදී. වටිනාකම එකතු කල නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා මුං වගාවේ යෙදි සිටින ගොවි සමාජ 22ක් වෙත ධාන්‍ය ඇඹරීමේ යන්ත්‍ර ලබා දෙන ලදී. වගාවන් යාන්ත්‍රිකරණය කිරීමේ අරමුණින් ගොවි සංවිධාන 10ක් වෙත බීජ වැපිරීමේ යන්ත්‍ර ලබා දෙන ලදී. අස්වනු වැඩි කිරීම සඳහා තාක්ෂණික පැකේජ හඳුන්වා දෙමින් අක්කර 1ක ආදර්ශන ස්ථාපිත කිරීම සඳහා නොමිලයේ බීජ සපයන ලදී. මෙම පැකේජයට බිජ ප්‍රතිකාර කිරීම පේළියට බීජ දැමීම, ඒකාබද්ධ පළිබෝධ පාලනය, බීජ සැකසීම හා ගබඩාකරණය ඇතුලත් වේ. හෙක්ටයාර 189.7 භූමි වපසරියක් ආවරණය කරමින් ස්ථාපිත කරන ලද මුළු ආදර්ශන ප්‍රමාණය 57ක් විය. තාක්ෂණික පැකේජ සහ යෝග්‍ය ගබඩාකරණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 19ක් පවත්වන ලදී. තාක්ෂණික පැකේජ ක්‍රියාත්මක කිරීම පිළිබඳ වු මාධ්‍ය වැඩසටහන් ද අදාල වසර තුලදී නිම කරන ලදී.

### 8. "හෙළ බොජුන්" අලෙවි මධ්‍යස්ථාන හරහා කාන්තා ව්‍යවසායකත්වය බලගැන්වීම.

මෙම ව්‍යාපෘතිය දේශීය ආහාර ප්‍රවර්ධනය කිරීම සහ කාන්තාවන් සඳහා ව්‍යවසායකත්ව හැකියාව ලබාදීමේ පරමාර්ථයෙන් යුතුව ක්‍රියාත්මක කරන ලදී. පදියතලාව, වාකරෙයි සහ කන්තලේ ප්‍රදේශවල 2016 වසරේදී ආරම්භ කරන ලද හෙළ බොජුන්සැල් වල වැඩකටයුතු 2017 වසරේදී නිම කරන ලදී. නිට්ටඹුවේ ඉදිකරන ලද හෙළ බොජුන් අලෙවි සැලේ ඉදිකිරීම කටයුතු නිම කර විවෘත කරන ලදී. මාතර ප්‍රදේශයේ හෙළ බොජුන් අලෙවි සැලේ ඉදිකිරීම් කටයුතු විශාල ප්‍රමාණයක් නිම කර ඇති අතර 2018 වසරේ ජනවාරි මස විවෘත කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය මඟින් ඉහත සඳහන් කරන ලද හෙළ බොජුන් අලෙවි සැල් සඳහා අවශ්‍ය මූලික උපකරණ සපයා දෙන ලදී. ත්‍රිකුණාමලය සහ හලාවත හෙළ බොජුන් ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. ගලහ හන්දිය, ගන්නොරුව සහ කුණ්ඩසාලේ දැනටමත් ස්ථාපිත කර තිබෙන හෙළ බොජුන් අලෙවි සැල් වල අළුත් වැඩියා කටයුතු 2017 වසරේදී අවසන් කරන ලදී. දිවයින පුරා කාන්තාවන් සඳහා ව්‍යවසායකත්ව හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් 57ක් පවත්වන ලදී.

### 9. මී මැසි පාලනය ඉහල නැංවීමේ වැඩසටහන්

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වනුයේ ගෙවතු වගා මට්ටමෙන් මී මැසි පාලන කටයුතු ජනප්‍රිය කරවීම තුලින් පවුලේ මී පැණි අවශ්‍යතාව සපුරාලීම සහ බෝග පරාගනය ඉහල නැංවීමයි. මෙම ව්‍යාපෘතිය මඟින් සුළු පරිමාණයෙන් මී මැසි පාලනයේ යෙදි සිටින්නන් සංවිධානය කිරීම සහ ලාභදායි කර්මාන්තයක් ලෙස මී මැසි පාලනය සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය මගින් අන්තර් පළාත්, පළාත් සහ මහවැලි කලාප ආවරණය කරමින් මී මැසි ගම්මාන 107ක් ස්ථාපිත කරන ලදී. සෑම ගමක්ම ආවරණය කරමින් ප්‍රතිලාභීන් 20 දෙනෙකු බැගින් ප්‍රතිලාභීන් 2,140ක් තෝරාගනු ලැබ පුහුණු කරන ලදී. සෑම ප්‍රතිලාභියෙකු සඳහාම මී මැසි පෙට්ටියක්, දුම් විසිරුවනයක් සහ මී මැසි ජනපදයක් සපයන ලදී. ස්ථාපිත කරන ලද මී මැසි ගම්මාන අතුරින් සාමාජිකයන් 100 දෙනෙකු තෝරා ඔවුන් බිඳුණුවැව මී මැසි සංවර්ධන ඒකකයේදී මී මැසි පාලන තාක්ෂණික නිලධාරීන් ලෙස පුහුණු කරන ලදී. තෝරාගත් ගම්මාන 10ක සාමාජිකයන් සඳහා මී මැසි රැජිනන් බෝ කිරීමේ පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර ඔවුන්ගේ ගම්මාන තුල එම කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාමට උපකාර කරන ලදී. මී මැසි පාලනය සිදු කරන ගම්මාන අධීක්ෂණය කරනු ලබන ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. බිඳුනු වැව සහ වාරියපොල මී මැසි සංවර්ධන ඒකකවල පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී. 2017 වසර තුලදී මී මැසි සංවර්ධනය ඒකක 2ක දේශන ශාලා ඉදිකිරීමේ කටයුතු නිම කරන ලදී. මී මැසි පාලකයන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ප්‍රයෝජනවත් වන මී මැසි පාලනය පිළිබඳ වූ අත් පොතක් සකස් කරන ලද අතර මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රකාශයට පත් කරන ලදී.

### 10. යහපත් කෘෂි පිළිවෙත් (GAP) හෝ කාබනික පිළිවෙත් යටතේ යටතේ අපනයනය කරනු ලබන කෘෂි ආහාර සහතික කිරීම ඉලක්ක කොට ගත් කෘෂි ව්‍යාපාර උපදේශන වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ යහපත් කෘෂි පිළිවෙත් සහතිකය ලද වාණිජ මට්ටමේ ගොවිපළ 146ක් ස්ථාපිත කරන ලදී. යහපත් කෘෂි පිළිවෙත් සහතිකය ලද එළවළු ගොවිපළ ස්ථාපිත කිරීම සහ

පහසුකම් සැපයීම සඳහා විසිරුම් ජල පද්ධති 48ක් (අක්කර ½), ප්ලාස්ටික් පෙට්ටි 500ක්, ජල පොම්ප 36ක්, 50%ක ගොවි දායකත්වය යටතේ ලබා දෙන ලදී. යහපත් කෘෂි පිළිවෙත් යටතේ වාණිජ මිරිස් ගොවිපළ ස්ථාපිත කිරීම සඳහා, කෘමි ආරක්ෂිත දැල්, විසිරුම් ජල පද්ධති 30 (අක්. ½ , 20 සහ අක්. ¼ , 10) මිරිස් බීජ කි.ග්‍රෑ. 5ක්, 50%ක ගොවි දායකත්වය යටතේ ගොවීන් වෙත සපයන ලදී. GAP ආදර්ශ ගොවිපල 22ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ මහවැලි ගොවිපල තුල ස්ථාපිත කරන ලදී. ගොවීන් සහ පොදු ජනයා උදෙසා යහපත් කෘෂි (GAP) පිළිවෙත් පිළිබඳ වූ දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා පවත්වන ලදී. සමාලෝචිත වසර තුල දැනුවත් කිරීමේ වැඩසටහන් 750ක් නිම කරන ලද අතර, දැන්වීම් පුවරු 9ක් සවි කරන ලදී. පුහුණු වැඩසටහන් 520ක් නිම කරන ලදී. බැනර් 222ක්, වාණිජ ගොවිපළ ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍ර 20,000ක්, අභ්‍යන්තර විගණන පරීක්ෂා කිරීමේ ලැයිස්තු සහ බෝග වාර්තා මුද්‍රණය කරන ලදී. යහපත් කෘෂි පිළිවෙත් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානය සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන සඳහා පහසුකම් සපයනු වස්, මේසය මත රඳවන පරිගණක 1ක්, ලැප්ටොප් 25ක් සහ මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී. යහපත් කෘෂිකර්ම පිළිවෙත් අනුගමනය කරන ගොවින්ගේ දත්ත පද්ධතියක් නිර්මාණය කරන ලද අතර එවැනි ගොවිපල 1900ක සංඛ්‍යාවක දත්ත ඇතුලත් කරන ලදී. දේශීය පාරිභෝගිකයන් සඳහා GAP සහතික කරන ලද කෘෂි නිෂ්පාදන විකිණීම සඳහා අලෙවි සැල් 2ක් ස්ථාපිත කරන ලදී. මාධ්‍ය වැඩසටහන් 60ක් පවත්වන ලදී. අපනයනය කිරීම සම්බන්ධ වූ වටිනාකම් දාම ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම සඳහා (ඇසුරුම් මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම සහ මෙහෙයවීම) ඇසුරුම් මධ්‍යස්ථාන 1,095ක් පරීක්ෂා කරන ලදී.

## 11. තරුණ ආකර්ශණය සමග වාණිජ ගොවිපල සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය

මෙම ව්‍යාපෘතිය යටතේ කෘෂි ව්‍යාපාරිකයන් 12ක් (50%ක ගොවිදායකත්වය යටතේ) විවිධ වූ කෘෂි පාදක ක්‍රියාකාරකම් වන, සහල් හා අනෙකුත් ධාන්‍ය සැකසීම ආරක්ෂිත ගෘහ තුල වගාව, තවාන් නඩත්තු කිරීම ආදියෙන් ප්‍රතිලාභ ලබාගන්නා ලදී. ගොවි ව්‍යාපාර පාසැල (FBS) පිළිබඳ එක් පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබිණි.

## 12. කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ අන්නාසි, පේර සහ පැෂන් ෆෘට් සඳහා කාබනික පැකේජ සංවර්ධනය කිරීම සිදු කරන ලදී. පර්යේෂණ කටයුතු සඳහා ආරක්ෂිත ගෘහ 1ක් සහ දැල් ගෘහ 1ක් ඉදිකිරීමේ කටයුතු නිම කරන ලදී. පුහුණු වන්නන් 7,193ක් සඳහා පුහුණු වැඩසටහන් 63ක් පවත්වන ලදී. සහභාගීවන්නන් 881 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව ගොවි ක්ෂේත්‍රවලදී ස්ථානීය පුහුණු 7ක් සම්පූර්ණ කරන ලදී. මහජනතාව දැනුවත් කිරීම සඳහා වැඩමුළු 6ක් සහ ප්‍රදර්ශන 1ක් පවත්වන ලදී. සමාලෝචිත වසර තුලදී, කෙසෙල්, දෙහි, කොස්, පේර, පැෂන් ෆෘට් සහ අන්නාසි වගාවලින් යුත් අක්කර 5ක කාබනික පලතුරු උද්‍යානයක් ස්ථාපිත කරන ලද අතර, අක්කරයක් පුරාවට කාබනික එළවළු වගාව සිදු කරන ලදී. කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම අරමුණු කොට ගනිමින් භූමි අක්කර 2ක වපසරියක ග්ලිරිසිඩියා සහ වල් සූරිය කාන්ත වගාව සිදු කරන ලදී. කොම්පොස්ට් විශ්ලේෂණය සඳහා අවශ්‍ය විදුරු මෙවලම් සහ රසායන ද්‍රව්‍ය, කලාපීය පරීක්ෂණ මධ්‍යස්ථාන 8ක් සඳහා බෙදා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය, මාකඳුර, කාබනික කෘෂිකර්මාන්තය සඳහා වූ

විශිෂ්ඨතා කේන්ද්‍රය මඟින් ක්‍රියාත්මක කරන ලදී.

13. දේශීය වශයෙන් යෝග්‍ය වූ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වැඩසටහන් ශ්‍රී ලංකාව තුල හඳුන්වාදීම. (AFACI - GAP)

මෙම ව්‍යාපෘතිය යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් 4ක් පවත්වන ලදී. මහජනතාව දැනුවත් කිරිම සඳහා අත්පත්‍රිකා 30,000ක් සකස් කරන ලදී. පාසැල් ළමුන් සඳහා ප්‍රවර්ධන වැඩසටහන් 4ක් පවත්වන ලදී.

## අන්තර් පළාත් බල ප්‍රදේශවල ව්‍යාප්ති කටයුතු

මහා වාරි ජල සම්පාදන යෝජනා ක්‍රම ක්‍රියාත්මක වන අන්තර් පළාත් බල ප්‍රදේශ 06ක් මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය යටතේ පවතින අතර අම්පාර, අනුරාධපුර, හම්බන්තොට, මොණරාගල, පොළොන්නරුව සහ මහනුවර යන දිස්ත්‍රික්කවල කොටස් අන්තර් පළාත් ප්‍රදේශ ලෙස සලකුණු කර ඇත. මෙම ප්‍රදේශවල සේවයේ නියුක්ත ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින් ගොවි ප්‍රජාවගේ කෘෂිකාර්මික දැනුම ඉහළ නැංවීම, නිපුණතාවය වැඩි කිරිම, ආකල්ප දියුණු කිරීම, ජාතික ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සිය සේවය ලබා දේ.

2016/2017 මහ කන්නයේදී සහ 2017 යල කන්නයේදී අන්තර් පළාත් ප්‍රදේශවල වී වගා කරන ලද සමස්ත වපසරිය පිළිවෙළින් හෙ. 145,898ක් සහ හෙ. 85,611.5ක් විය. ජලාශ වලින් සම්පාදනය කෙරෙන ජලය හිඟවීම හේතුවෙන් කන්න දෙකේදීම වගා කරන වපසරිය අඩු විය. 2017 වසරේදී වෙනත් ක්ෂේත්‍ර බෝග වගා වපසරිය ඉහළ නැංවීම සඳහා විශේෂ අවධානය යොමු කරන ලදී. ප්‍රධාන වශයෙන්ම අන්තර් පළාත් බල ප්‍රදේශ 6 තුල බඩඉරිඟු, මුං ඇට, රටකජු, තල, කව්පි, සෝයා, මිරිස්, කුරක්කන්, උඳු, ලොකු ළූණු සහ රතු ළූණු වගා කරන ලදී.

එක් එක් අන්තර් පළාත් බල ප්‍රදේශවල සුවිශේෂිත තොරතුරු සහ කාර්යයන් පිළිබඳව පහතින් දක්වා ඇත.

## අන්තර් පළාත් බල ප්‍රදේශය - හම්බන්තොට

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (අන්තර් පළාත්) හම්බන්තොට හා රත්නපුර දිස්ත්‍රික්ක තුල මහා වාරිමාර්ග ප්‍රදේශ වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06ක (අම්බලන්තොට, හම්බන්තොට, තිස්සමහාරාමය, ලුණුගම්වෙහෙර, සූරියවැව හා බලන්ගොඩ) හා ගොවිජන සේවා මධ්‍යස්ථාන 8ක් (අම්බන්තොට, ලුනම, බඳගිරිය, වීරවිල, යෝධකණ්ඩිය, බෙරලිහෙල, ගල්තොට හා මයුරපුර) ආවරණය කරමින් ව්‍යාප්ති කටයුතු සිදු කරයි.

හම්බන්තොට අන්තර් පළාත් බල ප්‍රදේශයේ වගා කරන ප්‍රධාන බෝගය වී වන අතර මහා වාරි ජල සම්පාදනය යටතේ හෙ. 15,000ක් පමණ වපසරියක්ද සුළු වාරි ජල සම්පාදනය යටතේ හෙ. 1,100ක පමණ වපසරියක් ද වර්ෂාපෝෂිත තත්ත්වය යටතේ හෙ. 50ක පමණද වී වගා කෙරේ. උස්බිම් ප්‍රදේශවල හෙ. 39,546ක පමණ වපසරියක ප්‍රධාන වශයෙන්ම පහතරට එළවළු සහ කෙසෙල් සහ පැපොල් වැනි පලතුරු වගා කෙරේ. ලුණුගම්වෙහෙර, ලියන්ගස්තොට (රිදියගම ජලාශය) සහ සමනල වැව යන ප්‍රධාන ජල යෝජනා ක්‍රම මගින් වගා කටයුතු සඳහා ජලය සම්පාදනය කෙරෙන අතර මෙමගින් ප්‍රධාන කන්න දෙක වන යල සහ මහ කන්න දෙකත් යල කන්නයට පසුව තෙවන කන්නයේත් වගා කටයුතු සිදු කෙරේ.

මෙම ප්‍රදේශයේ ප්‍රධාන වගා බෝගය වී වන අතර, දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය සඳහා එළවළු හා පලතුරු වගාව ද විශාල දායකත්වයක් ලබා දෙයි. එමෙන්ම කෙසෙල් වගාව ද දැනට නැගී එන බෝග වගා ප්‍රවනතාවයකි. 2017 වසර තුලදී කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන ලද ප්‍රතිපාදන අනුව වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. එනම්, වී නිෂ්පාදිතතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන, 3වන කන්නයේ මුං වගා වැඩසටහන, නියඟය හේතුවෙන් වී වගා නොකරන කුඹුරුවල මුං වගා වැඩසටහන, 4වන කන්නයේ මුං වගා වැඩසටහන, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වැඩසටහන, වෙනත් ක්ෂේත්‍ර බෝග (මිරිස්, බඩඉරිඟු, රටකජු, කුරක්කන්) වගා වැඩසටහන, ගෙවතු වගා වැඩසටහන, එළවළු වගා වැඩසටහන, පලතුරු ගම්මාන වැඩසටහන, මී පැණි නිෂ්පාදන වැඩසටහන, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන, මත්තල අක්කර 100ක භූමියක අඹ වගා වැඩසටහන. දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක සාමාන්‍ය ව්‍යාප්ති වැඩසටහන් හා නිෂ්පාදන වැඩසටහන් වලට අමතරව යථෝක්ත කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

## ප්‍රගතිය

### 2016/17 මහ

2016/17 මහ කන්නයේදී ඉලක්කගත වී වගා වපසරිය හෙ. 16,355 විය. මහා වාරිමාර්ග යටතේ හෙ. 14,997ක්ද සුළු වාරිමාර්ග යටතේ හෙ. 1303ක්ද වර්ෂාපෝෂිත වගාව යටතේ හෙ. 55ක්ද වූ අතර මෙම ඉලක්ක වලින් මහා වාරිමාර්ග සහ සුළු වාරිමාර්ග යටතේ පිළිවෙළින් හෙ. 14,451ක් සහ හෙ. 1139ක්ද වර්ෂාපෝෂිතව හෙ.50ක්ද වගා කරන ලදී. ජල සම්පාදන ක්‍රම තුනම යටතේ වගා කරන ලද සමස්ථ වපසරිය හෙ. 15,640ක් විය. මහා වාරිමාර්ග, සුළු වාරිමාර්ග සහ වර්ෂාපෝෂිත ක්‍රමය යටතේ ලබා ගත් වී අස්වනු සාමාන්‍යය පිළිවෙළින් 7.2ක් ටො./හෙ., 6.9ක් ටො./ හෙ. සහ 6.7ක් ටො./ හෙ. වූ අතර මෙම අස්වනු සාමාන්‍යය ජාතික අස්වනු සාමාන්‍ය වන 4.2ක් ටො./හෙ. ද ඉක්මවීය හැක.

### වෙනත් ක්ෂේත්‍ර බෝග

2016/17 මහ කන්නයේදී වෙනත් ක්ෂේත්‍ර බෝග වගාවේ ඉලක්කගත වපසරිය හෙ. 1882.8ක් වූ අතර ඊට මිරිස් හෙ. 107ක්, බඩඉරිඟු හෙ. 95ක්, රටකජු හෙ. 101ක්, කුරක්කන් හෙ.300, කව්පි හෙ. 29.7, ලොකු ළූණු හෙ. 14.2, රතු ළූණු හෙ. 13.9, තල හෙ. 425 හා මුං හෙ. 797ක් අයත් විය. මෙම කන්නයේදී මිරිස් හෙ. 132.85ක්, බඩඉරිඟු හෙ. 227ක්, රටකජු හෙ. 99ක්, කුරක්කන් හෙ. 228ක්, කව්පි හෙ. 43ක්, ලොකු ළූණු හෙ. 6.6, රතු ළූණු හෙ. 6.979, තල හෙ. 85ක් සහ මුං හෙ. 648ක් උස් බිම්වල වගා කරන ලදී. සමස්ථ වගා වපසරිය හෙ. 1,477ක් විය.

### යල 2017

යල කන්නයේදී මහා, සුළු සහ වර්ෂාපෝෂිත වාරි ජල සම්පාදන ක්‍රම යටතේ ඉලක්ක කෙරුණු වපසරියන් පිළිවෙළින් හෙ. 12,770ක්, හෙ. 796ක් සහ හෙ. 105ක් විය. මේ අනුව ඉලක්කගත සමස්ථ වපසරිය හෙ. 13,671ක් වූ අතර 2017 යල කන්නයේ වී වගා වපසරිය හෙ. 12,403ක් විය. මෙයට මහා වාරිමාර්ග යටතේ හෙ. 11,727ක්, සුළු වාරිමාර්ග යටතේ හෙ. 666ක් සහ වර්ෂාපෝෂිත ජල සම්පාදනය යටතේ හෙ. 10ක් අයත් විය.

### වෙනත් ක්ෂේත්‍ර බෝග

මෙම කන්නයේදී වෙනත් ක්ෂේත්‍ර බෝග වගාවේ ඉලක්කගත සමස්ථ වපසරිය හෙ. 787ක් වූ අතර ඊට මිරිස් හෙ. 105ක්, බඩඉරිඟු හෙ. 130ක්, රටකජු හෙ. 130ක්, කුරක්කන් හෙ. 268ක්, කව්පි හෙ. 12.4ක්, තල හෙ. 90ක් සහ මුං හෙ. 53ක් ඇතුළත්

විය. මිරිස් හෙ.73.4ක්ද බඩඉරිඟු හෙ. 77.5ක්ද, රටකජු හෙ. 35ක්ද, කුරක්කන් හෙ. 11.5ක්ද, සෝයා හෙ. 5.6ක්ද, කව්පි හෙ. 20ක්ද, තල හෙ. 20ක් සහ මුං හෙ. 24ක්ද වගා කරන ලදී. වෙනත් ක්ෂේත්‍ර බෝග වගා සමස්ථ වපසරිය හෙ. 267ක් විය.

## විශේෂ ව්‍යාපෘති

### ජාතික සහල් නිෂ්පාදන වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ භූමි අක්. 3.5ක ගොයම් පැල සිටුවන ලද අතර, පස් සාම්පල 100ක් පරීක්ෂණයට භාජනය කරන ලදී. සහතික කරන ලද බීජ නිෂ්පාදනය කිරීම සඳහා හෙක්. 35.2ක භූමි ප්‍රදේශයක වගා කටයුතු සිදු කරන ලද අතර ස්වයං බීජ නිෂ්පාදනය සඳහා හෙ. 273ක වගා කටයුතු සිදු කරන ලදී. පුහුණු වැඩසටහන් 31ක් සහ ක්ෂේත්‍ර දින 31ක් පවත්වන ලදී.

### කාබනික පොහොර ප්‍රවර්ධන වැඩසටහන

කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්ෂේත්‍ර දින 4ක් පවත්වන ලදී.

### මිරිස් වගා වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ වගා කරන ලද සමස්ථ වපසරිය හෙක්. 114.5ක් වූ අතර කි.ග්‍රෑ. 10ක බීජ ප්‍රමාණයක් ගොවීන් වෙත සපයන ලදී.

ඇඹරුම් හලක් සහ සීලරයක් ලබා දෙන ලදී.

### මුං නිෂ්පාදන වැඩසටහන (3වන කන්නය)

වගා කරන ලද භූමි වපසරිය හෙක්. 3,010ක් වූ අතර 50%ක ගොවි දායකත්වය යටතේ බීජ කි.ග්‍රෑ. 13,000ක් ගොවින් වෙත ලබා දෙන ලදී. පුහුණු වැඩසටහන් 40ක් ගොවීන් සඳහා පවත්වන ලදී. 50%ක ගොවි දායකත්වය යටතේ ත්‍රීත්ව ස්ප්‍රේ සහිත මළු 1000ක් ගොවින් වෙත සපයන ලදී. බීජ නිෂ්පාදන වැඩසටහන හෙක්. 40ක ක්‍රියාත්මක කරන ලදී.

### බඩඉරිඟු නිෂ්පාදන වැඩසටහන

මෙම ව්‍යාපෘතිය හරහා භූමිය හෙක්ටයාර 228.45ක වගා කටයුතු සිදු කරන ලදී. 50% ගොවි දායකත්වය යටතේ ගුණාත්මක තත්ත්වයේ බීජ කි.ග්‍රෑ. 1,650ක් සපයන ලදී. ආදර්ශන 40ක් ස්ථාපිත කරන ලද අතර පුහුණු වැඩසටහන් 20ක් පවත්වන ලදී.

### මත්තල අක්කර 100ක සිදු කරන ලද අඹ වගා වැඩසටහන

දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් සහ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

## අන්තර් පළාත් බල ප්‍රදේශය - මහනුවර

මහනුවර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) ප්‍රදේශයට ඇතුළත් වන්නේ මහනුවර, මාතලේ සහ බදුල්ල දිස්ත්‍රික්කවලට අයත් මිණිපේ, විල්ගමුව, මහියංගනය, රිදීමාලියද්ද සහ කන්දේකැටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ය. මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩ ඉඩම් සඳහා ජල සම්පාදනය කෙරෙනුයේ මිණිපේ අමුණ මගිනි. මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මඩ ඉඩම් සඳහා ජල සම්පාදනය කෙරෙනුයේ සොරබොර, දඹරාව සහ මාපාකඩවැව ජලාශ මගිනි. රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මඩ ඉඩම් සඳහා නාගදීප ජලාශය මගින්ද කන්දේකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි මඩ ඉඩම් සඳහා බදුලු ඔය සහ බත්මැඩිල්ල අමුණ මගින්ද ජල සම්පාදනය කෙරේ. මහ කන්නය තුළ මඩ ඉඩම්වල වගා කෙරෙන ප්‍රධාන බෝගය වී වන අතර ගොඩ ඉඩම්වල මෙන්ම හොඳින් ජල සම්පාදනය කෙරෙන මඩ ඉඩම්වල

සුළු පරිමාණයෙන් වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කෙරේ.

## ප්‍රගතිය

### 2016/17 මහ කන්නය

#### වී

2016/17 මහ කන්නය තුළ වී වගා කිරීමට ඉලක්ක කළ බිම් ප්‍රමාණය හෙ. 14,103ක් විය. මෙතුළ ප්‍රධාන වාරිමාර්ග යටතේ හෙ. 12,108ක් සහ වර්ෂාපෝෂිත තත්ත්ව යටතේ හෙ. 1,995ක් වශයෙන් වගා ඉලක්ක ඇතුළත් විය. කන්නය තුළ වී වගා කළ බිම් ප්‍රමාණය හෙ. 11,119කි. එයට ප්‍රධාන වාරිමාර්ග යටතේ හෙ. 9,964ක් සහ වර්ෂාපෝෂිත තත්ත්ව යටතේ හෙ. 1,155ක් ද ඇතුළත් විය. අඩු වර්ෂාපදනතය හේතුවෙන් ප්‍රගතිය අවම විය. මිනිපේ අමුණට සිදුවූ අලාභහානි ද අපේක්ෂිත ඉලක්ක කරා නොයාමට හේතුවිය.

ජලය හිඟ වීම හේතුවෙන් නාගදීපය සහ කන්දකැටිය වාරි පද්ධති මගින් ජලය සපයන කුඹුරු වගා කිරීමට නොහැකි විය. මහා වාරිමාර්ග සහ වර්ෂාපෝෂිත වාරිමාර්ග පද්ධති යටතේ වී වගාවෙන් ලද සාමාන්‍ය අස්වැන්න පිළිවෙලින් හෙක්ටයාරයකට මෙ.ටො. 5.2ක් හා මෙ.ටො. 4.5ක් විය.

#### වෙනත් ක්ෂේත්‍ර බෝග

2016/17 මහ කන්නය තුල වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරිමට ඉලක්ක කල බිම් ප්‍රමාණය හෙ. 640ක් වු අතර, එයට මිරිස් හෙ. 34, බඩඉරිඟු හෙ. 420,රටකජු හෙ. 15, කුරක්කන් හෙ. 62, සෝයා හෙ. 11, කවුපි හෙ. 24, තල හෙ. 37, උඳු හෙ. 15 සහ මුං හෙ. 24ක් ඇතුලත් විය.

මෙම කන්නයේදී මිරිස් හෙ. 31, බඩඉරිඟු හෙ. 488, රටකජු හෙ. 13ක්, තල හෙ. 23, උඳු හෙ. 5 සහ මුං හෙ. 17ක් උස් බිම් වල වගා කරන ලදී. මෙම ප්‍රදේශයේ සමස්ථ වගා වපසරිය වෙනත් බෝග සඳහා හෙ. 717ක් විය.

#### විශේෂ වැඩසටහන්

- 2017 යල කන්නය සඳහා බිත්තර වී නිෂ්පාදනය කිරීමේ ඉලක්කය සහිතව, ගොවීන් 143 දෙනෙකුගේ සහභාගිත්වය සහිතව හෙ. 181ක භූමි ප්‍රදේශයක කඩිනම් බිත්තර වී නිෂ්පාදන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඉදිරි යල කන්නය සඳහා බිත්තර වී නිෂ්පාදන කරනු ලබන ගොවීන් වෙත Bg 250 ප්‍රභේදයේ බිත්තර වී නොමිලයේ ලබා දෙන ලදී.
- නව ප්‍රදේශ වල බඩඉරිඟු වගා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- අක්කර 200ක භූමි වපසරියක සහතික කරන ලද බිත්තර වී නිෂ්පාදනය ක්‍රියාත්මක කරන ලද අතර 50%ක ගොවි දායකත්වය මත බිත්තර වී ගොවීන් වෙත සපයන ලදී.
- හෙක්ටයාර 10ක භූමි ප්‍රදේශයක මුං බීජ නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර ගොවීන් වෙත නොමිලයේ බීජ ලබා දෙන ලදී.
- වී වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ප්‍රදේශ තුල යාය 02 වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

### 2017 යල

#### වී

2017 යල කන්නයේ වී වගා කිරීමට ඉලක්ක කළ බිම් ප්‍රමාණය හෙ. 7,932ක් වු අතර හෙ. 9,025ක වී බෝගය වගා කෙරිණි. ඉලක්කය ඉක්මවා ප්‍රගතියක් ලැබීමට හැකිවුයේ කන්නය ආරම්භයේ ලැබුණු වර්ෂාපතනයයි. මෙම කන්නයේ සාමාන්‍ය අස්වැන්න හෙ. 1කට මෙ.ටො. 5.2ක් විය.

### වෙනත් ක්ෂේත්‍ර බෝග

2017 යල කන්නයේදී වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීමට ඉලක්ක කළ බිම් ප්‍රමාණය හෙ. 3,641කි. එයට මිරිස් හෙ. 29, බඩඉරිඟු හෙ. 2,591, රටකජු හෙ. 92, කුරක්කන් හෙ. 30, සෝයා හෙ. 192, කව්පි හෙ. 48, උඳු හෙ. 65, මුං හෙ. 514ක් ඇතුලත් වේ. ඒ අනුව, මිරිස් හෙ. 16කද, බඩඉරිඟු හෙ. 1597, රටකජු හෙ. 28.5, කුරක්කන් හෙ. 31.4, සෝයා හෙ. 162, කව්පි හෙ. 49, උඳු හෙ. 22 සහ මුං හෙ. 161.95ක් ලෙස උස් බිම්වල වගා කරන ලදී. වෙනත් බෝග වගා සමස්ථ වපසරිය හෙ. 2,070ක් විය. මුං වගා කරන ලද වපසරිය ඉලක්කගත වපසරියට වඩා බෙහෙවින් අඩු වූ අතර එයට හේතුව වූයේ, ආනයනික මුං සඳහා බදු අඩුකිරීමෙන් වෙළඳපල මිලද අඩුවීමය.

### විශේෂ වැඩසටහන්

- බඩඉරිඟු වගා ප්‍රවර්ධන වැඩසටහන ප්‍රදේශය තුල ක්‍රියාත්මක කරන ලද අතර මෙම වැඩසටහන යටතේ 50%ක ගොවි දායකත්වයෙන් ගොවීන් වෙත බීජ සපයන ලදී.
- සෝයා වගා ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. සෝයා බීජ ගොවීන් වෙත නොමිලයේ ලබාදුන් අතර භූමි සැකසීමේ ගාස්තු ගොවීනට ලබාදෙන ලදී.
- වී වගාවේ නිෂ්පාදනතාවය ඉහල නැංවීමේ ඉලක්ක සහිතව යාය 02 වැඩසටහන යාය 38ක් තුල ගොවීන් 935ගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහනෙන් ආවරණය කරන ලද සමස්ථ වපසරිය හෙ. 838ක් විය.
- සහතික කල බිත්තර වී වැඩසටහන ගොවීන් 126කගේ සහභාගීත්වයෙන් හෙ. 65ක් තුල ක්‍රියාත්මක කරන ලදී.

## අන්තර් පළාත් බල ප්‍රදේශය - අම්පාර

අම්පාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාල උහන, දමන, අඬ්ඩාලච්චේන සහ සමන්තුරේ යන කෘෂි පරිපාලන කලාප 4කින් සමන්විත වේ. මෙම කලාප 4ට ගොවිජන සේවා මධ්‍යස්ථාන 25ක්, කෘෂිකර්ම උපදේශක කොට්ඨාස 85ක්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16ක් සහ ග්‍රාම නිලධාරි කොට්ඨාස 430ක් ඇතුලත් වේ.

අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජල සම්පාදන මූලාශ්‍රය ඉඟිනියාගල සේනානායක සමුද්‍රයයි. එහි ධාරිතාව අක්කර අඩි 770,000ක් වන අතර එමගින් ගල්ඔය වම් ඉවුරේ කුඩා වැව් 10ක් සහ දකුණු ඉවුරේ ජනපද සඳහා ජලය සපයයි. එයට අමතරව, අම්පාර දිස්ත්‍රික්කයේ වී වගාව සඳහා විශාල වශයෙන් සහායක් වන වෙනත් කුඩා වැව් 13ක්ද තිබේ. මෙම ප්‍රදේශයේ ප්‍රධාන බෝගය වී වන අතර ජාතික සහල් නිෂ්පාදනයට 20%ක දායකත්වයක් ලබා දෙයි.

### ප්‍රගතිය

### 2016/17 මහ කන්නය

#### වී

2016/17 මහ කන්නය තුළ වී වගා කිරීමට ඉලක්ක කළ බිම් ප්‍රමාණය හෙ. 73,534ක් වන අතර එයට මහා වාරිමාර්ග යටතේ හෙ. 57,549ක්ද සුළු වාරිමාර්ග යටතේ හෙ. 4,414ක්ද වර්ෂාපෝෂිත ක්‍රමය යටතේ හෙ. 11,571ක්ද ඇතුළත් විය. මෙම ඉලක්කය අතුරින් මහා වාරිමාර්ග යටතේ හෙ. 53,400කද සුළු වාරිමාර්ග යටතේ හෙ. 4,410කද වගා කටයුතු කිරීමට හැකිවිය. වර්ෂාපෝෂිත තත්ත්වය යටතේ හෙ. 10,415ක් වගා කරන ලදී. ජල සම්පාදන ක්‍රම 3ම යටතේ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙ. 68,225කි. ප්‍රධාන හා සුළු වාරිමාර්ග යටතේ මෙන්ම වර්ෂාපෝෂිත ජල සම්පාදන ක්‍රම යටතේ

ලබාගත් සාමාන්‍ය වී අස්වැන්න පිළිවෙළින් හෙ. 1කට මෙ.ටො. 6.5ක්, 4.5ක් සහ 3.5ක් විය.

### වෙනත් ක්ෂේත්‍ර බෝග

2016/17 මහ කන්නය තුළ ඉලක්ක කළ වෙනත් ක්ෂේත්‍ර බෝග වගා බිම් ප්‍රමාණය හෙ. 5,382කි. එයට මිරිස් හෙ.392ක්, බඩඉරිඟු හෙ. 3847ක්, රටකජු හෙ. 780ක්, කව්පි හෙ. 171ක් සහ මුං හෙ. 192ක් ඇතුළත් විය. සැබැවින්ම වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව සිදුවූයේ හෙ. 210ක මිරිස්, හෙ. 3655ක බඩඉරිඟු, හෙ. 479ක රටකජු හෙ. 112ක කව්පි සහ හෙ. 107ක මුං වශයෙනි. මේ හේතුවෙන් කන්නය තුළ වෙනත් ක්ෂේත්‍ර බෝග වගා බිම් මුළු ප්‍රමාණය හෙ. 4563ක් බවට පත්විය. වගා ඉලක්ක ජය ගැනීමට නොහැකි වූයේ ජල හිඟය සහ ගුණාත්මයෙන් යුතු බීජ හිඟවීම හේතුවෙනි.

### එළවළු

2016/17 මහ කන්නයේ ඉලක්කගත එළවළු වගා බිම් වපසරිය හෙ. 410ක් වූ අතර එයට, මෑ හෙ. 120, බණ්ඩක්කා හෙ. 125, වැටකොළු හෙ. 100 සහ පතෝල හෙ. 65ක් ඇතුලත් වේ. වගා කරන ලද සමස්ථ භූමි වපසරිය හෙ. 233ක් වූ අතර එයට බණ්ඩක්කා හෙ. 71, මෑ හෙ. 62, වැටකොළු හෙ. 58 සහ පතෝල හෙ. 42ක් ඇතුලත් විය. අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත් වූයේ ජලය හිඟකම හේතුවෙනි.

### පලතුරු බෝග වගාව

2016/17 මහ කන්නයේ ඉලක්කගත පලතුරු වගා වපසරිය හෙ. 78.5ක් වූ අතර එයට පැපොල් හෙ. 50, කෙසෙල් හෙ. 10, දොඩම් හෙ. 8.5, අඹ හෙ. 10ක් ඇතුලත් විය. කෙසේ වුවද, වගාකරන ලද සමස්ථ වගා වපසරිය ඉලක්ක කල වපසරියට වඩා මදක් විශාල විය (හෙ.85). මෙසේ ඉලක්කගත වපසරිය ඉක්මවා යාමට හේතු වූයේ කන්නය ආරම්භයේ සිදුකරන ලද දැනුවත් කිරීමේ වැඩටහන්ය.

ඉහත ක්‍රියාකාරකම් වලට අමතරව ප්‍රදේශය තුල පහත සඳහන් වැඩසටහන් සිදුකරන ලදී.

- නව තරුණ ගොවි සමාජ ස්ථාපිත කිරීම.
- අම්පාර දිස්ත්‍රික්කයේ කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවිසැල් පරීක්ෂා කිරීම.
- කාබනික ගොවිතැන ප්‍රවර්ධනය.

## 2017 යල කන්නය

### වී

මහා වාරි සහ සුළු වාරිමාර්ග යටතේ වී වගා කිරීමට ඉලක්ක කළ බිම් ප්‍රමාණයන් පිළිවෙළින් හෙ. 31,491ක් සහ හෙ. 1762ක් විය. ඒ අනුව සමස්ත වගා බිම් ඉලක්කය හෙ. 33,253ක් විය. 2017 යල කන්නය තුළ හෙ. 36,653ක වී වගා කරන ලදී. එයට මහා වාරිමාර්ග යටතේ හෙ. 34,690ක් හා සුළු වාරිමාර්ග හෙ. 1963ක් ඇතුළත් විය. කෙසේ වුවත් වගා කල හැකි භූමි වපසරිය වූ හෙ. 61,963න් 59%ක් පමණක් වගා කිරීමට සිදු වූයේ ජල හිඟය හේතුවෙනි.

### වෙනත් ක්ෂේත්‍ර බෝග

කන්නය තුළ වගා කිරීමට ඉලක්ක කළ වෙනත් ක්ෂේත්‍ර බෝග වගා බිම් ප්‍රමාණය හෙ. 884ක් වූ අතර එයට මිරිස් හෙ. 188ක්ද බඩඉරිඟු හෙ. 130ක්ද රටකජු හෙ. 260ක්ද කුරක්කන් හෙ. 15, සෝයා හෙ. 10, කව්පි හෙ. 130, මුං හේ. 146ද, උඳු හෙ. 5ක්ද ඇතුලත් විය. කන්නය තුළ හෙ. 1065ක වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කරන ලදී. ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන වෙනත් ක්ෂේත්‍ර බෝග වගාබිම් ප්‍රමාණය වැඩිකරලීම සඳහා ගොවීන් දිරිමත් කිරීමට උපකාරි විය.

### එළවළු වගාව

2017 යල කන්නයේ ඉලක්කගත එළවළු වගා වපසරිය හෙ. 453ක් වූ අතර එයට වම්බටු හෙ. 110, මෑ හෙ. 90, බණ්ඩක්කා හෙ. 85, පතෝල හෙ. 70, කරවිල හෙ. 60,

වැටකොළු හෙ. 40ක් ආදිය ඇතුලත් වේ. වගා කරන ලද සමස්ත වපසරිය හෙ. 453.38ක් වු අතර එයට වම්බටු හෙ. 99.35, බණ්ඩක්කා හෙ. 84.25, මෑ හෙ. 66.02, කරවිල හෙ. 49.55 සහ පතෝල හෙ. 44.03ක් ඇතුලත් විය.

## පලතුරු වගා වැඩසටහන

2017 යල කන්නයේ වගා කරන ලද පලතුරු වගා වපසරිය හෙ. 670ක්, වූ අතර එයට පැපොල් හෙ. 47.68, කෙසෙල් හෙ. 166.83, අඹ හෙ. 301.795, දොඩම් හෙ. 108.11, පැණි කොමඩු හෙ. 19.39, පැෂන් ෆෘට් හෙ. 12,765 සහ වෙනත් පලතුරු බෝග හෙ. 13.52ක් ඇතුලත් වේ. පලතුරු ගම්මාන සංවර්ධනයය කිරීමේ වැඩසටහන යටතේ ගොවීන් 531 දෙනෙකුගේ සහභාගීත්වය සහිතව හෙ. 133.8ක භූමි ප්‍රදේශයක පලතුරු ගම්මාන 45ක් ස්ථාපිත කරන ලදී.

## විශේෂ කරුණු

- වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ පලතුරු වගා ගොවි නිෂ්පාදන සමිති ස්ථාපත කිරීම සහ සංවර්ධනය කිරීම.
- ගොවීන් 187 දෙනෙකුගේ සහභාගිත්වය සහිතව හෙ. 89.1ක භූමි වපසරියක් ආවරණය කරමින් අතරමැදි කන්නයේ වගාවන් සිදු කරන ලදී.

## අන්තර් පළාත් බල ප්‍රදේශය - මොණරාගල

මොණරාගල අන්තර් පළාත් බල ප්‍රදේශයට සියඹලාණ්ඩුව, ඔක්කම්පිටිය, ඇතිමලේ සහ තෙලුල්ල ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන බල ප්‍රදේශ ඇතුළත් වේ. මොණරාගල අන්තර් පළාත් බල ප්‍රදේශයට අයත් ප්‍රධාන වාරිමාර්ග ක්‍රම වනුයේ මුතුකණ්ඩිය, ඇතිමලේ, කොටියාගල, සද්ධාතිස්ස, හඳපානාගල යන වැව් සහ කුඹුක්කන් ඔය අමුණයි. මෙහි වගා කරන ප්‍රධාන බෝගය වී වන අතර දෙවැනි ස්ථානයට පත් වන්නේ බඩඉරිඟුය. නියෝජ්‍ය කෘෂි අධ්‍යක්ෂ කාර්යාලයේ (අන්තර් පළාත්, මොණරාගල) ව්‍යාප්ති නිලධාරින් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 25ක සිටින ගොවීන් 20,000කට ආසන්න සංඛ්‍යාවක් සඳහා තම සේවය ලබා දෙයි. ඔවුන් පුහුණු වැඩසටහන් ක්ෂේත්‍ර දින ආදර්ශන හරහා වී, වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ පලතුරු නිෂ්පාදනය පිළිබඳව නව තාක්ෂණය ලබා දෙයි. ග්‍රාමීය ගොවීන් අතර කෘෂිකර්මාන්තය සඳහා යන්ත්‍ර ජනප්‍රිය කරවමින් සහ මහා පරිමාණ හා සුළු පරිමාණ ප්‍රභේද අත්හදා බැලීම් සහ වෙනත් ආදර්ශන පවත්වමින්, ව්‍යාප්ති නිලධාරීන් පර්යේෂණ කටයුතු සඳහා විශාල සහායක් ලබා දෙයි. එමෙන්ම, කාන්තාවන් බලගැන්වීම සඳහා සහ ගොවින්ගේ සමාජයීය ප්‍රාග්ධනය වැඩිකිරීමේ අරමුණින් අවාරයේ සිදු කරනු ලබන ජීවනෝපාය මාර්ගයන් වන මී මැසි පාලනය, තරුණ ගොවි සමාජ, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධාන (WAES) ස්ථාපිත කිරීම වැනි කටයුතු වල යෙදීමට මහ පෙන්වයි.

## ප්‍රගතිය

### 2016/17 මහ කන්නය

#### වී

2016/17 මහ කන්නය තුළ වී වගා කිරීමට ඉලක්ක කළ බිම් ප්‍රමාණය හෙ. 6,517ක් වූ අතර එයට ප්‍රධාන වාරිමාර්ග යටතේ හෙ. 2633ක්ද සුළු වාරිමාර්ග යටතේ හෙ. 1180ක්ද වර්ෂාපෝෂිත ක්‍රමය යටතේ හෙ. 2704ක්ද ඇතුළත් විය. කන්නය තුළ ප්‍රධාන, සුළු වාරිමාර්ග හා වාර්ෂාපෝෂිත තත්ත්ව යටතේ වගා කළ බිම් ප්‍රමාණය පිළිවෙලින් හෙ. 1597, හෙ. 562 සහ හෙ. 1457ක් විය. සියලුම ජල සම්පාදන ක්‍රම යටතේ වගා කළ මුළු බිම් ප්‍රමාණය හෙ. 3617ක් විය. මෙසේ බිම් ප්‍රමාණය අඩු වීමට හේතු වුයේ කන්නය මුල වර්ෂාව ප්‍රමාණවත් අයුරින් නොලැබීමයි. ප්‍රධාන, සුළු වාරිමාර්ග සහ වර්ෂාපෝෂිත ක්‍රමය යටතේ ලබාගත් සාමාන්‍ය වී අස්වැන්න

පිළිවෙළින් හෙ. 1කට මෙ.ටො. 5.4, මෙ.ටො. 4.8ක් සහ මෙ.ටො. 3.2ක් විය.

## වෙනත් ක්ෂේත්‍ර බෝග

2016/17 මහ කන්නය තුල ඉලක්කගත වෙනත් ක්ෂේත්‍ර බෝග වගා වපසරිය හෙ. 6,292ක් විය. එයට, මිරිස් හෙ. 58ක්, බඩඉරිඟු හෙ. 5346ක්, රටකජු හෙ. 476ක්, කුරක්කන් හෙ. 43ක්, සෝයා හෙ. 29ක්, කව්පි හෙ. 106ක්, රතු ළූණු හෙක්. 6ක්, තල හෙක්. 23ක්, උඳු හෙක්. 155ක් හා මුං හෙ. 50ක් ඇතුලත් විය. මෙම කන්නයේදී මිරිස් හෙ. 42ක්, බඩඉරිඟු හෙ. 5251ක්, රටකජු හෙ. 381ක්, කුරක්කන් හෙ. 44ක්, සෝයා හෙ. 16ක්, කව්පි හෙ. 80ක්, රතු ළූණු හෙ. 33ක්, තල හෙ. 11ක්, උඳු හෙ. 274ක්, මුං හෙ. 13ක් තත්‍ය වශයෙන් වගා කරනු ලැබීය. වෙනත් ක්ෂේත්‍ර බෝග සමස්ථ වගා වපසරිය වූයේ හෙ. 6,145කි. අපේක්ෂිත ඉලක්ක උපයා ගැනීමට නොහැකි වූයේ ජල හිගයයි.

## එළවළු/ අල බෝග

2016/17 මහ කන්නයේදී මොණරාගල අන්තර් පළාත් ප්‍රදේශය තුල වගා කරන ලද එළවළු/ අල බෝග ප්‍රමාණය සහ නිෂ්පාදිත ප්‍රමාණය වගුව 3.1.2හි දැක්වේ.

**වගු අංක 3.1.2: 2016/17 මහ කන්නයේදී මොණරාගල අන්තර් පළාත් ප්‍රදේශයේ වගාකරන ලද එළවළු/ අල බෝග භූමි වපසරිය**

| බෝගය | ඉලක්කය (හෙ.) | ප්‍රගතිය (හෙ.) |
|---|---|---|
| වට්ටක්කා | 55 | 50.5 |
| වම්බටු | 26.2 | 22.8 |
| තක්කාලි | 8.5 | 10 |
| බණ්ඩක්කා | 27.4 | 15.3 |
| පිපිඤ්ඤා | 12.4 | 6.85 |
| කරවිල | 06 | 07 |
| අළු පුහුල් | 12.4 | 4.3 |
| මෑ කරල් | 18 | 14 |
| වැටකොළු | 0 6 | 04 |
| පතෝල | 05 | 04 |
| මඤ්ඤොක්කා | 12 | 6.8 |
| **එකතුව** | **188.9** | **159.55** |

## පලතුරු

2016/17 මහ කන්නයේදී මොණරාගල අන්තර් පළාත තුල වගාකරන ලද පලතුරු බෝගවල ඉලක්ක ගත වපසරිය සහ ප්‍රගතිය වගු අංක 3.1.3 හි දැක්වේ.

**වගු අංක 3.1.3: 2016/17 මහ කන්නයේ මොණරාගල අන්තර් පළාත් ප්‍රදේශයේ වගා කරන ලද පලතුරු බෝග ප්‍රමාණය**

| බෝගය | ඉලක්කය (හෙ.) | ප්‍රගතිය (හෙ.) |
|---|---|---|
| කෙසෙල් | 23.5 | 19.6 |
| දොඩම් | 14.3 | 21 |
| පැපොල් | 21.6 | 15.2 |
| අඹ | 59.5 | 33.85 |
| දිවුල් | 55.5 | 31.15 |
| පැණි කොමඩු | 35.5 | 61 |
| **එකතුව** | **209.9** | **181.8** |

## 2017 යල

## වී

2017 යල කන්නයේ ඉලක්කගත වී වගා වපසරිය හෙ. 3,212 වූ අතර ඊට මහා වාරි ජල සම්පාදනය යටතේ හෙ. 2,155 සහ සුළු වාරි ජල සම්පාදනය යටතේ හෙ. 1,057ක් අයත් විය. හෙ. 1,642ක් හා හෙ. 546ක් පිළිවෙළින් මහා වාරි සහ සුළු වාරි ජල සම්පාදනය යටතේ වගා කරන ලදී. මහා වාරි සහ සුළු වාරි ජල සම්පාදන ක්‍රම යටතේ වගා කරන ලද සමස්ථ වපසරිය හෙ. 2,188ක් වූ අතර මෙමගින් ලබාගත් නිෂ්පාදනය මෙ.ටො. 11,487ක් විය. ප්‍රධාන, සුළු හා වාර්ෂාපෝෂිත ක්‍රම යටතේ ලබාගත් සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයක් සඳහා පිළිවෙලින්

මෙ.ටො. 5.4, මෙ.ටො. 4.8 සහ මෙ.ටො. 3.2ක් විය.

### වෙනත් ක්ෂේත්‍ර බෝග

2017 යල කන්නය තුල ඉලක්ක ගත වෙනත් බෝග වගා වපසරිය වුයේ හෙ. 321කි. එයට, මිරිස් හෙ. 29, බඩඉරිඟු හෙ. 15, රටකජු හෙ. 104, සෝයා බෝංචි හෙ. 72, උඳු හෙ. 4, කවුපි හෙ. 89, කුරක්කන් හෙ. 8 අයත් විය. සත්‍ය වශයෙන් වගා කිරීමට හැකි වු වපසරිය වුයේ මිරිස් හෙ. 14.9, බඩඉරිඟු හෙ. 39.1, රටකජු හෙ. 126.58, සෝයා බෝංචි හෙ. 58.4, උඳු හෙ. 5.1, කවුපි හෙ. 60.2, කුරක්කන් හෙ. 2.8කි. වගා කරන ලද සමස්ථ වපසරිය වුයේ හෙ. 307.3කි.

### එළවළු

මොණරාගල අන්තර්පළාත් බල ප්‍රදේශය තුල 2016/17 මහ කන්න තුළදී වගාකරන ලද එළවළු/ අල බෝග වල භූමි ප්‍රමාණයන් වගු අංක 3.1.14 හි දැක්වේ.

**වගු අංක 3.1.4: 2017 යල කන්නයේදී මොණරාගල අන්තර් පළාත් බල ප්‍රදේශයේ වගා කරන ලද එළවළු වගා වපසරිය**

| බෝගය | ඉලක්කය (හෙ.) | ප්‍රගතිය (හෙ.) |
|---|---|---|
| වට්ටක්කා | 24 | 30.3 |
| වම්බටු | 27.3 | 11.5 |
| තක්කාලි | 9.2 | 4.4 |
| බණ්ඩක්කා | 27 | 15.7 |
| පිපිඤ්ඤා | 4.2 | 03 |
| කරවිල | 6.2 | 2.5 |
| අළු පුහුල් | 04 | 05 |
| මෑ | 07 | 11.3 |
| වැටකොළු | 6.2 | 1.3 |
| මාළු මිරිස් | 11.4 | 4.5 |
| පතෝල | 4.6 | 2.1 |
| **එකතුව** | **131.1** | **91.6** |

### පලතුරු

පලතුරු වගා වැඩසටහනෙහි ප්‍රගතිය වගු අංක 3.1.5හි දැක්වේ.

**වගු අංක 3.1.5: 2017 යල කන්නයේදී මොණරාගල අන්තර් පළාත් බල ප්‍රදේශයේ වගාකරන ලද පලතුරු වගා වපසරිය සහ නිෂ්පාදනය**

| බෝගය | ඉලක්කය (හෙ.) | ප්‍රගතිය (හෙ.) |
|---|---|---|
| කෙසෙල් | 35 | 25 |
| දොඩම් | 16 | 22 |
| පැපොල් | 26 | 19 |
| අඹ | 61 | 45 |
| දිවුල් | 55.5 | 31.15 |
| පැණි කොමඩු | 35.5 | 61 |
| **එකතුව** | **229** | **203.15** |

### විශේෂ වැඩසටහන්

- ගෙවතු වගා වැඩසටහන යටතේ ආදර්ශ ගෙවතු 500ක් ස්ථාපිත කර නඩත්තු කරන ලදී.
- මී මැසි පාලන වැඩසටහන යටතේ මී මැසි ජනපද 123ක් ස්ථාපිත කර නඩත්තු කරන ලදී.
- ගොවීන් සඳහා විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ පුහුණු වැඩසටහන් සිදු කරන ලදී. බිම්මල් වගාව පිළිබඳ දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 6ක් සිදුකරන ලදී. මී මැසි පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් 18ද, ගෙවතු වගා පුහුණු වැඩසටහන් 95ක් ද සිදු කරන ලදී. කාන්තා කෘෂි ව්‍යාප්ති වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 85ක් පවත්වන ලදී.

## අන්තර් පළාත් බල ප්‍රදේශ - අනුරාධපුර

අනුරාධපුර අන්තර් පළාත් බල ප්‍රදේශය මගින් අනුරාධපුර, කුරුණෑගල, මාතලේ

සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වල මහා වාරි ජල සම්පාදන ක්‍රම 12ක් ආවරණය කරනු ලබයි. කෘෂි නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය (අන්තර් පාලන, අනුරාධපුර) කෘෂි සහකාර අධ්‍යක්ෂ කාර්යාල 3කින් සමන්විත වන අතර මෙම කාර්යාල තුනට කෘෂි උපදේශක කලාප 43ක් අයත් වේ. වී, වෙනත් ක්ෂේත්‍ර බෝග, පලතුරු සහ එළවළු සම්බන්ධයෙන් ජාතික ආහාර නිෂ්පාදන ඉලක්ක සාක්ෂාත් කරගනු වස්, ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සංවර්ධන වැඩසටහන් බොහොමයක් හා සම්බන්ධ කටයුතු සිදු කරයි. භූමිය හෙ. 29,000ක කුඹුරු වපසරිය සහ හෙ. 25,000ක ගොඩ ගොවිතැනෙහි නිරත වන ගොවි පවුල් 47,000කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා මෙම ව්‍යාප්ති කාර්ය මණ්ඩලය තම සේවය ලබා දෙයි. නව තාක්ෂණය ලබා දීම, කාබනික වගා ප්‍රවර්ධනය, ගොවිපල යාන්ත්‍රිකරණය හඳුන්වාදීම, ආරක්ෂිත වගාව සහ ක්ෂුද්‍ර වාරි තාක්ෂණය, ගුණාත්මක තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය සැපයීම, නව ප්‍රභේදවල බීජ සහ වෙනත් යෙදවුම්, පලතුරු ගම්මාන ස්ථාපිත කිරීම, ගොවි සහ කාන්තා ගොවි සමාජ බලගැන්වීම යන කාර්යන් ප්‍රදේශයේ තිරසාර කෘෂි සංවර්ධනයක් උදෙසා සිදුකරනු ලබන සේවා අතුරින් කිහිපයකි.

වී වගාව සම්බන්ධයෙන් නිෂ්පාදිතාවය ඉහල නැංවීම සහ වී නිෂ්පාදනයේ පිරිවැය අවම කිරීම සඳහා, යාය වැඩසටහන ආරම්භ කරන ලද අතර, ඒ අතරම, පැරෂුට් ක්‍රමය ප්‍රවර්ධනය කිරීම, ගොයම් පැළ සිටුවීම සහ වල් ඉවත් කිරීම, ගුණාත්මක තත්ත්වයේ බිත්තර වී භාවිතය, කාබනික පොහොර භාවිතය, ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය, පත්‍ර වර්ණ සටහන් අනුව පොහොර භාවිතය සහ යෝග්‍ය වූ පසු අස්වනු පිළිවෙත් යොදා ගැනීම යන කරුණු ද ක්‍රියාත්මක කරනු ලැබේ. ගුණාත්මක තත්ත්වයේ බීජ සැපයීම, බීජ වප්කර සහ අතුරුයත් ගැමේ උපකරණ හඳුන්වාදීම, පාංශු සංරක්ෂණ වැටි ඉදිකිරීම, ක්ෂුද්‍ර වාරි ක්‍රම හා ආරක්ෂිත ගෘහ ලබාදීම යන කාර්යක් තුළින් වෙනත් ක්ෂේත්‍ර බෝග වගා වල නිෂ්පාදිතතාව වැඩිදියුණු කරනු ලබයි.

සෑම කන්නයක් අවසානයේම ආදර්ශන අැගයීම සඳහා අස්වනු සමීක්ෂණ සිදු කරනු ලැබේ. කෘෂි රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය ඉක්මවා භාවිත කිරීම අවම කරමින් ගොවීන් යහපත් කෘෂි පිළිවෙත් සඳහා යොමු කර වීම සඳහා ස්ථිර බෝග සායන වැඩසටහන් සහ ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය ඉවහල් විය.

බෝග ප්‍රභේද අත්හදා බැලීම් ස්ථාපිත කිරීම, මෙහෙයවීම, ඇගයීම සහ ඒ සම්බන්ධ වාර්තා ලබාදීම මගින් ව්‍යාප්ති කාර්ය මණ්ඩලය, පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා තම සහයෝගය ලබා දෙයි.

කෘෂි උපදේශකවරුන් 30දෙනෙකු සහ තාක්ෂණ සහායකයන් 32දෙනෙකු සියළුම බෝග සම්බන්ධයෙන් සියළු ක්ෂේත්‍ර මට්ටමේ කෘෂි ව්‍යාප්ති කටයුතු සිදු කරන අතර දත්ත එක්රැස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි.

## ප්‍රගතිය

### 2016/17 මහ

#### වී

2016/17 මහ කන්නයේ ඉලක්කගත වී වගා වපසරිය හෙ. 32,055ක් වන අතර ඊට මහා වාරි ජල සම්පාදන ක්‍රමය යටතේ හෙ. 23,110ක්, සුළු වාරි ජල සම්පාදන ක්‍රමය යටතේ හෙ. 5,696ක් සහ වර්ෂාපෝෂිත ජල සම්පාදන ක්‍රමය යටතේ හෙ. 3,249ක් අයත් වේ. කෙසේ වුවද, හෙ. 10,315ක්, හෙ. 1,446ක් සහ හෙ. 1,113ක් පිළිවෙළින් මහා වාරි, සුළු වාරි සහ වර්ෂාපෝෂිත ජල සම්පාදන ක්‍රම යටතේ වගා කළ අතර ජල සම්පාදන ක්‍රම තුනම යටතේ සමස්ථ වපසරිය හෙ. 12,874ක් වගා කරන ලදී. කන්නය ආරම්භයේ ප්‍රමාණවත් වර්ෂාපතනයක් නොලැබීම

මෙම තත්ත්වයට හේතු විය. මෙමගින් මෙ.ටො. 69,450ක නිෂ්පාදනයක් ලබා ගත් අතර පිළිවෙළින් මහා වාරි, සුළු වාරි සහ වර්ෂාපෝෂිත ජල සම්පාදන ක්‍රම යටතේ 5.5ක් මෙ.ටො./හෙ., 5.1ක් මෙ.ටො./හෙ. සහ 4.8ක් මෙ.ටො./හෙ. වූ වී අස්වනු සාමාන්‍යයක් සාක්ෂාත් කර ගන්නා ලදී.

## වෙනත් ක්ෂේත්‍ර බෝග

2016/17 මහ කන්නයේදී ඉලක්කගත වෙනත් ක්ෂේත්‍ර බෝග වගා වපසරිය හෙ. 10,043ක් වූ අතර ඊට මිරිස් හෙ. 676ක්, කව්පි හෙ. 151ක්, බඩඉරිඟු හෙ. 6127ක්, රටකජු හෙ. 185ක් සහ සෝයා හෙ. 81ක් මුං හෙ.200 සහ තල හෙ. 121, උඳු හෙ. 2,502 අයත් වේ. කෙසේ වුවද, මිරිස් හෙ. 357ක්, කව්පි හෙ. 312ක්, බඩඉරිඟු හෙ. 6415ක්, රටකජු හෙ. 165ක්, සෝයා හෙ. 212.3ක්, මුං හෙ. 94ක් කුරක්කන් හෙ. 97, තල හෙ. 153, උඳු හෙ. 2473ක් වගා කරන ලදුව වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කරන ලද සමස්ථ වපසරිය හෙ. 10,990ක් විය.

# 2017 යල

## වී

2017 යල කන්නයේදී ඉලක්කගත වී වගා වපසරිය හෙ. 3,100ක් වූ අතර එය මහා වාරි ජල සම්පාදනය යටතේ සිදුවිය. සුළු වාරි ජල සම්පාදනය හෝ වර්ෂාපෝෂිත ජල සම්පාදන ක්‍රම යටතේ ඉලක්කගත වපසරියක් නොවිය. මහා වාරි, සුළු වාරි හා වර්ෂාපෝෂිත ජල සම්පාදන යටතේ වගා කරන ලද වපසරියන් පිළිවෙළින් හෙ. 6,067, හෙ. 275 හා හෙ. 0.5ක් විය. වගා කරන ලද සමස්ත වපසරිය හෙ. 6,342.5 වූ අතර, මෙම අඩු වී වගා වපසරියට හේතු වුයේ කන්නය ආරම්භයෙහි දී වර්ෂාපතන අයහපත් තත්වයන් වේ. මහා වාරි, සුළු වාරි සහ වර්ෂාපෝෂිත ජල සම්පාදන ක්‍රම යටතේ ලබා ගන්නා ලද වී අස්වනු සාමාන්‍යයන් පිළිවෙළින් 5.5ක් මෙ.ටො./හෙ., 5.1ක් මෙ.ටො./හෙ. සහ 4.8ක් මෙ.ටො./හෙ. විය.

## වෙනත් ක්ෂේත්‍ර බෝග වැඩසටහන

2017 යල කන්නයේදී වෙනත් ක්ෂේත්‍ර බෝග වගාවන් සඳහා ඉලක්කගත වපසරිය හෙ. 1836.5ක් වූ අතර ඊට මිරිස් හෙ. 124ක්, බඩඉරිඟු හෙ. 132ක්, රටකජු හෙ. 51.4ක්, සෝයා බෝංචි හෙ. 587.4ක්, මුං හෙ. 181ක්, උඳු හෙ. 26.6ක්, කව්පි හෙ. 34ක්, කුරක්කන් හෙ. 7.50ක්, තල හෙ. 496.5ක් සහ ලොකු ළූණු හෙ. 195.6ක් අයත් විය. කෙසේ වුවද, මිරිස් හෙ. 76.9ක්, බඩඉරිඟු හෙ. 184.7ක්, රටකජු හෙ. 65ක්, සෝයා බෝංචි හෙ. 337.1ක්, කුරක්කන් හෙ. 7.85ක්, කව්පි හෙ. 28.57ක්, මුං හෙ. 38.3ක් උඳු හෙ. 11.45ක් තල හෙ. 516ක් සහ ලොකු ළූණු හෙ. 85.8ක් වගා කරන ලදුව වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කරන ලද සමස්ථ වපසරිය හෙ. 1351.67ක් විය.

## පලතුරු සහ එළවළු

වට්ටක්කා සහ වම්බටු වගාවන් මෙම ප්‍රදේශයේ වඩාත් පුමුඛ වගාවන්ය. වගාකරන ලද වට්ටක්කා සහ වම්බටු වගා වපසරිය පිළිවෙළින් හෙ. 622ක් සහ හෙ. 320ක් විය. හෙක්ටයාර 1672ක භූමි ප්‍රදේශක් තුල පැපොල්, කෙසෙල්, අඹ සහ දොඩම් වගාවන්ට අදාල පැළ 789ක් පුනරුත්තාපනය කරන ලදී. ස්ථාපිත කරන ලද නව වගා වපසරිය හෙ. 580ක් විය.

## විශේෂ වැඩසටහන්

- හෙ. 341ක වපසරියක බිත්තර වී නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර, බිත්තර වී බුසල් 500ක් නිෂ්පාදනය කරන ලදී. බිත්තර වී කඩිනම් මිලදී ගැනීමේ වැඩසටහනක් සිදු කරන ලද අතර බිත්තර වී බුසල් 20,063ක් සපයන ලදී.

- ස්වයං බිත්තර වී නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා ගොවීන් 1200ක් සහභාගී වූහ. ඊලඟ කන්නය සඳහා බිත්තර වී අවශ්‍යතාව සාක්ෂාත් කර ගැනීමට ඔවුනට හැකිවිය.
- හෙක්ටෙයාර 900ක භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් යාය 80ක් පුරා යාය වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.
- නයිට්‍රජන් පොහොර අවභාවිතය අවම කිරිම සඳහා පත්‍ර වර්ණ දර්ශක 5000ක් බෙදා දෙන ලදී.
- ගෙවතු වගා මට්ටමින් මළු වල මිරිස් වගා කිරීම ප්‍රවර්ධනය කරන ලද අතර එවැනි වගාවන් සහිත මළු 23,500කින් පවුලේ පරිභෝජන අවශ්‍යතා ඉටුකරගැනීමෙන්, අමතර ආදයමක් ලබා ගැනීමටත් හැකි විය. මිරිස් කොල කොඩවීමේ රෝගය අවම කිරීම සඳහා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ආදර්ශන 38ක් ස්ථාපිත කරන ලදී. පුහුණු පංති 96ක් පවත්වන ලද අතර ගොවීන් 1479 දෙනෙකු එයින් ප්‍රතිලාභ ලබන ලදී.
- බඩඉරිගු වගා කරනු ලබන බිම් ප්‍රදේශවල පාංශු ඛාදනය වැලැක්වීම සඳහා පාංශු සංරක්ෂණ වැටි 104ක් ස්ථාපිත කිරීම සහ වගා පිරිවැය අඩු කිරීම සඳහා යාන්ත්‍රික ආදර්ශන 44ක් ද සිදු කරනුලැබිය.
- පළිබෝධනාශක අලෙවිසැල් 67ක පරීක්ෂා කටයුතු නිම කරන ලද අතර මෙම වසර තුලදී අවසර පත්‍ර 23ක් නිකුත් කරන ලදී. පළිබෝධනාශක පනත සම්බන්ධයෙන් වූ නීති සහ රෙගුලාසි පිළිබඳව ලියාපදිංචි සියළු අලෙවිසැල් දැනුවත් කරන ලදී.
- ස්ථිර බෝග සායන 119ක ගොවීන් 268දෙනෙකුගේ සහභාගීත්වය සහ ඒකාබද්ධ පළිබෝධ පාලන ආදර්ශන 45ක් සඳහා ගොවීන් 45කගේ සහභාගීත්වය හේතුවෙන් කෘෂි රසායනික භාවිතය අවම කිරීමට හැකි විය.
- ගෙවතු වගාව පිළිබඳ පුහුණු පංති 386ක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා ගොවීන් 2,184ක් සහභාගී වූහ. ගම් 36ක් තුල ආදර්ශ ගෙවතු වගා 416ක් ස්ථාපිත කරන ලද අතර ඒ තුලින්, ගොවි පවුල්වල එළවළු අවශ්‍යතා ඉටු කර ගැනීමටත්, මුදල් ඉතිරි කර ගැනීමටත් ආරක්ෂිත ආහාර ලබා ගැනීමටත් හැකි විය.
- දේශීය ආහාර ප්‍රවර්ධන වැඩසටහන් සහ මුළුතැන්ගෙය සංවර්ධන වැඩසටහන් 79ක් මගින් නව කාන්තා ගොවි සමාජ 25ක සාමාජිකයන් 615ක් ප්‍රතිලාභ ලැබුහ.

## අන්තර් පළාත් බල ප්‍රදේශ - පොළොන්නරුව

පොළොන්නරුව අන්තර් බල ප්‍රදේශයේ සමස්ථ වපසරිය හෙ. 333,000ක් වන අතර, එය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ (අන්තර් පළාත්) වපසරිය ලෙස හෙ. 196,000ක් ලෙසත්, මහවැලි අධිකාරියේ වපසරිය ලෙස හෙ. 137,800ක් ලෙසත් බෙදා වෙන්කොට ඇත. පොළොන්නරුව අන්තර් පළාත් ප්‍රදේශයට මැදිරිගිරිය, හිඟුරක්ගොඩ, ලංකාපුර, තමන්කඩුව සහ ඇලහැර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහ අයත් වේ. මෙම ප්‍රදේශයේ ප්‍රධාන වාරිමාර්ග පද්ධති වනුයේ පරාක්‍රම සමුද්‍රය, කව්ඩුල්ල, මින්නේරිය සහ ගිරිතලේ යන ජලාශ වන අතර සුළු වාරිමාර්ග පද්ධති බොහෝමයක්ද පවති. මෙම අන්තර් පළාත් බල ප්‍රදේශයට බණ්ඩ 03ක්, ගොවිජන සේවා මධ්‍යස්ථාන 8ක් සහ කෘෂිකර්ම උපදේශක කලාප 35ක් අයත් වේ. පොළොන්නරුව අන්තර් පළාත් ප්‍රදේශයේ වගා කළ හැකි වපසරිය හෙ. 34,840ක් වන අතර කෘෂිකර්මාන්තයේ

යෙදී සිටින ගොවි පවුල් සංඛ්‍යාව 46,092කි.

## ප්‍රගතිය

### 2016/17 මහ

#### වී

2016/17 මහ කන්නයේදී ඉලක්කගත වී වගා වපසරිය හෙ. 34,750ක් වූ අතර ඊට මහා වාරි ජල සම්පාදන ක්‍රමය යටතේ හෙ. 26,200ක්ද සුළු වාරි ජල සම්පාදනය යටතේ හෙ. 6410ක් සහ වර්ෂාපෝෂිත ජල සම්පාදනය යටතේ හෙ. 2140ක් අයත් වේ. සියළුම ජල සම්පාදන ක්‍රම යටතේ වගා කරන ලද සමස්ත වපසරිය හෙ. 34,420ක් විය.

2016/17 මහ කන්නයේදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී සහ වෙනත් කෘෂි නිෂ්පාදන සඳහා වසර පුරා අඩු වර්ෂාපතනයක් ලැබීම අයහපත් ලෙස බලපෑවේය. ගිරිතලේ ව්‍යාපෘතිය යටතේ වී වගාව අසාර්ථක වූ අතර ඇලහැර ප්‍රදේශයේ 50%ක ප්‍රදේශයක වගා කටයුතු සිදු කරන ලදී. යථෝක්ත කරුණු හේතුවෙන් වී නිෂ්පාදනය දැඩි ලෙස පහත වැටුනි. 2016/17 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙ.ටො. 123,528ක් විය. 2016/17 මහ කන්නයේදී ජාතික නිෂ්පාදනය සඳහා එහි දායකත්වය 8.5%ක් විය.

#### වෙනත් ක්ෂේත්‍ර බෝග

2016/17 මහ කන්නයේ ඉලක්කගත වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදන වපසරිය හෙ. 981ක් වන අතර ඊට මිරිස් හෙ. 250ක්, කව්පි හෙ. 65ක්, බඩඉරිඟු හෙ. 320ක්, රටකජු හෙ. 150ක්, රතු ළූණු හෙ. 25, මුං හෙ. 61ක්, කුරක්කන් හෙ. 55ක්, උඳු හෙ. 25, තල හෙ. 30ක්, අයත් වේ. කෙසේ වුවද, මිරිස් හෙ. 132ක්, කව්පි හෙ. 52ක්, බඩඉරිඟු හෙ. 207ක්, රටකජු හෙ. 116ක්, රතු ළූණු හෙ. 16, මුං හෙ. 46ක්, කුරක්කන් හෙ. 47ක්, උඳු හෙ. 33, තල හෙ. 35ක්, වගා කරන ලදුව කන්නයේදී වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කරන ලද සමස්ත වපසරිය හෙ. 684ක් විය.

### 2017 යල

#### වී

2017 යල කන්නයේදී ඉලක්කගත වී වගා වපසරිය මහා වාරි ජල සම්පාදනය යටතේ හෙ. 25,220 සහ සුළු වාරි ජල සම්පාදනය යටතේ හෙ.4780ක් විය. වගා කරන ලද සමස්ත මහා වාරි වපසරිය හෙ. 25,220ක් වූ අතර සුළු වාරි ජල සම්පාදනය යටතේ එය හෙ. 4730ක් ලෙස සටහන් වේ. වගා කරන ලද සමස්ත භූමි ප්‍රමාණය හෙ. 29,950ක් විය. මෙමගින් ලබා ගත් මුළු නිෂ්පාදනය මෙ.ටො. 177,335 විය. මහා වාරි, සුළු වාරි සහ වර්ෂාපෝෂිත ජලසම්පාදන ක්‍රම යටතේ ලබාගත් වී අස්වනු සාමාන්‍ය පිළිවෙළින් 6ක් මෙ.ටො./හෙ., 5.5ක් මෙ.ටො./හෙ. සහ 5ක් මෙ.ටො./හෙ. විය. 2017 වර්ෂයේ යල කන්නය තුල ඇලහැර ප්‍රදේශයේ වී වගා නොකරන ලද අතර මින්නේරිය ප්‍රදේශයේ කුඹුරු ඉඩම් වලින් 50%ක ප්‍රමාණයක් පමණක් වගාකරන ලදී. 2017 යල කන්නයේ වී නිෂ්පාදනය මෙ.ටො. 123,956කි.

#### වෙනත් ක්ෂේත්‍ර බෝග වගා

2017 යල කන්නයේ ඉලක්කගත වෙනත් ක්ෂේත්‍ර බෝග වගා වපසරිය හෙ. 830 ක් වූ අතර ඊට මිරිස් හෙ. 160ක්, බඩඉරිඟු හෙ. 220, මුං හෙ. 50ක්, උඳු හෙ. 20ක්, කව්පි හෙ. 50ක්, කුරක්කන් හෙ. 20ක්, ලොකු ළූණු හෙ. 150ක් සහ සෝයා බෝංචි හෙ. 80ක් අයත් විය. කෙසේවුවද, මෙම කන්නයේදී මිරිස් හෙ. 72ක්, බඩඉරිඟු හෙ. 161ක්, මුං හෙ. 31.34ක්, උඳු හෙ.6ක්, කව්පි හෙ. 22.9ක්, කුරක්කන් හෙ. 7.19ක්, ලොකු ළූණු හෙ. 48.1ක් සහ සෝයා බෝංචි හෙ. 15.75ක් වගා කරන ලදී. වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කරන ලද සමස්ත වපසරිය හෙ. 364.28 ක් විය.

නිෂ්පාදනය අඩු වීමට හේතු වූයේ ජලය හිඟ වීමයි.

## පලතුරු

පොළොන්නරුව අන්තර් පළාත් බල ප්‍රදේශය තුල කෙසෙල් වගාවේ අඛණ්ඩ වැඩිවීමක් සිදුවිය. මෙම වර්ෂයේ පලතුරු බෝග වගාවේ කෙසෙල් හෙ. 67, අඹ හෙ. 78ක්, පැපොල් හෙ. 46 ලෙස නව වගා වපසරියක් බිහිවිය. පලතුරු ගම්මාන 89ක් සඳහා පලතුරු පැල ගොවීන් අතර බෙදා දෙන ලදී. කන්න දෙකේදීම පලතුරු වගාව පිළිබඳ පුහුණු වැඩසටහන් 237ක් සිදුකරන ලදී.

## එළවළු

මෙම කලාපයේ පහතරට එළවළු බොහෝසෙයින් වගා කරනු ලබයි. බණ්ඩක්කා හෙ. 109, වම්බටු හෙ. 63, මෑ හෙ. 108, වට්ටක්කා හෙ. 73 ද වගා කරනු ලැබිය. කන්න දෙකේදීම එළවළු වගාව පිළිබඳ පුහුණු පංති 268ක් පවත්වන ලදී. කෘෂි ළිං යටතේ හෙ. 144ක භූමි ප්‍රදේශයක් එළවළු වගාව සඳහා යොමු කරනු ලැබිය.

## විශේෂ කරුණු

- මෙම වසර සඳහා වී සම්බන්ධයෙන් ප්‍රධානතම ව්‍යාප්ති ක්‍රමෝපාය වූයේ යාය 2 වැඩසටහනයි. සමාලෝචිත වසර තුලදී වර්ෂාපතනය ප්‍රමාණවත් අයුරින් නොලැබීම නිසා මහ කන්නයේදී යාය 71ක් සහ යල කන්නයේදී යාය 97ක් පමණක් ක්‍රියාත්මක කෙරිනි. වර්ෂාපතනය ලැබීමත් සමග භූමිය සකස් කිරීමෙන් මෙම වැඩසටහන ආරම්භ කරන ලද අතර, ඉන් පසුව ගැඹුරට පස පෙරලීම, පත්‍ර වර්ණ සටහන් යොදා ගනිමින් පොහොර යෙදීම, ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය, ඒකාබද්ධ ශාක පෝෂක පද්ධති, යාන්ත්‍රිකරණය ආදි වූ ආදර්ශන එකී යාය තුල ක්‍රියාත්මක කරන ලදී. වී වගාව පිළිබඳ සමස්ථ වශයෙන් පුහුණු පංති 1326ක් සහ ක්ෂේත්‍ර දින 130ක් සිදු කරන ලදී.
- 3වන කන්නයේදී කවුඩුල්ල (අක්කර 120) සහ ගිරිතලේ (අක්කර 600) ප්‍රදේශවල මුං වගාව සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කරන ලදී.
- හදිසි බිත්තර වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ බිත්තර වී බුසල් 17,222ක් ගොවීන් 176 දෙනෙකුගෙන් මිලට ගන්නා ලදී.
- වෙනත් ක්ෂේත්‍ර බෝග වගා ප්‍රවර්ධනය කිරීම සඳහා කන්න දෙකේදීම පුහුණු පංති 785ක් සහ ක්ෂේත්‍ර දින 46ක් සිදුකරන ලදී.
- ආහාර සහ පෝෂණය, දේශීය ආහාර ප්‍රවර්ධනය, මුළුතැන්ගෙය කළමනාකරණය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ පුහුණු පංති 87ක් පවත්වන ලදී. ප්‍රජාව තුල දේශීය ආහාර ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් ලේකම් පරිශ්‍රය තුල 'හෙළ බොජුන්' අලෙවි සැලක් ස්ථාපිත කරන ලද අතර එයින් කාන්තා ව්‍යවසායකයන් 05 දෙනෙකු බිහිකරනු ලැබීය.

## පුහුණු ඒකකය

පුහුණු ඒකකයේ ප්‍රධානතම වගකීම වනුයේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයට අනුයුක්ත සියළු පුහුණු මධ්‍යස්ථාන මගින් සිදුකරනු ලබන පුහුණු කාර්යයන් අධීක්ෂණය කිරීම සහ මෙහෙයවීමය. වත්මන් අවශ්‍යතාවන්ට අනුව පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම මෙම ඒකකය විසින් සිදු කරනු ලබයි. පුහුණු මධ්‍යස්ථාන මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 3 / 4 මට්ටම් වලට අදාළ පුහුණු වැඩසටහන් ද මෙම ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. එක් එක් පුහුණු ආයතනය පිළිබඳ විශේෂිත වූ තොරතුරු පහතින් දැක්වේ.

### සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - ගන්නොරුව

ගන්නොරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන්ගේ නිපුණතා සංවර්ධනය ඔවුන්ට නව තාක්ෂණය හා තොරතුරු ලබාදීම සම්බන්ධයෙන් වගකීම දරණ ජාතික මට්ටමේ පවතින ප්‍රධාන කෘෂිකාර්මික පුහුණු ආයතනයයි. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම උදෙසා කෘෂිකර්ම දෙපාර්තමේන්තු ව්‍යාප්ති කාර්ය මණ්ඩලය ඔවුන්ගේ දැනුම සහ සන්නිවේදන දක්ෂතා ඇතුළු දක්ෂතාවන් දියුණු කර ගැනීමෙහිලා පුහුණු කරනු ලැබේ. සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ විධිමත් සහ පෞද්ගලික පුහුණුව ඔවුන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීමෙහිලා ඉවහල් වේ.

මෙම වසරේදී ඉලක්කගත පුහුණු කිරීම් සංඛ්‍යාව සහ මෙහෙයවන ලද පුහුණු කිරීම් සංඛ්‍යාව වගු අංක 3.1.6හි දැක්වේ.

**වගු අංක 3.1.6 : 2017 වර්ෂයේදී ගන්නොරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී මෙහෙයවන ලද පුහුණු වැඩසටහන්**

| පුහුණු වැඩසටහන | වාර්ෂික ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | වැඩසටහන් සංඛ්‍යාව | මිනිස් දින | වැඩසටහන් සංඛ්‍යාව | මිනිස් දින |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු | 74 | 7150 | 76 | 7696 |
| වෙනත් ආයතන සඳහා පුහුණු | 14 | 920 | 22 | 2699 |
| ගොවීන්, සිසුන් සහ වෙනත් පුද්ගලයන් සඳහා පුහුණු | 46 | 3320 | 97 | 5292 |
| වැඩමුළු / සම්මන්ත්‍රණ/ රැස්වීම් / සාකච්ඡා (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අනෙකුත් දෙපාර්තමේන්තු) | 65 | 3250 | 92 | 5870 |
| ASDA සමුළු (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව) | 01 | 2,000 | 02 | 2427 |
| **එකතුව** | **200** | **16,640** | **289** | **23,984** |

### විශේෂ කරුණු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2017 වාර්ෂික සම්මේලනය පවත්වනු ලැබීය.

### සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - අඟුණකොළපැලැස්ස

ක්ෂේත්‍ර ව්‍යාප්ති කාර්ය මණ්ඩලය නව තාක්ෂණයන් පිළිබඳව දැනුවත් කර ඔවුන්ගේ වෘත්තීය කුසලතා වැඩිදියුණු කිරීම සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වෙනස් වන තත්ත්වයන් පිළිබඳව ඔවුන්ගේ දැනුම යථාවත් කිරීම අඟුණකොළපැලැස්ස සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ මෙහෙවරයි.

මෙම ආයතනය මගින් ගාල්ල, මාතර හම්බන්තොට යන දිස්ත්‍රික්ක වල හා හම්බන්තොට අන්තර් පළාත් බල ප්‍රදේශ වල නිලධාරීන් සඳහා සේවාස්ථ පුහුණු ලබා දේ. සාමාන්‍යයෙන් මෙයින් ලබාදෙන පුහුණු වන්නේ සේවාරම්භක පුහුණුව, දැනට සිටින නිලධාරීන්ට නව දැනුම ලබා දීමේ පුහුණුව සහ පෙර කන්න පුහුණුවයි.

එම පුහුණුවලට අමතරව, සේවා සංස්කරණ අභ්‍යාස ආයතන පරිශ්‍රයේ හෙ.

8ක වපසරියක ඇති ක්ෂේත්‍ර ආදර්ශන නව කෘෂිකාර්මික තාක්ෂණයන් ප්‍රචලිත කිරීමට උපකාරි වේ. මෙම ආදර්ශන ක්ෂේත්‍රය තුල වී හෙ. 1ක්, එළවළු හා අල බෝග හෙ. 0.23, පලතුරු හෙ. 0.72, පොල් හෙ. 0.8, ගෙවතු වගා හෙ. 0.05, දැල් ගෘහ හෙ. 0.0176, තවාන සඳහා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හෙ. 0.03ක් වශයෙන් ඇතුලත් වේ. මෙම ආයතනයට අයත් පසු අස්වනු හා ආහාර සැකසුම් ඒකකය මගින් නිලධාරින්, සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ආහාර තාක්ෂණය පිළිබඳ පුහුණු ලබාදෙයි. සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය විසින් ගොවීන් සඳහා බෝග ආරක්ෂණය පිළිබඳ බෝග සායන පවත්වයි. එයට අමතරව, මෙම ආයතනයේදී පැළ තවාන් සංවර්ධන පුහුණු පාඨමාලාවද (NVQ 4 වන මට්ටම) පැවැත්විණි.

### ප්‍රගතිය

2017 වර්ෂයේදී පවත්වන ලද මුළු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 70කි. (මිනිස් දින 3,409). මෙතුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 43ක්ද (මිනිස් දින 2,267), අනෙකුත් ආයතන නිලධාරින් සඳහා පුහුණු වැඩසටහන් 01ක්ද (මිනිස් දින 139) සාමාන්‍ය කෘෂි වැඩසටහන් 1ක්ද (මිනිස් දින 17), ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 5ද (මිනිස් දින 156) ගොවිපල් යන්ත්‍ර පිළිබඳ පුහුණු 1ක්ද (මිනිස් දින 32), සිසුන්/ පාසැල්, තාක්ෂණික විද්‍යාල, සඳහා යාන්ත්‍රික පුහුණු වැඩසටහන 02ක්ද (මිනිස් දින 68) ඇතුළත් විය. එමෙන්ම, එළිමහන් පුහුණු වැඩසටහන් සඳහා වැඩමුළු/ සම්මන්ත්‍රණ/ රැස්වීම්/ සාකච්ඡා 7ක්ද (මිනිස් දින 296) පවත්වන ලදී.

මෙම ආයතනය විසින් පවත්වන ලද නිලධාරි පුහුණු මගින් ආවරණය කරන ලද විෂය ක්ෂේත්‍ර වන්නේ බෝග නිෂ්පාදනය (වී, පලතුරු, එළවළු සහ මුල් බෝග, වෙනත් ක්ෂේත්‍ර බෝග, මල් වගාව, පැළෑටි ආරක්ෂණය), මානව සම්පත් සංවර්ධනය, පසු අස්වනු තාක්ෂණය/ ආහාර තාක්ෂණය සහ පෙර කන්න පුහුණු සහ තරුණ ගොවි සමාජ/ මී මැසි පාලනය වැනි පුහුණු වේ.

## සේවා සංස්කරණ පුහුණු ආයතනය, හංසයා පාලම, අරලගන්විල

මෙම ආයතනය මහවැලි බී කොටසේ පිහිටා ඇති අතර මෙමගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ව්‍යාප්ති නිලධාරීන් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරින් මෙන්ම වෙනත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වයි. දෙකන්නයේම වෙනත් බෝග වගා, එළවළු, අල බෝග සහ පලතුරු වගාකරමින් ආදර්ශන ක්ෂේත්‍රයක් ලෙස මෙම පුහුණු ආයතනයේ භූමි ප්‍රදේශය මනා සේ නඩත්තු කරනු ලැබේ. මෙම ආයතනය පාසැල් හැරගිය පිරිස් වෙනුවෙන් කෘෂිකර්ම ක්ෂේත්‍ර සහකාරවරුන් පුහුණු කිරීමේ පාඨමාලාව (NVQ 4) පවත්වා ගෙන යනු ලබයි.

### ප්‍රගතිය

2017 වර්ෂයේදී පාසැල් හැරගිය 13දෙනෙකු සඳහා ක්ෂේත්‍ර සහකාරවරුන් පුහුණු කිරීමේ පාඨමාලාව (NVQ 4 වන මට්ටම) පවත්වන ලදී. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පෙර කන්න පුහුණුව සඳහා සුදානම් වීමේ රැස්වීම් 2ක් පවත්වන ලදී.

## ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය

ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය ගොවිපළ යන්ත්‍රසූත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ පවතින ජාතික මට්ටමේ එකම පුහුණු ආයතනයයි. මෙම ආයතනය 1971 වර්ෂයේදී බටහිර ජර්මනි රජයේ සහ ශ්‍රී ලංකා රජයේ සහයෝගයෙන් ස්ථාපිත කරන ලද්දකි. අනුරාධපුර පුලියන්කුලම ප්‍රදේශයේ පිහිටා ඇති මෙම ආයතනයට හෙ. 17ක බිම් ප්‍රමාණයක් අයත් වන අතර එහි වී, පොල්,

පලතුරු, එළවළු, මං තීරුවක්, පුහුණු ක්ෂේත්‍ර සහ වෙනත් ප්‍රයෝජනවත් ගොඩනැගිලි ඇතුළත් වේ. ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය තුළ පුහුණුවන්නන් 50 දෙනෙකු පමණ වෙනුවෙන් ආහාර සහ නවාතැන් පහසුකම් එකවරකදී සැපයීමේ හැකියාව ඇත.

මෙම ආයතනයේ ඉදිරි දැක්ම වනුයේ ශ්‍රී ලංකාවේ ගොවිපළ යාන්ත්‍රීකරණය පිළිබඳ විශිෂ්ටම ආයතනය බවට පත්වීමයි.

මෙම ආයතනයේ මෙහෙවර වනුයේ කෘෂිකර්මයේ තිරසාර සංවර්ධනය උදෙසා සුදුසු පරිදි යාන්ත්‍රීකරණය උපයෝගී කර ගන්නා නිපුණතාවයෙන් පිරි ගොවි ප්‍රජාවක් බිහි කිරීමයි.

ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානයට ප්‍රධාන වශයෙන්ම පහත සඳහන් අංශ සම්බන්ධ වගකීම පැවරී ඇත.

- රෝද 4 ට්‍රැක්ටර් ක්රියා කරවීම සහ නඩත්තුව පිළිබඳ වෘත්තීය පුහුණුව - දින 10
- රෝද 4 ට්‍රැක්ටර් ක්‍රියා කරවීම සහ නඩත්තුව - දින 5
- රෝද 2 ට්‍රැක්ටර් ක්‍රියා කරවීම සහ නඩත්තු - දින 5
- ජල පොම්ප ක්‍රියා කරවීම සහ නඩත්තුව - දින 10
- දියර ඉසින යන්ත්‍ර ක්‍රියා කරවීම සහ නඩත්තු - දින 10
- අස්වනු නෙළන, කොළ මඩින යන්ත්‍ර සහ සංයුක්ත අස්වනු නෙළන යන්ත්‍ර ක්‍රියා කරවීම සහ නඩත්තුව - දින 2
- බලවේග පැළ සිටුවන යන්ත්‍ර ක්‍රියාකරවීම සහ නඩත්තුව - දින 3

**අලුත්වැඩියා පාඨමාලා**

- රෝද 2 ට්‍රැක්ටර් (K75) එන්ජිම හා සම්ප්‍රේෂණ පද්ධතිය අලුත්වැඩියා කිරීම - දින 10
- ජල පොම්ප අලුත්වැඩියාව - දින 5

**ක්ෂුද්‍ර ජල සම්පාදන පාඨමාලා**

- ක්ෂුද්‍ර ජල සම්පාදනය පිළිබඳ හඳුන්වාදීම් පාඨමාලාව දින - 3
- වාණිජමය කෘෂිකර්මය සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදනය යොදා ගැනීම සහ නිර්මාණය කිරීම - දින 5

**වෙනත් පාඨමාලා**

- කෘෂිකර්මික කටයුතු සඳහා යොදා ගන්නා අතින් ක්‍රියාකරවන උපකරණ
- ගෙවතු වගාව

**ඉලක්ක කණ්ඩායම්**

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්
- අනෙකුත් ආයතනවල නිලධාරින්
- ගොවීන්
- පාසැල් / විශ්වවිද්‍යාල/ කෘෂිකර්ම විද්‍යාල/ තාක්ෂණික විද්‍යාවල සිසුන්

ගොවිපල යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථාන මගින් 2017 වර්ෂයේදී ඉලක්ක කරන ලද සහ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව වගු අංක 3.1.7 හි දැක්වේ.

**වගු අංක 3.1.7: අනුරාධපුර ගොවිපල යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානයේදී 2017 වසර තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව**

| වැඩසටහන | ඉලක්ක | | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | පුහුණු සංඛ්‍යාව | මිනිස් දින ගණන | පුහුණු සංඛ්‍යාව | මිනිස් දින ගණන |
| නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව) | 08 | 500 | 04 | 273 |
| නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන (වෙනත් ආයතන කාර්ය මණ්ඩල) | 05 | 250 | 07 | 339 |
| ගොවි පුහුණු පංති | 12 | 750 | 12 | 837 |
| ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන | 25 | 2800 | 54 | 6560 |
| වැඩමුළු, සම්මන්ත්‍රණ/ රැස්වීම් සහ සාකච්ඡා | 02 | 50 | | |
| එළිමහන් පුහුණු වැඩසටහන් | 05 | 200 | 05 | 267 |
| **එකතුව** | **57** | **4550** | **82** | **8276** |

## කාබනික කෘෂිකර්ම සඳහා වූ විශිෂ්ඨතා කේන්ද්‍රය - මාකඳුර

මාකඳුර, කාබනික කෘෂිකර්මය සඳහා වූ විශිෂ්ඨතා කේන්ද්‍රයේ ප්‍රධාන කාර්යයන් පහත සඳහන් වේ.

- පරිසර හිතකාමී කෘෂි තාක්ෂණයක් අත්හදා බැලීම
- කාබනික කෘෂිකර්මාන්තය සහ කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්.
- කොම්පෝස්ට් පොහොර සහ ජෛවීය බෝග සහතිකරණය කිරීමේ ක්‍රියාවලිය.
- කාබනික කෘෂිකර්මාන්තය හා කාබනික පොහොර ආදර්ශන කෘෂි උද්‍යානය වැඩිදියුණුව හා නඩත්තුව.

### ප්‍රගතිය

#### පුහුණු

- පුහුණු වැඩසටහන් 63ක් පවත්වන ලද අතර, පුහුණු වන්නන් 7,193ක් තම සහභාගීත්වය ලබා දුන්හ. එම පුහුණු කණ්ඩායම ගොවීන්, ව්‍යාප්ති නිලධාරීන්, කොම්පෝස්ට් නිෂ්පාදයන් සහ මීට අදාළ වෙනත් කණ්ඩායම් වලින් සමන්විත විය.
- වැඩමුළු 06ක් සිදු කරනු ලැබිය.

#### නව යන්ත්‍ර සහ නිෂ්පාදන ඒකකයේ කොම්පෝස්ට් නිෂ්පාදනය, සහ සංවර්ධන කටයුතු.

- ටොන් 200ක කොම්පෝස්ට් නිෂ්පාදනය කරන ලදී.
- ගැඩවිලි කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට අවශ්‍ය කොම්පෝස්ට් පොහොර ගොඩවල් පෙරලීමේ යන්ත්‍රයක් සංවර්ධනය කිරීම.

- ගැඩවිලි පණුවන් මගින් කොම්පෝස්ට් කිරීමේ ඒකකය, ජෛව අඟුරු ඒකකය. දහයියා අඟුරු ඒකකය සහ කොම්පෝස්ට් දියර පොහොර ඒකකය යන කාබනික පොහොර නිෂ්පාදන ඒකක ස්ථාපිත කරන ලදී.

### මාකඳුර CEOA සංවර්ධන කටයුතු

- මනා කාණු පද්ධතියක් සහ වාරි පහසුකම් සහිතව අක්. 10ක භූමි ප්‍රදේශයක් සහ කි.මී. 02ක අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කරන ලදී.
- පුහුණුලාභීන් සඳහා භෝජනාගාරයේ ඉදිකිරීම් කටයුතු නිම කරන ලදී.
- අක්. 02ක සහ අක්. 01ක භූමි ප්‍රදේශයක් පිළිවෙලින් පලතුරු සහ එළවළු බෝග වගා සිදුකරන ලදී.
- අක්. 1ක භූමි වපසරියක් ආවරණය කරමින් වල් සූරියකාන්ත සහ ග්ලිරිසීඩියා පැල ස්ථාපිත කරන ලදී.
- වැඩපල සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගන්නා ලදී.

### පර්යේෂණ කටයුතු

- කොම්පෝස්ට් වල ගුණාත්මක තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා වූ පර්යේෂණ අධ්‍යයන 05ක් නිමකරන ලදී.
- අන්නාසි, පේර හා පැෂන් ෆෲට් සම්බන්ධයෙන් කාබනික පැකේජ වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ අධ්‍යයන 03ක් ආරම්භ කරන ලද අතර, ඒවා අඛණ්ඩව සිදු වේ.

### කොම්පොස්ට් සඳහා සහතිකරණ ක්‍රියාවලිය

- සහතික කිරීමේ ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කරන ලද අතර අවශ්‍ය සියළු ලේඛණ මුද්‍රණය කරන ලදී.
- නිෂ්පාදකයන් තිදෙනකු සහතික කරන ලද අතර, නිෂ්පාදකයන් 50 දෙනෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් සහිතක කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.

### විශේෂ කරුණු

- මහජනතාව දැනුවත් කිරීම සඳහා 2017 දෙසැ. 14,15 සහ 16 යන දිනයන්හි ප්‍රදර්ශනයක් පවත්වනු ලැබීය.
- කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මූල්‍යාධාර සපයන ලද කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිත කිරීම පිළිබඳ වූ විශේෂ ව්‍යාපෘතිය මෙම ඒකකය මගින් ක්‍රියාත්මක කරන ලදී.

## උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනය - බිබිල

උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනය මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. 2003 අප්‍රේල් 01 වන දින එය ස්ථාපිත කරන ලද්දේ බිබිල කෘෂිකර්ම විද්‍යාලය සහ බිබිල උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපළ ඒකාබද්ධ කිරීමෙනි.

මෙම ආයතනයේ ප්‍රධාන අරමුණ පහත දැක්වේ.

- උද්‍යාන බෝග වගාව පිළිබඳ නව තාක්ෂණය හඳුන්වා දීම
- නව තාක්ෂණය යොදා ගනිමින් විවිධ පලතුරු පැළ නිපදවීම
- බිබිල කෘෂිකර්ම විද්‍යාලයේ කටයුතු සිදු කිරීම
- පැළ තවාන් සහායක වැඩසටහන (NVQ 3/4 මට්ටමේ පුහුණු පාඨමාලාව) පැවැත්වීම
- රජයේ නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන නිලධාරින්, ගොවීන් සහ ශිෂ්‍යයින් (පාසැල් / විශ්ව විද්‍යාල) සඳහා නව තාක්ෂණය යොදා ගනිමින් පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ක්ලෝන සංරක්ෂණය
- පුහුණුව සහ නිෂ්පාදනය අරමුණු කරගත් ආදර්ශන ක්ෂේත්‍රය නඩත්තුව

- නව නිර්දේශ සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාව

2017 වර්ෂයේ සිදු කළ පුහුණු කටයුතුවල ප්‍රගතිය පිළිබඳ සාරාංශයක් වගු අංක 3.1.8 හි දැක්වේ.

**වගු අංක 3.1.8: බිබිලේ උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව**

| පුහුණුව | පුහුණු වැඩසටහන් ගණන | | මිනිස් දින ගණන | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| නිලධාරි පුහුණුව (කෘෂිකර්ම දෙපාර්තමේන්තු හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය) | 8 | 02 | 200 | 68 |
| ගොවි පුහුණුව | 40 | 05 | 1000 | 1173 |
| ක්ෂේත්‍ර පුහුණුව | 24 | 18 | 960 | 1640 |
| **එකතුව** | **68** | **15** | **2040** | **514** |

පුහුණු නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් ඉලක්ක කළ වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.

### වෙනත් කටයුතු

- NVQ 3/4 මට්ටමේ පැළ තවාන් සහායක පාඨමාලාව සඳහා පුහුණුලාභීන් 19ක් බඳවා ගන්නා ලද අතර ඔවුන් ආයතනික පුහුණුව නිමකොට රැකියාස්ථ පුහුණුව සඳහා සම්බන්ධ වූහ.
- බිබිලේ කෘෂිකර්ම විද්‍යාලයේ NVQ 5 වන මට්ටමේ කෘෂි නිෂ්පාදන සහ තාක්ෂණය පිළිබඳ වූ පාඨමාලාව සිසුන් 46 විසින් හදාරණ ලදී.
- හෙක්. 2ක පැරණි අඹ වගා ක්ෂේත්‍රයක් පුනරුත්ථාපනය කරන ලදී.
- අඹ පැළ නිෂ්පාදන වැඩසටහනින් මි. 4ක ලාභයක් උපයන ලදී.

## දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - වීරවිල

මෙම පුහුණු මධ්‍යස්ථානය ගොවි ප්‍රජාව, පාසැල් සිසුන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු, වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල පිරිස් දැනුවත් කිරීමට සහ කෘෂිකර්මය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. අ.පො.ස (සා.පෙළ) නිම කළ පාසැල් හැරගිය පිරිස් සඳහා 2015 වර්ෂයේ සිට NVQ 4 මට්ටම සඳහා පුහුණු වැඩසටහනක් පවත්වයි. මෙය සය මාසික ආයතනික සහ සය මාසික රැකියාස්ථ පුහුණු කාලයකින් සමන්විතය.

### ප්‍රගතිය

2017 වර්ෂයේ පුහුණු වැඩසටහන් පිළිබඳ සාරාංශ වාර්තාව වගු අංක 3.1.9 හි දැක්වේ. 2016 වර්ෂයේදී NVQ 4 පුහුණුවට බැඳුණු සිසුන් 12 දෙනෙකු තම රැකියාස්ථ පුහුණුව නිමකලේ 2017 වර්ෂයේදීය. 2017 ඔක්තෝබර් මාසයේදී නව සිසුන් කණ්ඩායමක් බඳවා ගන්නා ලද අතර, ඔවුන් ආයතනික පුහුණුව ලබති.

වගු අංක 3.1.9: 2017 වර්ෂයේ වීරවිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව

| ප්‍රධාන කාර්යයන් | වාර්ෂික ඉලක්ක | | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | වැඩසටහන් සංඛ්‍යාව | මිනිස් දින ගණන | වැඩසටහන් සංඛ්‍යාව | මිනිස් දින ගණන |
| නිලධාරී පුහුණුව (කෘෂිකර්ම දෙපාර්තමේන්තු හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල) | 02 | 50 | 03 | 95 |
| නිලධාරි පුහුණුව (වෙනත් ආයතනික කාර්ය මණ්ඩලය) | 04 | 160 | 01 | 21 |
| ගොවි පුහුණුව | 06 | 100 | 20 | 450 |
| ක්ෂේත්‍ර පුහුණුව | 06 | 200 | 02 | 147 |
| වැඩමුළු, සමුළු / රැස්වීම් හා සාකච්ඡා | 04 | 160 | 0 2 | 84 |
| එළිමහන් පුහුණු වැඩසටහන් | 02 | 40 | - | - |
| **එකතුව** | **24** | **710** | **28** | **797** |

## දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - වාවින්න

මෙම පුහුණු මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ අම්පාර දිස්ත්‍රික්කයේ පොල් වගා ජනපදය තුලය. මෙය ගොවීන්, නිලධාරීන්, පාසැල් සිසුන් සහ අනෙකුත් පිරිස් සඳහා කෘෂිකාර්මික දැනුම පිළිබඳ පුහුණුව ලබා දෙන ආයතනයකි.

තාක්ෂණික ක්‍රියාත්මක සැලැස්ම අනුව පුහුණු මධ්‍යස්ථානය විසින් සිදුකළ පුහුණු කටයුතුවල ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

වගු අංක 3.1.10: අම්පාර දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වීමට ඉලක්ක කළ හා පැවැත් වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව - 2017

| ප්‍රධාන කාර්යයන් | ඉලක්ක | | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | පුහුණු සංඛ්‍යාව | මිනිස් දින | පුහුණු සංඛ්‍යාව | මිනිස් දින |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරි පුහුණු වැඩසටහන | 20 | 236 | 05 | 122 |
| වෙනත් ආයතන කාර්ය මණ්ඩලය සඳහා නිලධාරි පුහුණු වැඩසටහන | 04 | 60 | 03 | 184 |
| ගොවි පුහුණු වැඩසටහන | 44 | 580 | 25 | 539 |
| ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන | 16 | 13 | 300 | 394 |
| වැඩමුළු | 06 | 95 | 02 | 76 |
| එළිමහනේ සිදු කළ පුහුණු කාර්යයන් | 09 | 115 | 05 | 341 |
| **එකතුව** | **99** | **1099** | **340** | **1656** |

## දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - පොළොන්නරුව

පොළොන්නරුව දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය කඳුරුවෙල නගරය ආසන්නයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්ථානගතව තිබේ. මෙම ඒකකය ආදර්ශන ගොවිපළක් හා කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් පවතී. මෙහි වගා බිම් ප්‍රදේශය අක්. 4.5ක් පමණ වේ. දෙපාර්තමේන්තු නිර්දේශ අනුව ආදර්ශ ගොවිපළෙහි වී, වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු, පලතුරු හා වෙනත් බෝග (පොල්) වගා කර ඇත. ආදර්ශන ගෙවත්ත සත්ව පාලන අංශය හා බිම්මල් වගා ඒකකය මගින් නව තාක්ෂණයන් ප්‍රචලිත කිරීම සිදු වේ.

2017 වර්ෂයේදී පුහුණු වැඩසටහන් 44ක් (මිනිස් දින 1411ක්) සිදු කරන ලද අතර එයට නිලධාරීන් සඳහා වැඩසටහන් 24ක්ද (මිනිස් දින 940) ගොවීන් සඳහා වැඩසටහන් 20ක්ද (මිනිස් දින 447) එළිමහන් පුහුණු වැඩසටහන් 40ක්ද (මිනිස් දින 922) ඇතුළත් විය. මෙයට අමතරව සිසුන් 05දෙනෙකු සඳහා NVQ 3/4 මට්ටමේ තවාන් කළමනාකරණ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

## දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - අඬඩාලච්චේන

දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය අඬඩාලච්චේන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත. ගොවීන්ගේ, පාසැල් සිසුන්ගේ, ගුරුවරුන්ගේ සහ ප්‍රදේශයේ වෙනත් නිලධාරීන්ගේ කෘෂිකාර්මික දැනුම ප්‍රායෝගික අංශයන්ගෙන්ද වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් මෙම මධ්‍යස්ථානය මගින් පුහුණු වැඩසටහන් පවත්වයි.

දිස්ත්‍රික්ක කෘෂි පුහුණු මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර තුල එළවළු සහ වෙනත් ක්ෂේත්‍ර බෝග සාර්ථකව වගා කරනු ලබයි. ගොවීන් සහ අනෙකුත් පුහුණු ලාභීන් සඳහා දැනුම සපයනු වස් ආදර්ශන ක්ෂේත්‍ර වශයෙන් මෙම ක්ෂේත්‍ර මනා සේ නඩත්තු කරනු ලැබේ.

**වගු අංක 3.1.11: අඬඩාලච්චේන දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව - 2017**

| කාර්යය | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | | මිනිස් දින ගණන | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| නිලධාරි පුහුණුව (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව) | 06 | 06 | 360 | 202 |
| නිලධාරි පුහුණුව (වෙනත් ආයතන) | 03 | 04 | 180 | 142 |
| ගොවි පුහුණු පංති | 25 | 14 | 1020 | 458 |
| ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් (සිසුන් හා ගොවීන්) | 03 | 02 | 140 | 59 |
| වැඩමුළු / සම්මන්ත්‍රණ/ රැස්වීම්/ සාකච්ඡා | 02 | 02 | 120 | 75 |
| එළිමහන් ගොවි පුහුණු වැඩසටහන් | 03 | 02 | 120 | 36 |
| **එකතුව** | **42** | **30** | **1940** | **972** |

## විශේෂ කරුණු

- අඩාලච්චෙන, සමන්තුරේ සහ තින්දවූර් ප්‍රදේශවල කෘෂිකර්ම දෙපාර්තමේන්තු තාක්ෂණික කාර්ය මණ්ඩලය, ප්‍රදේශයේ ගොවීන් සහ වෙනත් ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානයේදී කෘෂි ජංගම සේවා වැඩසටහනක් පවත්වන ලදී. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය මගින් බීජ අලෙවි කිරීම, පොල් වගා මණ්ඩලය මගින් තාක්ෂණික සේවා සැපයීම, පෞද්ගලික සමාගම් වෙතින් දෙමුහුම් බීජ හඳුන්වාදීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි කාර්යයන් මෙම වැඩසටහන් හරහා ක්‍රියාත්මක වේ.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු තාක්ෂණික කාර්ය මණ්ඩලය, ගොවීන් සහ වෙනත් ආයතනික කාර්ය මණ්ඩලය සඳහා බිම්මල් වගාව, පිළිබඳ ප්‍රායෝගික දැනුම වැඩි කිරීම සඳහා පුහුණු වැඩසටහනක් සංවිධානය කරනු ලැබීය.
- කාන්තා ගොවි සමාජ පිහිටුවීමේ අරමුණෙන්, අඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අග්නිදිග විශ්ව විද්‍යාලය සහයෝගීත්වයෙන් පවත්වන ලදී. මෙම කාන්තා ව්‍යවසායකයන් ඔළුවිල් විශ්ව විද්‍යාලයේ ස්ථාපිත (SEUSL) 'හෙළ බොජුන්' අලෙවි සැලේ ව්‍යවසායකයන් ලෙස බඳවා ගැනීමට අපේක්ෂිතය.
- ස්ථිර බෝග සායන පිළිබඳ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් පවත්වන ලදී.
- අක්කරෙයිපත්තු කලාපීය අධ්‍යාපන ඒකකයේ කෘෂි ගුරුවරුන් සඳහා තිරසාර කෘෂිකර්මාන්තය පිළිබඳ වූ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.
- අඩාලච්චේන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගොවීන් සහ නිලධාරින්ගේ සහභාගීත්වයෙන් මී මැසි ජනපද ස්ථාපනය කිරීම පිළිබඳ වැඩසටහනක් ඔලුවිල්හිදී පැවැත්විණ.

## කාන්තා කෘෂි ව්‍යාප්ති වැඩසටහන

කාන්තා කෘෂි ව්‍යාප්ති වැඩසටහනෙහි මෙහෙවර වනුයේ කෘෂිකාර්මික නිෂ්පාදනය හරහා රටේ කෘෂිකාර්මික සංවර්ධනය සහ සේවා අංශ කෙරෙහි කාන්තා දායකත්වය වැඩි කිරීම මගින් ගොවි පවුල්වල පෝෂණ තත්ත්වය සහ සමාජ තත්වය වැඩිදියුණු කිරීමයි.

මෙම වැඩසටහන මගින් සිදු කෙරෙන ප්‍රධානතම සේවා වනුයේ දේශීය ආහාර ප්‍රවර්ධනය, කාන්තාවන් සඳහා ව්‍යවසායක ප්‍රවර්ධනය වැඩසටහන් හඳුන්වාදීම, වඩා හොඳ ගෘහ පරිසරයන් ප්‍රවර්ධනය කිරීම හා කාන්තා සංවිධාන ස්ථාපිත කර ශක්තිමත් කිරීමයි. කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ඒ ඒ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) කාර්යාලයට අනුයුක්ත විෂයානුගත නිලධාරින් විසින් බිම් මට්ටමින් ක්‍රියාවට නංවනු ලැබේ.

2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති කාර්යයන්:

- හෙළ බොජුන් අලෙවිසැල් 2ක් යාපනය සහ නිට්ටඹුව ප්‍රදේශවල විවෘත කරන ලද අතර ඒ සඳහා නව කාන්තා ව්‍යවසායකයින් 50 දෙනෙකු බඳවා ගැනීමට පියවර ගැනිණි.
- පාසැල් සිසුන් අතර දේශිය ආහාර පරිභෝජනය ඉහළ නැංවීමේ අරමුණෙන් පාසැල් ආපන ශාලා 3ක් හෙළ බොජුන් අලෙවි සැල් බවට පරිවර්තනය කරන ලදී. විශාකා බාලිකා විද්‍යාලය, හිල්වුඩ් විද්‍යාලය, පුෂ්පදාන බාලිකා විද්‍යාලය හා විද්‍යාර්ථ විද්‍යාලය

යන පාසැල්වල පිහිටි ආපන ශාලා මෙලෙස පරිවර්තනය කරන ලද අතර ඒ සඳහා කාන්තා ව්‍යවසායකයෝ 20 දෙනෙක් බඳවා ගන්නා ලදහ.

- මහනුවර ශික්ෂණ රෝහලේ සහ ඔළුවිල්හි අග්නිදිග විශ්ව විද්‍යාලයේ ආපන ශාලා ද්විත්වය 'හෙල බොජුන්' අලෙවි මධ්‍යස්ථාන ලෙස පරිවර්තනය කරන ලදී. මෙම හෙල බොජුන් සැල් සඳහා කාන්තා ව්‍යවසායකයන් 45ක් බඳවා ගනු ලැබීය.

- දිවයින පුරා සිටින කාන්තා කෘෂි ව්‍යාප්ති විෂයානුගත නිලධාරීන් 35දෙනෙකු සඳහා කාන්තා කෘෂි ව්‍යාප්ති ක්‍රියාකාරකම් හා පෝෂදායී ආහාර ප්‍රවර්ධන වැඩසටහන් පිළිබඳ පුහුණු කරන ලදී.

- නව කාන්තා කෘෂි ව්‍යාප්ති සංවිධාන 25ක් දිවයින පුරා ස්ථාපිත කරන ලදී.

- කාන්තා ව්‍යවසායකයින් 1522 දෙනෙකු සඳහා පුහුණු පංති 57ක් දිවයින පුරා පැවැත්විණි. මේ අතරින් කාන්තාවෝ 360 දෙනෙක් අලුතින් ස්ථාපිත කරන ලද පෞද්ගලික හෙළ බොජුන් අලෙවි සැල් 31ක සේවය කරමින් සිටිති.

- "දේශිය සෞඛ්‍යාරක්ෂිත ආහාර ප්‍රවර්ධනය" නමැති තේමාව යටතේ ප්‍රදර්ශන 1 සහ සම්මන්ත්‍රණ 04ක් සඳහා සහභාගිත්වය ලබා දෙන ලදී.

- සමාජය තුල ජනප්‍රිය නොවූ දේශීය කෑම වට්ටෝරු ජනප්‍රිය කරවීම සඳහා දෘෂ්‍ය වැඩසටහනක් පටිගත කර විකාශය කරන ලදී.

- ව්‍යවසායකත්ව සංවර්ධනය සහ 2017 ආහාර උළෙල පිළිබඳ රූපවාහිනි වැඩසටහන් (රණබීමට අරුණැල්ල, නුග සෙවණ) විකාශය කරන ලදී.

- අන්තර් පළාත් ප්‍රදේශ 06ක් සහ පළාත් 09ක සහභාගීත්වයෙන් 2017 ආහාර උළෙල, ගන්නොරුව පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පැවැත්විණ. මෙම උළෙලේ පරමාර්ථය වූයේ දුර්ලභ කෑම වට්ටෝරු එක්රැස් කිරීමත්, අදාළ ප්‍රදේශවල ආහාර පිළියෙල කිරීම සඳහා යොදා ගත හැකි ජෛව විවිධත්ව පිළිබඳ ප්‍රදර්ශනාත්මකව ඉදිරිපත් කිරීමත්ය.

- මාතර, හලාවත, ත්‍රිකුණාමලය, පදියතලාව, වාකරේ සහ කන්නතලේ 'හෙල බොජුන්' අලෙවි මධ්‍යස්ථාන 6ක් ඉදිකිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.

- නිට්ටඹුව සහ යාපනය ප්‍රදේශයේ අළුතෙන් ස්ථාපිත 'හෙල බොජුන්' අලෙවි මධ්‍යස්ථාන 02ක් සඳහා අවශ්‍ය උපකරණ (සිසිල් බෝතල් 02, යුෂ පිළියෙල කිරීමේ යන්ත්‍ර 2ක්, මේස 20 සහ පුටු 80ක්) ලබා දෙන ලදී.

## කෘෂි ව්‍යාපාර සංවර්ධන සහ තොරතුරු සේවය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය යටතේ ඇති කෘෂි ව්‍යාපාර උපදේශන අංශය කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවය වශයෙන්ද හඳුන්වනු ලැබේ. මෙම අංශය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි ව්‍යාපාර සහ කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරන කේන්ද්‍රීය මධ්‍යස්ථානයයි.

මෙම මධ්‍යස්ථානය විවිධ ප්‍රවේශයන් හරහා කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරයි. මෙමගින් මෙහෙයවනු ලබන ප්‍රධාන වැඩසටහන් පහත දැක්වේ.

### ප්‍රගතිය

### යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) අනුගමනය කිරීමෙන් කෘෂි ආහාර නිපැයුම්වල සුරක්ෂිතතාව සහ ගුණාත්මය වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග

දේශීය හා විදේශීය වෙළඳපළවලට ඉදිරිපත් කරන කෘෂි නිපැයුම්වල ගුණාත්මය හා සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ක්‍රමවේදයක් යහපත් කෘෂිකර්ම පිළිවෙත් හරහා ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය කෘෂි ව්‍යාපාර උපදේශන අංශය විසින් ක්‍රියාත්මක කෙරේ.

මෙම අංශයේ නිලධාරීන්ගේ ප්‍රධාන රාජකාරි හා වගකීම් වන්නේ වගා ක්ෂේත්‍රයේ (පස සහ බීජ) සිට වෙළඳපළ දක්වා වන මුළු ක්‍රියාකාරකම් සමුදාය සම්බන්ධයෙන් උපදෙස් දීම, එම දාමය පරීක්ෂා කර බැලීම සහ මෙහෙයවීමයි. මෙහිදි ගුණාත්මයෙන් යුතු නිපැයුම් වෙළඳපළට ඉදිරිපත් කිරීම සහතික කරනු පිණිස දේශීය වෙළඳපළ සම්බන්ධයෙන් නම් සියල්ල වෙළඳපළ දක්වාද යුරෝපීය වෙළඳපළ සම්බන්ධයෙන් නම් මෙරටින් පිටව යන ස්ථානයට අදාළ වන ජාතික පැළෑටි නිරෝධායන සේවා අංශය දක්වාද අදාළ කාර්යයන් සිදු කෙරේ. ඒකාකාරී සැපයුමක් සහතික කිරීම සඳහා අමතර තොග පවත්වාගෙන යෑම පිණිස සතිපතා පදනම යටතේ බෝග දින දසුනක් පිළියෙල කිරීමද මෙම අංශය මගින් සිදුකරන කාර්යයන්හි ඇතුළත්ය.

එමෙන්ම යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සම්බන්ධයෙන් ප්‍රජාව නිලධාරින් හා ගොවීන්ට දිවයින පුරා පුහුණු වැඩසටහන් 1,707ක් පවත්වන ලදී. එම පිළිවෙත අනුගමනය කරන සහතික කරන ලද ගොවිපළ (SL-GAP) 155ක්ද රජයේ ආදර්ශන ගොවිපළ 23ක්ද දිවයින පුරා ස්ථාපිත කරන ලදී. එයට අමතරව, එම පිළිවෙත් අනුගමනය කරන ගොවි සමුපකාර සමිති 39ක්ද පිහිටුවන ලදී. ගොවීන් 2204 දෙනෙකු පිළිබඳ තොරතුරු එක්රැස් කර ගොවි දත්ත පද්ධතියන් සකස් කරන ලද අතර රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් ඇතුලත්ව මාධ්‍ය වැඩසටහන් 82ක් විකාශනය කරන ලදී.

බෝග පදනම මත පලතුරු හා එළවළු සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වා දෙමින් පවතී. කෘෂි ව්‍යාපාර හා සංවර්ධන තොරතුරු සේවය විසින් නිෂ්පාදකයින් ගුණාත්මය සහතික කළ සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචි කර සහතික කරන අතරම මෙම අංශය අදාළ පාර්ශ්වයන්ට අවශ්‍ය තොරතුරු සපයන දත්ත මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි.

යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වීමත් සමගම යුරෝපීය වෙළඳපළ සඳහා පලතුරු සහ එළවළු අපනයනය ප්‍රවර්ධනය විය. එමෙන්ම නිපැයුම් තොගවල සුරක්ෂිතතාව සහ ගුණාත්මයද සහතික කෙරිණි. එමගින් අපනයන වෙළඳපළෙන් නිපැයුම් ප්‍රතික්ෂේපවීම අවම කිරීමට හැකිවිය. 2017 වර්ෂයේදී කරවිල මෙ.ටො. 191.8ක්, පතෝල මෙ.ටො. 109.17ක්, අඹ මෙ.ටො. 12.98ක් සහ පේර මෙ.ටො. 3.28ක් යුරෝපීය වෙළඳපළට අපනයන කරන ලදී.

### කෘෂි ව්‍යාපාර වැඩසටහන

තරුණ ආකර්ශණයන් සමග වාණිජ ගොවිතැන සහ කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන, කෘෂි ව්‍යාපාර උපදේශක අංශය (DoAgbiz) හරහා ක්‍රියාත්මක කරන ලදී. කෘෂි ව්‍යවසායකයන් 12ක් (50%ක ගොවි දායකත්වය යටතේ) කෘෂි පාදක කටයුතු වලින් ප්‍රතිලාභ ලබති. ගොවි ව්‍යාපාර පාසල් පිළිබඳ (FBS) එක් පුහුණු වැඩසටහනක් පැවැත්විණි.

### කෘෂි ව්‍යවසායකයින් වීමට කැමැත්තක් දක්වන පුද්ගලයන්ගේ හැකියාව වර්ධනය කිරීමේ වැඩසටහන

සෑම වසරකට මෙම ඒකකය මගින් කෘෂි ව්‍යවසායකත්ව වර්ධනය කිරීමේ පාඨමාලා සංවිධානය කර පවත්වනු ලැබේ. සාර්ථක කෘෂි ව්‍යාවායකයකු වීමට අවශ්‍ය සිද්ධාන්ත හා ප්‍රායෝගික කරුණු ඇතුලත් මොඩියුල 14කින් මෙම පාඨමාලාව සමන්විත වේ. ගොවිපළක බෝග වගා කිරීම, අගය එකතු කළ නිෂ්පාදන සැකසීම, විභවයක් ඇති කෘෂි ව්‍යාපාර හඳුනා ගැනීම හා ව්‍යාපෘති වාර්තා ලිවීම වැනි විශාල පරාසයකින් යුත් කරුණු මෙම මොඩියුල වලින් ආවරණය කෙරේ. මෙම වැඩසටහන යටතේ පුහුණුවන්නන් 297ක් (මිනිස් දින 687) පුහුණු කරන ලදී. වාණිජ වැදගත්කමකින් යුත් විභවයක් සහිත කෘෂි ව්‍යාපාර පදනම් කරගනිමින් ව්‍යාපෘති වාර්තා 50ක් ඉල්ලීම් මත නිකුත් කරන ලදී.

### ගොවිපළ සංවර්ධනය සහ ඵලදායිතා ප්‍රවර්ධනය කිරීමේ තාක්ෂණික උපදේශන සේවා

කෘෂි ව්‍යාපාර සංවර්ධනය හා තොරතුරු සේවය මගින් ඌන උපයෝජිත වාණිජමය මට්ටමේ ගොවිපළ සංවර්ධනය කිරීම සඳහා සහාය ලබාදුණි. දේපලෙහි වත්මන් තත්ත්ව පිළිබඳ විස්තර සහ සිය කැමැත්ත දක්වමින් හිමිකරුට වියීමත් ඉල්ලීමක් ඉදිපත් කළ හැකිය. ඉන්පසු මෙම ආයතනය විසින් හිමිකරුගේ කැමැත්ත පරිදි ගොවිපළට ගොස් අපේක්ෂිත නිෂ්පාදනය කිරීමට අවශ්‍ය තාක්ෂණික නිර්දේශ ලබාදීම සඳහා විශේෂඥ කණ්ඩායමක් තෝරා දෙනු ලැබේ.

### 'කෘෂි සේවා පියස' වශයෙන් හඳුන්වන කෘෂි සේවා මධ්‍යස්ථානය මෙහෙයවීම සහ ඒ සඳහා තාක්ෂණික සහාය ලබාදීම (KSP)

වෙළඳපළ අරමුණු කරගත් ගොවිතැනට අවශ්‍ය විශේෂිත සේවා හෝ සාමාන්‍ය යෙදවුම් සහ උපදේශක සේවා සැපයීම අරමුණු කර ගනිමින් කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවය විසින් පෙර වසරවලදී "කෘෂි සේවා පියස" ස්ථාපිත කරන ලදී. කෘෂිකර්මය සඳහා නුසුදුසු රසායනික හා අනෙකුත් යෙදවුම් භාවිත කරන අවස්ථා ගණන අවම කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම අරමුණකි. කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවය කෘෂි සේවා පියස සඳහා තාක්ෂණික සහාය ලබාදී ඇත.

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවා සැපයුම සම්බන්ධීකරණය

බීජ සහතිකකරණය, පැළෑටි නිරෝධායන, විද්‍යාගාර පරීක්ෂණ සහ ව්‍යාප්ති සේවා වැනි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සපයන සේවාවන් සහ තාක්ෂණික තොරතුරු ලබාගැනීමට පැමිණෙන කෘෂි ව්‍යවසායකයන් සමඟ විධිමත් සම්බන්ධීකරණයන් හරහා අවශ්‍ය සේවාවන් ලබාදේ.

### SL-GAP සහතිකකරණ ඒකකය

SL-GAP සහතිකකරණය මූලික වශයෙන් පලතුරු සහ එළවළු නිෂ්පාදන සහතික කිරීමේ කළමනාකරණය පද්ධතියක් හා සම්බන්ධයෙන් අන්තර් පළාත්, පළාත් හා මහවැලි ප්‍රදේශ ඇතුලත් වන පරිදි මුළු දිවයිනම ආවරණ වන පරිදි කටයුතු කෙරේ. එහිදී ආහාර වල ගුණාත්මක තත්ත්වය සහ ස්වස්ථතාව, එළවළු හා පලතුරු වගාවේ පාරසරික තිරසාරත්වය, ආර්ථිකමය ඵලදායිතාව සහ සමාජ පිළිගැනීම වැනි කරුණු සහතික කිරීමේ ක්‍රියාවලියට ඇතුලත් වේ.

SL-GAP පටිපාටිය යටතේ ලියාපදිංචි වී ඇති සියළු සුළු, මධ්‍ය හා මහා පරිමාණයේ ගොවිපල අඛණ්ඩ මෙහෙයවීම හා විගණන තුලින් සහතික කිරීම සඳහා අවශ්‍යතා සහ නියමාවලින් ඇගයීම සම්බන්ධයෙන් මෙම SL-GAP සහතිකකරණ ඒකකය වගකීම දරයි.

### ප්‍රගතිය

සහතිකකරණ ලද පලතුරු සහ එළවළු ගොවිපල සංඛ්‍යාව පිළිවෙලින් 96ක් සහ 60ක් වේ. අදාළ වර්ෂය තුල ගොවිපළ 156ක් මෙම ආයතනය මඟින් සහතික කරන ලදී.

### විශේෂ කරුණු

SL-GAP සහතිකකරණය හරහා පලතුරු සහ එළවළු නිෂ්පාදනයේ වෙළෙඳපල විභවය පිළිබඳ ගොවීන් සහ පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

## මී මැසි සංවර්ධන ඒකකය - බිඳුණුවැව, බණ්ඩාරවෙල

මී මැසි සංවර්ධන ඒකකය ගොවීන් අතර මී මැසි පාලනය සංවර්ධනය කිරීමේ සහ ව්‍යාප්ත කිරීමේ වගකීම දරයි. මී මැසි පාලනය පිළිබඳ නව තාක්ෂණය ලබාදීම පිණිස පහත සඳහන් පහසුකම් මෙමගින් සපයනු ලැබේ.

- ගොවීන්, නිලධාරීන් සහ සිසුන් යනාදී පිරිස් පුහුණු කිරීම
- මී මැසි පාලන උපකරණ නිෂ්පාදනය
- මී මැසි පාලන උපකරණ සැපයුම්කරුවන් පුහුණු කිරීම, ලියාපදිංචි කිරීම සහ සහතික කිරීම
- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලට මී මැසි පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදීම
- පර්යේෂණ කටයුතු සඳහා තාක්ෂණික සහාය ලබාදීම.
- ශ්‍රී ලංකාවේ මී මැසි පාලනය සහ මී පැණි නිෂ්පාදනය පිළිබඳව වාර්ෂිකව දත්ත රැස් කිරීම.

### ප්‍රගතිය

**වගු අංක 3.1.12: පුහුණු වැඩසටහන් හා මී මැසි ජනපද නඩත්තු පිළිබඳ ප්‍රගතිය - 2017**

| කාර්යය | කාණ්ඩය | පුහුණු වැඩසටහන සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| මී මැසි පාලන පුහුණු වැඩසටහන | නිලධාරීන් | 06 | 07 |
| | ගොවීන් | 10 | 23 |
| | විශ්වවිද්‍යාල | - | 04 |
| | ශිෂ්‍යයින් | - | 1,048 |
| මී මැසි පාලන උපකරණ නිෂ්පාදන පිළිබඳ පුහුණුව | ව්‍යවසායකයින් | 04 | 03 |
| මී මැසි ජනපද නඩත්තු | මී පැණි නිෂ්පාදනය | 500 kg | 328.25 kg |
| | ජනපද නඩත්තුව | 250 | 230 |

මී මැසි පාලනයට අදාළ උපකරණ නිෂ්පාදනයේ ප්‍රගතිය - අදාළ වසර තුල මෙම ඒකකය මඟින් මී මැසි පෙට්ටි 51ක්, දුම් විසුරුවන 133ක්, වද රාමු 27ක් සහ මී රැජිණ තහඩු 5,656ක් නිෂ්පාදනය කරන ලදී.

### විශේෂ කරුණු

- නව දේශන ශාලාවක් ඉදිකිරීමේ කටයුතු නිම කරන ලදී.
- නව තාක්ෂණය ගොවීන් සමග බෙදා ගැනීම සඳහා ක්ෂේත්‍ර දිනයක් පවත්වන ලදී.
- මී මැසි රැජිණ ඇති දැඩි කිරීමේ තාක්ෂණය යොදා ගනිමින් මී මැසි ජනපද නිපදවන ලදී.

## තරුණ ගොවි සමාජ මූලස්ථානය (YFC)

තරුණ ගොවි සමාජ යනු තරුණ ගොවි සමාජ ව්‍යාපාරයේ ගම් මට්ටමේ ආයතනයයි. මෙම ව්‍යාපාරයට අයත් අනෙකුත් අංග වනුයේ දිස්ත්‍රික් මට්ටමේ මූලික උපදේශක කමිටු, පළාත් මට්ටමේ උපදේශක කමිටු සහ ජාතික බලමණ්ඩලයයි. සාමාජිකත්වයේ සහභාගිත්වය ඇතිව මෙම කමිටු මගින් විවිධ මට්ටමින් අදාළ කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබේ. තරුණ ගොවි සමාජ ව්‍යාපාරයේ මූලස්ථානය මගින් සමස්ත සම්බන්ධීකරණය සිදු කෙරේ. තරුණ ගොවි සමාජ 3,000ක් පමණ පිහිටුවා ඇති අතර එයින් 1/3ක් මූලස්ථානයේ ලියාපදිංචි කර ඇත.

### ප්‍රගතිය

**වගු අංක 3.1.13: තරුණ ගොවි සමාජ මූලස්ථානයේ පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව**

| කාර්යය | අනු ක්‍රියාකාරකම් | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| පුහුණු වැඩසටහන | YFC සාමාජිකයන් සඳහා පුහුණු වැඩසටහන් | 480 | 400 |
| | නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් | 60 | 50 |
| | YFC සාමාජිකයන් සඳහා වාණිජ කෘෂි ව්‍යාපෘති හඳුන්වාදීම | 240 | 200 |
| රැස්වීම | මූලික උපදේශන කමිටු | 30 | 20 |
| | පළාත් උපදේශක කමිටු | 09 | 05 |
| | ජාතික ෆෙඩරේෂණය | 01 | 01 |
| YFC වෙතින් පවත්වන ලද වැඩසටහන් | සංස්කෘතිය වැඩසටහන් | 1,000 | 900 |
| | ආගමික | 500 | 420 |
| | අධ්‍යාපනික වැඩසටහන් | 200 | 180 |
| | සමාජ වැඩසටහන් | 1,000 | 950 |
| ගුවන් විදුලි වැඩසටහන් | ගුවන් විදුලි ප්‍රශ්ණ විචාරත්මක තරඟ | 52 | - |
| නව YFC ස්ථාපිත කිරීම | ASC කලාප<br>YFC / මහවැලි කලාප<br>YFC/ YFC පාසැල් | 1,000 | 1,550 |
| මාධ්‍ය / ප්‍රචාරණ | ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත මාධ්‍ය හරහා දිවයින පුරා ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීණ. | 160 | 140 |
| **එකතුව** | | **4,732** | **4,816** |

### විශේෂ කරුණු

- පාසැල් මට්ටමින් තරුණ ගොවි සමාජ 800ක් පිහිටුවීම.
- කාබනික පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානයක් ඇල්පිටියේ පිහිටුවීම.
- තරුණ ගොවි සමාජ පිළිබඳ විශේෂ රූපවාහිනි වැඩසටහන් නිෂ්පාදනය කරන ලදී.

## ජල කළමනාකරණ සහ ආරක්ෂිත කෘෂිකර්ම ඒකකය

මෙම ඒකකය පහත සඳහන් විෂයන්ට අදාළව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කාර්ය මණ්ඩලයට, අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවල, පෞද්ගලික අංශයේ පිරිස්වලට සහ මෙරට ගොවි ප්‍රජාවට තාක්ෂණය ජනනය කර බෙදා හැරීමට කටයුතු කරයි.

- දේශගුණික විපර්යාසයෙන් වන බලපෑම අවම කර ගැනීම සඳහා කෘෂිකාර්මික අනුවර්තන තාක්ෂණයන් භාවිතය
- ගොවිපළ ජල සම්පාදනය සහ ජල සම්පාදන කළමනාකරණය
- ක්ෂුද්‍ර ජල සම්පාදන තාක්ෂණය සහ පොහොර මිශ්‍රිත ජලය යෙදීමේ තාක්ෂණය
- පාලිත පාරිසරික කෘෂිකර්මය (ආරක්ෂිත කෘෂිකර්ම - ආරක්ෂිත ගෘහ, වැසි ආවරණ, දැල් ගෘහ)
- වාර්ෂික හා බහුවාර්ෂික බෝග වාණිජමය වශයෙන් වගා කිරීම (වාණිජමය ගොවිපළ සඳහා වැඩිදියුණු කළ සැලසුම්)
- ජල රෝපණ වගාව සහ උසස් පැළ තවාන් කළමනාකරණය

යථෝක්ත ක්‍රියාවලිය පහසු කිරීම සඳහා අදාළ පොත්, කුඩා පොත්, පත්‍රිකා සහ ඉදිරිපත් කිරීම් ආදිය පිළියෙල කරන ලදී. සුළු පරිමාණයේ සිට මහා පරිමාණය දක්වා වන වාණිජමය ගොවිපළ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීමද මෙම ඒකකයේ වැදගත් කාර්යභාරයකි. එයට අමතරව, ක්ෂුද්‍ර ජල සම්පාදනය සහ ආරක්ෂිත කෘෂිකර්ම යොදා ගනිමින් ගොවිපළ සංවර්ධනය කිරීමේ වැඩසටහන් සඳහා තාක්ෂණික සහාය ලබාදෙයි. මෙම ඒකකය විසින් අමාත්‍යාංශ අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අතර බෝග නායක වැඩසටහන වැනි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද වෙනත් වැඩසටහන් කරගෙන යාමටද උපකාරී විය.

### ප්‍රගතිය

**වගු අංක 3.1.14: ජල කළමනාකරණ සහ ආරක්ෂිත කෘෂිකර්ම ඒකකය මඟින් තාක්ෂණ ජනනය සහ බෙදා හැරීම**

| කාර්යයන් | ප්‍රගතිය |
|---|---|
| 1. ක්ෂුද්‍ර ජල සම්පාදනය හා ආරක්ෂිත කෘෂිකර්මය, කාලගුණික විපර්යාසවලට අනුවර්තනය වීම පිළිබඳව නිලධාරීන් සහ ගොවීන් සඳහා පුහුණු වැඩසටහන්. | 23 |
| 2. ක්ෂුද්‍ර ජල සම්පාදන හා ආරක්ෂිත ගෘහ සඳහා ඇස්තමේන්තු, ඇගයීම් වාර්තා සැකසීම. | 48 |

| කාර්යයන් | ප්‍රගතිය |
|---|---|
| 3. ගොවීන් හෝ ආයතන වල ඉල්ලීම මත ප්‍රතිරෝධන මාපන උපයෝගී කර ගනිමින් කෘෂි ළිං සඳහා භූගත ජල සමීක්ෂණය. | 60 |
| 4. විවිධ වූ කෘෂි පාරසරික කලාප වල අලෙවි කළ හැකි අස්වනු පවතින පදනම් කරගෙන දැනට පවත්නා පොහොර මිශ්‍රිත ජලය සැකසීමේ ක්‍රම ඇගයීම පිළිබඳ ගොවි සමීක්ෂණ | 85 |
| 5. ජනමාධ්‍ය වැඩසටහන් සඳහා තාක්ෂණික තොරතුරු සැපයීම සහ සහභාගීත්වය ලබාදීම | 13 |
| 6. වෙනත් ආයතනවල තාක්ෂණික රැස්වීම් සඳහා සහභාගි වීම. | 21 |
| 7. ක්ෂුද්‍ර වාරි පද්ධති, ආරක්ෂිත කෘෂිකර්මාන්තය සහ කාලගුණික විපර්යාසවලට අනුවර්තනය වීම පිළිබඳ වූ පවර් පොයින්ට් ඉදිරිපත් කිරීම, අත් පත්‍රිකා සහ කුඩා පොත් සැකසීම | 07 |
| 8. වෙනත් ආයතනවල ඉල්ලීම මත ව්‍යාප්ති අංශයේ කෘෂි ජංගම සේවාවෙහි සම්පත් දායකයන් වශයෙන් සහභාගි වීම. | 13 |

- කාලගුණ විපර්යාස සඳහා කෘෂිකාර්මික වශයෙන් අනුවර්තනය වීමේ ක්‍රම හඳුන්වා දීම.
- අඛණ්ඩ නිෂ්පාදනය සඳහා හරිතාගාර තුල කෘත්‍රිම අලෝකකරණය හඳුන්වාදීම.

### ආරක්ෂිත ගෘහ සහ ක්ෂුද්‍ර වාරි පද්ධති පිළිබඳ ඇස්තමේන්තු සැලසුම් කිරීම සහ සැකසීම

රජයේ ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශයේ ආයතන සහ ගොවි ප්‍රජාව සඳහා ක්ෂුද්‍ර වාරි පද්ධති සහ ආරක්ෂිත ගෘහ පිළිබඳ සැලසුම් සහ පිරිවිතර සපයන ලදී.

### විශේෂ කරුණු

පහත සඳහන් ජන මාධ්‍ය වැඩසටහන් හරහා තාක්ෂණික පණිවිඩ ලබා දෙන ලදී.

- 'කඳුරට' ගුවන්විදුලි වැඩසටහන
- ස්වදේශි ගුවන් විදුලි වැඩසටහන
- 'රන්ගිරි රන් දියවර' රේඩියෝ වැඩසටහන සහ 'ලංකාදීප'/ 'සිරිකත' පුවත්පත්.

## සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය

ප්‍රගති මෙහෙයුම් ඒකකයට පැවරී ඇති ප්‍රධාන වගකීම වන්නේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ සියලුම මූල්‍ය සහ තාක්ෂණික කාර්යයන් සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සහ එම කාර්යයන්හි ප්‍රගතිය මෙහෙයවීමය.

2017 වසර තුළ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ සියලුම උප ඒකකවල මූලධන ප්‍රතිපාදනවලට අදාළ වාර්ෂික ක්‍රියාකාරි සැලසුම් එක්රැස් කර සම්පාදනය කිරීම මෙම ඒකකය මගින් සිදු කෙරිණි. එම කාර්යයන්ට අමතරව, තාක්ෂණික කාර්යයන්ට සහ විශේෂ ව්‍යාපෘතිවලට අදාළ ක්‍රියාකාරි සැලසුම් සියල්ලද මෙමගින් එක්රැස් කර සම්පාදනය කරන ලදී. ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ මූලධන, පුනරාවර්තන සහ විශේෂ ව්‍යාපෘති ප්‍රතිපාදන මෙන්ම තාක්ෂණික කාර්යයන් පිළිබඳ මාසික ප්‍රගති වාර්තා ද මෙමගින් පිළියෙල කරන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ යටතේ ක්‍රියාත්මක කෙරෙන මූලධන, පුනරාවර්තන, තාක්ෂණික සහ විශේෂ

ව්‍යාපෘතිවල මාසික ප්‍රගති වාර්තා සකස් කර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකයට යැවීණි. කෘෂිකර්ම අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ ක්‍රියාත්මක කෙරෙන විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් මැදිරියට යැවිණි. සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා, මහ බැංකු වාර්තා, පාර්ලිමේන්තු අයවැය කථාව සඳහා තොරතුරු ලබාදීමේද නියැළිණි. වාර්ෂික අයවැයට ඉදිරිපත් කිරීම සඳහා ලද ව්‍යාපෘති යෝජනාද මෙම ඒකකය විසින් සම්පාදනය කරන ලදී. ව්‍යාප්ති අංශයේ සියළු අනු අංශ සඳහා එම අංශ වල ඉල්ලීම මත ප්‍රතිපාදන වෙන්කිරීම් සිදුකිරීම මෙම සැලසුම් අංශය මගින් සිදුකරන ලදී. තොරතුරු ලබාගැනීමේ පනත යටතේ මෙම ඒකකය මගින් ව්‍යාප්ති අංශයට අදාළ තොරතුරු සපයනු ලැබේ.

### අධ්‍යාපන ඒකකය

දිවයිනේ කෘෂි ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය මධ්‍යම මට්ටමේ මානව සම්පත් ලබා දීම සඳහා වූ ඵලදායී මෙන්ම කාර්යක්ෂම කෘෂි අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණින් ව්‍යාප්ති අංශයේ අධ්‍යාපන අංශය පහසුකම් සලසනු ලැබේ.

අධ්‍යාපන උප ඒකකය යටතේ කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව වන ජාතික වෘත්තීය සුදුසුකම 6වන මට්ටම පවත්වන කෘෂිකර්ම විද්‍යාලද, ජාතික වෘත්තීය සුදුසුකම් 5වන මට්ටමේ කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව පවත්වන කෘෂිකර්ම විද්‍යාල ද අධ්‍යාපන ඒකකය මගින් අධීක්ෂණය කිරීමත් මෙහෙයවීමත් සිදු කරනු ලබයි.

NVQ 6 වන මට්ටමේ පාඨමාලා කුණ්ඩසාලේ, පැල්වෙහෙර, අඟුණකොළපැලැස්ස, වවුනියා සහ කරපිංච යන කෘෂි විද්‍යාල 5ක පවත්වනු ලැබේ. මෙම විද්‍යාල මගින් පිරිනමන ලද දෑ අවුරුදු ඩිප්ලෝමාව, 2013 වසරේ සිට NVQ 6 මට්ටමේ කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වූ උසස් ජාතික ඩිප්ලෝමාව ලෙස පරිවර්තනය කරන ලදී. මෙම පාඨමාලාව වසර 2ක ආයතනික පුහුණු කාලයකින් සහ මාස 6ක රැකියාස්ථ පුහුණුවකින් යුක්ත වේ. NVQ 5 වන මට්ටමේ කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වූ ජාතික ඩිප්ලෝමාව එක් වර්ෂයක ආයතනික පුහුණුවකින් සහ මාස 6ක් රැකියාස්ථ පුහුණුවකින් යුක්ත වේ. ආයතනික පුහුණුවෙන් පසු සිසුන් ජාතික ආධුනිතක්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ මඟපෙන්වීම යටතේ රැකියාස්ථ පුහුණුව සඳහා යොමුවිය යුතුය. රැකියාස්ථ පුහුණුව සාර්ථකව නිම කල සිසුන් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මඟින් පවත්වනු ලබන නිපුණතාවය පාදක කොට ගත් ඇගයුමට මුහුණ දිය යුතුය. මෙම ඇගයුම සමත්වුවන්හට පමණක් NVQ සහතිකය පිරිනමනු ලැබේ. සියළු කෘෂි විද්‍යාල සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධති හඳුන්වා දෙන ලදී.

NVQ 6 වන මට්ටමේ විද්‍යාල 5 වන්නේ අනුරුධපුර, බිබිල, පරන්තන්, පාලමුණ, ලබුදූව සහ වාරියපොල පිහිටි කෘෂි විද්‍යාලයි. මෙම සියළු විද්‍යාලවල NVQ මට්ටම 6 හා 5 ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලා පවත්වනු ලැබේ.

අදාළ වසර තුල NVQ 6 වන මට්ටමේ කෘෂි විද්‍යාලවල සිසුන් 588ක් කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හදාරන ලද අතර, NVQ 5 වන මට්ටමේ විද්‍යාලවල සිසුන් 207ක් කෘෂිකර්ම නිෂ්පාදන තාන්ෂණය පිළිබඳ ජාතික මට්ටමේ පාඨමාලාව හදාරණ ලදී. සමස්තයක් වශයෙන් සිසුන් 795ක් 2017 වසරේ අවසානයේදී නේවාසිකව පාඨමාලා හදාරණ ලදී. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ ඒකාබද්ධව මෙරට

කෘෂිකර්මාන්තයේ කාලීන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වූ උසස් ජාතික ඩිප්ලෝමාව සහ ජාතික ඩිප්ලෝමාවට අදාළ විෂය නිර්දේශ හා විෂයමාලා කාලීනව සංශෝධනය කිරීම පිළිබඳ සහතිකවීම මෙම ඒකකය විසින් සිදුකරනු ලබයි. සංවර්ධනය සඳහා තාක්ෂණික සහාය සහ නිපුණතාවය පාදක කොටගත් පුහුණු විෂය මාලා සංශෝධනය සම්පූර්ණයෙන්ම වෘත්තිය තාක්ෂණය පිළිබඳ වූ විශ්ව විද්‍යාලය වෙත ලබා දෙනු ලබන්නේ මෙම ඒකකය මඟිනි මීට අමතරව NVQ 6 හා 5 වන මට්ටම සඳහා විෂය මාලා අනුව පාඩම් සැලසුම් සහ පුහුණු පටිපාටිය සකස් කරනු ලැබේ.

2017 වසර තුලදී ඩිප්ලෝමා සහතික පිරිණැමීමේ උත්සව 2ක් පැවැත්විණි.

1. 2015 වසරේදී NVQ 6 වන මට්ටම සම්පූර්ණ කල සිසුන් 213ක් සඳහා 2017 ජුනි 22 වන දින ඩිප්ලෝමා සහතික ප්‍රදානය කරන ලදී.
2. 2017 නොවැම්බර් 24 දිනදී NVQ 6 සහ NVQ 5 මට්මට සම්පූර්ණ කල සිසුන් සඳහා සහතික ප්‍රදානය කරන ලදී. NVQ 6 මට්ටමේ සුදුසුකම් ලැබ 2016 හා 2017 වසරවලදී ආයතනික පුහුණු නිමකල සිසුන් 404ක් සහ NVQ 5 මට්ටමේ සුදුසුකම් ලැබ 2016 සහ 2017 වසරවලදී ආයතනික පුහුණුව නිම කල සිසුන් 340ක් සඳහා සහතික ප්‍රදානය කරන ලදී.

NVQ 6 වන මට්ටමේ කෘෂි විද්‍යාල පිළිබඳ සුවිශේෂී කරුණු පහත සඳහන් වේ.

## කෘෂිකර්ම විද්‍යාලය, කුණ්ඩසාලේ

කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලය මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. මෙම කෘෂිකර්ම විද්‍යාලය කෘෂි අධ්‍යාපනයේ පුරෝගාමී ආයතනයක් ලෙස හඳුනාගත හැක. මෙම ආයතනයට අයත් සමස්ත භූමි වපසරිය හෙක්. 31.6ක් වන අතර එයින් අක්. 19.48ක් භූමි ප්‍රමාණයක බෝග වගා කර ඇත. මෙම ආයතනය වත්මන් තත්ත්වය දක්වා ක්‍රම ක්‍රමයෙන් දියුණු කර ඇත. කෘෂි ක්ෂේත්‍රයේ විවිධ පැතිකඩ පිළිබඳ අවශ්‍ය දැනුම සිසුනට ලබා දීම සඳහා වූ සියළු අංගෝපාංගයන්ගෙන් මෙම ආයතනය සමන්විතය. මීට අමතරව මෙම ආයතනයේ ඉංජිනේරු, සත්ත්ව පාලන, බිම්මල් වගා අංශද, ගොවිපලක්ද ඇත. මෙම ආයතනයේ දේශන ශාලා නවීන ශ්‍රව්‍ය දෘෂ්‍ය උපාංගයන්ගෙන් සහ විද්‍යාගාර වලින් සමන්විතය. වටිනා පොත් සහ සඟරා එකතුවක් සහිත පුස්තකාලයක්ද මෙම ආයතනය තුල පවතී. මීට අමතරව මෙම විද්‍යාල පරිසරයේ ස්ථාපිත කර ඇති කාලගුණ විද්‍යා ඒකකය ද සිසුන් සඳහා අධ්‍යාපනික කටයුතු වලදී බෙහෙවින් උපකාරී වේ. මෙහි ඩිප්ලෝමා පාඨමාලාව පූර්ණ කාලීන නේවාසික පාඨමාලාවක් වන බැවින් සියළු සිසුන් හට නේවාසික පහසුම් සපයනු ලැබේ. මෙම පරිශ්‍රය තුල නේවාසිකාගාර හතරක් ස්ථාපිත කර ඇති අතර දෙක බැගින් ගැහැණු සහ පිරිමි ලෙස වෙන් කර ඇත.

අදාළ වසර තුලදී පුස්තකාලයක්, තොරතුරු තාක්ෂණ පහසුකම්, ශ්‍රවණාගාරයක්, සම්මන්ත්‍රණ ශාලාවක් සහ අධ්‍යයන කාර්ය මණ්ඩල කාමර ඇතුළු අධ්‍යයන ගොඩනැගිලි ස්ථාපිත කිරීම තුලින්, 2017 වසර තුලදී මෙම ආයතනයේ යටිතල පහසුකම් දියුණු කර ඇත.

## කෘෂිකර්ම විද්‍යාලය, අඟුණකොලපැලැස්ස

මෙම විද්‍යාලය දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර එය 1980දී ආරම්භ කරන ලදී. මෙම ආයතනය හෙක්. 32ක භූමි වපසරියක් තුල ගොවිපල පරිශ්‍රයකින්ද හෙක්. 3.5ක විද්‍යාල පරිශ්‍රයකින් යුක්ත වේ. මෙම භූමි වපසරිය සිසුන්ගේ ක්ෂේත්‍ර ප්‍රායෝගික

අත්හදා බැලීම් සඳහා මෙන්ම නේවාසිකාගාර සිසුන්ගේ පරිභෝජනය සඳහා ආහාර සපයා ගැනීමේදී ද උපකාරී වේ. ගොවිපළ තුල වගාකරන ලද බෝගවල අස්වැන්න මෙන්ම ගොවිපල තුලින් සපයා ගන්නා බිත්තර, කිරි මස් වැනි ආහාර ද නේවාසිකාගාරවල ආහාර අවශ්‍යතාව සපුරාලීමට උපකාරි වේ.

### ප්‍රගතිය

- මෙම පරිශ්‍රයේ අක්. 5ක භූමි ප්‍රමාණයක පොල් වගාව ස්ථාපිත කරන ලදී.
- අක්. 0.5ක යහපත් කෘෂිකාර්මහික පිළිවෙත් සහතිකකරණය කල අඹ වගාව සහ අක්. 0.25ක භූමි ප්‍රදේශයක් තුල කොළ එළවළු වගාව සිදු කරන ලදී.
- ගොවිපළ ආහාර අවශ්‍යතාව සපුරාලනු වස් අක්. 1ක භූමි ප්‍රදේශයක තෘණ වගා කරන ලදී.
- අක්. 7ක භූමි ප්‍රදේශයක වී වගාව සිදු කර මෙ.ටො. 10.2ක අස්වැන්නක් ලබා ගන්නා ලදී.
- ගොවිපළ කාර්යාලය සහ ගැහැණු නේවාසිකාගාරයේ කාමර 04ක් අළුත්වැඩියා කරන ලදී.
- නව ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර 50%ක වැඩ අවසන් කරන ලදී.

## කෘෂිකර්ම විද්‍යාලය, පැල්වෙහෙර

පැල්වෙහෙර කෘෂි කෘෂිකර්ම විද්‍යාලය මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ ස්ථාපිත කොට ඇත. මෙම විද්‍යාලය 1981දී පැල්වෙහෙර බීජ ගොවිපලේ ආරම්භ කරන ලදී. මෙම විද්‍යාලයට අයත් සමස්ථ භූමි වපසරිය හෙ. 27.4කි. මෙම පරිශ්‍රය තුල ස්ථාපිත කර ඇති බෝග වන්නේ වී, පලතුරු, පොල්, එළවළු, ධාන්‍ය ආදියයි. විද්‍යාලයට අයත් කුඹුරු අක්. 12ක් පවතින අතර යල, මහ දෙකන්නයම වගා කෙරේ. කුඹුරු වලින් ලබා ගන්නා වී එළදාව නේවාසික සිසුනගේ ආහාර අවශ්‍යතාවය සඳහා යොදා ගනු ලැබේ. මුළු වසර පුරාම නේවාසික සිසුනගේ ආහාර අවශ්‍යතාව සපුරාලීම සඳහා මෙම අස්වැන්න ප්‍රමාණවත්ය. අක්. 2ක භූමියක් තුල අඹ, දොඩම්, දෙළුම් ආදි පලතුරු වලින් යුතු පලතුරු උයනක් පවති. සත්ත්ව පාලන ඒකකය ද සිසුනගේ ප්‍රායෝගික අධ්‍යාපන කටයුතු සඳහා මනාසේ පවත්වා ගෙන යයි. පසුගිය දෙවසර තුල නිම කරන ලද තෙමහල් නේවාසික සංකීර්ණය සහ අධ්‍යයන ගොඩනැගිලි හේතුවෙන් විද්‍යාලයේ යටිතල පහසුකම් දියුණුවට පත්විය.

වර්තමානය වන විට විද්‍යාලය මගින් කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වූ උසස් ජාතික ඩිප්ලෝමාව පිරිණමන අතර ඒ සඳහා සිසුන්හට නේවාසික පහසුකම් සපයනු ලැබේ. මේ සඳහා නේවාසිකාගාර 3ක් ස්ථාපිත කොට ඇත. අදාල වසර තුල මේ පාඨමාලාව හදාරණ සිසුන් ගණන 138ක් විය. ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීමට අමතරව, පාසැල් සිසුන්, ගුරුභවතුන් සහ ගොවීන්ගේ ඉල්ලුම් අනුව, කෘෂි තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලා පවත්වනු ලැබේ.

අතිරික්ත බෝග අස්වනු, සත්ත්ව නිෂ්පාදන, එළවළු සහ පලතුරු බාහිර පුද්ගලයන්ට විකිණීම තුලින් මෙම ආයතනය යම් ආදායමක් ද උපයයි.

### ප්‍රගතිය

2017 වසර තුල යන්ත්‍ර හඳුන්වා දීමෙන් ක්ෂේත්‍ර කටයුතු යාන්ත්‍රිකරණය කරන ලදී. එසේ හඳුන්වා දෙනු ලැබූ යන්ත්‍ර වනුයේ වී වගාවේ පැල සිටුවීමේ යන්ත්‍රයක්, වල් නෙලීමේ යන්ත්‍රයක් සහ රෝද 4 ට්‍රැක්ටරයක්ය.

## කෘෂිකර්ම විද්‍යාලය, වවුනියාව

වවුනියා කෘෂිකර්ම විද්‍යාලය වවුනියා දිස්ත්‍රික්කයේ, තාණ්ඩිකුලම් හි පිහිටා

තිබෙන අතර, දෙමළ භාෂාව පමණක් කථා කරන ගොවීන් සඳහා නව කෘෂි තාක්ෂණ හඳුන්වා දෙනු වස් තාක්ෂණික නිලධාරින්ගේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා 1989 වසරේදී උතුරු මැද පළාත් සභාව මගින් ආරම්භ කරන ලදී. මෙම විද්‍යාලයේ පාලන කටයුතු 1994 වසරේදී මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත පැවරිණි. ප්‍රායෝගික කටයුතු සඳහා මෙම ආයතනය වෙත අක්කර 10ක භූමි වපසරියක් අයත් වේ. වර්තමානයේ මෙම ආයතනය මගින් කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ වූ උසස් ජාතික ඩිප්ලෝමාව පිරිණමන අතර එය නේවාසික පාඨමාලාවක් වේ. මේ සඳහා නේවාසිකාගාර 4ක් සිසුන් සඳහා ස්ථාපිත කොට ඇත.

### ප්‍රගතිය

2017 වසර තුල මුළුතැන්ගෙය, භෝජනාගාරය, පුස්තකාලය, ගොවිපල කාර්යාල ඇතුළු ප්‍රධාන ගබඩා සංකීර්ණය යන ගොඩනැගිලිවල වහල අළුත්වැඩියා කිරීම් හා විදුලි පද්ධතිය අලුත් වැඩියා කිරීම යන කාර්යයන් නිම කරන ලදී. මීට අමතරව බිම්මල් කාමරය, සත්ත්ව ඒකකය සහ දැල් ගෘහ අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදී. පූතික ටැංකි ගොඩනැගීමේ කටයුතු ද නිම කරන ලදී. මී මැසි සංවර්ධන ඒකකය වැඩිදියුණු කරන ලද අතර, GAP වැඩසටහන යටතේ ටොම් ඊජේසි අඹ පැල ස්ථාපිත කරන ලදී.

### විශේෂ කරුණු

වවුනියාව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් සංවිධානය කරන ලද 'ඩෙංගු වලින් තොර පරිශ්‍රයක්' තරඟයේදී ප්‍රාදේශිය මට්ටමෙන් 3වන ස්ථානය දිනා ගන්නා ලදී.

## කෘෂිකර්ම විද්‍යාලය, කරපිංච

කරපිංච කෘෂිකර්ම විද්‍යාල සබරගමුව පලාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්ථාපිත කොට ඇත. මෙම ආයතනය සඳහා භූමිය හෙක්. 8.16ක වපසරියක් අයත් වේ. විද්‍යාලයට අයත් භූමිය තුල වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු, රඹුටන්, දොඩම්, දෙහි, අන්නාසි, සුළු පරිමාණයෙන් තේ, පොල්, කුරුඳු ආදිය වගා කොට ඇත.

මෙම විද්‍යාලය ප්‍රායෝගික ගොවිකම් විද්‍යාලයක් ලෙස 1958දී ආරම්භ කරන ලද අතර, එය දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානයක් ලෙස උසස් කරන ලදී. පසුව මෙම විද්‍යාලය සබරගමුව පලාත් සභාව වෙත බාරදෙන ලද අතර, පසුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (මධ්‍යම රජය) යටතේ කරපිංච, කෘෂිකර්ම විද්‍යාල වශයෙන් නැවත ස්ථාපිත කරන ලදී. 1994-1998 කාලවකවානුව තුල ඩිප්ලෝමාධාරීන් කණ්ඩායම් 2ක් තම අධ්‍යාපනය නිම කලහ. 1998 දී කෘෂි පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. 2007 වසරේදී නැවතත් කෘෂිකර්මය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලද අතර මේ දක්වා එය අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

2017 වන විට යථෝක්ත පාසැල් 5 තුල NVQ 6 වන මට්ටමේ පාඨමාලා හදාරණ ලද සිසුන් ගණන පහතින් දැක්වේ.

**වගු අංක 3.1.15: 2017 දෙසැම්බර් වන විට යථෝක්ත පාසැල් 5 තුල NVQ 6 මට්ටමේ පාඨමාලා හදාරණ සිසුන් සංඛ්‍යාව**

| කෘෂිකර්ම විද්‍යාලය (NVQ level 6) | එක් එක් අධ්‍යයන වර්ෂයේ සිසුන් සංඛ්‍යාව | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | 1වසර (2017/19) | | 2 වසර (2016/18) | | |
| | ගැහුණු | පිරිමි | ගැහුණු | පිරිමි | |
| කුණ්ඩසාලේ | 40 | 72 | 25 | 80 | 217 |
| අඟුණකොළපැලැස්ස | 27 | 26 | 6 | 38 | 97 |
| පැල්වෙහෙර | 32 | 43 | 32 | 38 | 145 |
| වවුනියාව | 17 | 10 | 27 | 16 | 70 |
| කරපිංච | - | 35 | - | 24 | 59 |
| **එකතුව** | **116** | **186** | **90** | **196** | **588** |

NVQ 5 මට්ටමේ කෘෂිකර්ම විද්‍යාල පිළිබඳ සුවිශේෂී තොරතුරු පහතින් දක්වා ඇත.

## කෘෂිකර්ම විද්‍යාලය - ලබුදූව

ලබුදූව ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව මෙහෙයවීමේ පරමාර්ථයෙන් 1994දී ආරම්භ කරන ලදුව 2000 වර්ෂය දක්වා අඛණ්ඩවම ක්‍රියාත්මක කරන ලදී. අනතුරුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් සඳහා එක් අවුරුදු ප්‍රායෝගික කෘෂිකර්ම පුහුණු පාඨමාලාවක් මෙහෙයවන ලද අතර එමගින් 2005 - 2013 වර්ෂය දක්වා කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් 350 දෙනෙකු පමණ සංඛ්‍යාවක් පුහුණු කරන ලදී. පාසැල් හැරගිය සිසුන් සඳහා ආහාරයට ගත හැකි බෝග මගින් උද්‍යාන අලංකරණය සහ නාගරික කෘෂිකර්මය පිළිබඳ NVQ 4වන මට්ටමේ පාඨමාලාවන් 2014 වසරේ ආරම්භ කොට 2017 වසර දක්වාම අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

2015 වසරේදී කෘෂි නිෂ්පාදන තාක්ෂණ පිළිබඳ වූ NVQ 5 වන මට්ටමේ පාඨමාලාව ආරම්භ කරන ලදී.

නිලධාරීන්, ගොවීන් සහ පාසැල් සිසුන් සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම මෙම විද්‍යාලයේ තවත් එක් කාර්යයකි. විද්‍යාලයේ භූමි වපසරිය මෙම පුහුණු ලාභීන් සඳහා ප්‍රායෝගික ක්ෂේත්‍රයක් ලෙස භාවිත වේ. මෙම ආයතනයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය ගොවිනගේ ගැටළු විසඳීම සඳහා නිරන්තරයෙන් සහයෝගය ලබාදෙති. කෘෂිකර්මය හා අදාළව පාඨමාලා හදාරණ සිසුන් සඳහා ඔවුනගේ රැකියාස්ථ පුහුණු පූර්ණ කර ගැනීම සඳහා මෙම ආයතනය අවස්ථාව ලබා දෙයි.

### ප්‍රගතිය

- කෘෂි නිෂ්පාදන තාක්ෂණ පිළිබඳ වූ NVQ 5 වන මට්ටමේ ජාතික ඩිප්ලෝමාව හදාරණ ලද සිසුන් 38ක් ආයතනික පුහුණුව නිමකොට රැකියාස්ථ පුහුණුව සඳහා සම්බන්ධ වූහ. 2017 වසරේදී සිසුන් 38ක සිසුන්ගෙන් යුත් අධ්‍යයන කණ්ඩායමක් බඳවා ගනු ලැබීය.

- ආහාරමය බෝග සහිත උද්‍යාන අලංකරණය සහ නාගරික කෘෂිකර්මය පිළිබඳ වූ NVQ 3 - 4 මට්ටමේ පාඨමාලාව හදාරණ ලද සිසුන් 16ක් ආයතනික පුහුණුව නිම කොට රැකියාස්ථ පුහුණුව ආරම්භ කලහ. NVQ 3 - 4 මට්ටමේ සිසුන් සඳහා අවසන් වසර පරීක්ෂා පවත්වන ලදී.

### විශේෂ කරුණු

- රූපවාහිනි වැඩසටහන් 2ක් (රිවිදින අරුණැල්ල හා ගොවිබිමට අරුණළු) සහ ගුවන් විදුලි වැඩසටහන් 3ක් සඳහා සහභාගීත්වය ලබා දෙන ලදී.
- ඩිප්ලෝමාධාරීන් සඳහා රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරිම.

## කෘෂිකර්ම විද්‍යාලය - වාරියපොළ

මෙම කෘෂිකර්ම විද්‍යාලය කුරුණෑගල දිස්ත්‍රික්කය තුල පිහිටා ඇත. මෙය කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NVQ 5 වන මට්ටම) පවත්වන ආයතනයකි. ශිෂ්‍යාවන් 38ක් 2017 වසර තුල මෙම පාඨමාලාව හදාරන ලදී.

ක්ෂේත්‍ර ප්‍රායෝගික අධ්‍යයන සඳහා ශිෂ්‍යයන් විසින් ආදර්ශන ක්ෂේත්‍රය මනාව නඩත්තු කරන අතර මෙයින් ලැබෙන නිෂ්පාදන ඔවුන්ගේ නේවාසිකාගාර පරිභෝජනයට යොදා ගැනේ. ක්ෂේත්‍රයේ අතිරික්ත නිෂ්පාදනය අලෙවි සැල මගින් අලෙවි කෙරේ.

මෙම විද්‍යාලය මගින් සය මාසික පැළ තවාන් සංවර්ධන සහාය පාඨමාලාවද (NVQ 3 සහ 4 වන මට්ටම) පවත්වනු ලබන අතර ඒ සඳහා සිසුහු 15දෙනෙක් බඳවා ගන්නා ලදහ. විද්‍යාල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති මී මැසි පාලන ඒකකය මගින් මී මැසි සංවර්ධන කටයුතු සිදු කෙරිණි. මෙමගින් පුහුණු පංති පැවැත්වීම, ආදර්ශන පැවැත්වීම, මී මැසි ජනපද සහ මී මැසි පෙට්ටි සැපැයීම වැනි කාර්යයන් සිදු කෙරේ.

වයඹ පලාත තුළ යහපත් කෘෂිකාර්මික පිළවෙත් වැඩසටහනේ ව්‍යාපෘති කටයුතු මෙහෙයවන ව්‍යාප්ත නිලධාරීන් මෙම ආයතනයට අනුයුක්තව කටයුතු කරයි. එම නිලධාරින් විසින් ක්ෂේත්‍ර චාරිකා, ක්ෂේත්‍ර ආදර්ශන, ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන්, විශේෂයෙන් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් කෙරෙහි අවධානය යොමුකරමින් සිදුකරයි.

## කෘෂිකර්ම විද්‍යාලය - බිබිල

බිබිලේ කෘෂිකර්ම විද්‍යාලය 1994 දී ආරම්භ කරන ලද අතර දැවුරුදු කෘෂි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගනු ලැබීය. මෙම පාඨමාලාව 2000 වසර දක්වා පවත්වනු ලැබීය. 2000 වර්ෂයේ සිට 2003 වර්ෂය සඳහා කෙටි කාලින පුහුණු පාඨමාලා පවත්වනු ලැබිය. 2003 අප්‍රේල් 1 වන දින උද්‍යාන බෝග පුහුණු සංවර්ධන ආයතනය ස්ථාපිත කරන ලද්දේ බිබිල, ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය සහ බිබිල උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපළ ඒකාබද්ධ කිරිමෙනි. පසුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂි පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් සඳහා එක් අවුරුදු ප්‍රායෝගික කෘෂි පුහුණු පාඨමාලාව පැවැත්වීම ආරම්භ කරන ලදී. කෘෂි නිෂ්පාදන සහ තාක්ෂණය පිළිබඳ වූ NVQ 5 මට්ටමේ ජාතික ඩිප්ලෝමාව පැවැත්වීම 2015 වසරේදී මෙහි නැවත ආරම්භ කරන ලදී. අදාල වසර තුල NVQ 5 මට්ටමේ කෘෂි නිෂ්පාදන හා තාක්ෂණය පිළිබඳ වූ පාඨමාලාව සිසුන් 46 දෙනෙකු විසින් හදාරණ ලදී.

## කෘෂිකර්ම විද්‍යාලය - පාලමුණ

පෙර පැවති පාලමුණ දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය කෘෂිකර්ම විද්‍යාලය බවට පරිවර්තනය කරමින් මෙය 2015 අප්‍රේල් 6 වන දින ආරම්භ කරන ලදී. කෘෂි නිෂ්පාදන සහ තාක්ෂණය පිළිබඳ වූ NVQ

5 මට්ටමේ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා තුන්වන කාණ්ඩායම බඳවා ගන්නා ලද්දේ 2017 වසරේදීය. බඳවා ගත් සිසුන් ගණන 23ක් වන අතර එම සිසුන් සහ ප්‍රදේශයේ ගොවීන් එක්ව අදාළ වර්ෂයේදී ගොවි සතියට අදාළ ප්‍රදර්ශනයක් පැවැත්විය. ඉහත උත්සවයේදී විද්‍යාලයෙන් ඩිප්ලෝමා පාඨමාලාව අවසන් කල පළමු සිසු කණ්ඩායමට NVQ 5 මට්ටමේ සහතික ප්‍රදානය සිදුකරන ලදී.

## කෘෂිකර්ම විද්‍යාලය - අනුරාධපුර

අනුරාධපුර ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය 1994 මැයි මස 2 දින ස්ථාපිත කරන ලද්දේ දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම සඳහා පුහුණු ආයතනයක් වශයෙනි. ඉන්පසු මෙම විද්‍යාලය 2002 වර්ෂයේදී විශේෂ පුහුණු ආයතනයක් බවට පරිවර්තනය කර රජයේ නිලධාරීන්, ගොවීන් සහ පාසැල් සිසුන් සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් විශාල සංඛ්‍යාවක් පවත්වන ලදී.

2005 වසරේදී, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කෘෂි පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් සඳහා එක් අවුරුදු ප්‍රායෝගික කෘෂි පුහුණු පාඨමාලාව ආරම්භ කරන ලදී. 2013 වසරේදී මහවැලි ක්ෂේත්‍ර සහකාරවරුන් සඳහා එක් අවුරුදු ප්‍රායෝගික කෘෂි සහතික පත්‍ර පාඨමාලාව සහ වෙනත් කෙටි කාලීන පුහුණු සඳහා අවස්ථාව ලබාදෙන ලදී. 2014 වසරේදී, නිලධාරීන් සහ පාසැල් සිසුන් සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර, අ.පො.ස (සා/පෙළ) සමත් සිසුන් සඳහා NVQ 3-4 ක්ෂේත්‍ර සහකාර (කෘෂි) පාඨමාලාව 2015 වසරේදී ආරම්භ කරන ලදී. 2016 වසරේදී කෘෂි නිෂ්පාදන තාක්ෂණ පිළිබඳ වූ NVQ 5 මට්ටමේ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කරන ලද අතර සිසුන් 36ක් එම පාඨමාලාව හදාරනු ලැබ, 2017 මාර්තු මාසයේදී එම ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කරන ලදී. 2017/18 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 34ක් බඳවා ගන්නා ලදී.

## කෘෂිකර්ම විද්‍යාලය - පරන්තන්

2016 වසරේදී ස්ථාපිත කරන ලද පරන්තන් කෘෂිකර්ම විද්‍යාලය කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. මෙම විද්‍යාලය උතුරු පළාතේ වාසය කරන සිසුන්ට කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් (NVQ - 5 වන මට්ටම) ලබා ගැනීමට මහඟු අවස්ථාවක් ලබාදෙයි.

මෙහි පළමු කණ්ඩායම සිසුන් 18 දෙනෙකුගෙන් යුක්ත වූ අතර ඔවුහු ආයතනික පුහුණුව නිම කොට රැකියාස්ථ පුහුණුව සඳහා යොමු කරන ලදී. අදාළ වසර තුල ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදුවිය.

2017 දෙසැම්බර් වන විට යථෝක්ත කෘෂිකර්ම විද්‍යාල 6 තුළ NVQ - 5 මට්ටමේ පාඨමාලාව හදාරන ලද සිසුන් සංඛ්‍යාවන් පිළිබඳ තොරතුරු වගුව 3.1.16හි දැක්වේ.

**වගු අංක 3.1.16 : NVQ 5 කෘෂි විද්‍යාල 6 තුල මට්ටමේ පාඨමාලා හදාරනු ලබන සිසුන්ගේ සංඛ්‍යාව**

| කෘෂිකර්ම විද්‍යාලය (NVQ 5 මට්ටම) | සිසුන් සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|
| | ගැහුණු | පිරිමි | |
| ලබුදූව | 16 | 24 | 40 |
| වාරියපොල | 40 | - | 40 |

| කෘෂිකර්ම විද්‍යාලය (NVQ 5 මට්ටම) | සිසුන් සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|
| | ගැහුණු | පිරිමි | |
| බිබිලේ | 40 | - | 40 |
| පාලමුණ | 18 | 10 | 28 |
| අනුරාධපුර | 34 | - | 34 |
| පරන්තන් | 12 | 13 | 25 |
| **එකතුව** | **160** | **47** | **207** |

## විභාග ඒකකය

විභාග අනු ඒකකය මඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා විවිධ විභාග පවත්වනු ලබන අතර කෘෂි විද්‍යාල 11 සම්බන්ධයෙන් සියළු වාර්ෂික පරීක්ෂණ ද පවත්වනු ලැබේ. මෙම ඒකකය මගින් සමාලෝචිත වසර තුල දෙපාර්තමේන්තු විභාග සහ කාර්යක්ෂමතා කඩයිම් විභාග 15ක් පවත්වා ඇති අතර මෙම පරීක්ෂණ සඳහා සහභාගි වූ විභාග අපේක්ෂකයන් සංඛ්‍යාව 1562ක් විය.

ගොවිපල ලිපිකරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත හා සීමිත විභාගය පවත්වන ලද අතර 2017 වසරේදී ඒ සඳහා විභාග අපේක්ෂකයන් 3361ක් ඉදිරිපත් වූහ.

මීට අමතරව කෘෂි විද්‍යාලවල NVQ 5 වන මට්ටමේ පාඨමාලාව හැදෑරීම සඳහා පරීක්ෂණ පවත්වන ලද අතර ඒ සඳහා විභාග අපේක්ෂකයන් 750ක් සහභාගි වූහ. NVQ 6 වන මට්ටමේ පාඨමාලාව හැදෑරීම සඳහා ලද අයදුම්පත්‍ර සංඛ්‍යාව 3200ක් වූ අතර, විභාග ඒකකය මගින් සුදුසුකම් ලැබූ සිසුන් පමණක් තෝරා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ඇතුලත් කර ගැනීමේ පරීක්ෂණය සඳහා යොමු කරන ලදී.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කෘෂි පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් (APRA) සඳහා එක් අවුරුදු ප්‍රායෝගික පුහුණු වැඩසටහන අදාළ අවසන් පරීක්ෂණ පවත්වන ලදී.

## 2018 වර්ෂය සඳහා සැලැස්ම

කෘෂිකර්ම ව්‍යාප්ති සහ පුහුණු වැඩසටහන්

2018 වර්ෂයේදී ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ඇත.

- අන්තර් පළාත් ප්‍රදේශ 6 තුළ කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන්.
- 2018 වර්ෂයේ අවධානය යොමු කෙරෙනුයේ මෙරට ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අන්තර් පළාත් ප්‍රදේශ තුළ වගා කරන ප්‍රධාන බෝගය වන වී වල ඵලදායිතාව ඉහළ නැංවීම කෙරෙහිය. ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ වී වල ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කෙරෙනු ඇත.
- ආනයනය අඩුකර විදේශ විනිමය ඉතිරි කර ගැනීම සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග වගා බිම් ප්‍රමාණය සහ එම බෝගවල ඵලදායිතාව ඉහළ නංවා ගැනීම කෙරෙහි වැඩි අවධානය යොමු කෙරෙනු ඇත. වෙනත් ක්ෂේත්‍ර බෝගවල වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදනය හා ඵලදායිතාව වර්ධනය කර ගැනීම සඳහා ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ දීප ව්‍යාප්ත මට්ටමෙන් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

- පලතුරු ගස් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන් සහ කෘෂි පාරිසරික කලාපවලට සුදුසු පලතුරු ප්‍රභේද හඳුන්වාදීම මගින් පලතුරු නිෂ්පාදනය වැඩි කෙරෙනු ඇත.

- එළවළු වගාවේ යහපත් කෘෂි පිළිවෙත් වැඩිදියුණු කිරීම.

- කෘෂිකර්ම විද්‍යාල 5හි කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ NVQ 6 මට්ටමේ පාඨමාලාව වන උසස් ජාතික ඩිප්ලෝමාව පැවැත්වීම. NVQ 6 මට්ටමේ ඩිප්ලෝමාධාරීන් 286ක් පමණ ඩිප්ලෝමාව සමත්ව පිටව යනු ඇති අතර පාඨමාලාව සඳහා නව ශිෂ්‍ය කණ්ඩායමක් බඳවා ගනු ඇත.

- අනුරාධපුර, වාරියපොළ, ලබුදුව, පාලමුණේ, බිබිල සහ පරන්තන් යන කෘෂිකර්ම විද්‍යාලවල කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ NVQ 5වන මට්ටමේ වන ජාතික ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම. මෙයින් සිසුන් 207ක් පමණ සමත්ව පිටව යනු ඇතැයි අපේක්ෂිත අතර නව ශිෂ්‍ය කණ්ඩායමක් පාඨමාලාව සඳහා බඳවා ගනු ඇත.

- NVQ 3-4 මට්ටමේ පුහුණු පාඨමාලා ලබුදුව හා වාරියපොළ යන කෘෂිකර්ම විද්‍යාලවලද බිබිලේ උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනය, අඟුණකොළපැලැස්ස සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, හංසයාපාලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය සහ වීරවිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වීම.

- නිලධාරීන් සහ ගොවීන් සඳහා සේවා සංස්කරණ පුහුණු ආයතනය 3හි, දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථාන 4හි, ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානයෙහි සහ මී මැසි සංවර්ධන ඒකකයෙහි කෘෂි පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- 2018 වර්ෂයේ විභාග කැලන්ඩරය අනුව, පහත සඳහන් විභාග පැවැත්වීම.
    - කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහ කෘෂි නිෂ්පාදන තාක්ෂණ පිළිබඳ ඩිප්ලෝමා විභාග
    - කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරින් සඳහා දෙපාර්තමේන්තු විභාග පැවැත්වීම
